# KURUKULA CHARITHAYA

## (II PART)

BY

**A. S. F. Weerasuriya, Kurukula Venthar**

**HAPUTALE.**

PRINTED
BY
KAURAVA ADITHYA, PIYADASA JAYARATNA.
KURUNEGALA.

# කුරුකුල චරිතය

## (දෙවන කාණ්ඩය)

හපුතලේ

ඒ. ඇස්. ඇෆ්. වීරසූරිය කුරුකුල වේ...

විසින් ලියනලදී.

ප්‍රකාශක

කෞරවාදිත්‍ය, පියදාස ජ...

# හැඳින්වීමයි.

"කුරුකුල චරිතය" නමැති මේ ග්‍රන්ථය කාරාවේ ගෝත්‍රිකයින්ගේ සටහන්ව තිබෙන පැරණි ඉතිහාස ගත තොරතුරු රාශියක් සහ කෞරව වංශික යුවරජවරු මහාමාත්‍යවරු මහා අධිකාරම්වරු යුධ සේනාපතිවරු මුදලිමුහන්දිරම්වරු සහ මහා ධනපතියන් ආදි ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගෙ නම්ගම් තොරතුරුත් ඇතුලත්ව තිබෙන ග්‍රන්ථයකි මේ පොතේ පලමුවෙනි කාණ්ඩය මුද්‍රණවාරයෙන් ප්‍රචාරයවූවාට පසු පොතේ කර්තෘ නැත්පත් හපුතලේ ජ්. ඇස්. ඈජ්. වීරසූරිය කුරුකුලවේන්ද්‍ර මහතාණෝ මෙහි දෙවෙනි කාණ්ඩයත් සම්පාදනය කිරීමට උත්සුකවූහ පොත සකස්කරමින් සිටිය දිම එතුමා රෝගාතුර විය පොතේ කටයුතු අවසන් කිරීමට පළමු ඒ මහතා පරලොව සැපත්වූහ එතුමාගේ අවමංගල්‍ය කෘත්‍යය ඉතා විසිතුරු අන්දමින් සිදුකරණ ලදී සිය ඥාතීන් විසින් මොරටුවෙන් ගෙනෙන ලද රාජකීය ලාංඡනවූ මුතු කඩය ආලවට්ටම් දෙක, ඉර හඳ කොඩිය, මකර කොඩිය, ත්‍රිසූල, කඩු, චාමර, දූලපන්දම් සහ මෙයින් හා හේවිසි හොරනෑ ආදියෙන්ද යුතුව ඉතා ගෞරව සහිතව කුල චාරිත්‍රානුකූල ලෙස භූමදාන කෘත්‍යය සිදුකරන්ට යෙදුනා ඇත. අප හිත මිත්‍ර ඒ මහතාගේ අභාවය අපට බලවත් පාඩුවකි. එතුමා ජීවත්ව සිටියදී මේ පොත මුද්‍රණය කරවන ලෙස අප වෙත කරන ලද ආරාධනය පරිදි මෙය මුද්‍රණය කරවීමට සිදු විය. කාලය අනුව කුල භේදය අභාවයට යන ලකුනු පහලවී තිබෙතත් තම කුලය පරපුර ගැන තොරතුරු සැම දෙනාම දැන සිටිය යුතු බව අපගේ හැගීමයි. මෙයින් බාල පරම්පරාවටද තමකුලය ගැන කරුණු නොදත් කාරාවේ ගෝත්‍රිකයින්ටද මහත් ප්‍රයෝජනයක් අත්වෙනවාට කිසිම සැකයක් නොමැතියි මෙහි යම් කිසි ලිපි දෝෂයක් හෝ මුද්‍රණ දෝෂයක් කිසි තැනක විද්‍යමාන වෙතත් මෙම පොතෙන් ලැබිය හැකි ප්‍රයෝජනයට ඉන් බාධාවක් පැමිණේ නැයි අපි නොසිතමු. මේ සඳහා තොරතුරු සපයා එවූ භවතුන්ටද පොත ඉතා උනන්දුවෙන් සහ කාලට වේලාවටත් මුද්‍රණය කර දුන් සජාතා මුද්‍රණාලයාධිපති තුමන් ඇතුළු කාර්‍ය මණ්ඩලයටත් අපේ කෘතඥතා පූර්වක අවංක සතුතිය මෙයින් පිරිනමනු ලැබේ.

මේයට ප්‍රකාශක,

"කාරවන්ති" කෞරව ආදිත්‍ය පියදාස ජයරත්න

නො. 108, මීගමු පාර, - කුරුණෑගල.

1960 ජනවාරි 1.



අන්තෝනි බැරැත්තු කුලසූරිය
උඩරට යුව රජතුමා.

# පිළිගැන්වීමයි.

—||—

ශ්‍රීමත් සෙනරත් මහ රජතුමාගේ යුද්ධ නෞකා මණ්ඩලයේ මහා අද්මිරාල් ධුරය හා උඩරට රාජධානියෙහි යුව රාජ පදවියෙන් හෙබවුන ඌවේ කුමාරයානෝ කෞරවාධිපති කඩුපිටි මාදම්පේ අන්තෝනියෝ බැරැත්තෝ නොහොත් මාතර මහා මන්ත්‍රීශ්වර කුරුවිට රදළ වරයාණන්, හා

අභීතව පෙරමුණේ සිට වර්ෂ 1848 දී මාතලේ මහ කැරැල්ල ඉංග්‍රීසීන්ට විරුද්ධව මෙහෙයවා උඩරට රජුශි සිංහලයන්ගේ විරුදාවලියට හිමිවූ මොරමුවේ ලක්ෂපතිගේ වීරබල ධීරසන්නබ ජයසූරිය කුරු උතුම් පාල අඹදේව ගුණරත්න පටබැඳිගේ ප්‍රැන්සිස්කු ප්‍රනාන්දු (පුරන්අප්පු රජ) තුමන්ගේද ශ්‍රී නාමයතට මෙම ප්‍රකරණය සමාදරයෙන් පිරිනමනු ලැබේ.

තෙදත දිගුයට රැඳුන සෙනරත් රදුගෙ යුද නාවුක මඩුල්
ත ර න පතිගොඩ සයුරු යුදනා විරුදු සහ ඌවේ විසල්
හෙබුන යුවරද තැනෙහි ගරු මාදම්පෙ දිනු සිරිමත් සිහල්
තු ම න අන්තෝනියො බැරැත්තෝ මෙදෑසමරමු බැති'නුදුල්

පු.රා හදවත දෑ බිමාතය රුපුන් මැඩුමට කිති කැ වී
අ.රා මහජන මතයෙ සිහසුන පිරිවරා සෙන් යුද ලැ වී
තිරා නායක කුරු උතුම් පල් පුරන් අප්පුගෙ නම හි වී
ස රා සඳ ලෙස දිලේ ලකඹර සිහල බැතිපෙම් වැඩී වෙ වී

මෙයට,

සම්පාදක සහ ප්‍රකාශක.
හපුතලේ සහ කුරුණෑගල.



කුරුළුතුම්පාල කුරුවිර පුරන්අප්පු ශ්‍රීමතාණෝ.

# ශුද්ධි පත්‍රය.

| පිටුව | වැරදිපාඨ. | නිවරදිපාඨ. |
|---|---|---|
| 5 | ප්‍රතිපල | ප්‍රතිඵල |
| 9 | ආමත්ත්‍රත්ය | ආමන්ත්‍රණය |
| 9 | පාතිග්‍රහණය | පාණිග්‍රහණය |
| 9 | ගුතසම්පන්න | ගුණසම්පන්න |
| 10 | අපමතු | අපමණ |
| 11 | සහ - ජාත | සහජාත |
| 11 | ශාන්තංනු | ශාන්තනු |
| 12 | හැගිගය | හැගීගිය |
| 13 | හි | එහි |
| 21 | ආක්‍රෝ | ආක්‍රෝශ |
| 21 | ආග්‍රහයණවූ | ආග්‍රහණයවූ |
| 21 | වහතාදීයද | වාහතාදියද |
| 28 | සහග්‍ර | සහස්‍ර |
| 33 | බ්‍රහ්මොතපත්තියද | බ්‍රහ්මෝත්පත්තියද |
| 36 | ඛඞ්ශ | ඛඞ්ග |
| 38 | පාසැලේ | පංසලේ |
| 41 | බැවකර | බැවහැර |
| 43 | රාජයෘය | රාජ්‍යය |
| 47 | බ්‍රහ්මණ | බ්‍රාහ්මණ |
| 53 | ආරිච්චි | ආරච්චි |
| 50 | කරුකුලිය | කුරුකුලිය |
| 51 | පරිණකුරුව | පරණකුරුව |
| 58 | දෙවහණක් | දෙවහණන් |
| 60 | බංවදෙවයා | බාඡදෙවයා |
| 62 | සුදුකොඩය | සුදුකොඩිය |
| 63 | යුධකිරීම | යුඬකිරීම |
| 71 | කියනයොත් | කියන යොත් |
| 71 | ජාපාතෙන් | ජාපතෙන් |
| 83 | කලයේ | කුලයේ |
| 96 | පැලකැටිගේ | පැලකැටියෙංගේ |
| 91 | මහත්මාගන්ධ | මහත්මාගන්දි |

| පිටුව | වැරදිපාඨ. | නිවරදිපාඨ. |
|---|---|---|
| 93 | බ්‍රාහ්ම | බ්‍රාහ්මණ |
| 118 | කොරෞව | කෞරව |
| 128 | 1651 | 1641 |
| 125 | 827 | 227 |
| 136 | දතවක | දෙතවක |
| 138 | ඹහෝදුරක් | බොහෝදුරක් |
| 143 | පවර | පරවර |
| 153 | කරුරට | කුරුරට |
| 143 | තිකපිටිසේ | තිකපිටියේ |
| 157 | නාගරිකයන්යද | නාගරිකයන්ද |
| 171 | ප්‍රභවවාහුවෙත් | ප්‍රභව වූවාහුවෙත් |
| 172 | ඔමලදහම්සූරිය | විමලදහම්සූරිය |
| 172 | පූණ්ඩුකර | පූව්ටුකර |
| 176 | එදිරිමතසූරිය | එදිරිමාතසූරිය |
| 179 | ඔත්තුකාරයික් | ඔත්තුකාරයින් |
| 182 | වටදෙණියේ | වටදෙණියේ |
| 183 | මැයි 18 - 19 | මැයි 1819 |
| 193 | කාරවකුලයේ | කරාව කුලයේ |
| 197 | වේලවාට | වේලාවට |
| 200 | කොරටවහල්කඩින් | කොරාවහල්කඩින් |
| 217 | හැටියටත් | හැටියටත් |
| 217 | ජීවික්ෂයට | ජීවිතක්ෂයට |
| 220 | පව්විත් | පව්ටි |
| 221 | ගෞරවරක් | ගෞරවයක් |
| 221 | කරුවන් විසික | කරුවන් විසින් |
| 222 | අත්අඩිංගුවට | අත්අඩංගුවට |
| 223 | අඟහරුවංතොට | අඟුරුවාතොට |
| 223 | කාලයස් | කාලය |
| 224 | වස්තු ලෝභයෙන් | වස්තු ලෝභයෙන් |
| 224 | පස්කොළ පොත | පුස්කොළ පොත |
| 229 | අල්ලාගෙල | අල්ලාගෙන |
| 229 | වැටලීමර | වැටලීමට |

| පිටුව | වැරදිපාඨ. | නිවරදිපාඨ. |
|---|---|---|
| 231 | සටන් කරතියේ | සටන් කර තිබේ |
| 232 | විජිතවශයත් | විජිත වශයෙන් |
| 238 | ගජබා හමතෙහි | ගජබාහටතෙහි |
| 241 | පරපුදරද | පරපුරද |
| 241 | (තයනීති නෙත්ති) | (තයතීති නෙත්ති) |
| 241 | ධනපතයාගේ | ධනපතියාගේ |
| 241 | වීදියේ බණ්ඩා | වීදියේබණ්ඩාර |
| 244 | මාතික්කතලෙයිවේන්ද | මාණික්කතලෙයි වේන්දර් |
| 245 | දියණියත් දියණියත් | දියණියත් |
| 245 | ගොත්‍රට | ගොත්‍රයට |
| 245 | බටහිරි | බටහිර |
| 247 | සම්ඣ | සම්බන්ධ |
| 247 | පැමණ | පැමිණ |
| 247 | තුත්තුකුඩියට | තුත්තුකුඩියට |
| 247 | පදංචිව | පදිංචිව |
| 256 | ශතජන තැමැති | ශත්‍රුජන නැමති |
| 258 | කළුඅංචිරචිගේ | කළුඅංරච්චිගේ |
| 258 | පැලවාගෙගෙන් | පැලවාගෙන් |
| 261 | අනුශානා | අනුශාසනා |
| 262 | පණික්කි | පානික්කි |
| 262 | පැරතුම්බා | පැරකුම්බා |
| 263 | වංශාඕපයෙකුවු | වංශාධිපතියෙකුවූ |
| 263 | පැකුම්බා | පැරකුම්බා |
| 263 | සේනාපසි | සේනාපති |
| 263 | සෙම්බුටප් | සෙම්බුගප් |
| 263 | 1499/76 | 1469 / 76 |
| 263 | රජරජවූයේය | රජවූයේය |
| 263 | සිජාවක රාජසිංහ | සීතාවක රාජසිංහ |
| 264 | කසාකුරුරුළු | කසාකුරුළු |
| 264 | බැවිනී | බැවිනි |
| 267 | තලකරාව | තිලකරාව |
| 268 | ගුරුකුල චරිතය | කුරුකුල චරිතය |

| පිටුව | වැරදිපාඨ. | නිවරදිපාඨ. |
|---|---|---|
| 271 | ඉදිපත්වීමට | ඉදිරිපත්වීමට |
| 273 | තතතුරු | තනතුරු |
| 273 | අද දවයේ | අද්දවසේ |
| 274 | පිව්ව | පිටුව |
| 275 | පුරදු | පුරුදු |
| 275 | තෙත්තතෝත් | තෙත්තකෝත් |
| 276 | උමේකුමාරයා උවේ පු:ර: | ඌවේකුමාරයා ඌවේයුවරජ |
| 276 | රාරසිංහ | රාජසිංහ |
| 277 | උඩටර | උඩරට |
| 277 | කොටුබැදද | කොටුබැද |
| 282 | සාර් | සර් |
| 293 | මුණද්‍රය | මුද්‍රණය |
| 300 | පියසරතන | පියරතන |
| 300 | තඹරු | තඹුරු |
| 302 | ලකාවට | ලංකාවට |
| 302 | නාගත්තේය | දිනාගත්තේය |
| 325 | ආභාවිය | අභාවය |
| 327 | ලදදේය | ලද්දේය |
| 328 | නාමයෙන් | නාමයෙන් |
| 328 | කුඩකල්හි | කුඩාකල්හි |
| 330 | සහෝදරියවූ | සහෝදරිය |
| 341 | දෙවාලයෙන් | දෙවාලයෙන් |
| 342 | සොමිකල | සෞමිකුල |
| 343 | වචිත්තර | විචිත්තර |
| 343 | කුමාරදද | කුමාරද |

295 වෙනි පිටුව අධෝලිපිය:-

සුසෙවිද සොයිසා දිසානායක රජවාසල මුදලි මන්ත්‍රීශ්වරයාණන්ගේ අයදුම සඳහා වර්ෂ 1878 දී වැලිගම ශ්‍රී සුමංගල නායක සප්විරපාදයන් වහන්සේ විසින් හිතොපදෙශ සන්නය මුද්‍රණය කරවන ලදී.

සුසෙවිද සොයිසා දිශානායක රාජවාසල මුදලි මන්ත්‍රීශ්වරයානන්ගේ අයදුම සඳහා, විෂ්ණුශර්මන් නම් පණ්ඩිතයා විසින් රචිත හිතොපදෙශයෙහි වූ ශ්ලොකයන්ගේ සන්නය ගෞරවාහී වැලිගම ශ්‍රී සුමංගල නායක සවාමිපාදයන් වහන්සේ ලියන ලදුව, එම මුදලිතුමාගේ අවසරයපරිදි, දොන් කරෝලිස් වීරක්කොඩි මහතා විසින් වර්ෂ 1878 දී මුද්‍රණය කරවන ලදී.

## නමඃ ශ්‍රී ඝණාය.

*රාමායණය සූර්‍ය වංශය පිළිබඳව කථාකරයි. එය වාල්මීකි නම් ඍෂිවරයා විසින් ලියන ලද්දේය. එහි සඳහන් රාම - රාවණා යුද්ධය සිදුවූයේ ක්‍රිස්තුස් වහන්සේගේ උප්පත්තියට අවුරුදු 1800 කට පමණ උඩදීය.

†මහා භාරතය චන්ද්‍ර වංශය සම්බන්ධව විස්තර කරයි. එහි අන්තර්ගත කෞරව - පාණ්ඩ්‍ය යනාදී ඥාති සහෝදරයින්ගේ දරුණු මහා සටන ඇතිවූයේ රාම-රාවණා යුද්ධයෙන් පසුය. ක්‍රිස්තු තුමන්ගේ ලෝ පහළවීමට අවුරුදු 1250 කට පමණ උඩදී දඹදිව උතුරු බඳ කුරුරට නැමැති ජනපදයේදී මේ සටන සිදුවූයේයයි විශ්වාස කරණු ලැබේ.

---

*"රම්රදුට දිනිතිය – කොසලිඳු දූ රදූ මෙන
පියකර නව සදෙව් සත නමදින වෙසෙ ස
සිස ගුරු බිසෝ හිමි සඳ නමිනි නිසි ලෙ ස"
(කොකිල සන්දේශය)

"තුන් ලෝ තමා නතුකළ රවුළු සොහොවු රැ
තු න් කල් බලා රම්ඳුව වූ ඉටු මිතු රැ
කු න් වේ ඇදුරු පුලතිසි කුල මිණි මිතු රැ
තු න් විටකම වඳු එසුරිඳු පා නඹු රැ"
(සැළලිහිණි සන්දේශය)

†" රාමායන බර න
ඇතුළුව දෙඩුම් මුල් යු ත
කිමුත් බස් නිර ත
සුතුව දෙඅඟින් දනුව නියව ත"
(කාව්‍යශේඛරය)

අතුරුකප පෙර උපන් බඹ පුත් විවස්වත් මනුරජ කුලෙන් ප ත
ඔක්කාවස් පුතු බානු මන්දතු පසේ නදි සුදසුන් බගී ර ත
නහුස සංකති රඝ දිලීපති සංකු නළ නාබාග දස ර ත
රාම ලක්මණ කුසලවාදී පසිඳු සක්විති රජුන්ගෙන් යු ත
(පැරකුම්බා සිරිත)

මෙම උගත් කතුවරුන් සියලුදෙනාම රාමායනය සහ මහා භාරතයද ආශ්‍රය කර තිබෙන බව මෙයින් හැඟේ.

මහා භාරතයෙහි කතුවරයා වනාහී වේද ව්‍යාස මහා සෘෂිවරයාය. හෙතෙම වූකලි මත්මරණ සත්‍රියකගේ පුත්‍රයෙකැයි මාතව ධර්ම ශාස්ත්‍රයෙහි දක්වා ඇත්තේය. තව්ද එතෙම කුරුරට රාජධානියේ උරුමක්කාරයින් වශයෙන් සලකන පාණ්ඩ්‍ය - කෞරව නොහොත් කුරුකුල රාජ වංශිකයින්ගේ ආදි පිතෘවරයා යයිද මහා භාරත කාව්‍යයෙන්ම ප්‍රකාශ වන්නේය. ඔව්හු වූකලී චන්ද්‍ර වංශයෙන් පැවතෙන බලවත් රණකාමී පිරිසක් බැව් මහා භාරතයේ පමණක් නොව අන්‍ය පුරාණ නැමැති ඉන්දියානු පැරණි ඉතිහාස පොත්වලද ලියා ඇත්තේය.

චන්ද්‍ර වංශයෙහි මූලිකයා වනාහි චන්ද්‍රගේ පුත්‍රයා වන "බුධ" යයි සමහර පොත්වල දකින්ට ලැබේ. ඇතැම් අය සූර්යයාගේ පුත්‍ර සූර්යපුත්‍ර යයිද ඔහුට කියති.

මහාබ්‍රහ්මයාගේ එක් නේත්‍රයකින් උපන් "අත්‍රි" නැමැති ප්‍රජාපතින් දස තපස් රක්ෂා කරණ කාලයකදී "අත්‍රිජ" සහ "අත්‍රි නේත්‍ර ප්‍රසූත" යනාදී නම් වලින් ප්‍රකට චන්ද්‍ර ඔහු නෙතින් උපන්නේය.

මේ "අත්‍රි" තෙම වනාහී චන්ද්‍ර වංශික රජුන්ගේ ආදි පුරුෂයා විය. චන්ද්‍ර වංශය පිහිටෙව්වාවූද ඒ වංශයෙහි මූලික රාජයාවූ "පුරවර" නම් රජුට "ආයුස්" නම් පුත්‍රයෙක් වූයේය. ඒ ආයුස් රජුගේ පුත්‍රයා "නහුෂ" නම් රජ්ජුරුවන් විය.

නහුෂ රජුගේ පුත්‍රයා "යයාති" නම් වූයේය. යයාති රජතෙම "යදු" සහ "පුරු" යන දෙරජුන්ගේ පිතෘ විය

---

"Atri" The author of the fifth book of the Rig veda, was a son-in-low of the "King Richyu" who was the eleventh ruler in the "Paurawa" dynasty and flourished in 2600 B. C."

(Dr. A. S. ALTAKAR'S address, Indian History Congress at Calcutta-All India Vol iv. No. 1,)

යදු රජුගේ පරම්පරාවේ රජවරු නම් වාසුදේව සහ ඔහුගේ සහෝදරිවූ කෞනනය, කුන්ති හෙවත් පෘථාද වංසුදේවගේ පුතුන්වූ කෘෂ්ණා හා බලරාමා යන මොවුන්ද ලෝක ප්‍රසිඬ බවට පැමිණියෝය.

පුරුගේ පුත් දුෂ්‍යන්ත රජ විශ්වාමිත්‍ර සෘෂිවරයාට දුව මේනකී සුරඹ කුස ඉපිද කන්වා සහ ගෞතමිය විසින් හදා වඩා ගත් සකුන්තලා කුමරිය විවාහ කර ගත්තේය. ඔවුන්ගේ පුත් සර්වදමන හෙවත් චක්‍රවර්ති පද ප්‍රාප්ත මහා භාරත රජුය.

මේ රජුගෙන් පසු චන්ද්‍ර වංශය භාරත හෙවත් භාරත වංශය කියාද මුළු මහත් දඹදිව් තලය භරත හෙවත් භාරත දේශය කියාද ප්‍රකට විය.

පෞරව නොහොත් පුරු පරපුරේ දහඅටවන පරම්පරාවේ ඉලින රජුගේ පුත් දුෂ්මන්තය. ඔහු ශකුන්තලාව විවාහකොටගෙන භරත කුමාරයින්ව බිහිකළාය. භරත රජුගේ මුනුබුරු හස්තින් විසින් කුරුරට හස්තිනා පුරය ගොඩනගන ලදී. හස්ති රජුගේ මුනුබුරු අජමීඪ රජුට කෛකෙයි, ගාන්ධාරී, විශාලා, ඍක්ෂා යැයි බිසෝවරු සිව් දෙනෙක් විය. ඔවුන් පුත්‍රයින් 124 ක් ප්‍රසූත කළෝය. ඔවුන් අතරින් සංවරණ තෙම තපති නැමති සූර්‍ය වංශික කන්‍යාව ලැබ පාණිග්‍රහණය කෙළේය. ඕතොම් සංවරණ රජුට දුව කුරු නම් පුත්‍රයෙක් ප්‍රසූත කළාය.

කුරුරජ තෙමේ කෞරවයින්ගේ නොහොත් කුරුකුලයින්ගේ සහ පාණ්ඩවයින්ගේත් පරම්පරා බද මුත්තණු කෙනෙකි. කුරු කුලය, කුරුවංශය නොහොත් කෞරව වංශය, නැමැති වංශ නාම මෝහු කරණකොට ගෙන ඇතිවිය.

# සත්‍යවතී හෙවත් මච්ඡගන්ධි කුමරියගේ උපත

කුරුරට වනගත ප්‍රදේශයේ දඩක්‍රීඩාවේ යෙදී සිටි යම් කිසි රජෙකුගේ ධාතු රජස පක්ෂියෙකුගේ මාගීයෙන් යමුනා ගංගා ජලයෙහි පතිත විය. ඒ රජස මත්ස්‍ය ධෙණුවක් විසින් ගිලදැමූවෙන් මෙය හේතුකොටගෙන උන්දෑ ගැබිණි වූවාය. නිසි කලට යමුනා ගංඉවුරෙහි බිළින්දියකු වදා දමා පළා ගියාය.

යමුනා වෙහි මසුන් මරන්නන් විසින් අවුලාගත් මේ ලේකැටි බිළිඳිය ඔවුන්ගේ ධීවර නායකයාවූ දාස නම් රාජයා වෙත ගෙනගොස් බාර දුන්නෙන් හෙතෙම ඒ බිළින්දිව සුත ප්‍රේමයෙන් ඇතිදැඩි කරගත්තේය.

කාලාතික්‍රමණයෙන් මස් මරන්නන්ගේ රජ්ජුරුවෝ තමන් ඇතිදැඩි කර ගත් දියණියන්ට සත්‍යවතී යන නාමය තබන ලද්දේය. ඕතොමෝ මත්ස්‍යයෙකුගේ කුසින් උපන් සෙයින් මච්ඡගන්ධී හෙවත් *මච්ඡගන්ධි යන අතුරු නාමයක්ද ඇගට ඇතිවීය.

---

*"තිල් දිය සළුව හැඳ තන තිසරුන් හංගා
ම ල් බර වෙමින් මුහුදට දිවයයි ගංගා
කු ල් මත් හෙයින් පැල්පත් ඇතුලට රිංගා
ඇ ල් ගෙවි ලියෝ පසුවෙති රති ගී තංගා
අ හ ස ට නැගී රත්වන් සමතලය බමයි
තර හෙට සිනාසෙන්තිය මල් පිපුන බිමයි
නරු පට සලනි ලැසි ගමනින් ගැහැණු ළමයි
කුරු රට අසල මෙය විසිතුරු බමුණු ගමයි
ලාරත් දෙතොල කුසුමකි මූව සෙව්ව න්දි
සාපත් කුමරියකි දුවණිය මාග න්දි
රූපත් පැවිද්දකු හට ඇය බැඳ ද න්දි
ජී වත් වෙන්න සැරසෙනී අහසට පී න්දි"

බී. එච්. අමරසේන මහතාගේ (මාගන්දිය)

කුරුරට මාගන්දි නමින් යුත් බමුණන් සහ බැමිණියන්ද සිටි බව බුඩ ධර්මයෙන් පෙනේ එමෙන්ම මච්චගන්දියද කුරුරට කුමරියකි මහත්මා ගන්දි තුමාගේ මුල් පරම්පරාව සම්බන්ධ අයින් වනාහි කුරුරැටියෝ වෙති.

ධීවර කන්‍යා සත්‍යවතිය හෙවත් මච්ඡගන්ධිය වැඩි වයසට පත්වූවා. යමුනා ගංතෙර නෞකාවක කටයුතු කරමින් සිටින අතර පරාශර නම් මුණිවරයා විසින් දැනගත් මහත් ඵල ශුභ යෝගයක ප්‍රතිපල ලැබෙන අයුරු ඕතොමෝ ඒ මුණිවරයාට භාර්යාව වූවාය. නොබෝ කලකින් ඇ ගර්භිණී විය.

“කලියුග දිවා පෙ   ර  
පරාශර නම් මුනි ව   ර  
දකින මෙන් ඉසිව   ර  
යෙමැසි සලකා දිනක පෙම ක   ර

සපසේම සිතු ලෙ   ද  
විමනෙන් නික්ම එම ස   ද  
සත යනෙන නැව් පැ   ද  
එසිඳු වෙත ගොස් එමුනි සිටි ස   ද

එ නැව් තොට මතඟ   ර  
සව් සත එතර කර ක   ර  
මච්ච කෝංතිය ත   ර  
රජ දුවක් නැව් පදි හැම ව   ර

ජිවි කූල එළඳ හ   ට  
අකුසල් බෙලෙන් පෙර කො   ට  
තුන් තුන් ගව් අව   ට  
දිවෙයි සිරුරෙන් දුගඳ හැම වි   ට

කැඳවා මුනි එ ල   ද  
පවසා තෙපුල් අම ලෙ   ද  
එම්බල අප මෙ ස   ද  
නැවෙන් එතරට කරව කි ස   ද

එ අසා එළඳ පෙ   ම  
දහසක් වටින බර ම   ම  
ඔබ රැගෙන නතිය   ම  
කෙසේ නැව පැද එතර කරව   ම

එ අසා ලද නිම,　　　ල
ඉදුවා එ මුනි තැව තු　　　ල
පැදගත තැව තිස　　　ල
දෙදෙන සිදු මැද තික්ම යන ක　　　ල

මුනිවර දිසි සඳ　　　ක්
ලෙස දිසි ගුණෙන් එ උද　　　ක්
ඇති මෙන් තැනි කද　　　ක්
දුක නෙතින් මුනි යෝග බලය　　　ක්

මේ මොහොතින් මෙදි　　　ත
කුමරෙක් උපනහොත් දූ　　　ත
ගිය එන කල්ප තු　　　ත
යුක්ති නිපුනව කියයි සිතමි　　　ත

එමුනිවර වම තු　　　ට
පවසන තෙපුල් තිසි කො　　　ට
මච්ච කොංතිය හ　　　ට
සැපත සමහත් විදින විලස　　　ට

එබසසා එලඳු　　　ත
තුන් ගව් දුගඳ ඇතියෙ　　　ත
ඔබහට තිසි ලෙසි　　　ත
සරණ වෙම්මැයි කවර විලසී　　　ත

එ අසා එමුනිව　　　ර
එලඳගෙ ගතින් එක ව　　　ර
තුන් තුන් ගව් අත　　　ර
තික්ම විහිදෙන සුවඳ පිඩු ක　　　ර

එලඳුන් වෙත පව　　　ර
මුනි රති සැපත විදි ව　　　ර
වේද වියාස　　　ර
නැමැති කුමරෙක් උපනී වැරසැ　　　ර”

“මහා පතරංග ජාතකය පොත”

මච්චගන්ධි නොහොත් සත්‍යවතී නැමැති ඒ ගර්භිණී කුමරිය යමුනා නදියෙහි පිහිටි දූපතකදී පුත්‍ර ලාභයක් ලද්දිය. මෙම බිළිඳුත් කාලවර්ණව සහ දූපතක උත්පත්තිය ලත් හෙයින් හෙතෙම ක්‍රෘෂ්ණා ද්වීපායන යන විරුදාවලියක් ඇතුව වේද ව්‍යාසර් නොහොත් ව්‍යාස ඍෂිවරයා යයි කියන ලද්දේය.

වැඩි වයසට පත් කෘෂ්ණ ද්වීපායන හෙවත් ව්‍යාස මුනිවරයා සවකීය පියාණත්වූ පරාසර මුනිවරයා හා යන්ට පිටත්වී තම මෑණියන්වූ සත්‍යවතී නොහොත් මච්චකොන්තියගෙන් සමුගෙන, "මෑණියන් වහන්ස! ඔබට මා දකිමට ආශා කොයි යම් වේලාවක හෝ වේවා මගේ නම මතක් කළ පමණින් ඔබ ඉදිරියේ පෙනී සිටින්නෙමි" යයි පොරොන්දුවී පරාශර හා යන්ට ගියේය.

පරාශර මුණිවරයාගේ අධිෂ්ඨානයෙන් නැවතත් කන්‍යා භාවය ලැබ සිය ශරීරයෙන් සුගන්ධය වහනය වන මච්චගන්දිය හෙවත් සත්‍යවතිය තම පියරජුගේ මාළිගයට පෙරලා ගියාය.

## කුරුරට ශාන්තනු රජ මච්චගන්දි හෙවත් සත්‍යවතිය විවාහ කර ගැනීම.

කුරුරට බුවිපාලයාවූ ශාන්තනු නැමැති කුරුකුල රාජයා ජලයට අධිපති ගංගා දේවිය හා පළමු වරට විවාහ විය. ඕ තොමෝ සත් වරක්ම සුරදූතයන් වැනි පුතුන් සත් දෙනෙක් ශාන්තනු රජුට දාව වැදූ කෙනෙහිම මරුමුවට කැප කරණ ලදී.

අටවෙනිව උපන් කුමාරයාද ඇ විසින් මරන්ට තැත්කළ අවස්ථාවෙහි පිය රජු විසින් බල පූර්වකව ඒ ලේකැටි බිළිඳා රැක ගන්නා ලද්දේය.

මෙසට කෝපවූ ගංගා දේවි තොමෝ පුත්‍රයාද ගෙන අතුරුදහන් වූවාය. ශාන්තනු මිහිපල් තෙම පුත්‍රයා හා භාර්‍ය්‍යා වියෝගයෙන් දොම්නසට පත්වූයේ තම රාජ්‍යය හැරපියා තපෝ වනයට ගියේය.

ගංගා දේවිය තම අටවෙනි පුත් දේවව්‍රත කුමාරයන් යහතින් වඩා නානාප්‍රකාර ශිල්ප ප්‍රගුණ කරවා පුත් කුමරුවන් තපෝ වනයට කැඳවා ගොස් පිය රජු හට භාර කළාය.

ඉක්බිති බුම්පල් තෙමේ සකල කලා දත් මනා රූප සම්පන්න පුත් කුමරුන් කැටුව ස්වකීය ජනපදයට පැමිණ තම ප්‍රධානීන් හා බන්ධු මිත්‍රාදීන් ඉදිරියේ මහත්වූ උත්සවයෙන් දේවව්‍රත පුත් කුමරුන් කුරුරට යුවරාජ වශයෙන් ඔටුණු පළඳවන ලදී.

එක් දවසක් මිස්මරණ ධාන්‍ය සත්‍යවතී තොහොත් මච්ඡගන්ධී කුමරිය යමුනා ගංගාව සමීපයේ යම් කිසි කාර්‍ය්‍යක යෙදී සිටින අතර ඒ අසලට අහම්බෙන් මෙන් ශාන්තනු නරේන්ද්‍ර තෙම දඩකෙළියෙහි ගියෙන් සත්‍යවතී කුමරියගේ ශරීරයෙන් වහනය වන සුමිහිරි පරිමලය වැද ඔබ මොබ බලනුයේ සුදු පිළියෙන් සැරසුනු දෙවඟනක් බඳු සත්‍යවතී කුමරිය දුටුවේය.

ඈය වනාහි මසුන් මරන්නන්ගේ නායක දාස රජුගේ දියනියන් බව දැනගත් මිහිපල් තෙම අභිරූපී ඈ කෙරෙහි ඇලුම් ඇතිවූයේ ඇයව් සරණ විවාරීම පිණිස දාස රාජයන් කරා නික්ම ගියේය.

දාස රජ මහත් ගෞරවයෙන් ශාන්තනු රජුව පිළිගෙන ආ නතු විමසීමෙන් පසු, ශාන්තනු රජු දාස රජුගේ දියනිය තමාට පාවා දෙන ලෙස ඉල්ලීය දාස රජ මේ ඉල්ලීමට තම සතුට ප්‍රකාශ කරමින් "මහ රජානනි!

මගේ දියනිය ඔබ ආවාහ කර ගන්නේ නම් ඔබ වහන්සේගේ ඇවෑමෙන් කුරුරට සිංහාසනය මං දියනියන්ගෙන් ලැබෙන පුත්‍ර කුමාරයින්ට හිමිවිය යුතුසේ දිවිරිය යුතු"යයි කීවේය.

කුරුරට සිංහාසනයට සම්ප්‍රකාරයෙන්ම යෝග්‍යවූ පුත්‍ර රත්නයක් සිටියදී මෙබඳු දෙයක් කෙසේ කරම්දැයි අභිමතයෙන් දුර්මුඛවූ ශාන්තනු රජ පෙරළා හස්තිනා පුරයට ගියේය.

ධීවර රාජ දුහිතෘවූ රූප ශ්‍රීයෙන් සමලංකෘත සත්‍යවතී හෙවත් මච්චගන්ධි කුමරිය තමහට පාවාගැනීමට නොලත් ශාන්තනු රජ තෙම වියෝදුකින් පසුවෙන බව දැනගත් යුව රාජ දේවව්‍රත තෙම, පිය රජුගේ කනස්සල්ල සන්සිඳුවනු වස් තම රාජවංශික දෙටුවන් සමූහයක් කැටුව ධීවර රාජයන් වෙත එළඹ ධීවර කන්‍යාව තම පියරජුට පාවා දෙන මෙන් ඉල්ලා සිටියේය.

ධීවර ශ්‍රේෂ්ඨ දාස රජතෙම දෙවව්‍රත යුව රාජයා හට ආචාර සම්පත්තව ආමන්ත්‍රන්‍ය කොට "භරත කුල ශ්‍රේෂ්ඨයානනි" මගේ දුහිතෘව ඔබ පියාහට පානිග්‍රහණය කොට එක්සිත්ව දෙන්නෙමි. එහෙත් ඇසුව මැනව. ඇගේ පුත්‍රයින්ට කුරුරට සිංහාසනය උරුම වන අටියෙන් ඔබ විසින් දිවිරුම් දියයුතුයයි" ප්‍රකාශ කෙළේය.

මස්මරණ රජුගේ අභිමතය වැටහුනු දේවව්‍රත යුවරජ පිළිතුරු දෙනුයේ "එම්බා සත්‍යවාදි ධීවර රාජයානනි! මාගේ සත්‍යවූ වාක්‍යය ශ්‍රවණය කරත්වා. ඔබ දුහිතෘවගේ ගර්භයෙන් වදගන්නා තැනැත්තේම කුරුරට භාරතයින්ගේ සහ මගේද රජ වන්නේය"යි දිවිරුම් දුන්නේය.

මෙය ඇසූ දාස රජ තෙම මහත් පුදුමයට සහ ප්‍රීතියට පැමිණ ශාන්තනු රජු උදෙසා සිය රූප ගුන සම්පන්න සත්‍යවතී නොහොත් මච්චගන්ධි දූ කුමරිය

දේවව්‍රත යුව රාජයානන් හට භාර කෙළේය. දේවව්‍රත කුමාර තෙම මස්මරණ තරුණ සාන්තාව රථයෙහි හිඳුවාගත සපිරිවරින් හස්තිනා පුරයට ගොස් පිය රාජයන් හට ඒ සත්‍යවති නොහොත් මච්ඡගන්දි කුමරිය භාර දුන් කළ ශාන්තනු රජතෙම අපමන ප්‍රීතියට පත්ව ස්වකීය පුත්‍රයාට ආශිර්වාද කෙළේය.

මේ උතුම්වූ කාය්‍ය්‍ය කරණකොට ගෙන දේවව්‍රත කුමාරයෝ "භීෂ්ම" යන නාමයෙන් ලෙව්හි ප්‍රකට වූයේය. ශාන්තනු රජ චාරිත්‍ර නොයික්මවා සත්‍යවතී කුමරිය විවාහ කොට ගත්තේය.

## විශේෂ විභාග

*කෞරව නොහොත් කුරුකුල වංශ වතුන්ගේ මුල් මෑණියන් වන මෙම මච්ඡකොනන, මච්ඡගන්දි, නොහොත් සත්‍යවති බිසව වනාහී යමුනා ගංගා ජලයෙහි පතිතවූ ධාතුවක් කරණකොට ගෙන මත්ස්‍යයෙකු කුසින් උප්පත්තිය ලත් බව මහා භාරතයේ සඳහන්ව තිබේ මෙය කිසිසේත් ඇදහිය නොහැකි අද්භූත කථාවකි.

මෑ තොමෝ කුරු රටට යාබද රාජධානියක්වූ මත්ස්‍ය රට මත්ස්‍ය රජුගේ දියනි කෙනෙක් හෝ මහා

---

*කුරුරට කේවට්ට මච්ඡගන්දි බිසෝගේ සහ කුරුරට ශාන්තනු රාජයාගේත් දරු මුනුබුරු පිරිස වනාහී "කෞරව වංසත්වය සත්‍යමයවූ පුණ්‍යමයවූ මංගලමයවූ ශ්‍රීමත් රාජ වංශයෙහි ශ්‍රෙෂ්ඨවූ කුරු වංශය- කලියුගයට මුලින් ද්වාපරයුග කාලයේදී සූර්‍ය්‍යවංශයෙහි කුරුරජ්ජුරුවෝය යන නාමයෙන් එක්තරා රජෙක් වූයේය. ඒ කුරු රජ්ජුරුවන්ගේ දරු මුනුබුරෝය යන අර්ථයෙහි අන්ප්‍රත්‍යය කළ කල්හි කුරුගෙන් පැවතෙන්නන් හට "කෞරව' නාමය සෑදුනේය. (සිද්ධාන්ත කෞමුදීය)

භාරතයේ සඵාත කිපයකම සඳහන් ප්‍රකාර මස් මරණ පිරිසට ප්‍රධාන දූස රජුගේම සහ-ජාත දියනියක් වියයුතුය. කාව්‍යව අලංකාර කරණ අන්දමින් පසු කාලයේ මහාභාරතයට අමුතු කරුණු සම්බන්ධ කල බමුණු ආචාරීන් විසින් මෙම ඓශ්වර්‍යයීමත් උපත ලියන්ට ඇතැයි සිතිය හැක.

ඈත අතීතයේ දක්වෙන මත්ස්‍ය දේශයට වර්තමාන කාලයේ ¶අල්වාර් රාජධානියයි කියනු ලැබේ රාජපුතානාවෙ පිහිටි මෙම රට වාසීන්ට සමහර ද්‍රවිඩ පොත්වල මීනවන්, මීනවර්, යනාදී නාම සඳහන් කර තිබෙන බව ඇසිමු. ගරුඩ පක්ෂියා බැඳි කොඩිය ඇතැම් රාජපුතානා ක්ෂත්‍රියන්ට අයිතිය.

## කෞරව නොහොත් කුරුකුලය.

ඉන් ඉක්බිති ශාන්තානු රජුට දුව මච්චගන්දි හෙවත් සත්‍යවති බිසව් පුත්‍රයින් දෙදෙනකු වැදුවාය. වල්ලභ කුමරු චිත්‍රාංගද නම් වූය. කණිටු කුමරු විචිත්‍රවීර්‍යයී නම් වූයේය පිය රජු ස්වර්ගස්ථවූ පසු භීෂ්මා යුවරජු විසින් තම සුළුමෑණියන් වන සත්‍යවති නොහොත් මච්චගන්දි දේවියගේ සම්මතයෙන්, චිත්‍රාංගද කුමරු හස්තිනා පුරයෙහි සිංහාසනාරූඪ කරණ ලද්දේය. ඔහු ගාන්ධර්වයෙකු හා සටනට ගොස් මළේය.

---

¶ஆழ்வார் – கருடன்
ආල්වාර් – ගරුඩන් (ගුරුළා)
(යාල්පානම් පෙයර්කරාදි 95 පිටුව)

குருகூர் } ஆழ்வர் திருநகரி
குருகை }
කුරුකූර් } අල්වාර් තිරුනගරය මින රට
කුරුකෛ }
(යාල්පානම් පෙයරකාරාදි 316 පිටුව)

ඔහුගේ බෑසත් වන විචිත්‍රවීර්‍ය කුමරු කාශිරට නරේන්ද්‍රයන්ගේ දියනිවරුන්වූ අම්බිකා සහ අම්බාලිකා යන කුමරියන් දෙදෙන පාණිග්‍රහණය කොට වංශය රක්නා පිණිස බාල අවස්ථාවේම හස්තිනා පුර රජ බවට පත්විය. එහෙත් අධික ස්ත්‍රී සමාගමය හේතුකොටගෙන රාජයක්ෂ්මා රෝගය වැළඳී ඔහු තරුණ වියෙහිදීම මළේය.

බිසෝවරු දෙදෙනෙකු පාවාගත් විචිත්‍රවීර්‍ය රජුට පුත්‍ර පුත්‍රී ඈ කිසිවෙක් නොසිටි බැවින් කුරුකුල හෙවත් කෞරව වංශයේ බෝවීම මෙසින් කෙළවර වීමට යන බැව් හැඟිගය මච්චගන්දි දේවිය තම හිමි ශාන්තනු රජුගේ පළමු විවාහයේ පුත්‍රවූ භීෂ්මා කුමරුට කථාකොට එකල පැවති උසස් චාරිත්‍රවල අනුමට භීෂ්මා කුමරුගේ මලණුවන් වන විචිත්‍රවීර්‍ය රජුගේ වැන්දඹු බිසවුන් දෙදෙන සරණ පාවාගන කුරු වංශයේ දියුණුව ගෙනයන ලෙස ඉල්ලා සිටියේය.

එවිට භීෂ්මා කුමරු තම සුළුමෑණියන් වන සත්‍යවතී බිසවගේ පියාතන් වන දාස රජු හා කුරුරට ඔවුන්නට උරුමක්පාඩු නොතැබීමේ පොරොන්දුවපිට කළ දිවුරුම මෙහෙදී මතක්කරමින්, "මෑණියන් වහන්ස, මගේ දිවුරුම කඩකල නොහැක්කේය. පෘථිවිය ගන්ධ ගුණය අත්හැර දැමුවත්, ජලය මධුරාදි සිසිල් රසය අත්හැර දැමුවත් වාතය ස්පර්ශ ගුණය අත්හැර දැමුවත්, සූර්‍ය්‍යයා ඔහුගේ තේජස් ගුණය අත්හැර දැමුවත්, අවකාශය ශබ්ද ගුණය අත්හැර දැමුවත්, අග්නිය උෂ්ණ ගුනය අත්හැර දැමුවත්, චන්ද්‍රයා සිසිල් ගුණය අත්හැර දැමුවත්, මගේ දිවුරුම කිසිකලෙකත් නොකඩන්නෙමි, ඒ මා වැන්නන්ට තරම් නොවේය,"යයි පැවසුවේය.

පැමිණී තිබෙන බාධාවන් මෙසේ වෙතත් කෞරව වංශයේ බෝවීම කෙසේ හෝ ගෙණ යායුතු බැව් මෙනෙහි කළ සත්‍යවතී බිසෝ තොමෝ භීෂ්මා කුමරුගේද සම්මතය

ඇතුව තමා විසින් පරාශර මුණිවරයාට දැව ලත් කුලුදුල් පුත්‍ර §ව්‍යාස මුණිවරයාව ගෙන්වීම පිණිස ඔහුව මතක්කෙලේය. මවගේ අධිෂ්ඨානය ප්‍රකාර ව්‍යාස මුණි වහා හි පැමිණියේය.

සවකීය මැණියන්ගේ නියෝගය පරිදි ව්‍යාස මුණි ඕය වැඩිමහලු නැතත්ඩියවූ වැන්දඹු *අම්බිකා බිසව කරා එළඹියේය. එවිට ඈ තොමෝ ඔහුගේ බිය ජනක රූපය දැක බියෙන් නැතිගෙන ඇස් දෙක පියාගත්තීය. ඉන්නිසා ඈ හට අන්ධ පුත්‍රයෙක් ලැබිත. හේ ධෘතරාෂ්ට්‍ර නමින් ප්‍රසිඬවිය.

ව්‍යාස මුණි තෙම දෙවන වරට අතික් නැතන්ඩියවූ අම්බාලිකා බිසව වෙත එළඹියේය. ඕ තොමෝ ව්‍යාස කෙරෙහි උපන් භය කාරණකොටගෙන ඇගේ සකල ශරීරය වෙව්ලා පඬුවන් හෙවත් සුදුමැලි පාටවිය. ඒ හේතුවෙන් ඈ ලත් පුත්‍රයා පාණ්ඩු පාට තොහොත් "ඇලි" බිළිදෙක් විය. ඔහු පාණ්ඩු කුමාර යයි ප්‍රකට වූයේය.

---

§ව්‍යාස මුණි:- බ්‍රහ්මපුරාණය, පද්මපුරාණය, විෂ්ණු පුරාණය, ශිවපුරාණය, භගවත්පුරාණය, බ්‍රහ්ම වෛවර්ත පුරාණය, මාර්කණ්ඩපුරාණය, අග්නිපුරාණය, වාමනපුරාණය කූර්මපුරාණය, මත්ස්‍යපුරාණය, ගරුඩපුරාණය, බ්‍රහ්මාණ්ඩ පුරාණය, යනාදි පුරාණ 18 ක් ලියා තිබේ.

*"දරුවන් නැති වැන්දඹු තරුණ කාන්තාවකට සවකීය පුරුෂයාගේ සහෝදරයකු හෝ අන්‍ය ඇවැස්ස නෑයෙකු හෝ සමඟ වාසයකොට තම පුරුෂයා වෙනුවෙන් දරුවන් උපදවා ගැණීමට ව්‍යවස්ථාවක් ඉන්දියාවේ පැවතුනේය මේ චාරිත්‍රයට "නියෝග" යයි කියන ලදී. මෙසේ උපන් පුත්‍රයින් හට "ක්ෂේත්‍රජ" යයි නම් වූහ.

(ඥාන දශීය)

තුන්වන වරට සවඝිය මැණියන් විසින් නිදහස් කර එවන ලද ශූද්‍ර හෙවත් සංකර වර්ණයේ දාසිය වෙත ව්‍යාස මුණි පැමිණියේය. සවඝිය සවාමි දුවගේ පුත්‍රරත්නය විසින් ඇව පාවා ගැණීමේ ගරුත්වයත් ලාභයත් ශුභ කටයුත්තක් ලෙස සිතා ප්‍රීතියෙන් ප්‍රමුදිතව සිටි ඕ තොමෝ මනා රූප සිරියෙන් හෙබි ඥානවත් පුත්‍රයෙකු ප්‍රසූත කළාය. ඔහු ‡කුරුරම විදුර පණ්ඩිත නමින් පසිද්ධ වූයේය.

ඉක්බිති වැඩුමහල් ධෘතරාෂ්ට්‍ර කුමරු †ගාන්ධාර දේශයේ සුබල රජුගේ දුහිතෘවූ ⱷගාන්ධාරී නම් උතුම් කුමරිය් ආවාහ කෙළේය. ඕතොමෝ දුර්යෝධන සහ දුශ්ශාසන ආදී පුතුන් සියයක්ද එකම දුහිතෘවූ දුශ්ශාලා කුමරියද ප්‍රසූත කළාය. දුර්යෝධන සහ දුඃශාසන යනාදී සහෝදරසින් සියල්ලෝම ඔවුන්ගේ මුත්තනුවන් කෙනෙකුවූ කුරුරජුගේ නාමයෙන් තම වශීයා කුරුකුලයෝය, කෞරවයෝය, කුරුවංශිකයෝය, යි කියාගත්තෝය.

පාණ්ඩු කුමාරයෝ කෞන්තය, කුංති හෙවත් පෘථා සහ මාද්‍රි යන කුමරියන් දෙදෙන ආවාහකොට ගෙන වසනුයේ; එක්තරා මෘග අවතාරය ගත් ඍෂිවරයෙකුගේ

---

‡පෙර සිට පැවති කුරුරට ඉදිපත් නුව ර
එපුර රජ කරණ කෝරව්‍ය රජව ර
පවර දස දහමයෙන් රජ කරණ ව ර
කුරරට වසන පණ්ඩිත කෙනෙකිය විදු ර
(විදුර ජාතකය - විමසියයුතුයි)

†ගාන්ධාර දේශයේ රජුන්ට දමිළ භාෂාවෙන් "குருநில மன்னன்" "කුරුතිල මන්නන්" යයි කියති.

කුරු - කෞරව
තිල - චන්ද්‍රයා
මන්නන් - මහීපාල, රජ යනුයි.
"කුරු චන්ද්‍ර රාජයා" යන තේරුමයි

ⱷගාන්ධාරි–කුරුනී, කරංවෙ සත්‍රී, යනුයි.

ශාපය හේතුකොට ගෙන තම බිසෝවරුන් දෙදෙන නොහැඳින විසුවේය. ඉන්නිසා කෞන්තය හෙවත් කුංතී බිසව, ධර්මදේවයාගේ අනුහසින් යුධිෂ්ඨිර කුමාරයාද වායු දේවයාගේ ආශීර්වාදයෙන් භීමසේන කුමරුද ඉන්ද්‍ර දේවයාගේ සරණින් අර්ජුන කුමාරයාද ප්‍රසූත කෙළේය.

තවද කෞන්තය බිසෝගේ යැදුම් පිදුම් කරණකොට ගෙන *අශ්වින් නැමැති දේවතාවාගේ පිළිසරණින් මාද්‍රි දේවියට නකුල සහ සහදේව යන නිඹුල් පුත්‍රයින් දෙදෙනෙකු ලැබුනාය. මේ කුමාරයන් පස්දෙන සවකීය පියාගේ නාමයවූ පාණ්ඩු නමින් පෙනී සිටියෝය. මොවුන් හට පංච පාණ්ඩ්‍යවරයෝ යයිද කියන ලද්දේය.

පංච පාණ්ඩ්‍යවරයෝ වනාහි වාසුදේවගේ නැගණියන්වූ කෞන්තය නොහොත් පෘථා දේවියගේ පුත්‍රයින් වන්නෝය. විෂ්ණුගේ අවතාරය ගත් කෘෂ්ණා සහ ඔහුගේ බෑයන් වන බලරාමාත් යන දෙදෙන වාසුදේවගේ පුත්‍රයින් වූහ. මේනයින් පංච පාණ්ඩ්‍යවරු සහ එක සීයක් කෞරවයින්ද කෘෂ්ණ සහ බලරාමා ගේත් මස්සිනාලාවූහ.

ලෝක ප්‍රසිඩ මහා භාරත ඉතිහාසයෙහි කතීවූ වේද ව්‍යාසර් සෘෂි තෙම මේ කෞරව සහ පාණ්ඩ්‍යවරයන්ගේ ලේ ධාරාව හිමි මුත්තණුවෝය. හෙතෙම වනාහි මිනකුල මච්චගන්දි නොහොත් සත්‍යවතී දේවියගේ වැඩිමහලු පුතණුවෝය.

## කුරුරට හස්තිනා පුර ආණ්ඩුව සහ යුඩය.

කුරුරට හෙවත් හස්තිනා පුරයෙහි රාජ්‍ය කළ කෞරව වංශික ශාන්තනු රජුගේ ඇවෑමෙන් ධෘතරාෂ්ට්‍ර

*අශ්විත් දේවතාවා – අඩියක් මිනිස් ශරීරයද අඩියක් අශව ශරීරයෙන්ද යුත් දේවතාවා

කුමාරයා රාජ්‍යයට වල්ලභයාව සිටියේවී නුමුත් තමා අන්ධ හෙයින් රජකම ස්වකීය සොහොයුරාවූ පාණ්ඩු කුමාරයාට භාර කෙළේය.

පාණ්ඩු රජ තෙම බල සම්පන්න රජෙක්ව කලක් රාජ්‍ය කොට විඩාවට පත්ව රාජ්‍ය හැරපියා තමාගේ ප්‍රියකරු ක්‍රීඩාවක්වූ දඩයම පිණිස හිමාල වනයට පිවිසියේය. එවිට ධෘතරාෂ්ට්‍ර කුමරු රාජ්‍ය පාලනය පටන්ගෙන තමා අන්ධ හෙයින් ස්වකීය ලොකු පියානන්වූ ශාන්තනු රජුට දාව ගංගා දේවිය කුසින් ඔත් භීෂ්මා කුමරු ලවා රාජ්‍ය කටයුතුද ස්වකීය දරුවන් ශිල්ප ශාස්ත්‍රයෙහි හික්මවීමද කරවූයේය. කලකට පසු පාණ්ඩු රජ මළේය. එවිට ඔහුගේ දේවියවූ කුන්ති, කෞන්තය, හෙවත් පෘථා, තම දරුවන් පස්දෙනාට ධෘතරාෂ්ට්‍ර රජුගේ දරුවන් සමග ශාස්ත්‍රෝද්ග්‍රහණය කරවීම පිණිස ඔවුන් රැගෙන ධෘතරාෂ්ට්‍ර රජු සමීපයට ගියාය.

කුන්ති දේවියගේ පුත්‍ර පාණ්ඩව කුමාරවරුන් වනාහි ධෘතරාෂ්ට්‍ර රජුගේ කුමාරවරුන්ට වඩා ඉගෙණීමෙහි දක්ෂවූ හෙයින් දුර්යෝධන කුමාරයා ඔවුන් කෙරෙහි ඊර්ෂ්‍යා බැඳ වස විස දීමෙන් හා ආයුධ සරඹ දැක්වීමෙන් ඔවුන් විනාශ කිරීමට තැත්කෙළේය. ඉක්බිති කෞරවයින්ට ගුරුවරයාව සිටි ද්‍රෝණ නම් බමුණාගේ උපදෙසින් ඔව්හු සමගිවූහ. මේ කාලයේදී ඒ බමුණාට පංචාල දේශයේ ද්‍රැපද රජු විසින් කරණ ලද අවමානයක් නිසා ඒ රජුට විරුද්ධව යුද්ධයට යාමට ඔහු ඒ කුමාරවරුන් පොළඹවන ලදින් යුද්ධාරම්භ කොට කෞරව කුමාරවරුන්ගේ සහ විශෙෂයෙන්ම පාණ්ඩව කුමාරවරුන්ගේ ආධාරයෙන් ඒ රජ පරදවනලදී.

මේ නිසා ධෘතරාෂ්ට්‍ර රජ ස්වකීය පුත් දුර්යෝධන කුමරාට රාජ්‍යය නොදී තම සොහොයුරු පාණ්ඩු රජුගේ පුත්‍රවූද සිය ඥාති පුත්‍රවූද යුධිෂ්ඨිර කුමරාට රාජ්‍යය භාරදීමට නියම් කර ගත්තේය. එවිට දුර්යෝධන කුමරු

තම ඥාති සහෝදරයින් දවා විනාශ කිරීමට නැවත උත්සාහ කෙළේය. මෙයින්ද ඔව්හු ගැලවුනාවූ යාචක බ්‍රාහ්මණ වෙස්ගෙන වනයට වැද සැඟවී සිටීම සෙහෙකැයි සිතා එසේ කළෝය.

ස්වල්ප කලකට පසු *පංචාල දේශයේ ද්‍රුපද රජු ක්‍රීඩා යුද්ධයක් පවත්වා ඉන් අති දක්ෂවූවාහට ස්වයංවර විධියෙන් තම දූ කුමරියවූ ද්‍රෞපදිය සරණ පාවා දෙන බැව් ප්‍රකාශ කරණ ලදින් ඔව්හු ඒ බැව් ව්‍යාස සෘෂින් අතින් අසා ඊට සැරසී ගියෝය. ඒ කුමරිය අති දක්ෂකම්පෑ අර්ජුන කුමරුහට පාවා දෙන ලද්දීය. එහෙත් පාණ්ඩව-යන්ගේ මවගේ එක් කීමක් නිසා ඈ ඔවුන් පස්දෙනාගේම භාර්‍යාව වූවාය. ඉක්බිති කෞරවයෝද පාණ්ඩවයෝද සමඟි වූවෝ. කෞරවයෝ ‡හස්තිනා පුරය අග්‍ර රාජධානිය කොටද පාණ්ඩවයෝ §ඛාණ්ඩව ප්‍රස්ථය අග්‍ර රාජධානිය කොටද ගෙණ රාජ්‍ය කිරීමට නියම කරගෙණ එසේ කළෝය. පාණ්ඩව ජ්‍යෙෂ්ඨ කුමාරයාවූ යුධිෂ්ඨිර තෙම චතාහි රාජ්‍යය පාලනය අතිස එලාංකාරයෙන් සිඩ කලේ රාජසූය නම් යාගය කොට අගරජ තනතුර ලැබීමට ප්‍රාර්ථණාකොට ඒ කටයුත්ත ඉතා ගරු ගම්භීරාංකාරයෙන් සිදුකෙළේය. පසුව යුධිෂ්ඨිර රජ තම බාප්පා වන විදුර පඬිතුමාගේද අවසරය ඇතුව දුර්යෝධන රජු සමග දූ කෙළ පැරද තමාගේ රාජ්‍යයද ධනයද සාධාරණ භාර්‍යාවවූ ද්‍රෞපදී දේවියද යනාදී සියල්ල නැතිකරගත්තේය. දහතුන් වරුෂයක් විදේශිව සිටීමට ගිවිසියෝ නම් ඉක්බිති ඔවුන්ගේ රාජ්‍යය ඔවුන්ට පෙරළා දීමට දුර්යෝධන රජු සතුටුවූයේය

*පංචාලදේශය – වර්තමාන පංජාබ් ජනපදය

‡ඛාණ්ඩව ප්‍රස්ථය – දැනට අළුත් දිල්ලි නගරය මෙය යමුනා ගංගා තීරයෙහි පිහිටියේය.

§හස්තිනා පුරය – පරණ දිල්ලි නගරයේ (පුරාණ ඉඳිපත් නුවර) සිට මයිල 65 ක් පමණ ඊශාණ දිගින් ගංගා නම් ගං ඉවුරබඩ පිහිටා තිබුනේය. මෙය කුරුකුලයින්ගේ අග නුවර විය.

එබැවින් ඔව්හු දහතුන් වර්ෂයක් විදේශීව මත්ස්‍ය දේශයේ විරාට නරපතිහුට මෙහෙකරමින් වසත්නෝ අන්තිමයේදී දුර්යෝධන රජ ඒ රජුට පහරදීමට තැත්කල කාලයෙහි ඔහු ආරක්‍ෂා කරගත්තාහුය. මේ නිසා ‡විරාට රජ අර්ජුනා කුමරුගේ පුත් අභිමාන්‍ය කුමරුට උත්තරා නම් සවකිය දූ කුමරිය සරණ පාවා දුන්නේය.

ඒ තෙළෙස් වර්ෂය ඉක්ම ගිය පසු පාණ්ඩ්‍යවයෝ සවකිය රාජ්‍යය පෙරළා ඉල්ලා, පළමු කොට කුඩා නගරවල් පහක් ලදහොත් සතුටු වන්නෙමු යයි කියා සිට පසුව කුරුක්‍ෂෙත්‍ර නම් ඈම භූමියේදී යුඩ කොට රාජ්‍යය ලබා ගැණුම් වස් නිශ්චය කරගෙන යුඩාරම්භ කළෝය.

කුරුක්‍ෂෙත්‍රයෙහි දහඅට දවසක් පැවතුන මේ මහා සංග්‍රාමයට එකළ දඹදිව සිටි සියලුම රජවරු පෘගේ මේ සටනට සහභාගිවී තිබුන බව මහා භාරතයෙන් හෙළි වන්නේය. මෙයින් *මාරක රටේ මහ බලසම්පන්න කෘෂ්ණා රජ පාණ්ඩ්‍යවයන්ගේ පක්‍ෂයටත් මගධ රට රජ්ජුරුවෝ සුදු පුරුදු හස්තින් දස දහසක් සමග කෞරව යන්ගේ පක්‍ෂයටත් බැඳී සිටි බව දක්වා ඇත්තේය.

එක ලේ ධාරාවෙන් ඉපිද එකම පියස්ස යට හැදී වැඩී සිටි කුරුකුලයෝය. පාණ්ඩ්‍යවරයෝය නැමැති මේ

---

‡මත්ස්‍යදෙශයේ විරාට නම් මත්ස්‍ය රජුගේ දූ කුමාරි යවූ උත්තරාව කුරුවංශික අභිමාන්‍ය කුමරුට පාවා දී තිබෙන බැවින් මත්ස්‍යයෝ සහ කෞරවයෝද බන්ධුවරයෝ වෙති. මත්ස්‍යයෝ චන්‍ද්‍රා වංශිකයෝය. ඔවුන්හට දමිල භාෂාවෙන් මීනවන් යන නාමය කියති.

*"සටනිය දවස මාරවතී නුවර රජ කළ කෘෂ්ණා යණ ගෝත්‍රයේ උපන් දස බෑ රජ්ජුරුවන්ට වැඩි මාලු වාසුදේව රජ්ජුරුවෝ නුවරින් නික්ම උයන්කෙළියට යන්නාහු"
(ගිරා සැළලිහිණි දෙබස – උම්මග්ග ජාතකය)

සහෝදර පිරිස අතර කුරුරට සිංහාසනය ජය ගැනුම් වස් සිදුවූ භයානක සටනින් ලක්‍ෂ සංඛ්‍යාත වීරයින් සමූහයක් විනාශ මුඛයට පත්වූවෝය.

සටන කෙළවර පාණ්ඩ්‍යවයෝ විජය ග්‍රහණයට පත්වූ නමුත් ඒ ඔවුන්ගේ වීර භාවයෙන් නොව ඔවුන්ගේ ආධාරයට බැඳී සිටි දෙවි දේවනාවුන්ගේ කපටිකමින් බැව් මහා භාරතය ඔඩ්‍යස්තාව කියවන්නෙකුට මනාව අවබෝධ වන්නේය.

භීමසේන බියගුල්ලෙකු ලෙසද දුර්යෝධන වීරයෙකු ලෙසද නොබා සටන් කළ බැව් පාණ්ඩ්‍යව පස ගෙන සිටි කෘෂ්ණ දේවයන්ගේ බෑයා වන බලරාමා විසින්ද කුරු ක්‍ෂෙත්‍රයෙහිදී ප්‍රකාශ කෙළේය. යුධිෂ්ඨිර බොරුකාරයෙකු ලෙසද, පාණ්ඩ්‍යවයින් හා ඔවුන්ගේ මිත්‍ර පක්‍ෂය රාජ වංශිකයින් අතර පවත්නා යුධ නීතියට අවමාන්නය ගෙන දෙන අඳමින් සටන් කරන්නෝ යසිද ඔවුන් හට නින්‍ද කරමින් "කෞරවයෝ වනාහී නීති ගරුක භීම වික්‍රමයෝය"යි පසසමින්ද රණදෙණියෙන් ඉවත්ව ගිය බැව් බලරාමාගේ කථාවෙන් එළිදරව් වන්නේය.

මේ මහා සංග්‍රාමයේදී ඍජුව ඉදිරියට මූණ පා ගොස් නියම වීරයින් වශයෙන් සටනට වැදුනු කුරුකුලයෝ පරාජයවූයේවී නමුත් ඔවුන්ගේ නිර්භීත භාවය ගැනත් නීතිගරුක භාවය ගැනත් මහා භාරතය සාක්‍ෂි දෙන්නේය.

★★
★★

භිෂ්මා, දුර්යොධනා, ‡කාණීකුමාර, දුඃශාසනා, ද්‍රෝණ, ශල්‍ය ආදි කුරුකුල ප්‍රධාන වීරයින්ද ඔවුන්ගේ දරු මුනුබුරන්ද යුධ භටයින්ද අනිකුත් යහළු මිත්‍රාදී රජදරුවන් සහ සේනාවන්ද බොහෝ රාශියක් මේ සටනින් මැරුම්කෑවෝ වූහ. එමේන්ම පංච පාණ්ඩ්‍යවයින්ගේ පුතුන් පස්දෙනද ඔවුන්ගේ පක්ෂයට බැඳී සිටි සමහර හේවායන් සහිත රජවරුන්ද විනාශවූය.

ඔවුන්ගේ ඇඹේණියන් බොහෝ දෙනෙක් මළාවූ තම පුරුෂයින්ගේ ලෙයින් තෙත්වූ දීර්ඝ කේශ කලාපයන් සිනිඳු ඇඟිලිවලින් අල්වා ගුටිකර ගැටගත්වා රුධිරයෙන් නෑවූ හිස් ගෙඩි තම තම උකුලුම්න තබාගෙන නා නා ප්‍රකාර අඳමේ ලය කකියවන විලාප කියමින් හැඬුවෝය.

කඩු, හෙල්, තෝමර, තණ්ඩායුද, ඊශර යනාදි පහර ලැබ ඒ ඒ තැන වැටුණ ඇත් අස් හා පාබල සේනාවන්ගේ මෘත ශරීර මත වංඩිවූ උකුසු, රාජාලි, කොක් යනාදි මාංශ ලෝභී පක්ෂී වර්ගයා මිනී සිරුරු කඩ කඩා කමින් ලෙයින් පෙරෙන අංකුස බඳු හොටවලින් සහ ශක්තිමත් පියාපත් ආධාර කොට ගෙන ද ඔවුනොවුන් අතර පහරදීගැනීම ඒ යුදපිටියේ දකින්ට ඇතිවිය.

‡කාණී කුමාර – යුධිෂ්ඨිර, භීමසේන, අර්ජුන, නැමැති පාණ්ඩ්‍යවර නොහොත් කුරුකුල කුමාරයින්ගේ මෑණියන් වන කෞන්තය, කුංතී හෙවත් පෘථා බිසෝ තරුණ අවස්ථාවේ සූර්‍යදේවාශ්‍රිවාදයෙන් ප්‍රසූත කළ කුළුදුල් පුත්‍රයාය අවිවාහකව සිටියදී උපන් මෙම කුමරු තම කුලයේ ගරුත්වය රැක ගැනීම උදෙසා ගංගාවෙහි දමන ලදින් ඒ දුටු අධිරථ රථාචාර්යයා මේ බිළිඳු ඇති දැඩි කරගත්හ. මොහු කෞරව පක්ෂය ගෙන සිටියෙකි. මොහුගේ නාමයෙන් පෙනී සිටින කාරාව කුලයේ සම්හර දෙනෙක් "කාණීසූරියගේ" "කාණිකුමාරගේ" "කාණීසූරිය පටබැඳිගේ" යන නාමාවලි යෙන් මේ දක්වා ප්‍රසිඩව සිටිති. උඩුගම්පොල හෙනරත්ගොඩ පලාත්වල මේ පරම්පරාවේ අය සිටිති.

කෑදර රුදු පක්ෂීන්ගෙන්ද මාංශ භක්ෂණයෙහි ලොල් ශෘගයින්ගෙන්ද තම තම ඥාතීන්ගේ මෘත ශරීරයන් ගොදුරුබවට පත්වීම වැලැක්වීම පිණිස එහි සිටි පාණ්ඩ්‍ය වරයෝය, කෞරවයෝය යනාදීන් ඒ ඒ සතුන්ගේ වදසට ප්‍රකෝපව ඔවුන්වෙත ගල් මුල් ගසමින්ද ආක්‍රෝශ පරිභව කරමින්ද අමු සොහොනක් බඳු ඒ කුරුක්ෂේත්‍රය තුල තා තාප්‍රකාර විලාසයෙන් හැසුරුනෝය,

ඒ අතර රාක්ෂ හා පිශාචයින්ද සමූහ වශයෙන් මෘත ශරීර අතර භයානක විලාස ගෙන හොල්මන් කරන්ට වන. මිනී දුර්ගන්ධය ආග්‍රහණවූ ගිජු සිවල් කැලන් කෙළ හැලි හැලි දිව් එල්ල එල්ලා මිනී මාංස කෑමට මානබලමින් රණ භූමිය හාත්පස පිහිටි මූකලන් තුලින් මිනීකඳන් දෙස එබි එබී බලා උන්නේය.

විජය ග්‍රහණයට පත් පාණ්ඩ්‍ය වරයින්ගේ පක්ෂය ගත් විෂ්ණුගේ අවතාරය ගෙන සිටි ඩාරක රටේ රාජයාවූ ක්‍රෘෂ්ණ තෙම ඒ කෞරවයින්ගේ සහ පාණ්ඩ්‍යවරයින්ගේත් කුරුක්ෂේත්‍රය නම් ලත් යුධ භූමිය දෙස ඇස් යොමා එකී රණපිටිය හාත්පස විසිරී තිබුන බෙහෙවින් කුරුකුලයින්ගේ සුන්බුන් මෘත ශරීරද ඇත් අස් මලකුණුද මුතු කුඩ කොඩි සේසත් සහ යුධ රථ වහනාදියද දුටු හෙතෙම තම මස්සිනාවූ අර්ජුනයින් අමතා:-

★★
★★

"බලව ‡අජ්ජුනයිනි, කුරුකුලයින්ගේ ‖තාරකා, චන්‍ද්‍ර සූර්‍ය්‍ය සහ අඩසඳලමින් හා සුදු කළු කහ රතු ආදී නොයෙක් වර්ණයෙන් හෙබි කොඩිද කුඩ සමූහාදියද යුධ භූමියෙහි විසිරී තිබෙන ආකාරය" යි කීවේය.
(ඉංග්‍රීසි සහ දෙමළ මහා භාරතය, මෝරිස් වින්ටර්නිස්ගේ ඉන්දියානු සාහිත්‍ය ඉතිහාසය, ඥතදශීය, මහපදරංග ජාතකය යනාදි පොත් ආශ්‍රයෙනි)

## කුරුකුල ඉර හඳ කොඩිය.

ඈත අතීතයේ සිටි සිංහල රජවරුන් දවසට ප්‍රථම කාලයේ සිට සිංහල ජාතියට මැත භාගයේදී පමණ ඇතුලත්ව සිටින කුරුකුලයෝය, කාරාව කුලවන්තයෝය. යන පිරිස විසින් ඔවුන්ගේ මගුල් සහ ඉලව් වලට ඉදිරිපත්

‡උතුරු දඹදිව මණිපූර් ප්‍රදේශයේ කථාවස්තුවේ ප්‍රකාර පංච පාංඩවරුන්ගෙන් කෙනෙක් වන "අරුජන" කුමරු මණිපූර් රාජධානියේ රජ්ජුරුවන්ගේ දියනියන්ව විවාහ කරගන්නා ලදී. නුමුත් මහා භාරත කතාවෙහි මෙය සටහන්වී නැත. ඒ මේ කතාවස්තුව කෙටි වසයෙන් මෙසේය, අරුජන තෙමේ "ගංගා වාර" රටෙහි වාසය කරන අතර කෞරව්‍ය නම් නාග රජ්ජුගෙ දියණියවූ "උලූපී" හා සරණවීය. නොබෝ දිනකින් දඹදිව පූර්ව දේශය තරඹන අටියෙන් නැගෙනහිර බලා ගමන් කල ඔහුට මණිපූර් රාජධානිය හමුවිය එහි රජ්ජුරුවන් වන චිත්‍රවාහන තෙමේ තම දියණියන් වන "චිත්‍රාන්ගද" කුමරිය අරුජන කුමරුට සරණ පාවා දෙන ලදී. මේ විවාහයෙන් ඔවුන්ට ලැබුන පුත්‍රයා "බහුරු වාහන" කුමරු කල්යෑමෙන් මතුවූර් හෙවත් මණිපූරයේ රජ විය.

‖සපිරි දිලෙන කළු සුදු කහ එමදවි යේ
අ සිරි වරුණ දිනු හිරු සඳු ඇති සැටි යේ
සු සිරි වඩන කුඩ කොඩි චාමර කැටි යේ
වී සිරි තිබෙන සැටි බල සකී රණ පිටි යේ

කොටගෙන යන ලදී. ඒ බැව් හවෙනි පරාක්‍රමබාහු රජුගේ සහ දෙවෙනි රාජසිංහ රජ කාලය දක්වා චරිත්වර ලියවුන පුරාණ ලිපිවල දක්වා ඇත්තේය.

කෞරවයෝ නොහොත් කාරාව කුලයේ මිනිසුන් දඹදිව සිට ලක්දිවට පැමිණෙන කාලවලදීද, ඔව්හු දඹදිවදීද මෙහි පහත සඳහන් රාජකීය අඩයාලම් අයිතිව සිටි බව ඉංදියානු ආණ්ඩුව මගින් ප්‍රසිඩ කරණ ලද ගැසට්යර් පොත් වලද මොනවට ඇතුලත් කර තිබේ.

## විශෙෂ විභාග.

"The marriage of a ( Parava ) member of the upper classes is conducted with much ceremony. The retual is in many essential features similar to that observed by the Hindu Caste."

"A peculiar features of the wedding is the procession from the church ( where the rite of marriage is performed ) to the brides house with virudus or banners, supposed to be the insignia of the **Kingly ancestors** of the race."

The emblems consist of 21 flags embroidered with representations of various objects, animate and inanimate, such as **a Snake, a Peacock**

a **Palmyra** a **Chunk** the **Sun** (the **Moon**) an **Elephant** a **Fish,** and so on. In addition to these a large **Umbrella** a **Shield**, and other **Trappings** are carried. The bridegroom wears a costume called KAPA resembling the state robes of JATHI THLAVAI MORE and with cloths are spread before him in his path."

(MADRAS DISTRICT GAZETTEERS TINNE-VELLY VOLUME 1 chapter iii, page 123 & 124— BY H. R. Pate I. C. S. Printed by the Superintendent Govt: Press Madras 1917)

පෞරව සහ කෞරව යන්නෙන් පරවර සහ කාරවර යන නාම සෑදී තිබෙන බවත් ඔවුන් දෙවගීයම එක පරම්පරාවේ අයින් බවත් සැලකිය යුතුයි ඉහත සඳහන් ඉංග්‍රීසියේ කෙටි විස්තරය:- "පරවර කුලයෙහි උසස් තත්වයේ වැජඹෙන සාමාජිකයෙකුගේ කරණ මංගල්‍යය වූකලී බොහෝ අලංකාර අන්දමට පවත්වනු ලැබේ. මේ උත්සවය බොහෝකොට හින්දු වාරිත්‍ර වලට සමාන වන්නේය. ඒ සිරිත් විරිත් යනාදිය පරවර ජනයා හින්දු ආගම් කාරයින් වශයෙන් සිටි කාලයේ පටන් පවත්වාගෙන එන බවට අනුමානයක් නැත."

"විවාහ මගුල සිදුකළ දේවස්ථානයේ සිට මනාලියගේ නිවස දක්වා විශ්මයජනක පෙළහරක්ද පවත්වන්නේය. එයට පරවර මිනිසුන්ගේ කුලයෙහි රාජකීය මුතුන් මිත්තන්ට අයත්යයි විශ්වාස කරණ අඩයාලම් සහිත "විරිදු" නොහොත් කොඩි කුඩ සේසත් යනාදියද ගෙන යනු ලැබේ.

"මේ අඩයාලම් වනාහි නානාප්‍රකාර සතුන්ගේ සහ තවත් දේවල් වෙති. ඒ ලකුණු.කොඩි වගී විසිඑකක (21) ගෙන්නම් කරණ ලද්දේය එනම්:- නාගයෙක්, මොණරෙක් තල්පත්, හක්ගෙඩියක්, ඉර (හඳ) හස්තියෙක්, මත්ස්‍යයෙක් සහ තවත් නොයෙකුත් අඩයාලම් වෙති. ලොකු කුඩයක්ද (මුතුකුඩ) පලිහක්ද ත්‍රිශූල බඳු ආයුධ වගීද මෙම පෙළහරට ගෙණ යන්නේය."

"මනාලයා "කාප" නැමැති ආයිත්තමක් අඳිති. එය වනාහි "ජාති තලවෙයි මොරෙයි" නම් වාරිත්‍රයට ඇතුලත් සලු පිළි වශයෙන් සැලකිය හැකිය. මනාලයා ගමන් කරණ මාගීයේ ඔහු ඉදිරියෙන් (පාවාඩ) සුදුරෙදි බිමට ඇතිරීමද සිදුකරන්නේය."යනුයි.

(මදුරාසි පලාතේ ගැසට්යර්, තින්නවැලි පලමුවෙනි කාණ්ඩය iii පරිච්ඡේදය 123 සහ 124 පිටු ඉන්දියානු සිවිල් නිලධාරි, එච්. ආර්. පේට්. කතෘ මදුරාසි ආණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි. ක්‍රි: ව: 1917)

# ආණ්ඩුවේ කොඩි පොත.

"In a work called the **CHANDRA KULA MALAWA,** Pitigal Korale (Central) the following flags are enumerated."

"මධ්‍යම පිටිගල් කෝරළේ චන්ද්‍ර කුල මාලාව නැමැති පොතක මෙහි පහත දක්වන කොඩිවගී සඳහන් කර තිබේ.

1 නාග කොඩිය.
2 කුකුලු කොඩිය.
3 මොණර කොඩිය.
4 තල් ගහ බැඳි කොඩිය (තල්පත් කොඩිය)
5 නැව බැඳි කොඩිය
6 හක්ගෙඩිය බැඳි කොඩිය
7 ශිප්පි කොඩිය
8 කොටියා බැඳි කොඩිය
6 සිංහයා බැඳි කොඩිය
10 රාජාලියා බැඳි කොඩිය (ගුරුළා)
11 හන්සයා බැඳි කොඩිය
12 තම්මැට්ටම බැඳි කොඩිය
13 සූර්‍ය්‍යා කොඩිය
14 චන්ද්‍රයා බැඳි කොඩිය
15 ඇතා බැඳි කොඩිය
16 ගොනා බැඳි කොඩිය
17 මකරයා කොඩිය
18 දැල් කොඩිය
19 මත්ස්‍ය කොඩිය
20 හණුමා කොඩිය
21 ගිරවා බැඳි කොඩිය

(ගරු ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතුන් විසින් සම්පාදනය කර ආණ්ඩුව මගින් මුද්‍රිත පුරාණ සිංහල කොඩි පොත 34 පිටුව)

පිටිගල් කෝරලේ කෞරව වංශික උගතෙකු විසින් මුද්‍රණය කරණ ලද චන්ද්‍ර කුල මාලාව නැමැති පොතේ සටහන් කොඩි විසිඑක් වගීය. ඒ පොතෙන් උපුටා ගරු ජ්. ඩබ්ලිව්. පෙරේරා මහතුන් විසින් ආණ්ඩුවේ ඉල්ලීම පරිදි සම්පාදනය කල පුරාණ සිංහල කොඩි පොතට ඇතුලත් කර තිබේ.

එහෙත් චන්ද්‍රකුල මාලාවේ මෙම කොඩි විසිඑකම කුරුකුලයට අයිති බව ලියා ඇතත් ඒ කොටස පෙරේරා මහතා විසින් තම පුරාණ කොඩි පොතේ ලියා නැත.

ඉහත සඳහන් මද්‍රාසි පලාතේ ගැසටියර් පොතේ පරවර (පෞරව) මිනිසුන්ට කොඩි වර්ග විසි එකක් අයිති බවත් ලංකාවාසී කුරුකුලගින්ටද (කෞරව) කොඩි වර්ග විසි එකක් අයිති බවත් චන්ද්‍රකුල මාලාවෙන් ප්‍රකාශ වෙයි. මේ දෙවර්ගයට අයිති කොඩිවල එක හා සමාන අඩයාලම් පිහිටුවා තිබෙන බව සැලකිය යුතුයි.

කෞරව වංශිකයෝ විසි එක් වර්ගයකට බෙදුනායින් පසු ඒ ඒ ගෝත්‍රවලට නියම අඩයාලම් පිහිටුවා කොඩි වගී විසි එකක් තනාගෙන මේ දක්වා ඔවුන්ගේ මගුල් හා ඉලව් වලට පාවිච්චි කරණු ලැබේ.

## මහා සම්මත කථාවක්.

“චේතිය රජුගේ වැඩිමහලු පුත් මුචලින්දය, ඔහුගේ පුත් සාගරය, ඔහුගේ සැටදහසක් පුත්‍රයෝ වූහ. එක් කුම්භාරිකාවකුත් වූයේය. යටගිය දවස ප්‍රථම කල්පයෙහි නා නා කුසුම් සම්පන්න නා සපු දුනුකේ අඹ දඹ බක්මී පලොල් පළු පල්ලවයෙන් ගැවසීගත් රුක් පෙලින්ද සීතිද්ද බෝනිද්ද දූසමන් සවුකෙන්ද කුසුමයන් ආකුලවූ පර්වත ශිඛරාදීන් විසින් පිරිවරණ, කොංච මයුර හංස කෝකිල කින්නර කින්නරාංගනාවන් විසින් ගැවසීගත්

පොළොන්තල රඟ මඩලෙහි මුළු මේ සිය තිසත් ගත් තැටුත්වූ තෙර්තත්‍ය මංඩල කොවුල් හඬින් එකනින්නාද වූයේය.''

''ඇඹුල ඉපුල හෙල්මැලි උපුල් මහනෙල් රත් නෙළුම් හෙල නෙළුම්, ආදියෙන් ගැවසීගත් සඳ්දහතලා නම් දීපයෙහි කාරවේරි නම් විලක් වූයේය. ඒ වීල දිගින් පලලින් යොදුන් පමණය ඒ විල අවරින් සෑදී තිබෙන ||වැටකෝ පෙළීන් සැදුම් ලද්දේය.''

''එහි මල් සුගන්ධයෙන් එකහෙලා හංහ රාජයන්ගෙන් ගැවසී ගත්තේය හස්තීන්ගේ කුංචනාදයෙන්ද ලිය කොවුල් හඬින් ගැවසීගත්තේය. ඒ කාරවේරි නම් විල දෙදෙව් ලොවට ශක්‍ර දිව්‍යරාජයාගේ නන්ද නම් පුෂ්කරණිය මෙන් වූයේය. එකල්හි මේ ලෝකයෙහි සත්වයෝ කුසල්හි හැසිරේ.

''වසවත්තියා වසවතීහි නම් දිව්‍ය ලෝකයෙහි වසන මාර දිව්‍ය රාජයා බලා නරකය හිස්වන නියාව දැන අහෝ මට අලාභය යයි, මීට උපායක් කරම්යි සිතා එම දිව්‍යලෝකයෙහි චුතවන්නට නියුක්තවූ එක් දිව්‍ය රාජයෙක් කරා එලඹ කියනුයේ ''එම්බා දිව්‍ය පුත්‍රයෙනි, තොප මනුෂ්‍ය ලෝකයට යන බව යහපොතය.''

''මනුෂ්‍ය ලෝකයෙහි වසන අය බොහෝ සේම කුසල් කර දිව්‍ය ලෝකයටම යෙති. අකුසල් කිරීමට නියුක්ත කෙනෙක් නැත. තොප සිතාපුවාවූ යම් සම සම අවියක් කරව. තොපට මම සඳහන් කලාම සිඩවන්-නේය.''යයි කි කල්හි ඒ දිව්‍ය පුත්‍ර තෙම කියනුයේ''

||වැටකෙයියා සහ දුනුකෙයියා වලට, කෝවත්ත, කෝවච්ච, යන නාම තියති. දුනුකේ කැති කුලය, වැටකේ කැති කුලය, යනාදි ක්ෂත්‍රිය නාම දූරුවත් පෙර දවස ලංකාවේ විසූ බව දැනගන්ට තිබේ.

"ස්වාමීනි! දිව්‍යරාජයාණ! මට තනියම යෑමට කම්මැලි බවසය" කිව්ට හවත් දිව්‍යලෝකයෙහි පරීක්ෂා කරන්නාහු එක් දිව්‍ය ස්ත්‍රියක් චුතවන නියාව දැන ඕ හටත් මනුෂ්‍ය ලෝකයට යන බව යයි කිවාහට සතුටුව දෙදෙනාම යහපතැයි කියා "කොතනක උපදින්දැයි?" විචාල උත්තර කියන්නාහු.

"එම්බා දිව්‍යයෙනි! අසවල් පණීත මඩියෙහි සද්දන තලා විපයෙහි ‡කාරවේරි නම් විල මධ්‍යයෙහි මහනෙල් මල් දෙකක් නියමකොට අවට දිලෙන සත සහශ්‍ර මල් චන්ද්‍ර මඩලය සූර්‍ය්‍ය මඩලය පිරිවැරූ තරු රැස් වලල්ලක් මෙන්ද! යනාදින් ඔහට සලකුණු කියා වර දුන්නේය."

### තනු රක්ත භාවෙන.

ජයන්ති අඟ රතෙනා කී හෙයින් අඟ රක්තා දිනයට කුජ දිව්‍ය පුත්තෝති වරයෙ ප්‍රසිඩවූ සෙයින් කුජ දිව්‍යපුත්‍රයන්ගේ දවස්හි සුභ නක්ෂත්‍ර යෝගයෙන් ශුභ මුහුර්තයෙන් ඔවුන් දෙදෙනා විල මධ්‍යයෙහි මල් කැකුලු දෙකේහි ඔප-පාතික වූයේය.

"පූර්වයෙහි කරණ ලද මහත් කුසල් ඇත්තේය. ඔහට ආරක්ෂා පිණිස තලාවූ භූමාවූ ආකාසස්ථ දේවතාවෝ ආරක්ෂාගත්හ. ඔවුන් ක්‍රම ක්‍රමයෙන් තරු පිරුවැරූ චන්ද්‍ර මඩලය සේද එසේ වැඩෙන්නාහු. ඔහට දසමස් ඇවෑමෙන් ඒ මහනෙල් මල් දෙක කරඬු දෙකක් මෙන් මහත් වූයේය.

---

‡காவேரி:- அயமணல், மைசூர், கோயம்புத்தூர், தஞ்சாவூர் முதலிய நாடுகளில்பாயும். சத்தநதிகளென்று-

කාවේරි:- අයමනල්, මෛසූර්, කෝයම්පුත්තූර් පුරාණ තංජාවූර් රට.

(යාල්පානම් පෙඩ්රකරාදි පි. 286)

"එකලට වසවර්ති දිව්‍යලෝකයෙහි ආයුසට විනාඞියකුත් නැත. එවිට වසවර්ති මාරතෙම යට කියන ලද දිව්‍යයන් සොයනුයේ විල්හි උපන් බවද සියල්ලන්ගෙන් කරණ ලද ආරක්‍ෂා ඇති බවද මල් වට නටන මනුෂ්‍යයන් විසින් කරණ ලද නෙතීතයද කොවුල් හඬින් ගීත ගායනාද සියල්ල දැක මාර තෙම සිතනුයේ "මොවුන් දැනට විල්හි ඉදිම කාරණා නැතැ"යි, සිතා මනුෂ්‍ය වේසයෙන් අවුත් ඒ විල්තෙර සමීපයෙහි ප්‍රාසාදයක් මවා දමා ගියේය."

"ඔහු ඒ දවස් රෑ එවකට රජ කරණ සාගර නම් රාජ ශ්‍රෙෂ්ඨයන් ලඟට මාර දිව්‍ය රාජයා රාත්‍රි භාගයෙහි ශ්‍රී යහන් මස්තකයෙහි උන් රජහට එලඹ කියන්නාහු "එම්බල රජ්ජුරුවනි; අසවල් හිමයේ සද්දහතලා නම් විපයෙහි කාරවේරි නම් විල මධ්‍යයෙහි කරඬු වැනි මහත් උත්කෘෂ්ටතර මහනෙල් මල් දෙකක් ඇත. එහි මහත්වූ පුණ්‍ය පුණ්‍ය තේජසින් උතුම්වූ රං රූප වැනි කුමාර කුමාරිකා දෙදෙනෙක් පූර්ණ චන්ද්‍ර මඬලයසේ බැබලි බැබලී ඕපපාතිකව උපන්හ. එසේ හෙයින් තොප විසින් චතුරාංගිණී සේනාව පිරිවරා එතනට ගොස් ඒ විල සමීපයෙහි සදා තිබෙන දිව්‍ය මාලිගාවෙහි හිඳුවා ඔවුන් රකින්වායි." කියා, "ඔවුන් සක්විති රජ කරන්ට පිං ඇත්තේය.

"ඒ නොකොලොත් තොපගේ රාජ්‍යය හිනි ලම්හයි කී." බසට, රජ්ජුරුවෝ අසන්නාහු "එම්බා පිංවත්නි! තොප මෙතැන්හි ආ වේලේහි පටන් මට මහත්වූ සංතෝෂයය. තොප ශ්‍රීයාව යහපොතය මෙබඳුවූ තේජසක් මේ සතර මහ දිවයින්හී නුදුටු විරූම්හ. එසේ හෙයින් තොප කවුරුන් බවත් නොදනිමි. එව නොවලහා මට කීව මැනවයි කීහ."

"එබස් ඇසූ වසවර්ති මාර තෙම කියනුයේ, එම්බල සාගරය සිත්සේ අසව, මාගේ ස්ථානය නම් සදිව්‍ය ලෝකයට උත්කෘෂ්ටතර පරනිර්මිත වසවර්ති නම් දිව්‍ය භවනයක් ඇත. ඒ ඇමටම උතුම් මාර දිව්‍ය රාජයා නම් මම වෙමියි" කියා අහසට පැනනැගී අන්තර්ධාන වූයේය."

"මේ කාරණ ඇසුවාවූ රජ්ජුරුවෝ මහත් සංතෝෂ භාවයට පැමිණෙන අතර අරුණු නැග්ගාහ. ඒ අරුණු නැගුනු පසු උදසනම නැගී සිට අමාත්‍ය මඬලයා රැස්කරවා ඇත් අස් පාබල සෙනග හා චතුරාංගිණී සේනාව පිරිවරා සාගර නැමැති ක්ෂීරය සේද මහසම්මත නම් දෙලොස්වැනි රජ නරේන්ද්‍රයන් පුණ්‍ය-තේජස පසලොස්වක් චන්ද්‍ර මඬලය සේද, අම්බරෙහි පතල සූර්‍ය්‍ය මඬලය සේද, දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දිව්‍ය රාජයා සේද, ඒ මහසම්මත සාගර නම් රජ සැට යොදුන් මාර්ගයා ගෙවා සද්දහතලා නම් චිපයේ කාරවෙඩි නම් විල්තෙර මාලිගාවට එලඹියේය.

එසේ එලඹියාවූ රජ්ජුරුවෝ එදවස් රාත්‍රියේ නොයෙක් රසමසවුලෙන් යුක්තව ආහාර කෘත්‍යය කොට එදවස් රෑ සැතපි පහන්වූ කල්හි එදවස් රාත්‍රි භාගයේ රජ්ජුරුවෝ එලඹි බව මාර දෙව් පුත් දැක එම ප්‍රාසාදය වටකර කරවි විමානයක්ද, නෞකාවක්ද මවා ගියේය.

"එදවස් රජතුමානෝ පිබිද නැගි සිට මාලිගාවෙහි ඇවිද සොයා විමසනුයේ නුදුටුවිරූ ගස් ජාති සෙයිත් අමාත්‍ය මඬලයා අතින් විචාරනුයේ ඒ රජ සෙනගෙන් මහ මන්ත්‍රි නම් අමාත්‍යයෙක් කියනුයේ "ස්වාමිනි මේ ගස් කරවි ගස්ය." යයි කීහ.

"ඒ බව ඇසූ රජහු එනමින්ම මේ පුවරට නම් තැබිම යුතුයයි සිතා "සද්දහතලා කරවි පුර නුවර" යයි නම් තැබූහ. එම ප්‍රාසාදයට කාරවන්නි විල සමීප බැවින් කාරවන්නි නම් ප්‍රසාදයයි නම්වූයේය. මෙසේ නම් සලස්වා රජතුමා විල්තෙරට ගොස් පරීක්‍ෂා කරන්නාහු නාවුකාව දැක ඉතා සන්තෝෂව මහ අමාත්‍ය මඬලයා විසින් සරසන ලද නාවුකා විමානයට රජතුමානන් හා සමග ඉතා සංතෝෂ භාවයෙන් මහ අමාත්‍ය මඬලයාද පංචතූර්‍ය්‍ය නාදයන්ද චතුරාංගිණී සේනාව විසින් පිරිවරණ ලද්ව නොයෙක් නෙත්ත මඬලයෙන් එක පහර ගායනා කරමින් එන්නාවූ නාවුකා විමනයට පැනනැගී ඒ විල්හි පිපි සුපිස්පිත කුසුම් දෙසා ලහට පැමිණියේය."

"මේ මහනෙල් මල් දෙක අවශෙෂ සේනාවට නොපෙනෙන්නේය. රජහු හටම පමණක් පෙනෙන්නේය. රජහු සමීපයට යෙත් මහනෙල් මල්පෙති විසිර ගියේය. ඒ පියුම් මත්තෙහි හුන් කුමාර කුමාරිකාවන් දෙදෙනාට රජ තුමානෝ ලෝභ සිත් උපදවා මහත් පෙම්බරින් අත දිගුකර ඔවුන් නාවුකා විමානයට ගත් කෙනෙහි අතිකුත් සියල්ලටම ඒ කුමාර කුමාරිකාවුන් දෙදෙන පෙණී ගියේය."

"එසේ දුටු පුරුෂයෝ මේ වික්‍රමය දැක උපන්නාවූ සංතෝෂයෙන් මහත් උද්ඝෝෂනය කෙළේය. මෙසේ මහා සංතෝෂයෙන් ඒ කුමාරවරු පෙළහරින් නාවුකාව විල්-තෙරට පැමිණ රජ්ජුරුවන් දෙවි කුලට වඩාවුන් ප්‍රාසාදයෙහි ශ්‍රී යහන්හි සතපඤවූහ.

"එතැන් පටන් ඔරු පාරු නැව් යාත්‍රා ආදියෙහි උප්පත්තිය ඇති උනේය. එවක් පටන් එකුමාර, කුමාරිකා බොහෝ ස්ත්කාර සම්මානයෙන් වැඩී තුන් අවුරුදු වයස් විය ඒ පිංවත් දෙදෙන කලාවෙන් කලාවට වැඩෙන පූර්ණ චන්ද්‍ර මඩලසේ වැඩී ඔවුන් සහෝදර භාවයෙන් සිටින දිනයට ඔවුන් හට නම් තබන මංගල්‍ය දිනය පැමිණියේය.

"රජ්ජුරුවෝ මොවුන්ට කුමන නම් තබන්දැයි විමසුයේය. ඔවුන් ඕපපාතිකව විල අවටින් ගැවසීගත් වැටකෝ මල්මලින් පිපී වැතීගිය සෙයිනුත් අටස් දිගු පුලුල් විල සෙයිනුත් කුමාරයින්ට නම් තබන්නාවූ මෙම නාමය අග්‍ර තියාව සෙයින් කොවට්ට කුමාරයො යයි නම් තිබූහ. ඔවුන් තැහතියන්ව කාරව්පුර නුවර සෙයිනුත් කාරවන්ති කුමාරිකාවො යයි නම් කිවූහ."

"ඔවුන් දෙදෙනා මෙනමින් ප්‍රසිද්ධවූහ. මෙසේ ඔවුන්හට කළමනා සියල්ලම නිසි කොට සලස්වා ඒ සාගර නම් උතුමානෝ සෙනග දෙකොටසක් කොට බෙදා කොටසක් හා සමග ඔහුගේ රාජ්ජ්‍යයට ගියේය. මෙසේ ඒ කුමාර වරුන්ට කටයුතු විට දෙනුවරින්ම ඔවුනොවුන් එන්නාහ. යන්නාහ.

"මෙසේ කල් යාමෙන් කුමරුවන් වැඩි වයසට පැමිණි බව රජහු සිතා මොවුන්ට කලමනාවූ ආවාහ විවාහ මංගල්ලය කටයුතු යයි සිතා තමන්ගේ මහ සම්මත නාමයෙන් පැවැති සැට දහසක් පමණ පුත්‍රයින්ට නායක වැඩිමහලු උප සාගර නම් නරේන්ද්‍රයන් හා සමග අවුත් සද්දහතලා නම් විපයෙහි කාරළු පුර නුවර කාරවන්ති නම් ප්‍රාසාදයෙහි වස්වා ඒ කුමාරිකාවත් සරණ මංගල්‍යය කොට ඒ රාජ්ජය ඔවුන්ට භාරකොට ඔටුණු පලඳවා ඒ ප්‍රාසාදයෙහි සිටි කොවච්ච කුමාරයන් හා සමග සාගර නම් රජහුගේ නුවරට ගොස් ඒ රජහුගේ දූ කුමාරිකාව ඔහුට පාවා දුන්හයි දතයුතුයි."

"සාගර නම් රජතුමාතෝ ඔවුන් රජ තනතුරට පමුණුවා වසන කල්හි කාරම්පුර නුවර වසන උප සාගර නම් රජුහට පුත් කුමාරයින් අට දෙනෙක් හා දූ කුමරියන් අට දෙනෙක් ලදහ. ඔවුන්ට නම් තබන්නාහු. පුත් කුමාරයින්ට පියරජහුගේ වංශයේ නම හා දූ කුමාරිකාවුන්ට මෑනියන්ගේ නාමයන් මච්චකොන්න §කාරවන්ති කුමාරිකාවෝ යයි නම් ව්‍යවහාර කලහ."

"ඒ සාගර නම් රජහුගේ දුහිතෘ කරකාර බැඳ දුන් කොවච්ච කුමාරයන්ටත් පුත් කුමාරවරු අට දෙනෙක. යනාදි ඔවුන්ටත් ඒ අනුසාරයෙන්ම නම් තැබ්බවූහයි දතයුතු. මෙසේ මේ රජ දෙපක්ෂය ඔවුනොවුන් කරකාර බැඳ දෙත්. ඔවුන් දියුනුව තෙසැට දහසක් රජ දරුවෝ වූහයි දතයුතුයි"

---

## රජ කුල අට

§සතාසත කුලය, කාරවණන කුලය, සමුද්‍රවංශ කුලය, අක්නිවංශ කුලය, සාක්‍යවංශ කුලය, සවසවංශ කුලය, ගංගාවංශ කුලය, දක්ෂදඤත්ත කුලය,
(නීති ප්‍රභෙද පුස්කොල පොත. කොළඹ කටුගේ පොත්හල. නො. 7/J7 "කි" පත් ඉරුව) මෙම පොත ඉතා වැදගත් පොතක් වශයෙන් කෞතුකාගාර පොත්හලේ නිලධාරින් විසින් පොත් කම්බයේ මතුපිට සටහන්කර තිබේ. පොතේ තිබුනු අන්දමටම මෙහි ලීවෙමු.

මෙසේ කල් යත් යත් මහසම්මත වංශයත් ඔව් වංශයත් දෙක ඛාරඛාර බැඳ දී දීමෙන්ද ඔවුනොවුන් ඛාරා ආ හෙයින්ද ඛාරාවෝ යයි කියාද ඛොවට්ට යයි කියාද මච්චඛොන්ත යයි කියාද කොවුල් හඬින් සට කියන ලද ඛාරවන්ති නම් විල්හි තදදුන් ගායනා බැවින් ඛොඩුලෝ කියාද එම හිමයෙහි වසත්නාවූ රජ දරුවන් විසින් මුව දඩයමෙහි නියුක්ත බැවින් එම රජුන්ට පානිවාද යයි කියාද රෞද්‍ර ක්‍රියායෙහි නියුක්ත බැවින් ළුද්ද යයි කියාද වඩුවො යයි කියාද ඔවුනොවුන්ට මෙසේ නම් ව්‍යවහාර වුවත් මහා සම්මත පරම්පරානුගතව ආ හෙයින් මහා සම්මත ඛාල්පද්‍රමසේ පළ පල්ලව මෙන් නොයෙක් රාජ වංශ විය.”

“මූල සැමට බ්‍රහ්මො – තපත්තියද දෙවැනිව මහා සම්මත යයි සහශ්‍රගත් රජ කුල ප්‍රභේද විය. ඔවුන් රටට අධිපති විය. ඔවුන්ගේ අමාත්‍යයෝ ග්‍රහපති මහසාර කුල විය. මහමත්තො යන තැන්හි මෙහි විස්තර මහ ලෝකොතපත්ති කථාවෙහි විස්තර වශයෙන් තියේය.”

“මහා මතොතා පධානංච, මතිසංචිචෝච මත්නි තිස ජීවෝ, සච්චා මඩො සේනාති තුච මුජපති. තාපංසා දිතත් චිවංදන මකබ දග්සො දටඨරි දෙවාරී කො පරිහාරො චාරටෙඨා චාර පාලකො”
(මහා විහාර වංශානුගත බුඩරක්ෂිත මහා සාමිගේ සන්න සහිත පුරාන පාලි ජනවංශය.

## සන්න සහිත පුරාණ පාලි ජනවංශය.

මෙම ජනවංශය ලියන ලද්දේ මහා විහාර වංශානු ගත ශ්‍රී බුඩරක්ෂිත මහා ස්ථවිර පාදයෝයයි එහි ලියා තිබේ. මෙහි මුල් භාගයේ කොටසක් ඉහත පිටුවල ලියා ඇත

ඒ කථාවේ අධෝභාගය පිළිබඳව ඉංග්‍රීසි ජාතිකයෙකුගේ අදහස ඇතුව මෙහි ලියන්නෙමු.

*වංශාධිපති සිවිල් නිලධාරි හියුනෙවිල් F. Z. S. මහතා වර්ෂ 1887 දී ජනවංශය සම්බන්ධව මෙසේ කියා තිබේ. එනම්:– "ජනවංශය වූකලි සිංහලයින් අතර ඉතා උසස් අන්දමට පිළිගත් පුස්තකයකි. එහෙත් මෑත භාගයේ ලියන ලද පිටපත් වනාහි කණගාටු වියයුතු විලස එයාගෙන් මෙයාගෙන් පක්ෂකාරියට වාසි ඇතිවන පරිදි ලියාගන තිබේ."

"යුරෝපීය සහ ලාංකික ශාස්ත්‍රාභිලාෂීන්ටත් මහගු සේවකයන්ගි නිරතව ඇප උපකාරයන්ගී යෙදී ප්‍රසිද්ධව සිටින පානදුර පලාතේ වස්කඩුවේ උගත් සුභූති හාමුදුරු-වන් විසින් සපයාදුන් බොහෝ අගනා තත්වයෙහි තිබුන පිටපතක් හා සසඳ මෙය සංශොධනය කරණ ලදී"

"තවත් ඉතා හොඳ පිටපතක් හලාවත පලාතේ කුඩා ගමක වසන වෙදමහතෙකු මගින්ද ලැබුනෙන් මෙම පොත් දෙකම එක් ගුරු පොතකින්ම නොහොත් මූලික පොතෙන් මෑත කාලයකදී ලියාගෙන තිබෙන බව දැනගතිමි. [මෙය ජනවංශය පිළිබඳ නෙවිල් මහතාගේ විවේචනයකි,]

*හියු නෙවිල් මහතුන්ගේ කීම සත්‍යයයි. කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ නොම්මර, J 9 – 6 P 1 – 7 K 8 දරණ ජනවංශය පුස්කොළ පොත් තුනක්තිබේ. ඒ සියල්ලෙහිම විස්තර විශාල ප්‍රමාණයක් අඩුවෙන් ලියා තිබේ.

හොරණ කෙහෙල් හේනාවේ සිංහබා කිවියර නැමැත්තෙකු විසින් කාව්‍යයට නගන ලද ජනවංශය වූකලි මේ සියල්ලටම වඩා වැදගත් කරුණු රාශියක් පැහැර හැර ලියන ලද්දකි. ඔහුගේ කුලය විස්තරවන කොටස සම්පූර්ණයෙන්ම එහි වසන් කර තිබේ.

නියම ජනවංශය කියවීමට ආශා ඇත්තන් විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් නො· P 10939/OR 6606 (39) දරණ සම්පූර්ණ පුස්කොළ පොතේ පිටපත් ගෙන්වා ගන්නවා මිනා ඉහත සඳහන් වැරදි පොත් කියවා තේරුම් නොගත යුතුයි. මුද්‍රණය කර ඇති ජනවංශ කීපයකින් එකකවත් "කරාව" කුලය ගැන ලියා තිබෙන වැදගත් කරුණු කිසිත් සඳහන් කර නැත.

*වෙළඳාම් පිණිස බරු යාත්‍රා නැව් හා හම්බන් ආදී කර්මාන්ත දත්තා අය සවාසු දහසක් යොදුන් ගැඹුර මහා සයුර හැසිරෙමින් රක්‍ෂා ලැබ සෙඩිවංශ යයි නම් විය.

"සියල්ලෝම ක්‍ෂුද්‍රයෝ නොවෙයි. මහා සම්මතයෙන් පැවතුනෝයයි දතයුතු. එතැන් සිට මිථ්‍යාදෘෂ්ටි රජ දරුවෝද ඒ ඒ රාජ්ජය කෙරීමෙන්ද බොහෝසේම නොයෙක් දිව්‍ය භක්තිකයෝද සැටදහසක් පමණ මිථ්‍යාදෘෂ්ටි ආගම්ද ලෝකයෙහි පහළවීමෙන් බොහෝ කාලාන්තරයක් පසුව යත කල්හි. දඹදිව . කාලිඟ චක්‍රවර්ති රජහුගේ මුනුබුරුවූ විජය රාජ කුමාරයන් ලක්දිවට එන ගමනේ සත්සියයක් යෝධසින්ට පළමුවෙනි යෝධයානෝ නම්

---

*තරණී නිර්මාණය හා වාණිජ ව්‍යාපාරය තරණී නිර්මානයෙහි හෙවත් නැව් තැනීමෙහි පෙර සිට මැත භාගය දක්වා සිටි ශිල්පීහු වනාහි කරාව කුලයට අයත්වූවෝ බැව් නොයෙකුත් පොත පතෙන් පෙනේ.

තවද ඔව්හු තම යාත්‍රාවන් නොයෙකුත් භාණ්ඩයන්-ගෙන් පුරවා සාගරය තරණය කොට නාග "පට්ටනම, කිලක්කරේ, තුත්තුකුඩිය, කෝරමණ්ඩලය, ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය යනාදී දේශවලට යාත්‍රා කර වෙළඳාම් කළ බව පෘතුගීසි, ඕලන්දය, ඉංග්‍රීසි දෙම්ළ පතපොතෙන් දැනගතහැක. දැනටද බේරුවල වැසි කරාවේ නැව් හිමියන් ඔවුන්ගේ නෞකාවන් නාග පට්ටනමට යාත්‍රා කරවා සම්බ හාල් සහ රටවලංද ගෙන්වා වෙළඳාම් කරති.

"වංග (බෙංගාල) දේශවාසීහු තරණී නිර්මාණය කර ගංගා නම් නදී මුවදොර විශාල නැව් රැස්කොට තබා වහිඃශත්‍රැන්ගෙ ආක්‍රමණයෙන් සවදේශය ආරක්‍ෂණය කළෝය"

"භාරතීය වාණිජයෝ සමුද්‍ර පථයෙන් ගමනා ගමනය කොට විදේශීන් හා වෙළඳාම් කළහ."

(රඝුවංශය - කුමාර සම්භවය ආශ්‍රයෙනි)

කෝවට්ට වංශානුගතව පැවති විජය රාජ කුමාරයින් කරා ආ හෙයින් කාරවනා කෝවට්ට කුමාරයින්ට යුවරාජ තනතුරුද ගම්වර සොළසක්ද දී බොහෝ රාජ බහුමානතරව නොයෙක් ලෙසින් උපස්ථාන කොට වසන කල්හි ඔවුන්ට කාංචිපුර නුවරින් විවාහ මහල්ලයක් ලැබ නොබෝ කලකින් දරු කදෙනෙක් ලදින්, මෙසේ වසන කල විජය රාජ කුමාරයාගේ කථා මාත්‍රයකින් ඒ කෝවට්ට යුව රජ්ජුරුවන් තමන්ගේ භාර්‍යාවන් හා සමග වැඩිමහලු කුමාරිකා දෙදෙනා හා වැඩිමහල් කුමාරයින් දෙදෙනා හා විජය රජ්ජුරුවන් ළඟ සිටුවා ලාබාල කුමාරවරු දෙදෙනා හා සමග යුව රජ්ජුරුවන් කාංචි රට කාංචි පුර නුවර අග්‍ර රාජ්ජය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.”

“එසින්-පැවති ආ අය කාරාවෝ යයි කියා ප්‍රසිධ වූවෝය” “ඔවුන් බොහෝසේ කෲරය අකුසල් කිරීමෙහි භයනැති ඉතා තීක්ෂණවූ වික්‍රම ක්‍රියාද ගෘහ කර්මාන්තයෙහි දක්ෂවූ නියාවද කාලිංග චක්‍රවර්ති රජහුගේ මුනුබුරුවූ සිංහබාහු කුමරුහුගේ ශ්‍රෙෂ්ඨ පුත්‍රවූ අභය ඇති දෙවෙනි විජය නරපතිහු ලක්දිව රජකරණ කල තමන්ගේ ජීවිතායෙහි අගමැති කමට හා විසිතුරු මාලිගාදිය කරවමට නිසි සියුම් කමින්ද, මන්ත්‍රිකමින්ද, යුක්තවූ කාංචිපුර නුවරින් කොවට්ට ගෘහපතින් සූවිසි දෙනෙක් ගෙන්නවා ලංකාවිපයෙහි හිඳිනා ලෙස කොත් වත් ගව මහිෂ වස්ත්‍රාභරණාදින් ඔවුනොවුන්ට දී සම්මත කලාහ.”

“මෙසේ කල්යාමක් ගිය කල අප බුදුන් පිරිනිවී ගිය පසු දෙසිය සත්වෙනි වර්ෂයට පැමිණි කල, නැවත ලක්දිවට රජ කරණ දෙවෙනි පෑතිස්ස නම් නරේන්ද්‍රයන් සමයෙහි දඹදිව ධර්මාශෝක නරපතින් විසින් විප්‍රල නෙදයෙන් සකල භය හැර අභය දෙන විජය මහ බෝදින් වහන්සේ හා සමග ශ්‍රී ලංකාවීපයට එවන මිහිඳු කුමාරයා හා සංඝමිත්‍රාවන්ද දෙදෙනා වහන්සේලා සමග ධනුස්ශිල්පයෙහි නියුක්ත වැදි පුත්‍රයින්ද ඛඩ්ග කොංත තෝමර පලිස් ආදි යුධයෙහි සපන් අයද, මුතුකුඩ සේසත් චාමර ඉම් ආදිය අපට නිසිය. අපගෙන් ඇතිවූ රාජ කුමාරවරු යද්දි අපට හිඳිම සුතු නොවෙසි.

"එකුන් පනසක් පමණ එහි බෝමැඩ කර්මාන්තයට අංවාහුය." "ඔවුන්ට බෝමැඩ *කරා ආ හෙයිනුත් රාජ කුමාරයින් කරා ආ හෙයිනුත් කරාවෝ යයි ව්‍යවහාර විය."

"බොහෝ සොත්වත් ගම්වරදී මේ සිරිලක්හිම රැඳවූහ. මෙසේ කලින් කලට රාජ්ජයට පැමිණෙන රජතුමානන් මෙම වංශානුගතව පැමිණෙන හෙයින් භුවනෙකබාහු නරශ්‍රේෂ්ඨයන් විසින් සස අනූවක් පමණ කාංචි පුර නුවරින් §මෙ ලක්දිවට ගෙන්නවාගෙන මුහුදු කරදිය වලල්ල වට පරසතුරන් විසින් වන අනතුරට ගම්වරදී ඔවුන්ට රාජ කරුණාවත් දෙවා එහි සිහිටවූහ. එතැන් සටන් ඔවුන්ට ගම නොයෙක් කටයුතු තබවා පස් මෙහෙ කරන්නාවුන්ද සලස්වා රක්ෂා කලාහ."

---

*KARAWA is not from KARA, but a coruption of "KURU—WARA" the "KURU—PEOPLE" changed from "KURUWA" to „ KARAWA."

භාවයː- "කරාව යනු *කරා" නොවෙයි, එය "කුරුවර" යන අරුතින් බිඳුන නාමයයි. "කුරු – මිණිසුන්" යන්න "කුරුව" කියාද, එයම "කරාව" යයි පෙරළාගෙන තිබේ.

KURUWA, became in modern Singhalese, "KARAWA"

භාවයː- "කුරුව, වර්තමාන සිංහලෙන් "කරාව"යි.

(Hon. Mr. Hugh Nevill's Teprohanian, 1887 page 108 & 110)
(වංශාධිපති හියු නෙවිල්ගේ "ටැප්‍රබේනියන්" ඉතිහාසය 1887 පිටු 108, 110, කොළඹ කටුගේ පොත්හල නොː 6/M6 පොත.)

"§සිංහල රජවරු වනාහි ඉන්දියාවෙන් යුධ සේනාවන් ගෙන්වා, මුහුද අසල ස්ථානවල රැකවලෙහි තැබුවේය."
(සර් ඇමැර්සන් ටෙනන්ට්ගේ ලංකා ඉතිහාසය)

(තමන්කඩුවේ කොඩිකාරගම පාසලේ තැන්පත් මහා විහාර වංශානුගත බුද්ධරක්ෂිත ස්වාමීන්ගේ සන්න සහිත පුරාණ පාලි ජනවංශයෙන් පිටපත් කල පොතෙන් උපුටා ගන්නා ලදී. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් නො: P. 10939 / OR. 6606 (39) දරණ ජනවංශය පුස්කොළ පොතද සුළු වැරදි හැර අනිකුත් සියලු විස්තර ඉහත සඳහන් පොත හා සමානයි )

## ANCIENT PALI JANAWANSAYA

By Maha Vihara Wansa sree Buddharakkitha, high priest written about the 12 th centuary.

Translated by Hon: Mr: Hugh Nevill Ceylon Civil Service & published in his book TAPPRABANIAN, 1887. Ceylon Museum Library Book No. 6 / M 6.

වංශාධිපති ලංකා සිවිල් නිලධාරි හියු නෙවිල් F. Z. S. මහතාගේ වෂී 1887 දී ඉංග්‍රීසියට පරිවර්තනය කල සන්න සහිත පුරාණ පාලි ජනවංශයේ කොටස "ටැප්‍රබේනියන්" නැමැති ඉංග්‍රීසි ඉතිහාස කථා පොත. කටුගේ පොත්හල. කොළඹ. අංක 6 / M 6.

"The work called **Jana wansaya** is one in great repute among Sinhalese, but copies of late years have been sadly multilated and tampered with to suit the views of this or that class.

"I have revised the text chiefly from a copy of fairly good authority, procured for me in the Panadure district by the learned Priest **SUBHUTI** of Waskadwa, so well known for the erudite help he is always ready to offered to Europeon students, as well as to his countrymen.

"Another very good copy was procured in the Hands of a Native Doctor cr Vedarala in a small village of the Chilaw District, and these two were evidently copied from one **"GURUPOT"** or orginal, at same remote period...............

"Because who knew How to build. ORU, YATRA (Out rigger junks) NEV (Ships) HAMBAN (Sailing Boats without, out riggers) traversing the grate ocen 84000 yogans in deapth in order to trade, gained their livily hood, they were called **"SETTI"** (සෙට්ටි) race **ALL THESE ARE NO SUDRAS,** it is right to know they are descentdents of **MAHASAMMATA**"

"From that time kings of faulse religious ruling this and that country, many kind of believers in gods, of about 60000 faulse religious greatly spread through the world. after a long interval of time had passed and gone, because on the journey when the **Royal Prince Wijaya,** grand son of the **Kalinga Chakkravarti** came to Ceylon. The hero belonging to **Kewatta Race,** the chief of the 700 heroes came near **(Kara)** the **Royal Prince Wijaya,** he gave the rank of **Yuva Raja** (Sub King) to the **Karavanti Kewatta Prince,** whilst so living, he was very intimate with the king, who in many ways showed him affection, and gave him 16 villages; and so living, he received from city Kanchipura a wife in marriage; after no long time he had six children and whilst so living, upon a scheme of the **Royal Prince Wijaya,** that **Kewatta Yuva Raja** with his wife, placing his two elder sons and two elder daughters in charge of **King Wijaya**, together with his younger children becoming **Chief King** of the **City Kanchi** and the **Kanchi Rata**, according to his acts, went to the other world".

"The manner in which the **Karava** came to those who descended from time, became public. Seeing the fact that they were savage (**Krura**) hav..ıg no fear of doing unmeritorious acts, skilled in house building, when the illustrious second **Wijaya Narapati,** elder son of **Prince Sinhabahu,** grand son of the **Kalinga Chakkravarti** was ruling in **Lankadipa,** fetching **24 Kewatta Grahapati** men possessed of shrewd wise intelligence from the **City Kanchi Pura,** in order that they might settle in **Lankadipa** he made covenant giving them fields, gardens, cattle buffaloes, clothes, ornaments and the like."

"After time has thus passed, in 207th year after our Buddha had gone to **Nirvana** at time when **Devenipae tissa Narendraya** was reigning over Lakdiva, **Dharmasoka Narapati of Dambadiva,** sending to **Sri Lankadipa** together with the great-in-splendours, all-fear-despelling fearless-rendering victorious **Maha Bodhin**, and with the two **Princess Mahinda** and **Sangamitta**, archers employed in bow-craft, and people accustomed to fight with **Swords** (Khadga) **Javalins** (Kuntha) **Pikes** (Tomara), **Shields** (Palis), and the, like; saying" (Holding), the **Pearl Umbrellas,** white canopies, and chamara are our services, while the **Princees** our king are going, it is not proper for us to stay" 49 in number these also came for the **Bomandala** business."

"Because they came near (**Kara**) the **Bodhin,** because they came near (**Kara**) the **Princes**, they were called **Karawo.**"

"Giving them many fields, gardens, and villages, they made them to stay in the **Sri Lanka**"

"Thus because Princes, who attained the kingship from time to time belonged to this race (**Karawa**) and attained it, **Buwaneka Bahu** on account of dangers that arose from foreign enemies, bringing to this **Lakdiva** from the city **Kanchi Pura,** 95 of them (Karawa) in number, showed them royal kindness, and established them there. from that time, keeping every thing that was needed, appointing the five doers of service, he protected them.

(Taprabanian, 1887. by Hon; Mr. Hugh Nevill. F.Z.S. Pages 108, 110, Colombo Museum. Book No. 6 / M 6.)

## මෞර්ය වංශය.

මෞර්ය වංශයේ කතෘවරයා වනාහි **චන්ද්‍රගුප්ත රජ්ජුය.** හෙතෙම **කෝවච්ච නන්ද රජ්ජුගේ** මුණුපුරෙකි. මේ චන්ද්‍රගුප්ත රජ්ජුගේ මැතියන්ගේ නාමය **මුරාය.** ඕ තොමෝ මූලින් නන්ද රජ්ජුගේ දාසියක්ව සිටියාය. ඒ දාසිය කුස චන්ද්‍රගුප්ත රජ්ජුගේ උප්පත්තිය ඇතිවිය. නවනන්ද රජුන් අතරෙන් අටවන නන්ද රජ **කෝඩච්ච නන්ද රජ්ජුය.** ඔහුගේ දරු මුණුපුරු පෙළපත මෙසේයි.

**කෝවච්ච නන්දය, ධනපාල නන්දය, චන්ද්‍රගුප්ත රජය, බින්දුසාර රජය, දෙවියන්ට ප්‍රියවූ අශෝක අග රජ්ජුය, මිහිඳු හාමුදුරුවෝය, සහ සංඝමිත්‍රාවන්ය.**

චන්ද්‍රගුප්ත රජ ග්‍රීසියේ මහ **ඇලැක්ෂන්ඩර්** අග රජ්ජුගේ ඥාති සහෝදරියක්ද සරණ පාවාගෙන සිටියේය. මෙම යුරෝපීය **ඇලැක්ෂන්ඩර්** නාමය උතුරු ඉන්දියානුන් විසින් උච්චාරණය කෙළේ හරිශ්චන්ද්‍ර යනුවෙනි. පසු කාලයකදී මහමදිකයෝද සිකන්දර් යයි මේ නාමය බැවකර කළෝය.

බිඹුසාර රජු ග්‍රීක් කුමරියගේ පුත්‍රයෙකැයි ඇතැම් අය කියති. ඒ එසේනම් මෞර්‍ය වංශය වනාහි ශාක්‍ය ග්‍රීක් සහ කේවට්ට යන්නෙන් මිශ්‍ර වංශයක් බැවි විශ්වාශ කිරීමට පුළුවන.

උම්මග්ග ජාතකයේ පෙනෙන අයුරු බරණැස් නුවර චූලනී බ්‍රහ්මදත්ත පුරෝහිත බ්‍රාහ්මණයාද කේවට්ට නම් බ්‍රාහ්මණයෙකි. මේ කේවට්ට බමුණා පිළිබඳ විවාදයකි.

"කේවට්ට යනු ඔහුගේ නාමයයි. කෙවුලන් විසින් රක්නා ලද හෙයිනි ඔවුන් වෙත වැඩුන හෙයිනැයි ඇතම් කෙනෙක් කියත්." යයි, වර්ෂ 1897 දී රණසිංහ තැමැත්තෙකු විසින් ලියන ලද ගහපති ශබ්ද විනිශ්චයෙන් ප්‍රකාශයට පමුණුවා තිබේ. තුමුත් කේවට්ටයින් වෙත වැඩුනු බව දක්වන පුංචි කථාවක් නිදර්ශනය වශයෙන් දක්වා තැත.
රණසිංහයන් තමන්ගේම අදහස ග්‍රන්ථාරූඪ කරණ ලද බව හොඳටම පැහැදිලිය.

තවද අපේ සිංහල ඉතිහාස වලද ඒ මේ නවනන්ද රජුන් පිළිබඳව මෙසේ දන්වා ඇත්තේය. එනම්:- "පණ්ඩුක නන්දය, පණ්ඩුගතී නන්දය, භූතපාල නන්දය, රට්ඨපාල නන්දය ගොවිසාණ නන්දය, දසසිද්ධක නන්දය, කේවට්ට නන්දය, ධනපාල නන්දය, චන්ද්‍රගුප්තය, බිම්බුසාරය,"

"සුදෙවුන් රජු දක්වා පැවත ආ සූර්‍ය වංශෝද්භූත රජහු විඩූඪභ යුද්ධයෙහි කිඹුල්වත් පුරය හැර ගංගා නම් ගං අස "මොරිය" නම් පුරයක් කර විසූහ. ඒ පුරයෙහි වසන ශෞර්‍යවීර්‍ය බල පරාක්‍රමයෙන් යුක්තවූ චන්ද්‍රගුප්ත නම් රජ කුමරුවෙක් චාණක්‍ය නම් අමාත්‍ය බ්‍රාහ්මණ යක්හුගේ සහායෙන් කාලාශෝක රජු ඉක්බිති පැලළුප් නුවර රාජ්‍යය ගෙන විසුයේය."
"ඔහු පින් බිඹුසාර නම් රජ එම මොරිය කුමරින් බම්ා නම් ශාක්‍ය කුමරියකු ගෙන්වා වසනුයේ අශෝකය, තිස්සය, යන රජ කුමරුවන් දෙදෙනකු ලද්දේය."

"එසිත් ප්‍රධාන පුත්‍රවූ ධර්‍ම නම්වූ බිසවුන්ගේ නම එක්කොට කියන ලද නම් ඇති තෙ සැට දහසක් නුවර පිරිවැරූ පැළලුප් නුවර සද්ධර්මාභිලාෂිවූ ධර්‍මාශොක රජ දශ රාජ ධර්මයෙන් රාජ්‍යය කරණ සමයෙහි ලඞ්කා ද්වීපයෙහි සකල නගරාංග රාජ්‍ය සම්පත්තීන් සමෘද්ධවූ අනුරාධපුර ප්‍රවරයෙහි සවන ගුණ මෙනෙන් ගත් අවනි පති කුල දෙවන පෑතිස්ස රජ රාජ්‍ය ශ්‍රියට පැමිණියේය."
(රාජ රත්නාකරය සහ නිකාය සංග්‍රහය)

## කුරු රට

මෙනම් රට ගංගා සහ යමුනා යන දෙනදිය අතර උෘඞ්ච ප්‍රදේශයේ පිහිටියේය. ඉන්ද්‍රා ප්‍රශස්ථ නොහොත් ඉඳිපත් නුවර සහ හස්තිනා පුරය මෙහි මහ නගර වන්නේය.

චන්ද්‍ර වංශයේ රජදරුවෝ වූකලී පෞරව, පුරූ, භරත, කෞරව, කුරූ, කුරුකුල, යනාදී වංශවතුන් වන්නේය. පෞරව හෙවත් පුරූ රජ, මහ භරත රජ, කුරූ රජ, ශාන්තනු රජ, වේද ව්‍යාසර මුනි, විචිත්‍ර වීර්‍ය රජ, චිත්‍රානඬ රජ, ධෘතරාෂ්ට්‍ර අන්ධ රජ, පාණ්ඩු නැමැති ඇළි රජ, විධුර පණ්ඩිත, කාණ්කුමාර, යුධිෂ්ඨිර භීමසේන, අර්ජුණ, නකුල සහ දේව, භීමවික්‍රම, දුයෝධ්ධන, දුක්ශාෂන, යනාදී ක්‍ෂත්‍රියන් සියල්ලෝම කුරුරට උපන් කුරුකුලයෝය.

මේ රාජ වංශිකයෝද ඔවුන්ගේ දරු මුනුපුරන්ද රණ බිම ක්‍රීඩා පිටියක් වශයෙන් සැලකුවෝය. බහු භාය්‍ර්‍යා සේවනය චාරිත්‍ර ධර්මයක් ලෙසින්ද, වනගත දඩයමේ යෙදීම, මසුන් මැරීම, සිරිතක් වශයෙන්ද, විනෝදය පිණිස දූකෙළිය සහ සුරාව ආශ්‍රය කළ බවත් මහා භාරතයෙන් සහ කුරුරට පිහිටි ශිලා ලිපිවලින්ද පෙනේ.

පාපයට බිය රහිත මෙසේ වූවත් මදීණය කර, ධර්මයෙහි හසුරුවනු කැමැත්තෙන් ශ්‍රීමත් ගෞතම ශාන්ති නායකයන් වහන්සේ කුරුරටට කීප වරක්ම වැඩිය සේක.

සූක්ෂමවූ සතිපට්ඨාන සූත්‍රය දේශනා කර වදාලේ විශෙෂයෙන්ම කුරුකුලයින් උදෙසාය. කුරුරට සාමාන්‍ය වැසියන් පවා බුඩධර්මය පැහැදිලිකර ගැනුම් වස් සමතුන්ව සිටියේ යයි කිමෙන් ඔවුන්ගේ තීක්‍ෂණ ඥානය මොනවට එළිදරව්වේ.

සතිපට්ඨාන සූත්‍රයේ ප්‍රකාශවන අන්දමට කුරුකුල්සින් උතුරුකුරු දිවයිනෙන් අවුත් පදිංචිවූ පිරිසකි. අද පවත්නා ශ්‍රෙෂ්ඨ පංචශීලය පවා කුරු ධර්ම ජාතකයේ කුරු ධර්මය යනුවෙන් දක්වේ.

ඉන්දියාවේ හා ලංකාවේද කුරුකුලයින්ව සංස්කෘත භාෂාවෙන්:- පුරු, පෞරව, භරත, භාරත, කුරු, කෞරව, කෞරව්‍ය, කුරුවංශ, කෞන්තෙය, සහ පාණ්ඩ්‍යය යනුවෙන්ද පාලි භාෂාවෙන් කොරව්‍ය, කොරබ්බ, කොන්ත, යනුවෙන්ද, දෙමළ භාෂාවෙන්:- පුරුවර්, පාරදර්, කුරුකුලම්, කුරුකුලත්තාර් කුරු නාච්චර්, කවුරවර්, කවුරියන්, කරයර්, කාඩියර් කරවෝර්, කරවර්, මීනවන්, පාණ්ඩියන්, කුරුවීර්, කවුන්ඩර්, කවුරවඩුගර් යනුවෙන්ද,

---

‖"பரவு பாரதரே மற்றைப் பௌரவ ரென்னு ஞாமம்,
குருகுல வேந்தர்க்காகும் கௌரவ ரென்றுங் கூறும்."

(சூடாமணி ஞிகண்டு)

"පරවු පාරදරේ මට්රෙප් පෞරව රෙන්නු නාමම්;
කුරුකුල වේන්දර්ක්කාකුම් කෞරව රෙන්රුං කූරුම්."

(චූඩාමණී නිඝණ්ඩුව)

භාවය:- පෞරව යන්නට පරවු පාරදරේ යන තවත් නාම දෙකකි. කෞරව යන්නට කුරුකුල වේන්දර් වරුන්ට කෞරව යන තවත් නාම දෙකකි.

චූඩාමණී නිඝණ්ඩුවේ ප්‍රකාර:- පෞරව යන්නට පරවු යන්න අයිතිවන්නාසේම කෞරව යන්නට කරවු යන්නද අයිතිවේ.

සිංහල භාෂාවෙන්:- කුරුකුල, කවුරව, කුරුවර, කුරුවීර, කුරුඇමියෝ, *කුරුනෑ කැමිය, කුරුනෑයෝ කුරුකැමියෝ,කාරවන්ත, කුරුවීර, කොණ්ඩ, §කරවි, කාරාව, කාරාවෝ යනුවෙන්ද හැදින්වේ.

## කුරුකුලය සහ ලංකාව.

සහදේව නැමැති කුරුරම කුරුකුල කුමරු ලංකාවට පැමිණ සිංහලයින් හා යුධකොට මහත් හිර සෙනගක් සිය රටට ගෙන ගිය බව මහ භාරතයෙන් පෙනේ. ඔහු හා පැමිණි සමහර යුධ භටයින් මෙහි රැඳුනාවද කිසිම අනුමානයක් නැත.

ඔවුන් පාම්බම් පටු මාර්ගයෙන් මෙහි පැමිණෙන්ට ඇතැයි කල්පනා කරති. යාපනය අසල "කුරුෂාදි දිව" නොහොත් "කුරුකුල දූපත" නැමැති දූපතට පාලුව තිබෙන දූපතේ මොවුන්ගෙන් සමහර දෙනෙක් ස්වල්ප කලක් කඳවුරු බැඳගෙන සිටියාහ.

---

*கரவோர் - கரவர்
කරවෝර් - කරවර් (කරාව)
(යාල්පානම් පෙයරකරාදි 243 පිටුව)

§Kurunegala—"Some derive it from the circumstances of a part of its orginal inhabitants having come over from Kurukshetra or Kuru-Rata (The scene of the bloody wars between the Pandawa & Kaurawa Princes) and settled there."
(CassiCoetty Gazeller 1834 Page 145)

භාවය:- පාණ්ඩ්‍යව සහ කෞරව කුමාරයින්ගෙන් ඝාතන සටන සිදුවූ පෙදෙශ වන කුරුක්ෂෙත්‍රයෙන් නොහොත් කුරුරටින් මුලින් පැමුණුන අයින් කරණකොටගෙන කුරුණෑගල යන නාමය ඇතිවූ බව සමහරුන්ගේ කල්පනාවයි.

(කාසිචෙට්ටි ගැසට්යර් 1834. පිට 145)

ඒ බැව් යාපනේ පැරන්නන් විසින් ජනකථා ශයෙන් කියනු ලැබේ. ඒ නිසා මෙම ද්‍වීපතට "කුරුෂාදි දිවි" යන නාමය ඇතිවීයයි කියති. සහදේව තෙමේ පඩි, සොලි, කේරල, ද්‍රවිඩාදී දකුණු ඉන්දියානු රටවල්ද උතුරු ඉන්දියානු රටවල් බොහොමයක්ද ජය ගත්තේය.

ලංකාධිපති විභීෂණ අපේ මහාරාජයාද නොයෙක් වර සහදේව කෞරවාධිපතියා හට පඬුරු පාක්කුඩම් යවා තිබෙන බව මහ භාරතය කියයි.

(මහ භාරතය, තවත් පත පොත හා ජනකථා ආශ්‍රයෙනි)

"The Arjuna from Manipuram proceeded towards gokarana and saw all the secred waters."

Ancient Jaffna, by Mudliyar C Rasanayagam C. C. S. page 34)

භාවය:- "අර්ජුන තෙමේ මණිපුරයෙන් ගෝකර්ණ දෙසට ගියේය. එහිදී පරිසුඩ තීර්ථයන් එකක් පාසා සියල්ලම දක්නා ලදී." (සිවිල් නිලධාරි සී. රාසනායගම් මුදලිදුගේ පුරාණ යාපනය නැමැති ඉතිහාසය පිට 34)

මෙහි ගොකර්ණ යනු ත්‍රිමංගලාව හෙවත් ත්‍රිකුණාමලයයි අර්ජුන නැමැති කුරුකුල රජද ලංකාවට පැමිණි බව මෙයින් වටහාගතහැක.

## දෙවන වරට කුරුකුල ලංකා තරණය.

"*පෙර අතිත කාලයෙහි කුරුරටින් රුවැති පැවැති බිසෝ කෙනෙක් හා රජ කුමරුවෙක් හා සිටාන කෙනෙක් හා පුරෝහිත බමුණු කෙනෙක් හා සපිරිවරින් අවුත් රාවණා යුධ කල පසු රාම රජුගේ නියෝගයෙන් විසූ හෙයින් කුරුරට යයි නම් විය.

(රාවණා රාජාවලිය පුස්කොළ පොත)

* In old times, after the Ravana war, from Kuru-rata there came to this Island a Queen, a Royal Prinec, a rich noble man a learned prime minister, with their retinue, and by order of King Rama dwelt in the place called on that account Kuru-Rata." (of Ceylon ) Ravana Raja Waliya)

රාවණා ලකිසුරා පරදවා රාම රජ ලංකාව ජයගත් පසු විභීෂණ මෙරට රජවිය. මේ කාලය තුල ඉහත සඳහන් කෞරවයෝ සිවු වර්‍ගය මෙහි පැමිණ පැලපදිංචි වූහ. එවක් පටන් අද දක්වා ඔවුන් පදිංචිවූ ප්‍රදේශයට සිංහලසා කුරුරට කියාද අළුත් කුරු කෝරළය කියාද නම්විය.

රාගමට තුදුරින් පිහිටි කුරුකුලාව නැමති ගම්මානයේ මෙම කුරුකුලයින් තවාතැන් ගෙන සිටි හෙයින් ඒ ගමට කුරුකුලාව නම් වීයයි විශ්වාස කරති. මෙය පිහිටියේද අළුත් කුරුරට සීමාව තුලය.

කුරුරට කෞරව වංශිකයින් සිවු වර්ගයකට බෙදී සිටි බවද විශ්වාස කළ හැකිසි.

රාවණා රාජවලියේ සඳහන් ප්‍රකාරෙ:- කුරුරට රූබැති පැවැති බිසෝ කෙනෙක් හා රජ කුමරුවෙක්" කී හෙයින් චන්‍ද්‍ර වංශිකයෝද-

"ඕවාන කෙනෙක්" කී හෙයින් වෙලඳ වංශිකයෝද-

"පුරෝහිත බමුණු කෙනෙක්" කී හෙයින් බ්‍රාහ්මණ වංශිකයෝද-

"සපිරිවරින්" කී හෙයින් සාමාන්‍ය වැසියන් යයි සිතා ගත යුතුව තිබේ.

මේ නයින් බලන කල ප්‍රශ්නයට භාජනය වන මෙම කුරුරට පිරිස ගෝත්‍ර හතර කට බෙදී සිටියන් බව කල්පනා කළ හැකිය.

එදත් අදත් ආසියාවේ සහ යුරෝපයේද වෙතත් මහ කොදෙව් වලද වැස්සෝ සිව් පඬකතියකට බෙදී සිටිති. ආසියාවට ඇතුලත් බොහෝ රටවල ජනයා බ්‍රාහ්මණ ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර, කියාද †යුරෝපීය ජනයෝ Royalty Ministers Traders, Peasant, එනම්:- රාජකීයයෝය.

---

†එංගලංතයේ පඬකති භේදය උග්‍රව පැවැති කාලේ ඊට විරුඬව සටන් කළ දේවගැතිවරයෙක් මෙසේ කියාතිබේ "මනුකය ඇති සියල්ලන් ඒව, ආදම්, සුනන් නම්; කුලවත්හු කියත්තේ - කාට කාටද? එසේ නම්:-

මංත්‍රි හෙවත් ප්‍රජකයෝය· වෙලෙන්දෝය. කම්කරුවෝය යන සිව් පංක්තියට බෙදී සිටිති. අප්‍රිකා මහද්වීපයේ නිග්‍රෝ ජනයාද, දුනුකාරයෝය. ලංසකාරයෝය. පොලුකාරයෝය. නාවන්නෝය. යන සිව් වර්ගයකට බෙදී සිටියාහ. යන බවද දැනගන්ට තිබේ. එමෙන්ම කුරුරට වැසි කෞරව වංශිකයෝද මූලදී ගෝත්‍ර වශයෙන් සතර වර්ගයකට බෙදී සිටියාහ. යන බව වටහා ගත හැක.

මෙහි පැමිණි මොවුන් අතරෙන් පැවතෙන්නාවූ ‡කුරුකුල. මනුකුල. වණිකුල. බරතකුල. මිහිඳුකුල. අරශකුල. කණිකුල. ලිනියකුමාර. නෙත්තිකුමාර. රන්දුනු කුමාර. කුඩා කුමාර. අරශන්. තේවර්. පෙරුමාල් දේවපිර්. යනාදීන් සහ තවත් උසස් පෙළපත් නාම දරන්නන් කුරුවංශික රාජ කුලීනයන්ගේ මූනුබුරන් විය යුතුයි.

---

‡තුම්බවර කාර්මණෙයක යාසෞයාදයි තාපසාශ්‍රමා සෘෂිකාඃ කාඤ්චි මරුචිපට්ටන වෙයර්‍යායික සිංහලා සෘෂභා.

(වෘහත්සංහිතා 14 අධ්‍යාය)

භාවය:- තුම්බුරු දේශයෙන් සුපැමිණි "මූලකම්" කාරකයන්ගෙන් යුත් දුර්ලභවූ හෙල්කසඹිලියා ගසින් යුත් සාගර සමීප ප්‍රදේශයෙහිවූ තාපසාශ්‍රමයන් ඇති "සෘෂික" නම් දේශයද කාඤ්චි පුරයෙන් හා මරුචි පටුනෙන් "චේරි" (කේරළ) දේශයද භාරත රජුගේ ගෝත්‍රිකයන් ඇති ආයර්‍යයන්ගෙන් යුත් "සිංහල" දේශයද දතයුතුයි. යනුයි

සිංහලයසින් සියලුදෙනාම පාහේ භාරත රජුගේ කුලයට අයත් භාරත වංශිකයින් බැව් මෙයින් ස්ඵුටවේ. භාරත වංශය වනාහි කෞරව වංශය නොහොත් කුරුකුලය බැව් ඔප්පුකිරීමට අමුතු සාක්ෂි කුමටද? වෘහත් සංහිතාවෙහි කතෘවර වරහමිර ආචාර්‍ය්‍ය ක්‍රි: ව: 375 දී පමණ විසූ බව ප්‍රසිද්ධය. වරහමිර ආචාර්‍ය්‍ය වනාහී අපේ දෙවෙනි උපතිස්ස රජු ක්‍රි: ව: (368/410) හා සමකාලිකයෙකු බැව් පෙනේ. හෙතෙම වික්‍රමාදිත්‍ය (වික්‍රමසූරිය) රජුගේ නව පණ්ඩිත රත්නයටද අයත් විය.

බමුණුගේ, බ්‍රාහ්මණගේ බමුණු සන්නාදිගේ, පත්තිනිගේ,, ගිනිගේ රන්ගේ, ගුරුගේ, රාජගුරුගේ කාර්තිගේ, පංචසිලගේ යනාදී පරම්පරා සහ තවත් වංශවත් නාමාවලි ඇත්තන් කුරුකුල, බමුණු, ගෝත්‍රික යන්ගෙන් පැවැත්වෙන්නන් විය යුතුයි.

සෙට්ඨිගේ, හෙට්ටිගේ, හෙට්ටි තංත්‍රිගේ, හෙට්ටි කන්දගේ, පරවරගේ, හෙට්ටියා පටබැඳිගේ, සෙට්ටි පට්ටන් කට්ටිගේ, සලුප්පරගේ, පරවර හෙට්ටිගේ, හෙට්ටි හේවාගේ යනාදීහු සහ තවත් වෙළඳ නාම දරන්නන් කෞරව වානිජ ගෝත්‍රිකයන්ගෙන් පැවතෙන පරම්පරාව යයි විශ්වාස කළ හැක.

සිව්වෙනි කොටසට අයත් කුරුරටියන් ඔවුන්ගේ වර්ග නාමාවලිය අනුව තෝරා බේරා ගතහැකිය. ඔව්හු *මුහුදේ යාත්‍රා පැදවීම, මසුන් මැරීම, ‡මාලිගා තැනීම වඩු කර්මාන්තය, ගව මේච්චලය, ගොඩ සහ මඩ ගොවිතැන් යනාදී කර්මාන්ත කරණ අයින් යයි සැලකිය හැකිවේ.

---

"*කවලය නාදන් නම් පඩි රජු ක්‍රි: ව: 1100 දී පමණ සිට සිව් අවුරුද්දක් රාජ්‍යය කළේය. සමුද්‍ර මාර්ගයෙන් වෙළඳාම කළ මෙරජු මහත් ධන සම්භාරයක් රැස්කර ගත්තේය. එක් වතාවක් වෙළඳාම පිණිස යාත්‍රා කරණ අතර භයාණක කුණාටුවකට අසුව නෞකාව සුනු විසුනු විය. ඒ රජුද එයින් විනාශ විය." (ඩබ්ලිව් වේලර්ගේ ඉන්දියානු ඉතිහාසය. පළමුවෙනි කාණ්ඩය. 201 පිටුව)

"හින්දු වර්ගයේ යාත්‍රාකරුවන් විසින් හින්දු ධර්මය සහ සිව් කුලයෙහි ජනයාද මගධයෙන් ජාවා දූපත් වලට ගෙනයන ලද්දේ ක්‍රිස්තු පශ්චාත් අවුරුදු 70 ට පමණ උඩදීය." (මාර්ෂ්මන්ගේ ඉන්දියා ඉතිහාසය)
ජාවක ජනයාද කුරුරටින් ගිය පිරිසක් බැව් කියනු ලැබේ

‡ගොවිතැන් කරණ කරාවේ ගෝත්‍රයට "කරෙයි තුරෙයි වෙල්ලාල" කියාද, වඩුවැඩ කරණ ගෝත්‍රයට "අච්චුවෙල්ලාල" කියාද ද්‍රවිඩ භාෂාවෙන් කියති.

(රේගුලෝ ඉතිහාසය)

අද ලක්දිව සිංහලයෝය, ජාපනේ ද්‍රවිඩයෝය, වන්නිවරුය, පරදේශ්වරුය, යනාදී වශයෙන් පෙනී සිටින කුරුරට කරාවේ මිනිසුන්, ඔවුන්ගේ මගුල් තුලාංවලදී "අසවල් පරම්පරා ඇත්තෝ අප ගෝත්‍රයට අසමානයෝය" "ඉන්නිසා උන් හා අප අතර හිර ගනුදෙනු නොකරම්හ" යනාදි උපහාස කථා කුරුකුල මිනිසුන් අතරම පවතින්ට හේතුව ඔවුන් නොයෙකුත් පංක්ති වලට බෙදී සිටින බැවින් යයි සිතිය හැකිය.

## විශේෂ විභාග.

ඉන්දියානුන්ගේ මහා භාරතයේ කුරුරට සහදේව කුමරු යුධ සේනාංකයක් හා සමග ලංකාවට පැමුණුනු බවත් එවකට මෙහි විභීෂණ රජු ලංකාව ආණ්ඩු කළ බවත් කියා තිබේ.

සිංහලයින්ගේ රාවණා රාජාවලියේද රවිලිදුගේ පරාජයෙන් පසු විභීෂණගේ ලක් ආණ්ඩු කාලයේදී පමණ කුරුරට කුමාරයෙක් සපිරිවරින් ලක්දිවට පැමිණුන බව සඳහන් කර තිබේ. මේ කථා දෙකට අයත් කුරුරැජියන්ගේ පැමිණීම එකක්ම බවට මෙහිදී විශ්වාස කළහැකිය.

මොවුහු පදිංචිවූ ප්‍රදේශ වලට අළුත් කුරුරට පරණ කුරුරට, කුරුකුලාව, කුරුණාදි දිව්, කුරුකුලිය, කුරුකුල කඩු, යනාදී නාම ඉන්පසු ව්‍යවහාරවීයයි සිතා ගැනීමට බාධාවක් නැත.

## සිරිලක අළුත් කුරු රට

රාම රාවණා යුද්ධයෙන් පසු කුරුරට වැසි රජ කුමරුවෙක් හා බිසවක්ද සිටාණ කෙනෙක් හා පුරෝහිත බ්‍රාහ්මණයෙක්ද සපිරිවරින් නැව්නැගී විත් ලක්දිව බැස රාම රජහුගෙන් එක් ප්‍රදේශයක් ලබාගන එහි වාසය කලාහුය. ඔවුන් වාසය කළ ප්‍රදේශය එතැන් පටන් ලක්දිව කුරුරට (අළුත් කුරුකෝරළය) යන නාමයෙන් ප්‍රසිඬ විය.

(ඕ. ඕ. රණසිංහ මහතාගේ පුරාවෘත පොත)

## සිරිලක පරණ කුරු රට

"එයින් මෑත භාගයෙහි ගජබාහු නරපති තෙමේ යට කියන කුරුරටෙහි (අළුත්කුරු කෝරළයෙහි) පරණ සිටියවුන් එහි එක් පසකට යවා ඊට පරණ කුරුරට (පරණ කුරු කෝරළය) යයි නම් තබා, තමා විසින් දඹදිව කුරුරටින් අලුත ගෙනෙන ලද සෙනග (අළුත්) කුරුරටෙහි අනික් පසෙහි නවත්වා ඊට අළුත් කුරුරට අළුත් කුරු කෝරළය) යයි නම් තබාලූයේය."

(ගජබා කථාව සහ සොළී වංශ පේරුව)

හතර කෝරළේම ඇතුළු පරණ කුරුරට නොහොත් පරණ කුරුකෝරළේ වැජඹෙන කෞරව වංශවතුන්ගේ නාමලේඛනය.

දූ රු තම ඔහු සිටිය පෙදෙසට කුරුරට ය
පි රු බල ගජබා නරපති ඉන් පසු ය
කුරු රට පලමු සිටි උත් පලවා හැරි ය
ස රු දඹදිවින් ගෙන ආ සෙන් එහිම වි ය

සො දිනේ පරණ සිටි කුරුරට අයට පෙ මා
ලැ බූ නේ අණ පෙදෙසක් සිටිනට කදි මා
පො රණේ කුරුරටින් ආ අය නිසා පෙ මා
ලැ බූ කේ පරණ කුරුව නම එද ත මා

ග තින් සිතට තුඹ කිව් පිලිවෙල යස ට
බැ තින් සතට හැහෙනා ලෙස පිලිවෙල ට
රු තින් පලමු කොටසේ තිබු තැනේ සි ට
ඉ තින් කියාපන් එහි සිටි දනන් ම ට

එකලට තිබුනු නම් ගම් මම දුටු ලෙස ට
සතහට පලවු පොත්පත්වල තිබු ලෙස ට
සහතුට පලමු කොටසේ තිබු නම් ලඟ ට
ගොතපෙල කියමි නානාසඞ්ඛාර තු ට

මල්ඝතුජේ රාල. පොල්ශස් දෙනි රා ල
අත්තිම පල්ලි පෝරුවේ පට්ටි රා ල
තම්බර පරණ කුරුවෙ මුල පැවති පෙ ල
සුන්දර දහ අටක් ඇති ගළලා පෙ ල

කෙහෙල් පත්තලට කොනහේ තැනැන්නැ හේ
පල්ලි පෝරුවට පෝහත් තැනැත්තැ හේ
ශන්ගෙ ආරච්චි නයිදේ එගම ල හේ
අත්තනායක නයිදේ එම ගම තුල හේ

එම ගම මිනිශසුඥර නයිදේ නිබ දේ
එගමට කුරුප්පු ආරච්චි නයි දේ
තඹවිට මාපා ආරච්චි නයි දේ
එම විරප්පෙරුම ආරච්චි නයි දේ

කෙහෙල් පත්තලට දුම්පොලගේ නයි දේ
තඹවිට රණවිර ආරච්චි නයි දේ
පල්ලේ ගෙදර අප්පු එම ගම පයි දේ
ආරච්චි තැනැන්නැහැ හෙම්මාතගම සො දේ

එමගම ගජබාහු ආරච්චි නම් තැ තේ
බස්නායක තැන්නැහැ එම ගම දනු සොඳි තේ
එම ගම සඟසේකර් තැන ඊට උ තේ
එම වික්‍රම ආරච්චි තැත එත තේ

ජාසූරිය තැනැන්නැහැ හෙම්මාත ග මං
මොලිගමුවේ දහනායක තැතැත්නැහැ පෙ මං
එරමිණී ගම්මතට නම් ලත් අය පේ මං
මාරසිංහ ආරච්චි තැත ගේ මං

එම ගමවම සමරකෝන් ආරච්චි තැ න
†අලුදෙනියේ මේගසූරිය ආරච්චි තැ න
රත්දිලිගම ශේනක ආරච්චි තැ න
බෙරුක්ගම්මන තැන යෝදගම ව න

---

†සත්කෝරලේද, කුරුකුල ගම් කීපයකම මේගසූරිය මුදියන්සේලාගෙ පරම්පරාවට අයිති කෞරව වංශිකයන් සිටිති.

මොහො ට්ටි තැනැන්නැහැ දනු කිරපෙං තේ
ඉද්දවල තැනැන්නැහැ එම ගම සොඳි තේ
එලගිපිටියෙ විජයසුන්දර තැන සොඳි තේ
හත්ගම්පොල සූරවීර ආරච්චි තැ නේ

එදිරිසූරි ආරච්චි තැන එග මා
නාරංගම්මනට තැන පෙර කලදි පෙ මා
එම ගම අතපත්තු ආරච්චිය එත මං
බුළුගම්මනට ජයසුන්දර නාසිදෙ න මා

කල්වාතේ දත සකි උඩගෙදර තැ න
පල්ලේගෙදර තැන එම ගම සිටි පොර න
තැනැන්නැහැ දෙනාවත්තේ දනු සොඳි න
නිකපිටියේ වීරසූරිය ආරච්චි තැ නා

බමුනං ගම්මනට දහනැකා තැතේ ද නු
බලවත් ගම පල්ලේ මුල්ලේ තැන, ව නු
එම ගම හත්පත්ගෙ නාසිදේ තමිත් ද නු
අලුපත කොටුවෙ නාසිදේ එගම ව නු

කුඹල්ගම තැනැන්නැහැ මූල පටත් ඇ නී
එම ගම නාසිදෙ හාමි තමකුත් පැව නී
පෙමකර වෙරකෝ තැන මූල පටත් ඇ නී
ගම කොලවර නාසිදේ ඒ ලඟ පැව නී

(සිව් කෝරලේ විසිතුරු සහ මාත්ත පහේ සිව්පද පොත)

## කුලසේකර පාණ්ඩියන් රජ්ජුරුවෝ මසුන් මැරීම.

ක්‍රිස්තු උප්පත්තියට අවුරුදු 500 ට පමණ පුරාණයේ ශක්‍රපූර් පට්ටනමේ භූර පාණ්ඩියන් රජකමට පැමිණෙන ලදී. ඔහුගේ පුත් අමුර්ත පාණ්ඩියන්ට පුත්‍රයෝ හත් දෙනෙක් වූහ.

වැඩිමහල් පුත්‍රවූ ඝඥවිජිය පාණ්ඩියන් ශක්‍රපූර් පට්ටනමේ රජකමට පත්විය. බාලම සහෝදර කුලශේඛර පාණ්ඩියන් කුමාර තෙම මනාවූර් නම් රටට විත් පුන්නයි කායල් නගරයේ සමුද්‍රය අශබඩ පදිංචිව, හක්, මුතු, පබළු, යනාදි මස් මරමින් එන අතර ඔහුගේ තොරතුරු මනාවූර් රට රජු හට දැන ගන්ට ලැබී, එරජුට පුත්‍රයෙක් නැති බැවින් ස්වකීය එකම දියණියවූ ශ්ලෝදයි අම්මාල් කුමාරිකාව ඉහතකී කුලසේකර පාණ්ඩියන් කුමාරයාට කාරය බැඳ රාජ්‍යය ඔහුට පාවා දෙන ලදී.

මේ කුමාර තෙම සක් මුතු සහ මසුන් මැරීමෙන් ජීවිකාව කරගත් බැවින් තමන්ගේ තොලිලයට ලකුණක් වශයෙන් මත්ස්‍යයා බැඳි කොඩිය සහ හක්ගෙඩිය බැඳි කොඩියද රාජකීය අඩයාලම්ක් ආකාර පිළිගනි.

එවක් පටන් පඬි රාජවංශයට මත්ස්‍යයා බැඳී කොඩිය සහ හක්ගෙඩිය බැඳි කොඩියද උරුම විය මොවුහු රටවල් ආරක්ෂා කිරීමට සහ මහා සමුද්‍රයෙන් වදින්නාවූ පරසතුරන් මර්දනය කිරීම පිණිස මුහුදුබඩ රටවල තොහෙත් කරසිපූර්වල පදිංචිවූහ.

තවද මොවුහු මසුන් මැරීමේ තොලිලය සිහිවීම් වස් මිනවන් යන නාමයද තම තමන්ගේ නාම වලට උප නාම පදයක් වශයෙන් යොදාගත්හ. මීනවත් කුලසේකර පාණ්ඩියන් රජ කෝර්කෙයි, මනාවූර් සහ මදුරාපුර රාජධානියෙහි ආණ්ඩුව පවත්වමින් මුතු, සක්, පබළු ආදී වස්තූන්ගෙන් පිරි නැව් යුරෝපා රටවලට යවා වෙළඳාම් කර මහත් ලාභයක් අත්කරගෙන තිබේ. මොහුගේ යුද්ධ නෞකාවන්හි අධිපතීන්ට මාරජ්, මාරන්, යන නාම කියා තිබේ.

මෙම ක්ෂත්‍රිය වංශිකයෝ දඩයමෙහි ලොල්වූහ. දඩ කෙළිය රාජ වංශිකයින්ටම උරුම ප්‍රවේණියකි. තවද සංඥාකිරීම, පිනට, දනට දීම, දඩයම් කිරීම, මසුන් මැරීම

යුඩ කිරීම, රටවල් ආරක්‍ෂා කිරීම, වැසියන් රැකීම, යනාදි කටයුතුවලට රාජවංශිකයන් යෙදී සිටිය යුතු බව "තිදිතුල්" නැමැති ද්‍රවිඩ පොතේ කියා තිබේ.

රාජ වංශිකයෝ තමතමන්ගේ ජීවිකාව සහ වැසියන්ගේ ආරක්‍ෂාව පිණිසත් ගිරි පර්‍වත වලද, වනාන්තර වලද, මහා සමුද්‍රයේද, ක්‍රියා කරති.

කඳු අතර තිබෙන්නාවූ **ගම්මිරිස්, එංසාල්**, යනාදී ප්‍රයෝජනවත්වූ ද්‍රව්‍ය **එකතු** කරගැනීමෙන්ද, වනයෙහි වසන ව්‍යාඝ්‍රාදි නපුරු සතුන් මරාදැමීමෙන්ද, දඩයම් කිරීමෙන්ද, ඇත්දත්, අලිදත් යනාදී වටිනා දේවල් සපයා ගැනීමෙන්ද මහා සමුද්‍රයෙහි තිබෙන මුතු. **පබළු**, සක් ආදී දේවල් ලබාගැනීමෙන්ද, සමුද්‍රරෙන් එන්නාවූ රුපුන් වැලැක්වීමෙන්ද, මසුන් මැරීමෙන්ද, සිටිය බව **අබි සන්දිහි** පුරාණ නම් පොතේ **"වෙට්ටෙයි සෙයිය"** කාණ්ඩයේ කියා තිබේ.

(තිත්වක්කන් දෙමළ පොත සහ තුත්තුකුඩියේ පතිමය මලර් නැමැතී දෙමළ සඟරාව)

මීනවන් කුලසේකර පාණ්ඩියන් රාජ වංශිකයින්ගේ මාතෘ භූමිය වූකලී දඹදිව උතුරුබද සින්දු නදිය අසබඩ පිහිටි **මංජීනරු නගරයය.** ඔවුන්ගේ කාසිවල මාළුවා **චන්ද්‍රයා, මුතු, තෝම්, කස්තූරි මුවා, පානා, සෙංකෝලය** යනාදී රාජකීය ලාංඡන මුද්‍රිතයි. දඹදිව දකුණේ **මනප්පාඩ** නුවරට නුදුරින් **කුලසේකර පට්ටනම්** නැමැති නගරයක් ඒරජුගේ නමින් මේදක්වා පවතී. මෙහි සහ **තූත්තුකුඩිය මනප්පාඩ**, යනාදී පලාත්වල වර්‍තමානයේ පවා ප්‍රවේනි-කාරයෝ වනාහි **පරවර** සහ **කාරාවේ** මිනිසුන් වෙති.

මේ රජු උතුරු ඉන්දියානු චන්ද්‍ර වංශිකයෙකු වූයේ වී නමුත් ද්‍රවිඩ භාෂාව බොහෝ දුරට දියුණු කළේය.

# ප්‍රාණ ඝාතනය.

## ඒ නගරයේ සිටි මස් මරන්නෝ දූන් ශාක්‍යයෝය

"පසේ නදි රජ කොසොල් රට රජවූ කල්හි ශාක්‍යවංශයෙහිවූ කපිල රට කුමරියක් සරණ ගිවිස්සේය. අමිතෝදන පුත් මහා නඳුනගේ වාලියක් රූප ලක්ෂණයෙන් අගනැත් පැමිණියේ ඔහට සරණකර ගැණීම පිණිස දෙන ලද්දිය. ඇගේ පුත් තෙමේ (විඩුඪභ) විරූඪ රජු විය."

"ඔහු දහ අට වයස්වූ කල තවත් භාඹිකිං නම් බ්‍රහ්මචාරී කෙනෙක් සමග මහා නඳු සම්මුඛ වීමට ගියේය." "එකල කපිල රටට බුදුන් වැඩ එහි තමන් වහන්සේගේ සංඝ සංකච්ජා සභාවක් ඇතිවිය. විරූඪ රජ (විඩුඪභ) පැමිණ බුදුන් හිඳින සිංහාසනයට නැග්ගේය."

"එවිට ශාක්‍යයෝ මහත් කෝපයෙන් දිලිගී "මේ වාලිගේ පුත්‍රා කුමක් නිසා සිංහාසන ප්‍රාප්තවිද" යි බිණුවෝය." "එකෙනෙහිම විරූඪ (විඩුඪභ) පිටත ගොස් තම අතවැසියාට කථාකොට "ශාක්‍යයෝ මා කෝප කළෝය මා සිංහාසන ප්‍රාප්තවූ කල්හි මෙය සිහිකරව"යි කීවේය."

"පසු කාලයක විරූඪ (විඩුඪභ) රජවූ පසු මහත් සේනාවක් ගෙන ශාක්‍ය කුල පුත්‍රයන් විනාශ කිරීමට ගියේය. බුදුන් විරූඪ (විඩුඪභ) රජ සම්මුඛවීම මතු දක්වන ජාතක කථාව වදාළේ මේ ස්ථානයේ දීය"

"මේ ස්ථානය අතීතයෙහි මසුන් මරන්නන්ගේ ගමක් විය."

"දුර්භික්ෂයකදී ඒ ගමේ එක් පෙදෙසක්හී විලක බොහෝ මත්ස්‍යයෝ සිටියෝය, මස් මරන්නන් මත්ස්‍යයන් ඇල්ලීමට ගියවිට පු (තිරිඟු ගුලිය) නම් මත්ස්‍යයෙක්ද වොෂි (ප්‍රලාප) යන නමින් මත්ස්‍යයන් දෙදෙනෙක්දැයි සත තිදෙන මස්මරන්නන් හා කෝපවූවෝය."

"විල ඉවුර සිටි කුඩා කොළුවෙක් උඩපනින කුඩා මත්ස්‍යයන් දැක කෙවිටක් රැගෙන උන්ගේ බලුවට ගැසුවේය." "ඒ නගරයේ සිටි මස්මරන්නෝ දැන් ශාක්‍ය යෝය. පුතම් මත්ස්‍යයා දැන් විරූඪ රජුය. ටොෂි දැන් බ්‍රහ්මචාරීය. කුඩා කොළුවා නම් මම්මවේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක." (පාහියන්ගේ බෞද්ධ රාජධානි සහ වන්දනා ගමන් විස්තරය පිට 56, 57.)

**සූර්ය වංශික රාම කුමරුගේ, මුව දඩයම**

"වම් පුල්ලි රන්මුවා විද මැරීම පිණිස රාම කුමාර තෙම තම දුන්න ගෙන රන්මුවා ලුහුබැඳ ගියේය."
(රාමායනය)

**රාම කුමරුගේ පක්ෂි දඩයම**

මිහිරි නාද කෝකිලාදි පක්ෂියන්ගේ - ඇසිලා බොහෝ ප්‍රීතිවේය මම් - දේදුණු වර්ණෙන්, යුක්තවූ කුරුල්ලෝ - රැව්දී පියාඹති දැන් - විදිම් උන්ට සීරුවේ -
(රාමායන නාටකය)

**ශාක්‍ය කාලිංග වංශික කුමාරයින්ගේ ඌරු දඩයම**

උන්මාද චිත්‍රාව විසින් අණවන ලද්දවූ දසි තොමෝ ලදරු කුමරහු කරඬුවක බහාගෙණ දොරමඩලා නම් ගමට ගියාය. රජ කුමරුවෝද (ශාක්‍යවංශික භද්ද කච්චානා බිසවගේ සහ පඬුවස් දෙව් රජුගේ පුත්‍ර කුමරුන්) මුවදඩ ගියෝ තුඹුරු කඳුරෙහිදී දැසිය දැක "කොහියෙහිද, මේ කිමෙක්දැ" යි කියාත් විචාළෝය.

(ඕ තොමෝ) "දොර මඩලාවට යෙමි, මාගේ දුවට ගෙණ යන ගුඩපූය" යි කිවාය. රජ කුමරුවෝ "බහා තබව" යි ඇට කිවූය. එකෙනෙහි මහත් හූරු වෙසක් දැක්වූය. ඒ කුමරුවෝ ඌරා (විද මැරීම පිණිස) ලුහු බැඳ ගියෝය"
(මහා වංශය, 10 වෙනි පරිච්ඡේදය)

## ගොඨ ඉම්බර සේනාධිපති.

ඉක්බිති ඒ යෝධයාතෝ මැත භාගයෙහි නුවර ඇතුලත තුන් මහල් පායක් කරවා දිව සැපත් හා සමාන මහත්වූ ශ්‍රී සම්පත් අනුභව කරන්නාහු දවසක තමන්ගේ භාය්‍යාවන්ද නිසර පට කොණ්ඩ මල් ආදීවූ නොයෙක් ආභරණයෙන් දේවගනක මෙන් සරහා රා පිරූ ධා මඩමක් අතට දී දකුණත් පස සිටුවා, එපරිද්දෙන්ම සැරසුනාවූ දෙවඟනක් බඳුවූ නොයෙක් සියගණන් සත්‍රීන් හා නානාප්‍රකාර ආයුධ හා සුවඳ මල් කලප්ද අටමඟල, සොළොස්මඟල, ආදීය අල්වාගෙන පිරිවරා සිටිනාසේ සලස්වා නෘත්‍ය ගීත වාද්‍යයෙහි දක්ෂවූ නාටක ජනයන් කැඳවා කැමති පරිද්දෙන් බෙරගසන නටන ගී කියනසේ නියෝගකොට ඒ සියලුම සුරාපාන මණ්ඩලය දිව්‍ය සභාවක් මෙන්ද ස්වභාවයෙන්ම ශ්‍රී කාන්තාවට වාසස්ථානවූ ප්‍රාසාදයක් මෙන් අලංකාර කොට ඒ ඒ තන්හි නිපුණවූ රා පිරූ සැල කොතල මහ සැල බඳුන් ආදිය තබ්බවා මත්ස්‍ය මාංශ ඉඟුරු ලූණු ආදීවූ උපකරණ රැස්කරවා තබ්බවාගෙන රා බොන්නට පටන්ගත්හ.

(සද්ධර්මාලංකාරය ගොඨඉම්බර වස්තුව ,492 පිටුව)

## මෞර්ය වංශික ධර්මාශෝක අග රජුගේ නියෝගය.

සත්ව ඝාතනය කිරීම මීට පෙර තහනම් කර නොතිබුනේය. මාගේ මූළුතැන්ගෙයි මෙහෙකරුවන් විසින් ආහාර පිණිස දහස් ගණන් සතුන් මැරූ නුමුත් මවිසින් ප්‍රාණඝාතනය නොකරණ ලෙස ආඥාවක් නිකුත් කරණ ලදී. ඒ ආඥාව පැනවූ දිනයේ මගේ ආහාරය පිණිස මොණරූ දෙන්නෙක්ද මුවෙක්ද මරණ ලද්දාහුය. (ධර්මාශෝක අග රජු - අශෝක ශිලා ලිපි)

## චන්ද්‍ර වංශිකයෝ සතුයින් අසංඛ්‍යය ගණන් නිකරුණේ මරාදැමීම.

අර්ජුන සහ විෂ්ණුගේ අවතාරය ගත් කෘෂ්ණාද බාණ්ඩව වනයට ගිනි ලෑවූහ. අවකාශය තෙක් ගිනි දළු බුරබුරා නැගුණි. ඒ වනයෙහි හුන් කෝටි ප්‍රකෝටි ප්‍රමාණයවත් වැඩි සතුන් සංඛ්‍යාවක් ප්‍රාණ භයින් මරහඬ ලෑවෝය. ඉන් කිසි පලක් නොවී, අසුරයෙකුත් අශවයෙකුත්, සොකුන්, සිව්දෙනෙකුත් හැර එහි සිටි අසංඛ්‍ය ගණන් ප්‍රාණීන් ගින්නෙන් දා අළුවිය.

ඊට අග්නි දෙවියා මහත්වූ සතුටට පත්වූයේය. ඉන්ද්‍රා සහ දෙව්දේවතාවෝද දිව්‍ය ලෝකයෙන් බැස චන්ද්‍ර වංශිකයින් දෙදෙනා විසින් කළ ප්‍රාණ ඝාතනය ගැන ප්‍රීතිය ප්‍රකාශ කරමින් ඔවුන් දෙදෙනාට ස්තෝත්‍ර ගී ගැයූහ. (මහා භාරතය)

## සාක්‍ය වංශික දෙවනපෑතිස්ස රජුගේ ගෝණ දඩයම.

"ඒ දෙවනපෑතිස් රජ නුවර වැසියන්ට දිය කෙළි විධාන කොට තෙමේ මුව දඩ කෙළියට ගියේය. ගෝණ වේස ඇත්තේ තණ පඳුරක් කමින් සිටියාසේ දැක්විය. රජතෙමේ දැක "පමාවූවහු විදිනට යුතු නොවේ"යි සිතා දුනුදිය හෙළීය. ගෝණ තෙමේ පර්වතාන්තරයට දිව්ය. රජතෙමේ (ගෝණා) ලුහුබැඳ ගියේය." (මහා වංශය 14 වෙනි පරිච්ඡේදය)

## කාඩොල් ඇතාට රා පෙවීම.

"රජ්ජුරුවෝ (ගැමුණු) නන්දිමිත්‍ර යොධයින්ගේ වග දනුම්හයි සනිටුහන් කොට රා කළ සියයක් තම කඩොලැතුට පොවා උහු කෝප කරවා (නන්දිමිත්‍ර) යොධයින් එන ඉදිරියට යවාපීහ." (දුටුගැමුණු එළාර යුධය)

## භරණ කුමාරයා.

කප්කදුරු නම් ගම්හී කුමාරයාගේ භරණ නම් පුතෙක් විය. ඒ තෙමේ කල්යාමෙන් දස දොළොස් හැවිරිදි වූයේ, ගම් දරුවන් හා වනයට ගොස් බොහෝ සාවුන් ලුහුබැඳ පයින් පැහැර දෙකඩ කොට බිම ගැසීය. සොළොස් හැවිරිදි වූයේ වනාහි ගම් වැස්සන් හා වලට ගොස් එසේම මුවන්, ගෝණුන්, ඌරන් වහා පෙළීය.

භරණ නම් ඒ මහා යෝධ තෙමේ එයින්ම ප්‍රකට විය. (කාවන්තිස්ස) රජ තෙමේ ඔහුද යටකී පරිද්දෙන් ගැමුණු කුමරු වෙත වැස්වී.

## ඛඤ්ජදේව යෝධයා.

"නෙකුල්ගල් කණ්ණිකායෙහි මහෙළුද්‍රෝණි නම් ගම අභය නම් තැනැත්තහුගේ අන්තිම පුත්‍රවූ ශක්ති සම්පන්න දේව නම් තැනැත්තෙක්වී, මදක් කොරගසා සන බැවින් ඛංජදේව යයි උහු දත්තුය.

එකල්හී ඒ මානව තෙමේ ගම්වැස්සන් හා මුව දඩ ගොස් මහත්වූ උස් මීමුන් ලුහුබැඳ අතින් උන් පා අල්වාගෙන ඉසවට සිසාරා බිම පැහැර උන් ඇට පොඩි කොරෙයි. (කාවන්තිස්ස) මීපල් තෙමේ එපවත් අසාම ඛංචදේවයා ගෙන්වාගෙන ගැමුණු කුමරු වෙත රැඳවී
(මහා වංශය 23 වෙනි පරිච්ඡෙදය)

★★
★★

# අල්ලි අරශානි බිසව.

*අල්ලි අරශානි නැමැති රාජිණිය තම මහ ඇමතියාහට කථාකොට "මම යුධයට එලඹෙන බැවින් නැව් එන වරායද, මුතු තිබෙන වරායද, පබළු තිබෙන වරායද, හක් තිබෙන වරායද, නගරයද ආරක්ෂා කරණ" හැටියට හාරදුන්නාය

මහ ඇමතියා විසින් එකියනලද වරාය පෙදෙස්වල රාජ වංශිකයන් පදිංචි කරවන ලද බවත් ඔවුන් ඒවායේ කම්මාන්ත කිරීමට යෙදී සිටිය බවත් පුශ්ලන්ති පුලවර් පාණ්ඩිය සම සතානයේ පණ්ඩිතයා විසින් ලියන ලද අල්ලි අරශානි මහින්තිරම් නැමැති දෙමළ කථා පොතේ විස්තර කර තිබේ.

රාජ වංශිකයින් විසින් පවත්වන විවාහ මංගල වලදී පෙරටුව ගෙනයන ඉරහඳ කොඩිය, මුතු කුඩය, යනාදි විරුදු වශීද උඩුවියන් පාවාඩ යනාදියද කුරුකුලයින්ට නොහොත් කරාවෙ ගෝත්‍රිකයින් හටද හිමිවී පැවත එන බව පුගලන්ති පුලවර් පාණ්ඩිය සමස්තානයේ පඬිවරයා විසින් ලියන ලද නල්ලතංගාල් මහින්තිරම් නැමැති දෙමළ පොතේ කියා තිබේ

---

*කල්වෙට්ටු නැමැති දෙමළ පොතේ සඳහන් ප්‍රකාර ලංකාවෙන් මුතු ලබාගැනීම පිණිස අල්ලි අරශානි බිසව විසින් සිරිලක මුතු තිබෙන මුහුදු ප්‍රදේශයේ කුදිරමලේ සහ සිලවතුරේ යන ග්‍රාම දෙක පිහිටුවූ බව දැනගතහැක

අල්ලි අරශානි බිසව වනාහි අර්ජුන නැමැති කුරුකුල කුමාරයාගේ භාර්‍යාව වන්නේය. ඕතොමෝ මිකාර සටහන දරණ ආභරණ පැළඳ සිටි බවට මෙසේ කියා තිබේ.

"பட்டகட்டுத்தாலி உருக்குமணி ஆபரணம்; கைக்கட்டுப் பவளம் கரண்டைக்காய் சீதனங்கள்."

"උච්කට්ටුත්තාලි උරුක්කුමණී ආබරණම්; කෛක්-කට්ටුප් පවලම් කරන්ඩෛක්කායි සීදනන්ගල්"

[புகழேந்திப் புலவர் පුදලොන්දිප් පුලවර්]

දඹදිව කාලි රාජේන්ද්‍ර චෝල භූපති මහ රජු කල එම සිංහාසනයට උරුමක්කාරයාවූ කුරුකුල නාච්චර් නැමැති කෞරව වංශිකයාගේ වරුණ කුලත්තාර් හෙවත් වර්ණකුලසූර්ය නාමය උතුම්කොට සලකුණුකර එක් එක් කුල වර්ග දහඅටක්ද නා නා ජාති වර්ගද යටත්කොට ශ්‍රී සත්ත සක් පිට *කාරවේරි පට්ටනමෙහි රජකමදී තම්බු පිණිස ඉරහඳ කොඩිය, සුදුකොඩිය, මුතුකුඩය, රාජබෙර, ඉරවිට හක්ගෙඩිය, තුවක්කු, ආලවට්ටන්, දඹල්පන්දම් කාඩුව, ත්‍රිශූල යනාදී රාජකීය අඩයාලම් සහිත නාත්ත මාත්ත ප්‍රදානය කල බව "කංනකී දේවීන්ගේ සිලම්බු අදිකාරි" නම් දෙමල පොතේ සඳහන්වේ.

## කුරුරට කෙවට්ට භෝගය සහ නාගවනය.

ධර්මාශෝක අගරජු සමයේ කුරුරට කෞරව වංශිකයින් දඩයම් කිරීම සහ මස්මැරීම චාරිත්‍ර ධර්මයක් වශයෙන් පිළිගෙන තිබෙන බව දැනගත් අග රජ තෙමේ ප්‍රාණඝාතනයට විරුද්ධව තහනම් නීති සනිටුහන් කර දයා දත ශිලාලිපියක් කුරුරට පිහිටුවාලූහ.

එහි කුරුරට බද කෙවට්ට භෝගයේ සහ නාගවනයෙහිද වසත්නාවූ යම් ප්‍රාණීන් වෙද්ද ඔව්හු නොමැරිය යුත්තාහ. යනාදි සතුන්ගේ නම් බොහොමයක් සටහන් කර තිබේ. මේ ශිලා ලිපිය කුරුරට (දිල්ලියේ) මීරුට් නගරයේ මේදක්වා තිබේ.

කුරුරට වැසි චන්ද්‍රවංශික සූර්ය වංශික රාජ පුත්‍රයෝ වනාහි පාණිවාදයෙහි ලොල් පිරිසක් බැව් මෙයින්හැගේ.

හින්දු ආගමේ ප්‍රකාර සතුන් මරා ප්‍රයෝජනයට ගැණීම පාපයක් කොට නොසලකති. ඔව්හු දේව පූජා වලට මීහරක්, එළු, බැටළු, කුකුලන්, මත්ස්‍යයන්ද දේවතා රූප ඉදිරියේ බිලිදෙති. එය මෝක්ෂ සම්පත් ලැබියහැකි. පිංකමක් වශයෙන් හින්දුවරුන් විශ්වාස කරති.

---

*காவிரிப்பூம்பட்டினம் – කාවීරි පූම්පට්ටිනම්
(යාල්පානම් පෙයරකරාදි 286 පිටුව)

## ගොඨ ඉම්බර සේනාධිපති.

"උතුරු තිස් වෙහෙර වැසි භික්ෂුහු අභය නම් යෝධයා මුහුකළ අවසථාවේ වැද්දන් හා සමග මුවදඩ ගොසින් කොටු පතෙක බලා සිටියේ දැල් බැඳි තැනට නොවැද යන මුවෙකු දැක ලුහුබඳවා ගොස් පස්සා කකුල්දෙක අල්වාගෙණ ඉසවට සිසාරා මිටි සිදුරු ඉඹුරු ගසෙක පැහැර දෙකඩකොට කැඩිය. එතැන් පටන් ගොඨසිම්බරයා යයි නාම ව්‍යවහාරය වියයි කියත්ල.

(සද්ධර්මාලංකාරය. ගොඨසිම්බර වස්තුව 491 පිටුව)

## සුරනිමිල සේනාධිපති.

ඒ නිමිලයෝ දුටුගැමුණු රජ්ජුරුවන් සමග දෙමළ සටන් කෙරෙමින් ඒ ඒ තන්හි දෙමළ කඳවුරු පැහැර විජිත පුරය සටනට වැදීමට පළමු මගධ නැලියෙන් සොළොස් නැලියක් පමණ රා පිරූ සැළෙක රා සියල්ලම රාජ නියෝගයෙන් බී නිමවූද එතැන් පටන් සුරනිමිල නම් වූහ.

(සද්ධර්මාලංකාරය සුරනිමිල වස්තුව 487)

## විශෙෂ විභාග.

රාජ වංශිකයින් රටවල් ආණ්ඩු කිරීමටත් යුධකිරීමටත් බැඳී සිටීම ඔවුන්ගේ පාරම්පරික චාරිත්‍ර ධර්මයකි. යුධකිරීම දඩයම් කිරීම මසුන් මැරීම සුරාපානය කිරීම බහු භාර්‍ය්‍යා සේවනය, යනාදිම ක්ෂත්‍රිය වංශවතුන්ගේ විනෝද ක්‍රීඩා බැව් පුරාණ නම් ලත් දඹදිව ඉතිහාස පොත්පත්වලින්ද බෞද්ධ ජාතක කථාවස්තු වලින්ද සිංහල ඉතිහාස පොත්වලින්ද මොනවට පෙනීයයි.

බටහිර දිග ජනපදයන්හි යුධභටයා වනාහි සාමාන්‍ය මහජනයා අතරෙන් තෝරා ගනු ලැබේ. පුරාණ පොත් පත්වල පෙනීයන අන්දමට පෙරදිග රාජ්‍යයන්හි යුධභටයා වූකලි මව්කුසින්ම බිහිවෙතැයි කියති. එනම් ක්ෂත්‍රිය වංශිකයෝයි.

## උඩරට මසුන් මැරීම.

හෙතෙම [උඩරට නිලමේ] වැවක් අසල කූඩාරම් ගසා රජුගේ [දෙවෙනි රාජසිංහ] ප්‍රයෝජනයට මසුන් ඇල්ලීමට උදව්විය යුතුයයි ගම්වාසීන් [ගම්පොල] සියළු දෙනාටම ආඥා කොළේය.

ඉතුරුවෙන කුඩමසුන් ලබාගන්නා අටියෙන් මිනිස්සු ඊට ඉතා කැමතිවූහ. මෙසේ සියලුදෙනාම එැඩේට [මසුන් මැරීමට] උවමනා අවිපන්න ආදී උපකරණද රැගෙන රැස්වූ විට"..................."ඔවුන්ගේ රටේ වැව් ‡පොකුණු මසුන්ගෙන් ගහණය.

ග්‍රීෂ්ම ඍතුවේදී ඒවා සිඳී ගිය කල කරක්ගෙඩි ගෙනා හොස් දියේ ගසා මසුන් අල්ලති.

"මහවැලි ගගේ මත්ස්‍යයෝ පිරී සිටිති. නුමුත් ගංගාවල මසුන් ඇල්ලීම පිළිබඳ නියම උපක්‍රම මෙරට වැස්සෝ නොදතිති තද නියං සමයෙහිදී ඔව්හු ගඟ හරහා වැළක් ඇද මසුන් රඳවා ගැනීම පිණිස එහි කොළ අතු එල්වති. මේ හැර දැල් ආදියක් ඔවුන්ට නැත. ඇතත් කලාතුරකිනි."

## තලගොයි මස්.

"තලගොයාගේ මස් රසවත් ව්‍යංජනයකි එය සියලුම මස් වර්ග වලට වඩා උසස්යයි සිංහලයෝ කියති.

---

‡වර්ෂ 1909 වනතුරු ලංකාණ්ඩුව විසින් සංරක්ෂිත වැව් සංඛ්‍යාව පලාත් 9 යේම 1828 කි. මේ වැව්වලින් අස්වද්දන ලද බිම් ප්‍රමාණය අක්කර 45844 ක්ය. (කවිකල්ප තරුව) මේ සැම වැවකම මසුන් ඇල්ලීම විදානේගේ අනපිට හෝ කුඹුරු හිමියන්ගෙ නොහොත් කුඹුරු වැඩකරණ ගොවින් විසින්ම කරක් ගසා හෝ ඔවුන් ලෙහෙසි අත්දමකින් මසුන් මරාගනිති. (කුඹුරු වැඩ නොකරණ අයට කුඹුරුවලට වතුර ගන්නා වැව් වලින් මසුන් ඇල්ලීමට) තහනම්ය.

## උෟරු මීයෝ.

"මූෂික ගනයට අයත් අනෙක් සියලුම සතුන් ඔව්හු කති."

## වඳුරු මස්.

"මේ සෑම වර්ගවලටම අයත් වාතරසින්ගේ මස් බුදීමට මැනවයි (උඩරට සිංහලසින්) විසින් කියනු ලැබේ. ලෙහෙනුන්ද මෙහි කිපවර්ගයකි. අල්ලාගන්ට ලැබුනොත් මෙරට මිනිස්සු ඔවුන්ගේද මස් කති. මුවන් උෟරන් වල් හරකුන් ආදිය ගිනිහුලක් ගෙන යැමෙන් රෑකාලේ විද මරා ගනිති.

"ඉත්තෑවුන් මැරීමට බොරු වලවල් තනා ඊපිට ලී දමා පස් අතුරා එහි අල බතල වවති. ඒවා හෑරීමට ඉත්තෑවුන් කවදාහරි පැමුණුනොත් බොරුවලට වැටී එහි පතුලේ හිටුවා තිබෙන උල්වල ඇනී මියයත්තේය.

පක්ෂීන් සහ මූෂිකා ගෝත්‍රයේ සතුන් ඇල්ලීමටද ඔව්හු මෙසේම දක්ෂයහ. ඇත්ත වශයෙන් කියතහොත් එවැනි කාතිව්‍යවලට නම් සමස්ත ලෝකයෙන්ම ඉපායෙහි දක්ෂයෝ සිංහලයෝය.

(රොබට් නොක්ස්ගේ ලංකා විස්තරය. පිටු 35, 36, 39, 42 96, 138)

## ගොයම් ගොවිතැන.

ගොයම් පීදෙන කාලයෙහි බංඩි වී කරල් වල ගොයම් මැස්සා නැමැති විනාශදායක මැසි වර්ගයක් බෝවේ. මොවුන් කොපමණ ඝන සැරේට බෝවේද කියතහොත් සම්හර ගොයම් ගස්වල සීය දෙසීය බැගින් බෝවී සිටිති.

ලපටි වී ඇටවල කිරි බිබී සම්පූර්ණ අක්කරයක ප්‍රමාණ කුඹුරක් පාලුකිරීමට මොවුන්ට වැඩි කාලයක් උවමනා නැත.

වහා ඇලෙන මැලියම් වගී තවරන ලද වැලක් දෙදෙනෙකු විසින් ගොයම් ගස් මතුපිට ඇදගෙන යෑමෙන් එක ලියද්දකින් මේ මදුරුවන් විශාල සංඛ්‍යාවක් මරා දමනු ලැබේ.

සමහර ගොවීයෝ කුල්ලක ඇතුල මැලියම් වර්ග තවරා ගොයමෙහි ගසමින්ද මේ මැසි වර්ගයා වඳකරති. මතුරන ලද පැන් ලියදි අතර ඉසීමෙන්ද ඔවුන් වඳකර ගන්ට පුළුවන් බැව් ගොවියෝ කියති.

(ගොවිකම් සඟරාව)

# ජය ශ්‍රී මහ බෝධිය සමග සිරිලකට පැමිණි මෞර්‍ය වංශික කුමාරවරු.

බොධිගුප්ත, සුමිත්‍ර, චන්‍ද්‍රගුප්ත, දේවගුප්ත, සූර්‍ය්‍ය ගුප්ත ගොතම සහ ජුතිනධර, යනාදී කුමාරවරුය.

# සුමිත්‍ර කුමාරයාගේ මාළු ඔරුව.

ශ්‍රී සමෘධි සම්පත්ත සකල ජම්බුද්වීපයට නාභි මංඩලාකාරවූ මධ්‍ය මණ්ඩලයෙහි පඤ්චවිධ විටපාලඞකෘතව විජෘම්භමාන සමූලස්කන්ධෝපේත සර්ව විජය ශ්‍රී මහා බෝධිද්‍රැම රාජයන් වහන්සේගේ දක්‍ෂිණ මහා ශාඛාව ශ්‍රී බුද්ධ වර්‍ෂයෙන් දෙසිය සතිස්වන වර්‍ෂයෙහිදී මෙම ශ්‍රී ලංකාවට වැඩමවා එන ප්‍රස්තාවට සර්වලෝක සංරක්‍ෂණාධාර භූ මණ්ඩලෙශ්වරවූ උතුම් දෙවෙනිපෑතිස්ස මහා රාජෝත්තමයානන් වහන්සේ රාජ්‍ය ශ්‍රිය කර වදුරණසේක් නමත් වහන්සේගේ බෝධිසත්ව චරිත පූර්‍වාංග මවු මහා

කරුණාධ්‍යාශයෙන් බෝධීන් පිහිටුවන මංගලාඩම්බරව ප්‍රමාණාතික්‍රාන්ත ප්‍රීතින් ප්‍රමුදිතව බෝධීන් වහන්සේ දඹදිවින් වැඩමවා ගෙන ආ සංඝමිත්තා ස්ථවිරින් ප්‍රධාන කොට ඇති රාජ මන්ත්‍රීශ්වරයන් අට දෙනෙකුටද අතිකුද්‍ර දහ අට කුලයෙක සේනා සමූහයාටද නම් ගම් තනතුරු දෙවා වදාරණ ප්‍රස්ථාවේදී මෙම අය අතරෙන් සුමිත්‍ර නම් මන්ත්‍රීශ්වරයාණ කෙනෙකුන්ට දෙවා වදාරාපු දේවල වග නම්:- විල්ගමුව යන ගම අටසිය හැත්තෑපස් අමුණක්ද, එලම්වන කියන ගම අසූපස් අමුණක්ද, යන මෙකී ගම් දෙකද පුත්තලම් තොටමුනේ බණ්ඩාර අරමුදලෙන් දළ පිළි සිහින් පිළි සහිත නා නා ප්‍රකාර වස්ත්‍ර, ජාතින් අවුරුද්දකට කච්චි සත්සියය බැගින්ද රිදී තුන්සියක් සිලව්වට බෙහෙත්බඩු වගීද දෙඩම්ගහ ඉරවැල්ල කියන §ලුණු ඉරවැල්ලද හලාවතින් මාළු බරුවක්ද ‡මිගමුවෙන් පොල්වත්තක්ද යන මෙකී දේ සමග අතිකුද්‍ර ඇත්, අස්, ගව මහිෂාදී සවිඥානකවූ දේද රං, රිදී, මුතු, මැණික් ආදී අවිඥානකවූ බොහෝ වස්තූන්ද දෙවා වදාරමින් තවද මේ මන්ත්‍රීශ්වරයානන් සම්භරණයෙන් සරහා පඤ්චතූර්‍යනාද පෙරටු කොට මඟුලැතු පිටින් නුවර ප්‍රදක්ෂිණා කරවා මිහිඳු මාහිමියන් වදාළ පණතින් බෝධිද්‍රැම රාජයන් වහන්සේට නුදුරු තැන වාසස්ථානයක් කරවා එහි වැස්වූසේය.

ඒ මන්ත්‍රීශ්වරයානන් ස්වල්ප කාලයක් එහි සිට දෙවනුව තමාට දෙවා වදාළාවූ †විල්ගමුව කියන ගමට යන සැටියට රජතුමාගෙන් අවසර ලැබගෙන අනුරාධපුරයෙන්

---

§ලුණුඉරවැල්ල, ලුණු මිදෙන ලේවාය.

‡මීගමුව, කාවන්තිස්ස රජුන් දවස හැටරියනක් දිග මීයක් ලැබූ ස්ථානයට මීගමුව යයි නමක් ඇතිවූ බව කියනත් ඊට ප්‍රථම දෙවනපෑතිස්ස රජුන් දවසද මෙම නියම් ගමට මීගමු නාමය තිබුන බව මෙයින් හැගේ.

†විල්ගමුව, මෙගම දැන් දෙරනෑගොඩ නමින් පවතී.

පිටත්ව ගොස් සත්තක පරසත්තක පිරිවර හා සමග යත ප්‍රස්ථාවට අතරමග *අකරවතු කියන ඔය අසල මහත්වූ වැලි මිශ්‍ර භූමි ප්‍රදේශයක් දැක එහි පොරොත්තුව මෙම බිම් මාසයට සතුටුව එහි වැලිතලාවෙහි කටු වල් අරවා ගමක් තනා මෙම ගමට කටුහැර වැල්ල අස්වැද්දූ නිසා §කටුවැල්ල යයි නම් තබා මෙම ග්‍රාමාභ්‍යන්තරයෙහි බෝධි මළුවක් හා විහාරයක් කරවා මෙම වග සම්සත්ව හිත බෝධිසත්ව චරිත පූර්වංගමවූ උතුම් දෙවන පෑතිස්ස මහා රාජෝත්තමයාණන් වහන්සේට සැළකල තැනේදී ඒ රාජෝත්තමයාණන් වහන්සේ සන්නසක් සමග මෙම ගම්ද ඒ මන්ත්‍රිහට දෙවා වදාළේය.

එලෙස ලබාගත ශ්‍රී මහා බෝධි වංශය පවතිනාතුරු මෙම කටුවැල්ල ගමත් මෙම පරම්පරාවත් පවතිනා සැටියට සාද ඒ මන්ත්‍රීශ්වර තෙමේ එතැනින් පිටත්ව ගොස් විසිතුරු පූග, පුන්නාග, චම්පකතාල, හින්තාල, ඛර්ජූරි, පනසාම්බු ශ්‍රී පර්ණිතාලි, කේරළාදි අනේක ප්‍රකාර පුෂ්ප ඵල වෘක්ෂයෙන් ශිශිර වාරිපූරිත ජලචරාකුල තරංග පංතීන් අලඞ්කෘතවූ උත්පල පුණ්ඩරීකාදී නා නා කුසුමයෙන් ශෝභාමත්වූ විල් තටාකාදීන් හා උද්භූත ක්ෂේත්‍රාදීන් සශ්‍රිකවූ විල්ගමු නම් ග්‍රාමාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව මීට දෙවෙනිද උදෑසන තමක් කැටුව ආවුන්ගෙන් දුක් සැප විචාරණ සියලු පිරිවර හා සමග තෑ පිරිස දෙරම සිටි සෙයින් ‡දෙරණෑගොඩ යයි නම් තබා මෙවැනි

---

*අකරවතු ඔය, දැන් බුත්ගමු ඔය. කුරුණෑගල බද කුලියාපිටිය සහ හෙට්ටිපොල අතර මාගීය හරහා මේ ඔය ගලාබසී.

§කටුවැල්ල, කුරුණෑගල බද කටුගම්පල උතුරු කෝරලේ මෙගම පිහිටා තිබේ. බෝමළුව සහ විහාරය අභාව ප්‍රාප්තයි. එහෙත් ඒවා තිබූ සථාන දැනගැනීමට තවමත් ලකුණු තිබේ.

‡දෙරණෑගොඩ, කොළඹ පලාතේ අළුත් කුරුරට කෝරලේ දසිය පත්තුවේ පිහිටා තිබේ. ගම්පහ සිට දුර සැතපුම් තුනක් පමණ වේ. විල සහ මලුවද මේතාක් පවතී. දැගැබ මෑතකදි අළුත්වැඩියා කරණ ලදී.

යශෘශ්‍රීන් සශ්‍රීකවූ ග්‍රාමාභ්‍යන්තරයෙහි අභිනව බෝධි ප්‍රතිෂ්ඨාකර පරලෝකාර්ථ සංසිද්ධිය කර ගනිමියි යන හිතාධ්‍යාශයෙන් අභිරාම තරංගාවලීන් හා ජලචරා කිණි පද්මෝත්පලාදි කුසුමයෙන්ද අලඞ්කාරවූ විලක් සමීපයෙහි උත්තම භූමිභාග ඇති නිරුපද්‍රවූ ස්ථානයක සම චතුරශ්‍ර අයාම විස්තාරයෙනුදු තුන් සියයක් වඩ්ඩකී රතන ප්‍රමාණ හා උසින් මනුෂ්‍ය ප්‍රමාණ මාලකයක් ශිලා කර්මාන්තයෙන් කරවා ඒ මතුයෙහි ගල් අතුට එම මාලක මධ්‍යයෙහි වැලි කොත්දෙහි පටන් වට එකසිය පනස් රියනක් කර ධාතු වඩා මහා චෛත්‍යයක් කරවා දෙවනුව විසිතුරුවූ බෝධි කොටුවක් කරවා සොළොස් මහ ඵලයෙන් සඤ්ජාත එක් ශ්‍රී මහා බෝධීන් වහන්සේ නමක් පිහිටුවා මාහැඟි බෝධි පූජාවක්ද කර තෙවනුව වඩු තුන්රියන් ප්‍රමාණ ගල්ටැම් සාදා ඊපිට දැව පේකඩ ගෝනැස්, මඩුලු, පා සමන්වා තුන්මහල් ප්‍රාසාදයක් කරවා ඊට නිසි පිළිම වඩා මෙසේ ත්‍රිවිධ බෝධි පිහිටුවා මේ තැන් මහා බෝධියටම අපමණවූ මාහැඟි පුද පෙළහැර මහොත්සව කොට බොහෝ කලක් පවත්වා ඉක්බිති තමන්ගේ බෑනා වන කෙනෙකු ප්‍රව්‍රජිත කර උපසම්පදා කරවා ස්වකීය නාමයෙන් උන්වහන්සේට සුමිත්‍ර තෙරුන් වහන්සේ යයි නම් සලස්වා ශාසනයට ඇතුලත් කොට මෙම විහාර පදවිය සහ අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේට තේව කරන නිලයක් භාර කරවා පසුවූයේය.

(ලංකාවේ නොයෙකුත් පළාත්වලින් එකතු කරගත් පුස්කොළ පොත්පත් වලින් පිටපත් කර මුද්‍රිත පාඨශාලාචාර්ය සී. ඩී. රණසිංහ මහතාගේ පුරාවෘත පොත)

## ජය ශ්‍රී මහ බෝධිය සහ පිරිස.

ඒ මිහිපතිවූ (ධර්මාශෝක) මහ රජ තෙම මහ බෝ රක්නා පිණිස අටලොස් කුලයක දෙවියන්ද, අටලොස් කුලයක ඇමැතියන්ද අට කුලයක බමුණන්ද අට කුලයක

කෙලෙඹියන්ද ගොපළු කුලයත් හා තරස් කුලයන්ද කුලිඟු කුලයන්ද, එසේම පෙහෙර කුලයන්ද කුඹල් කුලයන්ද සියළුම සේනා සම්බන්ධ කුලයන්ද නාග යක්ෂයන් සම්බන්ධ කුලයන්ද අට අට දී අභිමතදසි වූයේ රන් රිදී මුවා කලයන් අට අටදී ගංගා නම් නදියෙහි සරසන ලද නැවට මහ බෝධිය නංවා.

(මහා වංශය. 19 වෙනි පරිච්ඡදය)

## මහා බෝධි පිරිස සහ සන්න සහිත පූරාණ පාලි ජනවංශය.

මෙසේ කල්යාමක් ගියකල අප බුදුන් පිරිනිවී ගිය පසු දෙසිය සත්වෙනි වර්ෂයට පැමිණි කල තැවත ලක්දිවට රජ කරණ දෙවෙනි පැතිස්ස නරේන්ද්‍රයන් සමයෙහි දඹදිව ධර්මාශොක නරපතින් විසින් විපුල තෙදයෙන් සකල භය හැර අභය දෙන විජය මහ බෝධීන් වහන්සේ හා සමග ශ්‍රී ලඞකාවිපයට එවන මිහිඳු කුමාරයා හා සඞඝමිත්‍රාවන්ද දෙදෙනා වහන්සේලා සමග ධනුශ්ශිල්පයෙහි නියුක්ත අයින්ද, ඛඩ්ග කොන්ත තෝමර පලිස් ආදී යුද්දයෙහි සපත් අයද "මුතුකුඩ සේසත් චාමර මේ ආදිය අපට තිසිය."

අපගෙන් ඇතිවූ රාජ කුමාරවරු සද්දී අපට හිඳිම සුතු නොවෙයි, කියා එකුන් පනසක් පමණ එහි බෝමැඩ කර්මාන්තයට ආවාහුය. ඔවුන්හට බෝමැඩ කරා ආ හෙයිනුත් රාජ කුමාරයින් කාරා ආ හෙයිනුත් කාරාවෝ යයි ව්‍යවහාර විය. ඔවුන්හට බොහෝ කෙත්වත් ගම්වර දී මේ සිරිලක්හිම රුඳවූහ.

(මහ විහාර වංශානුගත ශ්‍රී බුඞරක්ෂිත මහා ස්ථවිර ස්වාමීන් විසින් ලියන ලද සන්න සහිත පුරාණ පාලි ජන වංශය පිටපතකින් උපුටාගන්නා ලදී.)

# හිටි බණ්ඩාරගේ මාළු ඔරුව.

"ශක වර්ෂ එක්වා දහස් දෙසිය හතලිස් නව අවුරුද්දට සේන්දුවූ මෙම වර්ෂයෙහි ස්වස්ති ශ්‍රී මහා චක්‍රාන්ති නව රත්නාදි වන ධර්මප්‍රාක්‍රමබාහු මහ වාසල කෝට්ටේ නුවර රාජ්‍ය ශ්‍රීය කර වදාරණ කලට, සලාවත මුතු කිම්දින්ඩත් ඇතුන් අල්ලන්ඩත් කායල් පට්ටලමෙන් අදිරාසලා (අධි අරශලා) හෝ (වෙඩි අරශලා කියනයොත් මුදලියෙක් බොහොයෝත් ගොල්ලකුත් සමග සලාවතට, ගොඩබැස සිටි කලට මාදම්පෙ වැඩසිටිය තනිය වල්ල බාහු මහා රජ්ජුරුවොත් කුඩා බණ්ඩාර නමින් පැවත එන මාදම්පේ වාහල වල්ලභ ජයකොඩි සේනානායක විජයකෝන් හිටිබණ්ඩාරත් සලාවතදී දෙමූතෙන් යු, අදිරසලා එක්ක යුඩකොට ඇත මරා නැව් පොඩිකර දමා යොනුන් තිස්දෙනෙකුව හාති ............තිබුනු වස්තුව අසි ජයගෙන අසිරාසලාගේ හිස ගෙන කෝට්ටේ නුවරට ගොස් දැක්කූ කල කරුනාව ලැබී දර්ශනයක් කරලා සමක්කට්ටු ලැබී. වාල් අටදෙනෙකු හා නොයෙක් මාන්න ඉසුරු සම්පත් තනතුරු දෙවා වදාරමින් ජයකඩු සේනාදරයින්ට කටුගම්පොලේ දෙස බලා කටුගම්පොලේ ඇතුළුව බෝඹිවෙලද, දෙටන, උප්පලවත්තද, බිදුන්කඩින් එනු කොට්ට හතක්ද පඩි මාළු ඔරුවක්ද අව්රුද්දකට ජාපානෙන් පිලි දෙසිය පනහක්ද මාදම්පේ වාහල වල්ලභ ජයකඩු සේනානායක විජයරත්න විජයකෝන් වාහල හිටිබණ්ඩාරට ධර්මප්‍රාක්‍රමබාහු මහ වාසලින් ශ්‍රී සන්නස දෙවා වදාලාය.

මහ වාසල පනිවුඩ පනත ලෙස ලිවූ බවට තිරිවන්ගම ශ්‍රී සන්නස් ලියන මොහොට්ටි රාලය.

(ඥාන දර්ශය 1909)

## අභය අලහප් පෙරුමාල් වැදි සෙනෙවියා.

ක්‍රි: ව: 1862 අගෝස්තු මස 12 වෙනි දින ශ්‍රී ලංකාණ්ඩු-කාර උතුමාගේ ඉල්ලීමට සබරගමු දිසාවේ පැල්මඩුල්ලේ විහාරාධිපති වල්ගම සුවර්ණජෝති තෙරුන්වහන්සේ විසින් ඔප්පුකළ වගන්තියේ පිටපතයි

ක්‍රිස්තු වර්ෂයට අවුරුදු දෙසිය හතරකට පමණ ඉහතදී මේ ලංකාද්වීපයෙහි රුහුණු මායා පිහිටි යන රට තුනේ කාවන්තිස්ස, කැලණි, එළාර යන රජවරු තුන් දෙනෙක් ආණ්ඩු කළා ඇත. මේ කාලයෙහි ලංකාද්වීපයේ මායා රට සුමණ කූටයට දකුණු දිග්භාගයෙහි දෙව වාසික නම් ජනපදයෙහි දෙනාවාසික නම් පටුනු ගම නොහොත් දෙනවකාට අයිති බොහෝපිටිය නොහොත් බෝපිටිගම විසිදහසක් පමණ වැදි සමූහයාට නායකවූ අබය අලහප් පෙරුම නම් ලත් එක් වැදි සේනාපතියෙක් සිට කාලක්‍රියා කෙළේය.

ඔහුගේ පුත්‍රයින්ගෙන් වැඩිමහළු පුත්‍රයා එම අබය අලහප්පෙරුම නාමයෙන් යුත් වැදි සේනාධිපති තනතුරට පැමිණ තමහට සමජාතිවූ පිළක ජනපදයෙහි වසන වැද්දෙකුගේ දුවක් සරණකොට ගෙන ඈ නිසා පුත්‍රයින් දෙදෙනෙකු හා එකම දුවක්ද ලැබ කල්යවන්නේ තරුණිවූ ඒ දූ සබර වාසික ජනපදයෙහි දෙල්ගමුවේ වසන එක් වැදි දෙටුවෙකුගේ පුත්‍රයෙකුට සරණ පාවාදී කල් යවන අතර දිනක් ඉහත ගණ සඳහන්වූ වැදි සේනාපතියා (මේ කාලේ ගමින් ගම මූරපලවල එළාර රජුගේ දෙමළ සේනාව මග යන්නන්ගේ බඩු බලාත්කාරයෙන් ගනිමින් සිටි බව කියං තිබේ.)

තමාගේ දරු මුනුබුරන් කෙරෙහි උපන් බලවත් ප්‍රේමයෙන් ඔවුන් දකිනා පිණිස මාගෝපකරණ ගෙන්වාගෙන කඩු අඩවි ගෙවාගෙන ගොස් මගට බැස යන

වේලෙහි පතුල්පානා කඩවත මුරපලේ සිටි දෙමළ ගෙනයන උපකරණ උදුරාගත් නිසා කළුගඟින් එතරව සබර වාසීන් දනව්වෙහි ආදී කතිකා කනෙයන්වූ වනයට පැමිණ නැගෙන්කරා හිස්අතින් යාම සුදුසු නොවන්නේයයි සිතා දුනු ගිගෙන වනයෙහි විමසන කල්හි එක් බඩදූරි ගෝනදෙනෙක් දැක විදපු කල්හි ශරය වැදී දුවන ගෝනදෙන පාරේ පන්නා යනවිට ගෝනදෙන කුරුගංගා තීරයට පැන්නාහ.

හීසැරය වැදීමෙනුත් ගසින් දිවූ වෙහෙසෙනුත් ඒ ලදූරි ගෝනදෙනගේ පැටව්‍ා බිහිව වතුරෙන් යනවා දුටු ගෝනදෙන ප්‍රේම උපදවා විත් කාපු වෙහෙස මදකුත් සිහිනොකොට පසුපස්සේ පිහිනන්ට පටන් ගත්තෝයැ. මේ බව දුටු වැදි පුත්‍රයාගේ සිත අනුකම්පාවී මමද මාගේ දරු මුණුබුරන් කෙරෙහි ප්‍රේමයෙන් බලා දැක යෙමියි ආයේය.

තිරිසන් වුවත් ඇද ඇගේ දරුවන්ට ප්‍රේම ඇත්තිය. එහෙයින් මා කලදේ නපුරැයයි සිතා දුනු හී බිඳ දමා තමාගේ දුවනියන් වසන ගෙට ගොස් ස්වල්ප දිනක් එහි වාසයකොට දෙල්ගමු විහාරයට ගොස් මහනවී............ පුරාණ කාලවල ලියා තිබෙන මේ සිංහල වාසගම්වල හැටියට ඉහත කාලවලදී සබරගමුවේ වැද්දෝ කියන මනුෂ්‍ය වර්ගයක් හිටිය බව ඔප්පු වෙනවාය.

(නිමි)

## සතුන් මැරීම සහ සුරා නැනීම

දියගොඩ සියළුම සතුන් මරා කන දෙන අයවළුත් රජ බමුණු ග්‍රහපති කෙනෙක් හෝ වස්තු ඇතෙනක් වී නුමුත් ඔහු කාරුණ්‍යනැතුව සතුන් මැරීමට නාරක්සොමන් ගෙන රජ බමුණු ග්‍රහපති කමට යොග්‍යවූ රාජාභරණ හැර වැදි කෙවුල් වෙස් ගෙණ ඇවිදිනි.

එකල ඔහු දුටු දුටුවෝ රජ යුවරජ යයි නොදැන ඇදිනගත නොහී මොහු වැදි කෙවුලෝ යයි මෙලොව දීම හැම ජනයන් විසින් ගරුකාර සත්කාර වන්දන මාන යෙන් විරහිතව චංඩාලවෙයි.

එයින් චුතව පරලොව ගිය කල සතර අපායෙහි නරක දුක් විඳ එයින් මිදී වඳුරුව, මූව, බලු, කපුටුව, උපදවා දුක් දෙන හෙයින් මෙලොවත් පරලොවත් දෙලොවින්ම චණ්ඩාලයෝ වන්නාහ.

තවද, කුළු, වට්ටි, පෙට්ටි, හා ලනු, වැල්, බාන් ආදියෙහි ඇලෙන්නාවූ ලාටු කිරි වගී නවරා පීඟදන, ගොයම්. යව මෙණේරි, ආදී ලපටි ක්‍රීබඩ ශස්‍යයන්හි රසයන් උරා බොන මැසි මදුරු යනාදී ක්‍ෂුද්‍ර ප්‍රාණීන් කුළුගා ලනුගා ලක්‍ෂ සංඛ්‍යාත ක්‍රිමින් මරා දැමීමද චංඩාල වසලයින්ගේ ක්‍රියාවන් වන්නේය.

ඔව්හුද මෙලොවත් පරලොවත් දෙලොවින්ම චණ්ඩා-ලයෝ වන්නාහ. නානාප්‍රකාර අඩු ගෙවල් ඇත්තෝයයි හෙවත් ගරම් කාරයෝය. නානාප්‍රකාර අවලක්‍ෂණ ඇත්තෝ හෙවත් වහත්වල ඇත්තෝයයි කිහු වන්නෝය.

සුරා සාරණුවො රාමෙර තැනුවො විකුණුවො මෙලොව ලජ්ජා විරහිත උම්මැද වෙයි. වස්තු කුලවශ නැණ ගුණ හීනව දුටු දුටුවන්ට අප්‍රිය කරවා පරලොව නරකාදි දුක්විඳ දෙලොවම චංඩාල වෙයි.

(මහ විහාර වංශික ශ්‍රී බුඩරක්‍ෂිත මහා ස්වාමීන්ගේ සන්න සහිත පුරාණ පාළි ජන වංශය)

## කෙවුල් විභාගය.

### මක් කෙවුල්.

වැද්දන් දුන්නෙන් ඊ ශරය විදිනවාත් සමග වහා නැගුනු දුනු දණ්ඩෙන් නැගෙන "මක්" යන ශබ්දය කාරණකොට ගෙන "මක්කෙවුල්" යන නාමය දුනු වැද්දන්හට කියනු ලැබේ.

## විශේෂ විභාග.

"වෙත මොකද මත්ද"? කියා ඇහුම් බැලුම් උත තැනේදී හුලංගමුවේ ගමගේ වැද්දය, හව්පත් වැද්දයයි සැලකල තැනේදී, "ඉන් පිටරටදැ"?යි විචාල කල "සවාමීනි" බිරි දේවාලේ හෙල් කඳුරෙත් පල්ල කණංගමුවේ කත්තිලක වැද්ද සිරකර සිටිනේය. තිකකොටුවේ හේරත් වැද්ද සිරකර සිටිනේය උඩුගොඩ මහකෝණාර වැද්ද සිරකර සිටිනේය. මහ තම්පලා වත්තෝ පලා බත්වෙල වැද්ද සිරකර සිටිනේය මහදෙඹවල දෙඹවෙල වැද්ද සිරකර සිටිනේය. දහනැක වැද්ද අඹත්පොල සිරකර සිටිනේය. මහ කවුඩැල්ලා වැද්ද කවුඩුපැලැල්ල සිරකර සිටිනේය. වල්ලිවෙල වැද්ද වල්ලිවල සිරකර සිටිනේය චන්‍ද්‍රසේකර බණ්ඩාර වැද්ද උඩස්ගිරිය සිරකර සිටිනේය. නයිරා වැද්ද තාරංගමුවේ සිරකර සිටිනේය. හේරත් බණ්ඩාර වැද්ද කම්පැල්ලේ සිරකර සිටිනේය. ඉමියා වැද්ද තාලත්දේ සිරකර සිටිනේය. (මාතලේ මහ දිශාවේ කඩයිම් පොත)

කොත්මලේ වැද්දත් අටපේරුවේ පොළමස් වැද්දත් බලු වැද්දත් දියමස් වැද්දත්. (රිදී විහාර අස්න සහ දඹදෙණි අස්න)

බා නා පසින් තුනු රුසිරෙන් පෙත්තා ල
තේ තා නුඹුත් තද තෙදසෙන් ගෙත්තා ල
සේනා දි පති නම් කළු වැදි රා ල
ගෝනා උල පිටට විගසින් ගෙත්තා ල

## වොක් කෙවුල්.

හීතාල තොහොත් කිතුල් මලට බෙහෙත් බැඳ මිණී හෝ ගෙරි ඇටයකින් මල් කොපුව තලත විට "වොක් වොක්" යන ශබ්දයක් මල් කොපුවෙන් හටගනී ඉත්තිසා කිතුල් මල් තලා තෙලිදිය හෝ රා මදින්නන්ට "වොක් කොවුල්" සහ "කිතුල් වැද්දන්" යන නාමය කියති.

### සපුමල් කෙවුල්.

සපුමල් කෙවුලත් ලංකාවේ නැත. දකුණු ඉන්දියාවේ සොළී, පාණ්ඩි, කේරළාදි රටවල මොවුන් හට **"සෙම්බඳවන්"** යයි කියති.

### ඉදිමල් නොහොත් ඉදිවැල් කෙවුල්.

ඉදිකොළ ගොතා රැහැන් දෙපොටක යොදා ඒ මැද කුඩා මඩියක් පිහිටුවා තනාගත් දැලට ඉදිවැල් දැලයයි කියති. පොල්කොළ වලින්ද මීට සමානම දැල් තනාගනුලැබේ කැලණි ගගේ නාගලු ගංතොට සිට හංවැල්ල සහ සවිසන්තොට යන ප්‍රදේශවල මේ දැල්වලින් මස් මරණු ලැබේ. මොවුන් හට ඉදිමල් නොහොත් ඉදිවැල් කෙවුලන් යයි කියති.

*ගිංගඟ මහවැලි ගඟ, වලවේ ගඟ, කළුගඟ, බෙංතර ගඟ, නිල්වලා ගඟ, යනාදියේ සහ විශාල වැව් පොකුණු වලද මේ දැල් වර්ගය යොදා මසුන් මරාගනිති.

### ‡හුණු කෙවුල්.

වැරැටි, තිරියල්, සිප්පි, හුණුගල් යන ආදිය පුළුස්සා හුණු තනන්නන් හට හුණු කෙවුලන් යයි කියති

---

*කාලේ පරිදි ගිංගඟ දිය ගලන කො ට
තාලේ වැරදිලා වදිනා සඳ ඔබ ට
ලි ලේ දුරදි සිතැඟි බොරු මායම ට
රා ලේ ඇසිද ආවේ මගෙ අතු පැල ට

උත්‍රය,

රු ලේ නැඟි තැගී ගිංගඟ ගලන වි ට
මොලේ නැති මාලු යනවා ගොඩ දෙස ට
තෙලේ අරින්නට උන්ගේ යස රඟ ට
බොලේ මම ආවෙ ඇහිඳල ගෙතියන් ට

ගිංගඟ ගොන්ගල කන්දෙන් පටන්ගෙන දෙනියාය හරහා ගලා බසී. (1954 ජනවාරි 9, සිංහල බෞද්ධයා)

‡මධ්‍යම පලාත ඌව සබරගමුව වයඹ සහ උතුරු මධ්‍යම පලාත්වල හුණුගල් පුළුස්සා හුණු තනාගනු ලැබේ. මේ කර්මාන්තයෙහි වැඩිකොටම යෙදී සිටින්නේ තමන් උසස් යයි කියා ගන්නාවූ මිනිසුන් වෙති

## මුහුදේ මසුන් අල්ලන්නෝ.

මේ දැල් දෙවගීය මූදේ මස්මැරීමට පමණක් යොදනු ලැබේ. නූල් දැලෙන් මස් මැරීම පිණිස විශාල පාරු දෙකක්ද මාදැලට එක පාරුවක්ද අවශ්‍ය වේ. මේ දැල් වගී ලංකාවේ උසස්යයි සම්මත කුලවත්තයින් බොහෝ දෙනෙකුට අයිතිව තිබෙන්නේය.

බෙන්තර කොස්ගොඩ පැලෑන උනවටුන පමුණුගම ජාඇල මෝදර යන පලාත්වල රජ බමුණු *වෙළඳ ගොවි යන කුලවත්හු නූල් දැල් සහ මාදැල් මුහුදේ යෙදවීමෙන් මස් මරාගනිති.

හලාවත මීගමුව මෝදර මොරටුව වැලිගම මිරිස්ස අහංගම යනාදී පලාත්වල කෞරව වංශිකායෝ නූල් දැල් සහ මාදැල් සහාය කොටගෙන මුහුදේ මසුන් මරාගනිති.

---

*"අපට අයිති දැලෙන් අල්වාගත් මත්ස්‍යයින් ගොඩක් එවකට බෙන්තර තානායමේ සිටි අංණ්ඩුකාර තුමාට තෑගි කෙළෙමි."

(වංශාධිපති වෙළඳකුල ජේම්ස් ද අල්විස් අධිතීතිඥ තුමාගේ පොත)

මා ත ගුණැති පිංවත් අයගෙ කාර තේ
දු ත දෙමින් සිල් රැක පිං කර හිඳි තේ
පා ත ඇවුලු ලෙස දෙව්ලොව සැප විඳි තේ
ජේත කෙනෙක් ඇත්නම් දිව ඇසින් පෙ නේ

මා ත මිස කඳුණ ගුන කිසිවක් නොදැ තේ
බා ත බිලි රැන යොත් දැල් පත්න ගෙ තේ
පී ත මින් මීන ගෙන දත් දෙන බැවි තේ
ජේත කෙනෙක් ඇත්නම් දැල් ඇසින් පෙ නේ

(කවි සඟරාව)

මන්නාරම යාපනය කල්පිටිය මඩකලපුව ත්‍රිකුණාමලය හම්බන්තොට යන මේ පලාත්වල ඒ දල් දෙවගීයෙන් මුක්කරු, තිමිලර්, මුස්ලිම්, ජා, දෙමල යනාදීන් විසින් මුහුදේ මස් මරාගනු ලැබේ.

## කරක් කෙවුල්.

දිය හිඳිගිය වැව් පොකුණු වලද කුඹුරු ඇල දෙල වල් වලද කරක්ගෙඩියෙන් මඩකරි මිරිකාගනිති. ඔවුන් හට කරක් කෙවුල් නාමය හිමියි. මඩකරි යනු මඩේ ලගින කුඩමසුන්ය.

## කෙමිණ කෙවුල්.

වැව් පොකුණු ඇල දෙල කුඹුරු කමත්වල දිය පිරුණු වර්ෂා දවස්වල කෙමිණ ආධාර කොටගෙන ලූල්පැටව් පෙතියෝ රල්ලි අඟුලුපැටව් කාවයියෝ යනාදී මසුන් අල්ලා ගනු ලබන්නන් හට කෙමිණ කෙවුල් යයි කියති.

## තවත් මත.

දුනු කෙවුල්, කෙමන් කෙවුල්, මුහුදු කෙවුල්, විල් කෙවුල්, උගුල් කෙවුල්, ගං කෙවුල්, වද කෙවුල්, ලිහිනි කෙවුල්, මස් කෙවුල්, යනාදී නවයයි.

## තවත් මත.

ධනුකඃ මොයක්‍ෂෙත්‍ර හිංසා උදවාගී ගෙබකඃ පිකඃ සයුරඃ නදී වාහිජ මත්තාලා හුත්ත සන්තෝයා කුරඃ

## තවත් මත.

"කෙවුල් කුල සතර"

මාදල් කෙවුලන්, කිතුල් වැද්දන්, සාදල් කෙවුලන් වැද්දන්, සෙසු වැද්දන්,

(නීති ප්‍රභේද පුස්කොළ පොත "කී" පත්‍ඉරුව කෞතුකාගාර පොත්හල නො: 7/J7)

තවද ක්‍රි: ව: 1726 යේදී ලියන ලද පොතේ, ප්‍රැන්කොයිස් වැලන්ටයින් ඉතිහාසඥයාගේ කියමනේ ප්‍රකාර ගොඩකෙවුල්, දඹුකෙවුල් යනාදී කීප වර්ගයක මස් මරන්නන් සිටින බව දැනගන්ට තිබේ.

ලංකාවේ ඕලන්ද ආණ්ඩුකාලය පැවති යුගයේ ලියන ලද වැලන්ටයින්ගේ ඉතිහාසයේ බෙහෙවින් නොමග ගිය කරුණු සඳහන්කොට තිබේ.

වැලන්ටයින් කිසිවිටක ලංකාවට පැමිණියේ නැත. ඔහු ඕලන්දයේ සිටගෙන එකිනෙකාගේ ලියුම් කියුම් අනුව ඔහුගේ ඉතිහාස පොත ලියන ලද්දේය. ඉන් නිසා තම තමන්ගේ පංතියට වාසි ලැබෙන අයුරු කරුණු කියාදුන් අයින් විසින් වැලන්ටයින් ඉතිහාස කරුව නොමග යවා තිබෙන බව සැලකියයුතුයි.

තවද එකල සිටි සමහර මුදලි මුහන්දිරම්වරු සහ රජේ ශාලලාද තමන්ට වාසි වන අන්දමට පූජක ජේම්ස් කෝර්ඩිනර්, ජෝන් ඩේවි, ජෝන් ආර්මර්, ජෝන් පර්ගියුසන්, යනාදි ඉතිහාස කරුවන් නොමග යවා අනුන්ට අපහාස වන අන්දමට කරුණු කියාදී ඒ පොත් සකස් කරවාගන තිබෙන බව පැරැන්නන් විසින් කියනලදී.

## විශෙෂ විභාග.

"මේ කෞරව ගෝත්‍රයෙන් හිත්තවූ මත්ස්‍ය කියන කො.. ස මේ ලංකාවේ සහ දකුණු දඹදිව මුහුදුබඩ පලාත්වල ඉන්න බව සත්‍ය වශයෙන් පෙනේ. මස් මැරීම් හේතුවෙන් ගෝත්‍ර නාමය වෙනස් නොවේ. ලක්දිව ඉන්නා සෑම ගෝත්‍රවලම අයත් මිණිස්සු මස්මරත්."

"‡සලාගම මිනිහෙක් මස්මැරීමෙන් කරාවේ මිනිහෙක් නොවේ. දුරාවේ මිනිහෙක් මස්මැරීමෙන් කරාවෙ මිනිහෙක් නොවේ ගොයිගම මිනිහෙකු ගැනත් එසේමයි. ශාන්ත පාප්වරු "බොල්ඝනා" කියන තම ඇති වැවේ ග්‍රීෂ්ම සෘතුවට මස් මරාගෙන අං බැවින් උත්තාත්සේලා කරාවේ නුවූහ." නුමුත් ඇත පුරාණයේ සිට මත්ස්‍ය ඝන නාමය ඒ ගෝත්‍රයට හිමිවූ බව නීලකණ්ඨ ටීකාවෙහිද සංස්කෘත සාහිත්‍ය නම් පොතේ 15 වෙනි පිටුවෙහිද දක්වා තිබේ.

(හලාගම් පිළිබඳ ශ්‍රී ලංකාවීප වර්ණනා පොත)

**බ්‍රාහ්මණ වංශය පිළිබඳ මහායානික පඬිවරයෙකුගේ යකුළු පහර.**

**බ්‍රාහ්මණයන්ගේ තකී වලංකාබල් මෙන් සුන්බුන් කිරීම.**

ශාස්ත්‍ර යුක්තීන්ට අනුරූපව ශක්ති පමණින් වජ්‍ර සූචි නම් ග්‍රන්ථයක් කරනු කැමති අශ්වඝෝෂාචාර්යයෝ මඤ්ජුඝෝෂ නම් ජගත් ගුරුන්හු ප්‍රණාමය කරමින් මෙසේ දක්වති.

---

‡හලාගම කුලය පිළිබඳ ශ්‍රී ලංකාවීප වර්ණනා පොතේ සඳහන් මේ කියමනේ ප්‍රකාර කරාවේ මිනිසුන් සියල්ලෝම මස් මරන්නන් බවට ප්‍රකාශ වෙයි.

හලාගම මිනිසුන්ගේ පොත්වලම ඔවුන්:-

හේවා පත්තක්කාරයෝය, කුරුඳු පත්තක්කාරයෝය පනිවිඩකාරයෝය, ඌලියක්කාරයෝය, අගම්පොඩියෝය, යනාදි පංචවර්ගයකට බෙදී සිටින බව කියාතිබේ. හලාගම මිනිසුන් සියල්ලෝම ඌලියක්කාරයින් හෝ අගම්පොඩියන් නොවන්නාසේම කරාවේ මිනිසුන් සියල්ලෝම මස් මරන්නෝ නොවෙති. ගොවිගම, හලාගම, දුරාව, නවන්දන්න යනාදි කුල ඒ ඒ කුලයන් අතර නා නා ගෝත්‍ර බෙදී සිටින්නේ යම්සේද, එමෙන්ම කරාව හෙවත් කුරුකුලයද ගෝත්‍ර 21 කට බෙදී සිටින බව දැනගතයුතුයි. ඒ ගෝත්‍ර අතර උස් පහත් ප්‍රභේදද පවත්වති.

ඔබගේ වේදය හා ස්මෘතියද ධර්මශාස්ත්‍ර පිළිබඳ කෘතින්ද ප්‍රශස්තයහ, සාරයහ, ඒවා පවතිනවාම සූත්‍රයෝ අසාරයහ. එහෙත් චතුර්වර්ණයන් අතරෙන් බ්‍රාහ්මණයාම උතුම්යැයි දක්වන ඔබගේ තර්කය ඒ පොත් වලින් ඔප්පු කරන්නට නොපිළිවන.

බ්‍රාහ්මණත්වය යනුවෙන් කුමක් අදහස් කෙරේදැයි පළමුකොටම කියනු මැනවි. එය ජීවයද, මවුපිය වංශයද, ශරීරයද, ඥානයද, ආචාරයද, කර්මයද නැත හොත් වේදයද?

# බ්‍රාහ්මණත්වය හා ජීවය

බ්‍රාහ්මණත්වය ජීවයයි ඔබ කියන්නෙහි නම් එය වේදයට නොගැළපෙන්නාවූ කියමනකි. සූර්යයාද, චන්ද්‍රයාද, ඉන්ද්‍ර දිව්‍ය පුත්‍රයා හා අවශෙෂ දෙවිවරුන්ද මුලදී සිවුපාවෝ වූහයි, වේදයෙහි ලියවී ඇති බැවිනි.

තවත් ඇතැම් දෙවිවරු මුලදී තිරිසනුන්ව සිට පසුව දෙවියෝවූහ. සවාපදයන් වැනි අතිශයින් කුත්සිතයෝ පවා, දේව සංඛ්‍යාවට ඇතුළත්වූහ. මෙයින් පැහැදිලි වනුයේ බ්‍රාහ්මණත්වය ජීවය නොවන බවයි. කාලිඤ්ජල පර්වත යෙහි ව්‍යාධයන් සත්දෙනෙකු හා මුව පොව්වන් දශදෙනෙකුන්ද, මානසා රෝවර විලෙහි හංසයාද, සාරද්වීප යෙහි සක්වා යුගලක්ද, කුරුක්ෂෙත්‍රයෙහි බ්‍රාහ්මණ මහා සාරකුලයෙහි ඉපිද වේද පාරගතවූ බැව් ප්‍රකාශවන මහා භාරත පාඨයෙන් ඒ බැව් වැඩිදුරටත් පැහැදිලිවෙයි

අංගොපාංග සහිත චතුර්වේදයෙහි කෝටි ප්‍රාප්තවූ යම් බ්‍රාහ්මණයෙක් ශුද්‍රයෙකුගෙන් භික්ෂාටනය කළහොත් දොළොස්වාරයක් ගද්‍රභ යොනියෙහිද, දහසය වාරයක් ඌරු යෝනියෙහිද, සත්වාරයක් ශුණක යෝනියෙහිද උපදින බැව් මනාව ධර්ම ශාස්ත්‍රය කියයි.

බ්‍රාහ්මණත්වය ජීවය නොවන බැව් ඔහුගේ මේ වචන වලින්ද පැහැදිලි වෙයි. බ්‍රාහ්මණත්වය ජීවය නම් මෙබඳු දේ සිදුවිය හැක්කේ කෙසේද? බ්‍රාහ්මණත්වය මවුපිය වංශය උත්පත්තිය හෝ ජාතියළඩ පවතීයයිද, බ්‍රාහ්මණයෙකු වීමට බ්‍රාහ්මණ මහා සාර කුලයෙහි දෙමව්-පියන්ට දුව ඉපදිය යුතුයයිද ඔබ නැවතත් කියන්නෙහි නම්, ස්මෘති ශාස්ත්‍රයෙහි එන පාඨයන් හා එය නොගැලපෙයි.

## දූවිල්ලෙන් උපන් පරශු රාමයා

අචල මුනි හස්ති යෝනියෙන්ද, කේශ පිංගල බකමුහුණු ධෙනුවකගේ කුසින්ද, අගස්ති මුනි අගස්ති පුෂ්පයෙන්ද, කෞශික මුනි කුසතණයෙන්ද, කපිල ඍෂියා වැදිරියකගෙන්ද, ගෞතම ඍෂියා සාල වෘක්ෂය වැළඳ ගත් ලතා ගුල්මයෙන්ද, ද්‍රෝණාචාර්ය මැටි කළයෙන්ද, තෛත්‍රි ඍෂි ඇම්කුකුළාගෙන්ද, පරශුරාම දූවිලි වලින්ද, ශෘංග ඍෂි මුවදෙනකගේ කුසින්ද, ව්‍යාස මුනි මස්මරන ස්ත්‍රියකගේ කුසින්ද, විශ්වා මිත්‍ර චණ්ඩාලියකගේ කුසින්ද, කෞශික මුනි ශුද්‍ර ස්ත්‍රියකගේ කුසින්ද, වශිෂ්ඨ මුනි ගණිකාවකගේ කුසින්ද, උපන් බැව් ස්මෘතිය කියයි.

යට දක්වූ එක්කෙනෙකුවත් බ්‍රාහ්මණ වංශික මව් කුසෙහි ජනිත නොවූ නමුත් ඒ සියලුදෙනාම බ්‍රාහ්මණ-යෝයයි එකහෙළා පිළිගනිති.

මෙයින් මට වටහාගත හැකිව තිබෙන්නේ බ්‍රාහ්මණ සත පදය මාතෘ පිතෘ වංශ පරම්පරාව අනුව උත්පත්තියෙන් එන එකක් නොවන බවයි. බ්‍රාහ්මණ වංශික දෙමව්පියන්ට දුව ඉපදුන යමෙක් බ්‍රාහ්මණයෙක් වේයයි ඔබ කියන්-නෙහිද? එසේනම් ඊට මම තරයේ විරුඬ වෙමි.

ඔබ පරිශුඬ බ්‍රාහ්මණ වංශයක් ඇදගන්නං හෙයිනි. පරිශුඬ බ්‍රාහ්මණ වංශයක් ඒ විධියට නම් ලැබිය නොහැක. වර්තමාන බ්‍රාහ්මණ වංශයේ ආදි පුරුෂයන්ගේ අඹුවන් අතර, ශුද්‍රයන් සමග අනාචාරයෙහි නොයෙදුනායයි නොකියහැකි එකියකුදු නැති බැවිනි.

# මානව ධර්මය.

ඉතින් නියම පියා ශුද්‍රයකු වීනම් මව බැමිණියක්වූ පලියට පුතා බ්‍රාහ්මණයෙක් නොවේ. මා ඉදිරියේ තිබෙන සියලුම කරුණු වලින් පෙනියන්නේ බ්‍රාහ්මණත්වය ඇත්ත වශයෙන්ම උත්පත්ති මූලක නොවන බවයි. මානව ධර්මයෙන්ද ඒ බැව් ඔප්පු කිරීමට සාධක දැක්විය හැකිව ත්‍රබේ.

මස් බුදින බ්‍රාහ්මණයා සැණෙකින්ම දිනයකු වන බැව් මානව ධර්මය කියයි. ඉටි, ලුණු, හෝ කිරි විකිණීමෙන්ද, තෙදිනක් ඇතුළත ඔහු ශුද්‍රයෙක් වන්නේයයිද මානව ධර්මය කියති. මස්මාංශ භාජන අතපතගෑමෙන් ධ්‍යානලාභිව, සෘධියෙන් යාහැකි බ්‍රාහ්මණයා නමුදු ඒ සියලු දෙයින්ම පිරිහෙන බැව් මානව ධර්මය වැඩිදුරටත් කියයි.

බ්‍රාහ්මණත්වය උත්පත්තියෙන් උරුම වන්නක් නොවන බැව් මේ සියලුම දෙයින් පැහැදිලි නොවන්නේද? එය උත්පත්තියෙන් ලැබෙන්නක් නම් යමෙකුගේ කෙතරම් නිහීන ක්‍රියාවලින් වුවද බ්‍රාහ්මණත්වය නැතිවිය නොහේ. බිමට වන් කෙණෙහි ඌරෙකු බවට පරිවර්තනයවූ අහසින් ගිය වලාහක අශ්වයෙකු ගැන ඔබ දන්නෙහිද? එය වනාහි සිදුවිය නොහැකි දෙයකි

ශරීරය බ්‍රාහ්මණත්වයයි ඔබ කියන්නෙහිද? මෙද බොරුවකි. ශරීරය බ්‍රාහ්මණයෙකු වේනම්, බ්‍රාහ්මණ මෘත කලේබරය (මළමිනිය) දවන ගින්නද බ්‍රාහ්මණයකු මැරීමේ අපරාධකාරයෙකු නොහොත් මිනීමරුවකු බවට පත්විය යුතුය. බමුණාගේ මෘත ශරීරය ගින්නට කැපකල ඥාතිහුද මිනීමරුවන්ගේ සංඛ්‍යාවට එකල්හි ඇතුලත් වන්නෝය. බමුණකුට දාව ක්‍ෂත්‍රිය හෝ වෛශ්‍ය කුලයේ මවකගේ කුසින් උපන් අයද බමුණෝයැයි යන මූඪ මතයද සත්‍ය විය නොහේ.

කවර හෙයින්ද යත් ඇවිත් ඇට, මසින් මසටම පියාට දුව්මක් විය නොහෙත බැවිනි. යලිදු යාග හෝම කිරීම, යාගහෝම කිරීමට අන්‍යයන් පෙළඹවීම, වේදය කියවීම හා කියවීමට අන්‍යයන් පෙළඹවීම, දක්ෂිණාව ලැබීම හා පිරිනැමීම, ඇතුළු වෙනත් ආගමානුකූල වත් පිළිවෙත් පැවැත්වීම යන මේ සියල්ල බ්‍රාහ්මණයාගේ ශරීරයෙන් ජනිත වූවාහු නොවෙත්ද?

බ්‍රාහ්මණ මෘත කලේබරය (මළමිනිය) විනාශ කිරීමෙන් යටකී සියලුම ගුණයෝ විනාශ කළාහු නොවෙත්ද?

## චතුර්වේදය.

ඇත්ත වශයෙන් කියතොත් අපේ ප්‍රතිපත්තීන් අනුව එබඳු නිගමනයක් කළ නොහේ. එසේනම් බ්‍රාහ්මණත්වය ශරීරයෙහි රැඳෙන්නවද නොපිළිවන.

බ්‍රාහ්මණත්වය ඥාණයයයි ඔබ කියන්නෙහිද? මේද අසත්‍යයකි. කවරහෙයින්ද යත්, බ්‍රාහ්මණත්වය ඥානයෙහි පවනී නම් ඥානයෙන් අග්‍රවූ බොහෝ ශුද්‍රයන්ද බ්‍රාහ්මණ සංඛ්‍යාවට ඇතුළත් වියයුතු හෙයිනි. චතුර්වේදයෙහිද, දශීන ශාස්ත්‍ර විෂයෙහිද මී මාංස සාංඛ්‍ය වෛශෙෂික ජ්‍යෝතිෂික ආදි දශීණ ශාස්ත්‍රයන්හි පාරප්‍රාප්තවූ බොහෝ ශුද්‍රයන් ගැන මම හොඳින් දනිමි.

එහෙත් ඒ එක් කෙනෙකුන්ට වත් බ්‍රාහ්මණයයි කියනු නොලැබේ. බ්‍රාහ්මණත්වය ඥානයෙහිවත් ඉගෙනීමෙහිවත් නොරඳන බැව් මෙයින් පැහැදිලිව ඔප්පුවෙයි. එසේනම් අංචාරය බ්‍රාහ්මණත්වය යයි ඔබ කියන්නෙහිද? ඒද අසත්‍යයකි. එය ඇත්තක් නම් බොහෝ ශුද්‍රයෝ බ්‍රාහ්මණ බවට පත්වන්නාහ.

**නාත, භාත, කෛවර්ත, භණ්ඩ සහ වෙනත්** බොහෝ දෙනකු සැම තැනම ආචාරයෙහි යෙදී උග්‍ර අඳුමින් තපස්රකිත බැව් පෙනෙත හෙයිනි. එසේද වුවත් ආචාරයෙන් අගතැන් පැමිණි මෙබන්දන්ට පවා කිසි විටෙකවත් බ්‍රාහ්මණයින්යයි කියනු නොලැබේ. ආචාරය බ්‍රාහ්මණත්වය නොවන බැව් එයින්ද පැහැදිලි වන්නේය. බ්‍රාහ්මණත්වය කර්මය විසින් නිර්මාණය කරනු ලැබේයයි ඔබ කියන්නෙහිද? ඊටද මම නැතැයි කියමි යට දක්වන ලද කරුණු මීටද ප්‍රබලා කාරයෙන් ගැළපෙනු පමණක් නොව ක්‍රියාවන් බ්‍රාහ්මණත්තවය යයි ගන්නා මතයද ඒ අනුව මූලොත්පාටිතය වෙයි.

## වේද මන්ත්‍ර හැදෑරීම

වේද මන්ත්‍ර හැදෑරීමෙන් මිනිසෙකු බ්‍රාහ්මණත්වයට පත්වේයයි ඔබ කියන්නෙහිද? ඒද ප්‍රත්‍යක්ෂ වශයෙන්ම බොරුවන්නේය.

රාවණා නැමැති රාක්ෂසයා චතුර්වේදයෙහි කෝටි ප්‍රාප්තව විසූ බැව් කවුරුන් විසිනුත් පිළිගනු ලැබේ. රාවණාගේ කාලයෙහි විසූ සියලුම රාක්ෂසයෝ වේදය හැදෑරූහ. එහෙත් ඔවුන්ගෙන් කිසිවකු ඒ අනුව බ්‍රාහ්මණ වූ බවක් ඔබ පිළි නොගනී. වේදය හැදෑරූ පමණින් කෙනෙකු බ්‍රාහ්මණ නොවන බැව් මේ අනුවද ඔප්පුවේ

**එසේ නම් බ්‍රාහ්මණයා යයි කියන සතා මොකාද?** චතුර්වේදය හැදෑරීම වත්, මව්පිය වංශ පරම්පරාව වත්, කුලය හෝ කර්මය වත්, බ්‍රාහ්මණත්වය නොවේ නම් කුමකින් එය නිර්මිත වීද?

මගේ හැඟීමේ හැටියට බ්‍රාහ්මණත්වය වනුයේ කුන පුෂ්පයේ ශ්වේත වර්ණය මෙන් නිර්මලවූ අකලංක දෙයකි යමක් පාපය පහකෙරේද, එය බ්‍රාහ්මණත්වයයි. ව්‍රත,. තපස්, නියම, උපවාස, දාන, දම, ශම සහ සංයමාදියෙන් එය නිර්මිතය.

අල්පෙච්ඡතා ඇති ආත්මාර්ථය නොසලකන සංගයෙන් මෙන්ම පරිග්‍රහයෙන්ද රාගයෙන් මෙන්ම වෙෂයෙන්ද තොරවූ යහපත් පුද්ගලයා බ්‍රාහ්මණයකු හැටියට දෙවියන් විසින් පවා සලකන බැව් වේදයෙහි ලියවී තිබේ.

## චණ්ඩාලයා කව්ද?

සත්‍යවාදි බව, ආත්ම දමනය, ඉන්ද්‍රිය සංයමය, සහ මෛත්‍රියද, නියම් බ්‍රාහ්මණයාගේ ලක්‍ෂණ බවත් මේකී ගුණයෙන් වෙන්ව දුෂ්ප්‍රතිපත්ති ගත් පුද්ගලයා චණ්ඩාලයෙකු බවත් සියලුම ශාස්ත්‍රවල සඳහන්වේ.

තෙමේ දෙවියෙකු මිනිසෙකු හෝ තිරශ්චීනයකු හෝ වුවද ගණිකා වෘත්තියෙන් ඇත්වෙතොත් ඒද බ්‍රාහ්මණයාගේ ලක්‍ෂණයකි. දෙවිවරුන් කුලය ගැන නොසලකන බවත් නින්දිත ගෝත්‍රයෙහි උපනත් යහපත් මනුෂ්‍යයා බ්‍රාහ්මණයෙකු හැටියට පිළිගන්නා බවත් ශුක්‍රාචාර්යයන් විසින් කියා තිබේ.

මේ සියල්ලෙන්ම බැසගත් නිගමනය නම් බ්‍රාහ්මණයකු වීම පිණිස උත්පත්තිය, ජීවිතය, ශරීරය, ඥානය, ආගමික පිළිවෙත් (ආචාරය) හෝ කර්මය නුවුවමනා හෝ හේතු නොවන බවය. තවද කිවයුත්තක් ඇති. ඔබගේ නිකායෙහි ශුද්‍රයන්ට ප්‍රව්‍රජ්‍යාව අහිමිය. ඒ වෙනුවට බ්‍රාහ්මණයින්ට සේවය කිරීම හා කීකරුව විසීම ශුද්‍රයන්ට නියමය.

## පාණිනී සූත්‍රය.

චතුර් වර්ණයන් ගැන කියන විට ශුද්‍රයා අන්තිමට කියවෙයි. ඔහු අන්තිමට කියවෙන නිසා කුලහීනයාය. මේද අඥ කීමකි. චතුර්වර්ණයන් අන්තිමට දැක්වූ පලියට ශුද්‍රයා නීචයෙක් වේනම් ඉඳුද සතුනයන් අතර අන්තිම පහත් නීචයෙකු විය යුතුයි.

පාණිනී සූත්‍රයෙහි බල්ලාටද අනතුරුව ඉන්ද්‍රගේ නම සඳහන්කර තිබෙන හෙයිනි. පාණිනී සූත්‍රයෙහි "ශිව, ශ්‍රූව, මඝවා," යනුවෙන් දක්නා ලැබේ. ඇත්ත වශයෙන් කියතොත් නම් ලියා හෝ සඳහන් කර තිබෙන පිළිවෙල අනුව ඒ ඒ පුද්ගලයන්ගේ තත්වයට හා ගෞරවයට හානියක් නොවේ. කිමෙක්ද? පාණිනිය මහේශට වඩා උසස්විද? ඇතැම් ව්‍යාකරණ වාක්‍යයන්ගේ අනුප්‍රාසය සලකාගෙන දන්වලට පසුව තොල කියා තිබෙන බැවින් දත්, තොල් වලට වඩා උසස්යයි කිවයුතුද?

දත්තයෝ තොල්වලට වඩා පැරණි වූවහුද, තොඑසේ නම් ශිව දේවයා ඔහුගේ අඹුවට වඩා පහත්කොට තැකීමට ඔබගේ ඇදහිල්ල ඔබට උගත් වන්නේද? නැත; චතුර් වර්ණයන් කිමෙහිදී එක්තරා පිළිවෙලක් අනුව අපට කියන්ට පුරුදුවූ නිසා ශුද්‍රයා නීචයෙකැයිද බ්‍රාහ්මණයා මහා ලොක්කෙකැයිද සත්‍ය නොවේ.

චතුර්වර්ණය පිළිබඳ තර්කය බිඳවැටෙන කල නීචවූ ශුද්‍රයා බ්‍රාහ්මණයාට සුවච කීකරුව සේවය කිරීමම තමන් ලබන ප්‍රවුජ්ජාව යයි, යන තර්කයද එලෙසින්ම බිඳවැටිය යුතුය ශුද්‍රනියකගේ කිරි බිව්වාවූ හෝ යටත් පිරිසෙයින් ඇගේ හුස්ම වැදුනාවූ හෝ බ්‍රාහ්මණයා තමාගේ බ්‍රාහ්ම ණභාවයෙන් පිරිහෙන බැව් මනුගේ ධර්ම ශාස්ත්‍රයෙහි ලියවී තිබෙන බැව් තවදුරටත් දැනගනු මැනවි.

ශුද්‍රනියකුගේ අතින් ඇල්ලූ යමක් කෑවාවූ හෝ බීවාවූ හෝ බ්‍රාහ්මණයා ශුද්‍රයකු වන බවත් මරණින් පසු ශුණකයකු වන බවත් එම ධර්ම ශාස්ත්‍රය වැඩිදුරටත් කියයි. ශුද්‍ර ස්ත්‍රියක සමග ආශ්‍රය කරන්නාවූ හෝ නැතහොත් ශුද්‍ර ස්ත්‍රියක අඹු තනතුරෙහි තබන්නාවූ හෝ බ්‍රාහ්මණ- යකු වේ නම් ඔහු ලේ නෑයන් විසින් පමණක් නොව දෙවියන් විසිනුදු වර්ජනය කරනු ලැබ, මරණින් මත්තෙහි අපායගාමි වන බැව් මනු තවදුරටත් කියයි.

## මානව ධර්මය.

මානව ධර්මයේ සඳහන් මේ සියලුම සාක්ෂ්‍ය වලින් පැහැදිලි වනුයේ බ්‍රාහ්මණත්වය යනු, යම් කිසි ජාතියකට හෝ උත්පත්තියකට ඇලීතිබෙන දෙයක් නොව යහපත් මනුෂ්‍යයන් පිළිබඳ ගුණාංගයක් බවයි.

තපෝ බලය කරණකොටගෙන බොහෝ ශූද්‍රයන් බ්‍රාහ්මණ සංඛ්‍යාවට ඇතුලත්වූ බැව් මානව ධර්ම ශාස්ත්‍රයෙහි තවදුරටත් සඳහන්වෙයි. හෝම ගින්නෙන් ඉපිද උග්‍රවූ තපෝ බලයෙන් බ්‍රාහ්මණයකුවූ කසින මුනිවරයා මේ පිළිබඳ කදිම නිදසුනකි.

උර්වශී නැමැති වෛශ්‍යාවගේ කුසින් උපන් වශිෂ්ට මුනිවරයාද, මස් මරණ ස්ත්‍රියකගේ කුසින් උපන් ව්‍යාස නම් මුනිවරයාද, මුවගනකගේ කුසින් උපන් ඍෂ්‍ය ශෘංග මුනිවරයාද, චණ්ඩාලියකගේ බඩින් උපන් විශ්වාමිත්‍ර හා මන්පැන් වෙළෙන්දියකගේ කුසින් උපන් නාරද මුනිවරයාද තමන් විසින් රක්කාවූ උග්‍ර තපෝ ගුණය නිසා බ්‍රාහ්මණයෝ වූහ.

බ්‍රාහ්මණත්වය උත්පත්තිය කෙරෙහි රඳී නැති බැව් මෙයින් පැහැදිලි නොවන්නේද? තමාම තමා ජයගත් තැනැත්තේ යති යයිද ඉඳුරන් දමනය පිණිස ආත්ම වධ පමුණුවා ගන්නා තැනැත්තේ, තාපස යයිද බ්‍රහ්මචරියාව රක්ෂාකරන තැනැත්තේ බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

## නියම බ්‍රාහ්මණයා.

යමෙකුගේ ජීවිතය පිරිසිදු නම්, සිත ප්‍රීතිමත් නම් නියම බ්‍රාහ්මණයා වනුයේ ඔහුයි. වංශ පරම්පරාවෙහි හෝ කුලයෙහි ඊට කිසිදු සම්බන්ධයක් නැත. මනු නීතියෙහි ශ්ලෝකවල මෙසේ සඳහන්වේ. "සියල්ලට වඩා උත්කෘෂ්ට වන්නේ යහපත් සිතිවිල්ල සහ පරිශුද්ධ භාවයත්ය."

කුල පරම්පරාව පමණක් ගරුබුහුමනට භාජන නොවිය යුතුය. ආචාර ශීලාදී ශිෂ්ට පැවතුම් වලින් තොරවේ නම් රජ කුලය වුවද නිෂ්ඵලය ගර්හිතය. කඩිත මුනි ව්‍යාස මුනි ඇතුළු අවශෙෂ මුනිවරයන් ශුද්‍රණියන් කුස උපනත් ඔව්හු මිනිසුන් අතර බ්‍රාහ්මණයන් හැටියට අතිශයින් ප්‍රසිඩයහ. ශීල ව්‍රත සමාදන්වීම නිසා කුලහීනව උපන් බොහෝදෙනා ස්වර්ගගාමී වූහ. එහෙයින් බ්‍රාහ්මණයා යම්කිසි විශෙෂ කුලයකට අයිතියයි, කිම වනාහි නිෂ්ඵලවූ මුසා කියමනකි.

බ්‍රාහ්මණයා මුඛයෙන්ද, ක්‍ෂත්‍රියයා බාහුවෙන්ද, වෛශ්‍යයා කලවායෙන්ද, ශුද්‍රයා පාදයෙන්ද, උපන්නාහු යයි කියන ඔබගේ ධර්මය ඒත්තුගන්නට බැරිමය. බ්‍රාහ්මණයෝ වනාහි යම්කිසි විශෙෂ ජාතියකට අයත් පුද්ගලයෝ නොවෙති.

කෛවර්ත කුල, රජක කුල, සහ චණ්ඩාල කුල ආදී කුලවල ජනිතව මේ ලෝකයෙහි ජීවත්වූ බොහෝ මිනිස්සු බ්‍රාහ්මණයන්ටම හිමිවූ චූඩාකරණ, මුඤ්ජබන්ධන දන්ත කාෂ්ඨ ආදි බ්‍රාහ්මණයන්ට හිමි චාරිත්‍ර විධි සිදුකළහ මරණින් මතු බ්‍රාහ්මණ සංඛ්‍යාවටද ඇතුලත්වූහ. ඔව්හු තවමත් බ්‍රාහ්මණයන් මෙන් ප්‍රසිඩයහ

## චතුර් වර්ණයෝ.

බ්‍රාහ්මණයන් ගැන මා විසින් කියන ලද සියල්ල ක්‍ෂත්‍රියයන් සම්බන්ධයෙන්ද, ඒ තරමටම ගැලපෙන බැව් ඔබ දැන සිටිය යුතුය. චතුර් වර්ණයන් පිළිබඳ ධර්මය එහෙයින් නිරවශෙෂ වශයෙන් බොරුය සියලුම මනුෂ්‍යයෝ එකම ජාතියකට ඇතුළත් වන්නෝය.

පුදුමයෙකි! සියලුම මනුෂ්‍යයෝ එක් කෙනෙකුගෙන් (බ්‍රහ්ම පදවියෙන්) ඇතිවන්නාහුයයි ඔබ කියන්නෙහිය. එසේ නම් ඔවුනතර වෙනස් කළ නොහැකිවූ චතුර්විධ භේදයක් කෙසේ ඇතිවිය හැකිද? එකම අම්මාට දාවූ පුත්‍රයන්

සතරදෙනෙක් මට සිටිත් නම් එකම පියෙකුට දූව එකම මවගේ කුසින් උපත් ඒ පුත්‍රයන් සතර දෙනා තඩයෙන් එකාකාර විය යුතුමය ජීවයන් අතර ජාති වශයෙන් පවත්නා ප්‍රභෙදය ප්‍රකෘති සවභාවයෙන්ද ඒ ඒ ක්‍රියාවන්ට අනුරූප වීමෙන්ද විශාල ලෙස වෙනස්වෙයි.

හස්ති පාදය අශ්වපාදයට වඩා වෙනස් වන්නාක් මෙනි. ව්‍යාඝ්‍ර පාදය මුව පාදයට වඩා වෙනස් වන්නාක් මෙනි. අනික් සත්වයන් ගැනද එසේමය. මේ එකම තත්ව නිරූපනය අනුව මේ සතුන් නොයෙක් වර්ගවලට අයිති බැව් අපි දැන සිටිමු.

එහෙත් ක්ෂත්‍රියයකුගේ පාදය බ්‍රාහ්මණයකුගේ පාදයෙන්වත් එසේ නැතහොත් ශුද්‍රයකුගේ පාදයෙන්වත් වෙනස්වූ බවක් මම කිසිවිටෙකවත් නැසීම්.

## වස්ත්‍ර ශුභාශ.

සියලු මනුෂ්‍යයන්ගේ නිර්මාණය එකාකාරය. එහෙසින් පැහැදිලි ලෙසම එකම ජාතිහුය. තවද්‍රටත් පිරික්සමු ප්‍රජන නෙත්‍රියයෝය. පැහැය, දේහය, ගන්ධය, මුත්‍රය අශුචිය, ශබ්දය ආදි විසින් ගොනා, මීහරකා, අශවයා ඇතා, බූරුවා, වඳුරා, එලුවා, බැටලුවා වශයෙන් ඒ ඒ සත්වයන්ගේ ප්‍රභෙද පැහැදිලි අඳුනට දැනගන්නට හැකිව තිබෙන නමුත්, ඒ සියලුම ලක්ෂණ විසින් බ්‍රාහ්මණයා ක්ෂත්‍රියයාට සමානය එහෙයින් ජාති වශයෙනුදු වර්ග වශයෙනුදු ක්ෂත්‍රියයා බ්‍රාහ්මණයාට හැම අතින්ම සමානය.

## හින්දු ධර්මය හා පංචම භෙදය.

ආගමානුකූල නොවන්නාවූ කුලභේදයේ බිහිසුණු ආදීනව.

ඉන්දියාව මෙකල ඉතා වියවුල් සහිත කාලයකට මුහුණ පා සිටී. පංචමයන්යයි කියනු ලබන ලක්‍ෂ සංඛ්‍යාත ජනතාවකගේ අභිවෘද්ධිය පිණිස මහාත්මා ගාන්ධි සවකීය ජීවිතය පූදකර සිටී.

මෙතුමා ආත්ම පරිශුද්ධිය පිණිස දවස් 21 ක් මුළුල්ලේ නොනවත්වාම උපවාසය කරන්නේය. මේ උපවාසයෙන් තමාට ජය අත්වේය යනු මහාත්මා ගාන්ධිගේ කල්පනාවයි...............

ඥානවත්කම හැඟවීම පිණිස බ්‍රාහ්මණයන් හිසටද යුධ කාමිත්වය දක්වන ක්‍ෂත්‍රියන් අත්දෙකටද, වෙළඳ කටයුතු හැඟවීම පිණිස වෛශ්‍යයන් උදරයටද මහජනයාට මෙහෙකිරීම හඟවනු වස් ශුද්‍රයන් පා යුවලටද සම කර තිබේ. මෙහිදී පැනනගින ප්‍රශ්නය නම් මනුෂ්‍ය ශරීරයේ ඒ ඒ කොටස් එකම සිරුරකට අයත් අංග වශයෙන් ගිණිය යුතුද? නැද්ද? යනුයි. මේ සම්පූර්ණ ශරීරයෙන් යම්කිසි අංගයක් අඩුවූවිට සිරුර ක්‍රියාවෙහි යෙදිය හැකිද? ජීවිතයේ සමගිය සැලසීම පිණිස ඒ ඒ අංග සම්පූර්ණ වීම අවශ්‍ය දෙයක් බව මෙයින් පෙනේ.

කරුණු මෙසේ බැවින් එක් පක්‍ෂයක ජන සමූහයක් පංචමයන් කොට සලකා ඔවුන් අනික් අයගේ ගෙවලට පවා වැද්ද නොගැනීම ඒ පංචමයන්ගේ දියුණුවට සම්බාධක කාරණයක්වේ. මෙසේ එක් පක්‍ෂයකට තවත් පක්‍ෂයක් භෙදකර තැබීම ප්‍රජාපතීහුගේ අදහස නොවීය.

පුරාණ කාලයේ හින්දූන් අතර මෙබඳු ජාතිභෙද නොපැවැති බවද, මෙය මෑත කාලයේ වෙනෙන ඇතැම් අයගේ දෙශපාලනමයවූද සමාජය පිළිබඳවූද, මුදල් සම්බන්ධවූද, තත්ත්වය උසස් කර ගැනීමට ඇතිකරගෙන තිබෙන ක්‍රියා මාර්ගයන් බවද ස්ඵුට කිරීම් වශයෙන් මම කරුණු දක්වමි.

## ශංකරාචාය්‍ය්

ශංකරාචාය්‍ය්යන් හා චණ්ඩාලයෙකු පිළිබඳ උපමා කථාවේ ශ්‍රී ශංකරාචාය්‍ය් තුමා ගමන් කරන මාර්ගය චණ්ඩාලයෙකු විසින් හරස්කළ අන්දම සඳහන්වේ. මුලදී ශංකරාචාය්‍ය් තෙමේ චණ්ඩාලයාට තමාගේ මාර්ගයෙන් ඉවත්වී යන්ට අණ කළේය. නුමුත් එක් මනුෂ්‍ය ආත්මයක් අතර වෙනසක් තිබේද, යනුවෙන් චණ්ඩාලයා ප්‍රශ්න කරන්ට විය.

මේ විවාදය මඳවේලාවක් පැවතුණෙන් ශ්‍රී ශංකරාචාය්‍ය් තුමා, ඒ චණ්ඩාලයා කෙරෙහි දෙවියන්ගේ නියම ගුණ මූර්තිමත්ව තිබෙන බැව් දැක ඔහුට ආචාර කෙළේය. විෂ්ණු දෙවියන්ගේ අවතාරයක්වූ රාම රාජයා ශබ්‍රි නම් චණ්ඩාල ස්ත්‍රිය සහ ඉතුරු කළ පලතුරු කෑ බැව් රාමායණයෙහි සඳහන් ප්‍රවෘත්තියකින් පෙනේ.

## නරසිංහ මේථා.

තුන්වෙනි නිදශීනය නරසිංහ මේටා නම් ගුජරාටි කවිවරයාගේ චරිතයෙන් ලබාගත හැකිය. නාගර නම් උසස් බ්‍රාහ්මණ කුලයකට මොහු අයිතිව සිටී. නමුත් නගර ශොධකයන් හා පරයා ජාතිකයන් සමග මිශ්‍ර වෙමින් කෘෂ්ණස්තොත්‍ර ගායනා කරමින් මොහු ජීවත්වූ බව අපි දනිමු. මනුෂ්‍යයන් සතර කොටසකට බෙදීම ගුණ හා කර්ම වශයෙන් මිස, ඔවුන්ගේ උත්පත්ති වශයෙන් නොවන බව ශ්‍රී කෘෂ්ණ භගවත් ගීතයෙහි කියා තිබේ.

## පංචම ජනකාය.

මේකල ඉන්දියාවේ වෙසෙන හින්දූන්ගේ මුළුගණන විසිනුන් කෝටියකි. මෙයින් හත්කෝටියක් ශුද්‍රයෝය. නිසා වශයෙන් මොවුන්ට පංචමයන් යයි නම් කර තිබේ.

මේසා විශාල ජන සමූහයක් පහත්යයි සම්මත කොට බැහැර කිරීම යුක්ති සහගත නොවේ වැඩිය දුර දිග නොබලා මේ පන්තියේ ජනයා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කරණකොටගෙන යම් දවසක ඔවුන් සම්පූර්ණයෙන්ම හින්දු ආගමෙන් ඉවත්වෙතැයි සිතන්ට පුළුවන.

සනාතන හින්දූන් මෙන්ම මේ පංචම ජනයාද මනුෂ්‍යයෝය. ඔවුන්ට අමුතුවෙන් අං හෝ වල්ගානැත.

## රුවටිලි කාරයෝ.

පංචම කුලයට හෙළිසයුතු අය තම් පරණ මතම ගරුකරන පක්ෂ භජනයෙන් යුක්තවූ හින්දුවරුය. මොවුන් ගෙන් වැඩිදෙනා රුවටිලි කාරයෝය. ඉන්දියාවේ සමාජය පිළිබඳවූද දේශපාලනමයවූද නිදහස ලබාගැනීමට අතිශයින් බාධා කරන්නෝය.

චණ්ඩාල යන වචනය හින්දූන්ගේ ශබ්දකෝෂ-යෙහි පවත්නාතුරු ස්වරාජ්‍යය පිළිබඳ කථා නිෂ්ඵල වෙනවා ඇත.

(ඉන්දියානු ජාති හිතෛෂී එච්. ඇම්. දේසායි මහ-තාගේ කථාවේ කොටසකි. දිනමිණ 26. 5. 1933)

## හින්දු නීතියක්.

අළු, නවගුණවැල, පූනනූල, උතුරු සළුව, සහ හිස් වෙළුම, (තලප්පාව) යනාදි ගරුකටයුතු දේවල් බ්‍රාහ්මණ ක්ෂත්‍රිය, වෛශ්‍ය අනුශාසකයින් විසින් පාවිච්චි කළයුතුයි. නුමුත් ශුද්‍ර කුලයේ අනුශාසකයකුට උත්තර ශාටකය සහ තලප්පාව අයිති නැත.

(ශෛව සමය තේරි නැමැති පැරණි ද්‍රවිඩ ග්‍රන්ථ-යෙහි පළමුවෙනි පරිච්ඡේදය.)

## කෞරව වංශයේ යුවරාජ සහ කුමාර කුමාරියෝ.

### මිහිලක රාම සහ විභීෂණ රජ කාලය.

| | |
|---|---|
| සහදේව කුරුරට කුමරු | මහ භාරතය |
| කුරුරට කුමාරයා | රාවණා රාජවලිය |
| කුරුරට කුමාරිය | එම |
| කුරුරට බ්‍රාහ්මණයා | එම |
| කුරුරට සිටුවරයා | එම |
| කුරුරට සපිරිවර | එම |

### විජය රජ කාලය.

කෞරවන්ත යුව රජ
කෞරවන්ත යුව රාණී
කෞරවන්ත කුමාරයින්
කෞරවන්ත කුමාරියන්
කුරුදූවේ කුරුවත්තියා ඇමැති
කරදනපිටියේ කරාති ඇමැති
කුරුපිටියේ කුරාති ඇමැති
කරාපිටියේ කරාති ඇමැති

### පඬුවස්දෙව් රජ කාලය.

| | |
|---|---|
| කුලකෝ ඉට්ටන් රජ | ත්‍රි මංගලාව |
| වේඩර් අරශන් මල් රජ | පඬුවස් නුවර |

### දෙවෙනි පෑ තිස්ස රජ කාලය.

අණිව ශ්‍රෙෂ්ඨ සූරිය ගුප්ත කුමරු, අනුරාධපුරයේ. (කුරුකුල ආදිත්‍ය)

| | | |
|---|---|---|
| සුමිත්‍ර කුමරු | | අනුරාධපුරය |
| ධතු ශිල්පි | හේවායෝ | එම |
| ඛඩ්ගායුද | හේවායෝ | එම |
| කොන්තායුද | හේවායෝ | එම |
| තෝමරායුද | හේවායෝ | එම |
| ඵලිසායුද | හේවායෝ | එම |
| මුතුකුඩ | හේවායෝ | එම |

මෙසේ කල්යාමක් ගියකල අප බුදුන් පිරිනිවී ගිය පසු දෙසිය සත්වන වර්ෂයට පැමිණිකල නැවත ලක්දිවටූ රජ කරණ දෙවෙනි පෑතිස්ස නම් නරේන්ද්‍රයන් සමයෙහි දඹදිව ධර්මාසෝක නම් නරපතින් විසින් විපුල තෙදයෙන් සකල භය හැර අභය දෙන විජය මහ බෝධීන් වහන්සේ හා සමග ශ්‍රී ලංකාවිපයට එවන මිහිඳු කුමාරයා හා සංඝමිත්‍රාවන්ද, දෙදෙනා වහන්සේලා සඟ ධනු ශිල්ප යෙහි නියුක්ත වැදි පුත්‍රයන්ද ඛඩ්ග කොන්ත තෝමර පලිස් ආදි යුධයෙහි සපන් අයද මුතුකුඩ සේසත් චාමර මේ ආදිය අපට නිසිය අපගෙන් (කරාව කුලයෙන්) ඇතිවූ රාජ කුමාරවරු යද්දී අපට හිදිම යුතුතොංවෙයි කියා එකුන් පනසක් පමණ එහි බෝමැඩ කර්මාන්තයට ආවාහුය. ඔවුන්ට බෝමැඩ කරා ආහෙසිනුත් රාජ කුමාරවරුන් කරා ආහෙසිකුන් කරාවෝ යයි ව්‍යවහාර විය බොහෝ කොත්වත් ගම්වරදී මේ සිරිලක්හිම රැදවූහ. (මහ විහාර වංශික ශ්‍රී බුඬ රක්‍ෂිත මහ හිමිගේ පුරාණ පාළි ජනවංශය.)

**දුටුගැමුණු රජ කාලය** ක්‍රි: ව: යට 161 - 137

| | |
|---|---|
| චන්ද්‍රකුලසූරිය සෙදිගල කුමරු | පානදූරේ |
| ජයසිරි ආදිත්‍ය ජයවර්ණකුලසූර්‍ය කුමරු | මොරටුව |
| කණදරා වත්ති උත්තැභැ | කමන්කඩුව |
| කාරවත්ති වත්ති කුමාර | එම |
| පටබැඳි බිසෝවරු | අනුරාධපුරය |

**පළමුවෙනි භාතිය රජ කාලය** ක්‍රි: ව: යට 20 - 9

| | | |
|---|---|---|
| §කෝඉට්ටන් | එම | එම |

§යො. කෝ - அரசன், අරශන්, රජ, මිහිඳු,
ඉට්ටන් - ස්ථානාන්තරය, අස්ථානය,
.. කණිට්ටු තිස්ස රජ ක්‍රි: ව: 165-193 තොබෝද, ස්වර්ණමාලි චෛත්‍යයේ දකුණු වාසල් කඩ කැණීමේදී සම්භවූ පුංකලසක මේ රජුගේ නාමය කාවිට්ටන් තිස්සයයි එහි සටහන්වී තිබුනු බව පුරාවිද්‍යා දෙපාර්මේන්තුව විසින් ප්‍රකාශ කර තිබේ

| | | |
|---|---|---|
| *පෝඉට්ටින් | සේනාධිපති | අනුරාධපුරය |
| කාලිංගවරයා | එම | එම |
| ‡ඉව්වන්ඩවන් | එම | එම |
| තල්ලංඩවන් | එම | එම |
| †පැලවා | එම | එම |
| මුදවන්හේවර | එම | එම |
| වෙඩිඅරශන් | එම | අළුත් කුරුරට |
| මරවර් | එම | අනුරාධ පුරය |

කරාවේ හේවායෝ හත්කෝරළය සහ අළුත්කුරු කෝරළය.

(ඉහත සඳහන් යුධකාර වංශිකයින් අයෝත්තිපට්ටනම නොහොත් අයෝධ්‍ය පුරයෙන් පැමිණ තිබේ.)

(වන්නි රාජාවලිය, මලල බණ්ඩාරවලිය, වන්නි කථාව)

**පළමුවෙනි ගජබාහු රජ කාලය:- ක්‍රි: ව: 113-135**

සොළීරටෙන් ගෙණෙන ලද කුරුරට යුධහමුදාව - අළුත්කුරුරට (දඹුගම)

(ගජබාකථාව සහ පාඨශාලාචාර්ය ඩී. බී. රණසිංහ මහතාගේ පුරාවෘත පොත)

**දෙවෙනි උපතිස්ස රජ කාලය:- ක්‍රි: ව: 368-410**

භාරත රජුගේ ගෝත්‍රිකයින් ඇති, කෞරව ආර්‍ය සිංහලයෝ.

(වරහ මිහිර-වෘහත් සංහිතාව)

---

*පෝ, පෝරව - පුරු, පෞරව, භරත, භාරත,
ඉට්ටින් - ස්ථානාන්තරය, අස්තානය,

‡මීගමුව සහ කුරණ පළාතේ ඉව්වන්ඩවන් පරම්පරාවට අයත් කෞරවයෝ මේදක්වා සිටිති.

†පැලවා යුධ හේවා කැටියෙන් පැවතෙන්නන් අද පැලවා කැටියේ, පැලකැටිගේ නමින් සිටිති. කුරුකැටිතායෝ කුරුතැකැටිය, කුරුකැටියෝයයි, කුරුවංශික ක්ෂත්‍රියයන් සමූහයකට කුරුණෑගල විස්තාරයෙහි ලියා තිබෙන පරිදි මේ නාමයද පැලවා සෙනෙවියාගේ පරම්පරා කැටිය පිළිබඳව එසේ ව්‍යවහාරයට පත්ව තිබේ;

**දෙ පුළුසෙන් රජකාලය :**-ක්‍රි: ව: 661 – 664

| | |
|---|---|
| හාතිය තිස්ස මහබෙත්මේ කුමරු | කතරගම |
| රත්පළුබැඳි කිරිළුතතා කුමාරිහාමි | දෙවුන්දර |
| වේද විශාසර පෙරුමාල් | එම |
| කුරුකුල නාට්ටු බණ්ඩාර සාමි තෙල්ගබඩා නිලමේ | කතරගම |

**පළමුවෙනි විජයබාහු රජ කාලය:-** ක්‍රි: ව: 1065 – 1120

| | |
|---|---|
| පොන්න සන්තඩ සෙනෙවි | පානදුරේ |

**පළමුවෙනි පරාක්‍රමබාහු රජ කාලය.** ක්‍රි: ව: 1164 - 1197.

| | |
|---|---|
| *ආදිත්‍ය ද්‍රවිඩ අධිගාරි තොහොත් සූරිය තමෙල් අද්මිරාල් | පොලොන්නරුව, |
| කුරුකුල ආදිත්‍ය අප්පන් තංතුල | එම |
| කුරුකුල ආදිත්‍ය දේව තංතුල | එම |

**කීර්ති නිශ්ශංක මල්ල රජ කාලය.** ක්‍රි: ව: 1198 – 1207.

| | |
|---|---|
| කිත් පොළොන්නරු ලක් විජය සිඟු සෙනෙවි සහ කිවිඳු. | පොළොන්නරුව |

**ලීලාවතී බිසව – රජ කාලය.** ක්‍රි: ව: 1208 – 1210

‡අග්‍ර අමාත්‍ය,

| | |
|---|---|
| ලක් විජය සිඟු කිත් සෙනෙවි | පොළොන්නරුව |

---

*පරාක්‍රමබාහු රජකාලයේ සහ ඊට ප්‍රථමද පසුවද සිටි සිංහල රජුන් වෙනුවෙන් නාවික සටන්වල යෙදුනු කරාවේ මිනිසුන් සමුද්‍රය ජයගෙන බොහෝ වරප්‍රසාද ලබා තිබෙනබැව් විශ්වාසකළහැක. ඔවුන් අතර සිටින "මාලිමිගේ" "මහමරක්කලගේ" "කොඩිකාරගේ" සහ තවත් පෙළපත් නාම දරන්නන්ගෙන් ඒ බැව් ස්ඵුටවේ".

(ආණ්ඩුවේ පුරාණ ලිපි භාරකාර, ඊ. රේමර්ස් තෝම්බු-වේ ප්‍රධාන තුමාගේ ලිපිය සිලෝන්කෝසරී, සඟරාව 1933 දෙසැම්බ - පිටු 23 . 52)

‡මොහු යුඩහටයින් ලක්‍ෂයකට අධිපතිකොට මොරටුවට (මූරතිහට) යැවීය. එහිදී ඔහු ලක්‍ෂාධිපති නමින් ප්‍රසිඩවිය. ඉන්පසු ඔහු සිටි ස්ථානයටද ලක්‍ෂපතිය යන නාමය ව්‍යවහාර විය.

**දෙවෙනි පරාක්‍රමබාහු - රජ කාලය.** ක්‍රි: ව: 1250 - 1285

**බම් සූශ්‍රී - කුරුකුල සූශ්‍රී - කණ්ණී සූශ්‍රී - වික්‍රම ආදිත්‍ය සහ මුදලිවරු සිව්දෙනට බලබෝව ගම්වරය දෙවා වදාලාය.**

**මිහිඳු කුල වීරසිංහ මුදලි, ඇපාතො - ක්‍රි: ව: 1292**

**වණ්ණසූරිය මුදලි, සූරියගොඩ වලව්ව, කටුගම්පොල ක්‍රි: ව: 1292**

**ජයරාජ ජයවණ්ණ සූරිය මුදලි, ක්‍රි: ව: 1292**

**කෞරව ආදිත්‍ය කුරු අරශ තිල ඉට්ට,**
**කුමාර තමෙල්, යුවරාජයා,**

**සිව්වෙනි විජයබාහු - රජකාල.** ක්‍රි: ව: 1285 - 1287.

**ඨකුරක හෙවත් ඨකුර අම් දේව ආදිත්‍ය, සෙනෙවි සහ ජයපුර ආයශ්‍රී කුරුක්ෂත්‍රිය හේවා පිරිස. දඹදෙණිය.**

**පළමුවෙනි බුවනෙකබාහු - රජ කාලය.** ක්‍රි: ව: 1287-1298
**(දඹදෙණිය සහ යාපව්නුවර)**

**මෙසේ කලින් කලට රාජ්ජයට පැමිණෙන රජ තුමාතන් මෙම (කෞරව) වංශානුගතව පැමිණෙන සෙයින් භූවනෙකබාහු නර ශ්‍රෙෂ්ටයානන් පස අනූවක් (95) පමණ (කුරුකුලයින් නොහොත් කරාවේ හේවායින්) කාංචි පුර නුවරින් මේ ලක්දිවට ගෙන්වාගෙන මූහුදු කරදිය වලල්ල වට පරසතුරන් විසින් කරන අනතුරු වල රැකවලට ගම්වරදී ඔවුන්ට රාජ කරුණාවත් දෙවා එහි පිහිටවූහ.**

(මහ විහාර වංශානුගත ශ්‍රී බුඬරක්ෂිත මහා ස්ථවීර ස්වාමීන්ගේ පුරාණ පාලි ජනවංශය. තමන්කඩුවේ කොඩිකාරගම පංසලේ සත්ත සහිත පුරාණ පාලි ජනවංශය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් නො: P10939/OR6066 (39) පුරාණ පාලි ජනවංශය. මෙම පොත් දෙකෝ සුළු වැරදි හැර අනිකුත් විස්තර එක හා සමානයි. ඉහත සඳහන් කරුණු එයින් උපුටා ගත්තා ලදී.

**පස්වෙනි බුවනෙකබාහු - රජ කාලය.** ක්‍රි: ව: 1371-1391.
රත්පටබැඳි රාජපක්‍ෂ රාජකරුණා දෙත්මල්ල වත්ති බණ්ඩාර
එම රාජකරුණා රත්රත් කුමාරසිංහ වත්ති බණ්ඩාර
එම ශ්‍රී වික්‍රම බණ්ඩාර.
එම රත්රත් ඉරුගල් වත්ති බණ්ඩාර
එම සිසිර ගුත සෝහත සෙතරත් වත්ති මුදියන්සේ
එම සෝමසිංහ කුමාර වත්ති මුදියන්සේ
ගම්පොල හටනපිටියේ එදිරිසූරිය මුදියන්සේ
(මොහු පසුව සීතා කෝරලේ කලගෙඩිහේනේ පදිංචිවිය)
**අලකේශ්වර යුව රාජයා - කෝට්ටේ.** ක්‍රි: ව: 1390
*වරුෂ විපුල සත්තඩ පෙරුමාල් මහලේනා
‡මුතුතංත්‍රි තිලමේ

| | |
|---|---|
| මහින්ද කුරු | දඹදෙණිය සහ යාපහුව |
| සුබතොාය කුරු | එම |
| වසන්ත කුරුය | එම |
| තන්ද කුරුය | එම |
| ගජ කුරුය | එම |
| පුසදන්ද කුරුය | එම |
| උසබ්බ කුරුය | එම |

**පස්වෙනි විජයබාහු - රජ කාලය.** ක්‍රි: ව: 1332 - 1344
කෞරව ආදිත්‍ය අරශ තිල ඉට්ට ඉලනාග§
**හයවෙනි පරාක්‍රමබාහු - රජකාලය.** ක්‍රි: ව: 1415-1467
කුරුවේන්ද්‍ර වෙඩි අරශ තවරත්නා, රණසිංහ
සූයඹී වච්ච නාච්චු දේවරීර්, යුවරාජ කෝට්ටේ
එදිරි මුණසිංහ රත්නමූඩි කාන්ත කුරුකුල-
වච්ච නාච්චු දේවරීර්, අධිශාරි අච්චන්කුලම

---

*මොහු, ද සොයිසා පරපුරේ මූලිකයාය.
‡මොහු, මොරටුවේ ශ්‍රී චන්ද්‍රසේකර පවුලේ මූලිකයාය.
§ඉල නාග:-
ඉලම් - ලංකාව, නාගම් - නාගයා
"ලංකානාග" යන අර්ථයයි. මීගමුවේ සහ තවත් ගම්වල කරාව කුලයට අයත් පරපුරකට ඉල නයිදේගේ යන පෙලපත් නාමය ව්‍යවහාරවේ.

○කුරුකුල වච්ච නාට්ටු දේවරීර්, කාංචිපුර සෙනෙවි- කොච්චිරට සෙනෙවි)
කුරුකුල නාට්ටු දේවරීර්, කුරුරට සෙනෙවි
මානික්ක තලෙයි වේන්දර් (මිණිකිරුළු රජ) කාවේරිපට්ටනම
කෞරව ආදිත්‍ය අරශ තිල ඉට්ට මහනාග
සිංහ සූඝ්‍ය දේවරීර්
අධි අරශ අඩප්පනාර්, නාවික සෙනෙවි අඩප්පරගම
වණ්සූඝ්‍ය දෙඹරනැද අඩප්ප උන්නැහැ සෙනෙවි එම
කුරුකුලසූරිය මුදියන්සේ කුරුකුලාව
‡පරද කුලසූරිය මුදියන්සේ (බරත කුලසූරිය) මීගමුව
අරශ කුලසූරිය මුදියන්සේ ආනබලොන්දව
අරශතිල ඉට්ටන් මුදියන්සේ මුන්නේස්සරම
අග්‍ර පුරෝහිත වෙංගඩත්තුවාරන් පාරදර් (භාරත)
සරස්වති තේණුවරප් පෙරුමාල් පාරදර් (භාරත)
අවධානිත් පාරදර් (භාරත)
බෞඩාගම චක්‍රවර්තින් පාරදර් (භාරත)
ආනන්ද හට්ට වෙංගඩත්තුවාරන් පාරදර් (භාරත)
විජයගප් පෙරුමාළුන් පාරදර් (භාරත)
සෙන්නා බජ්ජළුන් පාරදර් (භාරත)
||මුණිවිර වික්‍රමසූරිය, මහබෙත්මෙ කතරගම
තිලවිර වණ්සූරිය දෙවුන්දර
අභයසිංහ වික්‍රමසූරිය, මහබේත්මේ කතරගම දෙවොල
සිංහසූඝ්‍ය කුරුකුල නාට්ටු දේවරීත් ගබඩා තිලමේ එම
**නවවෙනි ධර්ම පරාක්‍රමබාහු රජකාලය.** ක්‍රි: ව: 1509 – 1529
*කුරුකුලසූරිය වර්ණමාන මුදලි
*මණුකුලසූරිය දේවරීර්

---

○කුරුකුල වච්ච නාට්ටු දේවරීර්, – සර් ජේම්ස් පීරිස් තුමාගේ මුත්තනුවෝ.

‡පරතකුලසූරිය නොහොත් බරතකුලසූරිය

||මොහුගෙන් පැවතෙන්නන්, දොන් ලුවිස් ද සිල්වා අභයසිංහ වික්‍රමසූරිය, දොන් අන්ද්‍රිස් ද සිල්වා අභයසිංහ වික්‍රමසූරිය, සහ දොන් අදිරියන් ද සිල්වා අභයසිංහ වික්‍රමසූරිය, මුහන්දිරම් යනාදීහු කතරගම දේවාලයේ මහබෙත්මේ තිලය දරුවෝ වෙති. මාතර ඇන්. ඒ. වික්‍රමසූරිය පත්තුවේ මුදලි තුමාද මෙයින් කෙනෙකි.

*මේ දෙදෙනා කුරුකුල නාට්ටු සිංහසූඝ්‍ය දේව ප්‍රතිරාජගේ මුනුබුරෝ වෙති.

සේනා සම්පත් අරශකුලසූරිය

**හයවෙනි විජයබාහු රජකාලය.** ක්‍රි: ව: 1509 – 1534

ජාපතේ මහ පටබැන්ද රාජාවලිය. 80ට

මොහු බුවනෙකබාහු, මායාදුන්නේ, රයිගම්බණ්ඩාර යන රජදරුවන්ගේ ප්‍රාණ ආරක්‍ෂා කර කාලයක්ම ඔහුගේ වලව්වේ තතර කරවාගත සංත්තු සප්පායම් කෙළේය. පසුව කෝට්ටේ රජකම ලබා ගැනීම් පිණිස ඔවුන් තමාගේම යාත්‍රාවකින් මීගමුවේ බොරලැස්සට ගොඩබස්සවා කෝට්ටේට පිටත්කර හරින ලදී. මොහුගේ නාමය වණ්කුලසූරිය ග්‍රාම තලවර් පට්ටන් කට්ටියාර්ය

**හත්වෙනි බුවනෙකබාහු රජකාලය.** ක්‍රි: ව: 1534-1551.

†කුරුකුල නාට්ටු බණ්ඩාර සාමි (දෙවෙනි) ක්‍රි: ව: 1543

නාත්තන්ඩිගේ අපොන්සු තයිදේ ‖භාරතිපති බොරලැස්ස

**දොන් ජුවන් ධර්මපාල පෙරිය බණ්ඩාර – රජ කාලය**

ක්‍රි: ව: 1551 – 1563

රත්කොද්දිවල ආදිත්‍ය බණ්ඩාර (සූරිය බණ්ඩාර)

මහවත්ත තිහගම, මොරටුව

ₒදොන් ප්‍රනාන්දු සමරකෝන් රාළ මහ සේනාධිපති

කොළඹ, මාතර, ගෝව,

---

†කොළඹ මෝදර මට්ටක්කුලියේ වාසල වලව්වේ වැසි කොලොම්තොට සේනාපති, සර් පිලිප් රූද්‍රිගු මුදලි සහ චවලියර් සිටුතුමා වනාහී මොහුගෙන් පැවතෙන්නෝය

‖භාරති (බාරති) නැව මාලුම් මාලිම් කප්පල් යන අර්ථයි.

ₒපෘතුගීසි ආණ්ඩුවෙන් සමරකෝන් ප්‍රනාන්දු හට ඕඩර් ඔෆ් ක්‍රයිස්ට්. (Order of Christ) යන ශුද්ධෝපාදියද, ඩෝස් පත්සියයක අංදායමක් ලැබෙන ගම්ක්ද සමරකෝන් හට ප්‍රදානය කෙළේය.

ගතවූ අවුරුදු සාරසියය තුල යුරෝපීය ආණ්ඩුවකින් මේතරම් උසස් නිලයකට පත්වූ ප්‍රථම ආසියාතිකයා ලෙස සමරකෝන් (ප්‍රනාන්දු) රාල ගිනිය හැකිවේ.

දොන් මානුවෙල් මුදියන්සේ සහ දොන් හැන්රික් සමරකෝන් රාලගේ මස්සිනාවරුය. දොන් දියෝ – ගෝතමින් ඔහුගේ සොහොයුරෙක් බව්තීස්ම විය ගාල්ලේ පෘතුගීසි කොටුව බඳනා ලද්දේ මොහුගේ උපදෙස්පිටය. (ඉතිහාස අංශයෙනි)

සිමන් කුරේ රාළ තොහොත් සසිමත් කොරයා
පට්ටන් කච්චි, නසිදෙ අප්පු මුදලි හලාවත
තකුර අච්දේව ආදිත්‍ය පේද්‍රුරු ද සිල්වා මහසෙනෙවි
හංවැල්ල සහ මොරටුව
තකුර අච්දේව ආදිත්‍ය මනුවෙල් ද සිල්වා එම
සීතාවක රාජසිංහ – රජ කාලය. ක්‍රි: ව:
හේනක මුදියන්සේ පඬිවිට වෙළ. මාතලේ
පළමුවෙනි විමලධර්ම සූරිය රජකාලය – ක්‍රි: ව: 1592–1604
වණීකුල ආදිත්‍ය අරගතිල ඉට්ට දෙන්,
මැනුවෙල් දියස් අඳරාදි විජයරත්න. මහඅධිකාරම
මාදම්පේ අන්තෝනියෝ බැරත්තු මංතර මංත්‍රි.
කච්චකුලමේ කුමාරවන්නි උන්නැහැ කච්චකුලම
සෙනරත් රජ කාලය – ක්‍රි: ව: 1604–1634.
§පත්තිනිගේ වීරසූරිය නිකපිටියෙ බණ්ඩාර පරණකුරුරට
මාදම්පේ අන්තෝනියෝ බැරැත්තු උඃවේකුමාරයා. උඩරට
යුවරජ, කුරුවිට මන්ත්‍රි, මාතොට මහ මන්ත්‍රි
දෙන් කොස්මෝ මුදලි. මීගමුව සහ කටුගහ.
මාදම්පේ පේද්‍රුරු බැරැත්තු, උඩරට රාජධානියේ නාවික
යුද්බල ඇණියේ මහනායක අද්මිරාල් (1606/1612)
වන්දිගේ නසිහාමි උප අද්මිරාල් මහනුවර
සන්දරප්පුස. "මහනුවර" නැමැති යුධනැවේ කප්පිත්ත
කිස්තෙනාය. "ඕලන්ද" එම
කිංගප්පේය. "මීගමුව" එම
ඕර්දියාය. "සම්පත" එම
මාරසිංහ. "වාසනාව" එම
සංදරප්පු. "විශ්වාසය" එම

ඉහත සඳහන් සමුද්‍ර ජයගත් කරාවකුල නාවික නිලධාරීන් සහ යුධනැව් සියල්ලද උඩරට රාජධානියට අයිතිය.

(A deseviption of Ceylon, by Revd: Phillip Baldaeus in Churchills Voyuges & Travels)
නැමැති ඉංග්‍රීසි ඉතිහාස පොතෙන් උපුටාගත්තාලදී.

---

§මෙම නිකපිටියේ බණ්ඩාර පෘතුගීසීන්ට විරුඩව ඇරඹු කැරැල්ල පිළිබඳ විස්තර පසුභාගයේ පළවේ.

# යාපනේ ආසජී චක්‍රවර්ති මහරජුගේ යුධ නෞකා බල මණ්ඩලය.

"The great navy of the Arya-Chakkrawarti would have been collected at this safe anchorage, as they were manned and officered by men of the **KARAWA** community.

(Ancient Jaffna, by Mudliyar, C. Rasanayagam O. C. S. P. 211, 212)

භාවය:-

"ආයජී චක්‍රවර්තිගේ (යාපනේ රජුගේ) **මහා යුධ නාවික බල මණ්ඩලය කාරාවේ මිනිසුන්** විසින් හසුරුවන **ලද** බැවින් **ඔවුන්ම නිලධාරීන් කොට** සිටි සෙයින්ද මේ ප්‍රවේසම් සහිත නැන්ගුරම් ලෑවීම කරගනු ලැබීමට එක්කාසු කරගත්ට සෙදුනා ඇත."

(ලංකා සිවිල්, තිලධාරි සී. රාසනායගම් මුදලි තුමාගේ "අතීත යාපනය" නැමැති ඉංග්‍රීසි ඉතිහාසය පිටු 211, 212)

යාපනේ රජවරුන්ගේ මුහුදු යුධ නාවික පිරිස් බලයද, පාබලයුධ හමුදාවන්ද, උස් පහත් නිලධාරි මණ්ඩලයන්ද සියල් ලන්ම පාගේ **කාරාව** ගෝත්‍රිකයින්ගෙන් පිරී පැවතුන බැවි යාපනේ රාජධානිය පිළිබඳ ඉතිහාස පොත්වලින් බොහෝ දුරට අනාවරණය වී තිබේ.

**දෙවෙනි රාජසිංහ රජ කාලය.** ක්‍රි: ව: 1634 – 1684

1 වර්ණකුලසූරිය වැල්ලක්කෝ මුදියන්සේ
මාතලේ මහ දිසාපති. මඩබැද්දෙ වලව්ව, මාතලේ

2 අමරාපති කුරුකුලසූරිය මුදියන්සේ. — මීගමුවේ මහ විධියේ අඹතවලව්ව. අඹත මාතලේ

3 වර්ණකුරුකුලසූරිය අධි අරශ මෙත්තිසිංහ අරශන්, තිළ ඉව්ට කුරුකුලත්තිල් මහ මුදියන්සේ සහ මහ අධිකාරම
රජවාසල. මහනුවර

4 වෙත්තසිංහ අධි අරශන් බරත කුලසූරිය මහ ගොරෙත්-දේරු මහ මුදියන්සේ සහ මහ අධිකාරම.
රජවාසල, මහනුවර

5 වර්ණකුලසූරිය මීගමුවේ වැල්ලේ වීදියේ මුදියන්සේ
ඇලගමුව. මාතලේ
6 වර්ණකුලසූරිය මීගමුවේ මුදියන්සේ සහ පිරිස
පඬිවිට වෙල, මාතලේ
7 වර්ණකුලසූරිය ඉල තයිදේ මුහන්දිරම
පඬිවිට, හුලංගමුව. මාතලේ
8 හුලංගමුවේ කළු අඩප්ප උන්නැහැ බතාවියට ගිය
රාජසිංහ රාජ දූතයා, හුලංගමුව, මාතලේ
9 අමරාපති කුරුකුලසූරිය දෙන් ජාන් ද කෝස්තා
අඹන්වෙල රාළ, රාජසිංහ රජුගේ ඔත්තුකාරයා
රජමාළිගාව. මහනුවර
10 මහ වීදියේ අමරාල් මුදියන්සේ මීගමුව
11 සිංහප්පා කුමාරසිංහ මුදියන්සේ වත්තිය සහ ඒරියාව
12 චන්ද්‍රසේකර යසකීර්ති වත්ති බණ්ඩාර මුදියන්සේ වත්තිය
13 කළිඟුහාමි මුදියන්සේ ලක්ෂපතිය, මොරටුව
14 කොඩිප්පිලි අප්පුසාමි මුහන්දිරම මිරිස්ස
15 ගුරුනාත අප්පුසාමි මුහන්දිරම වැලිගම
16 දෙන් පිලිප් කසිලාන පට්ටන් කට්ටි වත්තියේ
ප්‍රභූ කුමාරයා කොළිවිල
17 සිරිමල්හාමි මුදියන්සේ මීගමුව සහ බෙන්තර
18 කුමරප්පේරු මුදියන්සේ මීගමුව
19 අධිකාරි මුදියන්සේ මීගමුව
20 ගජනායක මුදියන්සේ මීගමුව
21 ඒකනායක මුදියන්සේ මීගමුව
22 කුරුකුලත්තේරු මුදියන්සේ මීගමුව
23 සෙනරත් මුදියන්සේ මීගමුව
24 වර්ණකුලසූරිය මුදියන්සේ මහවීදිය, මීගමුව
25 බාලසූරිය මුදියන්සේ මීගමුව
26 වර්ණකුලසූරිය ඉල තයිදේ හෙවත් ඉල නාග,
රාජසිංහ රජු විසින් කළුතර තොටමුනේ මුහන්දිරම්
පදවියට පත්කරණ ලදී. (ක්‍රි: ව· 1639)
27 පරණ කුරුරට අලුදෙණියේ මේසසූරිය කිවිඳු

**රාජාධි රාජසිංහ රජ කාලය.** ක්‍රි: ව: 1780 – 1798

| | | |
|---|---|---|
| අරශ කුලසේකර මුදියන්සේ (ක්‍රි: ව: 1785) | | කතම්පැල්ල |
| කුරුකුලසූරිය සමරතුංග මුහන්දිරම් | | කතම්පැල්ල |
| කුකුලුකොටුවේ රාළ | | කුකුලුකොටුව |
| වර්ණකුලසූරිය මතවාල රාළ, | ඔතුවෙල | කුරුණෑගල |

## කුරුකුලත් නන් වර්ණසූරිය මහ අරමුදලේ වන්නකු නිලමේ.

මේ තෙම වර්ණකුල ආදිත්‍ය ජයසේකර වර්ණනාම කුරුකුලසූරිය පරපුරට අයත් "වණ්නකු තිලමේ" නොහොත් "වණ්නකුවත්තේ" යන පරම්පරාවේ ආරම්භකරුය.

වණ්නකු යනු බස්නායක, බස්නැක බන්නැක යන්-නෙන් සැදුනු නාමයක් යයි කියති. මේ නාමය කෝට්ටේ එම්පරදෝරු රජුන් විසින් මොහුට දෙවාවදාළ භූමිප්‍රදේශයකටද "වණ්නකු වත්ත" යයි මේ දක්වා ව්‍යවහාරයට පැමිණ තිබේ. ඔහු නවවෙනි පරාක්‍රමබාහු කෝට්ටේ රජදවස, දේවාල අරමුදලේ බස්නායක ස්ථානාන්තරයද, දෙවිනුවර, බඹරැන්ද සහ කෝට්ටගොඩ පිහිටි දේවාල වලට අයත් ඉඩකඩම්වල අරමුදලේ ලේකම් ධුරයද ලබා සිටි කෙනෙකි.

පසු කාලයකදී මෙම "වණ්නකු තිලමේ" "වර්ණ-කුලසූරිය කාරෙයි යූජ් අවර්ගල්" යන නමින් මහපනිරාජ නම් ප්‍රදේශයට අයත් ගල්කිස්ස, තොටමුණේ සිට පානදුරේ තොටමුණ දක්වා මුහුදුබඩ පළාත ආරක්ෂකයා වශයෙන් රජුට මෙහෙ කෙළේය. මේ කොටස මොරටු වැල්ලට දකුණෙන් පානදුරා මෝය දක්වා පැතිර ඇත්තේය.

ඒ කාලයේ ඔහුගේ ස්ථානාන්තරය හේතුකොට-ගෙන ප්‍රසිඩියට පත් "වණ්නකු වත්තේ" නැමැති ස්ථානයේ ඔහුගේ පදිංචිය ඇතුව සිටියේය. ඒ කොටස දැනට කොරලවැල්ල, කටුකුරුන්ද සහ එගොඩ උයන යන ග්‍රාමයන් ඇතුලත්ව ඇත්තේය මේ කොටසට සාමාන්‍යයෙන් මොරටු දික්වැල්ල කියාද කියා තිබේ.

ක්‍රි: ව: 1402 දී ගම්පොළ ගංගා සිරිපුර දෙවෙනි වීරපරාක්‍රම රජුන් දවස මහ අධිකාරම් ධූරය දරූ කුරුගම අධිවාස කුරුවර අභිජාත අමරදිවාකර වික්‍රමසිංහ රාජපක්‍ෂ මහ නම්බුකාර අග්‍රකෝන් මහ නිලමේගේ පුත්‍රයා වන විලේගොඩ වික්‍රමසිංහ රාජපක්‍ෂ මුදියන්සේගේ මිණිබිරියක් වන පුංචි මැණිකේ කුමාරිහාමිව මෙම වර්ණකුලසූරිය කරෙයිසූර් අවර්ගල් නැමැති කෞරවාධිපතියා විසින් ආවාහ කරගන්නා ලදී.

මේතෙම මොරටුවේ වන්දනාකරුවන් සමූහයකට ප්‍රධානව දඹදිව බුද්ධගයාවට ගොස් වැඳපුදාගෙන එන ගමනේදී ශ්‍රීමහා බෝධින් වහන්සේගේ අංකුරයක්ද වැඩම්වාගෙනවිත් කොරළවැල්ලේ ග්‍රාමයේ රෝපණය කෙළේය. එහි එවකට ගොඩනගන ලද විහාරස්ථානයට දැනට පුරාණ විහාරය යයි ව්‍යවහාරව පවතී.

මොහුගේ බාලම පුත්‍ර වණ්නකුරාළ සිය පියාගේ උරුමය ලබා ක්‍රි: ව: 1528 සිටි දෙවෙනි විජයබාහු රජුගේ රාජකීය යුධ හමුදාවේ පඬිකාර ලේකම් වශයෙන් රාජකාර්‍ය්‍යයෙහි යෙදී සිටියේය.

කතරගම දේවාලේ තිලදූරු මහ බෙත්මේගේ තුන්වෙනි පරම්පරාවට අයත් කුරුකුල තාට්ටු බණ්ඩාර සාමිගේ දියණි කෙනෙකු වන ලීලාවතී කුමරිය මොහු විසින් විවාහ කරගන්නා ලදී.

මෙම වණ්නකුරාළ වඩු කර්මාන්තයෙහි දක්‍ෂයෙකුව සිටියෙන් දෙවෙනි බුවනෙකබාහු රජුට අතගි සිංහාසනයක්ද තනා ඔප්පු දුන්නේය.

ක්‍රි: ව: 1534 දී මොහුට රාජ සම්මාන වශයෙන් තුන්රියවල ඉරවැල්ලේ කුඹුරුයාය දෙවා වදාරණ ලදී. මෙය මේ දක්වා එම පරපුරට අයිතිව තිබේ.

**කෝට්ටේ රාජධානි කාලයේ සිටි කුරුකුල ප්‍රභූවරු.**

1 අන්දර වාස් පටබැඳි රාළ
2 නීරමුල්ලේ පළිහවඩන පෙරුමාල් ආරච්චි
3 *ජයසින්දු පළිහවඩන රාළ, තුන්කෝරළය, වහකෝට්ටේ
4 පට්චන් පෙරුම ආරච්චි
5 තේවර තංත්‍රි ආදිත්‍ය ජයසේකර, තංගල්ල
6 කුරුකුල තත්වර්ණ කුලසූරිය බස්නායක නිලමේ
7 වීර සන්නඩ වීරබල ජයසූර්‍ය අවිදේව ගුණරත්න
කුරු උතුම් පාල පටබැඳි රාළ.
8 වර්ණකුලසූරිය අඩප්ප උන්නැහැ දඹදෙණිය
9 මහමරක්කල කුරුකුලසූරිය අවිදේව ජයසූරිය
කුරු උතුම් පාල පටබැඳි රාළ,
10 චන්දිරම් උඩයාර් තමන්කඩුව
වර්ණකුලසූරිය කතප්පතාර් මඩකලපුව

කෞරව වංශයේ වන්නි උන්නැහලා

||තවරත්න සිංහ රාජ වන්නි උන්නැහැ
කුරුකුලත් අරශත් සූර්‍ය වන්නි උන්නැහැ
පාලත් වන්නි උන්නැහැ
කුමරප්පෙරුමාල් වන්නි උන්නැහැ
සූරිය වන්නි උන්නැහැ
මන්නම් වන්නි උන්නැහැ

---

*දූතට අල්මේදා (Avabroist Almeida) නමින් මොරටුව පයාගල සහ වහකෝට්ටේ සිටිති. සමහර දෙනෙක් විපුල ගුනරත්න ජයසිඳු පළිහවඩන නානායක්කාර පල්ලියේ රාළලාගේ දෙන් අල්මේදා කතකරත්න අප්පුහාමිලා යයි ප්‍රසිඩව සිටිති.

||වන්නි තනතුර වනාහී මේ කාලයේ දිසාපතී (Government Agent) තනතුර වැනි උසස් නිලයකි. අද දක්වා ව්‍යවහාර වන වන්නීය, වන්නි හත්පත්තුව, රාජ වන්නි පත්තුව, කුමාර වන්නි පත්තුව, (ප්‍රදේශ) නාම මේ කුමරු වන්ගේද ඔවුන්ට ලැබුනු නිලයේද නම් ස්මරණකොට ගෙන ඇතිවී තිබේ. [පුරාවෘත්ත 118 පිටුව]

කඩුපිටි මාදම්පේ අයියන් පුල්ලේ වන්නි උන්නැහැ
අරශ නිල ඉවිටන් කුරුකුලසූරිය වන්නියාර් මුදලි
වණ්කුලසූරිය වන්නියාර් මුදලි
නාවක්කඩුවේ රාජ වන්නි උන්නැහේ
කට්ටකඩුවේ කුමාර වන්නි උන්නැහැ

[වන්නි රාජවලිය චන්ද්‍රකුල මාලාව සහ තවත් පැරණි වන්නි විත්ති යත ලියවිලි ආශ්‍රයෙනි]

**යාපනේ කුරුකුල මුදලිවරු**

දෙන්, ඇස්. ඩි. ආර්. කුරුකුල නාච්චු දේවන් අධිගාර්, මාන්තෝට්ටම්
ව්‍යවස්ථාදයක මංත්‍රි. ජේ. සී. තිස්ස වීරසිංහ මුදලි
කුරුකුලසූරිය අගොස්තිනු මුදලි
කුරුකුලසිංහ මුදලි
බුවිමාන සිංහ පට්ටන් කට්ටි මුදලි
එදිරිමානසිංහ පටබැඳි මුදියන්සේ
එදිරිවීරසිංහ මුදලි
වර්ණකුලසිංහ මුදලි
සතුරුකුලසිංහ පටබැඳි මුදියන්සේ
ක්ෂත්‍රිය කුලසිංහ පටබැඳි මුදියන්සේ

[සිලෝන් මෝනිං ලීඩර් ඉංග්‍රීසි පුවත් පත 15. 8. 1932.]

**බ්‍රිතාන්‍ය ආණ්ඩු කාලය.**

ක්‍රි: ව: 1797 – 1815. ජෙද්‍රික් නෝර්ත් ආණ්ඩුකාර තුමාගේ **මහ ලේකම් ධුරයට පත්කරගෙන සිටියේ ලංකාවේ ප්‍රධාන කුල දෙකෙන් එකක්වූ කරාව** කුලයෙහි ප්‍රධානයෙකි.

(**කවුන්ට් ජෝර්ජ්** වැලැන්ෂියා කුමරුගේ ලංකා විසිත්-තේරුව 1802–1806 නැමැති ඉංග්‍රීසි පොත. I කාණ්ඩ පිටුව 303)

(Voyages & travels to India, Ceylon, Red sea, Abyssenia & Egypt in 1802, 1803, 1804, 1805, 1806, By Count George Valantia. 1Vol. P 303 Frinted by William Miller London 1809)

මිහිඳු කුලසූරිය සිල්වෙස්ටර් පෙරේරා අරශකුල විජයසූරිය තිලකරත්න තැමැති කෞරවාධිපතියා එතාගී ඉංග්‍රීසි ආණ්ඩුව ආරම්භ කාලයේ ඉංග්‍රීසි යුධ හමුදාවේ මෙහෙකළ සෙයින් ඔහුගේ දක්ෂ, පක්ෂභාවය කරණකොට ගෙන ක්‍රි: ව: 1815 අගෝස්තු 23 වෙනි දින වංශාධිපතී ශ්‍රීමත් සර් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාර තුමා විසින් ඔහුව මුහන්දිරම් තනතුරට පත්කර සන්නාසය පළදවන ලද්දේය.

මෙසේ විශ්වාසදායක අන්දමට තම රාජකාරිය යුතු අන්දමින් කරගෙන එන අතර ඔහුව බස්නාහිර පළාතේ ප්‍රධාන මුදලි ධුරයකටද පත් කරණු ලැබ වර්ෂ 1858 දක්වා රාජකාර්‍යයෙහි යෙදී සිටියේය.

එසේම බ්‍රිතාන්‍ය යුධ හමුදාවේ මූලින් සේවය කළ කළුතර තොටමුණේ මුදලි තැන්පත් ජොහානස්ද පොන්-සේකාටද, දෙන් මෛකල් ද පොන්සේකා අධිකාරමගේ මුණුපුරෙකුටද ක්‍රි: ව: 1819 නොවැම්බ 21 වෙනි දිනදී වංශාධිපති සර් රොබට් බ්‍රවුන්රිග් උතුමානන් විසින් රන් පදක්කම් පළදවන ලද්දේය,

(මොරටුවේ ආචාර්‍ය, ජේ. ඇස්. ඒ. ප්‍රනාන්දු මහතාගේ ඉංග්‍රීසි ලිපියකිනි)

**කුරුකුල විමුලර් මුදලිවරු සහ වාසල මුදලිවරු**

ජුවානිස් ද සිල්වා ජයසිංහ මුදලි මොරටුව
අන්ද්‍රිරිස් පෙරේරා අභය - කරුණාරත්න දිශානායක මුදලි පානදුරේ
මුතුතංත්‍රිගේ සීමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර වාසල මුදලි හොරේතුඩුව
එච්. ඇස්. ද පොන්සේකා මුදලි කොළඹ
ඒ. ඩබ්ලිව්. තාද්දියස් ජයසූරිය මුදලි මාතර
රොමානිස් පීරිස් වර්ණකුලසූරිය ගුණවර්ධන මුදලි ගොරකපොල
සයිමන් පෙරේරා ගුනවර්ධන මුදලි ගාල්ල

## කරාවේ විටුලර් මුහන්දිරම්වරු

ජොහානස් මැන්දිස් ජයවර්ධන මනුකුලසූරිය
විජයරත්න රජවාසල මුහන්දිරම් (1867) මොරටුව
ජෝශප් ප්‍රනාන්දු සේනාරත්න මුහන්දිරම් මොරටුව
අබරන් වර්ණකුලසූරිය පටබැඳි මුහන්දිරම් ගම්පළ
වෙලුන් ප්‍රනාන්දු සෙනෙවිරත්න මුහන්දිරම් කදිරාන
ඇලෙක්සන්ඩර් මැන්දිස් ජයවර්ධන මුහන්දිරම් මොරටුව
දනියල් කොතන් ප්‍රනාන්දු ජයවර්ධන මුහන්දිරම් මග්ගොන
ඩේවිඩ් ඇස්. පීරිස් වර්ණකුලසූරිය මුහන්දිරම් පානදුරේ
ඇඩ්වඩ් පීරිස් මුහන්දිරම් කොළඹ
අයිසෙක් රොද්‍රිගු ජයවර්ධන සමරසිංහ මුහන්දිරම් පානදුරේ

## කුරුවංශික වෙනත් මුදලිවරු.

මහ මරක්කල කුරුකුලසූරිය අන්තෝනි පෙරේරා
ජයසිංහ අභය - ගුණතිලක වික්‍රමසූරිය
කරුණාරත්න. කොළඹ උසාවියේ තෝල්ක මුදලි
ජෙනෝරිස්ද සොයිසා විජයසුන්දර ජයවර්දන
කොළඹ ෂරොප් මුදලි
වත්තකු වත්තේ දෙන් පෙට්රස් පෙරේරා විජේකුල
සෙනෙවිරත්න පටබැඳි මුදියන්සේ මෝදර, කොළඹ
ඇස්, ඇම්. ප්‍රනාන්දු කච්චේරි මුදලි කුරුණෑගල
කුරුකුලසූරිය සිල්වෙස්ටර් පෙරේරා තෝල්කමුදලි
හම්බන්තොට
ඒ. ජයවික්‍රම ෂරොප් මුදලි ගාල්ල
වෛටස්. ඒ. පීරිස් කච්චේරි මුදලි කළුතර

## බ්‍රිතාන්‍ය ආණ්ඩු කාලය.

## (කරාව කුලයේ කෝරලේ සහ පත්තුවේ මුදලිවරු)

ක්‍රි: ව: 1797 ප්‍රැන්සිස්කෝද පොන්සේකා පටබැඳි මුදියන්සේ
,, ,, 1797 කළුතර තොටමුණ
,, ,, 1797 බී පේද්‍රුරු මැත්ඩිස් ගුනතිලක සෙනෙවිරත්න
පටබැඳි මුදියන්සේ මොරටුව
,, ,, 1815 ජොහානස් ප්‍රනාන්දු මිහිඳු කුලසූරිය
වීරසිංහ මුදලි මීගමුව

ක්‍රි: ව: 1815 කොස්තන්තිනු පෙරේරා වීරසූරිය
තානාපති මුදලි ගාල්ල

,, ,, 1815 අරශකුල විජේසූරිය සිල්වෙස්ටර්
පෙරේරා තිලකරත්න මුදලි කොළඹ

,, ,, 1827 තෝමස්ද අන්දරාදි මුදලි කොළඹ

,, ,, 1827 කොර්නේලිස් ද. සා. අබේසේකර වැල්ල
බඩපත්තුවේ මුදලි ගන්දර

,, ,, 1819 ජොහනස් ද පොන්සේකා මුදලි කළුතර

,, ,, 1835 මනුවෙල් ද පොන්සේකා විජයතුංග සමරනායක
මුදලි කළුතර, පානදුර, තොටමුණ

,, ,, 1837 කුරුකුලසූරිය අප්පත් තංත්‍රිගේ ඇලක්සන්ඩර්
අබේසිංහ ධර්මරත්න මුදලි ගල්කිස්ස, මොරටුව
පානදුරේ

,, ,, 1837 වර්ණකුල ආදිත්‍ය ප්‍රැන්සිස්කෝ ලෝව්
උතුරු පිටිගල් කෝරළයේ මුදියන්සේ

,, ,, 1837 වර්ණකුල ආදිත්‍ය අරශ නිල ඉට්ට දෙන්
තෝමස් අන්දරාදි ශ්‍රෙවැට්ස් මුදලි

සෙලෙස්තිනු පොන්සේකා මුදලි කළුතර, තොටමුණ

වර්ණකුල ආදිත්‍ය අරශ නිල ඉට්ට ඇම්බ්‍රෝසියස් ද
රෝවල් මුදලි පිටිගල් කෝරළේ දකුණ

වර්ණකුල ආදිත්‍ය අරශ නිල ඉට්ට අන්තෝනිස් ද
රෝවල් මුදලි පිටිගල් කෝරළේ උතුර

වීරසූරිය ජයතිලක ලස්ක්‍රිඤ්ඤ හමුදාවේ පළමුවෙනි මුදලි

වර්ණකුල ආදිත්‍ය අල්විනු ලෝව් මුදලි දකුණු පිටිගල්
කෝරළය

කුරුකුලසූරිය ගේබ්‍රියල් ප්‍රනාන්දු කීර්තිසිංහ
අළුත්කුරු කෝරළේ මුදලි

පඹිවිට රටේමහත්මයා පඹිවිට මාතලේ

ක්‍රිස්තියන් ද සිල්වා ජයසූරිය මුදලි මාගම්පත්තුව

ජේ. කේ. ඇප්. කුරුකුලසූරිය කීර්තිසිංහ මුදලි
පුත්තලම් පත්තුව

කේ. වීරරත්න මුදලි මාතර

වර්ණකුලසූරිය විජේරත්න පේදුරු ප්‍රනාන්දු
ග්‍රෙවැට්ස් මුදලි කොළඹ
ඩු සුසෙව් ප්‍රනාන්ද මුදලි කොළඹ
අභයසිංහ ගුණවර්ධන මුදලි ගිරුවාපත්තුව
සී. ජයවික්‍රම මුදලි මාගම්පත්තුව
කේ. රොබට් ලුවිස් ගුනවර්ධන මුදලි අම්බලන්ගොඩ
ඇම්. ජෝශප් මැන්දිස් අරශකුලසූරිය විජයරත්න මුදලි
උතුරු අළුත් කුරු කෝරළය
බී. ජොහානස් මැන්දිස් මුදලි පස්දුන් කෝරළය
ඇන්ඩෘ ප්‍රනාන්දු වීරසූරිය අබේවික්‍රම රාජකරුණාරත්න
පටබැඳි මුදියන්සේ කොළඹ
දනියල් ප්‍රනාන්දු ජයසූරිය මුදලි රයිගම් කෝරළය
සයිමන්, ටී. ද වාස් ගුණවර්ධන මුදලි
හැවෙනහිර පස්දුන් කෝරළය
*පී. දෙන් එමලියානු මුදලි රයිගම් කෝරළය
මාටින් පෙරේරා දබරේරා මුදලි දකුණු පිටිගල් කෝරළය
ජේම්ස් ජේ. ද මැල් මුදලි පස්දුන් කෝරළය
සී. ඊ. විජේසේකර මුදලි කොළඹ සහ සල්පිටි කෝරළය
ඇඩ්මන්ඩ් පීරිස් මුදලි කළුතර තොටමුන
ඇස්. බී. විජේතුංග මුදලි වැල්ලබඩ පත්තුව
ඒබ්‍රහම් ද සිල්වා ගුනවර්දන මුදලි අම්බලන්ගොඩ
අදිරියන් මැන්දිස් වීරවික්‍රම මණ්ඩකුලසූරිය
සේනානායක මුදලි ගල්කිස්ස සහ මොරටුව

### බ්‍රිතාන්‍ය ආණ්ඩුව - ගෞරව මුහන්දිරම් වරු.

1 සෙල්ලප්පෙරුමගේ ජෝශප් ප්‍රනාන්දු
අර්ශසථ කුලසූරිය ගුණසේකර වර්ණසූරිය
විජයරත්න මුහන්දිරම් සල්පිටි කෝරළය
2 මහ මරක්කල කුරුකුලසූරිය ජොහානස් පෙරේරා
ජයසිංහ මුහන්දිරම් සල්පිටි කෝරළය

*වර්ෂ 1900 දී පමණ මේතෙම බදුලු කච්චේරි මුදලි වශයෙන් සිටියේය.

3 බස්තියන් ද අන්දරාදි මුහන්දිරම්
කොළඹ දිස්ත්‍රික්කය 1809 - 1817
4 පේදුරු ද පොන්සේකා තෝල්ක මුහන්දිරම් කොළඹ
5 අරශකුල විජේසූරිය පෙරේරා තිලකරත්න
මුහන්දිරම් මීගමුව
6 රෙනෝල්ඩස් ද අන්දරාදි අරශකුලරත්න
විජේරත්න මුහන්දිරම් කළුතර
7 හැන්ඩ්‍රා ඇලැක්සන්ඩර් අබේසිංහ ධර්මරත්න
මුහන්දිරම් උතුරු පිටිගල් කෝරළය
8 කරෝලිස් ද පොන්සේකා මුහන්දිරම් කළුතර
9 ජේම්ස් ද පොන්සේකා මුහන්දිරම් එම
10 ජී. ජේ. ද පොන්සේකා මුහන්දිරම් එම
11 සුසේ පෙරේරා වර්ණකුලසූරිය විජේසිංහ
ගුනතිලක මුහන්දිරම් අළුත්කුරු කෝරළය
12 කේ. ඒ. කොඩිප්පිළි මුහන්දිරම් මාතර

## කුරුකුල පෙළපත් නාම.

*ජයකුරු - කුරුවීර - රාජකුරු - කුරුතේරු - කුරුනාථ - කුරුසිංහ - කුරුනයිදේ - කුරුනායක - කුරුකැටියේ අමරසූරිය - 'මේඝසූරිය - හරණසූරිය - කර්ණසූරිය - රණසූරිය - ධීරසූරිය - වීරසූරිය - ජයසූරි - බාලසූරිය - වර්ණසූරිය - ඉලංගසූරිය - අඩප්පසූරිය - තිලවීරසූරිය - කුරුකුලසූරිය - අරශකුලසූරිය - වර්ණකුල සූරිය - බරත කුලසූරිය - මණ්ඩකුලසූරිය - මිහිඳුකුලසූරිය - වික්‍රමසූරිය.

---

*මාතර අග්ගසාර හාමුදුරුවෝ මාතර කොටුවේගොඩ "ජයකුරු" පෙළෙන් පැවත එන උතුමෙකි. මාතර ධම්මානන්ද හිමියන්ගේ ශිෂ්‍යයෙක්වූහ.

‡අප්‍රිකා සැන්සිබාර් ආදි විදේශවල ප්‍රසිඬ ධනවත් වෙළඳ ව්‍යාපාරිකයකුව සිටි විලියම් කුරුතේරු මැතිතුමා සහ ඔඩකලපුවේ සමාදාන විනිශ්චයකාරධුරන්ධර සීසර් කුරුතේරු මැතිතුමාද "කුරුතේරු" පරපුරේ උතුමෝ වෙති. මහජන හිතවත් මහගු ප්‍රභූවරයෝද වෙති.

ලොකුබද්දු ජයසූරිය - ලමාබද්දු ජයසූරිය - වීරවර්ණ ජයසූරිය
ජයවර්ණ වීරසූරිය - විරවික්‍රම විජේසූරිය - අබේසූරිය - විජය
සූරිය - ජයසිරි අරශකුලසූරිය-ජයරාජ ජයවර්ණ ගම්පාලන-
ජයසිංහ පලිහවඩන - වීරසන්නඩ වීරබල කුරුඋතුම් පාල
මහබල ජයසූරිය - ජයසිරි විජය මහබෝධි - ජයසිරි ආදිත්‍ය
නාංතුල - වණ්දිප්ති පත්තිනි - ආරුකච්චි පටබැඳිගේ
- සෙම්බුකුච්චි පටබැඳිගේ - කොළඹ මහපටබැඳිගේ
මොරටු පටබැඳිගේ - කෝට්ටෙ පටබැඳිගේ - මහාහවීර පට
බැඳිගේ - රණවීර පටබැඳිගේ - සමරකෝන් පටබැඳිගේ
මහපටබැඳිගේ - කහ කච්චි පටබැඳිගේ - සූරිය පටබැඳිගේ
චන්දිරම් පටබැඳිගේ - යාපනේ පටබැඳිගේ - පෙන්කුට්ටි
පටබැඳිගේ-වීරකෝන් පටබැඳිගේ-මිහමරක්කල පටබැඳිගේ
පොඩිමරක්කල පටබැඳිගේ - වීරකොණ්ඩ පටබැඳිගේ - වීර
වර්ණ පටිබැඳිගේ - ජයවර්ණ පටබැඳිගේ - අසුරමාන පට
බැඳිගේ - පාවශිල පටබැඳිගේ - ගීකියන පටබැඳිගේ - සිංහ
පුර පටබැඳිගේ-විජයපුර පටබැඳිගේ-කාලිංගපුර පටබැඳිගේ
මාලම් - පටබැඳිගේ - මාලුමී පටබැඳිගේ-කාංචිපුර පටබැඳිගේ
හෙට්ටියා පටබැඳිගේ - කොඹිප්පිලි පටබැඳිගේ - වීරසූරිය
මහවිදානගේ - රාජපක්ෂ වික්‍රමසූරිය පටබැඳි මහවිදානගේ -
රාජපක්ෂ වර්ණසූරිය මුදියන්සේලාගේ - විජේසූරිය පටබැඳි
මුහන්දිරම්ගේ - කුරුකුලත් අරශන් ඉලංගසිංහ ඔඩයාර්ගේ
අමරසූරිය මුදියන්සේලාගේ - විජේකුලසූරියගේ - §ලියනගේ
කුමාරසිංහ මුදියන්සේලාගේ - රාමනාථ මුදියන්සේලාගේ
රණසිංහමුදියන්සේගේ නානායක්කාර වරුණකුලපටබැඳිගේ

---

§දඹුගම පෙර යසසින් සිට නැවත දිළිඳුවූ ලියනගේ පවුලක අයෙකු විසින් කරණලද හොරකමක් ගැන අපහාස වසයෙන් කියන ලද්දකැයි ප්‍රකට කවියක්.

බසත් තිර ලෙසම කියවෙන පුරසාර ෂ්
හිසත් සුදගැසී හැරමිටි අනුසාර ත්
උසත් ඇති කුලය ලියනගෙ අදිකාර ෂ්
හෙනැත් නැම්බුවේ හොරකන් කර උඟර ත්
(කෝකිල සන්දේශය)

**කරාව කුලය පිළිබඳ විවිධ පණ්ඩිත මත.**

"ලංකාවේ ප්‍රවේණිකාර කොටසක් වශයෙන් සලකන කෞරව වංශිකයින්ගේ මුල් රට වනාහි දඹදිව කුරුරට යයි කියති."

(Ceylon Antiquarry & literary register. Vol VII Part 1 & 2)

**2**

"චූඩාමණි නිඝංඩුවේ විස්තර කරන පරිදි කරාවේ මිනිසුන්ගේ මුල්රට කුරුරටය."

(**සයිමන් කාසි චෙට්ටි ගැසටියර් පොත**)

**3**

"ක්‍රිස්තු උත්පත්තියට උත්පත්තියට වර්ෂ 1800 ට ඉහතදී චන්ද්‍ර වංශික කුරුරජ හස්තිනා පුරයෙහි රජවිය."

(Garret's classical dictionery of India)

**4**

"හස්තිනා පුරය සහ ඉඳිපත් නුවරද කුරුරට අග නුවරවල් වෙති." (ඉංග්‍රිසි මහ භාරතය)

**5**

"The Karawa of Ceylon have like their Northern Kinsmen the Kaurava of the Central India"

(Hon: Mt. Hugh Newill C. C. S. & Dal/on)

භාවය:- **ලංකාවේ කරාවෙ** මිනිස්සු වූකලී ඔවුන්ගේ බන්ධුවරයින් වන දඹදිව උතුරෙ වැසි මධ්‍යම ඉන්දියානු කෞරවයින් හා සමාන වන්නේය.

(**ලංකා සිවිල් නිලධාරි හියු නැවිල් සහ ඩෝල්ටන්**)

**6**

මහා භාරතයේ පෙණෙන අයුරු කුරුරට යුඬයෙන් පැරදී පලාගිය කෞරවයින් අතරෙන් කරාවේ මිනිසුන් පැවතෙන බව විශ්වාස කරන්ට පුළුවන.

(Orient a Studies. vii Part, P. P. 9 10)

**7**

**කුරුකුලිනයන්ගේ** සහ ඔවුන් සහෝදර පණ්ඩවරයින්ගේත් යුඬය සිදුවූයේ ක්‍රිස්තු උප්පත්තියට අවුරුදු 1250 ට පමණ ඉහතදීය.

(Garret's Dictionery)

8

"ක්‍රමයෙන් පැරදුන සමහර කෞරවයෝ ජයලත් ඔවුන්ගේම සහෝදර පාණ්ඩවරසින්ට යටත්ව විසුවෝය. එහෙත් තිත් දැඩි අභිමානවත් කෞරවයෝ බොහෝදෙනෙක් විදේශික රටවල් කරා පලා ගොස් ඒ ඒ රටවල්වල පදිංචි වූවෝය.

"ඉතිහාස කරුවන්ගේ මතානුකූලව උතුරු ඉන්දියාවේ අන්‍ය රටවල් දකුණු ඉන්දියාවේ පඬිරට, මදුරාපුර, රාමනාද් දෙශිකිලක්කරය, තුත්තුකුඩිය, කරත්කාඩුව, කේරළය බද කාඤ්චිපුරය හෙවත් වච්චපුරය (දැනට . කොඤ්චීවරම්) කොයිම්බටෝරය, සොළී රට බද කාවේරි පට්ටනම, තංජෝර් පුරය, මදුරාසිය, හෙවත් සිත්තපට්ටනමද, ජාවා දූපත්වල සහ ලංකාවේද කුරුදමින් පලාගිය කෞරවයෝ පදිංචිවූ බව අනුමාන රහිතව විශ්වාස කලහැකිය."

(මහා භාරතය සහ බටහිර - පූර්විදිග, වැසි ඉතිහාස කරුවන්ගේ පොත්පත් ආශ්‍රයෙනි)

9

"කෞරවයෝ ඔවුන්ගේ බංගලා රාජධානියේ "කූර්" නමින් ප්‍රසිඬ වූවෝය."

(Dalton Discription Etholgy of Bengal 1872)

10

"ඔව්හු රාජපුතානාවෙහි "කෞර්" නම්"

(Tob's Rajasthan)

11

"මධ්‍යම ඉන්දියාවේදී ඔවුන්ට "කෞරව" යයි ඇමතූහ"

(Dalton Discriptive of Bengal 1872)

12

"පාණ්ඩවරසින් පස්දෙනාට "කාරවීර්" යන නාමය අසිතිය." (චූඩාමණී නිඝණ්ඩුව)

13

"ජාවා දූපත්වලට පලාගිය කෞරවයෝ එරට ආධිපත්‍යය ලබා විජය නගරය ප්‍රධානකොටගෙන, ඕලන්දයින් විසින් ඒ කොදෙව් රැස ජයගන්නා තුරුම එහි රාජ්‍ය පාලකයෝවූහ."

"චන්ද්‍ර සහ සූරිය වංශ ප්‍රධානකොට ගෙන චන්ද්‍ර සහ සූර්‍ය අඩයාලම් වශයෙන් අඩ සඳ වන් "නැමි පනාවද" අඩි සූර්‍ය්‍යා ලෙස් "රැලි පනාවද" ශ්‍රී පළඳනාවක් මෙන් ඔව්හු හිසමත රඳාගත්තෝය."

(ඉතිහාස පොත් සහ ප්‍රවෘති පත්‍ර)

**"KURUWA becomes in modern Sinhalese KARAWA"**

"කුරුව යන්න වර්තමාන සිංහල භාෂාවෙන් කරාව යනුයි"

(Taprobanian Vol. 1 Page 108)

**14**

දකුණු ඉන්දියාවට පැමිණ පදිංචිවූ කෞරවයින්හට ද්‍රවිඩ භාෂාවෙන් "කෞරවර්" "කුරුකුලම්" "කුරුකුලත්-තාර්" "වරුණකුලත්තාර්" "කෞර වඩුගර්" "කුරුවීරර්" "කුරුවීර කෞත්දර්" "පරදවර්" ' පාරදවර්" "කෞත්ඩවර්" "මීනවන්" "මීනවර්" "මීන පරවර්" "නිල පරවර්" "මගල් පරවර්" යන නාම ව්‍යවහාර විය.

(දෙමළ, ඉංග්‍රීසි වින්ස්ලෝ අකාරාදිය. පිට 329 ක්‍රි: ව: 1862 මුද්‍රණය සහ තවත් පොතපත)

**15**

"යාපනේ පදිංචිවූ කෞරවයින්හට "කුරුකුලම්" යයි යාපනේ වැසි දමිළයන් විසින් කියනු ලැබේ."

(යාපනේ ඉංග්‍රීසි - දෙමළ අකාරාදිය)

**16**

"මද්‍රාසිය (සින්න පට්ටනම) අසල "තේනුවරයි' ප්‍රදේශයෙහි හෝ "වේපොක්" පෙදෙසෙහි පදිංචිවූ කෞර-වයින්ගෙන් පැවතෙන්නන් හට "ප්‍රිංස් ඔෆ් කාරියාස්" සහ "කිංලම් ඔෆ් කාරියාස්" යයි කියති. එහි තේරුම "කාරාවේ කුමාරවරු සහ කාරාවේ යුව රජුන් යනුයි.

**17**

"විජය රජුගේ අග්‍ර අමාත්‍යයාට නොහොත් උප රජුට "කාරවන්ත කුමාරයෝ" යයිද ඔහුගේ මිනිසුන්ට කාරවෙනා සහ "කාරාව" නාමය අයිතිය." යයිද කියා තිබේ.

(සන්න සහිත පුරාණ පාලි ජනවංශය)

**18**

**කෞරව - කරාවේ අය, කුරු රජුගේ වංශයෙහිවූ ක්ෂත්‍රියා.**

[අමර ශබ්දවලී අකාරාදිය. පිටුව 102]

**19**

"The warrior caste Kauravas is called in modern Sinhalese Karawa"

(Orient Studies Vol0l P, 9 10

භාවය:- "කෞරව යුධකාර වංශිකයින් හට වර්තමාන සිංහල භාෂාවෙන් කරාව, යයි කියනු ලැබේ."

(ඔරියන්ටල් සවඩීස් ii කාණ්ඩය, පිටු. 9. 10.)

**20**

"Manuel Andirasu a Man of the Kurukula Caste to be Mudali for the Writting Branch"

(Yalpanam Vaipava Malai)

භාවය:- "*කුරුකුල වංශයේ මනිමෙල් අඥරාසු නැමැත්තෙක් ලිපිකාර දෙපාර්තමේන්තුවේ මුදලි වශයෙන් පත්වූහ." (යාල්පානම් වෛපාව මාලෙයි)

---

*මෙම මනුවෙල් අඥරාදි මුදලි වනාහි කළුතර මිහවලව්වේ කරාව කුලයේ මුදලි පරම්පරාවේ කෙනෙකි. මොහු ඕලන්දක්කාරයින්ගේ පක්ෂයට බැඳී සටන් කොළේය. පරන්ගින් එලවා දමා යාපනය අල්වාගත් ඕලන්දයන් මොහු යාපනයේ මුදලි සහ අග්‍ර විනිශ්චයකාරයා වශයෙන් පත්කරණ ලදී.

මේතෙම පළමුවෙනි විමලධර්මසූරිය මහරජු යටතේ උඩරට රාජධානියේ මහ අධිකාරම් ධුරය දැරූ දොන් මනුවෙල් දියෙස් අන්දරාදි මහමුදලිඳුගේ මුණුබුරෙකු බවට පෝලන්ත දේශයේ නානාපති වැන්සන්ඩන්ගේ Ceylon chieftain නැමැති ග්‍රන්ථයේ දක්වා ඇත්තේය

21

වැල්ලේ වීදියේ මුදලියාගේ පට්ටම ‡කුරුකුලසූරිය අධි අරශ මෙත්තිසිංහ අරශ තිල ඉට්ට කුරුකුලසිත්තිල් මහ මුදියන්සේ යයි පටබඳවා.

(දෙවන රාජසිංහ රජ මුක්කර හටන. සිළුමිණ 1936 නොවැම්බ 1 සහ 8)

22

"*මෙසේ පක්ෂවාදිකම් ඇති ඔවුන් [මීගමුවේ වර්ණ-කුලසූරිය මුදලි සහ කුරුකුලසූරිය මුදලි] මාගේ සිංහලේ ආඥවාක් බොහෝ තාන්න මාන්න ගම් වරවල්ද ලැබ ආධාර වෙමි."

(දෙවන රාජසිංහ රජු, මුක්කර හටන - සිළුමිණ නොවැම්බ 1-8-36)

23

"ඕලන්දක්කාරයින්ට අති කඩිනමට ගොඩ බසින සැටියට ලියමන් ලියා මීගමුවේ මුදලියාට දෙන්ටෙයි යෙදී පතිවිඩ කාරයින් ඇරියාය. ඔහු ගොස් මීගමුවේ කුරුකුල-සූරිය මුදලියා අතට දුන්නේය." (දෙවන රාජසිංහ රජු මුක්කර හටන. සිළුමිණ 18-11-36)

---

‡මීගමුවේ වැල්ලේ වීදියේ කුරුකුලසූරිය මුදියන්සේට උඩරට රාජධානියේ මහ අධිකාරම් ධුරය රාජසිංහ රජු විසින් පවරා දෙන ලදී.

(බ්‍රිතාන්‍ය කෞතුකාගාර පොත්හලේ තිබෙන නො: **P 17323 / OR. 6606 (53)** දරණ මුක්කර හටන පුස්කොළ පොත. සිළුමිණ ඓතිහාසික කලාපය. නොවැම්බ 1. 8. 16 කලාප. 1936.

*දෙවන රාජසිංහ රජු තම වඩන තලත්තෙන් පත් ඉරුවක් ඉරා මෙහි ඉදිරිපිටේ සඳහන් වාක්‍ය කැබෙල්ල රත් පංහිදෙන් එහි ලියා ඊයක බැඳ දළඳ ගම් වෙල් පිහිටු මීගමු මුදියන්සේලාගේ කඳවුරට වැටෙන අයුරෙන් විද්දේය. ඒ ඊයේ බැඳතිබූ තල්පත කියවා බැලූ මුදලිවරු පෘතුගීසින් අත්හැර සිය සෙනගත් සමග රජුගේ පක්ෂ-යට ගියෝය.

## 24

"පරවර ප්‍රධානියා තුත්තුකුඩියේ වෙසෙසි. ඔහු ඕලන්ද ආණ්ඩුව යටතේ "ප්‍රින්ස්" යන කුමාර නාමයෙන් යුවරාජ තනතුරු ලබා මහත් බලයක් පවත්වයි."

"කාරාව, පරවර, පරම්පර්, පට්ටනවර්, සලුප්පර්, සනාදි ගෝත්‍රවලට පොදුවේ ව්‍යවහාර කරණ කළ "කුරු කුලම්" යයි කියනු ලැබේ." [කාසි චෙට්ටි ගැසට්යර්]

## 25

"ලංකාවේ සහ දකුණු ඉන්දියාවේත් නිත්‍ය පදිංචිකාරයින්ව වෙසෙන කෞරවයින් වනාහි උතුරු ඉන්දියානු වංශයකින් පැවත එන්නන් බව නොඅනුමානව කියනහැක. එය වැදගත් වංශයක් වශයෙන් පැවතුනා පමණක් නොව නවමන් උසස් තත්වයකින් වැජඹේ.

(Indian Ethnology, ඉන්ඩියන් ඇත්නොලොජි,)

*කෞරව, කාරාව, කාරවන්න, හෙවත් කුරුකුල, පුඩකාර වංශකයින් පිළිබඳව ඉහත .දැක්වූ විස්තර වලින්

---

*පූරුව කෝෂම් ද්‍රවිඩ හා ෂෙන් ලියාතිබෙනපොත දැක මවිසින්
පූරුව වංශම් උත්තම චරුණය ලීවෙමි මේ පොත සිහල බසින්
පුරුගෙවංසෙ ගෞරව මහතුනි ඇතත් වරද මෙය ඉවතදමන්
කුරුකුලවංසේ අරසන්පේරුව පැවතුන අන්දම අසනුනොසින්
පලමුව මහබඹ උපන පටන්ගෙන දෙවනුව මහ සම්මතය වෙනි
දඹදිව අගරජ සූරියවංශය එවක්පටන් පැවතීම එ නි
සූරියවංසේ චන්දකුලේ මහා පුරු රජුන් ලොව පහල වෙ නි
පුරුගෙ වංසෙන් විසිවෙනි නම් වන තුෂ්ටියන්ත රජකම්කර නි
තුෂ්ටියන්ත නම් රජහට දැකර බරත කුමරු ලොවපහලවෙ නි
බරතකුමරු නම් මුලුලොව් අගපත් සියලු රජුන්හට බලනෙදැනි
එවැනි උතුම්කම් ලැබ කුමරුන්ගෙ ගොතිරෙටපරදරනම්පැවනි
මෙවැනි උතුම්වූ රජාගෙ මුනුපුරු හත්වෙනි සංවරණය නැමනි
කුරු කුමාර රජකම් කර මිනිස් ලොව උපදින් නේ
කුරුකෞරව යනඋතුන්නමක්ඒකුමරුටනැබුවානොලසින්නේ
කුරුවංසෙන් සත් විසක් දඹදිවඅගරජකම්කරපැවතෙන්නේ
කුරුගෙන්පැවතෙනගෞරවනාමය කරාවබවමින් දැනගන්නේ

[සත්කෝරලේ හෙන්දිරිගාපිටියේ කුරුකුල විජේසූරිය මුදියන්සේලාගේ වර්ණසූරිය වෙද මහත්මයාගෙන් ලැබුන පොතකින් පිටපත් කරගන්නාලදී]

ඔවුන් මුහුදු සටනෙහිද සිංහලේ රජුන්ටද යාපනේ රජුන්ටද සේවය කළ යුඩකාමී කුලයක් බැව් අවබෝධ වීමට මේය ප්‍රමාණ වේයයි සිතමු ''

## විශෙෂ විභාග.

''රාජ වංශිකයාහට කඩු, දුනු, ඊ, දැරීම ඔවුන්ගේ ජීවිකා වෘත්තියයි. කඩු දුනු ශිල්ප ඉගෙන ගැනීම, ක්‍ෂත්‍රියයන්ට හැර සෙස්සන්ට අයිති නැති බව ඉන්දියාවේ නියෝගයක්ව තිබුණුසේ පෙනේ.''

''ශිව ආගමේ ප්‍රකාර යුඩ කිරීම හිමිකර තිබෙන්නේ ක්‍ෂත්‍රිය ජාතියට පමණයි. ජීවිකාව උදෙසා අන්‍ය මාර්ගයක් නැත්තම් බමුණන්ටත් යුඩ කිරීමට අවසර තිබේ.''

(සර් ඇමැර්සන් ටෙනන්ට්)

''මීගමුවේ තිල්ලත් දූවේ මහවිදියේ කුරුකුල කාසිරේසූර් වර්ගයට අයිති නැසීගිය බස්තියන් ප්‍රනාන්දුගේ දියණියත් වන ජුවානා ප්‍රනාන්දු'' මෙයට දන්නා සාක්ෂි:- කුරුකුල කාසිරේසූර් වර්ගයේ ප්‍රන්සිස්කු ප්‍රනාන්දු''

(ධූරාව කුලය පිළිබඳ නීති රත්නාවලියේ සඳහන් වර්ෂ 1834 නොවැම්බර් 3 වෙනි දින දුතම සීට්ටුව)

කවුරවර් – කුරුකුල වංශය (කෞරව වංශය)

(යාපනේ, දෙමළ – ඉංග්‍රීසි අකාරාදිය. පි: 94)

''සාන්තනුත් භව ද්‍රජා කෞරවණං ධූරන්ධරඃ''

භාවය:–

සාන්තනු රජුගෙන් පැවත ආවෝ ලෝකයෙහි අතිශයින් ප්‍රසිඩවූ බලසම්පන්නවූ කෞරවයෝ වූවෝය යනුයි.''

(මහ භාරතය)

''කුරෝර පත්‍යං කෞරවඃ''

භාවය:–

''කුරුගේ පුත්‍ර තෙම කෞරව'' නම් වෙයි.

(වර රුචි ආචාර්‍ය්‍ය)

## අකාරාදි විස්තර

குருகுல வேந்தர் – கௌரவர், பாரதர், பௌரவர்.
කුරුකුල වේන්දර් – කෞරවර්, පාරදර්, පෞරවර්.
කුරුකුල වේන්දර් – කෞරව, භාරත, පෞරව.
(යාල්ප් පාතම් පෙයරකරාදි)
பாரதர் – குருகுல வேந்தர்.
පාරතර් – කුරුකුල වේන්දර්
භාරත – කුරුවංශික රජු
பாரதி – சரச்சுவதி, மரக்கலம் [P. 669[.
පාරති – සරස්සුවති, මරක්කලම්.
භාරති – සරසවතී, මරක්කාව, (නෞකාව)
(යාල්ප් පාතම් පෙයරකරාදි)
பார்வதி – இடைச்சி. உமை. துருபதி.
පාර්වති – ඉඩෛච්චි, උමයි, දූර්පති,
පාර්වතී – එඬේර ස්ත්‍රී, උමාදේවී, ද්‍රෞපදී, (පාණ්ඩවර මාතාව)
(යාල්පාතම් පෙයරකරාදි පිටු 701)
பௌரவர் - குருகுல வேந்தர்
පෞරවර් – කුරුකුල වේන්දර්, පෞරව – කුරුවංශික රජ,
மரக்கலப்பாய் - கப்பற்பாய் මරක්කලප්පායි – කප්පර්පායි
මරක්කලප්පායි – නැව් රුවල
(යාල්පාතම් පෙයරකරාදි පිටු 779, 800)

## විශේෂ විභාග.

දෙමළ අකාරාදිවල පෙනෙන අන්දමට "පාරතර්" යනු භාරත වංශය යනුයි. එය ස්ත්‍රිලිංගික වශයෙන් යොදනවිට "පාරති" හෙවත් "භාරතී" යනුයි. හෙවත් භාරත මාතාව යනුයි. මෙය භාරත වංශයේ ස්ත්‍රීන්ට සහ සරස්වතීටද, පාර්වතීටද, *මරක්කලම්, හෙවත් නෞකා-වලටද කියනු ලැබේ.

---

*மரக்கலம் – கப்பல், தோணி.
මරක්කලම් – කප්පල්, තෝණි
මරක්කලම් – නැව, ඔරුව
மரக்கலம் – மீகாமன்.
මරක්කලම් – මීගාමන්,

මරක්කලම් යනු නෞකා, මීගාමන්, මාලුමී, මාලිමී, යනාදියට නම් වේ. මේ නාම කරණකොට ගෙන ‡මීගමුව යන නාමය ඇතිවීයයි සිතන්නට ඉඩ තිබේ. හම්බන් තැව්, ඔරු, පාරු, මරක්කාල් මාලුමී, මාලිමී, යනාදී යාත්‍රා වර්ග සියල්ලටම පාරති හෙවත් භාරතී යයි කියන්නාසේම මීගාමන් යන නාමයද කියති.

මේ නාමයේ "න්" ලෝපවී මීගාම, මීගම, මීගමුව යන වර්තමාන ග්‍රාම නාමය ඇතිවිය හැකිය.

මීගමුවේ වැසි පුරාණ පරම්පරා බොහොමයක් ඉහත සඳහන් "නෞකා" යන්න පෙළපත් නාම වශයෙන් මේ දක්වා කියාගතිති. එනම්:- පරත කුල හෙවත් භරත කුල, භාරති, මාලුමි, මාලිමි, මහමරක්කල, පොඩි මරක්කල ශෝණිය මාලිමි, මීගමු පටබැඳි, කුරුකුල යනාදිය වේ.

තවද කාවන්තිස්ස රජුන් දවස සැවරියතක් දිග මීවද ලත් සෙයින් මෙගමට මීගමුව යන නාමය ඇතිවීයයි බොහෝ දෙනෙක් කියති.

දෙවෙනි පැතිස්ස රජු විසින් මෞර්‍ය වංශික "සුමිත්‍ර කුමරුට හලාවතින් මාළු බරුවක්ද, මීගමුවෙන් පොල් වත්තක්ද නිඳට දෙවා වදාළ බව පුරාණ පුස්කොළ පොත් වල සඳහන්ව තිබෙන සෙයින් කාවන්තිස්ස රජුට වඩා ඉහත කාලේ සිට, ඒ තියම් ගමට මීගමුව යන නාමය තිබුණ බව මෙයින් හැගේ.

---

‡ *மீகாமன் - மாலுமி.*
*மீகான் - மாலுமி.*
මීගාමන් – මාලුමී, මාලිමී,
මීගාන් – එම එම
*மாலிமி – மாலுமி. இளமைப்பருவத்திற்.*
මාලිමී – මාලුමී, ඉලමයිප්පරුවත්තිර්
(යාල්පානම් පෙයරකරාදි, පිටු 699, 779, 701, 800, 826)

# පඬිරට මිනවන් පාණ්ඩියන් රජවරු,

පඬිරට වනාහි අප ලංකාව අසලම පිහිටා තිබෙන ඉන්දියාවේ දක්ෂිණ භාගයට හිමි මහ ජනපදය වන්නේය. එහි අගනුවර වූකලී මදුරා පුරයයි. එහි වැසියන් "පාණ්ඩිය දෙමළ" මිනිසුන් වශයෙන් අඳුන්වනු ලැබේ. *විජය රජු සහ ඔහුගේ පිරිසද මෙම දකුණු මදුරාපුර පාණ්ඩිය දෙමළ කුල කාන්තාවන් හා විවාහවුන බැව් මහ වංශයේ දක්වේ.

පඬිරට රාජවලිය, චන්‍ද්‍රවංශයට අයත්වන්නාසේම කුරුරට පාණ්ඩවර වංශයට නොහොත් කුරුකුලයටද ඔව්හු ලේ නෑකම් කියන්නෝ වෙති.

අප රට සිරි වික්‍රම පාණ්ඩියන් රජ (ක්‍රි: ව: 1052 / 1057) පරාක්‍රම පාණ්ඩියන් රජ (ක්‍රි: ව: (1059/1065) දෙවන පරාක්‍රම පාණ්ඩියන් රජ (1222/1225) වීරපාණ්ඩියන් රජ යනාදී සිංහල රජවරු වනාහී පඬිරට මීනවන් පාණ්ඩියන් නැමැති චන්‍ද්‍රවංශික පරම්පරාවට අයත්වූවෝ වෙති.

පඬිරට මීනවන් පාණ්ඩියන් රජ පරම්පරාවේ මූලිකයෙකුවූ කුලසේකර පාණ්ඩියන් නැමැති චන්දිර කුලත්තාර් තෙම "පුන්නයි කායල්" නගරේ සමුද්‍රය අසබඩ පදිංචිව සක් මුතු යනාදී මස් මරමින් ජීවිකාවෘත්තිය කරගත සිටි බැවින් ඔහුට මීනවන් නාමය පටබැඳුනු බවත් ඔහුගෙන් පැවතුන දරු මුනුබුරු ආදිකොට ඇතිවූන සකල පරම්පරාවටම

---

*විජය මහරජුගේ අග්‍ර මහේසිකාවවූ විජායි කුමාරිකාව හා ඇමැති දූරියන් සත්සියයක් කරාවේ ගෝත්‍රයේ උත්තම යන් බව වන්නි රාජවලියෙහි සඳහන්ව තිබේ.

(මාතලේ වීරසූරිය රාජපක්ෂ වාසල මුදියන්සේලා මුදියන්සේ කව්රාල මහතා තමින් කුරු රාජවංශය සහරාවේ පලවූ ලිපියකිනි.



මිනවන් කුලශෙඛර, පාණ්ඩියන් - පඬිරජතුමා
(මදුරාපුර පඬිරාට)
පතිමසෑලර් දෙමළ සඟරාවෙන් උපුටාගනිමි.

මීනවන් පාණ්ඩියන් නාමය විරුදාවලියක් වශයෙන් ව්‍යවහාරයට පත්වූ බවත් "තිරුවක්කන්" නැමැති දෙමළ කාව්‍යයෙන් විස්තර වන්නේය.

මෙම චන්ද්‍ර වංශිකයා මස්මැරීමෙන් ජීවිකාව කරගත් බැවින්ද සමුද්‍රයකිමිද සක් එකතු කරගත් බැවින්ද, තමන්ගේ වංශයට ලකුණක් වශයෙන් මත්ස්‍යයා බැඳි කොඩිය සහ හක්ගෙඩිය බැඳි කොඩිය රාජකීය අඩයාලමක් ආකාර පිළිගත්හ.

මොව්හු සිංහාසනාරූඪව සිටින අතර මුතු කුඩ තුනක් ඔසවනු ලැබේ. එයින් මැදට ඔසවනු ලැබූ කුඩය මුදුනේ මුතු මැණික් ඔබ්බවනු ලැබූ ස්වර්ණමය අඞ් චන්ද්‍ර සටහණ පිහිටුවා ලූහ.

සිංහාසනයට දකුණු පාශ්වයෙන් හක්ගෙඩිය බැඳි කොඩියද වම් පාශ්වයෙන් මත්ස්‍යයා බැඳි කොඩියද පිහිටුවා ගැනීම සිරිතක් කොට පැවැත්විය. මොහු ක්‍රිස්තු වර්ෂයට යට අවුරුදු 500 දී පඬිරට රජ ඉසුරු ලැබ මදුරාපුරය අග නුවර කොටගෙන මුතු පිළිබඳ සුප්‍රසිඬව තිබුණ කොර් කොයි නුවර වාසය වෙමින් රාජ්‍යය ආණ්ඩුකෙළේය.

(තුත්තුකුඩියේ "පතිමය මලර්" දෙමළ සඟරාව)

## අකාරාදි විස්තර,

மீனவன் - பாண்டியன். (පළමුකොටස 827 පිටුව)
මීනවන් – පාණ්ඩියන්.

பாண்டியன் - உசிதன். கவுரியன். குமரிச்செர்ப்பன், மீனவன் கூடர்கோமான், செழியன். தமிழ்நாடன், தென்னவன். பஞ்சவன், பொதியவெற்பன், மாறன் வழுதி வேம்பின்- ருரோன் வையத்துறைவன்,

පාන්ඩියන් – උසිදන්, කවුරියන්, කුමරිස් චෙර්පන්, මීනවන්, කූඩර්කෝමාන්, සෙලියන්, තමිල්නාටන්, තෙන්නවන්, පංජවන්, පොදිය වෙර්පන්, මාරන්, වලුති, වෙන්පන් රාරෝන්, වයියෙයිත් තුරෙයිවන්,

(යාල්පානම් පෙයරකරාදි ii කොටස, 81 පිටුව 141 පිටුව)

உகிதன் - උසිදත්, பாண்டியன் - පාණ්ඩ්‍ය පඬි, கவுரியன் - කවුරියන්, பண்டியன் - පාණ්ඩිය, පඬි, குமரிச்சொர்ப்பன் - කුමරිස් චෙර්පත්, பாண்டியன் - පාණ්ඩිය, පඬි, மீனவண் - මීනවත්, பண்டியன் - පාණ්ඩිය, පඬි, கூடர்கோமான் - කුඩර් කෝමාත්, பாண்டிய - පාණ්ඩිය, පඬි, செழியன் - සෙලියත් பாண்டியன் - පාණ්ඩිය, පඬි, தமிழ் நாடன் - තමිල් නාටත්, பாண்டியன் - පාණ්ඩිය, පඬි, தென்னவன் - තෙන්නවත්, பாண்டியன்-පාණ්ඩිය, පඬි, பஞ்சவன்-පංජවත්, பாண்டியன்-පාණ්ඩිය, පඬි, பொதியவெற்பன்-පොදිය වෙර්පත්, பாண்-டியன்-පාණ්ඩිය, පඬි, மாறன்-මාරත්, பாண்டியன்-පාණ්ඩිය පඬි, வழுதி-වලුති, பாண்டியன்-පාණ්ඩිය, පඬි, வெம்பின் றாரோர் - වෙම්පින්රාරෝ, பாண்டியன - පාණ්ඩිය, පඬි வையைத்துறைவன் - වයියෙයිත් තුරෙයිවත්, பாண்டியன் - පාණ්ඩිය, පඬි, கைதவன்-කෛදවත්, பாண்டிய-පාණ්ඩිය, පඬි, பஞ்சவர்-පඤ්ජවර්, பாண்டிய மக்கள் - පාණ්ඩව පුත්‍ර, පඬි, (චූඩාමණි නිඝණ්ඩුව සහ යාල්පානම් පෙයරකරාදි)

## පඬි රාජ විරුදාවලිය.

செழியனே கூடற் கோமான் தென்னவன வேம்பின்றாரான்
வழுதியேகுமரிஸ் சேர்ப்பன் வையகந்துறைவன் மாறன்.
விழைவுறு பொதிய வெற்பன் மீனவன் கைதவன்சே ரற்.
பழைய பஞ்சவனே வெய்ய கவுரியன் பாண்டியர் பேர்.
[சூடாமணி நிகண்டு]

සෙලියනේ කුඩර් කෝමාත් තෙන්නවත් වෙම්පින්රුරාත්
වලුතියේ කුමරිස් චෙර්පත් වෛයකත් තුරෙයිවත් මාරත්.
විලෙයිවුරු පොදිය වෙර්පත් මීනවත් කයිදවත් සෝර්,
පලෛය පඤ්ජවනේ වෙයිය කවුරියත් පාණ්ඩියත් පේර්.
(චූඩාමණි නිඝන්ඩුව)

## මීනවත් පඬිරට රජවරු

| | | | ක්‍රි: | ව: |
|---|---|---|---|---|
| 1 | ජටාවම් කුලසේකර පාණ්ඩියත් | | 1190 | 1214 |
| 2 | මාරවම් සුන්දර පාණ්ඩිය | i | 1216 | 1335 |
| 3 | ,, ,, | ii | 1238 | 1251 |

| | | | ක්‍රි: | ව: |
|---|---|---|---|---|
| 4 | ජටාවර්ම සුන්දර පාණ්ඩිය | i | 1251 | 1261 |
| 5 | වීර පාණ්ඩිය | | 1252 | 1267 |
| 6 | මාරවර්ම කුලසේකර | i | 1268 | 1308 |
| 7 | ජටාවර්ම සුන්දර පාණ්ඩිය | ii | 1275 | 1290 |
| 8 | මාරවර්ම කුලසේකර | ii | 1314 | 1321 |
| 9 | මාරවර්ම පරාක්‍රම පාණ්ඩිය | | 1334 | 1352 |
| 10 | ජටාවර්ම පරාක්‍රම පාණ්ඩිය | | 1357 | 1372 |
| 11 | පරාක්‍රම පාණ්ඩිය දේව | | | 1365 |
| 12 | පරාක්‍රම පාණ්ඩිය | | | 1384 |
| 13 | ජටිලවර්ම කුලසේකර | | | 1395 |
| 14 | ජටිලවර්ම පරාක්‍රම පාණ්ඩිය අරිකේශරිදේව | | 1422 | 1461 |
| 15 | මාරවර්ම වීර පාණ්ඩිය | | | 1422 |
| 16 | අලගන් පෙරුමාල් කුලසේකර | | | 1430 |
| 17 | වීරපාණ්ඩිය | | | 1437 |
| 18 | වීරපාණ්ඩිය | | | 1475 |
| 19 | ජටිලවර්ම පරාක්‍රම පාණ්ඩිය කුලසේකර | | 1479 | 1499 |
| 20 | පරාක්‍රම පාණ්ඩිය | | | 1516 |
| 21 | ජටිලවර්ම සිරිවල්ලභ අභිරාම පරාක්‍රම | | 1534 | 1537 |
| 22 | මාරවර්ම සුන්දර පාණ්ඩිය | iii | 1531 | 1555 |
| 23 | කුලසේකර පෙරුමාල් පරාක්‍රම | | | 1543 |
| 24 | වික්‍රමපාණ්ඩිය | | | 1543 |
| 25 | කෝනේරිමෙයි කොන්ඩාන් කුලසේකර ධර්ම-පෙරුමාල් | | | 1550 |
| 26 | ජටිලවර්ම සිරිවල්ලභ අතිවීර රාමන් | | 1562 | 1567 |
| 27 | කුලසේකර පරාක්‍රම අලගන් සොක්ක | | | 1572 |
| 28 | අභිරාම වරතුංග රාම | | | 1586 |
| 29 | වීර පාණ්ඩිය | | | 1586 |
| 30 | සිවල මාරර් | | | 1615 |
| | වික්‍රම පාණ්ඩියත්, සිංඤෝර් ජුවන්ද කෲස්-පරදවර්ම | | 1543 | 1553 |
| | කෝ: මේ: කො: කු: ධ: දොන් මිගෙල් ජුවන් ද කෲස් පරදවර්ම | | 1550 | 1562 |

සිංඤෝරා සිංඤෝරා දෝනා මරියා ද කෲස්
පරදවම් පාණ්ඩියන් දේවි 1562 1562

සිංඤෝර් සිංඤෝර් දෙන් ලුවිස් ඉස්තේවන් ද
කෲස් පිරිස් පරදවම් පාණ්ඩියන් 1565 1590

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් ජෙරනිමුස් ද
කෲස් පිරිස් පරදවම් පාණ්ඩියන් 1590 1615

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් මිගෙල් ජෙරනිමුස්
ද කෲස් පිරිස් පරදවම් පාණ්ඩියන් 1615 1641

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් සාවියර් මිගෙල්
ද කෲස් පිරිස් පරදවම් පාණ්ඩියන් 1651 1646

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් සාවියර් හෙන්රි
ද කෲස් කොරේරා පරදවම් පාණ්ඩියන් 1646 1671

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් ජේකබ් හැන්රි
ද කෲස් කොරේරා පරදවම් පාණ්ඩියන් 1671 1680

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් ඉස්තේවන් ද
කෲස් භුපාලරායර් පරදවම් පාණ්ඩියන් 1680 1686

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් ගබ්රියල් ද
කෲස් ගෝමස් පරදවම් පාණ්ඩියන් 1686 1700

සිඤ්ඤෝර් සිඤ්ඤෝර් දෙන් ජුසේ ලුවිස් ද
කෲස් ගෝමස් පරදවම් පාණ්ඩියන් 1700 1716

පඬිරට චන්ද්‍රවංශික රජ දරුවන්ගේ "මීනවන්" නැමැති පටබැඳි නාමය බ්‍රාහ්මණයින් විසින් සංස්කෘත භාෂාවට පෙරළාගනු ලැබුවේ "*මත්ස්‍යවරු" යනුවෙනි.

---

*One interpratation adds to me enemies of sudas the tribe of the MATSYAS (Fishes) who in later times occupied the lauds. now knoмu as ALWAR. JAIPUR, and BHARAT PUR.

මත්ස්‍යවරු, පසුව අල්වාර්, ජයපුරය, බාරත පුරය, යනාදියෙහි පදිංචිවූහ.

මේ මත්ස්‍යවරු නොහොත් මීනවර්වරු, ජයපුරවරු, බාරතපුරවරු යනාදීන් අතරෙන් සමහර පරම්පරා වලට බරත කුලය කුරුකුලය සහ කරාව යන නාම හිමිවන්නේය.
(පතිමය මලර් දෙමළ සඟරාව)

මේ මත්ස්‍ය වගීයා මීනවත්ගෙන් වෙනස්ව රාජපුත්‍ර අල්වාර් පෙදෙසේ වෙසේ. ඔව්හුද චන්‍ද්‍ර වංශික රාජ පුත්‍රයෝ වෙති. ඇතැම් අය කාරාවෙ මිනිසුන්ට "මීන කුලයේ මිනිසුන්"යයි උපහාස මුඛයෙන් කියති. එහෙත් එහි තේරුම "මීනවන් නොහොත් මත්ස්‍යවරු" යන්න බව ඔව්හු නොදනිති.

පඩි රාජ වංශය මුලුමනින්ම පරදර් නොහොත් පරවර මිනිසුන්ගෙන් ඇතිවූන වංශයක් බැව් බොහෝ දෙනාගේ කල්පනාවයි. පුරා විද්‍යාධරයෙකු වශයෙන් ප්‍රසිද්ධව දඹදිව වසන ගෞරවනීය එච්. හේරස් පියතුමා විසින් ලියන ලද "මොහෙන් ජොදරෝ නගරවැසියෝ" යන ලිපිවල මෙසේ ලියා තිබේ.

"ඉන්දු මිටියාවතෙන් සොයාගත්තාලද පුරාණ ශිලා ලිපිවල ප්‍රකාශයන් අනුව පරවරුන් හා චන්‍ද්‍රයා අතර යම්කිසි සම්බන්ධයක් තිබෙන බව පෙණෙන්නට තිබේ. පරවර ගෝත්‍රය ක්‍රම ක්‍රමයෙන් දියුණුවේගෙන එන අතර ඔව්හු දෙවගීයකට බෙදුනාහ. එක කොටසකට *පගල් පරවිර් කියාද අනික් කොටසට ‡නිල පරවිර් කියාද නම් කියාගත්තෝය.

"පගල් පරවිර්" යනු "සූය්‍ර්‍ය පරවර" කියාද "නිල පරවිර්" යනු "චන්‍ද්‍ර පරවර" යනුද මෙහි තේරුමයි. දෙවනුව කී වගීයා බොහෝ වැදගත්වා පමණක් නොව ඔවුන් පිළිබඳව නා නා ප්‍රකාර වශයෙන් ඒ ලිපිවල සඳහන්වෙයි

---

*பகல் – පගල් - சூரியன் தினம், සූරියන් දිනම්,
පගල් – සූය්‍ර්‍ය, දිනය, දවාල.
(යාල්පානම් පෙයරකරාදි පි: 644)

‡நில -- அம்புலி, இந்து, மதி, சந்திரன்,
නිල – අම්පුලි, ඉන්දු, මති, චන්දිරන්,
නිල – අම්බුලි, ඉන්දු, මති, චන්ද්‍රයා.
(පනිමඃ මලර් දෙමළ සඟරාව)

ඒ ලිපිවල අදහස නම් මීනවන් වර්ගයාට අයිති මත්ස්‍යයන් යුවල වනාහි "චන්ද්‍රයා"ට අයිති බවත් ඔවුන් වනාහි දෙකට බෙදුනු කොටසක්වූ පරවරු බවත්ය.

In deed the Indus valley inscription show that there is some historical connectien between the PARAVAS and the Moon. When the tribe of the PARAVAS grew, two sub-sections of this tribe were eventually formed. Each action took a new device by which they were distinguished from each other.

One of the sub-sections was called PAGAL PARAVIR "SUN PARAVAS" the other NILA PARAVIR "MOON PARAVAS". The later seem to have been more important or perhaps more numerous, for they are often mentioned in the inscriptions. The meaning of the inscription therefore is that the two FISHES of the MEENAVAN belonged to the MOON of one of the sule-seotions of the PARAVAS.

All this as regards the verble interpretation of the inscription. But what is the formal meaning of it."

(The jurnal of oriental research, Madras Vol. X. PART IV of Oct.)

**පගල් පරවර, නොහොත් සූර්‍ය්‍ය පරවර - නිල පරවර නොහොත් චන්ද්‍රපරවර, යනාදීන් හැර ඔවුන් අතර මීන පරවර් කියාද කොටසක් සිටිති. පඬිරට මීනවන් රාජ වංශය මේ මීනවන් පරවරුන්ගේ කොටසක් බව පරවරුන්ගේ ඉතිහාස පොත්වල දක්වා ඇත්තේය.**

**ඌවේ කුමාරයා, උඩරට රාජධානියේ යුව රජ, ඌවේ යුව රජ, කුරුවිට මන්ත්‍රී, කුරුවිට රාළ, මාතර මහා මන්ත්‍රී, යන ස්ථානාන්තර දරා සිටි කෞරව වංශික අන්තෝනියෝ බැරැත්තු, සේනාපති සහ අද්මිරාල්.**

මස්මරන්නෙකුගේ පුත්‍රයෙකු වශයෙන් හඳුන්වනු ලබන අන්තෝනියෝ බැරැත්තු (ANTONIO BARETTO) නොහොත් කුරුවිට රාල පිළිබඳ විස්තර අලගියවන්න මොහොට්ටාලගේ "කොස්තන්තීනු හටන" පිලිප් බෝල්-ඩියස් දේවගැතිතුමාගේ "ලංකා විස්තරය" පර්නැන්ඩි කියුරෝස් පූජකතුමාගේ "ලංකා විජය ග්‍රහණය" ආචාර්‍ය පෝල් ඊ. පීරිස් මහතුන්ගේ "පූර් චු ගීස් ඊරා" ඈස්. ජී. පෙරේරා පියතුමාගේ "ලංකා ඉතිහාසය" අලුදෙණියේ කිවිඳුගේ "රාජසිංහ වර්ණනාව" යනාදි පොත්පත් වල හොඳකාර සටහන්ව තිබේ.

මෙකියන ලද ඉතිහාස පොත් වල සහ කාව්‍යයන්හි අන්තෝනියෝ බැරැත්තුගේ යුධ දක්‍ෂභාවයත් නිර්භීත කමත් ඔහු කෙරෙහි පරන්ගීන්ගේ බියපත්වීම ගැනත් බොහෝ දුරට සඳහන්කර ඇත්තේය. මෙහි ඇතැම් තැන අන්තෝනියෝ බැරැත්තුට දෝෂාරෝපණය කොට ලියා තිබුනත් ඒ කතුවරු බොහෝ කොටම ඔහු ප්‍රශංසාවට ඉලක්කය කර හෙතෙම කෙරෙහි ගරුත්වයෙන් ලියා තිබේ.

සෙංකඩගල නුවර සෙනරත් රජුන් දවස (1604 - 1634) කොළඹ පරංගීන් යටතේ සිටියෙකුසේ දෙස් දෙන විදගම නාග සිඟු නැමැති පාතරවියෙකු විසින් ලියා සෙනරත් රජුට ඔප්පුකරණ ලදැයි කියන "අයස් මාලය" නම් කුඩා කාව්‍යයෙන් අන්තෝනියෝ බැරැත්තු ඌවේ යුවරාජයාගේ රණ සූර භාවයත්, නිර්භීත කමත්, දක්‍ෂ පක්‍ෂ භාවයත්, යනාදී කිසිවක් ප්‍රකාශවී නැත. මේ ඊර්ෂ්‍යාධික නිවට කිවියා බොහෝ කොට ඌවේ යුව රාජයාගේ නොහොත් කුමාරයාගේ කුල ගෝත්‍රයටත් දක්‍ෂ පක්‍ෂ භාවයටත් පටහැනිව උපහාස මුඛයෙන්ම මේ පද්‍ය ගලපා තිබේ.

ඒ කෙසේ වෙතත් මෙකියන ලද අයස් මාලය නැමැති පොතේ සඳහන් කවි සවල්පයක් මෙහි යෙදීම සෙහෙකැයි සිතමු. එයින් අප්‍රකටව තිබෙන එතුමන්ගේ ජනිත ග්‍රාමය ජයගත් ප්‍රදේශ **කුල ගෝත්‍රය** යනාදිය ප්‍රකාශ වනවා ඇත.

**විඩිදගම නාගසිංහ කච්චාගේ පද්‍යය.** ක්‍රි: ව: 1604-1634

කැත්කුල විසා ලය
සෙනරත් රජ සලී ලය
අසත ලෙස ලෝ ලය
කියමි සදියගෙ අයස් මා ලය

ඒ සඳි මැති න්‍දා
මහන්ත තෙපලා කැ න්‍දා
*කොස්ගම නිරි න්‍දා
වැරෙත් පිට යොන්නරෙන් කැ න්‍දා

---

*වෙල්ලස්ස දෙගොඩ ත්
මඩකලපුව පාත ම ත්
කදුකර කොස්ගම ත්
වැල්ලවා සහ එතර මාව ත්

[කොස්තන්තීනු හටන]

කොස්ගම නින්දගම්වරයද අන්තෝනියෝ බැරුත්තු නැමැති කරාවේ කුමාරයාට අයිතිව තිබුනු බව මේ කවෙන් ප්‍රකාශවෙයි. දැනට මෙය බිබිලේ රදළවරයෙකුට සහ සාමාන්‍ය වැසියන් සමූහයකටද අයිතිය. හල්දුම්මුල්ල ඔස්සේ මරන් ගහවලට දකුණෙන් රත්නපුර මාවතට සැතපුම් පහක් පමණ දුරින් මෙම ග්‍රාමය පිහිටා තිබේ. ගම්සභා පාරෙන් යායුතුයි.

අන්තෝනියෝ බැරුත්තෝ කොස්ගම මාළිගාවේ පොරොත්තුව සිටින කාලයේදී එකුමරුගේ බිසව වනාහී රත්මල්ගොඩ කුමාරිහාමි යයි කියති.

මාතර ලස්ක්‍රිඤ්ඤ හේව පත්තය අන්තෝනියෝ බැරුත්තු යටතේ බොහෝ කලක් තිබුණේය. එයට හේතුව ඔහු කාලයක්ම මාතොට මහමන්ත්‍රී වශයෙන් සිටි බැවිනි.

අවගුන සිරි තිනි ත
සිතැති . . . . . . . . සරෝසි ත
†මාතොට පිරිවරි න
පිටත්වී රුපු සෙනග සමගි ත

ළඟව බඳ සහ තු ට
ලත්ව එ බඳුලු පුරය ම
එතන සිට සවස ට
§ඇවිත් ඒ මස්වැන්න පියස ම

තුඹ ගොසින් එතන ට
එ රජ සඟුරන් කිතය ම
සෙට දිතිඳු මුදුන ට
එන්ඩ පලමුව වැඩමවත්න ට

එ තව හඳි මැති දු ල
සෙනගත් රැගෙන මහ බ ල
*කුඩ කොඩි බැඳ ලක ල
වාඩිවී ගොස් එ තවලම් ප‖ ල

එබැරෙත්තු මැති ස ද
කරවමින් පස මිතුරු න ද
වාඩි ලන ලෙස සො ද
()ඇවිත් බෙලිහුල් ඔයට එම ස ද

---

†වෙනුවෙන් විකුම් ඇ ති
පවර කුරුවිට මහ මැ ති
වෙර සිත් මෙත් බලැ ති
මහත් මාතොට මන්ත්‍රි අදිප ති
(පරණ කුරුරට අලුදෙණියේ මේසසූරිය කිවිඳු)

§මධ්‍යම පළාතේ උඩගම්පහ කෝරළේ රිකිල්ලගස්කඩ අසල මස්වැන්නගම පිහිටා තිබේ.

*මුතු කුඩය, මකරසා බැඳි කොඩිය, ඉර හඳ කොඩිය, රාවණා කොඩිය යනාදි විරුදු වගී.

‖මතුරට කෝරළයට අයත් තවලම්පල. දූනට හරස් බැද්ද (හරක්බැද්ද)

0උඩහේවාහැට මෙම බෙලිහුල්ඔය පිහිටා තිබේ. රත්නපුර මංගීයේ බලන්ගොඩට මයිල 10 පමණ නුදුරින් ගලගම අසලද තවත් බෙලිහුල්ඔයක් සහ ගමක්ද ඇත්තේය. ඒ අනිකකි.

නමින ගරු ත ත්තු
කරා වංසෙන් සු ක්කූ
නව සදි බැරෙ ක්කූ
බලව සදිකර කරපු තෙ ත්තු

යම් එකෙක් ලක බ ද
එක හැට්ටයක් මනන ද
මහන්තට එදනි ද
හැට්ට දහයක් මහයි නොවර ද

රජ්ජුනි හිමි තුන් දිය
අසම බස් සිත පැහැ දිය
ඔබටත් මේ ස දිය
කෙරෙහි යම්කලකදී උරු දිය

පරංගින්ගෙන් බැ ම
මොකු කකා උන් එකෙකු ම
රණැත්තෙන් ගරු කො ම
කලේ නව සදි කමක් ලහ සි ට

එ සේවා හැම 0බ ද
සතුරන් කිනෙහි මන ත ද
එසදි බිම සිදු මැ ද
පැමිණි තුඟු තුල් කසුන් ගිර ලෙ ද

සරා ගුනැති සිත නවනීතෙවු මහ තිරිඳුට සුප ස ත්තේ
දරා වෛර සිත කලෙත් සදිය රුදු තමසෙන් සමගි ත්තේ
නුරා බවෙත් නුඹ කොතෙක් ඇවිද්දත් රට කම්
සතොසි ත්තේ
කරා බැරෙක්කු නුඹේ ඉසත් දෙයි නොබෝ දවසකි ත්තේ

බසව කියන කඩදසි පොතුත් ගෙන ලියවන තුත් ලෝලේ
නොසව බොළඳ බස්දී සුරතල් කර ඇතිකරගත් බංලේ
රොසව මරාපිය පියවු පරංගී යක් දරු පෙම් තාලේ
අසව සෙනඹිරත් රජ කරුණාකර අවිස්වාස මාලේ

---

0හේවාහැට

එ සදි අන්තෝනි ය ත
නොයෙක් අත විත සදි මි ත
ㅇදෙඩම් කුඹුරුය ය ත
ගමට ඇවිදිත් වාඩි ලවමි ත

දස දිග බිහිති ව නා
ලෙසට තුරු ඝොෂ කරමි නා
එ සදි මැති සරොසි ත
සිටින සඟරන්කිතට අවුදි ත

මහ රජු තිසි ලෙ සා
මැද මහ පුරෙන් වෙසෙ සා
වැඩම කර තොල සා
එරජ හැම වැඩසිටින සතොා සා

සිව් දේවාලෙ සු ර
දිවසින් දැක මෙ උවදු ර
§සිව්මෙ අප නරව ර
වඩාගෙන වැඩි වැත්ත එම ව ර

පොරණා සිට කවියටම පසිදු විඳුගම හිමි ලෝ ලේ
තරුණා ගත කවි ‖නාග සිංගවු මකියන කැර ආ ලේ
ද රුණා ගුණයුතු ....... බැරෙන්තු කළ නව සදිමා ලේ
කරුණා කරමින් අසව සෙනවිරත් නිශිඳුනි හැම්වේ ලේ

---

ㅇදෙඩම්වෙල

§සෙනරත් රජ, කුමාරසිංහ විජයපාල, සහ රාජසිංහ යන සිව්දෙන.

‖පරංගියාගේ කාලේ කොළොම් පුර
මිරිවැඩි මහපුතුජපහි සංකර ගෙදර
දංකුඩ සූරා කා ජිවිත රුකුන පෙර
සුදුරෙකි අයස්මාලය ගෙනු කුකවියර
(මුඛ පරම්පරාවෙන් එන කවියකි)

අස්නක් අරගෙන දෙමළ ඝනාක්ෂා ගොස් සමුදුර පැ නයා
විස්තර *මායාදුන්නේ නරනිඳු දකිමින් දත ඇ නයා
සිස්ව තිබෙයි සිංහලේ නොයෙක වඞිනට සැලකල තැ නයා
තොස්ව වැඩම්කල තැන ලංකාවට ඔහුගේ බස් ගෙ නයා

ඇරලා නැව් කොච්චියාරමෙහි ගොඩබැස ලායේ
ලකලා මායාදුන්නේ නරනිඳු එහි වැඩසිට ලායේ
ඇරලා තල්පත් නුඹලා නාවොත් ඒ මුව පව ලායේ
එකලා කොස්ගම නා කි තැනදී සදියා දූක ලායේ

වෙසෙසව සිනාසෙමින් තම සුරතින් රුවිලක් අඹමි න්නේ
සතොසව එන්නට සදි මැති රට සවිලාපිමි සිත මි න්නේ
නිදෙසව ඇන් ඇස් දෝලි සිල වැඩමවන්ඩ සොදමි න්නේ
තොලසවි කොස්ගම රජු සහ පිටත්ව තමසෙන් සමගි න්නේ

ස ද නොයෙක් ලෙස තැන තැන රඹ තුරු බඳවා
තෙරලු කුසු මි
න ද සිනින් මග සැස පිසදම්මා පලලින් ගෙන මතර මී
උ ද ර විකුමැති බැරෙන්තු මැති තුරුහොස
කරවා නොවගි මි
එ ද එ මායාදුන්නේ නිරිඳුට බැඳදී පං කුඩ මි
තොබා වැඩසිට සුරත කගින් කත් දඩකට පහරදී තුමුල
බල පා ලා
ඔ බා සදියටම අා උගෙ සෙබලෙක් එවිට යක්දෙස්සෙකු
සේ පිට වෙව් ලා
ස බා වෙත් සිතත් බරටම යන්ඩ අවසරය යත එසත්
බවත් දී විසා ලා
න බා පස්සට අඩිය නැවත කරකැවී සිට අනුකීය
දුරදිග තොබ ලා

---

*මෙම් මායාදුන්නේ කුමරු වනාහී සීතාවක සිටි මායා-
දුන්නේ රජු නොව. දනවක මායාදුන්නේ නමින් සිටි සිංහල
ක්ෂත්‍රිය කුමාරයෙකි. මෙතුමා සෙතරත් රජුට බියෙන්
ඉන්දියාවේ සොළි රටට පලාගොස් සිටිනා අතර අන්තෝනියෝ
බැරුත්තු කුමාරයා සොළී රටට ගොස් ඔහු නැවතත් ලංකාවට
කැඳවාගෙන ආයේය.

සෙතරත් රජතුමාට වඩා උඩරට රාජධානියට හිමිකමක්
මෙතුමාම තිබුනේය.

පවර බුද්ධකුරු ගුනැති අප නිරිඳු හට සතර දේවාලයේ
සුරිඳු පිහිටි න්
එවර මුතු මැණික් නෙක කසුන් අලුයට දුමු
කෙලක් සේ නොසලකා නොව සතුටි න්
කුවර සෙනගක්සේ මැදවැදී අත්නා ලංස තුන්දහසකට
මැදව අවටි න්.
එවර ගැලවී වදුලාසින්මනොදුතේද පිංබලේගතියසදිගහිටින්
දිරි නාරකන් පපෑ නොසෙක් රටවල් කොට අන්තිමෙදිම
සදිකර ලු ද්දේ
කිරි පුරා දෙවපු සැලකට ගොම එක්කලා සේම
කරපි මේ අබ ද්දේ

§රමත් තුන් කිංඥ් අයබඳුන් දිව දුරා තම
කුමරුවෙකුසේ ගත් සොදි නේ
පිතුත් ඉරතමුත් තගෙ හෙවත්නට පාත පෙරනිමිත්තෙක
වෙතට සදි සිතු තේ

පවර මහත්තේ ගොල්ල වා
කොල්ලකමු වදහලෙ සහතු වා
ඔප්පුදෙවං ඒ සබය වා
එසදෙහි වැඩිතෙය රජ එම වි වා

එදිනෙහි අතපස කොංර වියේ
බොරුවක් බැඳ බෝකර කිය වියේ
ඉදින සග විසඳි මැන වියේ
එසඳෙහි රජ උදහස් බෝ වීයේ

වේගනී ඇති හදි මැති දෙස බලඹින් සුවිපු ලේ
බෝරුනි වන මායාදුන්නේ මහරජ දු ලේ
ඒ රුනි ඇති මගෙ හිමි රට කම්නැත හැඩුලො ලේ
මේ ගනි දූතවද නොසිට ගියේ මම සිංහ ලේ

---

§"සෙතරත් රජ මේ ගිවිසුම පෑතුගීසින් සමග ඇති නොකළා නම් ඔවුන් ලංකාව අත්හැර යනවාට අනුමාන නැත මේ කාලයේ පරන්ගින්ගේ යුධ බලය ගිනව තිබුනේය. සෙතරත් රජු සමග ඇතිකරගත් ගිවිසුම නිසා පරංගින් නැවතත් බලවත් වූයේය. උඩරට ජනයෝ අන්තෝනියෝ බැරුත්තුව යුවරජු වශයෙන් යොදවංගෙන සෙතරත් රජුට විරුඩව කැරලි ගැසීමට පටන්ගත්හ"

(ඇස්. ජී පෙරේරා පියතුමංගේ ලංකා ඉතිහාසය)

ඌවේ මහ බලසේනාවද රජුට විරුඩව නැගී සිටියාහ.

සූයසිං වංසෙහි නිරිඳුන්හට මේ දුක්ත ද
නැසසිං ලොව සත කිවේ අඩමින් ඉකිබි ද
දියසිං ගුණ නැති නව සඳි.........ත ද
*හාසසිං කි කාරියවත් නැසීවද එ ද

ලකලු බෝදිසත් අප නිරිඳුව සදිකර රොසේ
.........සදි එරජුට එක්වෙන සෙද එක කුසේ
කුරුලු රැනකට කැටක් ගසන ඉසුරුනු ලෙසේ
නැබුලු එරජ මහ සෙනගක් ඉසුරුති සහ ඇසේ

දිමුත් රුවැ'ති ඒ 0වෙල්ලස්සේ මහරට මැදේ
නුමුත් ගනට වත් ගිත් පහකර එහි වැඩ ඉදේ
නැකැත් පුරුදු ගනි නැදුරන් ගෙන්වංගන සොදේ
Fමහන් සාර ඔබ පරණ පියසෙහිවැඩ ඉදේ

ඉදුල් පතින් බත්ගානක් දුන් සතොං සිතේ
නිමල් ගුනය පෙන්වයි වෙන සිට වෙති සල මිතේ
විපුල් ඉසුරු දුන් සෙතරත් මහ නිරිඳුට දූතේ
....... බෑරෙන්තු විපරත් නැත දූතේ

ඔ හෝ දුරක් එගොසින් සමුදුරයෙන් එගොඩ ටං
අ හෝ ඉසුරු විඳ උත් මට සක්දෙවි විලස ටං
ම හෝ ගයසෙ දුක වනි ආවෙත් සිංහලය ටං
බොහෝ දුකක් වදහල නැන ඒ හදි මැති හ ටං

දි ග න් තරේ පවනිත මෙරජුගෙ අනසක බලේ
එ ඩ න් කාරපි එක යුදයෙන් නැමූ ලෙස දිය කලේ
නොමින් වෙහෙසදී නිරිදුට සහ සෙනගට දුලේ
ල මි න් වාසි එසදෙහි ගොස් ¦පස්සර වෙලේ

---

*රන්මල්ගොඩ කුමාරිහාමි

0වෙල්ලස්ස ඌව පලාතට අයත් ප්‍රදේශයකි. බිබිල ග්‍රාමය එහි ප්‍රධාන ස්ථානයයි.

Fපරණගම.

¦පස්සර – බදුල්ලේ සිට මඩකලපු මහ මාර්ගයේ බදුල්ලට මයිල 1? ක් ඈතින් පිහිටා තිබෙන නියම් ගමකි. දැනට ඌව පලාතේ සිව්වෙනි නගරයයි. මෙහි ආරෝග්‍ය ශාලාවක්ද පොලීසියක්ද සුලු නගර සභාවක්ද දැනට පිහිටුවා තිබේ.

එබසට මදකුත් බොරු නොකර පාතම වන්නි තිරිඳු
මූගෙ අවගති දූත තල්පත් ඇර මාතොට යෘ
බෝඝොස වඩමින් එසඳෙහි තම්මිට නවරත්න නිඹිඳු
ඒ වාසගත් අසමින් හසකර එමවිට යා

තුන්තෙත සරි තෙදැති තවරත්ත තිරිඳුගෙන් සමුගෙන
පතින එසෙත්තේ හදියාවෙතට රොසින් තේ
උත්තැති නුත් වැටී සතර ගාතයෙන්ම රිංගාගොස්
බල්මාදෙන් ඇස තැරම ඔලුවන් දුන් තේ

මාහ බරතයෙන් වැජඹෙන සෙතරත් මහරජතුමන්ඩ තනා
දෙවූ තෝ හැමටම ගරුකාර් . . . . . . . ලාශේ
යුත් පරවර . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . කුමන සසද තෝ ලද්දේ සදිකර ලාශේ

ස ත් පත යුතු සිරිපද යුග තිසි ලෙස මා
නී ත් තම වැද මැද සිට . . . . . මෙස මා
වෙත් වී සදි කළෙන් සෙනරත් රජුඩ පෙ මා
අ ත් වෙයි තට අට මහ නරකාදිය මා

*උනි නම් සඳිය නොකරම දෙරව පෙ මින්
දි නි වැජඹෙය සත සතුවු කරව මින්
තු නී වී ගියයි මුදලුත් විකුනා ක මින්
වැ නී ඇවිදීය දූත් කොයි අතක යෙ මින්

---

*49 වෙනි පද්‍යය. මෙහි අදහස මෙසේය:- 'පෙරලිකාර් අන්තෝනියෝ බැරුත්තු කුමරු උඩ-පාත දෙරටයෙහි යුධ කල කෝලාහල නොකර සිටියානම්, වැසියන්ගේ සිත් දිනාගෙන දිනී වැජඹී සිටින්නේය." යනුයි.

"මේ වීරවරයා (අන්තෝනියෝ බැරුත්තු කුමරු) මායාදුන්නේ කුමරුගේ අභිවෘධිය නොසලකා කෘර අංඥාදායකයෙකු සේ ක්‍රියා නොකර සිටියේ නම් සිංහලයින්ගේ අභිමතය පරිදි සවදේශක කුමාරයෙක් ඔවුන්ට ලබාගන්ට තිබුණි."

(Revd: Father Fernando Queyroz's Conquest of Ceylon)
(කීයුරෝස් පියතුමන්ගේ ලංකා විජය ග්‍රන්ථය ඉතිහාසය)

අවිස්වාසමාලේ කව්වාගෙන්. කිච්රෝස් පෘතුගීසි ඉතිහාසකරුගෙන්, අන්තෝනියෝ බැරෙත්තුගේ යුධ පිළිබඳ කියුම් එකාකා සමානයි.

මුවත් සම්භසාගෙන සඹ පිඹින කල
එවත් තල වැදී උනුවේ තම් යග ල
මෙවත් අප සෙනග ලෙත් තැගි සුසුම් තල
සෙදිත් උනු නෙවද දූජතා තමැති ගල

සේ වා පිතැති මහ තිරිඳුති සුවිපුල්ලේ
කි වා බසක් බොරු තැත මතුවන එල්ලේ
ගා වා . . . . . . . . . හදියා සිටිතා තුල්ලේ
ලු වා වැත්ත මියෑ ගෙවලන් මල්ලේ

පෙත්තා හරිත් අත්න බිත්ත බස් හදි මැති තොලසිත්තා
මන්නා මායාදුන්නේ තල්පත් ඔහු ඇරලා ගෙන්නා
දුන්නා රටතොට අෑලි සිල කුඩ කුනම් සමගින්නා
අත්නා දූත් විස එරජු ලවා දෙවනුත් එ මුගුරු මත්තා

එතනදි සරු අත් බවක් පැහැදි මැතිඳු කීය
තෙපුලක් අවිසම්ත්තේ
මෙතනදී පිටත්වී එකද ගොසිත් කොටම්
උඩරටත් සහ කොළඹ උත්තේ

සුබේ ගුන එ මායාදුන්නේ රජු වදාරත බසක්
එබසට නොම වංකා
නුඹේ උත් සහ ඇනෙහි මගෙ පිත අඩු කලට
කෙසේ සිඳු වෙද සිරි ලංකා

අදි මෝඩකම්න් උගෙ බොහෝ සිත වසිර බැඳ
තමත් සෙත් සහ ඇවිත් පැතලා
සදි කරා වායා යත තමක් ලැබ ගතිය දූත් තතෘ
දූත් රජුට සදි කරලා

සැපේ විද බොහෝ කාලයක් ඉන්නු පිතැති තමද
සිරිපද යුග දිමූත්තු
අපේ පිතැති බැදි නුඹේ පිත කෙසේ මතුවේද
අවගුණ බැරෙත්තු

අ තා යක පරංගින් අතින් ටොකූකකා ගෙරිඇට
උලංකැගති පාම් ත්තේ
ගොනා දිසි †කරා පරවර කෙසේ අවි අතට
ගත්තෙද පෙම් ත්තේ

කාරාවුන්නෙකුත් හැ මං
අත පාරවා පුදමින් හැ මා
කතා දෙවු තිරිඳුට පෙ මා
සලවිය ලකතල තව සදි ක මා

එවෙනි දුකින් සිත විලි ගෙ තේ
ඉන්තා තැන දෙමතස්වි අ තේ
මෙවෙනි වගත් එම රජුගෙ තේ
බියවති තැගි දිය ගිත්තක් මෙ තේ

ගරු කරවා නතතුරු දෙම් ත්
තිරිඳුත් හට තෝ පැත සදි කෙලෙ ත්
කරා බරෙත්තු තිසි ලෙසි ත්
ඉසදෙසි සිල්වාරත් දවසකි ත්

---

†The PARAVARS had a succession of Kings among them, distinguished by the hill of ADIYARASEN, some of whom seem to have resided at UTTARA KOSHA MANGAY, a place of Hindu pilgrimage in the neighbourhood of RAMNAD"

(Vide, Royal Asiatic Society's Journal (Ceylon branch) Vol. 18. Article 8. By Simon Casie Chetty, District Judge)

භාවය:- "අදි අරශන් කඳු හේතුකොටගෙන පරවර වංශිකයන් අතරේ රජ කෙනෙක් තෝරා ගැනීම සිදුවීතිබේ. ඔවුන් අතර සමහර දෙනෙක් එකල උත්‍රකෝෂමංගේ නැමැති ස්ථානයේ පදිංචිවී සිටි බව දැනගන්ට ලැබේ. එය රාමනාද් පුරය අසල හින්දු පූජනීය ස්ථානයක්වූ මංගේ නගරය වන්නේය."

(රාජකීය ආසියාතික (ලංකා ශාඛාව) සඟරාව 18 වෙනි කාණ්ඩය. 8 වන වගංතිය. දිස්ත්‍රික් විනිශ්චයකාර සයිමන් කාසිචෙට්ටි මහතාගේ ලිපිය)

සදිකර රට කත්තට ගොසි ත්
*බැම කන්නාට විය දූන් අප අනි න්
හංස ගමින් යත්තට ගොසි ත්
බැරිළනු වෙති කපුටත්ගෙ ගම ත්

මෙබු විකලා හිමි සෙතරත් රජුගෙ පසි ද්දේ
පද කමලා වංසලි වැඳ වැඳ සු ද්දේ
නැණිත බලා ‡මාදම්පෙ බරෙක්තු අබ ද්දේ
සදිකරලා තෝ මොත පාරව්වුද ල ද්දේ

ස මා ගවන අප දෙරට සෙතග ගෙත බේද යා
යො මා එ දෙස දෙමුතෙත් ගොස් වැද පැරදි යා
යො මා ඔක්තවුන් හට දීමත් කුරි සාදි යා
ද මා වොක්ක ඉස කපති තගේ ඒ නාදි යා

හ සා කුලග මාගාදූක්තේ මහරජු ස දා
දි සා දිසාවල පවසත යත කසමින් ක දා
තො සා වෙමින් ඇල්ලූ §රාගල රණබිම එ දා
ති සා දිව යයි සිතමින් ඇර බිදුතේ එ දා

නැතත් සිංහලේ දූන් මට සෙතත් පලමු උන් පියස
වෙත වෙත එකකු ගරුද මෙමට වදුරමි ත්තේ
ම හ ත් වේගයෙන් උමතුව වැඹඉත්ත කල සතොසව
උදහස්වී තරහිදු සඳ මායාදු ත්තේ
බෝග නෙක දූන් සෙතරත් රජුටත් පැත සදිකරමින්
කරපු අවිස්වාස බවට අපත් එ ගෙ ත්තා
මානිය දස දින ඇතුලත මූගෙ ඉස ◦පාත මරව්වූ මග
නිත කියා යදි උදහසිත් වඩි මි ත්තා
පැතලා අව්වමට ගොසිත් ඉඳලා ඉඩිමට රොසිත් එරට
වත්තිත් එත පුරුකර බොරු බි ත්තා
.........සිත දුෂ්ට කමින් වඩිගක්කට්ටය කරමින් ඇණ
ඇද්දවි තැන තැන අඩගස්සවමි ත්තා

---

"*අප අතින්"කී හෙයින් අවිස්වාසමංලේ කව්වා පරංගි පක්ෂයේ කෙනෙකු බැව් මෙයින් හැගේ.

‡මාදම්පේ – කඩුපිටි මාදම්පේ, හලාවත අසල පිහිටා තිබේ. අන්තෝනියෝ බැරුත්තු කඩුපිටි මාදම්පේ ග්‍රාම වැසියෙකි.

§රාගල – උඩපුස්සැල්ලාවේ පිහිටා තිබේ.

◦පාතමරව්වූ – මාතර පලාතේ හේවා බල ඇණිය.

උඩරට මහනිරිඳුට සදිකල තවසදියා ෂානම ඉදින
එ *නාවරත්න රි ඤු
බළ බැටදී උගෙ සෙනගට උගෙ ඔළුවත් ගෙනෙමු
කිව් මහතොට සෙත් වදහල බස් අසා පබ ඤු
බුදුකුරු සුක් අප නිරිඳුට කලෙත් සදිය වැද වැද සිට
කියන බස බොරු නොමවෙයි අසත් දිම් ත්තු
............................අතින් ටොකු කාගත
ඉස දෙන්දූසි......................බරෙ න්තු

§පවර බරෙත්තු සදිසරලත් මෙස ද
කරදර රුදු අයස බිජු අරගෙන තොම ද
බොරකර අප සෙනග හෙත් කඳුලෙත් ත්බ ද
තිරකර ලක් කෙතෙහි වපුලත් වේය ම ද

---

*දෙන් ජුවන් ධම්පාල රජුගේ බෑණකෙනෙක් වන දෙන් කොන්ස්ටන් ටැයින් නවරත්න.

§මේ කාව්‍යයෙහි මුලින් කරාවේ බැරුත්තු කියාද පසුව පරවර බැරුත්තු කියාද ලියා තිබේ. කරාව සහ පරවර යන කුල දෙක එකක්ම බැව් මෙයින් පෙනේ.

කෞරව සහ පෞරව යන වංශවලින් මේ වංශ නාම දෙක පෙරලාගෙන තිබෙන බැව් සැලකිය යුතුයි.
පරවර කුලයේ කුමාරයකු පිළිබඳ විස්තර මෙසේයි.

To.
**The Prince of Paravars**
at **Tuticorin**

COLOMBO.
16th September 1815.

I am directed by the Honnrable the Chief Justice to request that you will have the goodness to forward for his Lordship's information with the least possibie delay the Laws of Customs of the **Paravars** of **Tuticorin** upon which the civil cases and other disputes are decided, particularly. Such as concern inheritance, Do wry, Adoption, Possession of Grounds, Gardens, etc , Gift for donations, Mortgage, Hire, Purchase and sale of male and female slaves, loans of money, upon interest, etc.,

I am the Honour to be.

Your Obedient Servant
V. Wm: Vanderstranten.
Acting Registrar

දුම තුම නොවන ශෙලකින් සුතු ඛාරාවා
ඉට නුහතත් ඇති.................. ඛාරාවා
සිට සදි කලෙත් නිරිඳුට මතු ඛාරාවා
බැට මිස රටක් නැත තට සදි ඛාරාවා

(බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ නැත්පත් අංක. P8098 / OR6606 (156) දරණ පුස්කොළ පොතේ (අවිස්වංසමාලය) (පොටෝ ස්ටැට්ස් පිටපතෙන් උපුටා ගන්නා ලදී. A. F. Gomes' photostat copy)

මෙම කාව්‍යයෙහි කතුවරයා වන හාගසිංගත් අලගියවන්න මොහොට්ටාලත් පරංගි පක්ෂය ගෙන සිටි අය වූහ. අයස්මාලයත් කොස්තන්තීනු හටනත් මධ්‍යස්ථව කියවන්නෙකුට මේ දෙදෙනාම පරංගින්ගේ ප්‍රසාදය දිනා-ගැනීමටද සෙනරත් රජුට ව්‍යාජ අනුකම්පාවක් දැක්වීමටද නම ප්‍රබන්ධ ලියා තිබෙන බව මනාව අවබෝධ වේ. මේ කාව්‍යය ප්‍රයෝග දක්ෂ පරංගින්ගේ අනුශාසනා පරිදි සෙනරත් රජුට යවා රජු අන්තෝනියෝ බැරෙන්තු (ඌවේ කුමාරයා නොහොත් උඩරට යුව රජ) හා තව තවත් විරුද්ධ කරවීමට යොදාගත තිබේ. සෙනරත් රජුට විරුද්ධව ඇරඹුනු කැරැල්ල ආරම්භ කරණ ලද්දේ උඩරට වැසියන් විසිනි. ඊට හේතුව "උඩරට රාජධානිය පෘතුගාලයට කප්පන් ගෙවන යටත් විජිතයක් වශයෙන් පිළිගනිමින් සෙනරත් රජ පරංගින් සමග ගිවිසුමකට අත්සන් කළ බැවිනි."

ඒ එසේමැයි:- "සෙනරත් තමා පෘතුගීසින් සමග සමාදාන වීමට සතුටු බව දන්වා සිටියේය.... ............... අසවේජ්ජද එයට එකඟ විය...........අවසානයේදී උඩරට පෘතුගාලයට කප්පන් ගෙවීමටද සතුටුවූහ."/

"මින් පෙර කවදාවත් පෘතුගීසින්ට අවනත නොවූ උඩරට වාසීහු මෙයට තදින් තම විරුද්ධත්වය පෙන්නූහ. ඔව්හු (කෞරව වංශයේ) අන්තෝනියෝ බැරැන්තු (ඌවේ කුමාරයා නොහොත් උඩරට යුවරජ) යටතේ කැරැල්ලක් අරඹා රජු අගනුවරින් පලවා හැරියෝය. (ඇස්. ජී. පෙරේරා පියතුමාගේ ලංකා ඉතිහාසය පිටු 126 127,)

කොළඹදීය. 16. 9 1815

"තුත්තුකුඩියේ පරවර වංශික
කුමාරයාතෝ වෙතටයි"

"වංශාධිපති අග්‍ර විතිශ්චයකාර තුමන් විසින් මට ආඥාකර තිබෙන වගංතියේ ප්‍රකාර තුත්තුකුඩි වැසි පරවර වගීයා කෙරේ බල පවත්වන නීති වාරිත්‍ර, සිවිල් නඩු සහ අනිකුත් ආරාවුල් පිළිබඳ සිරිත් විරිත් යනාදි විස්තර උරුමඃ පාඩු දෑවැද් ගණුදෙනු, ඉඩම් කඩම් බුත්තියද, ත්‍යාගිකර, උකස්කර, බදුකර, වහලුන් සහ වහලියන් මිළට ගැනිම සහ විකිණීම, මුදල් පොළීකිරීම යනාදිය සම්බන්ධව පවතින සිරිත් සියල්ලමද ප්‍රමාදයක්වත් නොකර උතුමාතන් වහන්සේගේ දැනගැනීම පිණිස කරුණාවෙන් දන්වා සිටිනසේ මෙයින් ඉල්ලා සිටිමි."

ගෞරවයෙනි, ඔබගේ කීකරු
මෙහෙකාර මම වන්නෙමි.
වි. විම් වැන්ඩර් ස්ට්‍රැන්ටන්
වැඩබලන ලේකම්තැන.

(තුත්තුකුඩියේ ඇම්. ඒ. පීරිස් පඩිවරයා විසින් සකස්කර ජේ. පී. රුද්රිගස්, පී. සී දෙවොට්තා, ටී. ඇල්. දෙවොට්තා ඇම්. ඒ. යනාදීන් විසින් එක්සත් භාරත සංගමය වෙනුවෙන් මද්‍රාසියේ නො: 2141 දරණ බ්‍රොඩ්වේගී සුදන්තර වීරන් යන්ත්‍රාලයේ මුද්‍රිත "පනිමය මලර්" නැමැති දෙමළ සඟරාවෙන් උපුටාගත්තා ලදී. 155 වෙනි පිටුව)

(Copied from "Panimayamalar" Tamil Magazine composed by, M. A. Peiris Vidvan, printed and published by, J. P. Rodriguez P. C. Deottah, and T. L. Deottah. M. A. for the Bharatha United Sangam, Tuticorin, at Suthanthara Veeran Press 2141 Boadway Madras—Page 155

# කොස්තන්තීනු හටන කාව්‍යය.

සීතාවක පුවත ර
වැඩුණු මායා තරම ර
ඔහුට සහ මුනුබු ර
පෙරලි සහ ලකතු ර

පැරද ගොස් බිය වැ ද
සොලිරට එක් ගමක ඉ ඳ
බිසවුත් සමග සො ඳ
එපුර වැස උන් ස ඳ

අන්තෝනි බැරැත් තු
පෙරලි සහ ලක පත් තු
සොලී රට ඈර යු තු
ගෙන්නා නිරිඳු බලග තු

එ මායාදුන්නේ ර ඳ
සහ අන්තෝනි බැරැත්තු ඳ
*අප බල නොදැක හ ඳ
පෙරලි අරගති වන්නි බඳ ඉ ඳ

කපටත් අසත් ගුනසත් යුතු උඟ නොම දේ
ඇසුවොත් ‡බරෙන්තු පැවසූ තෙපුල් හැමස දේ
සෙනරත් නිරිඳු හට වූ සදිය නිවර දේ
ඔබටත් නොබෝ කලෙකින් හිමිසඳිනි යෙ දේ

---

*"අප බල" කී හෙයින් අලගියවත්ත මොහොට්ටාල පරංගි පක්ෂය ගෙන සිටි බව එයින් හැඟේ.

‡අන්තෝනියෝ බැරැත්තු නැමැති උඟවේ යුව රජ දහඅට අවුරුද්දක් පමණ නැගෙනහිර පලාත, මධ්‍යම පලාත ඌව පලාත, දකුණු පලාත, සබරගමුව යනාදියෙහි සර්වාධිකාරයෙකුමෙන් ක්‍රියා කර තිබේ.

මහත් ඉසුරු දුන් සෙනරත් නරනිඳු ට
පැවත් තරඟ දූත දූත ඒ සිඟි නොසො ට
*බරෙත් තු නම් ගුණ මද දුදනං බස ට
ඇවිත් මේදුක විය හිමි සඳිනි මේතුඹ ට

අසත් දුදන පැවසූ බස් ගෙන සිත ට
මහත් අත සතකි තෙපල පෙර සි ට
බරෙත් තූ මැත් පැවසූ බසසා ඔබ ට
විපත් උවෙත් සැකකර දුටිමි අත්පි ට

අන් තෝනි බරෙත්තූ කී බස අබද් ද
දූන් බල බලා හිමි සඳ ඔබ පැරද් ද
පින් කල තැනයි තිරිඥෙ නම් පසිද් ද
මින් මතු දුදන පැවසූ බස් අසද් ද

---

*එවකට පෘතුගීසීන්ට අයත් සිංහල හට හමුදාවල සේනාපති තනතුරු දැරූ දෙන් ප්‍රනාන්දු සමරකෝන් මුදලිඳු යටතේ සේවාකම් කල සිංහලයෙකි. යම්කිසි කරුණක් නිසා සමරකෝන් මුදලිඳුගේ සහෝදරයා මරා පෘතුගීසි සේනාවෙන් පැනගිය මේ හැඩිදෑඩි බරෙත්තු පසුව මාතර සබරගමුව යන පෙදෙස්වල පාලකයා විය. "කුරුවිට රාල" යන නමින් ප්‍රසිඩවූ බරෙත්තු ඒ ප්‍රදේශවල ආණ්ඩුකාරයා විය. ඉතා සුලු ආරම්භයක් ඇති බැරෙත්තු පෘතුගීසීන්ගෙන් දියුණුවී. පෘතුගීසීන්ටම විරුඩව කටයුතු කිරීම ඔවුන්ට නොදැරිය හැකි වුවත් එවකට පෘතුගීසි බලය දුර්වලව තිබුණු නිසා බරෙත්තු මැඩපැවැත්වීමද අසීරු කරුණක් විය. කවද තමුත් පෘතුගීසීන්ගෙන් පහර ලැබේයයි දැනසිටි අන්තෝනි බැරෙත්තු ඊට ප්‍රතිකාර වසයෙන් සෙනරත් රජු පහදවාගෙන ඒ සිංහල රජතුමාගෙන් ඌව තුන්කිඳ පලාත්වල පාලනය ලබාගෙන සූදානමෙන් සිටියේය. උපක්‍රම දක්ෂයෙකුවූ බරෙත්තු පසුව සෙනරත් රජුටත් විරුඩව එවකට ඉන්දියාවට පලාගොස් සිටි මායාදුන්නේ කුමාරයා ගෙන්වා ඒ කුමාරයාට තමාගෙ පක්ෂයේ රජකම පවරාදුන්නේය. මේ පුදුම සිංහල අධිපතියා 1620 දී මාතර දිසාපති තැන විසින් මරණ ලද්දේය.

(කුස්තන්තීනු හටන සාරාංශය)

ම හ ස ත්  ගුනැති සෙතරත් රජුට නිවර  දී
ම ළ කු ත්  නොසලකා සෙද්‍රවෙන් නපුර ස  දී
ගු න ව ත්  අසත් කුණුවිම ඇති බසට යෙ  දී
විදුවොන්  ඔබට මතුවට අවැඩ නිවැර  දී

ගු න යු ත්  නපුරු කුරුවිට මැති බස අස  ද
ස හ ප ත්  කොට සිතාගෙන චිත් තර මේසු  ද
රිවි ගොත්  රජුන් කල කත් නොම විදි දුක  ද
ඔ බ ල ත්  රජ ඉසුරු හිමි සඳ දූත් සොඳ  ද
(අලගියවන්න කොස්තන්තිනු හටන)

## ඌවේ පැරණි සන්නසක්.

ඌව පලාතේ වියලුමේ සමුද්දර ජයගත් ප්‍රෝහිතබ්‍රාහ්මනලාගේ මුතුබංඩාරගෙ පුස්කොල පොතේ පිටපතකි.

වේයන්, මීයන් විසින් අඩක් විනාශ කරණ ලද මෙම පොතේ අග මුල පුස්කොල පත්‍ර නැතිවී තිබේ. ඉතිරිව තිබෙන පත්‍ර 15 න් බොහෝ කොටස් විනාශවී තිබෙන බැවින් පොත සම්පූණියෙන් නැත. (මේ ඉතුරු කොටස් වලින් ඌවේ තොරතුරු සහ ඌවේ යුව රජ (අන්තෝනි බැරුත්තු කුලසූරිය වැදිපේරුවේ මුදියන්සේට යුව රජකම්දීපු වග දැනගතහැකියි) මෙහි අත්හැරී තිබෙන කොටස් ඒ විනාසවී ගිය කොටස් බැව් සැලකිය යුතුයි. ...............කනක රජත මාණික්‍ය වෛඩූර්‍ය ..........වීපය මහානාර්ග්ග සතර මහත් විපයන් අතුරෙන් ජම්බුත්වීපය සකල මනෝහර .....කමල නිමල කෝමල දෙමල පට්ටනමෙහි සෛලාන්ත ගිරි මාලිගාභ්‍යන්තරයෙහි උතුම් පැතුම් පැවතුම් ඇතිව වැඩවංසය කරන දැකුම් ඇලුම් කැලුම් ඇති තමන් වහන්සේගෙ මනඃප්‍රිය තෛවෘති මැතියන් වහන්සේගේ රක්ත පල්ලවසේ දෙනොලීන් යුත් චඥන සුගන්ධ වහනය මද්‍රර ශබ්දගත සොඳුරු මුඛයෙන් ගිලිහුන කථාමාත්‍රයකින් තමන් වහන්සේගේ සිත් කුඳ... ........මිලානිකව එරෙහිව අක්නි විලාශයෙන් කෝපව නිදහුත් ශ්‍රී යහනවත් නොදත්නී.........මකු.........

උදකල.........තුත්තුකුඩි දෙමල රාජධානියට වැඩමකර වදලාහ..........මෙසේ තුත්මස් තුත්පෝයක් මනස්තාපෙන් වැඩවසන අවධියට ඉලංකෙ හෙවත් අපේ මේ ශ්‍රී ලංකාවිප-යට යමසි සිතා තමන් වහන්සේගෙ ඉර්ධානුභාවයෙන් එකර සිට මෙකරට ඟහත්පත්වී අනුරාධපුර රාජ්ජයට වැඩ දිවස් ලා බලා දෙමලෝ අගුනය ආගන්තුක සත්කාර පුරුදුනැත. ...........මෙසේ සිතා ..........ගැමුණු රජහු කරුණාවෙන් මෛත්‍රියෙන්.......වංෂික කෛතිරකඳ කුමාර දේව ස්වාමීන් වහන්සේ සිංහල රට හා සිංහල නරදේවයන් වහන්සේ හා ශ්‍රී සම්පතටත් දිවස් ලා සුඹූඨිය අඩුක්කු කලාහයි දතයුතුයි. එකල කාතීනික සැනකෙලියට කෛවතීත සේනාධිපති නම් අමාත්‍යයා ප්‍රධානිව හස්ත්‍ය අස්ව පාබල සෙනග හා චතුරාගිනී සේනාව. ක්ෂත්‍රිය කුමාරවරුද ප්‍රෝහිත බ්‍රාහ්මනවරුද එක් දහස් 500 ක් තරුන වියට සිටි රූප ශ්‍රී සම්පන්න කෛවතීති සහ බිසෝවරුද හාරසියයක් තටත සත්‍රින්ද කතරගම් රුහුනු රට බද කදිරාපුර ශ්‍රී සුන්ද මංදිර ..................... ගැබ වජ්ජ්‍රාසිංහාසන ........හූවට දිවස්.........මෙරද්ට සෙත සැලැස්සුහ......එවක් පටන් හුව රාජ්ජයට ධන ධාන්‍ය ආඪ්‍ය විය. කුඹුරු කෙත්වත් ගව මහිෂ ආදී සුප්‍රයෝග දියුනුවූහ. කලින් කලට රජහු ඇතිද ලෙස නැතිදුත් සහමයනිතෙත් ...ඇත්තේය. පුරාන අපිත සමයෙහි............යුඩයෙහි පැරද පලා යන රාවනා රජහු රාවනා සැහැල්ලෙහි අප්‍ර-සිඬව රාසින් හිරවී සිටියාය... ......කිඳ ඇතුළු...... රාජ්ජය නම් ගංපහෙත් සක්ගලින් කඩවත කන්දෙන් බල්ල කොටු ගලින් කඩසින් කඩවත් හතරෙන් සමා ........යුතුයි ......කන්දෙන් කන්ද කාවල් සිටියාහ. කඩවත් හතරට සතුරු මූනය දකුම් බැලුම් උන තැනේදී යක්කු හූහඩ හැර කාවල් සිටිති. එකල කන්දෙන් කන්ද යක්කු හූහඩ හැරපාන හෙයින් පැයෙන් බාගෙන් රජහුට සතුරු සෙනග ලංලංව යෙනි යනු සංඥාවෙන් අනුදනුම් ඇති. ඒ හෙයින් හූවෙන් හුව අඩහරපානා ඌවේයයි කීහ. මෙසේ කල් යත් යත් අවුරුදු තුන්දහස් තුන්සියයක් ඉක්මගිය තැනේදී හකා-රය උකාරයට හ්‍රස්ව......ආ......හුව ඌව......විය දතයුතුයි...

මෙසේ .. තුත් ......ඉක්බිත්තෙන් සිවල් රජහු සෙං කංඩ සිරි වස්තු පුරයෙහි රාජ මාලිගයට වැඳ පුරුතුකාතු බිසෝ නිසං හා කන්දෙ රට නීසා ඌවේ කුමාරසාමින්ට වෛරව ...... ..කුලවැදී බැදී උන්හ .. ..ඉටියෙන් තැනවූ ප්‍රතිරූපයක් බඳු පුරුතුකාතු බිසෝරූප සිරියෙන් අග්‍ර නීසං.........විරහ ......මහ අමාරුවෙන් ඔත්පලව තැගී හිටින්ට බැරිව බැරුත්තු කුලසූරිය වැදිපේරුවේ මුදියන්සේට යුව රජ කම් දෙවා පට්ටම බඳවා....................යනුයි.

**අන්තෝනියෝ බැරෙත්තු සහ පහතරට කැරැල්ල.**

"රක්ගහවත්ත සහ මීගමුව යන සථාන දෙක කළහ කාරයෝ වටලා දෙවසථාන බිඳ දමං පූජං ප්‍රසාදීත් වහන්සේලා මරාදමූහ."

සමරකෝන් රාළ තැති අතර මාතර දිසං වන්නියේ සෙනගද කැරළි ගැසූහ. එහි සිටි මූලාදෑනිහුද ගාල්ලට පලා ගියාහ. ජේදුරු ආබ්‍රෙව් ඉලංගකෝන් මුදලිඳුන් ද්‍රොහීවීම හේතුකොටගෙන දඹුවම් පමුණුවන ලද්දේය. අට්ටංපිටිය, මැණික්කඩවර, තලම්පිටිය, කුරුවිට, ඕපනායකේ, වලේවල සහ කටුගම්පොල නවතාසිටි ආරක්‍ෂක සේනාවෝ මහත් අන්තරායකර තත්වයකට මුහුණලා සිටියෝය.

මීගමුවේ කැරළි නායකයා ඒ පළාත්වාසියෙකුම වූසෙන් (වැල්ලේවිදියේ කුරුකුලසූරිය මුදලි) අන්තරායේ සිටි ආරක්‍ෂක සේනාව ශලවා ගැනීමට පෙර මීගමුව මුදගැනීමට අසවේඡ්‍ගේ කල්පනා කෙළේය. ඒ නිසා කාංගර ආරච්චි පිටු දැකීම පිණිස හෙතෙම *සයිමන් කොරයා පට්ටන් කාපිටි මහත්මයා පිටත්කර යැවීය

*පට්ටන්කට්ටි – පටබැඳි නොහොත් කරාවේ කුලයෙහි ප්‍රධානියා

තම මස්සිනාවූ දොන් මානුවෙල් මුදලිතුමාද සමරකෝන් දිසාපති විසින් යවනු ලැබීය. එහෙත් සමරකෝන් දිසාපති තුමාගේ ඉතා දක්ෂ ලස්කිරිඤ්ඤ කාරයෙක්වූ කුරුවංශික අන්තෝනියෝ බැරැත්තු නැමැති සෙබල වල්ලභයා විසින් දොන් මානුවෙල් මුදලි මරාදමා තවත් විශාල කැරැල්ලක්ද ගසා එහි නායකයාවිය.

අට්ටාපිටියේ ආරක්ෂක සෙබල මූල බිහිසුණු සටන් කොට කොන්දේසි සහිතව යටත්වූ නමුදු ඔවුන් මරාදමනු ලැබූහ කුරුවිටද අන්තෝනියෝ බැරැත්තුට යටත් විය. අන්තෝනියෝ බැරැත්තු අනතුරුව සීතාවකද (අවිස්සාවේල්ලද) වටලා ජය ගත්හ. පෘතුගීසීන් විසින් යවනු ලැබූ සුඩ කණ්ඩායමක් සීතාවක සිට ආරක්ෂක හමුදාව මුදාගෙන රුවන්වැල්ල සහ මැණික්කඩවර මුදාගනුවස්ගමන් කෙළේය.

තත් වේලෙහි විමලධර්මසූරිය රජු තලම්පිටිය වටලා බොහෝ අලාභ හානි කරන අතර පෘතුගීසි සේනාව පැමිණි බව අසා තලම්පිටිය යටත් කරගැනීම තාවකාලිකව නවතා දමා ඒ හමුදාව පිට කඩා පැන්නේය......................

විමලධර්මසූරිය රජුගේ මරණයෙන් උඩරටට සිදුවූ පාඩුව පිරිමසාගැනීමට කාලයක් ගතවිය. විමලධර්මසූරිය රජුගේ සුළු මැණියන්ගේ පුත්‍රයා වන සෙනරත් කුමරු විසිපස් අවුරුදු වයසට පත්ව සිටි වැන්දඹු දෝන කතිරිනා (මහ බිසෝ බණ්ඩාර) බිසව ආවාහ කරගෙන සිංහාසනයද ලබාගැනීමට තැත් කෙළේය.

එමෙන්ම මහනුවරට යටත්ව සිටි ඌවේ විදියෙ බණ්ඩාරද දෙනවක මායාදුන්නේ කුමරුද, ඒ උපක්‍රමයම යොදා රජ බව ලැබීමට මාන බැලූහ. තමාම රජකම් කිරීමට කාලයක් මුලුල්ලේම දෙන කතිරිනා බිසව උත්සාහ කළාය එහෙත් රදලවරුන්ද පෘතුගීසි හිරකරුවන්ද තම පක්ෂයට බඳවාගත් සෙනරත් කුමරු එයට බාධකයෙක් විය.

ඔහු විසින් විදියේ බණ්ඩාර මරනු ලැබුයේය. දෙනවකා මායාදුන්නේ කුමරු සොළී රටට පැනගියේය. සෙතරත් කුමරු වැන්දඹු බිසව ආවාහ කරගෙන රජවිය.

**කරාවේ කුලයේ අන්තෝනියෝ බැරැන්තු ඌවේ රජ විය.** ලැබුණු මද අවකාශයෙන් ප්‍රයෝජන ගැනීමට ඉටාගත් අසවේදෝ තමන්ට අහිමිවීගිය පළාත් නැවත ලබාගත්තේය. එහෙත් කාංගර ආරච්චිට හා අන්තෝනියෝ බැරැන්තු නමැති ඌවේ කුමාරයාවත් කිසිවක් නොකළ හැකිවූයෙන් ඒ දෙපොල පෘතුගීසින්ට විරුද්ධව නොකඩවා ක්‍රියාකරගෙන ගියෝය.

අසවේදෝට සිංහලයින්ට විරුඬව යුඬ වැදීමට තරම් ශක්තියක් මේ කාලසීමාව තුල ඇතිනොවීය.

අළුත් සේනා ලැබෙන අපේක්ෂාවෙන් අසවේදෝ රටේ නොයෙක්දිශාවලට සේනා යවා වැසියන් බියපත් කලේය. තැගෙණහිර වෙරළාසන්න පළාතට යවන ලද සේනා බිම්තැන්න වෙල්ලස්ස, පානම මඩකලපුව සහ ඌව යන පළාත් සැරිසැරූහ. වර්ෂ 1906 දී අන්තෝනියෝ බැරැන්තු ඌවේ කුමාරයාට විරුඬව ඌව පළාතට සේනාවක් යවනු ලද්දේය. මේ සේනාවට මුහුණ පෑමට තරම් බැරැන්තු කුමරු එඩිතර නොවීය එහෙත් හේ මේ සේනාව වලකමින් එයට හිරිහැර කරමින් තනිව අසුවන හේවායන් මරමින් සිටියේය.

මේ අතරතුර අන්තෝනියෝ බැරැන්තු කුමරු සබරගමුවට පැමිණ පෘතුගීසි කොටුව මුරකළ සේනාංගය අල්ලාගෙන රයිගම් කෝරළය යටත් කරගත්තේය. මාතර සිටි ලස්ක්‍රිඤ්ඤ හේවායන්ද පැන ගියෙන් දිශාපති තුමාට ආරක්ෂාව සඳහා ගාල්ලට පැමිණීමට සිදුවිය පෘතුගීසින් නැවතත් යුඬ භූමියට පැමිණ කැරලිගැසූ ගම විනාශකර

§ නිකපිටිය (පරණ කරුරම විජසූරිය නයිදේ) හා අන්තෝනියෝ බැරැත්තු කුමරු සොයා ගියමුත් ඔවුන් අල්ලාගත නොහැකිවිය.

---

§ පරණ කුරු කෝරලේ කුරුවංශික නිකපිටියේ ක්‍රිස්තියානි අංගම වැළඳගත් තැනැත්තෙකි. පෘතුගීසීන් කෙරෙහි රහසිගතව ක්‍රෝධයෙන් සිටි මොහු සීතාවක හිටපු රජවූ නිකපිටියේ බණ්ඩාර "මම" යයි ව්‍යාජයෙන් මහජනයාට සහ රජුටත් දන්වා සිට රජතුමාගේ ආධාරයෙන් කැරැල්ලක් ඇතිකර පරන්ගිංට පහරදී ඔවුන්ගේ මාතියාගම, මැණික්කඩවර, සතර කෝරළය ආදී ස්ථානවල තිබුණ පරංගි බලකොටු විනාශ කර ජය ලබාගෙන උද්දාමවූ නිකපිටියේ ඥාන කන්‍යා බිසවගේ දියණියක් සරණ පාවා ගැනීමට ඉල්ලා රජු වෙත පයිණිඩයක් යැවිය. ඒගැන කෝපවූ රජතුමා (සෙනරත් රජ) ආධාර වශයෙන් දුන් සේනා ආපසු කැඳවා ගත්තේය.

මෙසේ රජ පවුලෙන් කුමාරියක් සරණකර නොදීමට හේතුව නම් මොහු නියම නිකපිටියේ බණ්ඩාර නොවන බව රජතුමා දැනගත් සෙයිනි. මොහු නියම නිකපිටියේ බණ්ඩාර බව රජතුමා පිලිගත්තේනම් මේ විවාහයට කිසි-සේත් විරුඩ නොවේ. එම නිසා මොහු නියම නිකපිටියේ බණ්ඩාර නොවන බව මේ කරුණෙන් පිළිගත හැකිසි.

**සපරගමුව හා මාතර දිශාවල ආධිපත්‍යය දරාගෙන සිටි ලාමේ කුමාර අන්තෝනියෝ බැරැත්තු** ලුහුබැඳ යෑමට පෘතුගීසීන්ට හැකිවිය. මෙසේ කාර්‍යක්ෂමව සිටිනාතර හක්මන සිටි ලස්ක්‍රිඤ්ඤ හේවාසින් පලාගියාහ. **අන්තෝනියෝ බැරැත්තු *කුරුවිට මහා මංත්‍රී** බේරුවලට කඩා පැන එතනින් හතර කෝරළයට පැමිණියේය. **අන්තෝනියෝ බැරැත්තු** සහ කාන්ගර ආරච්චිලත් අල්ලාගැනීමට නොහැකිවූ පෘතුගීසිහු නිදැල්ලේ සිටියෝය.

---

*මේ භීම වික්‍රම කුරුවිට රාළ නොහොත් අන්තෝනියෝ බැරැත්තු නැමැති කරාවේ යුවරාජයා ගැන තවත් කියුම්:-

වෙනුමෙන් විකුම් ඇ නි
පවර කුරුවිට මිහ මැ ති
මෙර සිත් මෙන් බලැ ති
මිහත් මාතොට මංත්‍රි අදිප තී

(පරණ කුරුරටි රදල පේරුවේ අලුදෙණියේ මේසසූරිය කිවිඳු)

අන්තෝනියෝ බැරැත්තු කුමාරයා කුරුවිට මහා මංත්‍රි කමටද මාතර මිහා මංත්‍රි කමටද පත්වී සිටිය බැව් මෙයින් වැටහේ.

"දකුණු පලාතේ මුහුදුතෙර පිහිටා තිබෙන මහ තැව් තොටප් මේවනතුරැම්, මාතර මාතොට මහකරාව කියා නම් තුණක් ව්‍යවහාරයි" (ශුද්‍රනීර්ණය දර්පණය 9 පිට)

සිංහල රාජාභිෂේක මංගල චාරිත්‍ර ධර්ම:- රාජාභිෂේකය සඳහා රතින්, රිදියෙන් සහ සාමාන්‍ය හක්ගෙඩියක්ද, ශතාදී හක්ගෙඩි තුනක්ද, ක්‍ෂත්‍රිය, බ්‍රහ්ම, වෛශ්‍ය, කුල කන්‍යාවන් තුන්දෙනෙක්ද සොයා ගතයුතුයි. රජකම ලබන තැනැත්තා වයස අවුරුදු 16 ක් ඉක්මවූ පිරිසිදු ක්‍ෂත්‍රිය පෙළපතින් පැවතෙන්නෙකු උදුම්බරා අතු මණ්ඩපයක් තුළ උදුම්බරා ආසනයක වාඩිවූ කල ඔහුගේ හිස් මුදුනට මංගල ඇඳුමෙන් සැරසුන ක්‍ෂත්‍රිය කන්‍යාව රන් හක්ගෙඩියෙන් පැන් ඉසිමින් රාජවංශිකයන් දශධර්මයෙන් ආණ්ඩු කළ මැනවයි කියයුතුයි. බ්‍රාහ්මන සහ වෛශ්‍ය කන්‍යාවන්ද රිදී හක්ගෙඩියෙන් හා

මායාදුන්නේ කුමරු කාන්ගර ආරච්චි හා බැරැත්තු කුමරුද මිත්‍රවී සෙනරත් රජු හා සමග විරුඬව මුළු නැගෙනහිර සමුද්‍රාසන්න ප්‍රදේශයම ඔවුන්ගේ අත් අඩංගුවට ගත්තෝය. ඉන්පසු මායාදුන්නේ කුමරු ලංකාවේ අධිරාජයා කිරීම පිණිස අති විශාල යුඬ හමුදාවක් රැගෙන දෙනෑක නම් ග්‍රාමයට පැමිණිය. **කොස්තන්තිනුද සා** එහා සපරගමුවේ කොටුවක් තනා දමරිකයන් හා යුඬකිරීමට ඉදිරිපත් වූයෙන් ඔව්හු දෙනවක අත්හැර ගියෝය ජනරාල් තැන තම සේනාව පලායන බව ව්‍යාජයෙන් අඟවා පසුව කළහ

*සාමාන්‍ය හක්ගෙඩියෙන් හිස මත පැන් ඉසිමින් තමතමන්ගේ කුල දශ ධර්මයෙන් ආණ්ඩු කළ මැතිවයි කිය යුතුයි. ඊට පසු රජකම ලබන තැනැත්තා ඔටුන්න ගෙන තම හිස මත තබාගනු ලැබේ. ලංකාවේ රාජ බලය, පිරිසිදු රාජ වංශිකයකු හැර අනිකෙකු ලබාගන්ට යෙදුනොත් ඔව්හු රාජද්‍රෝහියෙකු වශයෙන් සම්මත කරනු ලැබේ.

(පැල්ක් නැමැති ඕලන්ද ආණ්ඩුකාරයාට උඩරටින් ලැබුණු විස්තර)

"Appointed the Princes of Uua & Migomuwa Rala, guardians of his young sons and the Princesses, the daughter of the Late King"

(Percival Ceylon Page 25)

භාවයః- "ඌවේ කුමාරයා (අන්තෝනියෝ බැරැත්තු) සහ මීගමුවේ රාළ නැමැති කුමාරයා,ත් ඔහුගේ (සෙනරත් රජුගේ ලාබාල පුත්‍රයින්ගේද, අපවත්වී වදළ රජුගේ (විමලධර්මසූරිය) දූ කුමරියන්ගේද, භාරකාරයින් වශයෙන් පත්කර ගන්නා ලදී."

(පර්සිවල් ලංකා ඉතිහාසය පිටු 25)

"He was carried to DIYATILAKA, where on August 18 th (1613) a great council was held & Kuruvita Rala, (Antonio Barratto) & Migomuwe Rala, were appointed guardians of the young Prince Kumarasinghe, & regents in case of the King's death,"

(Portuguese Err Dr. Paul. E Peries. Vol. 1 Page 422)

කාරයින් පිට පැන කාන්ගර ආරච්චි අල්ලාගනුවිත්ම බැරැන්තු සහ මායාදුන්නේ දෙකුමරුන් බලාපොරොත්තු විරහිතව පැනගොස් දිවි ගලවා ගත්තෝය.

"උඩරට රාජධානියෙහි යුවරාජයාවූද, ඌවේ කුමාරයා හෙවත් ප්‍රතිරාජයා වූද, සපරගමුවේ මහ ආදිපාදයාවූ කුරුවිට රාල හෙවත් කුරුවිට මහා මංත්‍රි නඞ්න්ද ප්‍රසිඩව් සිට ශ්‍රී සිංහලය යුදශෙන් දස-අට අවුරුද්දක් දෙදරුම්කාල කුරුකුල ආදිත්‍ය අන්තෝනියෝ බැරැන්තු කුමරු මෙසේ අවුරුදු ගණනාවක්ම ගැලවී සිටි නමුත් පසුව සතුරන් හ‌ අසුව ඔවුන් විසින් ප්‍රසිඩියේ මරා දමන ලද්දේය.

(ගෞ: ඇස්. ජී. පෙරේරා පියතුමාගේ පෘතුගීසි සහ ඕලන්ද යුග, නැමැති ඉතිහාසය සහ තවත් පොත් ආශ්‍රයෙනි)

## සෙනරත් රජුගේ ශ්‍රී සඟ්නාස.

"අසනීප කම නිසාත් ජීවිතයේ බලාපොරොත්තු නැතිකම නිසාත් අපගේ ඇවෑමෙන් කටයුතු කිරීම පිණිස කුමාරයින් දෙදෙනෙකු පත් කරණ ලද්දේ රාජ්‍ය සම්බන්ධ කටයුතු පිණිස පමණක්ම නොව ඔවුන්ට හිමි කුමාරයාගේ ළදරු කාලයේදී සම්පූර්ණ බලය ඇතුව රාජ්‍ය කටයුතු පාලනය කරණ පිණිසයි."

---

*භාවය:- "එතුමාහන්ව (රෝගී සෙනරත් රජුව) දියතිලක නුවරට ගෙනගොස් (1613) අගෝස්තු මස 18 වෙනි දින විශාල සංගමයක් පවත්වා කුරුවිට රාළ (අන්තෝනියෝ බැරැත්තු) සහ මීගමුවේ රාළත්, ලාබාල කුමාරසිංහ කුමරුගේ බාරකාරයින් වශයෙන් පත්කරගන්නා ලදී.

"තවද රජුගේ (සෙනරත්) මරණය සිද්ධවුවහොත් ඔව්හු (උඩරට රාජධානිය) ආණ්ඩුකිරීමටද යොදවනු ලැබීය."

(ආචාර්ය පෝල්. ඊ. පීරිස් මහතාගේ පූර්වගීස් ඊරා. පොත. 1 වෙනි කාණ්ඩය. 422 පිටුව.

“අෂගේ රාජ්‍යයත් පළාත් ප්‍රදේශ, යන මේවා අප පුත්‍රයින්ගේ බාලාවස්ථාව තුළ පාලනය කිරීමේ බලය මොවුන්ට පැවරේ. අපගේ අවසානයෙන් පසු එක් එක් කෙනා තම තමන් සතු සියළු ආදායම්, ගණන් සහිතව මේ බලකාරයින් දෙදෙනාට දක්විය යුතුවත් හැර එසේ නොකරණ යමෙක් ඇද්ද ඔහු මරණීය දණ්ඩනයම යටත් විය යුතු බව දැනගත යුතුය.”

ඕනැවූ විටක එක් අයෙකුදු අනතැර සියළුම බල-වන්තයින්ට හා වංශවතුන්ට වාසලේ පෙනීසිටීමටත් ඔටුන්න හිමි කුමාරයා සහ රාජ්‍යය පිළිබඳ බලකාරයින් දෙදෙනා ඉදිරියේ සාමාන්‍ය දිවුරුම ප්‍රකාශ කිරීමටත් බලකරණු ලැබේ.

ස්වර්ණමය අක්ෂරයෙන් ලියැවුණු අපගේ මේ ශ්‍රී සන්නස මීගමුවේ කුමාරයාටත් (බොස් කුවුදර්) ඌවේ කුමාරයාටත් (අන්තෝනියෝ බැරැත්තු) ප්‍රදානය කරණු ලැබේ ක්‍රිමිනල් සිවිල් නඩු විසදීම් සම්බන්ධයෙන්ද මොවුන්ට බලය දුන් බව තවදුරටත් ප්‍රකාශ කරමු. ඒ නිසා අපගේ ආඥාවන් බලකිරීමත් සියලු රජවරුන්ද, කුමාරයන්ද, ආදිපාදයන්ද,, මණ්ඩලිකයන්ද, ආගමානුකූල ප්‍රධානින්ද වංශාධිපතින්ද, ආණ්ඩුකාරයන්ද, පළාත් පාලකයන්ද, නගරාධිපතින්ද' කප්පිත්තන්ද, සභානායක අනුශාස-කයන්ද, නෞකාධිපතින්ද, විනිශ්චයාධිපතින්ද හා අපගේ කාර්යයෙහි ව්‍යාවෘත අනුකාර්යාධිකාරින්ද, රාජ්‍යකාර්යාධිකාරින්ද, ශොවීන්ද, ස්වදේශීන්ද, සේවා-යන්ද, නාගරිකයන්සද, අතිකුත් සියලු දෙනාද, පොදු වශයෙන් හා පෞද්ගලික වශයෙන් ඔටුන්න හිමි කුමාරයා තිසි වයසට පැමිණෙනතුරු පළමු කියන ලද බලකාර කුමාරයින් දෙදෙනා රාජ්‍ය පාලකයන් හැටියට එකහෙලා පිළිගෙන පක්ෂපාතිත්වය ප්‍රකාශ කරණසේ දිවුරා අපට ගෞරව කරන ලෙස තරයේ ප්‍රකාශ කර සිටීමයයි වදරන්නමෝහ.

ක්‍රි: ව: 1613 වැන්නෙහි අගෝස්තු මස 19 වන දිනැ දියතිලක මහා වාසලේදීය.

(පිලිප් බෝල්ඩියස් දේවගැතිතුමාගේ ලංකා කථාව)

(A Discription of Ceylon by Revd: Phillip Boldeaus)

## කෞරව වංශාභිජාත අන්තෝනියෝ බැරැත්තු ඌවේ ඈපාණෝ පිළිබඳ වැඩිදුර විස්තරය.

## THE DEATH OF PRINCE RAJASURIYA AND ANTONIO BARETTO, PRINCE OF UVA.

The Prince Mahestana son of Don John (Wimala Dharmasuriya) and Dona Catharina, for whom the crown was professedly held, died on the 22nd August 1612 not without suspecions of having been poisoned by his step father, Cenwieraat, in order to secure the thorne to a son of his own.

The Empress Dona Catharina who was so much affected by the loss of her son, that she had taken hardly any nonrishment since his death, percieving her end was approaching, sent in July 1613, for **Princes of Miugone and Uva (Kurukula Antonio Baretto, Prince of Uav)** and after exacting from them and oath of fidelity made them guardians over her childrens brought into her presence, and kissing them one after the other, she earnestly adjured the two chiefs above menticned to protect them with constancy and affection.

after this, casting her eyes upon her husband Cenn wieraat, who was present, she charged him with having the cause of her death, though it does not appear that there was any ground for the accusation; but he is said to have taken it so much to heart, that it impained his health, and seemed to threaten his life.

The Empress breathed her last on the 20th of July, in the year of 1613. Before her death she expressed great contrition for her sins, and patricularly that of having conforaced to the sights of pagan worship.

The day after deciase, her funreral absequies, were performed with grate magnificence, in the same place when those of her son had recently received the same tribute of ceremonicus regurd.

After the death of the Empress, the sickness of the Emperor assumed such a dangerous aspect, **that he assembled his principal nobles and requested them to chooes two of their order to govern the Kingdom during the minority of his son, They selected the Princess of Miugone and of Uva (Antonio Baretto) for this important trust;** and they were accordingly appointed by the solemn act to exercise the supreme administration during the minority of the Prince.

The Emperor at the same time earnestly admonished all his children to obey these guardians of the realm as long as they were subjected to their controll.

The scene naturally leads us to expect that cennwierast would soon breath his last; but he appears to have survived for several years this delegation of the soveriegnity to two of the chiefs.

(History of Ceylon. Phillai, these P. 101, 103, 104. Colombo Museum Library Book. No. 6/k 25)

මෙහි භාවය:- **රාජසූරිය කුමරුගේ මරණය සහ අන්තෝනියෝ බැරැත්තු ඌවෙ කුමරු.** "කළුරිය කළ දෙන් ජෝන් (විමලධර්මසූරිය රජු)ගේ සහ දෝනා කැත්‍රිනා බිසවගෙන් පුත්‍ර රත්නයවූ ඔවුන්තට නියම හිමිකාරයාව සිටි ***මහ අස්ථාන කුමරු** (රාජසූරිය)වර්ෂ 1612 ක්වූ අගෝස්තු මස 22 වෙනි දින මරුමුවට පත්විය."

---

*රාජසූර්ය කුමරුට "Prince of Roosters" යන විහිලු නාමය ව්‍යවහාර විය. එහි අර්ථය පොර කුකුලන් කෙළවන කුමාරයා හෝ "කුකුල් කුමාරයා" යනුයි.
(ජෝන් රෙබෙයිරෝ ඉතිහාසය. viii පරි: 22 වෙනි පිටුව)

"සෙනෙවිරත් (රජු) ගේම පුත්‍රයෙකුට සිංහාසනය ලබාදීම පිණිස සවකිය සුළුපියා විසින් මහසථාන කුමරුට වසදී මරන්ට ඇතැයි යන අත්දමේ සංකාවක් මෙසින් පැනනැගුනේය."

"දෝන කතිනා එම්ප්‍රදෝරු රැජිණියට එතුමියගේ පුත්‍රයාගේ මරණය වූකලී තදබල පහරක් විය. මේ ඛේද ජනක මරණයෙන් පසු ඕ තොමෝ හරියාකාර ආහාර පානාදියක්වත් නොගෙන මෙන් කල් හැරියාය."

"ඇයගේ අන්තිම කාලය එළඹෙන බැව් වටහාගත් එතුමිය වර්ෂ 1613 ක්වූ ජූලයි මාසයේදී මීගමුවේ කුමාරයාව (බොස්ක්‍රුව්දර්) සහ ඌවේ කුමාරයාත් (අන්තෝනියෝ බැරැත්තු) රැජිණිය ඉදිරිපිටට පමුණුවාගන, තම දරුවන්ට පක්ෂපාතව ක්‍රියාකිරීම පිණිස ඔවුන් දෙන්නාගෙන් දිව්රුමක් ලබාගත්තේය. ඉක්බිති ඕතොමෝ තම දරු ලපටින් ඉදිරියට ගෙන්වා එකිනෙකාව සිප වැළඳගන්වා ඔවුන් කෙරෙහි ඉතා ලැදිකමින්ද ආදරයෙන්ද, ආරක්ෂා කරණ මෙන්, මේ ප්‍රධානී දෙපොලගෙන් බොහෝ ඕනෑකමින් ඉල්ලා සිටියාය."

"මෙසින් පසු එහි සිටි ඇයගේ සවාමි පුරුෂයානන් වන සෙනෙවිරත් (රජු) දෙස නෙත් යොමා ඇයගේ මරණයට හේතුව ඔහුගේ වරදයයි චෝදනා කෙළේය."

තමුත් ඔහු මේ අන්දමේ චෝදනා ලැබීමට තරම් වරදක් කර තිබුන බව සිතාගැනීමට ඉඩක් පෙනෙන්ට තිබුනේ නැත. එහෙත් එය ඔහු බොහෝදුරට හිතට ගත්තෙන් සිය සනීපයටද බාධාවක් විය. ඔහුගේ ප්‍රාණය හානිවේයයිද පෙනෙන්ට තිබුණේය."

"වර්ෂ 1613 ක්වූ ජූලයි මස 20 වෙනි දින එම්ප්‍රදෝරු රැජින (දෝනා කතිනා බිසෝ) අවසාන හුස්ම හෙලුවාය මිත්‍යාදෘෂ්ටි චාරිත්‍රානුකූලව එතුමිය මියයාමට පෙර පච්

ක්ෂමාකරවා ගැනීමද සිදුකරගන්නාලදී. ඇයගේ මරණයෙන් පසුවද එතුමියගේ පුත්‍රයාව නොබෝද ආදාහන කළ ස්ථානයේම ඇයගේ අවමංගල්‍ය කෘත්‍යය බොහෝ අලංකාර උත්සවයන් සහිතව සිදු කෙළේය.''

"එම්ප්‍රදෝරු රැජිණියගේ අභාවයෙන් පසු එම්ප්‍රදෝරු රජු (සෙනරත්)ගේ ගිලන් භාවය බරපතල තත්වයකට පත්වූයෙන් හෙතෙම තම ප්‍රධාන වංශාධිපති රදළවරු සියල්ලන්ම කැඳවා සෙනරත් රජු සවගීස්ථවෙන්ට යෙදුනොත් සවකීය පුත්‍රයාගේ ලාබාල අවස්ථාව තුළ (උඩරට) රාජධානිය පරිපාලනය කිරීම පිණිස එයට තිසි දෙදෙනෙකු තෝරා ගන්නා ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය.''

ඔව්හු මිගමුවේ සහ ඌවේ කුමාරසින් දෙදෙන මේ භාරදූර කටයුත්ත සඳහා තෝරාගත්තෙත්, එගාකාරයෙන්ම ඔවුන් දෙදෙනාට කුමාරයාගේ බාල කාලය තුළ (උඩරට) රාජ්‍යයේ ආණ්ඩුකාර කටයුතු කිරීමට දිව්රුම් පිට බාරදී පත්කර ගත්තෝය.''

"මෙසේ එම්ප්‍රදෝරු රජුගේ (සෙනරත්) සහ ඔහුගේ වංශාධිපති රදළ මණ්ඩලයේද සම්මතයෙන් රාජ්‍යය ආණ්ඩුකිරීමේ භාරකාරත්වයට පත්කරගනු ලැබූවින් යම්තාක් කාලයක් දුරට ආණ්ඩුව පාලනය කරත්ද ඒ මුළු කාලය තුළ තම දරුවන් සියල්ලන්ම ඔවුන් දෙදෙනාට කීකරුව විසියුතු බැව් රජතෙම තරයේම කියාසිටියේය''

"මේ සිඩිය හේතුකොටගෙන සෙනෙවිරත් (රජු) ඉක්මණින්ම මරණයට ගොදුරුවේයයි අපේ දැනුම් තේරුම් ඇති අන්දමට විශ්වාස කිරීමට ඉඩ තිබුනේය. එහෙත් ඔහු අවුරුදු කීපයක්ම ජීවත්ව සිටියදීම ඔහුගේ ප්‍රධානීන් දෙදෙනාගේ ආණ්ඩු කාලය ගෙවී ගියේය''

(පිලලෙතෙස් ලංකා ඉතිහාසය. පිටු 101, 103, 104, කෞතුකාගාර පුස්තකාලය. තො: 6 / K 25)

## දොන් මැනුවෙල් දියෙස් අඥරාදි මහ අදිකාරම, සිංහලේ රාජධානිය.

වරුණකුල ආදිත්‍ය අරශ නිල ඉම්මන් දොන් මැනුවෙල් දියෙස් මුදියන්සේ වනාහි කුරුකුල හෙවත් කෞරව වංශිකයෙකි. මොවුන් වූකලී පළමුවෙන්ම කෝට්ටේ දොන් ජුවන් ධර්මපාල රජුගේ සහ පරංගි යුද හමුදවලත් දක්ෂ පක්ෂ නිර්භීත සෙනෙවියෙකුව සිට ධර්මපාල රජුගෙන් පාතරට මුදලි තනතුරක් ලබාගැනීමටද වාසනාව ලත් ප්‍රභූවරයෙක් වූයේය.

පසු කලකදී මහනුවරට පලාගොස් දොන් ජෝන් විමලධර්මසූරිය රජුට සහ දෝන කත්‍රිනා මහ බිසවටද ලැදිව සිංහලේට පක්ෂවද පරංගීන්ට විපක්ෂවද බලගතු යුද ව්‍යාපාරයන් බොහෝමයකම කටයුතු මනාසේ ඉෂ්ටකෙළේය මෙසින් පැහැදුනු රජතුමා උඩරට රාජධානියේ මහ අදිකාරම් ධූරයටද පත්කරගත්තේය. මෙම උඩරට මහ අධිකාරම් ස්ථානාන්තරය පළමුවෙන්ම ලැබුවේ මොහු බැව් සියළුම ඉතිහාසවලම පාහේ දක්වා ඇත්තේය.

එක් අවස්ථාවකදී මොහු පරංගීන් විසින් මෙහෙයවන ලද ඝාතක සොරුන්ගෙන් රජතුමාගේ ප්‍රාණයද ආරක්ෂා කරණ ලද්දේය. එපමණක් නොව උඩරට රාජධානියට විරුද්ධව පරංගීන් විසින් හොතන ලද කුමන්ත්‍රණ වල රහස් ඔත්තු රාශියක්ද වරින් වර රජතුමාට කල්තියාම දන්වන ලද්දේය. මොහු විසින් සපයන ලද රහස් ඔත්තු සම්භාරය හේතුකොටගෙන පරංගීන්ගෙන් උඩරටට සිදුවෙන්ට තිබුණු උපද්‍රව රාශියක්ම ව්‍යාවෘත විය

ආචාර්ය පෝල් ඊ. පිරිස් මහතාගේ "පුර්විගීස් ඊරා" යගිරල පණ්ඩිත ප්‍රඥානන්ද ස්වාමීන්ගේ මහ වංශය තුන්වෙනි කාණ්ඩය, ගෞරවණීය ඇස්. ජී. පෙරේරා පියතුමාගේ

ලංකා *ඉතිහාසය. 1505, 1796, යනාදී ඉතිහාස පොත්වල මෙම දෙන් මැනුවෙල් දියෙස් මහා අධිකාරම පරන්ගි කාරයෙකු වශයෙන් හඳුන්වා දී තිබේ.

එහෙත්:- ලක්මිණි පහන් කතු, ඇම්. ධම්රත්න පඬිතුමාගේ "ගහපති විභාගය" වැලිගම ශ්‍රී සුමංගල "ඉතිහාස වණ්නාව" ගාල්ලේ අතපත්තු වලව්වේ, ඇප්. ඊ. ගුණරත්න තෝම්බුවේ මුදලිතුමාගේ "ලන්දේසි කාලය" නොහොත් "ඩච් ටයිම්ස්" පොත, පෝලත්ත දේශ තානාපති මහතාගේ "ලක්දිව ප්‍රභුවරු" යන ඉතිහාස පොත, දඩුගම ජෝර්ජ් පෙරේරා වර්ණකුලසූරිය සෙනෙවිරත්න නොතාරිස් රාලහාමිගේ "ක්‍ෂත්‍රිය වංශය" යනාදී ඉතිහාස, සහ චරිත කතා පොත් පත්වල යථොක්ත මහා අධිකාරම වනාහි කෞරව වංශයට අයත් සිංහලයෙකු වශයෙන් ප්‍රකාශ කරණු ලැබේ.

---

*"Don John Wimala Dharmasuriya of Kandy, did appoint a certain Manuel Dias. his Maha Mudaliyar over the heads of all his Sinhalese Officers & the first fruits of his promotion was an attack in June on Corea, who he defeated with heavy loss."

(Portuegues Era. Dr. Paul Peiris. Vol. I. Page 362)

භාවය:- "මහනුවර දෙන් ජෝන් විමලධම්සූරිය විසින් එක්තරා මනුවෙල් දියෙස් නැමැත්තෙක් ඔහුගේ මහමුදලි වශයෙන්ද හෙතෙම සියලුම සිංහල නිලමවරුන්ගේ අධිපති-යා වශයෙන්ද පත්කරගත්තා ලදී. ඔහුව මේ උසස් ස්ථානාන්තරයට පත්කර ගැනීමෙන් පසු ප්‍රථම ප්‍රතිපලය නම් හෙතෙම ජූනිමාසයේදී කොරයාව බරපතල පරාජයකට හෙළා විශාල ඝාතනයක් කර දැමීම වන්නේය."

(පෝල් පීරිස් මහතාගේ පූර්තුගීස් ඊරා පොත. 1 වෙනි කාණ්ඩය. 362 වෙනි පිටුව)

දිණමිණ පත්‍රයේ කර්තෘ තැන්පත්ව සිටි උගත් ඇලෙක්ෂන්ඩර් වැලිවිට මහතා විසින් වර්ෂ 1939 පෙබරවාරි මස 10 දින, දිනමිණ පත් මගින් පළකරවූ සාරවත් ලිපියෙන් සහ "පරංගි සංහාරය" හෙවත් "ප්‍රතිකාල් මහා යුඩය" නැමැති කාව්‍යයෙන්ද පූර්වෝක්ත මහා අධිකාරම සිංහල-යෙකැයි ස්ථිර වශයෙන්ම කියා තිබේ.

කළුතර මහ වලව්වේ මුදලි ජේරුවට අයත් දියෙස් අඳුරාදි පුරාණ පරම්පරාව වූකලී සිංහල ප්‍රතිකාල්, ලන්දේසි ඇංග්ලු කාල තුළ අධිකාරම්, මුදලි, සහ මුහන්දිරම් පදවි ලබා සිටි කෞරව නොහොත් කාරාව කුලයට අයත් පරපුරකි.

මේ පරම්පරාව පිළිබඳ විස්තර ඇතුළත් ඉතිහාස පොත්වල මොවුහු වනාහි මහනුවර මහා අධිකාරම් තැන්පත්ව සිටි දෙන් *මනුවෙල් දියෙස් අඳුරාදි මහ මුදලිඳුගෙන් පැවතෙන මුනුබුරු සමූහයායයි සඳහන්වීතිබේ

මේ සම්බන්ධ ඉතිහාස පොත්පත් කියවා බැලූ අපට පිලලෙතෙස් ඉතිහාසයෙන් කරුණු ස්වල්පයක් උපුටා මෙහි බහාලීමෙන් දෙන් මනුවෙල් දියෙස් කවරෙක්ද යනු පාඨකයාට අවබෝධ වෙතැයි විශ්වාස කරමු. තවද කිව්රෝස්ගේ ඉතිහාසයෙන් බොහෝ කරුණු උපුටා ඇලැක්ෂැන්ඩර් වැලිවිට මහතාගේ ලිපිය සරසා තිබෙන බැවින් එකී ඉතිහාසය ගැන යමක් අපි මෙහි තොලියමු. ඉහත සඳහන් ඉතිහාස ලිපි සියල්ලම් අප විසින් සම්පාදනය කරණ ලද කුරුකුල චරිතයේ පළමුවෙනි කාණ්ඩයේ මැනවින් යොදා ඇත.

---

*මොහුගේ පටබැඳි නාමය වූකලී "අරශ නිල ඉට්ට දෙන් මනුවෙල් දියෙස් අඳුරාදි විජයරත්න මහ රජිඳුන් කඩු පැලඳුන් මහ අධිකාරම" යයි ඇසිමු.

## පිලලතෙස් ලංකා ඉතිහාසය.

පෘතුගීසි සෙනෙවිරත් දොන් පේද්‍රුරුගේ යුධ හමුදාවේ කලින් නියුක්තව සිටි *මනුවෙල් දියෙස් නම් මුදලි කෙනෙක් මෙවකට මහනුවර ඉතාමත් උසස් අඳුමට වැජඹුනි. ඔහු වතාගි දොන් ජෝන් රජුගේ (විමලධර්මසූරිය) රාජ සභාවේ බොහෝ තේජවන්ත අධිපතියාව සිටියේය.

ක්‍රි: ව: (1602) අගෝස්තු 4 වෙනි දින මනුවෙල් දියෙස් මහා අධිකාරම සහ තවත් මුදලිවරුද සේවකයිත් එකසිය විසිදෙනෙක්ද (ලන්දේසි) ස්පිල් බර්ජන්ගේ නෞකාව පරීක්ෂා කිරීමට සහ ඔහුගේ නැව ආපසු යනතුරු ප්‍රවේශම් සහිත ස්ථානයක නැංගුරම් ලෑවීමට උපදෙස් දීම පිණිස ඔවුන්ගේ ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ විසින් යවන ලද්දේය. (ඕලන්ද ජාතික ස්පිල් බර්ජන්) අද්මිරාල් තැන මහනුවරට ඇතින් ගංගාව ළඟට පැමිණෙනවිට, මනුවෙල් දියෙස් මහ මුදලිඳු එනතුරු ඔහුට එහි පැයක් පමණ ප්‍රමාද වීමට සිදුවිය

"මේ තිලමේ පෘතුගීසීන් රාශියක් පිරිවරාගෙන ආවේය. ඔහු සියලු දෙනම කර්ණයන් පලුදු කිරීම් විඳදරා ගත් අය වූහ. ඔව්හු දූතට මහනුවර රජුට මෙහෙකරන්-නෝය. අද්මිරාල්තැන ඔහුගේ නවාතැනට සේන්දු වනවිට එහි සියල්ල පෘතුගීසි පිළිවෙළට ලකලෑස්ති කර තිබුණි. මනුවෙල් දියෙස් ඔහුගේ පෘතුගීසි සේවක පිරිස සමග සවස් වනතුරු රැඳුනේය."

"ලංදේසි ජාතික ස්පිල් බර්ජන්ගේ නෞකාවේදී මහ අධිකාරම් තුමාට ඉතාමත් ගෞරව අඳුමට සලකමින් බොහෝ උසස් පිළිවෙලක සංග්‍රහයක්ද පවත්වන ලදී."

*"ඉහතදී පෘතුගීසි යුධ හමුදාවේ සේවය කළ මනුවෙල් දියෙස්"

(ප්‍රබ්හැම් ඉතිහාස. පිටුව 102.)

"විමලධර්මසූරිය මහ රජුගේ ආරක්ෂක භට සේනාව කඩු දරමින් පෙළහරකට සිටගත්හ ඒ අතර අද්මිරාල්තැන ගොඩට පිවිසියේය. මහ රජුද ඔහුගේ කඩුව අත දරමින් අද්මිරාල්ගේ පැමිණීමගැන ස්තුතිවන්ත විය. ස්පීල් බර්ජන්ද මහරජුට වචනා නැගිබෝග ඔප්පුකෙළේය.........අන්තිමේදී ස්පිල් බර්ජන්ට සහ ඔහුගේ පිරිසටත් මුදලිතුමාගේ වලව්වට සතමෙන් නියම කෙළේය. එහිදී ඔවුන්ට ඉතා හොඳින් සංග්‍රහ කරනලදී. පසුවද ලංදේශි ජාතික අද්මිරාල්ට සහ ඔහුගේ පිරිසටත් ඔවුන් නවාතැන්ගත් වලව්වේම නවතින මෙන් රජුගෙන් අණ ලැබුනේය.

එදින සවස ලංදේශි ස්පිල් බර්ජන් අද්මිරාල් නැතව රජු ඉදිරියට කැඳවා ඔහු ප්‍රතිකාල් ජාතික කෙනෙකැයි කියමින් තදබල අන්දමට චෝදනා කෙළේය. ඉක්බිති ස්පිල් බර්ජන් තමන් වෙන ජාතියකට (ලංදේශි) අයිති බැව් රජුට සහ සිංහල ඇමැති මණ්ඩලයටද අවබෝධ කිරීම මහත් අසීරු කටයුත්තක් විය. පසුව ඔහු හිරභාරයේ නොව ඔහු කැමතිවේලාවක ආපසු යන්ට අවසර ලැබුනේය. ස්පිල් බර්ජන්ට තාමත් පෘතුගීසී කාරයකු නොව ලංදේශියකැයි නැවත නැවතත් කියමින් ඇත්ත ඔප්පුකරන්ට සිදුවිය.

(පිලලේතස් ලංකා ඉතිහාසය. කෞතුකාගාර පොත් නො: 6 / K 25 පිටු 77, 78, 83, 90)

මෙහි අපේ කෙටි විස්තරය නම් මනුවෙල් දියෙස් කාරාවේ ගෝත්‍රයට අයත් සිංහලයෙකු බවයි ඔහු ඕලන්ද ජාතික ස්පිල් බර්ජන් අද්මිරාල් සමග මඩකලපු වරායේදී බොහෝසේ ආශ්‍රය කරමින් සිට මහනුවර දක්වා එනතුරුද ඔහු හා සමාගම් පැවැත්තුවේය. මහනුවර ඔහුගේ වලව්වේ ලැගුම් ගත් මේ අද්මිරාල් තැන එහිදීද මනුවෙල් දියෙස් හා එකට විසුවේය. නොයෙකුත් කථාබස්ද කළෝය

එහෙත් මේ අද්මිරාල් පෘතුගීසි කාරයෙකැයි රජුද මනුවෙල් දියෙස්ද අනිකුත් මන්ත්‍රිවරුද සැක කළෝය. ඉන්නිසා තමා පෘතුගීසි කාරයෙකු නොව ඕලන්ද ජාතිකයෙකැයි ඔප්පුකිරීමට බොහෝදුරට ඔහු මහන්සි විය. එනමුත් තමා ඕලන්ද කාරයෙකැයි නැවත නැවතත් කියමින් යම්තම් තමන්ගේ ජාතිය රජුට සහ පිරිසටත් තේරුම් කර දුන්නේය.

මෙතනසිත් බලනවිට මනුවෙල් දියෙස් පෘතුගීසි කාරයෙකු නම්, ඕලන්ද ජාතික අද්මිරාල්, පෘතුගීසි කාරයෙක්ද? ඕලන්ද ජාතිකයෙක්ද? යන වග එකවරම දැනගන්ට තිබුනේය. එසේ දැනගැනීමට ඔහුට නුපුළුවන් වූයේ හේ සිංහලයෙක් වූ බැවිනි.

තවද මනුවෙල් දියෙස් මුදලි තැන මඩකලපු වරායේ තිබුණු ඕලන්ද ස්පිල් බර්ජන් අද්මිරාල්ගේ නැවටද ගොස් ඔවුන් හා භෝජන සංග්‍රහයටද සහභාගිවී තිබේ. එහි සිටි ඕලන්ද ජාතිකයන් සියල්ලන්ම ඔහුට දකින්ට ලැබුනත් ගැර ඔවුන් කථාකළ භාෂාවද ඇසෙන්ට ඇතුවාට කිසිම සැකයක් නැත. මඩකලපුවේ සිට මහනුවර දක්වා ගමන් මාර්ගයේද මනුවෙල් දියෙස් මුදලි තැන ඔවුන් හා සමාජ වාදීවද සිටියේය. මෙසේ ඕලන්ද ජාතිකයින් හා බොහෝ දුරට ආශ්‍රය පැවැත්වූ, මේ මුදලිඳු පරංගි කාරයෙකු නම් ඉතා ලෙහෙසියෙන්ම ස්පිල් බර්ජන්ලා ඕලන්ද කාරයින් බව අඳුනා ගන්නවාට කිසිම සැකයක් නැත. තමන් පෘතුගීසි කාරයින් නොව ඕලන්ද ජාතිකයන් බව නැවත නැවතත් කියමින් විමලධර්මසූරිය රජුට සහ තත් මංත්‍රි මංඩලයටත් අවබෝධ කරවීමට ස්පිල් බර්ජන්ට බොහෝ කරදර සිදුවූයේ මනුවෙල් දියෙස් මහ අධිකාරම ඇත්තෙන්ම සිංහලයෙකුවූ බැවිනි.

තවද මේ මනුවෙල් දියෙස් කොළඹ පරංගින් යටතේ සිටියදීත් මුදලි නාමය ලත් ප්‍රභුවරයෙකි. මුදලි නාමය ලබා ගැනීම සිංහලයින්ගේ ප්‍රවේණි සිරිතකි. එය රජුන් ගෙන් හෝ ආණ්ඩුකාරයින්ගෙන් හෝ ලැබියයුතු ගරු නාම සම්මුතියක්ය. ලංකාවට පමණක් සීමාවූ මෙම ආණ්ඩුවේ උසස් පදවිය පෘතුගීසි, ලංදේසි, හෝ ඉංග්‍රීසි, ජාතියෙකුට කිසිවිටක ප්‍රදානය කර තිබුණු බව ඉතිහාස පොතක නුදුටුවෙමු.

සෙනරත් රජුන් දවස මහනුවර සිටි ලංදේසි නානාපති මර්සේලිස් බොස් ක්‍රවුදර් "මීගමුවේ කුමාරයා" නමින්ද, හතර කෝරලය, මාතර පළාත. යාපනය යනාදී පලාත් පරිපාලනය කල පරංගි සහ ලංසි ජාතික ප්‍රධානීන් "දිසාව" නමින්ද පෙනී සිටි නමුත් "මුදලි" නාමයෙන් පෙනීසිටි යුරෝපාකාරයෙක් මේ දක්වා ලංකාවේ නොසිටි බව පැරණි පොත පතෙන් දත හැකිය.

## සයිමන් කොරයා පට්ටින් කට්ටි හෙවත් නයිදෙ අප්පු මුදියන්සේ.

දෙන් ජෙරනිමෝ නමින් බව්තීස්මය ලැබ කතෝලිකා'ගම් වැළඳගත් අලගියවන්න මොහොට්ටාල පෘතුගීසින්ගේ ආඥාව පරිදි ඔවුන්ට යටත් පහතරට ප්‍රදේශික වැසියන්ගේ තෝම්බුව (නාම ලේඛනය) ලියන ලදී. මෙම තෝම්බුවේ පිටපත් ලංකාවේ නොමැති සෙයින් ගෞරවනීය ඇස් ජී. පෙරේරා පියතුමන් විසින් පෘතුගාල් රට කෞතුකාගාර පුස්තකාලයේ තිබුණ පිටපතකින් කොපිකර ගෙන්වා ගත් පිටපත ප්‍රදර්ශනය පිණිස තබා කොළඹ කෞතුකාගාරයේ තබන ලදී. මෙම අත් පිටපත් පොතේ මෙහි මාතෘකාන්විත සයිමන් කොරයා පට්ටන් කට්ටි හෙවත් නයිදෙ අප්පු යන නාමයද ඇතුලත්වී තිබේ.

§"**පට්ටන්කට්ටි**" යන කුලය එළිදරව්වෙන උප පදය පිළිබඳ ලංකාවේ සුප්‍රසිද්ධ සිංහල ඉතිහාසඥයකු වන කනිෂ්ඨ සිවිල් නිලධාරි ආචාර්ය පෝල් පීරිස් මහතා මෙසේ විවේචනය කර තිබේ.

මෙහි භාවය:- "**මන්නාරමේ** (55) **පට්ටන්කට්ටිවරු**" (13 පිට) (55) සිංහලට පටබැන්ද (යන අර්ථයයි) (ඒ නාමය) නියම වශයෙන් මසුන් මරණ කුලේ ප්‍රධානීන්ට කියනු ලැබේ. (34පිට) (ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතාගේ "යාපනේ රාජධානිය" නැමැති පොත 1645)

"Pattangatin (55) of Mannar" (Page 13) "(55) the Sinhalese Patabanda, usrally applied to Headmen of the Fisher Caste."

(Page 34, The Kingdom of Jaffnapatam. 1645, by Paul E. Pieris Litt. D.)

---

**§Pattankatti - Tax Gatherers among, careyars, Paradars (Thesawalame, Page 722. Colombo Museam Library) No. 15/A 19)**

භාවය:- පට්ටන්කට්ටි - කරාවෙ, පරවර................... කුලවලට අයත් ආදායම් පාලකයෝ.

(දේශවලමේ පොත. කොළඹ කෞතුකාගාර පොත්හල නො: 15 / A 19. පිටුව 722)

"In consequence of the last will of king Don Juan Dharmapala, one was a Pattangatti, Thome Rodrigues representative of the KARAWA" (Portugues Era, By Dr Paul Peiris. Vol. 1. PP 312 560)

භාවය:- "දොන් ජුවන් ධර්මපාල රජුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳව, කරාව කුලය වෙනුවෙන් පෙණී සිටියේ පට්ටන්කට්ටි තෝමෙ රුද්‍රීගුස් නැමැත්තෙකි."

(පුර්තුගීස් ඊරා, ආචාර්ය පෝල් පීරිස් 1 වෙනි කාණ්ඩය පිටු 312, 560.)

කාරාවේ හොහොත් කුරුකුල, පරවර හෙවත් පෞරව යනාදි වංශිකයන් විසින් ගරු උප නාම පදයක් වශයෙන් භාවිතා කරනු ලබන මෙම "පට්ටන් කට්ටි" හෙවත් "පට්ටබැන්ද" යන නාමය පිළිබඳ දෙමළ සිංහල සහ ඉංග්‍රීසි භාෂා උගත් ඇල්ප්‍රඩ් ද සිල්වා ගාර්දියෙ පුංචිහේවා මුදලිඳුගේ තමිල් ශබ්දකරය නැමැති පොතේ ග්‍රන්ථ ප්‍රවේශයේ හොඳාකාර විස්තර කර තිබේ.

මේ මුදලිඳු පට්ටන්කට්ටි නාමය බොහෝ උසස් නාමයක් වශයෙන් විවේචනය කර තිබෙන මුත් ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතා විසින් පෘතුගාල් රට ලිස්බන් නුවර කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත්වී තිබෙන "ජැප්නා පටම්" නැමැති පෘතුගීසි භාෂාවෙන් ලියන ලද පොතේ ඉංග්‍රීසි පරිවර්තනයේ මේ පට්ටන්කට්ටි නාමය මස් මරණ කුලයේ ප්‍රධානීන්ට නියම වශයෙන් හිමි බැව් සඳහන් කර තිබේ.

මේ පිළිබඳ දෙමළ අකාරාදි කිපයක්ම පෙරළා බැලූ අපට මෙහි පහත සඳහන් විස්තර දක්නට ලැබුනි.

### දෙමළ අකාරාදි විභාග.

பட்டணவர் – கடவுளர், செம்படவர்.
පට්ටනවර් – කඩවුලර්, සෙම්පඩවර්.
පට්ටනවර් – දෙවියෝ, සපුකාරයා.

பட்டாரகள் – அரசன் கடவுல், சூரியன்.
පට්ටාරගන් – අරසන්, කඩවුල් සූරියන්.
පට්ටාරගන් – රජ, දෙවියෝ සූර්‍ය්‍යා

பட்டங்கட்டி – கைக்கோசிறிற்றலைவன் பட்டவத்தனர்.
පට්ටන්කට්ටි – කෛක්කෝලරිර්රලෛවන් පට්ටවත්තනර්.
පට්ටන්කට්ටි – රාජාභිෂේකයා, රාජපාලකයා.

(යාල්පාණම් පෙයරකරාදි. පිටු 655, 656.)

## පටබැඳි නාම.

සිංහල මනුෂ්‍යයන්ගේ ඇතැම්"ගේ" නාම නොහොත් පෙළපත් නාම දෙමළෙන් පැමිණ තිබෙන බැව් පෙනෙන්ට තිබේ. "පටබැඳිගේ" "ආරුකච්චි පටබැඳිගේ" "සරුක්කාලි පටබැඳිගේ" "මුදලිගේ" "අරශ කුලරත්නගේ"............... යන මේවා එකී නම්වලින් කීපයකි.

"මෙකී නම් පිළිවෙළින් "පට්ටබද්ධ" ඊට සම තමිළ් වචනය **"පට්ටන්කට්ටි"** (රන් නළල් පට බඳිනු ලැබූ තැනැත්තේ, අධිපති ප්‍රධාරි තැන, නොහොත් තිලමේ) යනුයි."

"ආර්රුකච්චි පට්ටත්කට්ටි (පටබැඳි තිලක ලත් *"මාලුමි" නොහොත් "මාලිමි පටබැඳි තිලමේ") යනුයි.

"සර්ක්කාර් පට්ටත්කට්ටි" 'මුදලි' 'අරශ කුලරත්නම් ...... .. ..යන මේ නම්වලින් ප්‍රභවිවාහුවෙත්."

ඉහත සඳහන් පෙළපත් නාම සියල්ලම කුරුකුල වරිග නාමයෝ වෙති.

(§ඇල්ප්‍රඩ් ද සිල්වා ගාර්දියේ පුංචිහේවා මුදලි තුමාගේ තමිල් ශබ්දකෝෂය)

**සයිමන් කොරයා පට්ටන්කට්ටි හෙවත් සිමන් කුරේරාල**

ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් සිංහල භාෂා පරිවර්තනයෙහි ප්‍රධාන තැන්පත් බී. ගුණසේකර රජවාසල මුදලි මන්ත්‍රීන් විසින් සකස්කර ආණ්ඩුව මගින් මුද්‍රිත රාජාවලියෙහි

---

*මාලිමි යන්ත්‍රය - COMPASS, මකරාගාර ඔර්ලෝසුව, මාලිමිශ ශාස්ත්‍රය - NAVIGATION, සමුද්‍ර ශාස්ත්‍රය, මාලිමී, මාලුමි, - NAVIGATOR, සමුද්‍ර මාගෝප දේශකයා

§කුරුකුල චරිතය පළමු කාණ්ඩයේ 199, 200 වෙනි පිටුවල සඳහන් පට්ටත් කට්ටි නොහොත් පටබැන්දන් පිළිබඳ විස්තරයද ඇල්ප්‍රඩ් ද සිල්වා ගාර්දියේ පුංචිහේවා මුදලිඳුගේ තමිල් ශබ්දකෝෂයෙන් උපුටාගත් බැව් සැලකිය යුතුයි. එය කියවා බැලීමෙන් පට්ටත් කට්ටි නොහොත් පටබැඳි යන නාමවල උසස් තත්වය වටහා ගතහැක.

"සිමන් කුරේ රාල" නමින් අඳුන්වාදී තිබෙන්නේ "*සයිමන් කොරයා පට්ටන්කට්ටි" නැමැති මසුන් මරණ කුලේ ප්‍රධානියාය.

මොහු පිළිබඳ රාජාවලියේ ඇතුලත් කරුණු මෙහි සටහන් කිරීම කරණකොටගෙන කියවන්නන්ට මෙම මසුන් මරණ කුලේට ප්‍රධාන සයිමන් කොරෙයා පට්ටන්-කට්ටි නොහොත් සිමන් කුරේ රාළව චන්ද්‍ර වංශික සිංහල රජුන් විසින් "මල්ලියේ" යන උත්තම නාමයෙන් අමතමින්ද, ඔවුන් තුරුළු කර සිප වැළඳගනිමින්ද, තමන් වහන්සේට අයත් පහතරට රාජධානිය නිරවුල්කර බේරා දෙනමෙන් අයදමින්ද, ක්‍රියා කළ බව රාජාවලියෙන් දක්නට ලැබේ.

## රාජාවලිය.

"නොබෝ දවසකින් එදිරිල්ලේ රාළ රයිගම් කෝරළයේ උඩුවර සිටිනවිට සමරකෝන් රාළ කොළඹින් පිටත්ව ඇවිත් යුධකර එදිරිල්ලේ රාළ ඇල්ලුවේය."

පසුව ධර්මපාල රජ පහතරට සමන්වා එදිරිල්ලේ වලිය අල්ලා මරාදමා, ගැනුත් හා එදිරිල්ලේ රාළගේ මලයාත් අල්වා ගෝවට ඇරියේය. ඔහු හෝවට ගෙනගොස් මරන්ට ගෙනයනවිට පීතා මාතා නැතිහෙයින් ඔරොප්පුවේ (ORPHANAGE – අනාථ මඩම) ඇතිකර උන් ප්‍රතිකාල් කෙණෙකුගේ දුවක් "මම බඳිමි" කියා මරන්ට නොදී ගලවාගෙන බැඳලා දෙවනුව කොළඹට ඇවිත් උන්නාය.

ඕවිල දහම් සූරිය රජ දූරණියගලට වැඩමවා පහත රට අවුල් කරවා මීගමුවට සටන් පුණඩුකර හමුදාව පිටත්කර හැරියේය. ඇරලා සිටිවිට සියනෑකෝරළේට ගොසින්

---

*රාජාවලියේ ප්‍රකාර සිමන් කුරේ රාළ නොහොත් සයිමන් කොරෙයා පට්ටන්කට්ටි උත්තැහැ දකුණු ඉන්දියානු ගෝව නුවරදී අනාථ පෘතුගීසි තරුණියක් ආවාහ කරගත තිබේ.

කත්තංගර ආරච්චිලත් හේවහම් කෝරලේට ගොසින් වෙල්ලප්පුලි ආරච්චිලත්, කොළඹට ගොසින් කුරුප්පු මුදලියාත් පෙරළීකර රට අවුල්කර සිටිනා කලට ධම්පාල රජ්ජුරුවෝ එදිරිල්ලේ රාළගේ මලයා (*සසිමන් කොරයා පට්ටන්කච්චි නොහොත් සිමන් කුරේ රාළ) කැඳවාගෙන තුරුළුකරගෙන සිඹ සනසා මෙසේ කීයේය. "මලණුවනි, මාගේ මාත්තය තබා මේ හතුරු පෙරළිය කරපත්න" කියා හමුදාව භාරකර දුන්විට සිමන් කුරේ රාළ (සසිමන් කොරයා පට්ටන්කච්චි) කත්තංගර සෙබළාත් අල්ලා සියතැකෝරලේ සතුරත්ටත් කොටා කුරුප්පු මුදලිනුත් එලවා සිටි විට විමල දහම් සූරිය රජ උඩරට ගියේය.

සිමන් කුරේ රාළ (සසිමන් කොරයා පට්ටන්කච්චි) සතර කෝරළය හා කොක්කාගලින් හා සුදු පුරුදු ගලෙන් මෙපිට සමත්නවාගෙන ඉඳිනා සඳ උඩරට ඇර පාතකච්චුව (පහතරට) ප්‍රතිකාලුත්ට එක්සත් කරදී ධම්පාල රජ මිය පරලොව ගියේය. ධම්පාල රජුගේ මළකඳ ගෙන ප්‍රතිකා-ලුත්ගේ පල්ලියේ වැළලූවාහ."

සිමන් කුරේ රාළ ප්‍රතිකාලුත් ගෙනගොස් සත්වරක් කන්දඋඩරට ගිහිලන විට සෙනරත් රජ දියතිලක නුවර කරවා වැඩඋන්නේය දෙන් කොස්තන්තිනු රජ පහත රටට රජ කරණ සඳ සිමන් කුරේ රාළ (සසිමන් කොරයා පට්ටන්කච්චි) තියත් අය සතර දේවාලය නොබලා ලොවට

---

*"ඔවුන්ගේ ඊලඟ සෙනවියා සසිමන් කෝරියා (සසිමන් කොරයා) ඔහු උත්පත්තියෙන් සිංහලයෙක් වුවද බවුනිස්ම ලැබුවෙකි. ඔහු මහ රණසූරයෙකැයි කියනු ලැබේ. ඔහු සිංහල හමුදාවක් පරාජයකොට අල්ලාගත්විට බොහෝ කෲර ක්‍රියා කලේය. හෙතෙම සත්‍රීන් ලවා ධාන්‍ය කොටන වංගෙඩිවල බහා ඔවුන්ගේ දරුවන් කෙටවූයේය."

(රොබට් නොක්ස්ගේ ඉතිහාසය ?49 පිටුව)

උතුම් බුඩ ශාසනය නොබලා අනර්ථකර සතුන් ගරු නැතුව මරා පව් කරන විට සිරිලකට අරක්ගත් දෙවියන්ගේ බලෙන් සිමන් කුරේ රාළ ගිනියම් ව්‍යසනයකින් කාලක්‍රියා විය.” (රාජාවලිය, පිටු 71 සහ 72)

## ඩොමින්ගෝ කොරයා

කොළඹ දෙන් ජුවන් ධම්පාල රජුගේ රාජ සභාව පෘතුගීසි යුඬ මූලාදෑනින්ගෙන්ද රෝමානු කතෝලික ලබ්දිය වැළඳගත් සිංහල මන්ත්‍රී වරුන්ගෙන්ද යුක්තවූවකි.

එදිරිල්ලේ ආරච්චි හෙවත් ජෙරනිමෝ කොරයා ධම්පාල රජුගේ තෝල්ක නිලධාරියා වූයේය. පසු කාලයක එදිරිල්ලේ රාළ යන නමින් ප්‍රසිද්ධවූ *ඩොමින්ගෝ කොරයා මේ ජෙරනිමෝ කොරයාගේ පුත්‍රයෙකි. රජ වාසල සමග පියාගේ තිබුන සම්බන්ධකම් නිසා ඩොමිංගෝ කොරයාට රාජ සභා ආශ්‍රයෙන් ඇතිදැඩි වීමට ප්‍රස්තාව ලැබින......... ඩොමිංගෝ කොරයා ඔහුගේ ශරීරාලංකාරය ගැන ආඩම්බරවූ විනෝදකාමී තරුණයෙකුව සිටි බවද කියති. පෘතුගීසි සිංහල යන භාෂා ඇතුළු භාෂා කීපයක්ම හොඳින් දැන සිටි ඔහු යුඬ ශිල්පයෙහි අති දක්ෂයෙක් වූයේය............... ධම්පාල රජ තරුණ කොරයාගේ ළමා වයස ඉකුත් වන්නටත් පෙර ඔහු ආරච්චි නිලයකට පත්කෙළේය. එතැන් සිට අනුක්‍රමයෙන් රාජ සේවයෙහි උසස්වී ගිය ඔහුට “රාළ” පදවියද “මුදියන්සේ” පදවියද තාරුණ වියෙහි සිටියදීම ප්‍රදානය කරණ ලදී.

---

*“ඩොමිංගො කොරයාගේ භාර්‍යාව වනාහී පෘතුගීසි කාන්තාවකි.”

(පෘතුගීසී හා ඕලන්ද යුගය. 96 පිට)

එහෙත් ඔහු සැම තැනම හඳුන්වනු ලැබුවේ "එදිරිල්ලේ රාල" යන නමිනි..........ක්‍රි: ව: 1595 ජනවාරි 1 වෙනි දින පෘතුගීසි හා සිංහල හට හමුදාවන්ගේ ප්‍රධානියාවූ අසවේදු, සියනෑ කෝරළය බලා කොළඹින් පිටත්විය... අසරණ ධම්පාල රජ්ජුද යුධ හමුදාව සමග ගෙනයනු ලැබීය.

තවගමු දේවාලයත් ඒ අවට ගම් කීපයකුත් විනාශ කර, අසවේදු කැළණි ගඟින් එතරව රක්ගහවත්තට පැමිණ එය කඳවුරු කරගත සියනෑ කෝරළේ වැසියන් මැඩීමේ ව්‍යාපාරය ආරම්භ කෙළේය...................,...................................................මේ කාලය වනවිට එදිරිල්ලේ රාළ ධම්පාල රජ්ජුගේ අග්‍ර සේනාධිපතියාව සිටියේය. කෝට්ටේ රාජ්‍යයේ ඉතා උසස් පදවියවූ †"වික්‍රමසිංහ" යන අභිනව රදළ තනතුරටද ධම්පාල රජ්ජු විසින් එදිරිල්ලේ රාළ පත්කරණ ලදී........ ............................ ..............,.............. ක්‍රි: ව: 1595 නොවැම්බර් මස 17 වෙනි දින තුන්කෝරළේ අකුළුගමදී විශෙෂයෙන් තෝරාගන්නා ලද නිර්භීත යුධ භටයින් 7000 ක් ඉදිරිපිට එදිරිල්ලේ රාළ කොළඹ ධම්පාල රජ්ජුටත් පෘතුගීසීන්ටත් විරුඬව යුධ ප්‍රකාශයක් කෙළේය. මේ ප්‍රවෘත්තිය ඇසූ සැම පෘතුගීසියාම භයින් ත්‍රස්ත වන්නට වන....................................................... .............. කඳවුර භාරව සිටි නිලධාරියාවූ ‡ජුවන් පර්නැන්ඩස් (ජුවන් ප්‍රදිනාන්දු) සිය ඥාති සහෝදරයාවූ එදිරිල්ලේ රාළගේ කැරලිකාර භට හමුදාවට එකතුවූ බවත් පෘතුගීසීන්ට දැනගන්ට ලැබුනේය.

ක්‍රි: ව: 1596 වනවිට සෙංකඩගල නුවර අගනුවර කරගත උඩරට රාජ්‍යය කල විමලධර්මසූරිය රජතුමා සිංහල ද්වීපයේ නිදහස උදෙසා උද්‍යොගව සටන් කල ජාතික පක්ෂයේ නායකයාව සිටියේය....... ...................................

---

†ජුවන් ප්‍රදිනාන්දු හෙවත් ඉද්දගොඩ නයිදෙ.

‡වික්‍රමසිංහ - කොමාන්ඩර් ඉන් චීෆ් ෆීල්ඩ් 'මාර්ෂල් යන්න වෙනුවට සිංහලෙන් අමතන නාමයයි.

ජාතික තිදහස් ව්‍යාපාරය සාර්ථක ලෙස ගෙනයත කුම සාකච්ඡා කිරීම පිණිස එදිරිල්ලේ රාළ සෙංකඩගල නුවරට එනබව ඇසූ විමලධර්මසූරිය රජතුමා මේ සිංහල විරයා ගෞරවයෙන් පිළිගැණීමට සූදානම් විය. ඔවුණු පැළැන්දූ රජෙකුට නිමි සත්කාර සම්මාන සහිත පිළිගැ-ණීමක් එදිරිල්ලේ රාළට සෙංකඩගල නුවරදී ලැබුණේය.

මේ කාලයෙහි සිංහල රාජ වංශයේ එදිරිමන සූරිය පවුලේ කුමාරයෙකුවූ විදියබණ්ඩාර, විමලධර්මසූරිය රජතුමාගේ ප්‍රතිරාජයාතන් හැටියට සත්කෝරළය ආණ්ඩුකෙළේය. විමලධර්මසූරිය රජතුමාගේ අග්‍ර මහිෂිකාව වන මහ බිසෝ බණ්ඩාර හෙවත් දෝනා කතිරිනා බිසොවගේ කිට්ටුවර ඥාතියකුවූ මේ සත්කෝරළේ විදියබණ්ඩාර කුමාරයාට රූපලාවණ්‍යයෙන් අංග සම්පූර්ණ තරුණ දියණි කෙනෙක් වූවාය. මේ රාජ කුමරිය දෝනා කතිරිනා බිසව භාරයෙහි මහනුවර රජ මාලිගයෙහි නැවතී සිටියාය.

එදිරිල්ලේ රාළ රාජ වංශයට ඇතුලත් කරගැනීම පිණිසත් පහතරට අළුත් රජ පවුල සමග නෑසබඳකම් ඇති කරගැනීම පිණිසත් මේ දහඅට හැවිරිදි රූමත් කුමාරිකාව එදිරිල්ලේ රාළට සරණ පාවා දෙන්ට විමලධර්මසූරිය රජතුමා කැමැත්ත ප්‍රකාශ කෙළේය.

මේ කුමාරිකාවගේ වංශ නාමයවූ එදිරිමාන්න සූරිය යන නම පටබැඳි නාමය හැටියට එදිරිල්ලේ රාළට ප්‍රදානයකොටදී විමලධර්මසූරිය රජතුමා මේ දෙදෙනාගේ විවාහ මංගල්‍යය උත්සවශ්‍රීයෙන් සිදුකිරීමට අණ දුන්නේය.

එතැන් සිට එදිරිල්ලේ රාළ එදිරිමාන්න සූරිය බණ්ඩාර නම් විය.

(ශ්‍රී සිංහල සංග්‍රාමය. පිටු 40, 46, 52)

මේ එදිරිමාන්න සූරිය බණ්ඩාර නාමය ලත් ඩොමිංගො කොරයාට, ඩොමිනිකාස් කොරයා කියාද ඇතැම් ඉතිහාස පොත්වල ලියා තිබේ. *සයිමන් කොරයා පට්ටන්කට්ටි නොහොත් නයිදෙ අප්පු මුදියන්සේ වනාහී ඩොමිංගො කොරයාගේ සහෝදරයාය. සයිමන් කොරයා පට්ටන්කට්ටි මුදියන්සේට "නවරත්න බණ්ඩාර" යන පටබැඳි නාමයක් විමලධර්මසූරිය රජු විසින් ප්‍රදානය කරණ ලදී.

මෙසින් පසු එදිරිමාන්න සූරිය එදිරිල්ලේ රාළ උඩුවර කඳවුරු බැඳගන සිටිනවිට සමරකෝන් රාළ මොහුව අල්වා හිරකෙළේය. ධර්මපාල රජු මොහු මරාදමා ගැණුන් සහ මොහුගේ මලයා වන ‡සයිමන් කොරෙයා පට්ටන්කට්ටි හෙවත් සීමන් කුරේ රාළ ගෝව රටට හිරභාරයේ යැව්වේය. මෙය සිදුවූයේ විමලධර්මසූරිය රජ කාලයේදීය. එතුමා ක්‍රි: ව: 1592 සිට 1604 දක්වා අවුරුදු දෙළහක් රජකම් කර ක්‍රි: ව: 1604 මැයි මාසය තුල පරලෝ සැපත්විය.

---

*Simon Correa, Patamgatim, heathen Name Naide Appu. age to years.

(The Ceylon Littoral, 1593, Page 22, by Dr. Paul Peiris)

භාවය;- "සයිමන් කොරයා, පට්ටන්කට්ටි, මිථ්‍යාදෘෂ්ටි නාමය නයිදෙ අප්පු"

(අලගියවන්න මොහොට්ටාලගේ පෘතුගීසි තෝම්බුවේ ඉංග්‍රීසි විවරණය. ක්‍රි: ව: 1593, පිටුව 22, ආචාර්ය පෝල් පීරිස්

‡ක්‍රි: ව: 1596 දී පමණ දෙමිංගො කොරයා එදිරිල්ලේ රාළ ධර්මපාල රජු විසින් මරාදැමුවායින් පසු ඔහු විසින් ගෙනයනු ලැබූ කැරැල්ල නොනවතා කරගන යන ලෙස විමලධර්මසූරිය රජු විසින් සයිමන් කොරයාට පොළඹවනු ලැබින. ඔහු "නවරත්න බණ්ඩාර" යන නාමය ආරූඪ කරගන තෙමේම "සීතාවක රජු" බව ප්‍රකාශ කර සිටියේය.

විමලධර්මසූරිය රජු දෙන් ජෝන් කොන්තප්පු බණ්ඩාර වශයෙන් කොළඹ සිටින කාලයේ රෝමානු කතෝලිකාගම වැළඳගෙන උදම්මිට ගාලගේ ශ්‍රේණි කෙනෙකු හා විවාහව සිටියේය. පසු කාලයකදී මේ කාන්තාව කොන්තප්පු බණ්ඩාර, විමලධර්මසූරිය නමින් මහනුවර රජ වූයෙන් එනුමත් හා විසීමට යන අතර බලකෙ කඩවතින් උඩහට යන්ට නැරිය නිසා ඕතොමෝ ආපසු කොළඹට පැමිණ දෙන් ප්‍රන්සිස්කස් නැමැති පෘතුගීසියකු හා දෙවන වරට ආවාහ වූවාය.

## විමලධර්මසූරිය වර්ණකුල එදිරිසූරිය මුදියන්සේ.

ක්‍රි: ව: 1597 දී විමලධර්මසූරිය මහරජු විසින් එදිරිමාන සූරිය ඇදිත්‍ය උන්නැහැ මුදලි සථානාන්තරයකට පත්කර "විමලධර්මසූරිය වර්ණකුල ආදිත්‍ය එදිරිසූරිය මුදියන්සේ" යයි නම් පටබැඳ සිරිලක දකුණු පලාතේ මුදලි වශයෙන් ශ්‍රී සන්නස් දෙවා වදුරා පත්කරණ ලදී.

දකුණු සිරිලක ජයගත් විමලධර්මසූරිය රජු ඒ පෙදෙසට මුහුදෙන් ගොඩවදින්ට මාන බලන පරංගි සේනාවන්ට පහර දෙවීම පිණිස මේ ආදිත්‍ය මුදලි සහ ඔහුගේ සේනාවන් යොදවා ගන්නා ලදී.

මේ මුදලිඳු එවකට මාතර විසූ කුරුකුල එම්ප්‍රදෝරු හෙවත් අමදෝරු අතපත්තු මුදලි තුමාගේ දියනියන් වන කාර්ලිනා අමදෝරු තරුණ කුමාරිහාමි මහත්මිය විවාහ කරගත්තේය.

මෙසින් පැවතෙන එදිරිමාන සූරිය නොහොත් එදිරිසූරිය පරම්පරාවේ බොහෝදෙනෙක් ඔවුන්ගේ මුත්තනුවන් හට ලැබුණු නින්දගම් මේදක්වා බුත්ති විඳගත එති

ඔවුන්හට අයත්ව තිබුණු සන්නස් පත්‍රද තවත් වටිනා රාජකීය භාණ්ඩද ක්‍රි: ව: 1940 දී සිදුවූ ජලගැල්මෙන් විනාශ විය.

දැනට කිවුල හුංගම "රෝහණ මන්දිර" යෙහි වෙසෙන ඩෙනිසියස් වර්ණකුල ආදිත්‍ය එදිරිසූරිය මහතුන්ද ඉහත සඳහන් පෙළපතෙන් පැවතෙන්නෙකි.

# මීගමුවේ කුරුකුල අමරාපති මුදියන්සේ

මීගමුවේ මහවීදියේ අමරාපති මුදියන්සේ පෘතුගීසින් සටතේ මෙහෙකළ නුමුත් නිරතුරුව සිංහල රජුන්ට පක්ෂව සිටියෙකි. දෙවෙනි රාජසිංහ රජු විසින් පරංගින්ට හොරා මීගමුවෙන් සීතාවකට රහස් ඔත්තුකාරයින් මගින් ගෙන්වන ලද වෙළඳ මන්ත්‍රීන් අතරෙන් මේ *අමරාපති මුදියන්සේද කෙනෙකි.

මේ මුදලිඳු ඇතුළුව අනිකුත් මුදලිවරුන්ද පෘතුගීසින්ට විරුඬව සටන් කර මීගමු යුද කඳවුර රාජසිංහ රජුට අල්ලා පාවා දීමට සීතාවකදී (අවිස්සාවේල්ල) පැවැත්වූ රහස් මන්ත්‍රණයේදී පොරොන්දුවී තිබේ

පොරොන්දු ප්‍රකාර මේ මුදලිවරුන් ලංදේශින්ගේද උපකාර ඇතුව මීගමු යුද කොටුව පරන්ගින්ගෙන් උදුරා රාජසිංහ රජුට පාවා දුන්හ.

මීගමුවේ වැල්ලේ වීදියේ හෝ මහ වීදියේ ඒ අමරාපති මුදියන්සේගේ පුතෙක්ද මේ සටනට සහභාගිවී සිංහල රජුට සහ ලංදේශින්ටද අදාල බොහෝ වැදගත් රාජකාරි වල නියුක්තව සිටියේය. මෙතෙම පරංගින්ගෙන් කතෝලිකාගම වැළඳගත කුරුකුලසූරිය *දොන් ජාන්ද කොස්තා අමරාපති නමින් පෙනී සිටියේය.

---

*අමරා මුදියන්සේ ඇතුළු අනිකුත් මුදලිවරුන් පිළිබඳ වන්නි කථාව කුරුකුල චරිතයේ පළමු කාණ්ඩයේ 168 වෙනි පිටුවේ ලියා ඇත "අමරා" යන්න "අමරාල්" යන ("Amaraal") යුරෝපීය නාමයෙහි සිංහල භාවයයි.

A"Jono Da Costa, described as MANDAMANDI, probably MANDADI; of Dom Gaspar de Cruz Patangatim," or Balasuriya Aratchi.

රාජසිංහ රජුගේ පුද්ගලික මුර සෙබල ඇණිය වශයෙන් හේවායින් 50 ක් හෝ 200 ක් එවන ලෙස ඉල්ලා ලංදේසින් වෙත කුරුකුලසූරිය ඉලනාග මගින් යැවූ පණිවිඩය ප්‍රකාර ලංසින් විසින් රජුවෙත යවන ලද රජුගේ මුර සේනාවට ගියවුන් අතරෙත් මෙම දොන් ජාන්ද කෝස්තා අමරාපතිද කෙනෙකි.

රාජසිංහ රජු මොහු කෙරේ බොහෝ විශ්වාසව සිටියේය. ඉන්නිසා හෙතෙම "වාසල අප්පුහාමි" (Lord of the Royal Gate) ධුරයටද පසුව "සැතපෙනගේ අප්පුහාමි" ස්ථානාන්තරයටද (Lcrd of the Royal Bed Chember) පත්කරගත වාසල විසූ රදළ තරුණියක්ද ආවාහ කරගැනීමට අවසරය දෙමින් ඔවුන්ගේ ජීවිකාව උදෙසා අඹන්වෙල නිඳ ගම් වරයද දෙවා වදාළේය. මෙයින් පසු මෙතෙමේ අඹන්වෙල රාල නමින් ප්‍රසිද්ධ විය.

---

A"ජාන් ද කෝස්තා, චනාගි දොන් ගැස්පර් ද කාෂ්ෂ් පට්ටන් කච්චිගේ (කරාවේ ප්‍රධානියා බාලසූරිය ආරච්චිගේ) මස්මරණ දූලේ ප්‍රධාන "මණ්ඩාඩි" යාය."

(The Ceylón Littoral. 1593 by Paul E. Peiris. Page 30)

(අලගියවන්න මොහොට්ටාලගේ පෘතුගීසි තොම්බුවේ ඉංග්‍රිසි විවේචනය 30 පිටුව, 1593, ආචාර්ය පෝල් ඊ. පීරිස්)

පි ත් සරු රාජසිහ රිවිකුල අග නර ත
ස ත් තොස වන ලෙසට ඕලන්දේ නර න
සෙන් හට අම්රාල අගමැති කර පෙම් න
ම ත් තොස වෙමින් නික්මුණු යකාදරාවෙ න

ගෙන්නා අප නිරිඳු නම වෙත අමරා ල
පෙන්නා නමින් යස පුර සිරි ලෙස ලී ල
ද න් නා නොයෙක් තනතුරු සඟ මුතු මා ල
ච න් නා යුදල විවරණ ගෙන ජන රා ල

(මහා භටන)

කල්යැමෙන් හෙතෙම ලංදේශීන්ගේ සට කපට වලට රැවටියෙකු මෙන් රජුට විරුඬව බෙංරුවට නැගී සිටියේය. මීට ඇත්ත වශයෙන් සහභාගිවූ ඒදඩුවාව, පැල්ලම්පිටිය උඩුබද්දාව යනාදී වාසල අප්පුහාමිලාද තවත් රාජද්‍රෝහීන් බොහෝ දෙනෙකුද රාජ උදහස් ලැබී හිස් ගහදමන ලදී. එහෙත් මේ ව්‍යාජ රාජද්‍රෝහි †දොන් ජාන් ද කෝස්තා අමරාපතී අඹන්වෙල රාළ, ලංදේශීන් විසින් එවන ලද්දෙක් සෙයින් ඔහුට විරුඬ චෝදනා ඉදිරිපත්කර ඔහු මරාදමන ලෙස කොළඹ ලංදේශීන් වෙත යවන ලද්දේය. ලංදේශීහු රැවටී ඔහු නොමරා මීගමුවේ මුදලි කමටද පත්කරගත්හ මොහුගෙන් පැවතෙන මුණුපුරු පරම්පරාව මේ දක්වා අඹන්වෙල සිටිති.

---

†කෞරව වංශික දොන් ජාන් ද කෝස්තා අමරාපතී අඹන්වෙල රාළ වනාහි ව්‍යාජ රාජ ද්‍රෝහියෙකි. මොහුව යදම්න් බැඳ ලන්දේසීන් වෙත යවන ලද්දේ හෙතෙම නොමරා ලන්දේසීන්ගෙන් උපසත්කාර ලබන බව රජු විසින් දැන සිටි බැවිනි. ඒ අතර ලන්දේසීන් විසින් උඩරට රාජධානිය පිළිබඳව යොදන කුමන්ත්‍රන සියල්ල මොහුගෙන් රජුට දැනගත හැකිවිය.

මොහු ආපසු ලන්සීන්ගෙන් පලාවිත් රාජසිංහ රජුට ඔත්තු රාශියක් සියාදුනි රාජ සම්මාන ලැබ අඹන්වෙල ගම වාසය කල මෙම කෞරවාධිපතියාගේ සහජාතක පරම්පරාවේ මුණුපුරන් සමහර දෙනෙක් සියම් මහනිකායෙන් මහන උපසම්පදාව ලැබ නායක තනතුරු හිමිකරගත සිටි බව ඇසීම ප්‍රීති ජනකයි.

කුරුකුල චරිතයේ පලමුවන කාණ්ඩයේ මොහු පිළිබඳ මීට සවල්පයක් වෙනස්ව ලියා ඇත.

රාජසිංහ රජු මැරීමට නැත්කිරීම සම්බන්ධව කුමන්ත්‍රණ කාරයින්ගේ නාම අතර අඹන්වෙල රාළගේ නාමය "මාතලේ මහකඩයින් පොතේ" නොදක්වන ලද්දේ ඔහු රාජද්‍රොහියෙකු නොව, රජුට ඔත්තු සපයන ව්‍යාජ රාජද්‍රෝහියෙකුසේ විසූ හෙයිනි.

ක්‍රි: ව: 1819 දී ජීවත්ව සිටි **අඹන්වෙල අමරාපති සළුවඩන වලව්වේ** ලොකුබණ්ඩාර නැමැත්තාද මොහුගේ මුනුබුරන් අතරෙන් එක් කෙනෙකි.

**දොන් ජාන් ද කෝස්තා අමරාපති මුදියන්සේ හෙවත් අඹන්වෙල රාළ.**

ක්‍රි: ව: 1896 ක්වූ 19 වෙනි දින ඉංග්‍රීසි ආණ්ඩුවේ ආඥාව ප්‍රකාර ජේෂ්ඨ සිවිල් නිලධාරි ඒ. සී. ලෝරි මහතාව මහනුවර පලාතේ නින්දගම් පිළිබඳ රිජිස්ටරයක් සකස් කිරීම පිණිස පත්කරණ ලදී. උන්නැහට සහකාරයෙකු වශයෙන් ටී. බී. පරණතල නැමැති උඩරට නිලධාරියෙක්ද පත් කරණ ලද්දේය. මේ දෙපළ විසින් සංග්‍රහ කරන ලද "සැන්ට්‍රල් ප්‍රොවින්ස් ගැසටියර්" (Central Province Gazeteer) නැමැති පොතේ අඹන්වෙල රාළ සම්බන්ධව මෙසේ දක්වා ඇත්තේය.

(ලෝරි මහතාගේ විස්තරය) නොක්ස්ගේ ලංකා ඉතිහාසයේ 119 වෙනි පිටේ මෙසේ සඳහන්ව් තිබේ.

"දෙවෙනි රාජසිංහ රජුට විරුඩව ක්‍රි: ව: 1664 දී කැරැල්ලක් ආරම්භ කල අයින් අතරෙන් අඹන්වෙල රාළ සුප්‍රසිඩ ප්‍රධානියෙකි. ඔහුව මරාදැමීම පිණිස කොළඹ ලන්දේසින් වෙත යවන ලදී. නමුත් ඕලන්දක්කාරයෝ ඔහුව බැඳදමා තිබුණු යදම් කපා හැර බොහෝ කරුණාවෙන් සංග්‍රහකොට උඩරට යම් යම් ඔත්තු දැනගැනීම පිණිස ඔහුව කොළඹ රඳවාගත්හ. මේදක්වා ඔහු ලන්දේශීන්ගෙන් අපමණ උපසත්කාර ලබමින් කොළඹ වෙසෙසි" යනුයි

"අඹන්වෙල වලව්වේ කුඩා නිලමේ ක්‍රි: ව: 1808 දී වටදෙණියේ ඉඩම් මරක්කල මිනිහෙකුට උකසට බදින ලදී. ඔහුගේ දරුවන් වන ලොකුනිලමේ සහ දුග්ගන්නා නිලමෙත් පැමිණිල්ල වශයෙන් ඉදිරිපත්වී දවුදු ලෙබ්බෙ විත්තිකාරයා කර නඩු පැවරුවේය. 13397"

"අඹන්වෙල තැසීගිය ආරච්චිලගේ ඉඩම් බහු ඉංග්‍රිසීන්ට විරුඬව කැරැල්ලට සම්බන්ධවී සිටි නිසා (මැයි 18,-19) ඒව දඬුවම් වශයෙන් රාජසන්තක කරගනු ලැබුවේය."

අමරාපති හලුවඩන ලොකුබණ්ඩා 95379 දරන්බගේ ඉඩම්, හලගොඩ දිසාව විසින් මිලයට ගෙන අස්වැද්දූමෙ මහත්මියන්ට ත්‍යාගිකරන්ට යෙදුනි. ඕතොමෝ විසින් එය ලොකු දරන්ඩේ රාළම දෙන්ට යෙදුනේය.

### අඹන්වෙල.

මෙතම් ග්‍රාමය මධ්‍යම පලාතේ උඩුනුවර බද කදු පළාතේ පිහිටියේය. ක්‍රි: ව: 1881 කේ අවුරුද්දේ මෙහි මුළු ජනගහනය 199 දෙනෙකි.

---

පු රවා  එකප්පර ගෙන සිඳු මුළු  ල්ලේ
කරවා  අමරාල සිට යුද විපු  ල්ලේ
ම රවා  රුපුන් මත් බිඳහැර සිය  ල්ලේ
අ රවා  පලමුවෙන් කඳවුර ගා  ල්ලේ
දු ල් ල  බල යසැති යුද අමරාල ල  ක
මෙල්ල  නොකර යුදයට සෙනග බල දෑ  ක
ගොල්ල  සමග ඇවිදින් රට කාපු ල  ක
සෙ ල් ල  මට ඇරෙව් පස් රටෙහි දෙනව  ක
ප සිඳු  රාජසිහ නරනිඳු නොද පව  ර
සුසැඳු  අමරාල සහ යුදයට නොහැ  ර
පි රි ඳු  සටන් කරමින් ලකට විසිතු  ර
බල ඳු  කොටුව බිඳ වැඩ මැණික් කඩව  ර

(මහා හටන)

ගාල්  තුලට වන් ගව රැලකට වැටලීල්  නැතින් බිඳ
මැද පැන  ලා
තුල්  වලහ තලඹෙව් ඇදගත යති ලීල්  නොකර මන්
බිය කර  ලා
වාල්  විතර සරු නොව බැටදී ප්‍රතිකාල්  රුපුන් රැක
වට කර  ලා
ගාල්  ල ඇරවිය රජසිහ රජු අම්රාල්  සමග සිය
සෙන් ඇර  ලා

(පරංගි හටන)

(පිරිමි 95 යි, ගැණු 104 යි,) වශී 1891 අවුරුද්දේ මුළු ජනගහනය 191 දෙනෙකි. (පිරිමි 90 යි. ගැණු 101 යි) රිජිස්ටර්වී තිබෙන කුඹුරු වගාව අක්කර 56 යි. මෙගමට අයත් ඉඩම්වලට උරුම කියන අයින් මෙසේයි. අඹන්වෙල රාළ, තාරංවෙල රාළ, අඹන්වෙල අප්පුහාමි, කොටගල්ඔලුවේ උන්නාන්සේ, ඇලදන්තේරාළ තාරංවල මුහන්දිරම් රාළ සහ තවත් අයින් වෙති. මේ සියල්ලෝම කෞරව වංශිකයෝය.

(Jud: Com: 29 October 1829 Central Province Gazetteer by A. C. Lawrie. December 1896, P. P. 679. Colombo Museum. Book No. 6/JI)

## කුරුකුල හේනක මුදියන්සේ.

(මාතලේ පඩිවිට විත්ති වට්ටෝරුව)

"මාතලේ කොහොන්සිය පත්තුව බද පඩිවිට ගම්වරය කුරුවංශික හේනක මුදියන්සේ විසින් ඇතුන් සහ ග්‍රාමයන්ද නෛකශ්‍රීන් විරාජමාන සීතාවක රජ්ජුරුවන් වහන්සේගෙන් ලබාගෙන ගම් දහඅටකට ප්‍රධානියෙක් විය."

"තොබෝ කලකට පසු මොහු අලියකු පිට නැග ගමන් කරණ අතර දිය කඳුරක් දුටුවෙන් ඒ වතුර හරවාගන පඩිවිට ග්‍රාමයේ අමුණු 40 ක් කුඹුරු අස්වද්දා ගත්තේය. තවද ගල්පොත ගමේදී අමුණු 10 ක් අස්වද්දාගෙන බුත්තිවින්දේය."

"ඔහුගේ මරණයෙන් පසු තත් පුත්‍රයා අර මුදලේ මොහොට්ටාල විය. ඔහුට කුරුණෑගල කුරුඳු වෙළඳාම පිළිබඳ මහබද්දේ රාජකාරියද අත්විය. ඔහුට ඇතුව තිබුණු සියලුම ඉඩකඩම් පසුව නැතිවිය. එහෙත් අමුණු හතක් පමණක් ඉතුරුවී තිබුණේය. අමුණු හතරක් අර මුදලේ මොහොට්ටාල සතුවිය.

"කුණ්ඩසාලේ රජුන් දවස යුධ පිළිබඳ ආරංචියක් දැනගන්ට ලැබී ඔහුට බැහැර ගොස් බේරෙන්ටයයි රජ්ජුරුවන් විසින් නියම කරණ ලදී. මොහොට්ඨාල එයින් තික්ම ගොස් ඔහුගේ ගමට වැදී කහවත්තට පැමිණියේය."

"මීට ප්‍රථම මොහු මේ ගමින් විවාහයක් කරගෙන සිට එය අවලංගු කර දමා තිබුණු සෙයින් ඔවුනොවුන් අතර අසමදානය පැවතුනේය. මේ මොහොට්ටාල ගම් ප්‍රධානියා වශයෙන් එහිම පදිංචිවිය. මේ අතර ඔහුගේ අත්හැරදැමූ භාර්‍යාවගේ සහෝදරයින් විසින් මග රැක සිට ඔහුව මරාදැමුවේය. මේ කාලේ පැවතුන සිරිත් විරිත්වල අන්දමට යම් කෙනෙකුට නින්දා ගෙනදෙන කටයුත්තක් කිසිවෙකු විසින් කලහොත් මේ පිළිවෙලට පළිගැනීම සිදුවන්නේය. ඔහු අහිංසකයෙකි."

"යුධයෙන් පසු රජ්ජුරුවන්ට මේ සිඩිය දැනගන්ට ලැබී කහවත්තේ මිනීසුන්ට තදබල දඩුවම් දෙන ලද්දේය. මොණරාවිල (කැප්පෙටිපොල) මාතලේ දිසාව කරන අවදියේ මේ මොහොට්ටාලගේ පුත්‍රයාව දුග්ගන්නා රාළ වශයෙන් පත්කරණ ලදී. ඔහු ගම්වරයද ලබා සිටින අතර බෝවත්තේ නැමැත්තා එකී ගම්වරණට ආරාවුල් කරමින් ඉහත සඳහන් පරම්පරාවේ දරු මුණුපුරන් නැතිබව කියමින් ගම්වරය බුත්තිවින්දේය. ඔහුගෙන් පසු "සොඳ" නැමැත්තෙක් ගම්වරය බුත්තිවින්දේය. මේ කාලයේදී පමණ කුණ්ඩසාලේ රජ්ජුරුවෝ කළුරිය කෙළේය.

"හගුරන්කෙත රජුන් දවස මුල් අයිතිකරුවන්වූ ඉහත සඳහන් මුදියන්සේ සහ නිසුන් වහන්සේත් ගම්වරය පිළිබඳව රජුට පැමිණිලි කරන ලදී.

"මංත්‍රීන්වරුන්ගේ සහභාගිකම් ඇතුව පැමිණිල්ල විනිශ්චයකර ලියවිල්ලක් ඇතුව අපට ගම්වරය පාවා දෙන්ට යෙදුණි." ඉන්පසු ඔහුට යුධයට යැම පිණිස රජ්ජුරුවන්ගෙන් අංඥාවක් ලැබුනේය. සන්නයක් වශයෙන් අංයුධයක්ද ලැබුණි.

මොහු රජුට විශාල මෙහෙයක් කරමින් ගම බුත්ති වින්දේය.

"හල්ලියද්දෙ මුහන්දිරම් මෙය බුත්ති විඳින අවස්ථාවේ මුදියන්සේගේ පුත්‍රයාවන සිව්රුළු අය තමන්ගේ අයිතිය පිළිබඳ රජු ඉදිරියේ දුක්ගැනවිලි පැවසූකල තුන් පැලක් අපට අයිතිකර දුන්පසු අවුරුදු 30 ක් බුත්ති වින්දෙමු අතින් තුන්පැලද බලයෙන් ආපසු ගන්ට යෙදුනේය.

ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ අපේ උරුමය ගැන මාතලේ දිසාවට පැමිණිලි කෙලෙමු. ඔහුට එය විභාග කිරීමට බලයක් නොතිබුණෙන් එය සේනාධිපති තැනට (සර් ජෝන් ඩොයිලි) වෙත පමුණුවන ලදී. උන්නැහ විසින් මොල්ලිගොඩ මහනිලමේට මෙය විභාගයට යවනු ලැබූ නමුත් ඔහු විභාගයක් නොපැවැත්තුවේය. සලිත් සේනාධි-පති තැනට පැමිණිල්ල ඉදිරිපත් කෙළෙන් ඔහු අපව විසොන්ලා සමග යුවරජු (ඇහැලපොල) වලව්ව කරා යැව්වෙමු. එහෙත් ඔහු නඩුව විනිශ්චය කලේ නැත. ඊට පසු අපි කොළඹට ගියෙමු. ආණ්ඩුකාරතුමා නඩුව විභාග කර මෙය බේරා දෙන ලෙස සේනාධිපති තැන වෙතට යැව්වේය. එහි තීන්දුවක් නොලැබ කොළඹට යන්ට කියා ආඥාවක් දුනි."

(ඒ. සි. ලෝරි නැමැති සිවිල් නිලධාරි මහතුන් විසින් සකස් කරණ ලද මධ්‍යම පළාතේ ගැසටියර් පොත. 1896, කෞතුකාගාර පොත. නො: 6/JI කාණ්ඩය 1.)

## මාතලේ පඩිවිට ඊශ්වර දේවාලය.

"පඩිවිට පිහිටි ඊශ්වර දේවාලය වනාගි ඕශමුවේ මුදියන්සේ විසින් තනවන ලදී. (මාතලේ දිසත්‍රික් උසාවියේ නඩුව, නො: 2512) මෙය ගොඩනගන්ට යෙදුනේ රාජාධි රාජසිංහ රජුගේ රාජ්‍ය කාලය තුලය. දැනට ජරාවාසයක්ව තිබේ. මෙම දේවාලයේ තිබුණ දේව රූපය දැනට එහි විහාරයේ වැඩසිටියි. එහි පුරාණ අම්බලමක්ද තිබේ.

"නවරත්න මුදියන්සේලාගේට කුරුණී අටක තිඳු පංගුව අයිතිය. දිංතු නයිදෙ පණ්ඩිතයා (දේවාලයට) අවුරුද්දකට වරක් බැගින් බුලත්කොළ 40 ක්ද වලංකදක්ද ඔප්පු කළයුතුයි."

ආණ්ඩුවේ මධ්‍යම පළාතේ ගැසට් පොත. 1 වෙනි කාණ්ඩය)

(Central Province Gazeteer, Vol 1, by A, C, Lawrie C C S 1896)

මිගමුවේ මුදියන්සේ නොහොත් කුරුකුලසූරිය මුදියන්සේගේ කරාවේ යුධකාර වංශිකයින්ට පඬිවිට ගම්වරය එහෙමපිටින්ම දෙවන වරට දෙවා වදාරණ ලද්දේ දෙවෙනි රාජසිංහ රජුය. මීගමුවේ මුදියන්සේගෙන් පසු ඔහුගේ දරු මුණුපුරන්ටද "මීගමුවේ මුදියන්සේලා" යනුවෙන් ව්‍යවහාර වුනු බව සැලකියයුතුයි මධ්‍යම පළාතේ නින්දගම්වර පිළිබඳ විභාගයේදී පඬිවිට ගම්වරය සම්බන්ධව කරුණු පහදා දීමට ක්‍රි: ව: 1896 දී ඒ. සී. ලෝරි, ඒජන්ත මහතා ඉදිරියේ පෙනී සිටි අයද මිගමුවේ මුදියන්සේ නැමැත්තෙකි. ඔහු ගැන මෙහි ඉහතින් සඳහන්වී ඇත.

"සතුරු ඔරු පාරු පදවාගත උරු ම
යහලු නෑ සෙබල කැඳවාගත සැවො ම
*මහවෙ මුදලි ආවට සිංහලේ මෙ ම
කරාවට ලැබුණී පඩිවිටි-අඩනා ග ම

(මිදෙල්ලව කෝරාල)

පඩිවිටි වෙල නොහොත් පඩිවිට.

**PADIVITA:**- a village in Kohonsiya Pattuwa, Matale South, One and half a Mile South of Matale Town,

A Large Village. the sub divisions are Padivita Gama and Padivita Wela,

---

*මහවෙ මුදලි - මහවීදියෙ මුදලි, නොහොත් මීගමුවෙ මහවීදියේ කුරුකුලසූරිය මුදලි

**A Royal Village in King Rajasinghe's time. He granted it to MEEGOMUWE MUDIYANSE free of taxes; Lence "PADI-HITA"**

(Central Province Gazetteer, P, 675-676, Museum No. 6/JI)

භාවය:- "පඩිවිට" මාතලේ වවුමට දකුණු දිගින් සැතපුම් 1½ ක් දුරින් පිහිටි කොහොන්සිය පත්තුව බද දක්ෂිණ මාතලයට අයත් ගම්වරයකි. පඩිවිට ගම සහ පඩිවිට වෙල යනුවෙන් කොටස් වලට බෙදුනු මෙය විශාල ගම්මානයකි."

"රාජසිංහ රජුන් දවස රාජකීය බණ්ඩාර ග්‍රාමයක්වූ මෙය පඩි සුංගම් මරාල බදුවලින් නිදහස් කර මීගමුවේ මුදියන්සේට නින්දට දෙවා වදාලේය. ඒ සෙයින් ඒ ගමට "පඩිහිට" යන නාමය ඇතිවිය."

(මධ්‍යම පළාතේ ගැසටියර් පොත, පිටු 675 - 676)

### පඩිවිට වලව්ව.

Second Part:- Padivita Walawwa, Son of Padivita Ratemahatmaya, 2369, 4106, Cases D, C, Matale — Vol I P, 366, 395,

(Central Province Gazetteer, Vol I P, 675, 676, 679.)

දෙවෙනි කොටස:- පඩිවිට වලව්ව, පඩිවිට රටේමහත්මයාගේ පුතුන්ගේ නඩු නොං: 2369, 4106, මාතලේ දිසත්‍රික් උසාවිය (1 කාණ්ඩ පිටු 366, 395,)

(මධ්‍යම පලාතේ ගැසටියර් පොත. පිටු 675, 676, 679,)

### ඇලගමුව.

ඇලගමුව, දෙවෙනි රාජසිංහ රජු විසින් මීගමුවේ වැල්ලේ විදියේ වර්ණකුලසූරිය මුදියන්සේට දෙවා වදල නින්දගම් වරයකි ගොඩින් මඩින් හැටපස් අමුණුබැගින්

තිබුණු ග්‍රාමවරය වර්ණකුලසූරිය මුදියන්සේට වරප්‍රසාද වශයෙන් දීමට හේතුව් රාජසිංහ රජුට මීගමුව සහ එහි කඳවුරද දළඳ ගම්වෙල සටහත් රජුගේ පක්ෂයට වාසි අඳුමටද යුද්ධ කටයුතු මේ මුදලිඳු සලස්වා දුන් බැවිනි.

ඒ බැව් මුක්කර හටන හෙවත් රාජසිංහ වත්නි කතාවේ හොඳකාර විස්තර කර තිබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙන මේ පොතේ ඡායාරූප පිටපත් අත්ඩිරියස් නැල් මහතුන් විසින් ලංකාවට ගෙනෙන ලදුව එය දැනට කෞතුකාගාරයේ තිබේ. මෙහි සම්පූර්ණ කථාව වර්ෂ 1936 යේ නොවැම්බර් 1, 8, සහ 16 වෙනි දිනයන්හි පළවූ "සිළුමිණ" ඉතිහාස පිටුවල ප්‍රසිද්ධ කර තිබුණි.

මේ *ඇලගමුව මාතලේ සිට සැතපුම් 27 ක් පමණ දුරින් මහ ඔගට යාව පිහිටා තිබේ. ඇලහැර ගොවි ජනපදයේ සිට මයිල 5 කි. මෙහි පුරාණයේ තිබුණු වෙල්යායට වඩා වර්ණකුලසූරිය මුදියන්සේගේ පරම්පරා කාරයන් විසින් විශාල වෙල් යායක් අස්වද්දවන ලද බව ගැමියෝ කියති. එහි වෙල්යායේ විස්තර සන්දේශ කර තිබෙන්නේ මෙසේයි.

"පලතුරු කුසුත් පෙළ සැදි මල්වතු කැටිය
වනතුරු පසින් කඳු පෙළ වට ගල් කැටිය
පලතුරු බරින් සුසැදුනු පොල් වතු කැටිය
විසිතුරු බලන් ඇලගමුවේ වෙල් කැමිය"
(පිණිපා මිතුරු සංදේශය)

දැනට මෙගමේ වර්ණකුලසූරිය මුදියන්සේලාගේ ගෙවල් දෙකක් පමණක් තිබේ. කුඹුරු සමහරක් අත්සතුය. ගොඩ ඉඩම් සියල්ල නිරවුල්ව ඒ පරම්පරාවටම අයිතිය. වර්ණකුලසූරිය මුදියන්සේලාගේ පරම්පරා කාරයින් අතුරෙන් සමහර දෙනෙක් රතලවැවේ සහ මහවෙල සිටිති.

---

*මිගමුවත් ඇලගමුවත් එකය බොල ත්
ලංකාවට පටබැත්දෝ අපිය බොල ත්
ඇලගමු කුරුකුලේ අය තමන් ගැනම කියාගත්තා කියුම්ය

කොලඩින් සමයේ ඔව්හු ඇලගමුවට පැමිණ ගොයම් පාගවා අස්වැන්න ගෙනයති. ඇලගමුවේ මුදියන්සේට අයිතිව තිබුණු ඉර හඳ සහිත හස්ති සුවල බැඳි කොඩියද කේශර සිංහ කොඩියද ගෙත්තම් කරණ ලද රතු පාවාඩයද ඒ මුදලිඳුගේ මුණුපුරන් වන රතලවැවේ පදිංචි වර්ණකුලසූරිය මුදියන්සේලාගේ පුංචිරාලට සහ උප තැපැල් ස්ථානාධිපති හේරත් මුදියන්සේලාගේ කලුබණ්ඩාර යන මිහතුන්ට සහ තවත් කිපදෙනෙකුන්ට අයිතිව තිබේ. ඔවුන් සියල්ලෝම "අපි කුරුකුලේ මිනිස්සු" වම්හ කියති.

ක්‍රි: ව: 1896/1897 දී ඉංග්‍රිසි ආණ්ඩුව මගින් මහනුවර පළාතේ නින්දගම්වලට අයත් ඉඩම් නිරවුල් කිරීම පිණිස පත්ව සිටි (ඒ. සි. ලෝරි නැමැති) උසස් නිලධාරි තැන විසින් සම්පාදනය කරණ ලද "ලෝරිස් ගැසටියර්" නැමැති පොතේ ඇලගමුවේ ඉඩම් කඩම් වර්ණකුලසූරිය මුදියන්-සේලාගේ පරම්පරාවේ අයිත්ට අයිති බවත් රත්වත්තේ නැමැති කෙනෙකුටද අයිති බවත් සඳහන් කර තිබේ.

මාතලේ රතලවැවේ, මහවෙල සහ ඇලගමුවේ පදිංචි කුරුකුලේ වර්ණකුලසූරිය මුදියන්සේගේ පරම්පරාව නම් ඇලගමුවේ නින්ද ගම්වරය නිරවුල් කර ගැනීම උදෙසා මාතලේ උසාවියේ නඩු පවරා තිබෙන බවද දැනගන්ට තිබේ.

## අඹන ගම.

රාජසිංහ රජුට බොහෝ පසුව පරංගින් යටතේ සිටි සේනාධිපතින් අතරෙන් මීගමුවේ *මහ වීදියේ මුදියන්සේද කෙනෙකි. දලදා ගන්පෙල සටනේදි රාජසිංහ රජු පරංගින්ට අසුවෙන්ට යන තැනේදී මීගමුවේ මහ වීදියේ

*Mudali, Rua Grande, මහ හොරෙන්දේ මුදලි යනුයි. මීගමුවේ මහවීදියේ කුරුකුලසූරිය මුදලිවරුන්ට පෘතුගීසී භාෂාවෙන් එසේ ආමන්ත්‍රණය කර තිබේ.

කුරුකුලසූරිය මුදියන්සේ සිය කඩුපත ගෙන තම යටිපිල්ල ඉරං රුධිරය කඩුපතෙහි තවරා "උඩරැටියන් කපා දැමූවෙමි. ඉදිරි නොබලා ආපසු යමු"යි කියා පරංගි සේනාවට රුධිරය පෙන්වා ඔවුන් රවටා රාජසිංහ රජුව මගහැර යාමට මග සැලසූ සැටිත්, මීගමුවේ කොටුව අල්ලාදුන් සේනාවේ මූලිකයා මේ මුදියන්සේ බවත් දැනගත් රාජසිංහ රජු ඔහු සහ පිරිස මහනුවරට කැඳවා මාතලයට හැතැප්ම 22 ක් පමණ ඈත අඹන ගම්වරයද මාතලේට නුදුරු පඩිවිටද, (පඩි-හීවි වෙල) තිත්ද ගම් කර දෙන ලද්දේය.

එයින් කිහ:-

"*යතුරු ඔරු පාරු පදවා ගත උරු ම
සහලු නැ සෙබළ කැඳවාගත සැවො ම
මහමෙව් මුදලි අංවට සිංහලේ මෙ ම
කාරාවට ලැබුණි පඩිහිටි අඹන ග ම

*මීගමුවේ මුදලිවරු පරංගින්ට හොරා තම අඹුදරුවන් උඩරටට ගෙනයනු ලැබුවේ ඔවුන්ගේ යාත්‍රාවලින් ත්‍රිකුණාමලය මාගීයෙනි.

ගාන්ධාර දේශයේ සිට දුටුගැමුණු මහ රජුන් දවස ලංකාවට පැමිණි ක්‍ෂත්‍රිය වංශිකයින් දෙදෙනෙක් එම මහ රජාණන් බැහැදැක සිටි කැතෝදී නිමිරා පුල්ලේ නැමැති රාජ වංශිකයාට තමන්කඩ දෙකට බෙදා වන්නිකම්දී රටේ සෙනග බලාගැනීමට අවසර දුන්නේය.

මෙම දෙදෙනාගේ පේරුවෙන් පැවත ආවාවූ තමන්-කඩුවේ සිටිය "කාරවන්නි පුල්ලේ" යන වන්නි උන්නැහේටත් එම රටේ සිටිය "අමරා මුදියන්සේ" යන වන්නි උන්නැහේටත් රාජසිංහ මහ රජාතන් විසින් "අඹන" "ඇලගමුව" දුන්නේය

සත්කෝරලය බද හෙන්දිරියාපිටියෙ කුරුකුල විජේ-සූරිය මුදියන්සේලාගේ වර්ණකුලසූරිය මහතාණන්ගෙන් ලැබුන පොතකින් උපුටා ගන්නා ලදී.

"අඹා කියන හඩ රජුහට ඇසුනා ලු
හඹන් සපුරෙ පැද එනවා දුටුවා ලු
තඹු සැම රාසිං දෙවි දුන්නා ලු
අඹන ගමට ජං සන්නස ලැබුනා ලු"
(මිදෙල්ලව කෝරාළ)

මේ අඹන ගම්වරය පිළිබඳ ක්‍රි: ව: 1896 / 1897 දී විහංගවලදී සිංහල තිලධාරියෙක් විසින් මිගමුවේ මහ විදියේ කුරුකුලසූරිය මුදියන්සේව ඉංග්‍රීසි ආණ්ඩුවට අදුන්වා දී තිබෙන්නේ මෙසේය.

"අඹන මෙනම් ගම දක්ෂිණ මාතලේ ගම්පහ සිය පත්තුවේ පිහිටා තිබේ. තලියා කනත්ත, මාවුස්සාගොල්ල මදුරුස්ස, පැපොලැල්ල, බෙරකොටුව, වසමට් අයත් මෙම ග්‍රාමය, තැගෙනහිර මාතලේ අතිකුත් පත්තුවලට අයත් ගම් වලින් වෙනස් වන්නේය."

"මෙම අඹන ගම, මිගමුවේ මුදියන්සේ නැමැති මස් මරණ දෙමළ මිනිසෙකුට රජෙක් විසින් සංනසක්පිට දෙන ලද්දකි" මිගමුවේ යුඹයේදී ඔහු විසින් දක්ෂ ලෙස සටන් කල හෙයින් මේ ගම්වරය ලද්දේය. ඔහුගෙන් පැවතෙන කාලිඅම්මා නැමැත්තිය උතුරු මධ්‍යම පළාතේ කෝරාළ කෙනෙකු හා ආවාහව් තිබේ. මේ ගම්වල ජන-ගණනය (ක්‍රි: ව: 1881) සියල්ලෝම 182 දෙන්නෙකි. (100 පිරිමි 82 ගැණු) (ක්‍රි: ව: 1891) සියලු ජනයා 207 යි. (පිරිමි 121 යි ගැණු 86 යි) සියල්ලෝම මස් මරන්නෝය. කුඹුරු අක්කර 266 (ක්‍රි: ව: 1878)

"පහලගේ කිරිමැණිකා පැමිණිලිකාරි විසින් උඹගේ පුංචිරාලට විරුඩව මාතලේ දිස්ත්‍රික් උසාවියේ පවරා තිබෙන නඩු නොම්මරය 3502 විත්තිකාර පුංචිරාල ඔහුගේ

මුත්තනුවන් වන *මනවාල රාළට සක වර්ෂ 1673 හේදී එනම් ක්‍රි: ව: 1751 දී මීගමුවේ මුදියන්සේ විසින් දුන්නාය. කියන කල්පත් සිට්ටුව ඉදිරිපත් කරන ලදී. "මුල් නඩු තොම්මරය 1546" රත්නායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා මැරුණ ආරච්චිරාළට දියණියක් සිටියි. ඔහුගේ මස්සිනා වනාහි †"මිච්චමල් පිණ්දිය ප්‍රතාපා මුදියන්සේලාගේ මුදලිහාමි වේරගම" (ක්‍රි: ව: 1751) ශක වර්ෂ 1673 උඩගේ මනවාල හම්මගේ ඔපල්ගල පදිංචිකාරයා මා ඉදිරියට පැමිණිය. මාතලේ අඹන මීගමුවේ මුදියන්සේ (දැනුම්) කදක්ද, රිදී පහනක්ද ගෙන ආවා. ඒවා කල්පනාවට ගෙන මගේ කැමැත්තේ ප්‍රකාර හේනගල බිමෙන් ගොඩ ඉඩම් අමුණක් දුන්නෙමි."

(ලෝරිස් ගැසටියර් පළමුවෙනි කාණ්ඩය. 38 පිටුව)

"ලෝරිස් ගැසටියර්" නොහොත් "සෙන්ට්‍රල් ප්‍රොවින්ස් ගැසටියර්" පොතේ කියන පරිදි ඉහත නම් සඳහන් උරුමඃ කාරයින් සියල්ලෝම මීගමුවේ මුදියන්සේගෙන් පැවතෙන පරම්පරාවේය. කෞරව වංශිකයෝය.

---

*මනවාල මුදියන්සේ සහ ප්‍රතාපා මුදියන්සේද මීගමුවේ සිටි කාරව කුලයේ යුධ සෙනෙවිවරු වෙති. මේ කරාවේ මුදලිවරුන්ගෙන් පැවත එන මුණුපුරු පරම්පරාව දැනට "මිච්චමල් පිණ්දිය ප්‍රතාපා මුදියන්සේලාගේ වේරගම" කියාද "මනවාල මුදියන්සේලා" කියාද කියාගනිති. "ප්‍රතාප" යනු සංස්කෘත පදයකි. බටහිරදිග ඉන්දියානුන් අතර මුල් කාලවල තිබුණ රන් කාසි වර්ගයකටද "ප්‍රතාප්" යන නාමය ව්‍යවහාරවිය. පසුව පෘතුගීසින්ගේ රිදී කාසියකට මේ "ප්‍රතාපා" නාමය කීයත්ට පුරුදුවිය. අන්තිමේ ලෝහ මුදල් සියල්ලටම "ප්‍රතාපා" යයි කී හෙයින් පරංගි දවස ලෝහ මුදල් මුද්‍රාලයේ මුදියන්සේටද "ප්‍රතාප මුදියන්සේ" යන්න ඇතිවියයි කියනු ලැබේ.

†රාජකීය භාණ්ඩ පැටිවිලි කිරීම පිළිබඳ ප්‍රධානියාට මනවාල රාළ නොහොත් මනවාල මුදියන්සේයයි කියති.

මිහරක් අංතට්ටුවක් හිස තබාගෙන ගොස් වාසලට දැකුම් දක්වාපු රා මදීන්නත්, ගෝනදෙනක් අල්ලා බැඳ රජුට දක්වාලූ දඩ වැද්දත්, රාජාධි රාජසිංහ රජ වාසල බැළ මෙහෙකාරයක්, අණ්ඩර දමිළ වඩුග රජුන්ගේ අන්තඃපුරයට යකඩ දෝලියත් ඔප්පු දුන්න නිවට අයිතුත් ගම් බිම් ලද්දෝය. ඔවුන්ගෙන් පැවතෙන්නත් තමන් රදලවරු යයි ඉංග්‍රිසින්ට විවේචනය කරමින්, දෙවෙනි රාජසිංහ රජුට බලගතු යුධ කීපයකින්ම ජය ගෙනදී රජුගේ ප්‍රාණයද ආරක්ෂාකර මුළු මහත් උඩරට රාජධානියටම අගනා සේවයක් කල යුධකාමී වීරවරයෙකුවූ මීගමුවේ *මුදියන්සේව, ඉංග්‍රිසින්ට අඳුන්වා දී තිබෙන්නේ "මීගමුවේ මස් මරණ දෙමල මිනිසෙකු" වශයෙන් උපහාසයට සොදමිනි.

## මාතලේ මහ දිසාපති නොහොත් වර්ණකුලසූරිය වැල්ලැක්කේ මුදියන්සේ.

මේ මුදලි තැන වැල්ලකාරේ වැසියෙකි, පෘතුගීසිස් හා දෙන් ජුවන් ධර්මපාල පෙරිය බණ්ඩාර කෝට්ටේ මහ රජුන්ගේ යුධ හමුදාවල සුළු මුලාදෑනියෙක්ව සිටි

*රාජසිංහ රජතුමානන්ගේ කාලයෙහි යුද සේවයෙහි නියුක්තව මීගමුවේ විසූ "කරාව" ගෝත්‍රයේ මුදලි මුහන්දිරම් වරුන්ට මහමඩිගේ ගම් සේරම භාරකරණ ලදී. ඒ ගම්වල ගණන 18 කි. මාතලේ දිශාවේ පඩිවිටය, අඹන, ඇලගමුව, සේරපල්ලම, මාරදෙන සහ තවත් ගම්ද, සතර කෝරළෙන් ගම් 18 ක්ද, සත් කෝරළෙන් ගම්වරවල්ද, මුදලිවරුන් සමග පැමිණි අයට ඉන්ට අවසර දුන්නේය. මෙපමණක් නොව, සත්කෝරලේ සහ වන්නි බද මහගල්ගමුව ආදී පලාත්ද භාතියතිස්ස රජතුමන් විසින් භාරතයෙන් ගෙන්වන ලද කරාවේ යුධ භට පිරිසට මුක්කරුන් පරදවා ජය ගත් නිසා මුක්කරුන්ට අයිතිව තිබූ ඒ ගම් සියල්ලම "කරාවේ" යුධ හමුදාවන්ට නින්දගම් වශයෙන් දෙන ලදී. (වන්නි විත්ති ලිපි ආශ්‍රයෙනි.)

මෙම කෞරව වංශිකයා යුද මෙහෙයෙහි නිර්භීත සෙබ-ලෙක් වූයෙන් මුදලි ස්ථානාන්තරයටද පත්විය.

එක් දවසක් තම රූපත් අඹේතියත් සමග ‡නාගුළු ගංතොට ඔස්සේ තැදූ ගමනක් යන සිංහල ගෘහපතියෙකු ඉදිරියට හැඩිදූඩි පරංගි මුලාදැනියෙක් පැමිණ ඔහුගේ රූපත් ලද බොළඳ භාර්යාවට අපහස ගෙන දෙන අටියෙන් ක්‍රියා කිරීමට තැත් කරණ වේලෙහි, සිංහල ගෘහපතියා හා පරංගියා අතර කෝලාහලයක් ඇතිවිය.

මේ වේලෙහි නාගුළුගංතොට කදවුරේ රාජකාර්ය-යෙහි යෙදී සිටි වැල්ලසාගේ මුදියන්සේඩ සිය ජාතික කුලකාන්තාවකට සිදුවෙන්ට යන අපකීර්තිය හැගී ගියෙන් කෝපයට පත් හෙතෙම වහා නැගිට හැඩිදූඩි පරංගියාව එක එල්ලෙම වෙඩිතබා මරා දැමුවේය. මේ සිඩිය හුදකලා ස්ථානයක සිදුවූ හෙයින් පරංගියාගේ මළකඳ ගහම ඇද දමා තම කිසිත් නොදත්තකු මෙන් රාජකාර්යයෙහි යෙදුනේය.

මෙවක් සිට තම ජාතිකයින් හට පරන්ගින්ගෙන් සිදුවන තාඩන පීඩනද බලහත්කාර ක්‍රියාවන් කෙරේ කලකිරුණු වැල්ලක්කෝ මුදලිඳු මීගමුවේ කොටුව අරභයා සිදුවූ සටනේදී දෙවෙනි රාජසිංහ රජුගෙ පක්ෂයට ගොස් පෘතුගීසින්ට විරුඩව සටන්කොට මීගමු කොටුව රජුට අල්ලා දීමේ ගෞරවයටද පාත්‍රවිය.

මෙම යුඩයෙන් විජය ශ්‍රීයට පත් යුද බල ඇතිය හා මහනුවරට සපැමිණි කුරුකුලයට අයත් මණ්ඩල-සූරිය වැල්ලැක්කෝ මුදියන්සේඩ නොයෙකුත් රාජ

‡නාගුළුගංතොට - දැනට වික්ටෝරියා බ්‍රිජ් නැමැති පාලම අසල පිහිටි කැළණි ගගේ තොටුපල.

කොල්සම් වරප්‍රසාද ලැබී ක්‍රි: ව: 1630 දී §මාතලේ මහ දිසාපති ස්ථානාන්තරය සහ මඩබැද්ද ගම්වරයද රාසිං දෙවි ස්වාමි දරුවානන් වහන්සේ විසින් දෙවා වදාළාය.

මෙතුමා මාතලේ මඩබැද්ද යන ගම් වලව්වක් තනාගත මාතලේ රට රදළ කාන්තාවක්ද විවාහ කොටගත මාතුලා රට කෙරෙව්වේය. ඒ වලව්ව තිබූ තැනට වලව් ගොඩැල්ල කියාද එතුමා වන්දනාමාන කල ස්ථානයට ඇත්ගොඩ දේවාලය කියාද දැනට ව්‍යහාර කරති.

"Madabedde:— in Udugoda Pallesiya Pattu Matale Southruins of a maligawa some stone pilles"
Lowries Gazetteer Vol I P 566

"මඩබැද්ද:- දක්ෂිණ මාතලේ උඩුගොඩ පල්ලෙසිය පත්තුව. මාලිගාවක නටබුන් වස්තු සහ ගල් කණුද තිබේ.
(ලෝරිස් ගැසටියර්. 1 කාණ්ඩය. පිට 566)

## මුක්කර හටන.
### සඬසනි සිබම්.

කෝට්ටේ නුවර ශ්‍රී ප්‍රාක්‍රමබාහු මහ වාසල රාජ්ජ ශ්‍රී විද වදාරණ ප්‍රසනාවට මේ ලක්දිව අල්ලන හැටියට පුත්තලමට නාගපට්ටනමට පන්නාල දේශෙ සිට මුක්කරු ඇවිත් පදිංචිඋනු ප්‍රසනාවට එවගට රදළවරු දක්වාගන යුධ කරප්ට කවුරු පොහොසත්ද වදාල තෙන

§Matale Disawa was formed, the sun & moon flag & five Kodituwakku were handed over to Matale Maha Disawa"
(Lowries Gazetteer Vol. I P 552)

"මාතලේ දිසාවට අයත් ඉරහඳ කොඩිය සහ කොඩිතුවක්කු පසද මාතලේ මහ දිසාවට පිළිගන්වනු ලැබූහ.
(ලෝරිස් ගැසටියර්, 1 කාණ්ඩය. පිට 552)

මුක්කරු හමුදාව සමග යුධ කරතොත් කාංචිපුර කාවේරි පට්ටනම කිලක්කරෙ මෙම රට තුනේ හමුදාවගෙන්නා ගත්තොත් සුදුස්සයයි කියා සැලකල තැනේදී ඒ හැටි හොඳයි කියා දිවුස්ලා වදාල තැනේදී රදළවරු විසින් දිවස්ලා වදාල හැටියට එරට තුනට ඇරියාය. ඒ කැඩපත් තුන රට තුනේ නිලමක්කාරයෝ බලාගත එරට තුනේ හමුදාවක් සමග කාංචිපුර දේශෙටම එකතු වෙමින් වෙව්චි පතිවුඩ පතනේ හැටියට කථා කරගත සනකෙළි කෙළිමං ලංකාවට ගොඩබසින්ට එන නිලමක්කාරයෝ නම්:- වච්චු නාච්චු දෙවරෙද, කුරුකුල නාච්චු දෙවරෙද, මානික්ක තලවඬ අදි අරස අඩප්ප උන්නැහෙද, වණ්ණසූරිය දෙම්බ නාද අඩප්ප උන්නැහෙද, කුරුකුලසූරියා මුදියන්සේද, පරදකුලසූරියා මුදියන්සේද, අරසකුල සූරිය මුදියන්සේද, මෙම නිලමක්කාරයෝ නම්දෙනා සමග ආරච්චිවරු දහඅට දෙනෙක් ඇතුළුව හේවා හමුදාවගෙන් සන්දහස් සත්සිය හතලිහකුත් අඹැට්ටියා ඇතුළුව තොලිල්කාරයෝ පස්දෙනෙකුත් සමග හබාත් තුන යට රුවල් ඇද පදිනා වේලවාට එක්වා දහස් එකසිය පනස් නවයට පැමිණි මෙම වර්ෂයෙහි මීන රවි පසලොස් භාගවූ පංචමීලත් රවිදිව රෙහෙනේ නැකතින් සිංහ ලග්නයෙන් ගුරු හෝරාවෙන් පිටත්ව කැළණි මෝදරට ගොඩබැස්සාය. ඒ එග හැටි දී සවණ්ණේවර සිංහාසනාරූඪවී වදාරමින් ඒ ආ නිලමක්කාරයෝ සහ හේවා හමුදාව දක්කවා ගැන වදාරමින් නම් ගොත් සහ ආගිය තොරතුරුද අසා වදාරමින් නැවත කරුණාව සහා තාන්තරුවල් ඇතුළුව පඩි ප්‍රසාද ලැබෙමින් දේසක්කාර සමූහයා දිසාව බලා වදාරමින් රවි මඬලේට නික්මෙන්නාවූ අසුර විලාසයෙන් සෝභාව දැක වදාරමින් හේවා පන්නෙට සාමාජීයෝයයි සිතා වදාරමින් පුත්තලමට ඇවිත් පදිංචිව සිටින මුක්කරුන් සමග යුධයට යන්ට පුළුවන්දැයි කියා අසා වදාල තැනේදී ඊට යහපති කියා යුධ කරණ හැටියට දුනු කඩු කිරිච්චි ජම්ජාඩි කෙටේරි වලළු හෙල්ල මුගුරු යන මෙකී ආයුධ

සත්තඹව පුත්තලමට ගොස් යුද්ධයට පටන්ගෙන තුන් මාසෙකින් කොටුව ඇරෙව්වාය. ඒ යුද්ධයට මෙඅතින් වැටිච්ච සේවා හමුදාව එක්දහස් පන්සියයක් වැටුනාය.

ඊටත් බියපත් නොවී නාග පට්ටනමට යුද්ධයට ගොසින් යුද්ද හතලිස් දවසක් යුද්ද කරණ වේලාවට මාණික්ක තලවන් කියන තිලමක්කාරයා සේවාකමෙන් වැටුනාය. ඉන් පසු දෙමස් පසලොස් දවසක් යුද්දකොට නාග පට්ටනම අල්ලුවාය. මේ යුද්ද දෙකේදී දෙදහස් අටසියක් සේනාව මෙඅතින් වැටුනාය. කොටු දෙක අල්ලා කොටු දෙකේ තිබුනු රතු කොඩි දෙකත් කොටු දෙකේ තිලමක්කාරයෝ දෙන්නාගේ තරම් දෙකත් ගෙනවිත් දක්කවාපු තැනේදි බොහෝසේ කරුණාං සන්තෝෂවී වඳුරමින් මැදින්නොරුව ආනා ඔලන්දුව මුන්නේස්සරම ඛාම්මල තඹරාවිල හුනුපිටියෙ වීදියෙද පෙටියාමුල්ලේ වීදියද ඛාම්මල වීදියද කොලොම්පිටි මඟ වීදියද වැල්ලේ වීදියද කුරුණා වීදියද මීගොමුව සහද ප්‍රවේනි සැලැස්මට තඹෙත් ශ්‍රී සත් පිකිටුවා ලැබුනාය. ඒ ඇර Aශාවණා කොඩිය, ඉරහඳ කොඩියද මකරයා කොඩියද මාල දෙපිසන්ද වට්ටජ්ජු කුරිසල්ද මුදුද රත්‍රං කාස්ථාන, රිදී කාස්ථාන රං හවඩි රිදී හවඩිද, රං බන්දි රිදී බන්දිද, රං බස්තන් රිදී බස්තන්ද, කර්ණා කුණ්ඩලාද වඩනතල අනුද ඇලි සවරං දෙකා දෙකද රිදී තැම් රිදී පුසලාංද රිදී අඩු රිදී සුලංද රිදී හැඳිද රිදී කොතලාද රිදී වලඳ මෙකී නානාත්‍ර ලැබෙමින්

---

Aවිජය රජ්ජුගෙන් ඉහත කාලේ සිට කරාවේ හෙවත් කුරුකුලේ මිනිසුන්ට ඉරහඳ කොඩිය උරුම බැව් මහ භාරතයෙන් ප්‍රකාශවෙයි. ඉර හඳ කොඩියේ සටහන් තාරකා විසිඑකෙන් ඔවුන්ගේ ගෝත්‍ර විසිඑක හෙළිවේ. හවෙනි පැරකුම් රජ්ජු විසින්ද කරාවේ යුධකාර වංශිකයින්ට ඉර හඳ කොඩිය වරප්‍රශාද කර දී තිබේ. කරාවෙ මිනිසුන්ගේ මඟුල් අවමඟුල් ප්‍රසථාවලදී සිංහල රජ්ජුන්ට පෙරද සිංහල

දහඅට තොටමුනේට වෙළඳාමට යනවාට එනවාට හිරූව සුඟං මුද්දර මිල නැති සැටියට මහ වාසලින් පනිවුඩ උනායැ. නැවත රාජාඟං පවතිනා කේතාට මිගොමුව ප්‍රවෙනි වසමට ලැබී මීගොමුවේ පදිංචි කලාය. නැවත රාජ්ජ ශ්‍රී විද වදුරණ ප්‍රසථාවට ගෝව ප්‍රතිකාල් පරංගි-කාර ගොල්ල සිල්වාරමක් නොයෙක් පඬුරු පාක්කුඩම් ගෙනවිත් දක්කවා මූනපාපු තැනේදී ආගිය කොරතුරු අසා වදුරමින් "කුමක් පිණිස ආවාදැයි" කියා අසා වදල තැනේදී "අපගේ දේශයේ යුඬ බොහෝ නිසාත් වෙළඳාම නවාම් දුර්ලභ නිසාත්, ඔබ වහන්සේගේ ශ්‍රීපාද පත්මයට යටහත් වෙමින් කොළඹ තොටමුනේ හෝසමක් අතුර ගත්නා විතරවත් බිම් වාසයක් ලබාගන තලාඞි බැඳගන පදිංචිව වෙළඳාම් කරගන රක්ෂාවෙමින් මහ වාසලටත් වැඩ රාජකාරිය කරමින් හිටිනට ඕනෑ නිසා ආවාය කියා" ඔප්පුකල තැනේදී එපමන බිම් වාසිය තඹෙන් ශ්‍රී සං පිහිටුවා දෙවා වදාලාය.

---

[4] රජ කාලය තුලද මේදක්වාද කිසිවෙකුගෙන් බාධාවක් රහිතව ඔවුන්ගේ උත්සව වලට ඉර හඳ කොඩිය පෙරවූ කරගෙන යනු ලැබේ. මේ උරුමයේ නිදහස අත්‍යයන්ට නැති බව මෙහි පහත සඳහන් කරුණු වලින් හෙළිවේ.

සිංහලේ නඩු විභාගය ක්‍රි: ව: 1818 සිදුවූ උවේ කැරැල්ල මොල්ලිගොඩ පදිංචි "මාපාගේ මුහන්දිරම" නැමැති 13 වෙනි සාක්ෂිකාරයා කැඳවන ලදුව මෙසේ ප්‍රකාශ කලේය.

..............."ඉර හඳ ලකුණු මම දෙඩන්තැල්ල පංසලේදීද ගෙදරදීද දුටිමි. උත්සවයක් සිදුවනවිට ඒවා මන්දිරයට ගෙනයනු ලැබේ. උත්සවය අවසන්වූ පසු ඒවා ආපසු ගෙනයනු ලැබේ. මහනුවර රජුගේ කාලයේ කිසිද සාමාන්‍ය වැඩකට රජු විසින් ඒවා නොදෙනු ලැබේ. ඒවා වෙන කෙනෙකුගේ ගෙයක නැත. මහනුවර රජුගේ කාලයේ යම් කෙනෙකුගේ නිවසක ඉර හඳ ලකුණු කොඩි තිබී සම්බවුවහොත් ඔහුට වරද සිදුවේ. ඔහුගේ හිස ගහදමනවාට සැක නැත. (මහනුවර 1818/1819 යුඬාධිකරණ නඩු තීන්දුව)

*එලෙසින්ම ගෝසම තුනිකාර සින්කාර ඉරා වටට ඇඳ බැඳ මැදිවූ බිමේ කොටුව බැඳවමින් කළුගල් තාප්ප බැඳ මුර සමත්නාගත පදිංචි උනාය. මෙතන වැඩසිටිනට නපුරැයි කියා සිතාවක නුවරට වැඩියාය. නැවත සිතාවකින් එගොඩ ප්‍රගිකාර ගොල්ල එනිසා මෙතන සිටිනට සුදුසු නැත කියා කොටකඩගලට වැඩමවා වදලාය. එනුවර වැඩ වදරණ ප්‍රස්තාවට පරගි ගොල්ල Aකොරා වහල් කඩින් මෙපිට කඩසිත් ලාගත්තාය.

---

*කොරට වහල්කඩින්

Aදඹදිව සිරිමත් පුර ගෝවේ ය ත
සිරිමත් දත සිටු සැපතින් අපම න
කර සත් සිත් සැම පුරවර තොසයෙ න
පවසත් අපමණ ප්‍රතිකල් තියමෙ න

පෙම කර දඹදිව සිට මත නදි නා
සැම තෙක වස්තුව ගෙන සිතු ලෙසි නං
මෙම ලෙස අප වෙළඳුම්ට හිඳ නා
බිම දූත මැනවිණ ගෙරිසම එල නං

දෙව් සස පුත් වැඩඋන්නෝ ලක ලා
නැව් එත එකොලොම් පුර වැඩසිට ලා
සව් සතහට වෙළඳුමට තිස ලා
දෙව් බිම ගෙරි සම පමණට මැන ලා

අරා පවර වැඩඋන් නැන පෙම් නා
තිරා ලෙසට දූත් බිම සම සම නා
පුරා නැණැති ප්‍රතිකල් සිතු පෙම් නා
ඉරා එ ගෙරි සම කොසහක් ලෙසි නං

පෙර සොඳ බුවනෙක බා තිරිඳුන් වා
ගොඩ ඉඳ වෙළඳුමෙන් දිතවත් වා
සිතුලෙස ගිවිසී කප්පම් දෙන් වා
බිම ගෙන කොටු බැඳ සිතු රට ගත් වා

(මහා හටන)

මුර පැල බිසිඑකක් තනා ඒවායේ සිට රට් කැබෙල්ලෙ රාජකාරිය ගත්තාය. ධෞත සංඛ පරික්ෂිප්ත සලිලාකාර අභිත්ත මනුවං සොත් භූතේස්වර ශ්‍රී ලංකාදිපතිවූ උතුම් අපගේ රාජසිංහ දේවස්වාමි දරුවානන්වහන්සේ සිංහාසන මස්ථකයෙහි වැඩවදාරණ ප්‍රස්තාවට (පරංගි ගොල්ල) බඳුල්ලෙ නුවරට වැඩවදාරමින් එනුවර වැඩසිට ඌව මහ බලසේනාව සමග මහ අතපත්තුවේ එක්ලක්ෂ පනස් දහසක් පමණ අඡ්ජුභූරෑ සමග නොයෙක් ආවුද ඊයං වෙඩිබේත් සමුඩිකොට පිටවුනු වග නම් චතුරංගිනී සේනාව පිරිවරාගනිමින් අසුර යුඬයට නික්මුනු සැක්‍රදේවේන්ද්‍රයන් මෙන් ඒ ඒ තැන පරගි එක්ක යුඬ කරමින් කේසර සිංහ රාජ විලාසයෙන් ජයගෙන නැවතත් දලඳ ගන් වෙලේ හේවාකමට වැඩ වදාත්ව සිතා වදාරමින් නොයෙක් අමාප්ත මඩලේ රදලවරුත් පිරිවරා ගනිමින් ශාස්ත්‍ර කුජර විදාරණ තරකේසරිසදෘවූ උතුම් රාජසිංහ දේවස්සුවාමි දරුවංතන් වහන්සේ දලඳ ගම් වෙලේ හේවා කමට නික්වෙමින් රණ දෙරණ වැඩසිටින ප්‍රස්තාවට සතුරු සේනාව ලංවී එන වේලාවට නොයෙක් කොඩි කුඩ ප්‍රසාධ ලැබී උතුම් මහවාසලට පක්ෂවාදිකම පිණිස සිටි නොයෙක් අමාප්තයො බිංදු පැහැ දීවාය. එවෙලාවට මහ කුඹුරේ පලිසවඩන රාල අපගේ රාජසිංහ දෙවස්සුවාමි දරුවාතන් වහන්සේ වැඩසිටින කැටුව සිටිය නැවතත් සතුරු සෙන් ලන් වෙන් වෙන් එම පලිසවඩන රාලත් පලිස දමා දුවනා වේලාවට "නොදුවසි සෙදී" දෙතුන් විටක් දිවස්ලා වදාලාය.

ඒත් දුවන නිසා "අත ඇත්නම් නොදුවඩි. නොදුවසි" කියා සෙදුනු පනතට "බෝවා කාලයක් ආසු ශ්‍රී බෝවැඩ, අත ඇත්තේ පත ඇතිකොටවද" කියා දුවන කල "මහ කුඹුරේ බත් තිත්තකරම්" කියා සෙදුනු විට "මහකුඹුරේ බත් තිත්ත වෙච්චි නම් පිංගාබයේ අලකොල මියනා කොලත් තිත්තවේද"සි කියා දුවපු නිසා ශ්‍රී හස්තේ තිබුණු සකඩ පලිය බිමට දමා පලිහපිට වැඩසිටිමින් උඩින්

ඉයිලෙන මානැවියා දක වදුරමින් ශ්‍රී හස්තෝ සිටිය වඩන කුරුල්ලා ඇර වදුරමින් "රාජසිංහ මැඩිල්ල මෙතනයි" කියා වැඩසිටිනප්‍රස්තාවට ගල්දුනු ගල්පටි කිරිච්චි කෙඩේරි ජමජාඩි වලාතඩි වාතාතඩිවාතත් චක්‍රාවලලු හැදිතුවක්කු අත්තුවක්කු විරගි බෙඬි කුකුලා සුස්ලංස පටි සථාන මෙකිආවුද ගත්තාවූ පන්සියක් හේවා හමුදුවත් ඉස්කෝපීති කියන පරංගි කප්පිත්තා *මහගොරෙඬ කියන අපගේ මිගොමුවේ මුදියන්සෙන් සැදි පැහැදී හේවාකමට එන වේලාවට ප්‍රවර සූයසි මඩලයක් මෙන් වැඩසිටිනා බව මිගමුවේ මුදියන්සේ දකිමින් සුඹ සූයසිා වංසෝත්භූතවූ දේව සවාමි දරුවානන් වහන්සේට සතුරු සේනාව යුද්දකරපුනම් කෝට්ටේ මහ වාසලිං සෙදුනු පනතට කාංචිපුර දේසේ සිට ආ පක්ෂවාදියොන් නැතිවෙ"යි කියා අතේ තිබි කිරිච්චියෙන් සටිපල්ල ඉරා සතුරු සේනාවට ලේ පෙන්නා "සිංහලේ ඇත්තෝ හදිකරපුව"යි කියා පරංගිකාර ගොල්ල රවටා ආපසු කාරණුවාගන ගොස් පලමු සිටිය තැන පොරොත්තු උනාය. අපගේ රාජසිංහ දේවස්සුවාමි දරුමානන් වහන්සේ අමාත්‍ය මඩලේ රදලවරු දක්කවාගන "පරංගිකාර ගොල්ල ආබව මොකද? නැවත ගිය කාරිය මොකද?" අග වදල තැනේදී මානලේ දිසාව ලැබී තිබෙන වැල්ලකේ දිසා

---

*The Rua Grande, Main Street community, waited on the King (Rajasingha First, King of Sietawaka) with their PATAMGATIMS and in acknowledgment of vassatage offered to him.

(The Ceylon Littoral, 1593. Page 27. Paul E Pieris)

("RUA GRANDE යනු 'මහ ගොරෙන්දෙ" නොහොත් "මහ වීදියෙ" ගෝත්‍රය යනුයි. ඔවුන්ගේ පටබැන්දන් සමග රජුව (සීතාවක රාජසිංහ රජුව) බැහැදක රජු කෙරෙහි තමන්ගේ පක්ෂපාත භාවය හැගිම වස් එතුමන්ට ඔප්පු දෙන්ට සෙදුනි......යි)

(අලගියවන්න මොහොට්ටාලගේ පෘතුගීසි තෝම්බුවේ ඉංග්‍රිසි විවරණය. ක්‍රි: ව: 1593. පිට 27 පෝල් පීරිස්)

මහත්මයා විසින් රාජසිංහ දේව ස්වාමි දරුවානන් වහන්සේට ඔප්පු කරන සැටි නම් "ඝෝර්චිටේ මහවාසල වේලාවේදී පුත්තලමේ මුක්කරුන් එක්ක ශේවාකමට කුරුකුල දේශේ, කාංචිපුර දේශේ, කිලක්කරෙ, කාවේරි පට්ටලමේ මෙකී දේසවල්වලට කැඩපත් ඇර ගෙන්වා වදුරා හේවා පත්තෙට ඇරපු තැනේදී මුක්කරුන් හා යුධකොට ජයගත් නිසා තාන්න මාන්න ලැබී මීගමුව සහ ප්‍රවේනියට ලැබී, ඒ පක්ෂවාදිකමට අදත් අපේ රාජසිංහ මහවාසලට දෙමස්කත තපුර සේනාව යුධකරපු නං තපුරැයි කියා §මිගමු වැල්ලේ විදියේ වණීකුලසූරිය අරශ නිල ඉම්බුල මුදලියා දයාවෙන් පක්ෂවාදිවෙමින් සටිපල්ල ඉරාගත පක්ෂවාදිකමට ගිය බව මුත් පැරද ගියා නොවෙයි." කියා ඔප්පුකල තැනේදී ඒ මුදලියාට කාරුණාව ලැබී වඩන තල ඇත්තෙන් තල ඇගිල්ලක් ඉරාගත රන් පත්හිදෙන් "මේ පක්ෂවාදිකං ඇති බහු මාගෙ සිංහලේට ආවොත් බොහො තාන්න මාන්න ගම්වර ලැබී ආදර වෙම්." සෙදී කැඩපතක් ලියා රංදුනු සාම්සැර ගැන වදාරමින් ඊය අග පත්‍රය බැඳ විද වදුලාය. ඒ ලියමන මීගමුවේ මුදලියාගේ කලවාඩි ලහවූ නිසා පත්‍රය බලා *කාළුහමුදුව තිලමස්කාරයො සතරදෙනත් පරංගිකාරයින්ට කියන වග නම්, "අපි ආ හැකන මුවාත් සුද්දනැන. ඊයත් වෙඩිබෙහෙත් නැත, සේවා පත්තෙත් බල මද කියා කොටුවට ගොස් සියළු කටයුතු සමුඩිකොට එමැයි." කියා කොටුවට ගියාය. ගිය තැනේදී වැල්ල වීදියේ මුදලියා මහ වාසලට පක්ෂ වාදිකංවූසැටි ප්‍රහිකාර ගොල්ල විමසමින් එම මුදලියා

---

**"§The Community of Rua da Praia, Beach Road"**

**(The Ceylon Littoral, 1593. Page 27, Dr. Paul Peiris)**

"රුවා ද ප්‍රයියා, යනු වැල්ලේ විදියයි. (මීගමුවේ) වැල්ලේ වීදියේ ගෝත්‍රය යනුයි."

(අලගියවන්න පෘතුගීසි තෝම්බුවේ විවරණය. 159 3 27 පිට ආචාර්ය පෝල් පීරිස්)

*කාළුහමුදුව - කාරාවේ යුධ හමුදාව.

අවතිරකොට "කොළඹසමුද්‍රධන් අතික් තිලමක්කාරයන්ටත් කොල්ලැවක් පමණවත් ඇත්ත මුහුදෙ යන්ටත් එපාය කියා නාගුඵ ගන්ගොඩමෙන් යන්ටත් එපාය. ගිය කෙනෙක් ඇත්නම් කටට වෙඩිබෙහෙත් දමා ගිනිදෙනවා ඇත" කියා අඬබෙර ලැව්වාය. නැවත රාජසිංහ දේවස්සුවාමින් වහන්සේ ඕලංදට කඩපත්ඇර වදාලාඇත. ඒ පතනින් ඕලංදක්-කාරයෝ ගේවා පත්තෙට කටයුතු සදගෙන ඇවිත් මුහුදෙ සිටි බව අසා පරංගිකාර ගොල්ල එන්ට නොදී රැක්කාය. ඒ වග රාජසිංහ දේවස්සුවාමින් වහන්සේට ඒත්තුවෙමින් ඕලංදක්කාරයින්ට අති කඩිනමට ගොඩබසින සැටියට ලියමන් ලියා *මීගමුවේ මුදලියාට දෙන්ටෙයි සෙදි පතිවිඩ කාරයින් ඇරියාය. ඔහු ගොස් මීගමුවේ කුරුකුල සූරිය මුදලියා අතට දුන්නාය. ඒ ලියමන සිංහලේම අකි විගව සඹු මුදලිවරු සතරදෙනා බලා "අපි නැකිවෙනත් මහවාසලට පක්ෂවාදිකාං ඇකිණිශා කැඩපත ලංසිගොල්-ලම දෙන්ට ඕනෑයි" කියා වැල්ලවීදියේ මුදලියාගේ යාළු නැකං දරණ ඉශල් නසිදේම නියෝග කර එවලෙහිම ඉලේ නසිදෙ ජිඩිකා වෘත්තිය ශොසලකා මුහුද පීනා ගොස් පනුවද පාන්වූ කුන්පැය වේලාවට කැඩපත දුන්නාය. ඒ කැඩපත බලා ලංසි ගොල්ල මුහුදෙන් ගොඩ ආවාය. නැවත රාජසිංහ දේවස්සුවාමි දරුවාංනත් වහන්සේ සම්ජන සන්නාහ සන්නද්ධව චතුරංග සේනාවත් වල්ලහවූ සේනාවත් වසතුවත් ඕලංදක්කාරයින්ට බාරදෙමිං කපුවරල වාඩියේ වැඩසිට මීගමුවේ තිලමක්කාරයින්ට එන්ටයෙදී ‡මහවිදිගේ කුරුකුල සූරිය මුදලියාද, ශාම්ෂ අදිගතුරෙ

*ක්‍රි: ව: 1613 දී මීගමුවේ සිටි කරාව කුලයට අයත් ප්‍රධාන මූලාදෑනින් සම්හරකුගේ නාම මෙසේයි. මොවුන් හට සිංහල රජුන් දවස අයබදු ගෙවී හැටි ප්‍රකාශ කිරීමට අණකර තිබේ.

(1) Dom Gasper Da Cruz, Patamgatim Major. Rua Grande, Aged 46.
(2) Dom Theronymo, Mayoral, Rua Grande, Aged 75,
(3) Simoa Fernando, Rua Grande, Aged 50,

අරසකුල සූරිය, වීරසිංහ කුරුණ ආරච්චිලද, ජයසූරිය ආරච්චිලද, මහ ගුණුපිටියේ රණසිංහ ආරච්චිලද, කාට්ටප්පබය ආරච්චිලද, *වැල්ලවීදියේ මුදලියාගේ ඇමැසස හැකිං දරාපු අඩි අරස අඩප්පයා. ඒ ඇර ආරච්චි නම් වලින් තවත් කීප අයටත් තාන්ත මාන්ත ලැබෙමින් මාලක් කරලෑවාය.

*(4) Alfonso Pereira, Patamgatim Major, Rua Da Praia. Aged 52.

(5) Ventura Fernando, Mayoral Rua Da Praia, Aged 60

(6) Luiz Fernando, Rua Da Praia, Aged 78.

On 20 th August 1613, the following, who have been summoned to state the dues levied under the Heatheen Kings appeared at the Vedor's house in Colombo. Namely:-

(The Ceylon Littoral. 1593, Page 26, by Dr. Paul Peiris)

වර්ෂ 1613 ක්වූ අගෝස්තු මස 20 වෙනි දින මෙකී ඉහත සඳහන් අයින්, මිථ්‍යාදෘෂ්ටි රජුන් (සිංහල රජුන්) දවස අයබදු ගෙවූසැටි ප්‍රකාශ කිරීම්වස් ඔව්හු කොළඹ ආදායම් භාරකාර තැනගේ නිවසට කැඳවන ලදී. ඔවුන්ගේ නාම

(1) දොන් ගැස්පර් ද කෲස්, රුවා ග්‍රාන්ඩියේ, නොහොත් මහවීදියේ මහ පටබැන්ද. වයස 46.

(2) දොන් ජෙරනිමෝ, රුවං ග්‍රාන්ඩියේ, නොහොත් මහ වීදියේ නගරාධිපති. වයස 75.

(3) සිමොන් ප්‍රනාන්දු, රුවා ග්‍රාන්ඩි, මහවීදිය වයස 50

(4) අපොන්සු පෙරේරා, රුවා ද ප්‍රයියා, නොහොත් වැල්ලේ වීදියේ මහ පටබැන්ද. වයස 52.

(5) වෙන්තුරා ප්‍රනාන්දු, රුවා ද ප්‍රයියාවේ නොහොත් වැල්ලේ වීදියේ, නගරාධිපති. වයස 60.

(6) ලුයිස් ප්‍රනාන්දු, රුවා ද ප්‍රයියා නොහොත් වැල්ලේ වීදිය. වයස 78.

(අලගියවන්න මොහොට්ටාලගේ පෘතුගීසි තෝම්බුවේ ඉංග්‍රීසි විවරණය. ක්‍රි: ව: 1593, පිටුව 26. ආචාර්ය පෝල් පීරිස්)

(එංගලන්ත බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් නො: P 17323 / O R 6606 (53) දරණ පුරාණ පුස්කොළ පොතේ පොටෝ ස්ටැට් ඡායාරූප පිටපතෙන් උපුටා ගන්නා ලදි.)

ඉහත සඳහන් ඉතිහාස කථාවස්තුව හා සමාන පොත් හතරක් දැනට සොයාගත තිබෙන බව අපගේ පරීක්ෂාවට භාජනවී තිබේ.

මුලින්ම ප්‍රසිද්ධියට පමුණුවන ලද පුස්කොළ පොත කාළුතර පුලිනතලා රාමයේ තිබී ඉන් කොටසක් වැලිගම ශ්‍රී සුමංගල මහා ස්වාමි දරුවානන් වහන්සේ විසින් සකස්කර ක්‍රි: ව: 1874 රේ මුද්‍රිත ඉතිහාස පොතේ 60 වෙනි පිටුවේ දක්වා ඇත්තේය.

දෙවෙනි වරට වෛද්‍යාචාර්ය ඇන්ඩ්‍රියස් නෑල් මහතුන් විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙන පත්ඉරු දහසයකින් යුත් "රාජසිංහ වන්නි කථාව" නැමැති පුස්කොළ පොතෙන් ගත් ඡායාරූප පිටපතයි මෙය ඉහත සඳහන් කථාවට වඩා විස්තර සහිත පොතකි. මෙම පොතේ අඩංගු ඉතිහාස ප්‍රවෘත්තිය ක්‍රි: ව: 1936 යේ නොවැම්බර් 1 වැනිද, 8 වැනිද සහ 16 වැනිදත් පළවූ සිළුමිණ ඉතිහාස කලාපවල දක්වා ඇත.

තුන්වෙනුව දැනගන්ට තිබෙන පොත දික්වැල්ලටත් තංගල්ලටත් අතර පිහිටි මහවෙල ග්‍රාමය අසල නාකුළු-ගමුවේ ඒගොඩරූප්පේ විහාරස්ථානයේ තැන්පත්වී තිබේ. එහි කථාවිස්තරය තංගල්ලේ ගෞතම විද්‍යාලය මගින් පළවෙන සරස්වතී ශාස්ත්‍රීය සඟරාවේ 1950 ඔක්තෝම්බර් කලාපයේ ප්‍රසිද්ධවිය.

## දොන් කොස්මො මුදලි මන්නි.

"There were in command of the fighting men of our territory, and were named Dom Alexo, DOM COSMO. Dom Balthezar and Dom Theodozio"

(Ribiero's Ceilao. P 96)

භාවය:- (පරංගි) "අපේ යුඩ හමුදාවේ සේනාපතීන් වශයෙන් දොන් ඇලැක්සෝ, **දොන් කොස්මෝ,** දොන් බැල්තාසර් සහ දොන් තියඩෝෂියෝ නැමැත්තෝ සිටියෝය" යනුයි.

ක්‍රි: ව: 1630 පමණේදී කොන්ස්තන්තිනුද සා සෙන්-පතියා පන්සියයක් පමණ තෝරාගත් පලපුරුදු පෘතුගීසි යුඩ භටයින්ද විසිදහසක් ලස්කිරිඤ්ඤ (සිංහල භේවාපන්නයද) ඔවුන්ගේ අණදෙන සේනාපතියන්වූ දොන් ඇලැක්සො, දොන් කොස්මෙං, දොන් බැල්තාසර්, දොන් තියඩෝෂියෝ සහ (දොන් සීමන්) නැමැති සිංහල මුදලිවරුන් පස්දෙනද පිරිවරාගෙන සිංහලේ හෙවත් උඩරට රාජධානිය "නැත්තටම නැති කරමැයි" වාගාඩම්බර බෙතෙමින් මැද මහ නුවර යටත් කරගෙන එහි රැකවල් තබා ඌවට පසුබා ගිය සෙනරත් රජුද, කුමාරසිංහ, ඇපාණෝද, විජයපාල මාතලේ කුමාරයාද, රාජසිංහ කුමාරයාද, අල්වා ගන්නා පිණිස ඌවට පිවිසියේය ඔව්හු මූතියංගන විහාරයේ කඳවුරු බැඳගන බදුලු නුවර කොල්ලකා ගිනිතබා විහාර පන්සල් කඩා බිඳ දැම්මෝය.

ඉහත සඳහන් මුදලිවරු පස්දෙන මීට ඉහත අවුරුදු තිපයක සිට සෙනරත් රජු සමග පෘතුගීසීන් වනසාලීම සඳහා කුමන්ත්‍රණයක යෙදී සිටියෝය. මේ ප්‍රස්ථාවේදී ඒ කුමන්ත්‍රණකාර මුදලිවරු කොන්ස්තන්තිනුද සා හා ඔහුට පක්ෂ යුඩ හමුදාවද පාවා දීමට කටයුතු සලසාගත්හ.

රජතුමා විසින් එක මුදලි කෙනෙකුට එවන ලද ලියුම්තක් කොන්ස්ටැන්ටයින් ද සා අතට පත්විය. එහෙත් ‡විභාෂා දත් මොහොට්ටිරාල ඒ ලිපියෙහි ඇති සත්‍යය සඟවා ක්‍රියාකෙළේය. "පෘතුගීසි සේනාව ජීවත්ව සිටීමට තවත් ඇත්තේ එක දවසක්ය." යන ආරංචිය රජුගේ සේනාව අතර පැතිර ගියේය. මුදලිවරුන් හා අමාත්‍යපවී සිටි ආරච්චි කෙනෙක් මේ කරුණ එළිකළහ. ඉන් ඉක්බිති තමාට තමාම කරගත් වරද කොන්ස්තන්තීනු ද සා සෙන්පතිට අවබෝධ විය.

එක් උදෑසනක පසුබැස යාමට අදහස් කළ පෘතුගීසි යුධ ඛණ්ඩායම තුන් කොටසකට බෙදී රජුගේ යුද බල සේනාවට පෙනී පෙනීම බදුලු හගෙක් එතර විය. එකල්හී පසුපස ගමන්ගත් දොන් කොස්මෝ මුදලිඳු පරංගි හේවායකු මරා ඔහුගේ හිස ලංසයක අමුනාගත, දොන් ඇලැක්ෂියෝ මුදලිද ඔහු යටතේ සිටි ලස්කිරිඤ්ඤ හේවායින් සමග සෙතරත් රජුන් වෙත පලාගියේය. අනිකුත් මුදලිවරුද තම තමන් යටතේ සිටි හේවා පන්නය සමග පෙර කියන ලද්දන් අනුව පලාගියහ. සිදුවූ අභාග්‍යය දුටු පෘතුගීසිහු සිහි විකලභාවයට පැමිණියාහ. පලායන මේ සේනාව රාත්‍රි කාලයේ කඳු පාවුලකට සේන්දුවී ලැගුම්ගනී. එහෙත් සිංහල සේනාවෙන් බේරුමක් නොවීය.

එක් එක් හේවායා දවස් තුනකට පමණක් යැපෙන ආහාර තබාගත ඉතිරි ආහාර හා බඩුබාහිර ආදිය පුලුස්සා දැම්මේය. පසුවද යම්තම්කට පණ බේරාගත් පරංගි සේනාව උඟුවේ සීමාව යාබද වැල්ලවායේ කඳු බැවුම්කට ලඟාවිය. මීට පැය ගණනකට උඩදී රණදෙණියේදී දෙපක්ෂය අතර සටනක්ද ඇතිවී පරංගි සේනාවට මහත් හානි සිදුවිය.

---

‡විභාෂා - සිංහල සහ පෘතුගීසි යන භාෂා දෙක විභාෂ්, තුපාස්, තුප්පයි, මෙයට ලන්දේසි සහ ඉංග්‍රීසි භාෂා වලින් (DUBASH) ඩුබැෂ් යයි කියති.

මෙතෙක් පරංගින් හා රුඳී සිටි මාතර සහ සත්කෝරලේ ලස්කිරිඤ්ඤ හේවා, මුලටද එහිදී බලවත් ලෙස පහර වැදුනි. අන්තිමේදී ඔව්හුද රජුගේ පක්ෂයට එක්වූහ.

වර්ෂ 1630 අගෝස්තු මස 25 වෙනි දින කොන්ස්තන්-තීනු ද සා ජනරාල් තැනට යටත්වන ලෙස රජු විසින් යෝජනාවක් යවන ලදී. එය ප්‍රතික්ෂේප කල ජනරාල් අන්තිම හේවාසා දක්වා සටන් කිරීමට ඉටාගත්තෙන් එදින පෙරවරු හතේ සිට පස්වරු දෙක දක්වා සටන කරගන ගියේය. මේ අතරතුර පරංගි හටයින් 350 තස් දෙනෙක් පමණ මැරුම්කෑවෝය. සිය ගණනක් හිරභාර-යටද ගත්හ. එක අතක් රොච්චිවූ ජනරාල් පලල් කඩුවකින් හත්තැදිව සිංහල හේවායෝ බොහෝ ගණනක් මරාදැම්මේය ර් පහරක් වැදුනු ජනරාල්ද බිම ඇද වැටුණේය.

ඔහුගේ හිස කපාගැනීමට සිංහල හේවායන් එතැනට රැස්වූවිට ජනරාල් බේරාගැනුම්වස් තැත්කිරීමේදී පරංගි පක්ෂයේම වෙඩිල්ලක් අත්වැරැද්දෙන් වැදී හෙතෙම එතැනම මියගියේය. ඉතිරි හේවායින් මරාදැමීමෙන් හෝ හිර අඩස්සියට ගනු ලැබීමෙන් හෝ පරංගි පක්ෂයේ සම්පූර්ණ පරාජය සිදුවිය. එක පරංගි යුද හටයෙක්වත් මේ සටනින් ඉතුරු නොවිය.

(ජෝන් රොබෙයිරෝ. ඇස්. ජී. පෙරේරා පියතුමා සහ රොබට් නොක්ස්ගේ ඉතිහාස පොත් ආශ්‍රයෙනි)

මේ සටනින් ජයගැනීම පිණිස සෙනරත් රජුට පක්ෂව බොහෝදුරට ක්‍රියාකලේ දොන් කොස්මෝ මුදලි තුමාය. පරංගි පක්ෂයෙන් වෙන්වී සිංහල පක්ෂය ගත් මේ මුදලිඳුව නැවත කොළඹට යෑමට අන්දමක් නැති සෙයින් උඩරට පදිංචි වීමට ඉටාගත්තේය. සෙනරත් රජු දොන් කොස්මෝ මුදලිඳුට බොහෝ වස්තුවද ඌවේ උඩුකිඳ බද කතුගහ වලව්වද, අවට තිරවුල් ගොඩ මඩ ඉඩම්ද තිඳගම්කොට දුන්නේය. කතුගහ පරම්පරාව සහ ඇහැලේපොල පරපුරද මේ දොන් කොස්මෝ මුදලිඳුගෙන් පැවතෙති.

## විශෙෂ විභාග.

(1)

මේ සටනේ ප්‍රධාන ද්‍රෝහිකාරයා වශයෙන් පරංගින් විසින් ප්‍රකාශ කර තිබෙන්නේ දොන් කොස්මෙ මුදලියා. ඔහුට සිංහල නාමයක් තිබුණු බව පරංගි ඉතිහාස පොතක දක්නට නැත.

(2)

දොන් කොස්මෙට පළමුවෙන්ම විජේශේඛර නාමය දක්වා ඇත්තේ, †සයිමොන් ද සිල්වා මුදලිඳු විසින් සම්පා-දනය කළ ආණ්ඩුවෙන් මුද්‍රිත ලංකා කථාවේය. මේ

---

ලංකා කථාව.

†"කුරුඳු බද්ද සම්බන්ධ මුදලි කෙනෙකුගේ පුත්‍රවූ දොන් කොස්මෙ විජේසේකර නම් මුදලිතැන අති දක්ෂ යුද්ධකාරයෙකු මෙන් ප්‍රසිද්ධව සිටියේය. හෙතෙම පළමුකොට සතර කෝරළේ මැණික්කඩවර බලකොටුව භාරේ සිටි එමැනුවල් ද අසවේදු සේනාපති තැන යටතේ යුද්ධ මූලාදෑනි-යෙක්ව සිටියේය. ඉන්පසු සතර කෝරළේ ජනනායක ධුරය ලැබ සටන් කීපයකදී ජයගෙන බොහෝ ධනය රැස්කොටගෙන කොළඹ අසල මට්ටක්කුලියේ අලංකාර ප්‍රාසාදයක් තනවා මහත් ඓශ්වර්යයෙන් එහි වාසය කෙළේය. "...........උදෑසන ප්‍රතිකාල් සේනාවෝ කන්දෙන් පහළ බසින්ට පටන්ගත්තේය. එකල්හි දොන් කොස්මෙ තම්වාගේ සේනාව වෙන්කොටගෙන සිංහල රජ්ජුගේ පක්ෂයට ගියේය අනිත් මුදලිවරු තුන්දෙනද එසේම කළෝය."

(සයිමොන් ද සිල්වා මුදලිඳුගේ ලංකා කථාව. 85 වෙනි පිටුව)

සැලකිය යුතුයි:- දොන් කොස්මෙ විජේසේකර මුදලි මේ සටනට නොගිය බවත් සටනට ඉදිරිපත්වූයේ දොන් කොස්මෙ බවත් මෙයින් පැහැදිලිය. විජේසේකර මුදලි කෙනෙක් මීට ඉහතින් පරංගින්ට පක්ෂව සිටියේය. ඔහුව පාතුගීසින් විසින් සතරකෝරළේ දිසාපති කමට පත්කරණ ලදී. ඔහු මහලු වයසේදී කොළඹට ගොස් මට්ටක්කුලියේ අලංකාර වලව්වක් තනවාගන එහි වාසය කෙළේය.

විජේසේකර නාමය කුමන ඉතිහාස පොතකින් උපුටාගත්තාද යනු සයිමොන් ද සිල්වා මුදලිඳු එහි විස්තර කර නැත.

(3)

ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතාද දෙන් කොස්මෝ විජේසේකර යයි මෙම දෙන් කොස්මෝට තම පෘතුගීසි යුගය නැමැති ඉතිහාස පොතෙන් ප්‍රකාශයට පමුණුවා තිබේ. දෙන් කොස්මෝ විජේසේකර මුදලිඳුට වික්‍රමසිංහ නාමයද කටුගහ වලව්වද ඒ පළාතේ නිරවුල් ගම්ද තිඹිරිගම් කොට දුන් බැව් එහි 175 වෙනි පිටුවෙහි දක්වා තිබේ එහෙත් මේ දෙන් කොස්මෝට විජේසේකර නාමය ලැබුන අන්දම එහිද සඳහන්ව් නැත. එනිසා මේ විජේසේකර නාමය ලංකා කථාවෙන්ම උපුටා ගත් බව විසවාස කලහැක.

(4)

හලාගම් කුලය පිළිබඳ "ශ්‍රී ලංකාවීප වර්ණනා" නැමැති පොතේද ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතාගේ පෘතුගීසි යුගය නැමැති ඉතිහාසයෙන් උපුටාගෙන දෙන් කොස්මෝ විජේ-සේකර"යයි ලියා එතුමා හලාගම කුලයේ "තන්දිරිස් විජේසේකර මුදලිඳුගේ" අභිජාත පුත්‍රරත්නයකැයි ලියා තිබේ. මේ කියන විජේසේකර මුදලිඳු "මෙතැන් සිට උඩරටම පදිංචි විය. මෙතුමා වර්‍ෂ 1630 සිට 1713 වනතුරු එහි වාසය කෙළේය."යයි එහි කී හෙයින්, මේ මුදලිඳු අවුරුදු 83 ක්ම *කටුගහ වලව්වේ විසූ බව හැඟී යයි.

---

*දෙන් කොස්මෝ මුදලි පිළිබඳව බණ්ඩාරවෙල කොත්තහෙළ, මහ පළාතේ කටුගහ කෝරලේ මහතා රජවත්තේ වැසි කටුගහ හිටපු ආරච්චි මහතා, මාළිගා තැන්නේ කටුගහ බණ්ඩාර මහතා, කටුගහ සිරිල්, කටුගහ යනාදි මහතුන්ගෙන් විමසූ අපට ලැබුන උත්තරය නම් ඔව්හු දෙන් කොස්මෝ මුදලි සම්බන්ධව කිසිත් නොදන්නා බවයි.

තවද, රොබට් දිවිතොටවෙල, උඩුකිඳ රටේ මැතිතුමා වැලිමඩ, රඹුක්පොත හපුතලේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, බදුල්ල, ලංකාතිලක, වැල්ලවා පලාත, සහ උඩුකිඳ රටේ මැතිතුමා සහ කැලෑ දෙපාර්තමේන්තුවේ නිලධාරි සිදුරුවාණෙන් උඩුවාවල මහතා යනාදීන් විසින්, දෙන් කොස්මෝ මුදලි වනාහී මීගමුවේ මුදියන්සේ කෙනෙකැයි යනු අප හා කීයන්ට සෙදුනේය.

එහෙත් කටුගඹ වලව්වේ පදිංචිවෙන කාලයේදී එතුමන්ගේ වයස සාමාන්‍යයෙන් අවුරුදු 40 ක් වත් යොදා බැලූකල එතුමා අවුරුදු 123 ක් පමණ ආයු වැළඳූ බැව් ඔප්පුවේ. එය වෙන්ට බැරිදෙයකි.

(5)

ඌව ඉතිහාසයේද දෙන් කොස්මෝ මුදලිට විජේ-සේකර යයි අමතමින් එතුමා ඇහැලේපොල පෙලපතේ පිතෘවරයා වශයෙන් අඳුන්වා දීතිබේ. මෙයද ආචාර්‍ය්‍ය පෝල් පීරිස්තුමාගේ පෘතුගීසි ඉතිහාසයෙන් උපුටා ගත් බව එහි සඳහන් කර තිබේ.

දෙන් ජුවන් ධර්මපාල රජු රාජ්‍යය කළ කාලය ක්‍රි: ව: 1551–1563 දක්වා දොළොස් අවුරුද්දකි. මේ දොළොස් අවුරුද්ද ඇතුළත විජේසේකර නාමයෙන් පෙනීසිටියේ එක මුදලි කෙනෙකි.

එනම්:- "තේවාගම කිඹන්පළගෙයි හිද්දා නයිදේගේ පුතා කොළඹට ගොස් ධර්මපාල රජ්ජුරුවන් දැක විජය සේකර මුදලිකමුත් ලැබ කොළඹ ඉඳගෙන නොයෙක් කෙටුම් කොටා තැතක් හිර අල්ලාගත කොළඹට එක් සිත්ව උන්නාහ." (රාජාවලිය)

මේ හිද්දා නයිදේගේ පුතාට මුදලි තිලයත් විජය-සේකර නාමයත් පටබැඳනු ලැබුවේ ධර්මපාල රජුගේ කාලයේදිය ඒ රාජ්‍ය කාලයේ අන්තිම වර්ෂයවූ 1563 සිට රණදෙණි වැල්ලවායේ යුද්ධය කෙරුණු 1630 වර්ෂය දක්වා කාලය 67 අවුරුද්දකි. මුදලිකම ලබනවිට ඔහුගේ වයස අවුරුදු 25 ක් යොදා ගණන් බැලූ විට ප්‍රශ්නයට භාජනය වන යුද්ධය කෙරෙනවිට ඔහුගේ වයස අවුරුදු 92 ක් තවත් වැඩිවන සෙයින් මේ නැගිටින්ඩවත් බැරි මහලු විජේසේකර මුදලි අර ‡දෙන් කොස්මෝ මුදලි නොවන බව ඉතා හොඳින් පැහැදිලිවේ.

‡පර්නැන්ඩි කියුරෝස් ඉතිහාසකරුද මොහුට තිකම්ම දෙන් කොස්මෝ මුදලියයි කියා තිබේ.

**(6)**

**"Another distinguished chief recorded in history is Wijesekara Mudaliyar's son Don Cosmo, who was in the service of the Portuguise Genral Emmanuel Da Azavedu who commanded the camp at Manikkadawara. He was invested with the rank of Mudaliyar under the name of Kulatunga and for his distinguised services he was rewarded with command of the four Korales,**

**He had a magnificient house built at Paliyagoda. He gave his daughter in marriage to Don Emmanuel secretary to the Portuguese General Constantine Da Sa."**

**(Dutch Times, by F. E. Gooneratne. Tombo Mudaliyar of Atapattu Walauwa. Galle. P. 70)**

මෙහි කෙටි විස්තරය නම්:- "තවත් සැලකියයුතු ප්‍රධානියෙකු පිළිබඳව ඉතිහාස ගතවන්නේ විජේසේකර මුදලිඳුගේ පුත් දොන් කොස්මෝය. මැණික්කඩවර කඳවුරේ ආඥාදායක එම්මානුවෙල් අසවේදු ජනරාල් සටනේ මෙතෙම මෙහෙකළේය. ඔහුට මුදලි තානාන්තරයද පවරා කුලතුංග නැමැති නාමයද පට බඳන ලදී. ඔහුගේ කටයුතු මනා අන්දමට කළ හෙයින් හතර කෝරළය පරිපාලනය කිරීමටද පත්කෙළේය. පැලියගොඩ තනන ලද රම්‍ය නිවාසයක්ද ඔහුට අයිතිව තිබුණි"

"කොන්ස්තන්තීනු ද සා ප්‍රතිකාල් ජනරාල්ගේ ලේකම් තැන්පත්ව සිටි දොන් එම්මානුවෙල්ට ඔහුගේ දියණියක්ව විවාහකොට දුන්නේය" යනුයි.

(ගාල්ලේ අතපත්තුව වලව්වේ ඇප්. ඊ. ගුණරත්න තෝම්බුවේ මුදලිතුමාගේ "ඩච් ටයිම්ස්" පොත. 70 පිටුව.)

“ඩච් ටයිම්ස්” නොහොත් “ලංදේසි කාලය” නැමැති ඉහත සඳහන් පොතේ විස්තරවන දෙන් කොස්මෝ කුලතුංග මුදලි කොළඹම සිටි මුදලි කෙනෙකි ඔහු 1630 සිදුවූ රණදෙණිය, වැල්ලවාය යුද්ධයට සම්බන්ධවූවෙක් බැව් මෙම පොතෙන් ප්‍රකාශවී නැත. මොහු පරංගි යටතේ හතර කෝරළය කරවන ලදුව දරුවන් ඇත්තෙක්ද විය. ඉන් නිසා තම අඹුදරුවන්ද ඥාතීන්ද අත්හැර දමා ඔවුන් කොළඹ සිටින අතර පූර්වෝක්ත යුද්ධයේදී පරන්ගින්ට ද්‍රෝහිව සිංහල රජුගේ පක්ෂය වෙත කඩුගහ වලව්වෙ බින්න බැසපු දෙන් කොස්මෝ මුදලියයි. මේ කුලතුංග මුදලි මොහොතකටවත් සිතන්ට බැරිය. මේ දෙන් කොස්මෝ කුලතුංග මුදලි අනිකෙකි.

ගෞරවණීය ඇස්. ජී. පෙරේරා පියතුමන් විසින් සම්පාදනය කරණ ලද “පෘතුගීසි හා ඕලන්ද යුග” නැමැති ලංකා ඉතිහාසයේ රණදෙණිය සහ වැල්ලවායේ සටනට සහභාගිව කොන්ස්තන්තීනුද සා ජනරාල් සමග ඌවට ගිය සිංහල සේනාවේ කුමන්ත්‍රණකාර ප්‍රධානියා දෙන් කොස්මො කුලතුංග මුදලියයි ලියා තිබේ. ඒ සටන කෙරෙන අතර පරංගි හටයකු මරා ඔලුව හෙල්ලක අමුණා ඔහුගේ පිරිසත් තවත් මුදලිවරුන් පිරිසත් කැටුව රජුගේ පක්ෂයට ගොස් පරංගි සේනාව සහමුලින්ම විනාශ කල බව එහි වැඩිදුරටත් සඳහන්ව තිබේ එහෙත් මේ දෙන් කොස්මො කුලතුංග මුදලිට ඌවෙන් නින්ද ගම්වර දුන්න බවත් යුද්ධයෙන් පසු ඔහුට කුමක් සිදුවීදැයි යන්නවත් එහි ලියා නැත.

ඉහත සඳහන් ඉතිහාස පොත්වල සඳහන් දෙන් කොස්මෝ මුදලි රොබෙයිරෝ කියන්නාසේම නිකම්ම දෙන් කොස්මෝ මුදලි නම් කෙනෙකි. ඔහුට “විජේසේකර” හෝ කුලතුංග” යන සිංහල නාමයන් තිබුනේ නැත. විජේසේකර සහ කුලතුංග මුදලිවරු දෙදෙන මේ කාලයේ

යුඞයට නොවපිනා දරු මුනුබුරන් ඇතුව සිටි මහලු අය වෙති. ඔව්හු කොළඹ නගරයේ පදිංචිව සිට අත්තිමය දක්වා පෘතුගීසීන්ගේ දයාවද ලැබ මියගොස් කොළඹම භූමදානය කළ මුදලිවරුය. කටුගහ සහ ඇහැලපොල පෙලපතේ මුලිකයා දෙන් කොස්මෝ නැමැති මිගමුවේ මුදලි කෙනෙකි. ඔහු යුඞයෙහි දක්‍ෂයෙකි. ප්‍රයෝග කුමංත්‍රණ වලට නම්දරා සිටි කෙනෙකි. මේ යුඞය පටන්ගැනීමට ප්‍රථම කොළඹ මඟුල්ගෙදරක සිදුවූ රහසිගත කථාවක් මෙසේයි.

## සිංහල මුදලිවරයකු මගුල්ගෙදරකදී කල කථාව.

කොන්ස්තන්තිනු ද සා ගේ කාලයෙහි ඔහු යටතේ සේනානායක ධුර ඉසිලුවාවූද පසුව සිංහලේන්ද්‍රයාට පක්‍ෂව පරංගීන්ට විපක්‍ෂව කැරලි ගැසුවාවූද දෙන් කොස්මෝ දෙන් අඳුරෙ, දෙන් මනුවෙල්, දෙන් අන්තෝනියෝ, යනාදී අධිපතීන්ගේ නියම සිංහල නම් සෙවීම දුෂ්කරය නමුත් ද සිල්වා වාසල මුදලිවරයාගේ ලංකා ඉතිහාසයෙහි දෙන් කොස්මෝ "විජයසේකර" යයි පෙනෙන නමුත් කිපුරෝස්ගේ පොතේ සඳහන් වන්නේ දෙන් කොස්මෝ කියා පමණකි.

## නිර්භීත කථාව.

දෙන් කොස්මෝ මුදලි තැනගේ පුත්‍ර දෙන් අන්තෝනියෝ මහතා A දෙන් මනුවෙල් මුදලි තැනගේ දියණියක්

---

A මෙම දෙන් මනුවෙල් නොහොත් දෙන් එමානුවෙල් මුදලි වනාහි දෙන් ප්‍රනාන්දු නොහොත් සමරකෝන් රාළගේ මස්සිනාය. ඒ දෙන් එමානුවෙල් මුදලිගේ දියණිය දෙන් කොස්මෝ මුදලිගේ පුත්‍ර දෙන් අන්තෝනියෝට ආවාහ කොට දුන්නේය

සරණ පාමා ගැනීම පෙරදැරි කොට දොන් කොස්මෝ මුදලිඳුගේ නිවසේ මංගලෝත්සවයක් පවත්වන ලදී. පරංගි ආණ්ඩුව යටතේ සේනානායකයන් හැටියට සේවය කල සිංහල රදලවරු හැම දෙනාම යථෝක්ත උත්සවයට පැමිණියාහ. මේ ප්‍රස්ථාවෙහි සැබෑ සිංහලයෙක්වූ යථෝක්ත දොන් කොස්මෝ මුදලි තුමා ඔවුන් ඉදිරියේ රහසිගතව කල හිතෛෂි වේගවත් කථාව සැකෙවින් මෙසේයි:-

"ශ්‍රේෂ්ඨ මිත්‍රවරුනි, මේ නීච පරංගීන්ගේ වහලුන් හැටියට තව කොපමණ කලක් අපි ජීවත්වන්නමෝද? මොවුන්ගේ කැමැත්ත අනුව දෙනු ලබන නිදහසක් හැර වෙන මොනම නිදහසක්වත් නැතුව අපි මොවුන්ගේ දරුණුවූ වහල්කම අවුරුදු 125 ක් පමණ කාලයක් විඳ දරාගත්තෙමු.

"මනුෂ්‍යයන්ට ඇති මහානාඝී වස්තුව නම් නිදහසය. බොහෝ කලක් වහල්කමට පත්ව සිටීමේ විපාකයක් වශයෙන් තමුන්නාන්සේලාට ඒ බව සම්පූර්ණයෙන්ම

---

* වර්ෂ 1614 ජනවාරි මස 14 දින දරණ පිලිප් රජුගේ ලියුමක දොන් ප්‍රනාන්දු මුදලි තැනගේ සහෝදර ඉඤ්ඤියෝද (දොන් දියෝගෝ) මුදලිතැන පෘතුගීසි රට නැවතී සිටි බවත් ඒ තැනැත්තා කලහකාර මනුෂ්‍යයෙක් සෙයින් පෘතුගීසි රටින් ඕහට සැහවී ඉඤ්ඤියාවට යන්ට නොදී ප්‍රවේසම් ලෙස ආරක්ෂා කල බවත් කියා තිබේ. මීට පසු සමරකෝන් රාළට හෙවත් දොන් ප්‍රනාන්දුට කුමක්විදැයි නොදනිමි.

(ඥාන දශීය. ix කාණ්ඩය. 44 පිටුව)

"අතිත් තුන්වෙනි කොටුව තිබෙන්නේ මාතර රාජ-ධානියේය. එහි ආණ්ඩුකාරයා සමරකෝන් මුදියන්සේය. ඔහුට දොන් ප්‍රනාන්දු කියාද නමක් ඇත්තේය.

(ඥාන දශීය. ix කාණ්ඩය. 30 පිටුව)

17 වැනි ශතවර්ෂයේ ස්පාඤ්ඤ ජාතික කප්පිත්තෙකු විසින් ලියන ලද ලංකාව පිළිබඳ ලිපිය.

අමතකවී ගියේද? නිදහස් මිනිසුන් හැටියටත් අධිපතින් හැටියටත් වාසය කරන්ට පුළුවන්කම තිබියදී තමුන්නාන්සේලාගේ මුතුන් මිත්තන් ගරුකොට සැලකූ ඒ උතුම් නිදහසට නිග්‍රහකොට ඒ වෙනුවට වහල්කම වැළඳගැණීමෙන් එකී මුතුන් මිත්තන් පිළිබඳ උත්කෘෂ්ට සිතුවිලි අමතක කරන්නහුද?

## පරංගින්ගේ ආදරය.

සවකීය දරු මුනුපුරන්ගේ අවාසනාවන්ත ඉරණම ගැන යුෂ්මත්හු නොසිතන්නහුද? අපගේ දුර්වලභාවය හෝ අස්ථිර ගතිය හේතුකොටගෙන අප සිංහල වර්ගයා වහල්කමට පත් කළොත් අපේ දරුවෝ ඒකාන්තයෙන්ම අපගේ ඇස් ඉදිරියේම මරණයට පත්වන්නාහ. එසේ නැත්නම් රට නංවනු ලබන්නාහ. අප වර්ගයාගේම විනාශය සලසණ පිණිස ඔවුන් හා කැටුව යාමට මිනිසුන් උවමනා නිසා අද දවසේ අපේ දේපොල බුත්තිවිඳීමට ඔවුන් අපට ඉඩදී තිබෙතත් හෙට දවසේ ඒවායේ අයිතිකාරයෝ ඔව්හුය. සිංහලයින් ජීවික්ෂයට පමුණුවා සිංහල නාමය මුලෝච්ඡින්න කිරීමෙන් හෝ එසේ නැත්නම් අපේ පවුල් සියල්ල රට නැංවීමෙන් හෝ ඔව්හු ඒ දේ සිදු කරන්නෝය. අපගේ ශූර භාවය ගැන භය ඇති ඔව්හු සවකීය ආධිපත්‍යය වඩ වඩා තහවුරු කරගැනීමට වෙර වඩන්නාහ.

ස්පාඤ්ඤ ජාතිකයෝ එම දේශයෙහි අවුරුදු 800 ක් කල ක්‍රිස්තියානි කාරයින් හැටියටත් බෞතිස්මව සිටි අප්‍රිකානු මනුෂ්‍යයන්ට එසේ කළාහු නම්, පර්සියාවේ රජ ආර්මේනියාවේ වංශාධිපතුන්ට එසේ කෙළේ නම්, සවකීය ආරක්ෂාව සලස්වා ගැනීම සඳහා තවත් බොහෝ දෙනා එසේ කළාහු නම් සදාකාලයටම ලංකාවේ පදිංචි වීමත් ලංකාවේ ඇති සියලු වස්තුව හා සැප සම්පත් මුළුමනින්

බුත්නිවිදිමටත් පුලපුලා සිටිත පරංගින්ගෙන් ඊට වැඩි දෙයක් අපට බලාපොරොත්තුවෙන්ට පුළුවන්ද? පරංගීහු ඔවුන්ගේ රටවැසියන්ටත් ඔවුන්ගේ දරුවන්ටත් වඩා අපට ආදරය කරන්යයි තමුන්නාන්සේලා සිතන්නහුද?

## අපේම ලේ.

මේ තරම් අධිකව කොලාහල පවතිද්දී මේතරම් ලේ විහුරුවා මියයද්දිත් ඔවුන්ගෙ ගණන වර්ධනවෙයි. අප සිංහල ජාතිය යටත්කොට සාමය පිහිටි කාලයක ඔවුන්ගේ සංඛ්‍යාව මෙති වර්ධන වන ආකාරය ගැන යුෂ්මත්හු කුමක් සිතන්නහුද? යුෂ්මතුන්ගේ අනුවණකම ප්‍රත්‍යක්ෂ වන්නේ එවිටය. එදාට යුෂ්මතුන් පරදේශක්කාරයන්ට විකුණනු ලැබූ වහලුන් හැටියට රට තංවන සැටි සියසින් දක්නාකල තමන් කල අනුවණකම් අවබෝධ වෙනවා ඇති ඔවුන් තමුන්නාන්සේලාගේ දුහිතෘන් සරණ පාවා ගැනීමෙන් දුන් ඥාති සම්බන්ධත්වය ඇතිකර ගැනීමේ අදහස නම් අපේම ලේ අපේ දේපල වලටත් අපේ නිදහසටත් යටත් වීමයි.

(දිනමිණ පුවත්පතෙහි කතෘ ධුරන්ධරව සිටි ඇලෙක්ෂැන්ඩර් වැලිවිට මහතාගේ ලිපි ආශ්‍රයෙනි)

## පටබැඳි මුදියන්සේලා.

කරාව හෙවත් කෞරව වංශයේ මුදලිවරුන්ට දෙමළ භාෂාවෙන් "පට්ටන්කට්ටි මුදලියාර්" කියාද, ලංකා භාෂාවෙන් "පටබැඳි මුදියන්සේලා" කියාද බැවහැර කරණ බව නොයෙකුත් පුරාණ ඉතිහාස පොත්පත් වලින් ප්‍රකාශයට පමුණුවා තිබේ.

එමෙන්ම පටබැඳි කුමාර, පටබැඳි කුමාරි, පටබැඳි බිසෝවරු, පටබැඳි අධිකාරම, පටබැඳි මුහන්දිරම, පටබැඳි කෝරාල, පටබැඳි ආරච්චි, පටබැඳි අප්පුහාමි, කියාද කුරුකුලයින්ට අති පුරාණයේ සිට මේ දක්වා ආමන්ත්‍රණය කරණ බව ප්‍රසිඬ කරුණකි.

කොළඹ මෝදර මට්ටක්කුලියේ වාසල වලව්වේ වැසි රෝම නුවර චැවලියර් ශිවුවර සේනාපති සර් පිලිප් රූජ්‍රිගු රදළ කුමාද කුරු වංශිකයෙකි. ආණ්ඩුවේ නීති ප්‍රකාර එතුමාට "පටබැඳි මුදියන්සේ" යයි කියයුතුයි. එතුමන් යටතේ රාජකාරි කරන අතිකුත් මුලාදෑනීන්වද පටබැඳි ආරච්චි යනුවෙන් ආමන්ත්‍රණය කිරීම පැරණිකල පටන් පැවතෙන සිරිතකි.

අපේ ඇතැම් ඉතිහාස කරුවෝ පටබැඳි මුදියන්සේ, පටබැඳි මුහන්දිරම යනාදී තිලමක්කාර නාමවලට අවුවා ලියා තිබෙන්නේ ඒ පටබැඳි නාම දරන්නන් සියල්ලෝම *මසුන් මරන්නන්ගේ ප්‍රධානීන් හැටියටය

කිරවැල්ලේ චන්ද්‍ර වංශික ක්ෂත්‍රියින්ගෙන් පැවතෙන්නන් වශයෙන් සලකන මායාගම් පත්තුවේ විසූ කඳුරේ බණ්ඩාර කුමාරසිංහ එතනා කුමාර බණ්ඩාර, සුචඳ එතනා, සහ තවත් අයින් විසින් ශක වර්ෂ එක්වා දහස් හාරසිය දහතුනේදී ලියන ලද ඒ පරම්පරාවට අයත් නීතියේ පොතේ කරාවේ මිනිසුන්ට "පටබැන්දන්" යනුවෙන් අමතා තිබේ.

ඒ බැවි:- "රටේ පමබැන්දෙ" "නැගම මාපාහාමිට" කියාද "රටේ කාරිය කරන්නං පටබැණ්දන් සිටින තැනේදී" කියාද ලියා තිබේ තවද රාජසිංහ රජුගේ යුධ විස්තර වන විශාල පුස්කොළ පොතේද සප්‍ාන බොහොම්යක කරාවේ තිලධාරින්ට "පටබැඳි මුලාදෑනීන්" කියාද සාමාන්‍ය කරාවේ

---

*මෙරට මුහුදේ මස් මරන්නන්ගේ ජන ලේඛනය 1921 අවුරුද්දේ සිට 1946 අවුරුද්ද දක්වා ඇති අවුරුදු 25 තුල 23913 කි

(සිංහල ජාතිය පත්‍රය 1948 නොවැම්බර් 20 දා)

මෙසින් කරාව කුලයට අයත් මස් මරන්නන් 3000 ට වඩා නැත. අනිත් අයින් මුක්කර (තිමිලර්) තිමිල්ලෝ, මරක්කල, ජා, දෙමළ, හලාගම, ගොවිගම, දුරාව සහ තවත් කුලවල උදවිය වෙති.

මිනිසුන්ට "දුනුම්භි පටබැන්දන්" කියාද, "රෙටේ පට-බැන්දන්" කියාද ලියා තිබේ. මේ චරිතා පුස්තකය හෝමරසන්කඩවල පත්සලට අයිතිය. කුරුකුලේ හෙවත් කාරාව කුලයේ ප්‍රධානීන්ට පමණක් මේ "පට්ටන්කට්ටි මුදලියාර්" නොහොත් "පටබැඳි මුදියන්සේ" යනාදී නාම මේ දක්වා සිමාවී තිබෙන බව කාරණා කාරණ දත් කවිරුත් පාහේ දක්නා කරුණකි.

වැලිවිට සරණංකර සංඝරාජ මහා ස්වාමි දරුවාණන් වහන්සේගේ එක කුස ඔත් සහෝදරයෙක්ද "පටබැඳි මුදියන්සේ" නමින් සිටි බව නාහල්ලේ පඤ්ඤාසේන හාමුදුරුවන් සහ *පුංචිබණ්ඩාර සන්නස්ගල උන්නැහ විසිනුත් පාඨ ශෝධනය කර මුද්‍රිත සංඝරාජ සාධුචරියාවෙන් ප්‍රකාශයට පමුණුවා තිබේ. මේ පටබැඳි මුදියන්සේ පිළිබඳව යමක් කිමට අපි නොදනිමු

---

*හපුතලේ යහලබැද්දේ අළුත්ගෙදර පණ්ඩිත පුංචි බණ්ඩාර සන්නස්ගල මහතා ගොවිකුලයට අයත් කෙනෙකි. පව්විත්කාරයෝද මෙහි සිටිති. ගොවි කුලයට අයත් සියළුම ගෝත්‍ර පව්ටි වලසින් නොවන්නාසේම දේවපුත්‍රයින්වූ සියලූදෙනාම කුල ඥාති ආත්ම ගෞරවයක් හැති ගරු නම් සඳහා වාල්විමට ආශාඇති මස්මරන්නෝ නොවෙති

(මෙය නිදර්ශනයක් වශයෙන් ගෙනහැර පෑ බැව් කරුණාවෙන් සලකත්වා)

තිබ්බටුවාව ගෝනලගම උඩ කඳු ර
කඩිගාව්ද නැලවත්ගම තොට ගෙද ර
කොසන්දෙනිය වැහැරත්තන වැවගෙද ර
පට්පි කොහොලම්මු මේ ගම්වල නිත ර

ඌවත් බිංතැන්න දුම්බර හේවහැට ත්
හාරිස්පත්තු මාතලෙ තුම්පනේ රට ත්
සොලී දෙමළ කැළ නබවා දියුණු කළෙ ත්
හස්ති ශෛල පුරයේ කඩඉමේ සිටි ත්

(මිදෙල්ල කෝරාළගේ රාජවල්ලිය)

පට්ටිවලයින් දහඅට කොටසකි කොහොලත්නුත් වූකලී දේවාලවල, විහාරවල වැඩකාර කොටසකි

තවද එම සඞඝරාජ සාධුචරියාවේම "කුල, ඥාති, ආත්ම ගෞරවරක් නැති මස්මරන්නෝ ගරු නම් සඳහා දේව පුත්‍රයන් වූහ." යයි ලියා තිබේ. මුත්නැහෙලා මෙසේ ලියන්ට හේතුව "මස්මරන්නන්ගේ ප්‍රධාන පටබැඳි මුදියන්සේලා සහ පටබැන්දන් ඇතුළුව මස් මරන්නන් 70000 ක්" පමණ පෘතුගීසි ආණ්ඩුකාලයේ ක්‍රිස්තියානිය වැලඳගත් බව නොමග යවනු ලැබූ ඇතැම් යුරෝපීය ඉතිහාස කරුවන් විසින වැරදි අඳුමට ලියා තිබෙන සෙයින් යයි සිතිය හැක.

සමහර බටහිර ඉතිහාස කරුවන් විසින් ලියා තියා තිබෙන පරිදි "සිංහලයෝ වනාහි සහෝදරයින් කිපදෙනකුන් අතර ඔවුන් සියල්ලන්ටම පොදුවේ එක අඹුවක් පාවා ගැනීමේ සිරිතක් පවත්වන්නෝය" යන්නෙන් සිංහල ජාතික සියලුම පවුල්වල සහෝදරයින් අතර එක අඹුවක්ම පාවා ගැනීමේ සිරිතක් පවතින බව මෙයින් හැගේ. මෙය සිංහල ජාතියේ සවල්ප දෙනෙකුන් අතර පවතින විෂම චාරිත්‍රයක් බව් සැබෑ නුමුත් සියලුම සිංහල සහෝදර පවුල් අතර එලෙසයයි අනුමත කරන්නෙක් නැත්තාසේම, 70000 ක් ක්‍රිස්තියානිය වැළඳගත් සියල්ලෝම කුල, ඥාති, ආත්ම ගෞරවයක් නැති මස් මරන්නෝ නොවෙති.

ඒ ක්‍රිස්තියානිය වැළඳගත්තන් අතර මස් මරන්නන්ද සිටියා සේම, ඊට උසස් තත්වයේ අරගන් පේරුව, කුමාර පේරුව, වත්ති පේරුව, පටබැඳි පේරුව, මුදලි පේරුව, හේවා පේරුව, වඩුග පේරුව, මාලිමී පේරුව, වෙළඳ පේරුව, පරම්පරා පේරුව, මණුකුල පේරුව, කුරුකුල පේරුව, වණ්කුල පේරුව, මිහිඳුකුල පේරුව, අරගකුල පේරුව, කර්ණකුල පේරුව, මේඝවර්ණ පේරුව, ජයවර්ණ පේරුව, වීරවර්ණ පේරුව, කෞණ්ඩ පේරුව යනාදී නොයෙකුත් ගෝත්‍ර වලට අයත් කෞරවයින්ද ක්‍රිස්තියානිය වැළඳගත් බව ඇත්තකි.

මේ කාලයේ පහතරට සහ උඩරට සිටි චන්ද්‍රවංශික සහ සූර්‍යවංශික රජුන්ද, කුමාරයින්ද, එතුමන්ලාගේ කිරවැල්ලේ සහ සිදුරුවාන බද ගම්පොලද, මහනුවරද, විසූ චන්ද්‍රවංශික බිසෝවරුන්ද, කුමාරියන්ද, තවත් කුමාරවරුන් සහ ඈපා, මාපා, යාපා ආදී අංදිපාදවරුන්ද, අධිකාරින්ද' දිසාපතින්ද, ධනපතින්ද, රාශි වශයෙන් ක්‍රිස්තියානිය වැළඳගැනීම නම්බුවක් කොට පැවත නුමුත් මුහුදුබඩ විසූවන් ක්‍රිස්තියානින් වීමට විරුද්ධවිය.

එසේ විරුද්ධවූ මුහුදුබඩ විසූ කෞරවයින් බොහෝ දෙනෙකුන්ව [A]පොල්අතු මඩුවල හිරකර ගිණි තබමින් පරංගින් විසින් ඔවුන් විනාශ කරගෙන යන අවස්ථාවේ ක්‍රිස්තියානින් වී සිටි තම රජුගෙන් හෝ ඇමතියන්ගෙන් හෝ මිට කිසිම පිළිසරණක් නොලත් කෞරවයෝද අන්තිමේදි ඔවුන්ගේ මහපටබැන්දුන් ඇතුළු පටබැඳි මුදියන්සේලාද. පටබැඳි මුහන්දිරම්ලාද, අත්කුන් අයද, මස්මරන්නෝද සමග 70000 ක් පමණ දෙනා කැමැත්තෙන් සහ අකැමැත්තෙන්ද, මරණ බියෙන්ද, ක්‍රිස්තියානිය වැළඳ ගත්තෝය.

---

[A]ක්‍රි: ව: 1546 දී දෙන් ජෝන් පාතුකාල් රජ (විසුරේට) වෙස්රොයිර් මෙසේ ලියයි:-

අප විසින් තමුන්නාන්සේ වෙත පමුණුවන්ට යෙදෙන ආඥාවේ වග හැටි නම්:-

"සාජ්ව රාජකාර්‍යයෙහි යෙදෙන මුලාදෑනින් සමූහයක් යොදවා සියළුම (බුද්ධ) පිළිම අත්අඩංගුවට ගෙන ඒවා සුනු විසුනු කර දැමිය යුතුයි."

"රහසේ හෝ ප්‍රසිද්ධියේ මිත්‍යාදිෂ්ටි (බෞද්ධ) වැළුම් පිදුම් උත්සව පවත්වන්නන් හට බොහෝ බරපතල දඬුවම් නියම කරණ බවද ප්‍රසිද්ධකර ඇරියයුතු."

(Portugal in Ceylon. 1505 - 1658. by Paul E. Pieris)

මේ කාලයේදීම වාගේ හන්වැල්ල නොහොත් ගුරු-බැවිල, කළුග්ගල, රුවන්වැල්ල, අඟරුවංතොට, වැලිවිට, වැල්ලම්පිටිය, කැලණිය, පමුණුගම කඩවත, මල්වාන, යනාදී පළාත්වල වැසි ගොවිගම පවුල් රාශියක්ම ක්‍රිස්තියානියන් වූහ.

එමෙන්ම හපාර කෝරළේ, සීනාකෝරළේ, හේවාගම් කෝරළේ, සල්පිටි කෝරළේ, පස්දුන් කෝරළේද, දකුණු පළාතේද, පෘතුගීසින්ගෙන් මුදලි මුහන්දිරම් පට්ටන් ලත් සියලුම පරම්පරාවල් තමන් ක්‍රිස්තියානින් වශයෙන් බෞතිස්ම ලැබූහ.

---

ක්‍රි: ව: 1530 / 1551 දී පමණ කාලය තුල ක්‍රිස්තියානි ආගම, ධනය සහ බලය දියුණු කරගැණීමේ තත්භාවට වහල්වූ පෘතුගීසීන් සිංහලයින්ගේ ලංකාව පිළිබඳ උරුමඃ පාඩු ගැන නොසලකා බොහෝ ක්‍රිමිනල් අපරාධ කළෝය. මෙයින් කිපුනු සිත් දැඩි මුහුදුබඩ වැසි සිංහලයෝ (ප්‍රධානකොට කරාවේ මිනිසුන්) විසිදහසකින් යුත් සිංහල සේනාවක් ගොස් කොළඹ කොටුව වැටලූවෝය. යුද අශ්වාරෝහකයින් 120 දෙනෙක්ද, දුනුකාර සේනා නැගි දළ බැඳි මහ කඩු ඇති ඇතුන් 25 දෙනෙක්ද, මේ සටනට සහභාගි විය. ගිනියම් කල හෙල්ලවල්ද කොටුව තුලට විසිකර පරංගින්ට බොහෝ විනාශයක් කළෝය. මේ කාලයේ සීතාවක මායාදුන්නේ රජුද පරංගින්ට විරුඬව සිටියේය. ක්‍රි: ව: 1575 පමණ කරාවේ ප්‍රධානියාව සිටි කොළඹ මහ පටබැන්දුව පරංගින්ට විරුඬව මායාදුන්නේ රජු හා කුමන්ත්‍රණයක යෙදුනේයයි චෝදනා කොට පරංගින් විසින් ඔහුව මරා දමන ලදී.

(පෘතුගීසි ජාතික ද බැරස්ගේ සහ පෝල් ඊ. පීරිස් මහතාගේ පෘතුගීසි ඉතිහාස ආශ්‍රයෙනි)

## ජයවර්ධන පුර කෝට්ටේ.

“එවක් පටන් ප්‍රතිකාතෝ කෝට්ටේ නුවර නෑතක් ක්‍ෂත්‍රි ජාතිහු ප්‍රතිකානුන්ඩ එකතුවූයෝය මදිත ජාතිද, කත්තාලි ජාතිද, හාලි ජාතිද, *කෝට්ටේ නුවර ප්‍රධානි වරුද, වස්තු ලෝභයෙන් ප්‍රතිකානුත්ඩ එකතුව කුලමැදි බැඳි උන්නාහ.

(වත්ති රාජාවලිය පස්කොළ පොත. 131 වෙනි පත්‍රිකාව කොළඹ කෞතුකාගාර පොත්හළ. අංක. A. R. 18/127)

එකල කෝට්ටේ නුවර සිටි සියළුම උසස් පහත් සිංහල මිනිසුන් සහ ගැණුන්, ක්‍රිස්තියානිය වැළඳගත පෘතුගිසින් හා මිශ්‍රවී සිටි බව මෙයින් හැඟේ,

## බෞද්ධ බාලිකාව.

“බේබදු පරංගියා පළමු කොටම මිෂනාරි විඥදූමය පතුරුවා හැරියේය. දෙවනුව සිංහල තරුණයන්ට පරංගි වෛශ්‍යාවන්ද, සිංහල වෛශ්‍යාවන් පරංගි සෙබළුන්ටද බලාත්කාරයෙන් විවාහ කැර දුන්නේය...............

---

*සලප්පු ආරච්චි, ධර්මපාල රජ, ඔහුගේ උඩරට බිසෝවරු තුන්දෙන එනම්:- දෝනා මාගරිටා, දෝනා ඉසබෙලා සහ දෝනා කත්‍රිනා. කරලියද්දේ බණ්ඩාර මහනුවර රජ සහ ඔහු බිසව, දෝනා කත්‍රිනා මහ බිසෝ බණ්ඩාර, ජමසිංහ බණ්ඩාර, කොනප්පු බණ්ඩාර, විජයපාල කුමරු සහ තවත් උසස් කුලවත්තයින් බොහොමයක් ක්‍රිස්තියානි වී සිටියේය.

තවද අලගියවන්න මොහොට්ටාල, ගැස්පර් කොරයා, ඩොමිනිකස් කොරයා, සයිමන් කොරයා, සමරකෝන්රාළ බණ්ඩාරනායක, ඉලංගක්කෝන්, තෙන්නකෝන්, තිලක-රත්න, අබේසිංහ, කදුරේ බණ්ඩාර, ඒකනායක මුදලි සහ තවත් ප්‍රධානීන් බොහෝ රාශියක්ද ඔවුන්ගේ පවුල්පිටින්ම ක්‍රිස්තියානිය වැළඳගත්තෝ වූහ.

(ඉතිහාස පොත් ආශ්‍රයෙනි)

සංකර - දූෂිත නිවට මුහුදුබඩ පාතයෝ ඔවුන්ගේ කෙළිබඩු වූහ "උඩරට රජුන්ට විරුඬව පාතරට සිංහලයෝ පරංගින් සමග එක්වී සටන් පිණිස අංග උඟරාගේ මස් ඌගේ ඇඟ පිටම තබා කැපීම වැනියයි යත පිරුළ සාර්ථක කරන්නට මෙන් තම ජාතියේ මිනීවළ කැපීමට තමන්ම තම සතුරන් සමග එක්වී පැමිණීම වැනි නීච ජඩ ක්‍රියාවක් සිංහල ඉතිහාසයේම මිස වෙන කොතනක දක්ක හැකිද? සිය මවට විරුඬව සතුරන් සමග අවුත් මව පාවාදී සතුරන් ලවා ඇය කිලිටි කැරවීම යම් බඳු අධම පහත් ක්‍රියාවක්ද? ඊටත් වඩා අධම පහත් ක්‍රියාවක් කළ පහතරට සංකරයෝ මහ පොළොව පවතිනාතාක් නින්දා ලැබිය යුත්තාහ.

Aඉංජිසාවේ බිරියක් රැකීමට තරම් ආදායමක් නැති සමහර පවුල්වල සෝවුරන් එකම බිරියක් පාවාගෙන එක පවුලේ විසීම හෙවත් එක පංගුවේ කෑම පුරුදු තායක්කර්වරු දෙනුවර හා හාරිස්පත්තුවේ හා බලලත් කල්හි එහිදු පැරණි අශිෂ්ට සිරිත පැවැත්තුවාහ.

(දියතලාවේ මලල්ගොඩ සහ විජයසිරිගේත් බෞඬ බාලිකාව පොත. 1949)

---

Aඋඩරට සීතාවක රාජසිංහ රජුගේ මිනිබිරිය ඡේනා මෙරායං පෙරේරා නමින් රෝම කතෝලිකාගම වැළඳගෙන සීමෝ පිංහෝ නැමැති පරංගි යුඬභටයෙකු හා ආවාහ විය. කොළඹ කොටුව ලංදේශීන් අල්ලාගත් දවස්වල මේ කාන්තාවගේ රූපත් දියණිය කොළඹ කොටුව භාරව සිටි ප්‍රධාන ලංසියාට පර අඹුවක් වශයෙන් ත්‍යාගකර ඔහුව පරංගි පක්ෂයට බඳවා ගැනීමට යෝජනා කළ විට "ඔය වේසියන්ට මම ප්‍රිය නොවෙමි" යයි කොටුව භාරව සිටි ලංදේශියා උත්තර දුන්නේය.

(පෘතුගීසින් හා ලංදේශීන් අතර (ඩැග් රිජිස්ටර්) ගනු-දෙනුවූ පුරාණ ලිපි ආශ්‍රයෙනි)

මලල්ගොඩ සහ විජය සිරිත් සියළුම පාතරට සිංහලයෝ පරංගින්ට එකතුව උඩරට සිංහලයින්ට විරුඬව සටනට ආ බව කියයි. පහතරට මුහුදුබඩ සිංහලයෝ පරංගින්ගේ බලකිරීම හේතුකොටගෙන උඩරටට විරුඬ සටන් වලට අවුරුදු සියයක් පමණ කාලය තුල වරින්වර පැමුණුන බව සැබැයි, එහෙත් ඒ මුහුදුබඩ පාතයෝ උඩරටට සේන්දුඋන වහාම පරංගින්ව අත්ඇර සිංහල රජුන්ගේ පක්ෂයට ගොස් තිබෙන බව ඔවුන් දෙදෙනා නොදන්නා සෙයින් මෙසේ විස්තර කරමු.

---

"Aඑක පංගුවේ කෑම පුරුදු නායක්කර්වරු" උඩරට සිංහලයින්ටද ඒ අශිෂ්ට සිරිත පුරුදු කල බවකී මේ. මෙය හෙතු මලල්ගොඩ සහ විජයසිරිත් නායක්කර්වරු පිට වරද පටවා තම පක්ෂයට පුරුදු විෂම අභිසරු චාරිත්‍රය යටපත් කිරීමට වෑයමකී ඒ. නායක්කර්වරු ලංකාවට පැමිණීයේ නරේන්ද්‍රසිංහ රජ බිසව සමග ක්‍රි: ව: 1706 / 1739 දීය. ඊට බොහෝ කාලයකට ප්‍රථම දවස පවා උඩරට සිංහල සහෝදර පවුල් අතරෙත් බොහොමයක්ම පොදුවේ එක භාර්‍යාවක්ම පාවා ගැනීම සිරිතක් කොට පවත්වාගෙන ආ බව මෙසේ ඉතිහාස පොත් වලින් පෙනේ.

ක්‍රි: ව: 1640 / 1658 ලංකාවේ සිටි පෘතුකාල් ඉතිහාස කරුවෙකුවූ ජෝන් රෝබෙයිරෝගේ විස්තරයකි මේ.

"සිංහලයින්ගේ විවාහ සිරිත් විරිත් වනාහී හිනහවීමට කරුණු වෙයි. යම් ස්ත්‍රියක් ආවාහවූ දිනට පසුවද තම පුරුෂයාගේ ස්ථානය ගනු ලබන්නේ ඔහුගේ සහෝදරයෙකි. සහෝදරයින් හත්දෙනෙක් සිටියත් ඒ සියල්ලගේම සාධාරණ භාර්‍යාව ඈ වන්නීය. එක එක රාත්‍රිය බැගින් ඔවුන් ඇව බෙදගනු ලැබේ කසාද පුරුෂයාට ඈ පිළිබඳ වැඩි අයිතිවාසිකමක් නැත."

"දවල් දවසද සයනාගාරය හිස්ව තිබුනි තම සහෝදරයෙකුට එහි ඇතුල්වී ඈව බුත්තිවිදීමට පුළුවන ඒ වෙලාවට අනික් සහෝදරයෙක් එහි නොයයි. සහෝදරයින්

එනම්:- "දොන් ලෝපැස්ද සෞසා සේනාපති තම බෑනාද පරංගි හේවායින් 1200 ද යුද්ධෝපකරණද ඇතිව දෝනා කාතරිනා කුමරියද කැටුව මීගමුවට අවුත් මහනුවර දෙසට ගමන්කෙළේය මීගමුවෙදී මුහුදුබඩ පාතසින් (හේවායින්) 20000 ක් පිරිවරාගෙන "වේඬර් ආදිට්ටන්"

---

A හත්දෙනෙකුට වැඩිනම් ඒ වැඩි අයට ඇව අයිතී නැත. සහෝදරයින් සමූහයකට පොදුවේ භාර්යාව වන ස්ත්‍රිය වූකලී වාසනාවන්තියක් යයි කල්පනා කරනු ලැබේ. ඊට හේතුව ඔවුන් සියලුදෙනාම හරි හම්බුකරන සියල්ලම ඈට හිමි බැවිනි. මේ මාර්ගයෙන් ඇ ගෞරව ලබන්නියක් පමණක් නොව මහා සේ සැප සම්පත් ලබන්නියක් වන්නීය. ඇගේ දරුවන් ස්වකීය පුරුෂයාට හා ඔහුගේ සහෝදරයින්ටද සාධාරණව අප්පොච්චියයි අමතන්නෝය"

(ජෝන් රොබෙයිරෝ. xvi පරිච්ඡේදය. 54 පිට)

ඉංග්‍රීසි යුගයේ මධ්‍යම භාගයේදී පමණ මහනුවර උඩරට ප්‍රධාන පවුල් රාශියක්ම ක්‍රිස්තියානියෙන් බෞතීස්මය ලබා ගත් බව ප්‍රසිද්ධ කාරණයකි. ඒ කාලයේ දළදා මාලිගාවේ දිව නිලමේ පට්ටම ලබා සිටි කීපදෙනෙක්ම ක්‍රිස්තියානීන්ව සිටියෝය. බදුල්ල, නුවරඑළිය, රත්නපුරේ යනාදී පළාත් වලද උඩරට ප්‍රධාන පවුල් බොහොමයක් ක්‍රිස්තියානීන් වී සිටිය බව නොරහසකි.

(බෞද්ධ ප්‍රවෘත්ති පත්‍ර ආශ්‍රයෙනි)

## උඩරට ක්‍රිස්තියානි රජ.

"වර්ෂ 1546 අගෝස්තු 18 වෙනි දින ගෝවේ නුවරට ගිය ජෝර්ජ් ද සෞසා එහි ආණ්ඩුකාරයා සමග මෙසේ කියේය." ක්‍රිස්තු ධර්මය දේශීමට ලංකාවට ගිය අප ස්වාමිවූ ප්‍රාන්සිස්කෝ පියතුමාගෙන් ධර්මය අසා මහනුවර රජතුමා හා තවත් විශාල ජනකායක් (උඩරට) ක්‍රිස්තු සමය වැළඳගත් බව අපට කෝමිස් නගරයේදී අසන්ට ලැබුණේය."

(ගැස්පර් කොරයාගේ පෘතුගීසි ඉතිහාසය. කො. 20)

(අරශන් සූරිය) නැමැති අධිපතියෙක් උඩරට සිංහාසනයට නියම හිමිකාරිය වන දෝනා කත්‍රිනා කුමරියට උපකාරයට මෙන් හඟවා ව්‍යාජ ලැදිකමකින් අවුත් ප්‍රතිකාල් සේනාවට එකතුවිය. කල් යල් බලා විමලධර්මසූරිය රජුට කුමරියත් යුධයෙන් ජයග්‍රහණයත් ලබාදීමට බලාපොරොත්තුව සිටි කුමන්ත්‍රණය හෙලිවීමෙන් වේත්දර් ආදිවූවන් නොහොත් ජයවීර මන්නපෙරුමාල්ව සෞසා විසින් මගදීම මරාදමන ලදි. එහෙත් රජුත් හා කරගත තිබුණු කුමන්ත්‍රණය ප්‍රකාර ඒ 20000 ක් මිගමුවේ යුධ හට සේනාව පරංගින්ගෙන් වෙන්ව රජුගේ පක්ෂයට බැඳී පරංගි සේනාවට විරුඩව නැගිසිට රජුව යුධයෙන් දිනවා දෝන කත්‍රිනා කුමරියද රජුට පාවා දුන්නෝය. මෙහිදී මේ 20000 ක් පහතරට මුහුදුබඩ හේවාසින්ට ප්‍රධානව සිටියේ වරුණකුල ආදිත්‍ය අරශ නිලඉච්ච මනුවෙල් දියෙස් අන්දරාදි විජයරත්න මහ මුදලි තැනය. ඔහුද මුලසිටම විමලධර්මසූරිය රජුට පක්ෂව කටයුතු කිරීමට පොරොත්දුව සිටි ඔත්තුකාරයෙකි.

මීගමුවෙන් ගිය හේවා හටයින්ට තමන්කඩ මන්නන් පිටිය, වලස්වැව, සිවලාකුලම, සහ තවත් ගම් බොහොමයක් රජු විසින් නින්දගම් කොට දෙවං වදාරණ ලදී. මනුවෙල් දියෙස් මුදලි තැනට උඩරට සියළුම උසස් රදළ මණ්ඩලයට ප්‍රධාන මහ අදිකාරම් ධූරය පිරිනමන ලද්දේය.

## උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට අත්වීම.

ආණ්ඩුකාරයා ඇහැලේපොළට සියලුම ආරක්ෂා සංවිධාන සැලැස්වූයෙන් උඩරට රදළවරුන් රජුට විපක්ෂ කරවා ඉංග්‍රීසින්ට උදව් කරවං ගැනීමට අවශ්‍ය සියල්ල ඇහැලේපොල නොපිරිහෙලා කෙලේය. සේනා බලයෙන් හා කල්‍යාණ මිත්‍ර සේවනයෙන් පිරිහුණු රජතුමා (ශ්‍රී වික්‍රම රාජසිංහ) දෙවෙනි වර හගුරන්කෙත බලකොටුවේ නොව මැදමහනුවර ආරච්චි කෙනෙකුගේ ගෙයි සැඟවුණි. ගොඩුරු සොයා යන කොටියකු ගොදුර ලඟටම පැනගත්තාක්

මේත් ඇහැලේපොළ ඉංග්‍රීසි හමුදාවක් ගෙණ රජු සැඟවී සිටි ගෙයි දොර ළඟටම සැපත්විය. මහනුවර රජු අල්ලා ගැනීමේ ආරංචිය ලැබෙනවිට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා කොළඹ රජවාසලේ අමුත්තන් පිරිසකට රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වමින් සිටියේය. ආණ්ඩුකාරයා සතුටු කඳුළු වගුරුවමින් වහා හුනස්නෙන් නැගිට ඔහු සමග සිටි ආණ්ඩුවේ නිලධාරීන් කිපදෙනාට අභිනන දෙමින් අවුරුදු තුන්සියයක් මුළුල්ලේ යුරෝපීය තුන් ජාතියකට අවනත කරගන්ට බැරිවූ උඩරට රාජධානිය මෙසේ නිශ්ඨා ප්‍රාප්ත කිරීමට ඔවුන්ගෙන් ලැබුනු සහයෝගයට නොමසුරු ලෙස ස්තුති පූජාකෙළේය

(මහා කුමන්ත්‍රණය. 96 පිටුව)

ක්‍රි: ව: 1815 පෙබ්‍රවාරි 18 වෙනිදා බෝඹුරේ උඩුපිටියේ ගෙදර අප්පුරාළ ආරච්චිලගේ නිවසෙහිදී ශ්‍රී වික්‍රම රාජසිංහ මහ රජු එක්තැලිගොඩ මොහොට්ටාල විසින් ජීවග්‍රාහයෙන් අල්ලාගෙන ඉංග්‍රීසීන්ට පාවා දෙන ලදී.

(ලංකාතාද. 1953 ජනවාරි 9)

## දෙන් ජේරනිමෝ් අසෙවේදු පරංගි ජනරාල්.

මෝහුද පරංගි සේනාවක් හා පාතරට සිංහල සේනාවක්ද ගෙන විමලධර්මසූරිය රජුට විරුඬව උඩරට ගියේය. නුමුත් යුධය පවත්වාගන යන අතර පාතරට සිංහල යුධ හමුදාව පරංගින්ව අත්හැර රජුගේ පක්ෂය ගෙන සටන් කළෝය. මේ සටනින් පරංගින් 300 ක් මළ බවත් උඩරට රජු යුධයෙන් ජය ගත් බවත් රෝබෙයිරෝ විසින් කියනලදී.

"පාතරට සිංහල යුධ හමුදාව අප හා උඩරට වැටලීමර සේන්දුවී සුළුල්ප ආබාධයකට මූන පෑමට වූ වහාම ඔවුන්ගේ ජාතියේ උඩරට රජුන්ගේ පක්ෂය ගෙන අප වෙතින් පැන යාම සිරිතක් කොට පවත්නෝ" යයි රෝබෙයිරෝගේ තවත් කියමනකි.

## තෙන්නකෝන් දිසාව.

මෙකල උඩරට දක්ෂ සේනාපතියෙකැයි ප්‍රකටව සිටි තෙන්නකෝන් දිසාව ඕලන්දයන් හා හසුන්පත් ගනුදෙනු කිරීමෙන් සිය පවුල ඇතුළු අනුචරයන් තුන්සිය දෙනෙකු රැගෙන 1673 දී කොළඹට ආයේය. තම පක්ෂයට බැඳුනු ඔහුගේ ගෙළ රත් මාලයක් පැළඳවීමෙන් ඕලන්ද ආණ්ඩු-කාර තුමා විසින් ප්‍රීතියෙන් පිළිගනු ලැබිය. ඔහු මෙසේ පලාඒමට හේතුවූයේ ඔහුගේ සූර වීර භාවය නිසා රජුගේ ඇතිවූ ඊර්ෂ්‍යාව නිසා යයි කියනු ලැබේ.

(ලංකා ඉතිහාසය. ඕලන්ද කාලය. 37 පිටුව. ඇම්. මේලියස් සිල්වා)

## මොල්ලිගොඩ මහ අධිකාරම් තුමා.

යලිත් සිංහල ආණ්ඩුවක් පිහිටුවීමට උත්සාහ ගත් වීරයා. මීට අවුරුදු 116 කට පෙර රාජ ද්‍රෝහි චෝදනා එකොළොසක් සම්බන්ධයෙන් මොල්ලිගොඩ මහ අධිකාරම් තුමා ප්‍රධාන ගිහි පැවිදි හයදෙනෙකුට විරුද්ධව ඇතිවූ රාජකීය නඩු විභාගය, සතරකෝරළේ දිසාපති තැන්පත් මොල්ලිගොඩ රාජකරුණා සෙනෙවිරත්න හේරත් වාසල මුදියන්සේ මහ අධිකාරම් තුමා. මිල්ලෑව දිසාපති තුමන්ගෙ පුතනුවන්වූ දුණුවිල රාජකරුණාධාර ඒකනායක ධම්කීර්ති පන්ඩිත මුදියන්සේ හෙවත් ලොකුබණ්ඩා. තිබ්බටුවාවේ මේධංකර උන්නාන්සේ ආදී ගිහි පැවිදි හයදෙනම මේ නඩුව ඉංග්‍රිසි භාෂාව කථාකරණ ජූරි සභාවක් ඉදිරියේ නඩුව විභාග කලයුතු බවත්, ජූරිසභාවට තෝරාගන්නා එකම සභිකයෙක්වත් උඩරටියන් අතුරින් තෝරා නො-ගතයුතුයයිද ඉල්ලා සිටියහ. ආණ්ඩුව ඒ ඉල්ලීම් දෙකටම එකහවිය. ජූරිසභාව ඉංග්‍රිසි ජාතිකයන් හයදෙනෙකුගෙන් හා පහතරට සිංහලයින් හත්දෙනෙකුගෙන්ද යන දහතුන් දෙනෙකුගෙන් සමන්විත වූවාය. නඩුතීන්දුව ජූරිසභාව

පුරා පැයක් සාකච්ඡාවෙහි යෙදුනාය ජූරිසභාව ආපසු පැමිණ තම අසුත්ගැනීමෙන් පසු එහි ප්‍රධානියා නැගිට ජූරිසභාවේ වැඩිදෙනෙකුගේ තීරණය විත්තිකරුවන් නිවැරදි කරුවන් බව යයි ප්‍රකාශ කරණ ලදී. ඒ අනුව විනිශ්චයකාරතුමා විත්තිකරුඒන් සියලුදෙනාම නිදහස් කෙලේය. ජූරිසභාවේ ඉංග්‍රිසි මහතුන් හයදෙනාම විත්තිකරුවන් වරදකරුවන් බවද සිංහල මහතුන් තත්දෙනා විත්තිකරුවන් නිවැරදිකරුවන් බවද ප්‍රකාශ කල බවත් ජූරිසභාවේ ඒ තීරණය ගැන විනිශ්චයකාරතුමා මෙන්ම ආණ්ඩුකාර තුමාත් පුදුමවූ බවත් ඒකාලයේ ලියකියවිලි වලින් පැහැදිලිවේ. කුමන්ත්‍රණ පිළිබඳ ආණ්ඩුවට ඉතා වැදගත් ආරංචි සැපයීම ගැන මහවෙලතැන්න දිසාපති තුමාට මහඅධිකාරම් ධූරයටත්, ඩේවිඩ් ද සිල්වා මුදලිතුමා වාසල මුදලි ධූරයටත් පත්කරන ලදී.

(සිළුමිණ 1951 ජනවාරි 14)

## ඌවේ මහ කැරැල්ල.

ඌවේ මහ කැරැල්ලටද පහතරට ජනයා ඉංග්‍රිසින්ට විරුඩව පහතරටින් ගොස් සිංහලේ පෙරමුණට එක්ව සටන් කර තියේ.

(සිළුමිණ 1959 ජනවාරි 25)

මෙකල්හී මාලිගාවක විසූ දෙරේසාමිගේ (රජුගෙ) අමාත්‍යයන් ලෙස කැප්පෙටිපොල, මඩුගල්ලෙ, යන දෙදෙන පත්වී සිටි නමුත් ටික කලකට පසු විල්බාවේ රජකුලයෙහි නොව ගොවිකුලයෙහි උපන් ශ්‍රමනයෙක් බැව් මඩුගල්ලෙට දැනගන්ට ලැබී ඔහු සහ කැප්පිටිපොල සිරකරන ලදී මේ කෝලාහලයේ මොල්ලිගොඩ ඉංග්‍රීසි පක්ෂයෙහි විය. එසේ නොවූයේනම් ඉංග්‍රිසින්ට උඩරට හැර යන්ට සිදුවෙන්නේයයි. කියා තිබේ.

(බ්‍රිතාන්‍ය කාලීන ඉතිහාසය. එච්. පී. පීරිස්.)

බෙංඩ බාලිකාව නැමැති පුසතකයේ පාඨාරවියන්ට පමණක් නගාඇති කරුණු නිසාම උඩරටියන් ගැනද යම් යම් තොරතුරු පාඨකයන්ට දැනගැනීමට මෙහි සඳහන් ප්‍රවෘත්ති පොත්පත් වලින් උපුටාගෙන මෙහි ඇතුලත් කිරීමට සිදුවිය.

## කම්මල ග්‍රාම වසම.

මෙනම් ගම්මංනය වූකලී භවෙනි පරාක්‍රමබාහු මහ රජුන් විසින් *කුරුකුල දේශේ කාංචිපුරය, කාවේරි පට්ටනම, කිලක්කරේ" යනාදි රටවලින් ගෙන්වන ලද කුරුකුල හෙවත් කෞරව යුඩකාර වංශිකයින්ට නිඥගම් කොට දෙවා වදාල ගම්වරයකි. ඒ බැව් මෙහි අත්‍ය පිටක සඳහන් "මුක්කර හටන" සෙත් මොනවට ප්‍රකාශවේ.

පුරාණ කාලයේ සිට නැව් හම්බන් යාත්‍රා යනාදිය තැනීම කරාවේ මිනිසුන් විසින් දක්‍ෂ ලෙස දැන සිටි බැවින් පරාක්‍රමබාහු රජවරුන්ද මෙහි නෞකා තටාංගයන් තනවා නෞකා සෑදීමේ කම්මල් පිටියකට පරිවර්තනය කර එහි අධිපති බවට කරාවේ මිනිසුන් රැඳවූබැව් කියතුලැබේ.

පෘතුගීසි ආණ්ඩුකාලයේද කම්මල ග්‍රාමයේ අධිපතීන් වශයෙන් පෙනීසිටියේ කරාවේ මිනිසුන් වෙති. මේ ප්‍රදේ-ශයෙන් පරංගීන් හට අයබදු අයකර ගැනීමේ මාගී දැන ගැනීම පිණිස ඔවුන් ඉදිරියට කැඳවන ලද්දේද කරාව කුලයට අයත් දැනුම්නි පටබැන්දන් සමූහයකි

*මුක්කර හටනෙහි, කුරුකුල දේශේ කාංචි පුරය කාවේරි පට්ටනම කිලක්කරේ යනු ලියන්ට හේතුව, බොහෝ කාලයක් පඬිරට, සොළීරට සහ කේරළයන් කුරුරට කුරුකුල රජුන්ගේ යටත් විජිත වශයන් තිබුන හෙයිනි. මෙම දකුණු ඉන්දියානු රටවල කුරුකුල යුඩ භටයින්ද නැවතී සිටිය බව විශ්වාස කළ හැක.

ඒ එසේමැයි.

On 25 th September, 1613. The Patamgatims and other heads of the Port of Caimel, with the Canacapoli met at Freire's house in Colombo to lay down what were the direitos and customes appertaining to the **Fazenda"**

They were:-

Lourenco Teixeira, Canacapoli, 40 Years.

Simao Correa, Patamgatim, heathen name Naidappu 60

PAULO FERNANDO Patamgatim, alias PATAM 60,

ANTONYO FERNANDO alias CUT PERUMA 40.

SIMAO PRA PATAMGATIM, alias AHIAM PERUMA 40.

ANTONYO FERNANDO, PATAMGATIM, of the Careas, alias ABBA. 40.

DUARTE de MIRANDA, Patamgatim of the Careas, alias Togan 40.

JOAN de CRUS, alias Arabalata Patamgatim 30

"After them sworu as customary to decleare what under the heathen Kings was collected at the Port. They explaimed that the anciant records were burnt in the general sebellion and only those of eight years were available."

(The Ceylon Littoral 1593. Page 23)

මෙහි කෙටි විස්තරය:-

වර්ෂ 1613 ක්වූ සැප්තැම්බර් මස 25 වෙනි දින, කයිමල නැමැති වරායේ වැසි (කරාවේ ප්‍රධානීන්) පට්ටන්කට්ටිවරු (පටබැන්දෝ) සහ අනිකුත් ප්‍රධානීන්ද ලිපිකරුද ඇතුළුව භාණ්ඩාගාරයට ලැබියයුතු අයබදු සහ තීරුව පිළිබඳව කරුණු කියාපෑමට කොළඹ "ෆ්‍රිරිස්"ගේ මංදිරයට ගියෝය.

ඔවුහු නම්:-

ලෝරන්සෝ තිසේරා ලිපිකරු. අවුරුදු 40.
සිමන් කොරයා පට්ටන්කට්ටි සවදේශිය නාමය.
තයිදෙඅප්පු 60.
පාවුලු ප්‍රනාන්දු පට්ටන්කට්ටි නොහොත් පට්ටන් 60.
අන්තෝනියෝ ප්‍රනාන්දු නොහොත් කුට්ටි පෙරුම 40.
සිමන් පෙරේරා පට්ටන්කට්ටි නොහොත්
අතිම් පෙරුම 40.
බූර්තා ද මිරන්ඩා පට්ටන්කට්ටි කරාවේ ප්‍රධානියා
නොහොත් තෝගන් 40.
අන්තෝනියෝ ප්‍රනාන්දු පට්ටන්කට්ටි කරාවේ
ප්‍රධානියා නොහොත් අබේ 40.
ජාන් ද කෘස් නොහොත් අරම්බාලන් පට්ටන්කට්ටි 30.

"දේශිය රජුන් දවස වසමෙන් ආදායම් එකතු කර ගත් අන්දම විස්තර කිරීම අරභයා චාරිත්‍රානුකූලව දිව්රුම් දුන්නායින් පසු පුරාණ ආදායම් බදු සඳහන් "මහ භට-තේදි" ගිණිබත්වූ බවත් දැනට කමන් ලඟ තිබෙන්නේ අට අවුරුද්දකට සීමාවූ සටහන් බවත් ඔව්හු කියාපෑවෝය"
(අලගියවත්ත මුකවෙට්ටිගේ පෘතුගීසි තෝම්බුවේ ඉංග්‍රීසි විවරණය. 1593. පිටුව 23. ආචාර්‍ය පෝල් පීරිස්)

ඉහත සඳහන් අයින් සියළු දෙනාම ජනපද ප්‍රධා-නීන් වශයෙන් අලගියවත්ත මොහොට්ටාල සහ පරංගි භාණ්ඩාගාරිකයා ඉදිරියේ තම තමන් දත් කරුණු කියා තිබේ.

## සූරිය තමෙල්.

4මහ පරාක්‍රමබාහු රජතුමන්ගේ රණකාමි නාවික බල මණ්ඩලයේ "අද්මිරාල්" කෙනෙකුව සිටි "වණීකුල ආදිත්‍ය තමෙල්" නැමැති නෞකාධිපතියාගේ නාමය මහ වංශයේ සඳහන්වී ඇත්තේ "ආදිත්‍ය ද්‍රවිඩ අධිගාරි" වශයෙනි.

"සූයම්" නාමය "ආදිත්‍ය" වශයෙන්ද "තමෙල්" නාමය "ද්‍රවිඩ" වශයෙන්ද "නෞකාධිපති" යන්න "අධිගාරි" නමින්ද එහි ලියා තිබේ.

පරරාජසේකරන්, සංගිලි යනාදී යාපනේ රජුන් දවස ඔවුන්ගේ යුධ නාවික බල මණ්ඩලය කුරුවේ නිලධාරින්ගෙන් සකස්වී තිබුන බව යාපනේ ඉතිහාසයෙන් පෙනේ එමෙන්ම සිංහල යුධ නෞකා සියල්ලෙහිද කරාවේ නිලධාරින් යොදා සිටි බව පෘතුගීසි, ලංදේශි සහ දෙමළ ඉතිහාස පොත්වල දක්නට ඇත.

## කුමාර තමෙල්.

සූරිය තමෙල් නෞකාධිපතින්ගේ මුණුබුරෙකු වශයෙන් කියනු ලබන කෞරවීර ආදිත්‍ය කුරු අරශ නිල ඉඹට කුමාර තමෙල් කුමරු වනාහි බුඩ වර්ෂ 1792 වැන්නෙහි සිටි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ යුව රාජයානෝය.

මේ යුව රජ වූකලී කම්මල ග්‍රාමයේ උත්පත්තිය ලත් කෙනෙකි. මොහුගෙන් පැවතෙන පරම්පරාවෙන් කෙනෙකු වන දොන් සිමන් තමෙල් මහ මුදලි ක්‍රි: ව: 1715 වැන්නෙන් පසු ලංදේශි ආණ්ඩුව යටතේ මහ මුදලි ස්ථානාන්තරයට පත්විය කිප වතාවක්ම හෙතෙම සේනාධිපතිව මහනුවරට ගියේය. ලංදේශි ආණ්ඩුකාලයෙහි කම්මල ග්‍රාමය නින්ද ගමක් කොට දෙන ලද්දේය. එවක් පටන් මොහුට "කම්මලේ මහ මුදියන්සේ" යන නාමය බැවහරයට පත්විය.

---

**මුහුදු යුධ දක්ෂයෝ.**

ᴬමීට අවුරුදු 1400 ගණනකට පෙර මුගලන් රජු දවස 1350 ගණනකට පෙර අඹ හෙරණ සල මෙවන් රජු දවසද මුහුදු යුධයෙහි දක්ෂ යුධ භටයන්ගෙන් පවා ලඞකා ධරණිය විරාජමානව පැවැති බැව් මෙහි පහත දක්වන මහ වංශපායෙන් පෙනේ. "සයුරින් අරක්බැද ලක්දිව නිර්භය කරවිය" "මලය රජ අග තනතුරද දකුණු රටදදී මධ්‍යමයා මුහුදු රක්නා පිණිස යෙදී"

(කවි කල්ප තරුව)

මෙම තමෙල් මහ මුදලි දැදුරුඔය පටන් කතරගම දක්වා මුහුදුබඩ ප්‍රදේශයට අධිපතිව සිටි බව බෙතාවියේ ලංදේශීන් භාරයේ තිබෙන "ඩෙග් රිජිස්ටර්" නැමැති පුරාණ ලිපිවල සටහන්ව ඇත්තේය.

සලාගම කුලය පිළිබඳ උභයසේකර මහතුන් විසින් විරචිත "ශ්‍රී ලංකාවීප වණ්ණා" නැමැති පොතේ කරාව කුලයට අයත් තමෙල් පරම්පරාව, දෙමළ රාජ කුමාර-සෙකුගෙන් පවතින්නෝ යයි දක්වා ඇත.

කම්මල, හලාවත, මාදම්පේ, තඹරාවිල, මීගමුව යනාදී ගම් නියම්ගම් වල වැසි තමෙල් පරම්පරාව අතර කතෝලිකාගමේ පූජක ස්වාමිවරුද පලාත්පාලන මුදලිවරුද, කෝරලේ මුහන්දිරම් වරුද ධනවතුන්ද සිටිය බව සහ සිටින බවද මේදක්වා දැනගත හැක.

## තමෙල් නාමය.

තමෙල් නාමය "De Mello" යන පරංගි නාමයෙන් බිඳුනක් බව කීයමින් ඇතැම් අය අනම් මනම් දොඩවති.

පරංගි භාෂාවෙන් තමෙල් යන්න ලියා තිබෙන්නේ "Tamulla" "තමුල්ල" යනුවෙනි.

(අලගියවන්න පෘතුගීසි තෝම්බුව. 28 පිටුව. දෙවෙනි පදේ කෙළවර)

---

227 වෙනි පිටේ අධෝලිපිය හා සම්බන්ධයි.

බහුපුරුෂ සේවනය හෙවත් එක ස්ත්‍රියකු විසින් පුරුෂයන් කීපදෙනෙකු පාවාගැනීම නීතියට විරුඬ ක්‍රියාවක් බව මේ උතුමානන් වහන්සෙ විසින් උඩරටියන්ගේ සම්පූණ් කැමැත්ත ඇතිව ප්‍රකාශ කරණ ලදී.
(ලංකාණ්ඩුකාර ධුර සර් හෙන්රි වෝර්ඩ්. ක්‍රි: ව: 1855-1860)
(එච් ගුණතිලක මහතාගෙ ලංකා ඉතිහාසය මහනුවර දළදා මාලිගාව ඉදිරිපිට පිට්ටනියේ දැනට දකින්ට ලැබෙන ප්‍රතිමාව මේ ආණ්ඩුකාරයානන් සිහිපීම පිණිස පිහිටුවන ලද්දකි)

තම්මෙල් නාමය පරංගි නාමයෙන් සිංහලට පෙරලා ගත්තක් නම් "ද මෙල්ලෝ" කියන ඔවුන්ගේම නිවැරැදි නාම පදය ඒ අඳුමටම අලගියවන්න, පෘතුගීසි තෝම්බුවේ ලියා තබනවාට කිසිම අනුමානයක් නැත. එසේ නොලියා "තම්බුල්ල"යයි ලියන ලද්දේ පරංගින් කියන අඳුමට එය මිථ්‍යාදිෂ්ටි (දෙශීය) නාමයක් වූ බැවිනි.

තවද පරංගින් ලංකාව පිළිබඳ කිසින් තොදක් කාල වලදීද සූරිය තම්මෙල්, කුමාර තම්මෙල් යනාදි අධිපතින් මෙහි සිටිය බවද සැලකිය යුතුයි.

## රාජ භක්තික මිගමුවේ මහවීදියේ සහ වැල්ල වීදියේ කුරුකුලසූරිය සහ වර්ණකුලසූරිය මුදලි පරම්පරාව.

"Twice a year, in April and November ("which in the MALAWAR tongue is called CATIGUE") The RUA GRANDE, MAIN STREET community, waited on the King with their PATAMGATIMS and in acknowlegment of vassalage offered to him 10 Cachas and 10 Pingas of carawadu. These were the Sinhalese Tuppotti panam and Kath Rajakariya, and their total value was 21 xerafims 2 Larins.

The Community of RUA da PRAIA, Beach Road acling separality, did tho same."

(The Ceylon Littoral. 1593. Page 27. Dr. Paul Peiris)

මෙහි කෙටි විස්තරය:-

"අවුරුද්දකට දෙවරක් එනම් අප්‍රියල් සහ නොවැම්බර් මාස තුලදී "රුවා ග්‍රෑන්ඩ්" යේ නොහොත් මහ වීදියේ ගෝත්‍රය ඔවුන්ගේ පට්ටන්කට්ටිවරුන් (පටබැඳන්) ඇතුළුව රජතුමාණන් (සීතාවක රාජසිංහ) බැහැදැක තම පක්ෂපාත

භාවය ඔප්පුකිරීම් වස්, සිංහල තුප්පොට්ටි පතම් මිල සහ කත් රාජකාරිය වශයෙන් රෙදි කච්චි දහයක්ද, කරවල කත් දහයක්ද ඔප්පු දුන්නෝය."

"රුවා ප්‍රසියං" වේ නොහොත් වැල්ලේ වීදියේ ගෝත්‍රයද වෙනම (රජුව) බැහැදක එසේම පක්ෂපාතව රාජකාරිය කළෝය."

(අලගියවන්න මොහොට්ටාලගේ පෘතුගීසි තෝම්බුවේ ඉංග්‍රීසි විවරණය. ක්‍රි: ව: 1593 පිටුව 27. ආචාර්ය පෝල් පීරිස්)

## අළුත් කුරුරට හෙවත් අළුත් කුරුකෝරළය

ගජබා රජු දවස සොළී රටට ගොස් යුද කොට දඩ පිණිස අල්ලා ගෙනෙනු ලැබූ සොළී සෙනග සිරි ලක අළුත් කුරුරට හෙවත් අළුත් කුරු කෝරළේ දහසිය පත්තුවේ දහසියක් පදිංචි කරවන ලද බව ප්‍රකට කරුණකි.

## ගජබා හටනෙහි.

එසින් මැන භාගයෙහි ගජබාහු නරපති තෙමේ යට කියන ලද..................තමන් විසින් දඹදිව කුරු රටින් අළුත ගෙනෙන ලද හිර සෙනග කුරු රටෙහි අනික් පසෙහි නවත්වා ඊට අළුත් කුරුරට යයි නම් තබාලූයේය.

(ගජබා හටන පුස්කොළපොත කෞතුකාගාර පුස්තකාලය)

සිද්ද පනත් අන මුල්කර ගෙන මෙහෙ මං
ඇද්ද මගෙ බලය මතු තුන් දහසට මං
දෙළොස් දහ තැබිය නම පරවෙණි වල මිං
අළුත් කුරු කෝරළෙ ඉතුරු වට්ට මං

දිශා තිළමේට අදිකාරම් කිය නී
රටේ ඔබ ගොසින් තොරතුරු ගැන බල නී
රටේ කෝරළේ අතපත්තුවෙන් එ නී
කොහොළන් ගම්වලට සැර පයිඩය අරි නී

(මිදෙල්ලව කෝරාළ)

සොළී රටෙන් ගෙනෙන ලද අනෙක් සෙනග ඌව මාතලේ සිව්කෝරළේ, තුම්පතේ යනාදී පලාත්වලද පදිංචි කරවූ බව ඉතිහාස පොත්පත් වලින් ප්‍රකාශවේ. මොවුන් ගෙන් පැවැතෙන පරම්පරාවන් ඉහත සඳහන් ප්‍රදේශවල මේ දක්වා පදිංචිව සිටිති. කෝණාර මුදියන්සේලාගේ, නවසිවායම් මුදියන්සේලාගෙ, රාමනායක මුදියන්සේලාගේ, එළියපෙරුම මුදියන්සේලාගේ, අලකප්පෙරුම මුදියන්සේ-ලාගේ, යනාදී පෙලපත් නාමාවලි ඇත්තාවූ පරම්පරා සොළී රටෙන් පැමිණි "රටේ ඇත්තන්" වශයෙන් උඩරට වැස්සන් විසින් කියනු ලැබේ.

සොළී සෙනගක් ලවා ගාමිණී තිස්ස නම් වැවක් බඳවා මුතුරාජවෙලට ජලය සැපයූ බවද ඉතිහාසය කියයි.

මේ සොළී සිරකරුවන්ගෙන් වැඩ ගැනීම පිණිස පරණ කුරුරට හෙවත් පරණ කුරු කෝරළේ විසූ කුරුකුල අධිපතිහු පැමිණි හෙයින්ද ගජබාහු රජු විසින් ගෙනෙන ලද කුරුකුල හෙවත් කෞරව ගෝත්‍රික සෙබලුන් පදිංචි කරවූ හෙයින්ද අළුත් කුරුව නමින් මේ කෝරළය ප්‍රසිඩියට පත්විය.

## උඩුගම්පොළ.

අළුත් කුරුරට උඩුගම්පොල වනාහි කැලණිතිස්ස රජුගේ සොහොයුරු කුමරුවෙක් රාජ උදහසින් පලාවුත් සැඟවී සිටි ස්ථානයකි. මෙය කෝට්ටේ රාජධානිය දවස උසස් දියුණුවකින් සකලාංග සම්පූර්ණ රාජධානියක් බවට පත්විය.

ක්‍රි: ව: 1873 දී ලුවී ද සොයිසා මහමුදලිඳුට මීගමුවේ කුරුඳු වත්තක තිබී සම්භවූ "කෝණාර පෙරුමාල්" තඹ සන්නසින්ද "උඩුගම්පොල අළුත් මාලිගය තුළ සිට ඒ සන්නස ලියා පවරන ලද බව ඔප්පුවේ. මෙය කුරුකුල සිත්ගේ ආදී මැණී කෙනෙකුන් වන කෞන්තය

දේවියගේ නමින් හඳුන්වන කරාවේ ගෝත්‍රයේ වේන්දර් අරශ කොන්ත පෙරුමාල් හෙවත් කොන්ඩර් පෙරුමාල් නැමැති පූජකයෙකුට ක්‍රි: ව: 1398 / 1409 දක්වා ගම්පල සිටි හවෙනි විජයබාහු රජු විසින් දෙන ලද්දකි.

එකල උඩුගම්පොල රාජධානිය විශාල නගරයකි. උතුරු වාසල්කඩ අද "වැලිකඩ" නමින් පවත්නේය උතුරු වාසල්කඩ ආරක්ෂාව සඳහා යුධ බල ඇණියක් නවත්වා එහි ප්‍රධානත්වය මුතුකොඩි වර්ණසූරිය සහ කර්ණසූරිය යන සේනාධිපතියන් දෙදෙනෙකුට පවරා දී තිබුණි. බලඇණිය සිටි ස්ථානය අද "බලබෝව" නමින් පවතී. මුතුකොඩි වර්ණසූරිය සහ කර්ණසූරිය අධිපති දෙපල විසූ ස්ථානයට මුතුකලගම යයි අද ව්‍යවහාර කරනු ලැබේ. ඒ පරම්පරානුගත කෞරවයෝ අදත් බල-බෝවේ සහ මුතුකලගම වෙසෙති.

## *පෙතියාගොඩ.

උඩුගම්පොල නැගෙනහිර වාසල්කඩ ආරක්ෂාව පිණිස නෙත්තිකුමාර නම් කුරුවංශික කුමාර කෙනෙක් ඔවුන් සහෝදරයින් වන †ලීනිය කුමාර, රන්දූනු කුමාර, කුඩා කුමාර යන ක්ෂත්‍රියයන් සමග පතියැගොඩ විසූහ. පතියැගොඩ

---

*හෙනරත්ගොඩ අවට ගම්වූ "පෙතියාගොඩ" වීදිය වත්ත, බුරුල්ලපිටිය, අලුත්ගම, පුවක්වත්ත, වැලිවේරිය, හාපිටිගම යන ගම්වලද, කරාවේ ගෝත්‍රයෙහි මනුෂ්‍යයෝ වෙසෙත්. ඔව්හු රජදරුවන්ගෙන් සහ පිරිවර ජනයාගෙන් පැවතෙන්නන් බැව් රාජවලිය, රාජරත්නාකරය ආදි පොත් වල කථා කරණකොටගෙන අවබෝධවේ.

(දඹුගම ජෝර්ජ් ප්‍රේරා වර්ණකුලසූරිය සෙනෙවිරත්න මහතාගේ "ක්ෂත්‍රිය වංශය" පිටුව 36)

†ලීනියකුමාරගේ, පෙළපතේ බොහෝදෙනෙක් මොරටුවේ වෙසෙති

යනු පෙතියාගොඩ යයි ව්‍යවහාරයට පත්විය. මේ රාජ වංශික කුමාර පරපුරද අද වෙන තුරු පෙතියාගොඩ වෙසෙති. (නයනීති තෙත්ති) යන්නෙන් පමුණුවන්නා නායකයා යන අර්ථය ගෙනදේ.

නෙත්ති කුමාරගේ බිසොව රත්තැලි හන්නක්ම ශ්‍රීවාලංකාර උදෙසා පැළඳ සිටි හෙයින් ඒ පරම්පරාවෝ "හත්තැල්ලගේ" යන උප නාමයද කියාගතිති.

## විදිය වත්ත.

මීගමුව ආසන්න ස්ථානයක වීදියේ බණ්ඩා කුමරු සැඟවී සිටි ස්ථානය වශයෙන් සලකන *වීදියේ වත්ත උඩුගම්පොල රාජධානියෙහි බස්නාහිර වාසල පිහිටි ප්‍රදේශයයි එහි ආරක්ෂාව සඳහා කෞරව වංශික සෙන්පතියෙකු යටතේ යුධ හමුදාවක් තවත්වා තිබියේය. වීරසූරිය ජයසූරිය ආදී පරම්පරා ඒ යුධ සේනාධිපතියාගෙන් පැවත එන කුරුකුලයෝය.

උඩුගම්පොල රාජධානියෙහි දකුණු වාසල්කඩ ප්‍රදේශය ආරක්ෂා කල බලහමුදාවෙහි නායකත්වය "කෙහෙලි බැදි රාළ" නම් සූරවීර සෙන්පතියෙකුට පවරා තිබුණේය ඒ සෙන්පතියා විසූ ප්‍රදේශයට "කෙහෙල් බද්දර" යයි ව්‍යවහාර කරන බව සැලකිය යුතුයි.

විශෙෂ වශයෙන් සැලකීයයුත්තක් නම් මේ ගම් තුළ හා ඊට යාව පිහිටි වත්තේගෙදර පත්සිල්ගොඩ ගුරුල්ලපිටිය, ආදී ගම්වල කෞරව හෙවත් කරාවේ ගෝත්‍රිකයන් මිස අන්‍ය ගෝත්‍රිකයන් අදවනතුරුත් නොවිසීමයි.

(පැරණි ලිපි සහ ජනකථා ආශ්‍රයෙනි)

---

*වීදියවත්ත:- බුලම්කුලමේ විසූ පාලකුට්ටි සෙට්ටියාර් නම් කෞරව වංශික ධනපතයාගේ පුත්‍රයෙක් මෑත සමයකදී වීදියවත්තේ පදිංචිවිය. ඔහුගේ පරම්පරාව මේදක්වා පාලකුට්ටිගේ නමින් පැවතේ. මෝරාවත්තේ කෞරව ගෝත්‍රිකයන්ගේ පරපුරද මෝරාවත්තේගෙ නමින් මෙහි වෙසෙයි.

## *කුරණ ග්‍රාමය.

මෙම ග්‍රාමයේ නාමය විසන්ධි කළවිට කුරු+අණ, යි සිටි. මින් කුරුවංශිකයින්ගේ හෙවත් කෞරව්‍යයන්ගේ අණසක පිහිටි ග්‍රාමවරයක් බැව් වැටහේ. මෙය මීගමුවට සැතපුම් දෙකක් පමණ දුරින් කොළඹ දෙසින් පිහිටියේය. මෙහි දකුණු මායිම දිය හොඩ නම් ඇළය. දුම්රියපොළක්ද, රෝමානු කතෝලික දේවස්ථානයක්ද එම සභාවේම පාඨශාලාවක්ද මෙහි තිබේ.

බොහෝ කොට කෞරවයන්ගේ වංස භූමියවූ මේ ග්‍රාම වැසියන් අතර "පංසිල්ගේ" යන පෙළපත් නාමාවලියක් ඇති පරපුරක් දක්නා ලැබේ. මුලදී "පංචසීල පටබැඳිගේ" යන වගී නාමය ඇතුව සිටි මොවුහු පසලොස් වෙනි ශතවර්ෂය තුළදී කතෝලිකාගම වැළඳගත් පසු "පංසිල්ගේ" යන නාමයෙන් පෙනී සිටිති.

කුරු ධර්මය ආරක්ෂාකල පංචසීල කෝරව්‍ය ක්ෂත්‍රිය පරම්පරාවෙන් පැවතෙන්නන් වශයෙන් විශ්වාස කරණ මොව්හු අතරෙන් සමහර දෙනෙක් බෞඩයෝය. ඇතැම් අය තවමත් ක්‍රිස්තියානි කාරයෝ වී සිටිති.

තවද යාපා පටුන යටත්කර පිළිවෙලින් එහි රජ තැන්පත්ව සිටි සංගිලි (SANGILI) රාජ පරම්පරාවට අයත් ක්ෂත්‍රියකුගෙන් පැවතෙන කුරුකුල පරපුරක්ද මෙම ග්‍රාමයේ වෙසේ. ඔව්හු "සංගිලිගේ" යන නාමයෙන් ප්‍රසිඩව සිටිති.

දැනට ජීවත්ව සිටින දොන් සිමොන් සංගිලි, දොන් අද්රියන් සංගිලි, දොන් පේද්‍රුරු සංගිලි, නැමැති මහතුන්ද යාපා පටුනු සංගිලි රාජ පෙළපතෙන් පැවත එන්නන් වශයෙන් විශ්වාස කරණු ලැබේ

---

*කුරුණ ගම්වරය සහ තවත් ගම්වර බොහොමයක් දඹදිවෙන් පැමිණී කරාවෙ යුඩාකාර වංශිකයින්ට හයවෙනි පැරකුම්බා රජු විසින් දෙවා වදාළ බැව් මුක්කර හටනයෙන් ප්‍රකාශ වේ.

භාතිය තිස්ස මහ රජුන් දවස අයෝත්ති (අයොධ්‍ය) පට්ටනමෙන් මෙසිරි ලකට පැමිණි චන්‍ද්‍ර සූය්‍ය වංශික යුඩ සේනාධිපති නව ගෝත්‍රිකයින් අතරින් එක් සෙනෙවියෙක් "ඉච්චණ්ඩවන්" නැමැත්තෙකි. මොහුගෙන් පැවැතෙන මුනුබුරු රාශිය අද දවසේ වර්ණකුලසූරිය ඉච්චන් පුල්ලිගේ ඉච්චන් පුල්ලිගේ යන වගී නාමය ව්‍යවහාර කර ගනිති.

තවද *කුරණ ග්‍රාම නාමය දරණ කරාවේ පරම්පරා කිපයකි. එයින් කුරණගේ, කුරණ පඩබැඳිගේ, ජයසූය්‍ය කුරණගේ යනාදීහු ප්‍රධාන පවුල්වලට අයත්වූවෝ වෙති.

## කුරු වංශික මාණික්ක තලෙයි වේන්දර් ප්‍රදේශ රජ.

පරාක්‍රමබාහු රජුන් සමයේ දකුණු හින්දුස්ථානයේ පිහිටි කේරළ හෙවත් මලයාලම් නැමැති ගිරි වංශික රටේ අගනුවරක් වන කාංචිපුරය නොහොත් කොංජීවරමෙන්ද සොළී රට අග නගරයක්වූ කාවේරි පට්ටනමෙන්ද, පඬිරට රාමනාත් ප්‍රදේශයේ පිහිටි කිලක්කරෙන්ද මෙරටට ගෙන්වන ලද 7740 ක් පමණවූ කුරුකුල සේවා බලඇතියට ප්‍රධාන කුරුකුල නාට්ටු දේවරීර්, එච්ච නාට්ටු දේවරීර්, මාණික්ක තලේ වේන්දර් - අධි අරශ අඩප්ප උත්තැහ - වරුණසූරිය අඩප්ප උත්තැහ - කුරුකුලසූරිය මූදියන්සේ - අරශ කුල සූරිය මුදියන්සේ - අරශ තිලයිට්ටු මූදියන්සේ - බරත කුල සූරිය මුදියන්සේ - යනාදී කුමාරවරුන් සහ මුදලිවරුන් අතුරෙන් මාණික්ක තලෙයි වෙන්දර් නැමැති කුමරු පිළිබඳ මෙසේ දක්වා තිබේ.

---

*සෙම්බරී ආරිය තුරෙයි, නැමැති කුරණ අඩප්ප උත්තැහ දෙවන රාජසිංහ රජු දවස කුරණගම ප්‍රධාන මූලාදෑනියාව සිටියේය ඔහු කුරුකුලයෙකි

(මුක්කර හටන)

එනම්:-

"Sometime after the arrival of the mookvas in the district their chieftain named VEDI ARASEN, had to contend with a rival called MANIKKA THALEIVAN who then presided over the people deroMinated KAREYAR and possessed a settlement on the south side of the district."

(Casichetty Gazetteer, Page. 276)

මෙහි භාවය:-

"මුක්කර වගීයං පලාතට පැමිණීමෙන් පසු ඔවුන්ගේ අධිපතියා වන වෙඩි අරශන්ට මාණික්ක තලෙයි වේඤර් නැමැති විරුඩවාදියෙකු හා සටනකට මුහුණ පෑමට සිදුවීය. ඔහු වනාහි කරාවේ මිනිසුන්ට අධිගාරියෙක්වා පමණක් නොව පලාතේ දකුණු දිග්භාගයෙන් ප්‍රදේශයක්ද අයිති කරගත් කෙනෙකි."

(කාසිචෙට්ටි ගැසටියර් පොත. 276 පිටුව)

මෙයින් ප්‍රකාශවන්නේ දකුණු පලාතේ මෙම මාණික්ක තලෙයි වේඤර් පැලපදිංචිවූ බවයි.

කුරුකුලයේ හෙවත් කරාව ගෝත්‍රයේ කුමාරයෙකුවූ මෙතුමා කරාවේ යුධ භට සේනාවක් පිරිවරාගෙන මුක්කර සේනාවක් පරාජය කර උතුරු පලාත සහ දකුණු පලාතත් නිදහස් කර තිබේ.

## මාණික්ක තලෙයි වේඤර් සරණ විචාරීම.

මුක්කර රාජයාවූ Aවෙඩි අරශන්ට, මාණික්ක තලෙයි වෙඤ නැමැති එදිරිකාරයෙකු හා තරඟ කිරීමට සිදුවිය ඔහු කරාවේ මිනිසුන්ගේ ආණ්ඩුකාරයෙකි.

"Aපුත්තලම දිස්ත්‍රික්කයේ ලුනුවිල නම් ගමක් ඇත. මේ ග්‍රාම යත්වත බුවනෙකබාහු රජු විසින් කවරත්න

(රජෙකි) ඔහුට පලාතේ දකුණු දිගින් ප්‍රදේශයක්ද අයිතිව තිබුණි. මාණික්ක තලෙයි වෙන්දර් නම නිලධාරින් කීප දෙනෙකු ලවා වෙදි අරශන්ගේ දියණියත් දියනියත් සරණ විවාල කල එයට අමනාප පිළිතුරු ලැබුණෙන් හෙතෙම බලගතු යුධ සේනාවක් මෙහෙයවා වෙදි අරශන්ට විරුඬව යුඬ ප්‍රකාශ කර මුක්කරුන්ව සමූලඝාතනයෙන් මඩින්නෙමැයි කීයේය.''..............''හලාවත දිසත්‍රික්කයේ

ᴬවත්තියා නම් මුක්කර මුදලි කෙනෙකුට සන්නසක් පිට දෙන ලද්දකි. මෙගම ආඬිපතේ සහ මරදන්කුලි නැමැති ගම්වලට පිහිටුවා තිබෙන තැපැල් පෙට්ටියට මයිල බාගයක දුර ප්‍රමාණයේ පිහිටා තිබේ.

(කාසිචෙට්ටි ගැසට්යර් පොත. ක්‍රි: ව: 1832 පිටුව 148)

''මහ ගල්ගමුවේ වැසියෝ මූක්කුවා (මූක්කර) ගෝත්‍රට අයත් ද්‍රවිඩ කතෝලික භක්තිකයෝ වෙති............අයෝධ්‍ය පුරයේ සිට එන රාම රජුට ගංගා නම් නදිය තරණය කරණු පිණිස උදව්වූ තොටියා වශයෙන් රාමායනයෙහි සඳහන් වන ''කුගා'' මොවුන්ගේ ආදි පුරුෂයායයි මූක්කරු කියති. අයෝධ්‍යයෙහි සිට දකුණු ඉන්දියාවටද එතැනින් ලංකාවටද සංක්‍රමණවූහයි, ඔව්හු පවසති.

''මූක්කරු මෑත කාලයක වෙදි අරශන් නැමැති නායකයෙකු යටතේ ලංකාවට පැමිණ කුදිරමලේ නම් ස්ථානයකට ගොඩබට බවද, ඔවුන් මානික්ක තලෙයිවන් නැමැති නායකයෙකු යටතේවූ වෙනත් විරුඬවාදි ගෝත්‍රයක් (කරාවෙ) සමග සටන් කළ බවද, සටනට අරමුණු වූයේ මූක්කර නායකයාගේ රූමත් දියණිය බවද බටහිරි වෙරළ (පුත්තලම) බඩ පෙදෙස් වල පැවත එන ජන ප්‍රවාදයෙකි.

(දේවධර්මවාදී, ඇඩ්මන්ඩ් පීරිස්. රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ලිපියෙන් උපුටා ගන්නා ලදී සිළුමිණ පත්‍රය 13-6-1948)

කට්ටකඩේ අසල කිසූ පරාවී ඇලේ ලීපාලමට නුදුරින් තිබෙන විශාල තැන්තලා භූමියේ මංගලවැල්ල නම් මේ ස්ථානයේදී ඝාරාවෙ සහ මුක්කර හමුද මුතගැසී මහා සටනක් සිදුවීමෙන් ඉහතකී වගීයාද ඔවුන්ගේ රජු මාණික්ක තලෙයි වේන්දද විනාශවිය.

(කාසිවෙට්ටි ගැසටියර්. පිටු 276)

රාජසිංහ වන්නි කථාවේ සහ මුක්කර හටනේ මාණික්ක තලෙයි වේන්දර් ජාපනේ යුඩයෙන් මළ බව කියා තිබේ. කාසිවෙට්ටි ගැසටියර් පොතේ හලාවත යුඩයෙන් මළ බව කියයි. හලාවත මඟුල් වැල්ලේ භූමිභාගක් බැඳි මිණීවලක් මේදක්වා තිබෙයි. එය මාණික්ක තලෙයි වේන්දර්ගේ සොහොන යයි මෙහි වැසියෝ කියති.

## පඬිරට.

පඬිරට වනාහි දකුණු ඉන්දියාවේ ලංකාවට ඉතාම ආසන්න ද්‍රවිඩ ජනපදයකි. පඬි රාජ වංශය වනාහි කුරුරට පාණ්ඩව නැමැති කෞරවයින්ගෙන් පැවත එන්නකී. කුරුරට කෞරව රජුන් දවස පඬි රාජධානිය හස්තිනාපුර කුරු වංශික ප්‍රතිරාජයන් විසින් බොහෝ කාලයක්ම ආණ්ඩු කරන ලද බව ඉන්දියාවේ පුරාණ ලිපි සහ ඉතිහාස පිළිබඳ පොත් කාණ්ඩ දෙකක් වර්ෂ 1835 දී මද්‍රාසියේදී ලියා ප්‍රසිඩ කළ ඩබ්ලිව්. ටේලර් මහතා විසින් ඔහුගේ එම පොත්වල (1.120, 195) සඳහන් කර තිබේ.

පෞරව හෙවත් පුරු රජුගේ පසළොස්වෙනි මුණුපුරා වනාහි දුෂ්මාන්තා රජුය. හෙතෙම සකුන්තලා නම් බ්‍රාහ්මණ තරුණිය ආවාහ කොට ගත්තෙන් සම්දමන නම් පුතෙක් ලැබුණි. හේ පසු කාලයකදී චක්‍රවර්ති පද ප්‍රාප්ත මහා භරත රජු නමින් මුළු මහත් දඹදිවම ප්‍රසිඩවිය.

මේ චක්‍රවර්ති රාජයා විසින් ක්‍රිස්තු වර්ෂයෙන් යට අවුරුදු 2000 පමණේදී භරත් හෙවත් භාරත වංශයද භාරත වර්ෂයද, ඇතිකළේය. "කුමාරි" නමින් සිටි මේ රජුගේ දියණියට භාරත දේශයේ දකුණු ඉන්දියාවේ කොටසකශ-යක් අයිතිවීම හේතුකොටගෙන එහි එක් කෙළවරකට කුමාරි තුඩුව යයි (CAPF COMORIN) නමක් ඇතිවිය.

කුරුකුල දේශය යනු උතුරු ඉන්දියාවේ පිහිටි කුරු රටට පමණක් නොව පසු කාලවලදී යම් යම් කරුණු හේතු-කොට ගෙන කුරුවංශිකයින් පදිංචිවූ අන්‍ය ප්‍රදේශ වලටද කුරු, කෞරව, නාම සම්බන්ධ කර ස්ථාන නාම ව්‍යවහාරයට පැමිණ තිබෙන බව පෙනේ.

පුරාණ කාලයේ සිට මීගමු වැසියන් කෝර මණ්ඩල-යට යාත්‍රාකර වෙළහෙළඳාම් කර තිබේ. මේ ව්‍යාපාරය ඉංග්‍රීසි ආණ්ඩුවේ මූලාරම්භය දක්වා පැවැත විත් ඉංග්‍රීසීන්ට විරුඩව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇරඹූ යුඬයේදී මුහුදු *යාත්‍රා මගින් ඉංග්‍රීසින්ට විරුඩ කටයුතු කර දකුණු පළාතේ §ඩොංග්ගලදී ඉංග්‍රීසින් පරදවන ලදී.

පසු කාලෙක මෙබඳු යාත්‍රා සියල්ල විනාශවී යාමට ඉංග්‍රීසීහු මං සැලසූහ. එයින් පසු කෝර මණ්ඩලයට තුත්තුකුඩියට, නාගපට්ටනමට යනාදී ඉන්දියා පටුනු ගම්වලට කුරුකුලයින්ගේ යාත්‍රා කිරීම නැත්තටම නැතිවිය.

කෞරවයින් පදංචිව සිටි හෙයින් කෞරව මණ්ඩල යයිද, කෝර මණ්ඩලයයිද, නම් විය. මීගමුවෙ සිට කෙළින්ම යාත්‍රා කළ විට මෙරටට පැමිණිය හැකිය මෙරටින් කුරුකුල මිනිසුන් හිර ගනුදෙනු කිරීම, වෙළඳාම් කිරීම ඉඩකඩම් මිළට ගැනීම, යනාදී කටයුතු බොහෝ දුරට පවත්වා ගෙන ඇවිත් තිබෙන බව ලන්දේශි ලේඛනවලින් පෙනේ.

---

*මුහුදු යාත්‍රා සියල්ල කුරුකුල වංශවතුන්ට අයිති ඒවාය.

§මෙහි විස්තරය කුරුකුල චරිත පළමුවෙනි කාණ්ඩයේ 270, 271, පිටුවල සඳහන්ව ඇත.

ඉහත සඳහන් කරුණු සිදුවීමට ප්‍රධාන හේතුව පඬිරුවියන් ඈත අතීතයෙහි සිට කුරුකුලයින් හා සබඳකම් පැවැත්වීමත් ඔවුනොවුන් අතර ඥාති සම්බන්ධය ඇතුව සිටීමත්ය.

වම් 1862 දී මද්‍රාසියේ මුද්‍රිත වින්ස්ලෝ දෙමළ අකාරාදියේ පෙනෙන අයුරු කාරාවේ මිනිසුන්ට දමිළ භාෂාවෙන් "මීනවන්" යන නාමයක් ඇති බව හැගේ. මීනවන් යනු පඬි රාජ වංශයට අයිති නාමයකි. ඒ බැව් දෙමළ අකාරාදි විස්තරයෙන් මෙසේයි:-

பண்டியன்:- உசுதன், கவுரியன், குமரிச்சேர்பன்,
கூடற்கோமான். கைதவன், செலியுன்,
தமிழ்நாடன், தென்னவன், பஞ்சவன்,
பொதியவேற்பன், மாறன், மீனவன், வழுதி,
வேன்பின்ருரோன், வையைத்துறைவன்,

පාණ්ඩියන්:- උසිදන්, කවුරියන්, කුමරි වෙර්පන්,
කුඩර්කෝමාන්, කෛදවන්, සෙලියන්,
තමිල් නාටන්, තෙන්නවන්, පංජවන්,
පොදිය වෙර්පන්, මාරන්, මීනවන්, වලුති,
වෙන්පින්ව්‍රාරෝන්, වෛයෙයිතුරෙයිවන්,

{ உசிதன் - பாண்டியன.
{ උසිදන් - පාණ්ඩියන්, (පාණ්ඩව, පඬි)

{ கவுரியன் - கவுரவர்.
{ කවුරියන් - කවුරවර්, කුරුකුල වේන්දර්, පඬි.

*{ குமரிசேபபன் - பாண்டியன்.
{ කුමරිවෙර්පන් - පාණ්ඩියන්.

---

*මුහුදුකරේ වැසියන්ගේ රජුට "වෙර්පන්" යන පුදුම නාමයක් කියති.

(වින්ස්ලෝ අකාරාදිය)

කරාවේ මිනිසුන් වනාහී, චන්ද්‍රවංශික ශාන්තනු රජ කාලයේ හස්තිනාපුර යමුනා නදිය දෙගංබඩ පදිංචිව සිටියෝය

(කාශිචෙට්ටි ගැසටියර්)

கூடர்கோமான் - ராண்டியன்
කුඩර්කෝමාන් - පාණ්ඩියන්, මහරජෙක්.

கைதவன் - பாண்டியன்.
කෛදවන් - පාණ්ඩියන්.

செழியன் - பாண்டியன் கோன்.
සෙලියන් - පඩිරජ, පාණ්ඩිය කෝන්.

தமிழ் நாடன் - பாண்டியன்.
තමිල් නාටන් - පාණ්ඩියන් දමිළ වැසියා.

தென்னவன் - பாண்டியன்.
තෙන්නවන් - පඩි, දකුණු රටියා.

*பஞ்சவன் - பாண்டியன்
පඤ්චවන් - පඩි, පඤ්ච පාණ්ඩවරු,

போதிய வெற்பன் – பாண்டியன்
පොදිය වෙර්පන් - පාණ්ඩියන්,

‡பாண்டியன் – மீனவன்.
පාණ්ඩියන් - මීනවන්,

மாரன் - மல்மதன்.
මාරන් - මල්මද, අනංගයා, පඩි.

வழுதி – பண்டியன்.
වලුති - පාණ්ඩියන්.

மீனவன் – பாண்டியன்.
මිනවන් - පාණ්ඩියන්, පඩිරජ.

வெம்பின்குரோன் - பாண்டியன்
වෙම්පින්ගුරෝන් - පාණ්ඩියන්, පඩිරජ.

வையைத்துறைவன் - பாண்டியன்.

---

*පඤ්චවන්:- පංච පාණ්ඩවරු නැමැති කුරුකුල කුමාර වරු පස්දෙනා ධම්බුඩි හෙවත් යුධිෂ්ඨිර, භීමසේන, අර්ජුන සහදේව හා නකුල,

‡මදුරාපුර, චන්ද්‍රවංශික රජ පරම්පරාවට සහ මස්මරන් නන්ටද මීනවන් නාමය ව්‍යවහාර වෙන බව යාපනේ පෙයරකාරාදිය, සහ වින්ස්ලෝ අකාරාදියෙන්ද පෙනේ.

**වෛසෙත්තුරෛවත් - පාණ්ඩියත්.**

(பெயரகராதி, அக, 81 - ජාපනේ පෙයරකරාදි. පිට 81)

*Fisher - Meenavan

**මසුත්මරක්කා - මිනවත්**

பாண்டியன் - Any King of Madura of the Lunar dynasty or any Prince of that line.

පාණ්ඩියත් - මදුරාපුර රජුන් වන චන්ද්‍ර වංශිකයෝය. ඒ පෙළපතේ අන්‍ය කුමාරයෝය.

(වින්ස්ලෝ දමිළ අකාරාදිය. මද්‍රාසිය. 1862)

ඉහත සඳහන් ප්‍රකාර මිනවත් යනු පඩි කියාද, පඩි යනු මිනවත් කියාද, ඔවුන්ටම කෞරව කියාද. පංචවරු (පඤ්ච පාණ්ඩවරු නොහොත් කුරු වංශිකයෝ) කියාද තවත් වැදගත් ගරු දමිළ නාමයන් පඩි රාජ වංශයට ව්‍යවහාරවන බව මෙයින් මොනවට විස්තරවේ.

වින්ස්ලෝ අකාරාදියේ "මීණවත්" යනු කරාවෙ මිනිසුන් සෙයින්, ජාපනේ පෙයරකරාදි නැමැති දෙමළ මහාකාරාදියේ ප්‍රකාර කරාවෙ මිනිසුන් කෞරව වංශයට නොහොත් (චන්ද්‍ර වංශ) පඩි රාජ වංශයට අයත් බැව් මෙයින් හොඳකාර පැහැදිලිවේ.

## කරාවෙ කුලයට අයත් මකරයා බැඳි කොඩිය.

Aමකරයා නැමැති අමරවංශ මත්ස්‍ය රූපය පිළිබඳව මනා විස්තරයක් කුරාකුල චරිතයේ පළමුවෙනි කාණ්ඩයේ

---

*"The Great Pandyan King Gloried in his Fish Flag" (History manusripts., 2 Vol, Madras 1835. by W. Taylor Appenpix. P 29)

භාවය:- "මහා පඩිරජ තමන්ගේ මත්ස්‍යයා බැඳි කොඩිය අරභයා ප්‍රභාවත්විය.

(ඩබ්ලිව් ටේලර්ගේ ඉතිහාසගත පැරණි ලිපි. කාණ්ඩ 2. මද්‍රාසිය. 1835. උප ග්‍රන්ථය. 29 පිටුව.)

පලවී ඇත. ඇතැම් අය මේ මත්ස්‍යයාට මෝරා යයි කියති. මකරයාට නොයෙකුත් සතුන්ගේ පාද, කර්ණ, අක්ෂි, කුම්භස්තල යනාදි අවයවයන් පිහිටි බැව් "රූපාවලියෙන්" පෙනේ. මකර රූපය දැකීමෙන්ද යමෙකුට ඒ සත්වයාට පිහිටි අවයව කරණකොටගෙන ඌ මෝරෙක් නොව මෝරෙකුට හාත්පසින්ම විරුඬ උතුම් සත්වයෙකු බැව් එකහෙලා අවබෝධ වෙනවාට සැක නැත. කිසිවෙක් මකරයාට මෝරා යයි කියන්ට යෙදුන හොත් "මෝරාට කකුල් කොයින්දැ"යි ප්‍රකාශ කිරීමට ඉඩ තිබේ

මකරයා ගෞරව ස්ථානයන්හි තබා ව්‍යවහාරයට පමුණුවා තිබෙන බව මෙහි පහත සඳහන් පුරාණ කරුණු වලින් දැනගත හැක.

තඹර කර අඹර වරදන කර වරණ
මකර දද මකර දජ බඳ සප තරණ
පවර පරණ මද බබලන අප සමණ
කවර වරද වද මම කරවන උරණ

(මකර ධවජය කාව්‍යය)

පුන් සඳ සූරිඳු සඳ සලකුණ අදින ව ර
බත්සොඳ තෙළි තුඩෙව් තෙල තුඩිනි මනහ ර
මින් දද ජය විරිදු තද කරණ පියක ර
අන්කොද මෙදිසතුර තොප සරිවන පව ර

(කොකිල සන්දේශය)

---

A කුරුකුල වංශයේ හෙවත් කෞරව වංශයේ කොඩිය තවත් සැලකියයුතු එකකි. ඉර, හඳ, තාරකා, මුතුකුඩය, චාමරය, හක්ගෙඩිය, කඩුව, හෙන්ඩුව, දැලපත්දම, ආල-වට්ටම, නාගයා, මාළු, නෙලුම්මල් ආදී ලකුණු රාශියක් එහි තිබේ. ප්‍රතිකාල් සමයේදී ඒ වංශයේ බොහෝ දෙනෙක් ක්‍රිස්තියානි ආගම වැළඳගත්තාසින් පසු කුරුසියේ ලකුණුද ඊට එකතු කළහ. මකර කොඩියද මේ වංශිකයන්ගෙ තවත් කොඩියකි.

(ලංකාවේ පැරණි කොඩි, දිණමින 1951 මාර්තු මස 15)

මකර රුව මහ රජුන්ගේ සිංහාසන, මාලිගා, දේවාල සහ විහාරස්ථාන වලද, මංගල ලකුණක් මෙන් පෙරටුකොට ඇත අතීතයේ සිට මේදක්වා තබා ඉදිකරනු ලැබේ.

මකරාගාරයට නොහොත් මකරාලයට (මහ මුහුදට) අධිපති මේ විශේෂ මත්ස්‍යයා උතුම් සත්වයෙකු වශයෙන් පූර්වදින් වාසීන් විසින් ගරුත්වයෙන් සලකති.

තවද රාවණාකොඩිය ඉරහඳකොඩිය සහ ගුරුළු කොඩියද කරාව කුලයට අයිති බව පැරණි මුක්කර හටනයේ සහ පුරාණ සිංහල කොඩි පොතේද දක්වා ඇත්තේය.

## පැලවා සේනාධිපති.

භාතිය තිස්ස රජුන් සමයේ එනම් ක්‍රි: ව: යට 20–9 යන කාලය තුළ දඹදිව, අයෝධ්‍ය, ඌඩ් හෙවත් අයෝත්ති පට්ටනමෙන් සිරිලකට ගෙන්වා කාක මුක්කර නල මුදලියා හා සටන්කල නවගෝත්‍ර කරාවෙ යුධාකාර සේනාපතින් අතරෙන් පැලවා සේනාධිපති තැනද කෙනෙකි. ඔවුන් සම්බන්ධව මනා විස්තර කුරුකුල චරිතයේ පළමුවෙනි කාණ්ඩයේ බහා තිබේ.

පැලවා සෙනෙවියන්ගේ කරාව ගෝත්‍රයට අයත් යුධ භටයින්ගේ සංඛ්‍යාව අටසියයක් යයි වන්නි රාජවලිය මලල බණ්ඩාරවලිය, යනාදී වත්ති කථා පොත්වල විස්තර කර තිබේ.

කාක මුක්කරුන් පරදවා භාතිය තිස්ස රජුට ජය ගෙනදුන් හත්දස් අටසීයක් පමණ අයෝත්ති පට්ටනමෙන් පැමිණි මේ කරාවේ යුධ භටයින්ද ඔවුන්ගේ සේනාධිපතින් නවදෙනාටද "සිංහලෙන් නෑකම් දෙමී" කියා සිංහල කාන්තාවුන් තැලි බැඳ කරකාර බැඳ දී හත්කෝරලේ

පළාතෙහි ගම් හතලිහක පමණ රජු විසින් ඔවුන් පදිංචි කරවා තිබේ. තවත් සමහරෙකුට මුදුතෙර රටවල්වලට සන්නස් ප්‍රදානය කර යවන ලදී. මුදුතෙර පළාත්වලට යවන ලද සේනාවන් අතරෙන් පැලවා යුධ සේනාධිපතියාද ඔහුගේ අටසියක් පැලවා කැටියද හරුමල්ගොඩ සහ ඒ අවට ගම්වල පදිංචි උන බැව් මුඛ පරම්පරා කථා ආශ්‍රයෙන් දැනගන්ට තිබේ.

මේ පැලවා යුධ සේනාධි පතියන්ගෙන් පැවතෙන පරම්පරාවට පැලකැටියේගෙ යන පෙලපත් නාමය දැනට ව්‍යවහාරව පවතින බව විශ්වාස කරණු ලැබේ. ඔව්හු අයෝධ්‍යයෙන් පැමිණි චන්ද්‍ර සූර්‍ය්‍ය හෙවත් සෝමසූර්‍ය්‍ය වංශික කුරුකුල යුධකාරයින්ගෙන් පැවත එන මුනුබුරු පිරිසක් වශයෙන් සිතා ගත හැක.

වන්නි බුවනෙකබාහු රජ කාලයේ මලල බණ්ඩාර කුමාරවරුන්ගේ නැව්-හම්බන් හතෙන් කිපයක් හරුමල්-ගොඩ අසල ස්ථානයකට ගොඩවෙන්ට යෙදුන හෙයින් ඒ මලල බණ්ඩාරවරු සමූහයක් ඒ ස්ථානයෙහි රජුගෙන් ලත් අවසරය පරිදි පදිංචිවී ගමක්කොට ගත්තෝය. එවක් පටන් එයට මලලගම යන නාමය ඇතිවිය.

මලලගම්ද මලල බණ්ඩාර වරුන්ගෙන් පැවත එන කුරුකුල හෙවත් කරාවේ වැදගත් පරම්පරා බොහොමයක් මේ දක්වා සිටිති. ඔවුන්ගේ උසස් අව දක්වන පෙලපත් නාමයන්ගෙන් ඒබැව් මොනවට අවබෝධ වෙනවාට සැකයක් නැත. මේ මලලගම් ග්‍රාමය ප්‍රභූවරයන්ද, ධනපතියන්ද, නීතිවේදීන්ද, සිවිවර, කිච්චවරියන්ද ඇතුළු සෙසු ජනී ජන-යන්ගේ වාසභූමියකි. එසිනුදු මෙහි ජන්ම භූමිය කරගත් ශ්‍රේෂ්ඨ පැවිදි උතුමන් කිපපලක් නම්:- මලලගම මුදලිඳු-රාමාධිපතිව වැඩවිසූ සුමන හිමිතුමානන්ද, මලලගම ධම්මානන්ද, මලලගම සාසනධජ, මලලගම සංඝානන්ද මහානායක ස්වාමීපාදයන් වහන්සේ හා මලලගම විජයනාග

ස්වාමිපාදයන්ද යන පඩිවරයෝයි. මුන්වහන්සේලා අතුරෙන් මිලලගම විජයනාග ස්වාමිපාදයන් වහන්සේ ගැන අපට දැනගන්ට ලැබී තිබෙන තොරතුරු මෙසේයි. මෙතුමා ලෝ සසුන් දෙකට අනල්ප සේවයක් සිදුකල උතුමෙකි. එසේම මුන්වහන්සේ කරණ ලද ග්‍රන්ථද රාශියකි. එනම් කර්ම වණ්ණාව, තෘෂ්ණාදීපනී, චෛතිය වර්ණනාව, මව්පිය සහරාව තෙරුවන් වැඳීම, සතරදූත යන ධර්ම පුස්තකයෝයි. මේ ග්‍රන්ථ අතුරෙන් සතරදූත නැමැති ග්‍රන්ථයේ මුන්වහන්සේ ගැන තොරතුරු ඇතුළත් කවිපංක්තියක් මෙහි සඳහන් කරමි.

ඒ කවිපංක්තිය මෙසේයි.

සිරි ලකහන සුරතලූ රන් වලලු සු ර
පිරි හැම් තොට සමග බබලන කොටු පවු ර
සිරි සර යස ගාලු මහ පුරවර නුදු ර
.පිරි හස යතුරු තොටුපල ඇතී අති ලක ර

කුරු කුල මලලගම පද දස වයස් ක ලේ
ග රු බුදු සසුන පැවිදිව දම් පුහුණු ක ලේ
ගු රු ගුරු සොඳ ඇසුරුකර සසුන වැඩ ක ලේ
කුරු ගල ගල්ලෙනග අදිපති වන මෙක ලේ

අජා සිල රජ දේවී කෙරෙව් පෙ ර
දජා විලස බබලන ගල්ලෙනේ තු ර
රජා තිලෝ බුදු පිළිරු පා තඹ ර
බජා නය කිරීමෙන් වසන ආද ර

සිරී සුගත සාසන වෙත බැති අද ර
දිරී හදය ලෝ වැඩ වඩනා නිත ර
පිරී ය වඩවන සුමියුරු බසිති ස ර
සිරී විජය නාගය යන නැමැති තෙ ර

(සතරදූත)

මල්ලගම උපත් ගිහිපඬිවරුන් අතුරෙන් කෞරව කුල මාර්ටින් වික්‍රමසිංහ මහත්මයා ශ්‍රෙෂ්ඨ පුද්ගලයෙකි. එතුමාට මෞලි මංගලෝත්සවය නිමිත්තෙන් ප්‍රදානය කරණ ලද නම්බුනාම ලේඛනයෙහි ඇම්. බී. ඊ. යන ගෞරව නාමය ලැබීම ඉතාමත් ප්‍රශස්තයි. සුප්‍රසිද්ධ ග්‍රන්ථ කතෘවරයෙක්වූ වික්‍රමසිංහ මහතා සිංහල භාෂා සාහිත්‍යාදියට අත්‍යාදර සේවයක් කළ බහුශ්‍රැත පඬිවරයෙකි. විවිධ අංශවලට අයත් ග්‍රන්ථ රාශියක කතෘවරයා වන මාර්ටින් වික්‍රමසිංහ මහතා අධිරාජ්‍ය නම්බුනාමයකින් ගෞරව ලැබූ පළමුවෙනි සිංහල ලේඛකයාය. ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාකාරයෙකු වන මේ මහතා විචාරකයෙකි. ගවේෂකයෙකි. සමාජවාදියෙකි. අධිරාජ්‍ය නම්බුනාමයකින් ඒ මහතාට සම්මාන දැක්වීම සිංහල උගතුන්ට දුන් විශේෂ ගෞරවයක් වශයෙන් සැලකිය යුත්තේය.

1953 ජූනි 5 පෙරමුණ

## *දුව මල්ලගම විමලසාරතිස්ස නායක ස්වාමිපාදයාණෝ

මූත්වහන්සේ මල්ලගම ග්‍රාමසන්න දූව මල්ලගම නම් ගමෙහි ජනිතවූ උතුමෙකි. මෙතුමා කොග්ගල විමලසාරතිස්ස යන නාමයෙන් ප්‍රසිද්ධියට පත්ව ලෝ සසුන් දෙකට ඉමහත් සේවයක් කරණ ලදහ. මූත්වහන්සේ පාණ්ඩිත්‍යයෙන්ද, කවිකත්වයෙන්ද, සූරවීරභාවයෙන්ද, තේජසින්ද, ආශ්‍රිත ජනයන්ගේ සිත් ගැනීමේ වාක් ශක්තියෙන්ද, අනූනව විසූ සේක. සිල්වත්ව, ගුණවත්ව, නැණවත්ව කටයුතු කිරීමෙන් කොග්ගල ප්‍රදේශයට පමණක් නොව බොහෝ පලාත්වලට හා ශාසනයට විශාල මෙහෙයක් කරමින් පංච ථූපාරාම විහාරයෙහි වැඩවිසූ සේක. මූත්වහන්සේ ග්‍රන්ථ රචනයෙහි හා කාව්‍ය බන්ධනයෙහිද ඉතා දක්ෂයෙකි. මේ ස්වාමීන්වහන්සේ කරණ ලද ග්‍රන්ථ අතුරෙන් අපට ලැබී තිබෙන "සම්මිණි රුවන" නම් කාව්‍ය පොතේ අවසාන සිලෝවෙන් මෙතුමා ගැන මනාකොට වටහා ගැනීමට පුළුවන්වේ.

---

*(ඕ. ඇම්. විමලසාර මහා ස්වාමිපාදයාණෝ.

පරලෝ සැපත්වූත "සසුන් දජ" නම් යතින්ද්‍ර
ඇදුරු දහම් නද යති - සඳුගේ අයැත්මෙන්
ගත මේ අසු තුරුසියක් හෙළුගත් නියුත්වූ
ගෙහුවේය කොග්ගල "විමල් සර" නම් යතින්ද්‍ර

තවද ඒතුමන් විසින් චාර්ල්ස් හැන්රි ද සොයිසා මැතිතුමන්ගේ හා වැලිගම ශ්‍රී සුමංගල නායක ස්වාමිපාදයානන් වහන්සේගේද ගුණ වර්ණනා කරමින් නිබන්ධනය කරන ලද "කාව්‍ය ගර්භ චක්‍රය" නැමැති පුස්තකයේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් එකම කවිය යොදා කල කවි වලින් මුල් කවිය මෙසේයි.

සිරි ගණ නයන ඉක්මූත සසුනු දය ර ත
අරි දන සමුදු පළසුණු දිකි යස දස ත
පිරි සිදු කුල බිදුනු සොයිසඳි වදන යු ත
සිරි සුමහල නැමැති සමිඳුට දෙම් මෙ පො ත

ගණන් අයත සංඛ්‍යා පථය, ඉක්මුණ, අතික්‍රාන්තවූ සිරි සම්පත්තිය ඇත්තාවූ, සසුනු, ස්වකීය දරුවන් කෙරෙහි දයරත, කරුණාවෙන්, ඇලුනාවූ නොහොත් සසුනු දයරත ස්වකීය දරුවන්ගේ අභිවෘධියෙහි ඇලුනාවූ, අරිදන ශත්‍රජන නැමැති, සමුදු, සමුද්‍රයට, පළය උණුදිති, ප්‍රලය සූර්‍ය්‍යයා වැනිවූ, යස, සත්වයා හට, යසද, යහපත දෙන්නාවූ නොහොත් යසස්දායකවූ, පිරිසිදු කුල, පරිශුඬ වංශයෙහි, අබිදුනු, අභිජාතවූ නොහොත් අබිදුනු, අභින්නවූ, පිරිසිදු කුල, පරිශුඬ වංශ ඇත්තාවූ. සොයිසඳි වදනයුත, චාර්ල්ස් හැන්රිද සොයිසා යන නාමයෙන් යුක්තවූ, සිරි, ඓශ්වර්‍ය්‍යය සුමහ, ලොකාර්ථදායක ක්‍රියා සංඛ්‍යාත යහපත් මාර්ගයෙහි, ලන, වියදම්කොට ලන්නාවූ, මැති සමිඳුට, ලඬකාධිපයෙහි සමාදන විනිශ්චයකාර මන්ත්‍රී ස්වාමි උත්තමයා හට, මේ පොත, කාව්‍ය රාශි ගර්භ චක්‍රය නම්වූ මේ පුස්තකය, දෙමි. දානය කරමි.

(ස්ථවිර පක්ෂයට) සිරිගණ, සර්වඥයන් වහන්සේගේ, අන අයන, ආඥාපථය; නඉක්මූ, අතික්‍රමණය නොකළාවූ; සසුනු දය රත, ශාසනාභිවෘද්ධියෙහි ඇලුනාවූ; අරිදන, ශ්‍රද්ධා ශීලාදී ආර්‍ය්‍ය ධනයන්ගෙන්; සමුදු, සමෘද්ධවූ; දිනි, ධෛර්‍ය්‍ය-යෙන් හා; යස, කීර්තියෙන්; දසත, දසදිසාවෙහි; පළඋනු ව්‍යාප්තවූ; දිනි, ප්‍රඥාවද; යස, කීර්තියද ඇත්තාවූ; අබිදුනු අභින්නවූ; කුල, මාතෘ පිතෘ කුලයෙන් හා ශාරිපුත්‍ර මෞද්-ගල්‍යාණ යනාදී ආර්‍ය්‍ය කුලයෙන්ද; පිරිස, ඥාතිපිරිසගෙන් හා ශිෂ්‍යාන්තේවාසී භික්ෂුසාමනේරාදී පිරිසගෙන්ද; ඉදු, සමෘද්ධවූ, සොයිස, ශ්‍රොතෙප්සාවූ හෙවත්, කර්ණ රසායනවූ; අදි වදන යුත, විශෙෂණ වදනයන්ගෙන් යුක්තවූ; සිරි සුමහල නැමැති ශ්‍රී සුමංගල යන නාමයක් ඇත්තාවූ; සමිඳුරු, වැලිගම ගණාචාර්‍ය්‍ය ස්වාමීන්ද්‍රයන් වහන්සේට, මේපොත, කාව්‍ය රාශිගර්භ චක්‍රය නම්වූ මේ පුස්තකය; දෙමි, දානයකරමි.

සිව් දෙස් පැතිරෙන යස තෙද ක ත්දේ
වර්ලස් හැත්රිද සොයිස මැති ත්දේ
කව් රැස් ගැබ සක නම මත න ත්දේ
සව් ලෙස් පිළිගනු මැන මෙ පබ ත්දේ

වැලිගම සිරි සුමගුල් ගණ ඇ දු රු
සිලි නම යතිවර හට අප ඇ දුරු
පිලි ලොම් වසයෙන් මේ පද ම දුරු
පිළිනම තෙමි වැඳ වැඳ පද සො දුරු

ගණිසුරු සඩා නන සොහොයුරු යුරු නැති න
අනිසුරු මැඩා හරිනට නිවි දපඋර න
මැනිසුරු තුඩාවේ පඬි ගුණ වඩන ය න
කරුසුරු වඩා හෙළ බස දැනගත් යෙහෙ න

යතිසුරු නැමැති කොග්ගල විමල සරනිස් ස
බුවිසුරු සක වසෙක දහසට සියෙ කොළ ස
දිනිසුරු තුලා රැස පත් කුජ දින තුදු ස
ලෙස සුරු මෙකව් රැස් ගැබ සකකෙලෙ සතො ස

ද සොයිසා චරිතය. 531, 532, 533, 534, 535, 536, 537, 538, 539, 540 යන පිටු.

මලලගම ග්‍රාමයට ඇතුළත්වූ මේ දූව මලලගම් නම් ගමෙහි කෞරව ගෝත්‍රයට අයත් පරම්පරා අතුරෙන් කිපයක් නම් මෙසේයි. වීරසූරිය මහ විදාන මූහන්දිරම්ගේ, වික්‍රමසූරිය රාජපක්ෂ පටබැඳි මහවිදානගේ, පුංචිහේවාගේ, සල්පද්‍රෙරු පටබැඳිගේ, අපරක්කෝ හේවාගේ, තෙල්වත්තේ කළුආච්චිගේ, යන පරම්පරායි. මේ හැර තවත් පරම්පරා රාශියක් තිබේ. මෙ ගමෙහි උපන් කෞරව වංශිකයෙක්වූද, යුධ සේනාපති පැලවාගෙගෙන් පැවත එන්නාවූද පැලකැටි-යගේ, ක්ෂත්‍රියෙකු සම්බන්ධව අපට දැනගන්ට ලැබුනු තොරතුරු ඇතුලත් කවිපංතියක් මෙහි ඇතුලත් කිරීම මැනැවයි සිතමි.

සහපත් ගති නැමැති මාහැගි මිණි රත්න
සහදෙති දරා ලොවැඩට උසුලන යත්න
මහතා කළණ මිත් පියදස් ජය රත්න
යහතින් සැරද! බලයෙන් තුන්විද රත්න

ලබමින් දිවි උපන දූවේ මලල ග ම
සුබ ගති ගුණ අනුව දැඩිවී මහගු ක ම
තබමින් ලක්දිවේ සැමතැනම් නම ත ම
ඔබ සිය දිවිය හොබවන බව කියනු කි ම

බැන්විස් රණවීර මෑ. කිවියර සභරාව. 1951 ජූලි කලාපය.

පෙම්පා දූයට රුපු එඩි බිඳ කෙසර යු රු
සෙන්පති පදවි ලත් පෙරවෙනින නර ව රු
සෙන්පති පරපුරක පැලවා කුලෙහි කු රු
සත් මිතු ජයරත්න දින සැපනිත් සපි . රු

(ධනපාල හේවාකොඩිකාර විසිනි)

පාලවත්, පාලකුට්ටි, පැලකැටියේ, පැලවා, යන පරම්පරා සියල්ලම කෞරව ගෝත්‍රිකයෝයි.

යුධසේනාපති පැලකැටියගෙ කෞරව ආදිත්‍ය පියදාස **ජයරත්න මහතා** මේ ග්‍රන්ථයෙහි ප්‍රකාශක වන්නේය.

## PANIKKAL OF MALAYALAM.

"In the reign of Maha Parakkrama Bahu (vi) there came to that City (Kotte) a certain Panikkal a foreignar native of the mountain of Malavar from a Village TULUNAR an expert master in arms and for this reason he was well comed by the King and being by him raised to the dignity of Mudliyar was called Panikkal Mudliyar."

"There he married and had two sons, who being aducated in the Palace were most belored by the King, who afterwards corisedering that on the side of their mother they had many Kingsmen, that as he had no their he had sworu in a grandson as his successor and fearing that the two brothers being less affected meanse of what there was of a foreigner in them and powerfull becanse of their very Kindred would disquitet his kindom after his death determind to kill them, he communicated this intention to one of his faverite who adviced him not to kill them but to send with some title of honor the one who was more to the feared to subdue JAFAPATANAM becanse the Mudliyar whom he had placed there, seized the lands and had done many wrongs and violances to his lieges."

The King adopted this advice and the Mudliyar himself who had given it to him went on his order to call the son of PANIKKAL who was called CHAMBAPERUMALI."

"He gave him men where with he became master of lands with title of Prince ever acknowledging the King of Kotte and paying him tribute faithfully. He they say was the first who should JAFNAPATANAM as King."

(Revd: Fr: Queroz's, Conquest of Ceylon)

# කොච්චි ජාතික පානික්කල් මුදලි.

"කෝට්ටේ හයවෙනි මහ පරාක්‍රමබාහු රජ දවස (දඹදිව) මලබාර් රට මලයාලම් ප්‍රදේශයේ තුලුතර් නම් ග්‍රාම වැසි Aපානික්කාල් නැමැති විදේශිකයෙක් කෝට්ටේ නුවරට පැමිණියේය. යුධායුද තැනීම පිළිබඳ ඉතා දක්ෂ භාවයක් මොවුන් කෙරේ පැවතුන සෙයින් රජතුමෝ ඔහු සාදරයෙන් පිළිගත්හ. කාලයක් ඇවෑමෙන් මොහුට මුදලි නාමයක් දෙවා වදාළායින් පසු හේ පානික්කාල් මුදලි නමින් ප්‍රසිඬවිය."

"මේ මුදලි තැන ආවාහව් පුත්තු දෙදෙනෙක් ලැබූහ. රජ මාලිගාවේම ඔව්හු ශාස්ත්‍රයන් ඉගනගත්හ. රජ්ජුරුවෝ මේ දරු දෙදෙනා කෙරෙහි බොහෝ ස්නේහ ඇතුව සිටියාහ."

"ඉක්බිති වැඩි වයස් පැමිණි මේ දරු දෙදෙනාගේ මව් පක්ෂයේ නෑබඳුවර රාජ පුරුෂයින් බොහෝදෙනෙක් සිටි හෙයින් තමාගෙන් පසු රාජ්‍යය පිළිබඳ බියව පත් රජ්ජුරුවෝ රජකමට උරුම පුත්‍රයෙක්ද නොසිටියෙන් සවකීය එකම මුනුපුරාට රජකම ලැබියයුතුයයි දිව්රුම්දී කැමැත්ත ප්‍රකාශ කළහ. ඊට හේතුව මේ විදේශිකයින් බොහෝ බලසම්පන්නවද රටවැසියාගේ හිත් දිනාගනද සිටි බැවින් ඔව්හු රජකම ලබාගැනීම පිණිස කළකෝලාහල ඇතිකරත් යයි යන සැකය පිටය ඉත්තිසා මේ සහෝදරයින් දෙදෙන මරාදැමීම පිණිස රජ බොහෝ පක්ෂ හිතවතකු හා කුමන්ත්‍රණ කෙළේය.

---

APANIKKAN:- A Caste of barbers and weavers in the Madura and Tinnvelly Districts of Madras.

(Castisin India, by J. H. Hutton, Cambridge Univercity Press, Page 256)

"ඒ හිතවතා ඔවුන් තොමරා දෙදෙනා අතරෙන් බලවත්තයා ගරු නාම සම්මුතියෙන් පවරා ජාපනේ රාජධානිය භාරව සිටින මුදලි තැන කෝට්ටේ නගරයට කප්පන් නොගෙවා රජුට ද්‍රෝහිව සිටින සෙයින් ඔහුට විරුඬව සටනට යවන්ට යයි අනුශාසනා කෙළේය."

"මේ අදහස රජ්ජුරුවෝ භාරගෙන ඒ අනුශාසනා කාර මුදලිතැන පානික්කාල්ගේ පුත්‍රයාවූ සෙම්බ පෙරුමාලි කැඳවාගෙන ඒම පිණිස පිටත්කර හැරියේය."

"ඔහුට කුමාරයා යන නාමයද ප්‍රසාදකොට දෙවා සේනාවද පවරා රජු සටනේ යාපා පට්ටනම පරිපාලනය කිරීමට සහ කෝට්ටේ රජුට (හයවෙනි පැරකුම්බා) කප්පන් ගෙවීමටද ආඥකළහ." මේ කුමරු වනාහි ජාපනය ආණ්ඩු කළ පළමුවෙනි රජුයයි කියනු ලැබේ." යනුයි.

(ප්‍රනාන්දු කියුරෝස් පියතුමාගේ ලංකා විජය ග්‍රහණය නැමැති ඉතිහාසය) කෞතුකාගාර පොත්හල අංක 22B/16

---

A පාංනික්කල්:- මදුරාසියේ මදුරේ සහ තින්නවේලි පලාත් වල වසන ඇම්බැට්ට ගෝත්‍රයකට සහ රෙදි වියන්නන්ටත් අයිති නාමයයි.

කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල යන්ත්‍රාලයේ මුද්‍රිත ඉන්දියාවේ වංශ නැමැති පොත. පිට 256. ජේ. එච්. හටන් විසිනි)

பாணிக்கன்:- வாத்தியகாரன்
පාණික්කන්:- ගුරුවරයා

பாணிக்கன்:- உபாத்தியயன். சாராயன் மாய்ச்சுகிறவன். யானை பாப்பாகன், விஷ வைத்தியன்.

පාණික්කන්:- උපාද්‍යාය අය, අරක්කු පෙරන්නා, අලි මෙහෙවල් කරන්නා, විෂ වෛද්‍යවරයා.

(යාපනේ පෙයරකරාදි. පිටු 658, 694)

දකුණු ඉන්දියාවේ බටහිරට හුරුවී පිහිටි මලයාලම් කේරළය, මලබාරය, නොහොත් කොච්චිරට, කොච්චි ගෝත්‍ර නාමයක් දරූ Aපානික්කාල් (පානික්කර්) නැමැත්තා කෝට්ටේ නුවරට පැමිණ සිංහල කුල කාන්තාවක් ආවාහ කොටගෙන සෙම්බුගප්පෙරුමාල් සහ අම්බුලුගල කුමාරයා නමින් යුත් පුතුන් දෙදෙනෙකුත් ලැබ මුදලි ධූර ප්‍රාප්තව කෝට්ටේ නගරයෙහි විසූ බව මෙයින් පැහැදිලිවේ.

මේ "සෙම්බුග පෙරුමාල්" නැමැති ද්‍රවිඩ නාමයේ සිංහල අර්ථය මෙසේයි.

## දෙමළ අකාරාදි විස්තර.-

செம்பு - உதும்பரம், தாம்பிரம்.
සෙම්බු - උදුම්බර, තාඹර, (සසු)
பெருமாள் - அரசன, தலைவன்,
පෙරුමාල් - රජ්ජුරුවෝ, ප්‍රධානියා (කුමරු)
(යාල්පානම් පෙයරකරාදි)

---

Aරන් සත් පත් එකසුත් සුගත් පද මුදුන් දුන්
මල්කඩක් මෙන් තිහින්
යුත් මෙත් සත් ගුණයෙන් .සතත් රැකී නැතින්
දත් සිප් සියල් කවි නළුන්
සත් කිත් යුත් පනික්කි නම් මැනිතුමෙක්
ආරාධනාවෙන් මහත්
සෙත් අත් පත් වනු වස් සියල් එළු සිලෝ
කීයෙත් තිලෝනා වඳිම්

(හවෙනි පැරකුම්බා රජ දවස ලියන ලද ඒළු සිලෝ සතකය පුස්කොළ පොත. කටුගේ පොත්හල අංක AD 6)

හවෙනි පරාක්‍රමබාහු රජ්ජුද සොළී දෙමළ රාජවංශයට අයත් කෙනෙකු බව වන්නි කථා පුස්කොළ පොත්වල සඳහන්වී තිබේ. ගම්පොල ඉතිහාසයෙහිද එසේම ලියනලදී. එතුමන්ගේ එකම දූකුමරිය "ලෝකනාථා" නොහොත්

## විශේෂ විභාග.

සෙම්බුගප් පෙරුමාල් යනු සපු කුමාරයා කියාද, සෙම්බුගප්-පූ-පෙරුමාල් යනු සපුමල් කුමාරයා හෝ සපුමල් රජ්ජුරුවෝ යන්න බව පසු පිටවල සඳහන් කරුණු වලින් මොනවට අවබෝධවෙ.

සෙම්බුගප් පෙරුමාල්ට, සේනානායක සථානාන්තරද පවරා තිබූ සෙයින්, ඒ දෙමළ නාමය සිංහලට පෙරළා සේනාපසි තනතුරද දක්කවමින් සන්දේශ කාරයෝ මෙසේ. වැනූහ.

---

A"උලකුඩය" දේවිය පාවා දුන්නේද දෙමළ වංශාධිපයෙකුවූ නල්ලූර් තුනයාර් නැමැති සත්තස් ලේකම් තැනටය පැකුම්බා රජුගෙන් පසු කෝට්ටේ රාජධානියේ සිංහාසනය මේ දෙපලයේ පුත්‍රයාට අයිතිවිය. හේ දෙවෙනි ජයබාහු (ක්‍රි: ව: 1467[69) නමින් 'රජවූයේ මොවුන් මරාදමා සපුමල් කුමරු හෙවත් සෙම්බුටප් - පූ - පෙරුමාල්, හයවෙනි භුව- නෙකබාහු (ක්‍රි: ව: 1499/76) නමින් ත්‍රි සිංහලයටම රජ රජවූයේය සිංහල රාජකීය කුමරියක් පාවාගත් මෙරජු ජාතියෙන් කොච්චියෙකි. මොහුගේ සහෝදරයෙක්වූ අට වෙනි වීර පරාක්‍රමබාහු (ක්‍රි. ව: 1487/1509) විසි දෑවුරුද්දක් රාජ්‍යය කෙළේය. මීට ඉහතින් (ක්‍රි: ව: 1476/86) දක්වා පණ්ඩිත පරාක්‍රමබාහු සිංහලුන්ගේ රජවිය. මේ දෙදෙනාද කොච්චි ජාතිකයෝ වෙති. නවවෙනි පරාක්‍රමබාහු රජුද (ක්‍රි: ව: 1508/28) ඉහත සඳහන් පරපුරට අයිතිය. මොවුන්ගේ සහෝදර කොච්චි ජාතිකයෙක් විජයබාහු (ක්‍රි: ව: 1530/34) යන නමින් දෙවුන්දර හා ගම්පොලද රජ්‍ය ශ්‍රියට පත්වූ බව පෙනේ. හත්වෙනි භුවනෙකබාහු, රයිගම් බණ්ඩාර, මායාදුන්නේ රජ. සීතාවක රාජසිංහ, දොන් ජුවන් ධර්මපාල යනාදී සිංහල රජවරුද ඉහත සඳහන් පෙළපතට අයත් වූවෝ වෙති.

නීල තුරගුව හැගෙමින් රිවි දෙව් සිරි ත
දු ල කර සේසත් මිණි බරණ සිරණි ත
බ ල සිරි සෙත් සහ යාපා පටුන් ගෙ ත
බ ල සේනානායක *සපු කුමරු එ ත

(සැලලිහිණි සන්දේශය.)

එමෙන්ම අතීත සිංහල රජ දවස ඉන්දියාවෙන් මෙරටට පැමිණි මාණික්ක තලෙයි වේන්දර් නැමැති තවත් රජකුගේ අංශයි ද්‍රවිඩ නාමයවූ (மாணிக்க தலை வேந்தர்.) මාණික්ක තලෙයි වේත්දර් යන්න' නීලකොබෝ සහ කසෑකුරුරුළු සන්දේශ කාරයෝ මෙසේ ලංකා භාෂාවට පෙරළා දක්වූහ.

මෙංහු වනාහී මුක්කර හටනෙහි දක්වෙන දෙවන මාණික්ක තල වේන්දර්ට පළමුව ලංකාවට පැමිණියෙකි.

මු නිඳු දතු වඩමින් තිසි ලෙස සොඳු රූ
නිරිඳු මිණි කිරුළු කරවූ සැය ශ රූ
ප සිඳු සුර තරන් අද කරණ විසිතු රූ
දී නිඳු අවර වඳු වෙහෙරට පොලොම් ම රූ

(කහකුරුළු සන්දේශය. 46 වන පද්‍යය.)

දමිල බසෙහි වූ "මාණික්ක තලෙයි වේන්දර්" යනු "මැණික් ඔටුණු රජ" නොහොත් "කුමාරයා" යන අර්ථයයි.

"මාණික්ක" යනු මැණික්, මිණි, යන තේරුමයි. "තලෙයි" යනු ඔටුණු, කිරීට යන අර්ථයයි. මෙයින් "මණි කිරීට" යයි මිශ්‍ර සිංහලයට ව්‍යවහාර වූහ. එය සිංහලට බිඳී බැවහාරවුණේ "මිණිකිරුළු" යනුවෙනි.

---

*සපුමල් කුමරු යාපනයෙහි සිංහාසනාරූඪවූයේ ක්‍රි: ව: 1448 දීය යාපනේ අර්ධද්වීපය දිසා හතරකට බෙදා සිංහල අධිපතියන් හතරදෙනකුට බාරදුන් බවද යාපනයේ ඉතිහාසයෙන් පෙනීයන කරුනකි. ඒ දිසාවලට පත්කරන ලද අධිපතියන්ගේ නම් මෙසේය.

ඒ බැව් ඉහත සඳහන් පද්‍යයෙන් පැහැදිලිවේ. පොලොම්මරු වෙහෙර (දැන් කංගල්ලේ පොලොම්මාරුවේ කුඩා විහාරය) "මාණික්ක තලෙයි වේන්දර්" නොහොත් "මිණි කිරිළු තිරිඳු" නැමැත්තෙකුගේ කෘතියක් බව මින් ස්ඵුටවේ.

## දෙමල අකාරාදි විභංග

மாணிக்க தலை – මානික්ක තලෛ
මානික්ක තලෛ – මැණික්ඔටුන්න, මිණි කිරුළු
வேந்தர் – වේන්දර්
වේන්දර් – රජ

පොලොම්මාරුව අසල වූ සිරිනා මළුවේ මේ ප්‍රදේශික රාජයා විසූ බව හරණ ගණිතාචාර්‍ය ප්‍රණීත නීලකොබෝ සන්දේශයේ අටවන කවෙන් අනාවරණය කරන්නේ මෙසේයි:–

සි රි නා කල පෞරණ මිණි කිට රද පේම
සි රි නා වැඩ දිවාමලු කරවිය මී ම
සි රි නා දැන් මෙතොප අප මෙපියස තා ම
සි රි නා මළුව යයි පැවසුති එති සා ම

(නීලකොබෝ සන්දේශය)

---

*"වල්ලිමානාක්කන්, යන විරුද නම ඇති වික්‍රමසූරිය තෙමේ බටහිර පත්තුවටද, සෙම්බග මානාක්කන් යන විරුද නාමලත්, වීරසූරිය තෙමේ නැගෙනහිර පත්තුවටද යෝන් මානාක්කන් යන විරුද නම ඇති, විජය පරාක්‍රම තෙමේ දකුණු පත්තුවටද, අධිකාරි කොට "උද්දණ්ඩවීර ශිඛාමනි" ගරු නාමධාරි වීරසිං තෙමේ සේනාපති පදවියටද පත්කරණ ලද්දේය.

(1957 සැප්තැම්බර් මස 1 ඉරිදා, සිළුමිණ.)

මිණිකිරිට - යනු පද්‍යයට යෙදුවේ "මිණිකිට" කියායි.

"එමිණි කිරුළු රද හට පොරණ තිරතුරු"

යන්නෙන් රාජ නාමය පෙනේ

මිණි කිට - මිණි කිරීට - මිණි කිරුළු යනු "මාණික්ක තලෙයි වේන්දර්" නැමැති රාජයෙක් බව දූත් හොඳටම පැහැදිලිය. ප්‍රසිද්ධ ඉතිහාස පොත්වල මේ රාජ නාමය සඳහන් නොකරන ලද්දේ ප්‍රදේශික රාජයකුවූ බැවිනි. කහ-කුරුළු සන්දේශ කර්තෘවූ දික්වැල්ලේ හෙරණ පාණන් සහ තිල කොබෝ සන්දේශකාර හරණ ගණිතාචාර්‍යයන්ද ස්වීය ග්‍රන්ථවල මේ නාමය සඳහන් කරන ලද්දේ ප්‍රත්‍යක්ෂ වශයෙන් නිසැකයෙන්ම මේ රජු පිළිබඳ පුවත් දන්නා බැවිනි. මාණික්ක තලෙයි වේන්දර් රජු දකුණු ලක සිටිනා-මලුව නිසම් තම වාස භූමිය කොට ගෙන සිටි බව මෙයින් හැගේ.

A මාණික්ක පට්ටන්කට්ටිගේ, මාණික්ක පටබැඳිගේ නමින් යුත් කෞරව වංශික පරම්පරාවල් දකුණු පලාතේ පමණක් දකින්ට ලැබේ. මේ පෙලපත් නාම වලින්ද "මැණික් ඔටුනු දූරුවෝ" යන අර්ථය ගෙනදේ

---

A பட்டங்கட்டி - பட்டவத்தனள்

පට්ටන්කට්ටි - පට්ටවත්තනන්

පට්ටන්කට්ටි - රාජාභිෂේකයා

பட்ட வத்தனர் - பட்டங்தரித்த வாசர்

පට්ටවත්තනර් - පට්ටන්තරිත්ත වරසර්

පට්ටවත්තනර් - රාජාභිෂේකය ලත් රජු

(යාල්පානම් පෙයරකරාදි. පිටු 655, 656)

† BADUGES (I. E. Vadugans er Northeners) The Emissaries of the Madure Rulers

(Tinuavelly Gezetteer, by H, R. Pate I. C. S. Chf ii. Fage 58)

භාවය:-

(බදුගේ යන නාමය "වඩුගන්" නොහොත් "උතුරේ වැසියා යනුයි" මොවුහු මදුරාපුර රජවරු වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුයි.)

(තින්නවැලි ගැසට්යර්, සිවිල් නිලධාරි, එච්. ආර්. පේට් ii පරිචේ: පිටුව 58.)

†"මාණික්ක බදුගේ" මාණික්කු බදුගේ, මාණික්කු බදුගේ යන නාමවලියෙන් පඬිරට මදුරාපුර රජවරුන්ගේ ඇම්සංරිස් ධුරය දැරූවන් යන තේරුම ඇතිවේ.

තවත් මාණික්කගේ, මාණික්ක බඩතුරුගේ යනාදී පරම්පරාවල් වනාහී මාණික්ක තලෙයි චේන්දර් රජු යටතේ සේවය කළ සුළු නිලධාරි කොටසකගෙන් පවතින පරම්පරාවල් වශයෙන් විශ්වාස කරණු ලැබේ. ඔවහුද කුරුකුලයෝය

## නීල කාරාව

අලගියවන්න මුකවෙටි තුමා විසින් පෘතුගීසි ආණ්ඩුවේ ඉල්ලීම පරිදි (ක්‍රි: ව: 1593/1615) කාලය තුල ඇතුලත් ආදායම් බදු සම්බන්ධව සම්පාදනය කල තෝම්බුවේ 12 වෙනි පිටුවේ 23 සහ 41 වෙනි පෙළේද, 15 වන පිටුවේ 6 වන පෙළේද, 16 වන පිටුවේ 11 සහ 23 වන පෙළේද, 17 වන පිටුවේ 14 වන පෙළේද, 20 වන පිටුවේ 16 සහ 38 වන පෙළේ, සහ තවත් කිප පළකම මීගමුව සහ හලාවත පළාත්-බද පුරුදුවැල්ල, කුබුකන, ගලහිටියාව, වෙන්නප්පුව, කටු-නේරිය, තීන්නපිටි, නයිනාමඩම, යනාදී ප්‍රදේශ වාසීන් අතර "නීල කාරාව" නම් කාරාව කුලයට අයත් ගෝත්‍රයක් ගැන සටහන් වී තිබේ

එහි "A" අක්ෂරය වැරදීමකින් වැඩිපුර යොදා තිබෙන්නේ වී නමුත් පරංගි භාෂාවෙන් ලියන විට, එසේ "A" අක්ෂරය (ඉංග්‍රීසි ක්‍රමයට විරුඬව) සමහර විට ලියන්ට පුළුවන්කම තිබේ යයි සිතිය හැක.

එහෙත් "නීල කාරාව" පිළිබඳ දන්නං කෙනෙකුට එහි සඳහන් ගෝත්‍රික නාමය එකවරටම තෝරා ගත හැක

ඉන්දු මිටියාවතෙන් සොයාගන්නා ලද ඇත පුරාණ ශිලා ලිපි ප්‍රකාර පරවර කුලයේ මිනිසුන් තුන් වර්ගයකට, නිල පරවීර්, පගල් හෙවත් පගලවන් පරවීර්, සහ මීන-පරවීර්, යන නාම ගිම් බැව් කියන ලදී.

සුබ දමිළ භාෂාවෙන් "නිල" යනු චන්ද්‍රයාටද "පගල්" නොහොත් "පගලවන්" යනු සූර්යයාටද "මීන" යනු මත්ස්‍ය-යාටද කියනු ලැබේ.

කෞරව වංශිකයින් අතරද ඔවුන් තුන් වර්ගයකට, "තිල කරවර්" (චන්ද්‍ර කරාව) "පගල් කරවර්" (සූර්‍ය කරාව) "මීන කරවර්" (මත්ස්‍ය කරා) යයි ව්‍යවහාරව පවතී.

හත් කෝරළය බද සෙත්දිරියාපිටිය, පොතුබෝව, තෙරියාව, අරශත්වැව, මීගලෑවැව, කුරුප්පුවත්ත, ඔතුවෙල, මාස්පොත, දිද්දෙණිය, දෙබෙමඩ, බුල්තැව, තෙල්ලිය, දෙමළමාතේ, සහ තවත් පලාත් කීපයක වසන සමහර උඩරට කරාව කුලයේ මිනිසුන්ද, තම තමන් "චන්ද්‍රකරාවේය." "සූර්‍ය කරාවේය." "කෝන් කරාවේ"යයි කියා ගනිති.

"කෝන්" යනු දමිළ වචනයෙන් "රජු" නොහොත් "එඩේරා" යන අර්ථය ගෙන දේ.

මීනවත් පඩිරාජයින්ට "කෝන්" නාමයෙන් අමතන්නා සේම "මීන" හෙවත් "මත්ස්‍ය" නාමයද, ඔවුන්ට උරුම වන්නේය.

ඉන්නිසා කරාව කුලයේ එක් ගෝත්‍රයක් "කෝන් (රජු) සහ "මීන" (මත්ස්‍ය කරාව) යයි කියාගන්නා බව සැලකිය හැක.

දඹදිව උතුරේ රාජ පුත්‍ර ප්‍රදේශයේ කුරුරටට යාබද රාජධානියට මත්ස්‍යදේශයයි කියති. අද "හෛරාට්" නමින් හඳුන්වන මේ රට වැසියන්ට සකු බසින් "මත්ස්‍ය වරු කියාද, දමිළ බසින් "මීන" නොහොත් "මීනවත්" කියාද කියති.

දමිළයන් කියන අන්දමට මොවුහු චන්ද්‍ර ඇත අතීතයේ චන්ද්‍ර වංශික මීන පඩිරාජයින් සමහර දෙනෙක් දඹදිව දකුණෙන් පලාගොස් රාජ පුත්‍ර ජනපදයේ පදිංචි වූ බවත් ඔවුන්ගෙන් පැවතෙන්නෝ වූකලී මෙම මත්ස්‍යවරු යයි විශ්වාස කළ හැක.

(අලගියවන්න පෘතුගීසි තෝම්බුව, තුන්තුකුඩියේ පතිඤය ලර් දෙමළ සභරාව, දෙමළ අකාරාදි, හත්කෝරළයේ ජන කථා ආශ්‍රයෙනි.)

## ශාක්‍ය වංශික බණ්ඩාර වලිය.

"..................භද්‍රකත්‍යායන බිසවු සොහොයුරු ඌරු කුමාරයා, රෝහණ කුමාරයා, අනුර කුමාරයා, විජිතයා, දීඝායුෂ, යන කුමාරවරු නැගනියන්ගේ ලක්දිව් ගමන් අසා මෙහි පැමිණ නැගනියන් සහිත රජ දැක, ඔවුන් විසින් කරණ ලද සත්කාර සම්මාන ඇත්තාහු ඒ ඒ තන්හි නගර ග්‍රාමයන් පිහිටුවූහ. ඔවුනතුරෙන් ඌරු කුමාර තෙමේ ගම්පලට නුදුරු ගම්හී රමණීයවූ බිම් බලා එහි නුවරක් කොට විසුයේය එනුවර ගම්පල නොහොත් සිදුරුවාන නම් විය."

"රෝහණ කුමාරයා විසූ රට රෝහන නම් විය. අනුර කුමාරයා විසූ රට අනුරාපුර විය විජිත කුමාරයා විසූ රට විජිතපුරය නම් විය. දීඝායු කුමාරයා විසූ රට එනම් විය. රාම කුමාරයා විසූ රටද එනම් විය."

"මෙසේ මේ රාජයන්ගේ නාමයෙන් රුහුණුය, මායාය පිහිටිය, යන නම් ඇති කොටස් තුනක් වූහ. නොහොත් ත්‍රි සිංහ නම් වි..............සිදුරුවාන රටෙහි බණ්ඩාරවරු දස අට දෙනෙක් වූහ. බලවිට්ද එපමණ වූහ. ඉතිරි තෙරටෙහිද රට මදක් බණ්ඩාරවරු අඩුවූහ. මෙකී පත් මහ රටෙහි සියලු බණ්ඩාරවරුම ඉතා බලසම්පන්නව කුඩ පලිස් ආදිය ඇතිව ආධිපත්‍යයෙන් විසූහ.............."

"සිදුරුවාන බද බණ්ඩාරවරු, "අපේ රජ පලි ආදිය නුදුනහොත් බලවිට රට යුද කොට ගනිමැයි" කීහ. එවිට:- "බලවිට රට බණ්ඩාරවරු;" "රට දෙනත් පලි නොදෙමැයි" කීහ................. ..

(සිදුරුවාණය නොහොත් බණ්ඩාරවරු)

## පානබොක්කේ මහතා විසින් විස්තර කරණ බණ්ඩාර වලිය.

කලින් කල රජ බමුණු වෙළඳ යන ගෝත්‍රිකයින් මෙහි පදිංචිවීම පිණිස ආවෝය. ඔවුහු කොහොමටවත් ඔවුන්ගේ

කුල මිශ්‍රණය වීමට ඉඩ ප්‍රස්ථාවක් නුදුන්හ එහෙත් ඔවුහු ගොවි කුලයෙන් හිර ගත්තෙත් ඒ කරණකොට ගෙන ගොවි කුලය මේ රටේ ප්‍රධාන කුලය වශයෙන් කල්පනා කරන්ට විය.

වර්තමාන කාලයේ ගොවි කුලයේ කොටස් කීපයක් තිබේ.

‡ රජෙකුට දූව ගොවි කුල බිරිඳකුගෙන් ඉපිද පැව- තෙන පරම්පරාවට බණ්ඩාර වලිය යයි කියති...............

මොවුන්ට හා අමිශ්‍ර ගොවි කුලයටද රදලකම්පේරුව නොහොත් මුදලි පේරුව යන තනතුරේ නාමය අයිතිය .........

අතිකුත් බාල ගොවිගම ගෝත්‍ර පිළිබඳ විස්තර මෙසේය:-

1. “තිලමක්කාරයෝය.
2. පට්ටිවල ඇයෝය.
3. වීරමේසතර ගොල්ලෝය.
4. පොරොකාර සහ කුතම් මඩුවේ ගමයෝය.
5. ඇත්වල පණික්කියෝය.
6. මල්කරුවෝය.
7. කුට්ටන් වල ඇත්තෝය.
8. බලිගත් ගමයෝය.
9 ගත්තරුය.
10. තිඹිල්ලෝය” යනුයි.

---

‡ නරේන්ද්‍රසිංහ රජුට දූව උනම්බුවේ නම් පුතෙක් සිටි- යේය. එහෙත් ගොවි කුල ස්ත්‍රියකුගේ දරුවෙක් සෙයින් ඔහුව රජු මෙන් පිළිගන්ට කුලමානී ඇමැතියෝ සතුටු නොවූහ.

සිංහල බලය පුවත් පත, 1. 11. 1941,

යම් පුරුෂයෙක් ඔහුට වඩා පහත් කුලයක ස්ත්‍රියක හෝ ස්වකීය දෙගුරුන්ගෙ කැමැත්ත නැතුව තමාගේ කුලයේම ස්ත්‍රියක සමග හෝ අවාහ වෙන්ට යෙදුන හොත් එය චාරිත්‍රවලට සහ නැකම් පිළිබඳවද විරුඬ ක්‍රියාවක් වන්නේය. මෙවැනි විවාහවලින් උපදින දරුවන් අවජාතක වශයෙන් සලකනු ලැබේ.''

''ගොවි කුලය මේ වීපයේ ප්‍රධාන කුලය වශයෙන් කල්පනා කරණ නුමුදු රජ බමුණු සහ වෙළඳ කුලිනයන් අතරෙන් යම් පුරුෂයෙක් මෙරටට පැමිණ ගොවිකුල ස්ත්‍රියක පාවාගෙන ඒ බිරිඳගෙන් දරුවන් ලද්දේද එකී දරුවෝ පියාගේ වංශයට ඇතුලත් නැත. එසේ වුවත් ඒ දරුවන් සහජාතකයින් වශයෙන් කල්පනා කරණු ලැබේ. එහෙත් ඔව්හු පිය උරුමයේ ප්‍රශ්නයට භාජන නොවෙති. ඊට හේතුව කවරේද යත් පියාගේ මරණයේදී ඔහුගේම කුලයට අයත් බිරිඳකගෙන් උපන් දරුවන් ඇතිවී ඔවුන් උරුම කියාගෙන ඉදිපත් වීමට පුළුවන් කම තිබෙන නිසත්, මෙහි පදිංචි වී සිටින අර මැරුණ පුරුෂයාගේම නෑ බන්ධු කෙනෙකු හෝ උරුම කියාගෙන ඉදිරිපත් වීමට ඉඩ තිබෙන නිසාත්ය.''

''ගොවි කුල බිරිඳගේ දරුවන්ට මේ පිය උරුමය පිළිබඳ කිසිම අයිතිවාසි කමක් නැත''

(පානබොක්සෝ සහ ලැම්භරර් මහනුවර ඒජන්ත මහතුන්ගේත් නීති නිසංඩුව, පිටු 6, 13, 14, 15, කොළඹ කෞතුකාගාර පොත් හල, අඬක 15 / **B. S.**)

## බණ්ඩාර වරු.

කෝට්ටේ සහ මහනුවර යනාදී රාජධානි කාලවල දකුණු ඉන්දියානු රාජවංශිකයින් බොහෝ දෙනෙක් මේ රටට වරින් වර පැමිණ තිබෙන බව නොයෙකුත් ඉතිහාස පොත්වල සටහන්වී තිබේ මේ ක්ෂත්‍රියයන්හට ''සම්-බන්ධාර්'' කියාද කෙටි වශයෙන් ''බන්ධාර්'' කියාද ද්‍රවිඩ

භෂාවෙන් ආමංත්‍රණය කර තිබේ. මෙයින් ලංකා භාෂාවට පෙරලාගත් "බණ්ඩාර" නාමය අද දක්වා ව්‍යවහාරව පවතී. එහෙත් සිංහල රජුන් දවස මේ ගරු බණ්ඩාර නාමය රාජ වංශිකයින්ටම පමණක් සීමාවී තිබුන බව ඉතිහාස පොත්-පත් බැලුවන්ට ඇතැඹුලක්සේ වැටහී යනවාට කිසිසේත් අනුමාන නැත

රොබෙයිරෝ කියුරෝ, කූටෝ, බෝල්දියස්, බැරදස්, වලන්ටයින්, රොබොට් නොක්ස්, ඇජ්. ජ්. ගුණරත්න, තෝම්බුවේ මුදලි, යනාදී ඉතිහාසඥයින්ගේ පොත්වල "බණ්ඩාර" යනු රජුන් පිළිබඳවම ව්‍යවහාරයට පමුණුවා තිබුනු බව දැනගත හැක.

එසේ තිබියදී අර විදියේ කුල මිශ්‍රනයකින් බණ්ඩාර වලිය (බණ්ඩාරවරු) ඇතිවිය, යන පාතබොක්කෙ මහ-තුන්ගේ කියමන ඉඳුරාම වැරදි විය යුතුයි.

බණ්ඩාරවලියේ උරුමක්කාරයින් වනාහී මෙහි පහත සඳහන් රජ දරුවෝය:-

මායාදුන්නේ බණ්ඩාර, මහ රයිගම් බණ්ඩාර, රයිගම් බණ්ඩාර, ටිකිරිබණ්ඩාර, වීරසුන්දර බණ්ඩාර, කොනප්පු-බණ්ඩාර, ජයවීර බණ්ඩාර, පෙරිය බණ්ඩාර, * දෝනා කත්‍රිනා-බිසෝ බණ්ඩාර, දෝනා මාගරිටා බිසෝ බණ්ඩාර, දෝනා ඉසබෙලා බිසෝ බණ්ඩාර, හෙණකද බිසෝ බණ්ඩාර, දෝනා-කත්‍රිනා මහ බිසෝ බණ්ඩාර, දෙන් දීගෝ බණ්ඩාර, ජම්සිංහ බණ්ඩාර, සහ තවත් රාජවංශිකයෝ බොහෝ දෙනෙක් වෙති.

---

* "ජයවීර රජතෙම තමහට ජාතක කොට කිර-වැල්ලේ බිසෝ බණ්ඩාර වැදූ රාජ කුමාරයෙකුත් රාජ කුමාරියෙකුත් වූහ.

රාජ කුමාරිකාව භුවනෙකබාහු රජදරුවන් වැඩ-ඉන්නා අවදියේ ධර්මපාල රජහට සරණ මගුල් කොට"...........

(අලකේශ්වර යුද්ධය පුස්කොළ පොත කටුගේ පොත් හල)

මෙම උඩරට ජයවීර බණ්ඩාර රජුගේ දූ කුමරිය දෝනා කතිරිනා නමින් බව්තීස්මය ලැබ ක්‍රිස්තියානිය වැළඳගෙන දෙන් ජුවන් ධර්මපාල රජුගේ මෙහෙසිය වූවාය.

ජයවර්ධන පුර කෝට්ටේ රජුන් දවස "බණ්ඩාර-නායක" නැමැති තානාන්තරයක්ද තිබුනේය. එය රජ කුලේ ප්‍රධානියාට අයිතිව තිබුන තිල වලියක් බැව් ඇසීමු. මෙයට ඉංග්‍රීසියෙන් "Grand Duke" නොහොත් "Arch Duke". යයි කියති. එය "මහ අධිපාද" "නායක අධිපාද" යන ගරු කටයුතු නාමයක් සේ සැලකිය හැකිය. ඒ එසේ මැයි:-

"ව න් ධා තප කිරණ වන් තද තෙදින් නැ බී
§බණ් ඩා ර නායක තතතුරු සිරින් හෙ බී

(හංස සන්දේශය)

කෝට්ටේ රාජධානි යුගයෙහි විසූ මේ බණ්ඩාර-නායක නැමැති ක්‍ෂත්‍රියන්ගෙන් පැවතෙන පරම්පරාවක් දැනට නැති බව ඉතිහාසඥයෝ කියති. සොළි, පාඩි, සහ කේරල යනාදී ද්‍රවිඩ ජාතීන් අතර "කාවල්කාර" නමින් ගෝත්‍රයක් සිටි බව පෙනේ. මොවුන්හට "මුත්තුරාසි" නොහොත් "පණ්ඩාරම්" යනුද කියති. මේ පණ්ඩාරම් කුලයට සිංහල භාෂාවෙන් "කපුවෝ" යයි කියනු ලැබේ. අද දවසේ මේ පාණ්ඩාරම් වරුන්ද බණ්ඩාර නැමැති රාජ-කිය නාමයෙන් පෙනී සිටින බව දැනගන්ට තිබේ.

---

§ (1) බණ්ඩාරනායක - රජු ලඟට සිටින රාජ කුලීනයා

(2) බණ්ඩාර නැලිය - රජ මිම්ම යයි තෝරුම් කෙරෙන නිත්‍යානුකූල මිම්ම.

(3) Bandaras or Adassing, are these who appear at cowrt as dukes, count or princes of he royal family.

බණ්ඩාර නොහොත් "අදසිං" වරු වනාහි රජ පවුලට අයත් රාජ සභාවේ පෙනී සිටින මහ අධිපාද, අධිපාද, නොහොත් කුමාර වරුය.

(නොක්ස්ගේ ලංකා ඉතිහාසය. 136 පිටුව සහ පිලිලතෙස්, ඉතිහාසය, පළමුවන කාණ්ඩය. 333 පිටුව)

පළමුවෙනි විමලධම්සූරිය, සෙනරත් සහ දෙවෙනි රාජසිංහ රාජධානි කාලයේ උඩරට රදළ පේරුවකට අයත් සෙංකඩගල මහනුවර විසූ අලුදෙණියේ කිවිඳු විසින් ලියන ලද "රාජසිංහ වණ්නා" නැමැති කාව්‍යයෙන් උඩරට සහ පහතරට හතලිස් අට කෝරළයකින් ගෙන්වන ලද රදළ නොහොත් A මුදලි පේරුවලට අයත් හටන්කාර කුලීනයින් හට අප්පුහාමි නමින් ආමංත්‍රණය කර තිබේ. එහෙත් මේ පේරුවලට පෙනී සිටින රදළ අප්පුහාමි වරුන් වනාහී පාන බොක්කේ මහතා විසින් විවේචනය කරණ මිශ්‍රණය නොවන බව අපි එක එල්ලේ විශ්වාස කරමු.

රාජ වංශයෙන් පිට කුලීනයින්හට බණ්ඩාර නාමය නොව අප්පුහාමි නාමය හිමි බැව් රාජසිංහ වණ්නා කාව්‍යය කියවීමෙන් දැනගත හැක.

අළුදෙණියේ කිවිඳුගේ "රාජසිංහ වණ්ණාවෙන්" පද්‍ය කිපයක් මෙසේයි.

## රාජසිංහ වණ්ණාව.

සාලේගොඩ,

12 සාලේගොඩ උතු මි
මහ මැතිඳු සඳ එතර මි
උනඹුවෙ මින ර මි
තෙන්නකෝන් මහ මැතිඳු පැරකු මි

---

"A The Title Mudali or even mudaliyar is used by the Kaikkilaiyan and some other castte."

(Tinnavelly Gazetteer of Madura. 1917, By, H. R. Pate. Chp: iii, P: 138, Foot Note)

මුදලි නොහොත් මුදලියර් නම රෙදි වියන්නන්ට සහ තවත් සමහර කුලවල අයින්ටද ව්‍යවහාර කරති

(මදුරාසි තින්නවෙලි ගැසටියර් 1917 iii වන පරි: පිටුව 138, අධෝලිපි, එච්. ආර්. පේට්)

වලගම,

14 වලගම හිමි ම තා
† චන්‍ද්‍ර සේකර මැති තා
වල්ල ගම් සොබ තා
විජය හෝන් මැති විජය තා

මොලගොඩ සහ අළුවිහාරේ,

15 එහිමි අළු වෙහෙ ර
මුදලිඳු වනිග සේක ර
ලත් ජය සිරිති තො ර
උතුම් මොලගොඩ මහ මැති සු ර

කුරුවිට සහ මාතර,

16 වෙනු මෙත් විකුම් ඇ ති
පවර කුරුවිට මහ මැ ති
වෙර සිත් මෙත් බලැ ති
මහත් A මාතොට මන්ත්‍රි අදි ප ති

කුරුප්පු චින්න,

17 ජයසිරි තිනිද රැ දු
මහත් ? සෙනරත් මුදලි දු
කල රුප්පු රණ පුර දු
o උතුම් එ කුරුප්පු මහ මැති ස දු

---

* මේ උනම්බුවේ තෙන්නකෝන් මහ මන්ත්‍රි වනාහි සෙනරත් රජ කාලයේ (ක්‍රි: ව: 1604/34) සිටියෙකි. මීට අවුරුදු 72 ට පසු නරේන්ද්‍ර සිංහ රජුට දාව යකඩ දෝලියගෙන් උපන් උනම්බුවේ නැමැත්තා වූකලී ඉහත සඳහන් උනම්බුවේ තෙන්නකෝන් පරපුර හා ඥාති සම්බන්ධයක් නැතිලු.

18 මෙමැති සෙත් පිරි ව ර
කුරු මැද සුපුත් සඳ සු ර
සෙතරත් නාර පව ර
සොඳින් රජ කරණ සඳ එනුව ර

---

† කුරුකුල චරිතයේ පළමුවන කාණ්ඩයේ 170 වන පිටුවේ මොහුට චන්ද්‍රසේකර මුදලි මන්ත්‍රී යයි ලියා තිබේ.

"මීගමුවේ වෙළඳ මහ මන්ත්‍රීත්" යයි රාජසිංහ රජුගේ ඇමැතිවරු ඔහුට ඇමතූහ. (169 පිටුව. කුරුකුල චරිතය පළවෙනි කාණ්ඩය.)

සලුප්පර් - ලෝම රෙදි විකුණන වෙළඳ වංශය. ඔවුහු කුරු කුලයට අයත් වූවෝ වෙති.

(කාසිචෙට්ටි ගැසටියර්, 233 පිටුව. ක්‍රි: ව: 1834. මුද්‍රණය, කටුහෙඩි-පොත් හල, නො. 6 / J. 3)

A මාතොට හෙවත් මාතර යනු, මහ කරාව යන තේරුමලු.

(ශුද්‍රනීණීය දපීණය)

A මහත් මාතොට මන්ත්‍රි අදිපති - අන්තෝනියෝ බැරැන්තෝ උවේ කුමාරයා. උවේ යුව රජ, උඩරට රාජධානියේ යුව රජ (ක්‍රි: ව: ) කුරුවිට මහ මන්ත්‍රි, මාතර මහ මන්ත්‍රි යනාදි පත්වීම් එකවර ලබා සිටි කරාවේ කුමරු.

o මෙම මීගමුවේ කරාවේ කුරුප්පු මුදියන්සේට කුරුණෑගල අසල කුරුප්පුවත්ත නින්ද ගම් කොට රාජසිංහ රජු විසින් දුන් බව කියති. එහි වැසි කෞරවයෝ මේ දක්වා සිටිති.

? කුරුකුල චරිතයේ 1 වන කාණ්ඩයේ 170, 173, පිටුවල සඳහන් සෙතරත් මුදියන්සේට මීගමුවේ වෙළඳ මහ මන්ත්‍රි යයි රාජසිංහ රජුගේ උඩරට මන්ත්‍රි මංඩලය විසින් බැවහර කරණ ලදී. මොහුද කුරුකුලයෙකි.

19 සෙනග ප්‍රනි කා ලේ
උදක් තල බැඳ ලී ලේ
කොළඹටම ආ ලේ
වංඩ සමගින්නි කෝ ලේ

20 සිදු දියෙ තොයෙ කු ත්
අය සහ කරමිනු සවු ත්
මහත් බල විසුරෙ ත්
‡ සමග සීමන් කුරේ සිරිම ත්

21 යුදට සිතු අ රයා
කල සෙනග ගෙන ත රයා
කල වික්‍රමැති රයා
ගතිමු උඩවර මෙගිය ව රයා

22 කියා වාසී සො ද
ගොසින් බල සෙන් සොටු බැඳ ද
බොසෙ කරමින් යු ද
ඇම්ද සිර අල්ලවා රට මැ ද

23 මිහි දිගත කෝවි ල්
සහ පත්නි මාළිගාව ල්
දළදා ගෙය විපු ල්
සමග වතසා ගසා ගිනිදු ල්

24 අඹ දඹ පතා තු රු
පුහ තාලිය පොල් තු රු
කපා සෙද තොව ස රු
පැ පැ බුජබල වික්‍රම් බව යු රු

---

‡ සීමන් කුරේ රාළ නොහොත් සීමන් කොරයා පට්ටිත්කට්ටි, මොහු කෞරව වංශයේ කෙනෙකි. විමලධම් සූරිය රජුගේ පක්‍ෂය ගෙන සිටි මොහු ඉදිරිමත සූරිය සහ තවරත්න යන ගරු නම්ද බොහෝ වර ප්‍රසාදද ලැබුවෙකි.

25 එළු ගව මි හර ක්
මරා මස් බුදිමින් තෙ ක්
රකුසන් වත් තැත ක්
ලෙසට වැදකර නොයෙක් සිතුව ක්

26 සෙබලත් සහ ලත ර
හැඩි දෙමළ සෙන් පුව ත ර
ගොඩ බැස මින් තොං හැ ර
නැසූ විලසින් පෙර අනුර පු ර

27 එරුපු කර ගැට්ටු ව
නිල ලතඹරුව ඔට්ටු ව
සුදෙහි එද නොට්ටු ව
විසුම් නොහැකි වනු වාර කි ව

28 ලක හිමි රජ වලි ත්
රන් රුවන් සළු බරණ ත්
දූසි දසන් හසුනු ත්
සමග ගෙන තත් මුදල් පෙට්ටි ත්

29 සෙනවිරත් ඒ ර ද
තෙද පිත් සිරිති බව සෙ ද
දනැත සෙන් පැහැ ද
එසේ වැදි පත්තුවට වැඩි ස ද

94 කුමර කෙළියෙහි තු රු
පිරිවැරු කරුණා යු රු
අප්පු සාමි ව රූ
සමග නාසිදෙ සාමි වරූ ග රූ

139 විජයසේකර න මි
අප්පු සාමි මනර මි
යුදට වැද තෙද විකු මි
වීකුම් බල පෙන්වමින් අබිර මි

142 සාලේ ගොඩ පසි ඳු
අජ්පු සාමි සිරි රැ ඳු
ලංස ගෙන වියරු ඳු
කියා වාසී ගොසින් රන සි ඳු

147 අබයකෝන් මැනිඳු ල
සහ ජාත වික්‍රමෙන් සි ට
අජ්පු සාමි තු ට
කියා වහසි තෙපුල් යුදය ට

කඳුරෙගම,

149 කඳුරෙගි මිණි ස ක
මුදලිඳුම සහ ජංඝා ක
අජ්පු සාමි තොසැ ක
සසුං රකිනා ලෙසින් තොවල ක

151 වංඩගෙයි මැතිඳු ට
තදන සිරිලක් මැඳිඳු ට
අජ්පු සාමි තෙසා සි ට
වැදී සංග්‍රාමයට එම පි ට

මොල දණ්ඩ,

153 යටිනුවරින් සපි රැ
මොලදණ්ඩ නම් ගම යු රැ
අජ්පු සාමි ග රැ
යුදට මිග බස් කියා රැඳු රැ

ගෝනුහුගම,

155 පවර ගෝනුහු ග ම
අජ්පු සාමි නම් තු ම
වැදී රුපු මැදෙහි ම
කොටූ රග සැලවි ලෝ සැ ම

# පොත්සේකං පරපුරවල්

†1. ගම්පලගේ පොත්සේකා,
2. ගම්පල වඩුගේ පොත්සේකා,
3. ගම මංලගේ පොත්සේකා,
4. ගාර්දියවසත් හේවා පොත්සේකාගේ පොත්සේකා,
5. ගාල්ලගේ පොත්සේකා,
6. හේවා පොත්සේකාගේ පොත්සේකා,
7. හේවා පතිරණගේ පොත්සේකා,
8. සේනාධිරගේ පොත්සේකා,
9. සෙල්ලප්පෙරලගේ පොත්සේකා,
10. පස්කුල් පොත්සේකලාගේ පොත්සේකා,
11. පොඩිමරක්කලගේ පොත්සේකා,
12. කලුතර වෙදගෙ පොත්සේකා,
13. වණීගේ පොත්සේකා,
14. මෙරෙසඳ්ඤගේ පොත්සේකා,
15. ජයරාජ ජයවණී ගමපාලනගේ (ගම්පලගෙ)

† මේලකුණෙන් හඳුන්වනු ලබන කෞරව වංශිකයන් වන ගම්පලගේ පොත්සේකා වරුන්ගේ ඉතිහාසය මීට අවුරුදු 400 කට වැඩිය පැරණි බවත් පාතදුරේ විසූ කීර්තිශෙෂ භාවොපගත පණ්ඩිත ඩී. ඇම්. සිල්වා ශ්‍රී විජය කවිරාජ තුමා විසින් ඒ සම්බන්ධ ඓතිහාසික ප්‍රවෘත්ති ඇතුලත් ඉතා වටිනා වැදගත් ලියවිලි බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් කීර්තිමත් ද සොයිසා පවුලට අයත් ශ්‍රීමත් විල්ප්‍රඩ් ද සොයිසා නයිට් තුමානන්ගේ විශෙෂ ඉල්ලීම පරිදි පිටපත් කරගෙණ ආ බවත් දැනට එම ලියවිලි සියල්ලක්ම බස්නාහිර පලාතේ මහදිසාපති ධුරය උසුලන වී. ඇස්. ඇම්. ද මැල් මහතා ළඟ ඉතා සුරක්ෂිතව තිබෙන බවත් අපට දැනගන්ට ලැබී තිබේ. මේ හැර ජයශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවාගෙන ආ දඹදිව ඒප චක්‍රවර්ති ධර්මාශෝක මහරජාණන්ගේ දියණිය වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේ සමග ලංකාවට පැමිණි දස අට කුලයෙහි ජනයා අතුරෙන් "ගම්පාලනගෙ"

තමින් හැඳින්වෙන එක් කුලයක් ද විය මේ ගම්පාලනගේ පරපුරෙහි අය සිංහල රාජ්‍ය කාලයෙහි "රටේ රාල" "ගමේ-රාල" "ගමරාල" ආදී එවකට තිබුන උසස් තනතුරුද රාජ සම්මාන වශයෙන් ලබාගෙන තිබේ.

පසුව සිංහල රාජ්‍යය පරසතුරු උවදුරුවලින් පීඩා විඳින අවදියෙහි පෘතුගීසි, ඕලන්ද, ආණ්ඩු කාලයෙහි එම ආණ්ඩුවලට විරුඬව සිංහල ආණ්ඩුවට පක්ෂපාතී අයවලුන් හැටියට මොවුන් පෘතුගීසි, ඕලන්ද ආණ්ඩුවල උසස් නිලධාරීන් විසින් අඳුනාගෙන තිබුන බැවින් ඒ ගැන පරසතුරු කරදරවලින් මිදෙන්ට කල්පනා කල ඔව්හු ගම්පාලනගේ වෙනුවට ගම්පලගේද, පොන්සේකා කියාද, සමහරුන් ගම්පලගේ පොන්සේකා කියාද භාවිතා කළ බව පෙණේ.

තවද පසුකාලයෙහි ගම්පලගේද පොන්සේකා වරුන් ගෙන් සමහරු ද පොන්සේකායන නමේ අගට "ද පොන්සේකා ජයසූරිය" "ද පොන්සේකා වණ්දීපත්‍ය ජයසූරිය" "ද පොන්සේකා අභය කරුණාරත්න" "ද පොන්සේකා සමරසේකර" "ද පොන්සේකා දිසානායක" යනුවෙන් ලියන්ට පටන්ගත්හ. එසින් බොහොමයක් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ඔවුන්ගේ මුතුන්මිත්තන්ට මුදලි, මුහන්දිරම් ආදී නම්බුනාමයන් සමග ලැබුන රාජකීය ගෞරව උපාධි නාමයන් බැව් පිළිගැණීමට සාක්ෂි එමට තිබේ.

---

(පොන්සේකා අභිනන්දන පිටු 1, 2.)

(කුරුකුල චරිතයේ පළමුවෙනි කාණ්ඩයේ "263" පිටේ "කළුතර වණ්කුලසූරිය" "ආදිත්‍ය රාජ" පොන්සේකා සේනාපති කරාවේ යුවරජු ගැන විස්තර ලියා තිබේ.)

# ශ්‍රීමත් සාර් හැන්රි ලෝසන් ද මැල්

## සී. බී, ජ. මැතිතුමා.

මෙතුමාට්ටිකලි ලක්වැසි ජනතාවගේ අසහාය කල්‍යාණ මිත්‍රයෙක් වූද, ධනවත් සිටුවරයෙක් වූද, කාලයාන්‍රාකල ලක්ෂපති මහ විදුනරාලලාගේ ජේකබ් ද මැල් මහතාණන්ගේ අභිජාත පුත්‍රරත්නයකි.

රාජකීය විද්‍යාලයක්හි උසස් ඉගනීම් ලැබ වර්ෂ 1899 දී මෙතුමා සුප්‍රිම්උසාවියේ නීතිඥ වරයෙක්ව එහි කටයුතු ඉතා දක්ෂ අන්දමට ඉටුකරමින් සිට එය ප්‍රතික්ෂෙප කොට මහජන හිතෙෂියෙක්ව අමෙරිකා, එංගලන්ත, ජර්මණිය, ප්‍රංශය, ආදි විදේශිය රටවල් සමග වාණිජ ව්‍යාපාරයෙහි යෙදී වණික් කර්ම පිළිබඳ විශාරද දැනුමක් ඇතිකරගැනීමෙන් මුලු ලක්දිවෙහිම එහි ප්‍රමුඛස්ථානය උසුලන ලදි.

ලක්දිව වෙළඳ කටයුතු දියුණුව සඳහා තිස්වර්ෂයකට අධික කාලයක්ම අනෙක පරිශ්‍රම දරා වර්ෂ 1916 දී පම්ණ පහතරට වැවිලිකරුවන්ගේ අභිවෘධිය සලකා “පහතරට වැවිලි කාරු සංගමය” ආරම්භ කොට එහි සභාපති ධුරය හා එම සමිතිය වෙනුවෙන් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රි ධුරයක්ද උසුලමින් ගොවි කර්මාන්තය දියුණුවට කටයුතු කරණ ලදී.

සිරිලක තනි පුද්ගලයෙකු වශයෙන් සියළුදෙනාටම වැඩි කම්කරු පිරිසකට මෙතුමාගෙන් රක්ෂාව ලැබී තිබෙන බව විශෙෂයෙන් සැලකිය යුතු කරුණකි.

හිරියාලේ හත්පත්තුවේ වාසීන් විසින් නිරන්තර ප්‍රශංසාමුඛයෙන් කථාකරණ සවකීය මව් පියන් සිහිවීම් වශයෙන්ද, යථොක්ත පලාතට දක්වන ගෞරවාදරයක් වශයෙන්ද මෙතුමාතන් විසින් ඒ පලාත්වාසීන්ගේ ප්‍රයෝජනය පිණිස හිරියාලේ සිට දඹුල්ලට යන පාරේ දහසය සැතපුම් කනුව සමීපයේ “මැල්හිරිපුර” නමින් සකලාංග සම්පූර්ණ නගරයක් ඉදි කරණ ලදී.

ලක්දිවට පැමිණි උතුමන් වහන්සේලා අතුරෙන් ඉතාම අපක්ෂපාතිවාදී ආණ්ඩුකාරයෙකු හැටියට මහජනය විසින් පිළිගනු ලැබූ ශ්‍රීමත් සෑර් ජෝන් ඇන්ඩර්සන් උතුමානෝ, ද මැල් සිරිමතාණන් ගැන කථා කරමින් මෙසේ ප්‍රකාශ කර තිබේ. "නොයෙක් අවස්ථාවලදී ආණ්ඩුවට මූණපාන්ට සිදුවූ ගැටලු ප්‍රශ්න විසඳීමේදී මේ මහතාණන්ගෙන් ලැබුනු ආධාර අප්‍රමාණ වේ." වර්‍ෂ 1915 දී පැමිණි අධිකාර කාලයේදී එය ඉතාමත් පැහැදිලිව ඔප්පුවේ යනුයි. නොයෙක් ප්‍රස්තාවලදී ආණ්ඩුව ඉදිරිපිට මහජනයාගේ ශුභසිද්ධියට අදහස් ප්‍රකාශ කොට යථෝක්ත අදහස් ක්‍රියාවෙහි යොදවමින් අගනා මෙහෙයක් සිදුකර තිබේ. අප රටේ පොදු දියුණුවට ලක්දිව ජන නායකයන් තුල විද්‍යමාන වියයුතු ඉතාමත් වැදගත් අංගයක් නම් අන්‍යයන්ගේ අභිප්‍රායේම නොගොස් ස්වකීය රටවැසියන්ගේ දියුණුවට කලින් කල කලයුතු අමුතු දේ ඉදිරිපත් කිරීමේ ක්‍රියා ශූරත්වයයි. අප ජන නායකයන් අතරේ මේ අංග ඇති අය ඉතා ස්වල්ප දෙනෙකි.

ද මැල් මහතාණන් ඒ ස්වල්ප දෙනා අතුරෙන් ප්‍රථම ස්ථානයේ තබන්ට හැකිබව ඒ මහතාණන් විසින් පසුගිය නිස්වර්‍ෂය තුල කරණ ලද නා නා කටයුතුවලින් පෙනී යයි. ගතවූ සිව් වර්‍ෂය තුල පුත්තලම් පලාත වෙනුවෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහි මන්ත්‍රී වරයෙකු වශයෙන් සේවය කරමින් කරණ ලද මහජනානුග්‍රහයද ඉතා විශාලය.

මෙසේ රාජකීය ශාස්ත්‍ර ශාලාවෙන් අස්වූ දා පටන් අද වනතුරුත් (මැරෙණ තුරුත්) පුද්ගලික වශයෙන්ද, සමිති සමාගම් මාර්‍ගයෙන්ද අවඞක ලෙසත් දක්‍ෂ ලෙසත් රටට සහ ජාතියටත් අගනා මෙහෙයක් ඉටුකර තිබෙන මෙතුමා ආණ්ඩුවේද විශෙෂ ගෞරවයට භාජනව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ සේනාපති ධූරයක් සහ මුලු ලක්දිවටම සමාදාන ධූරයක් ඉසුළුවේය.

තෛකශ්‍රීන් විරාජමානවූ බැල්ජියම් මහ රජතුමන් විසින් "ෂැවලියර්" නැමැති සිටු තනතුරු ගරු නාම සම්මුතියක්ද ප්‍රදානය කිරීමෙන් රාජ ගෞරවයද ලබන ලදී.

සැරද රජ මැතිවර – සිරිමත් එච්. ඇල්. ද මැල්,
යස රැස දසදෙසෙහි නිති – විහිදු සරද සඳසේ.

| | | |
|---|---|---|
| සා ග ර | යුරු මහත් දන ඇති මුත් | ඒ සා |
| නැ අ ර | තරඟ නැග නැඟ එන පුහු | ගෝසා |
| එ ස ර | සැපැත් රට දූය වැඩ ගැන | ආ සා |
| පා නි ර | කුරුව සොඳවන මැතිඳුනි, | තෝසා |
| | | |
| ලැ බ ග ත් | ගරු නාම දිනු රජ ආද | ර ය |
| ඔ බ නි ත් | යස රැසිනි සුදිලෙන සේක | ර ය |
| ප බ ව ත් | මහරු ගුණ මිණි පිරි ආක | ර ය |
| ශොබ ව ත් | දුටත් දන සිතු ඔබ රූ ස | ර ය |
| | | |
| පිංසර සව්සිරින් යසසින් ඔදු | | වැ ඩි ය |
| ගංබිර සිහ රදෙකු වන් විකුමෙන් | | එ ඩි ය |
| සිංහල වීරයාණෙනි දූ පෙම් | | වැ ඩි ය |
| සිංහල ගගනතේ ඔබ ලෙලදෙන | | කොඩි ය |
| | | |
| නැ ණ සි ත් | පසිඳු මැතිඳුනි; පරහිත | කා මී |
| ස තො සි ත් | සිරිසම්ගවුන් සරසවි | පේ මී |
| ප හ සි ත් | තුටු කරන කියමිනි මගෙ | සා මී |
| කෙලෙසිත් | මෙමම ඔබ ගුණ ගැන ගෙන | පා මී |
| | | |
| ස ම් ගි න | සිරිවම්ය අවුදින් සර | සු ර ඹ |
| ග රු ව න | මැනී නමිනි සලමින් මිණි | ස ල ඹ |
| පු ද දෙ න | පිණිස දුන් මේ කව් මල් | ක ල ඹ |
| "සි හ සු න | සහර" සහ පිළිගන්වමූ | එ ළ ඹ |

(සිහසුන සහරාව.)

‡ ක්‍රි:ව: 1198 දී ශ්‍රී නිශ්ශංක මල්ල රජු දවස පොලොත් තරුවේ විසූ කඳවුරු දෙශිලක් විජය සිංකිත් සෙනෙවියක් පුත් කිත්පොලොත්තරු ලක් විජයසිං සෙනෙවි සහ කිවි-යත්ගේ පරම්පරාවෙන් පැවත විත් පරංගි යුගයේදී රෝමානු කතෝලිකාගම වැළඳගෙන ද මැල්ලෝ (ද මැල් යන නාම-යෙන් පැවතෙන මෙම සර් හැත්රි ලෝසන් ද මැල් මහතා වනාහි කුරුකුල කුමාරයෙකි.

---

‡ ශ්‍රී ලක් විජය සිංකිත් වර්‍ණමාන සපරමාදු නානා-යක්කාර දිශානායක ලක්‍ෂපති මහ විදානේ මුහන්දිරම් රාලලාගේ ජෝශප් ද මැල්.

මේතෙම වනාහි ලක්‍ෂපති මහා විදාන මුහන්දිරම් රාල-හාමිගේ පුත්‍රයෙක් වූද, ප්‍රතිකාල් කැප්ටන් ජනරාල් සහ ආණ්ඩුකාර ධුරන්ධර දියාගු ද මැල්ලෝ තුමාගේ ඥාති දරු-වෙක් වූද, ප්‍රතිකාල් ජාතික ගෞ: බර්තාර්දු පියතුමා අතින් වර්‍ෂ 1637 ක්වූ මැයි මස 25 වෙනි දින ප්‍රසාද ස්නානය ලබා ගෙන මෙම පරම්පරාවෙන් පලමුව රෝමානු කතෝලිකාගම වැළඳගත්තාවූද, බර්නාඬු ද මැල් ගෙන් පැවතෙන්නෙකි. කෝකිල සන්දේශයේ සඳහන් "ලක්‍ෂපතිය නම් පොල්උයන" වර්‍ෂ 1187 දී නිශ්ශඞ්ක මල්ල රජතුමා විසින් ශ්‍රී ලක් විජය සිංකිත් හෙවත් ලක්‍ෂපති තුමාට ප්‍රදානය කරණ ලද ගම්වරයෙකි" දැනට ලක්‍ෂපතිය, රාවතා වත්ත, ඉඩම, උයන, අගුලාන, රත්මලාන සහ කල්දේමුල්ලත් යයි කියනු ලබන මුළු ප්‍රදේශයටම එකල ලක්‍ෂපතිය යන නාමය යෙදුනේ මේ සේනාපති තුමාගේ නාමය අනුවයි"

(මොරටුවේ මිතුරු සමාගමේ ක්‍රි: ව: 1857/1957. සාංවත්සරිකානුස්මරණය සඟරාව 42 පිටුව.)

ඉහත සඳහන් පෙලපතට අයත් ශිලා ලිපිය කුරුකුල චරිතයේ 337 වෙනි පිටුවේ ලියා ඇත.

කොළඹ පියදාස සිරිසේන මහතා විසින් ලියා ප්‍රසිද්ධ කරණ ලද "ලංකාමාතා" නැමැති ප්‍රබන්ධ කථා පොතේ ද මැල් පරම්පරාවේ තුන්වෙනි මුත්තනුවන් වනාහි උඩරට ගොවි කුලයේ කෙනෙකු වශයෙන් හැඟවීමට බෙහෙවින් වෙහෙස දරා මැල් සහ ජයසේකර නමින් දෙබසක් ලියා තිබේ.

ද මැල් පරපුරේ මුත්තනුවන් අන්‍ය කුලයක අයෙක් නොව කිත් පොලොන්නරු ලක්විජය සිඟු සෙනෙවි නැමැති කුරුරාජ වංශිකයෙකු බැව් මෙයින් දැනගත යුතුයි. නයිට් නාමය,

මෙසේ මහජන කටයුතුවල නියැලිව උන් මේ රාජ පාක්ෂික වීරයා කෙරෙහි ප්‍රසන්නවූ ආණ්ඩුව මගින් මෙතුමාට "නයිට්" යන ගරු නාමයෙන් ගෞරව කරණ ලදී. මෙතුමාගේ වත්තක උන් මූලාදෑනියෙකුට (මෙතුමාගේම) ඥාතියෙකු විසින් වෙඩි තබන ලදී සාහසිකයා තවත් සේවකයන්ට වෙඩි තැබීමේ අදහසින් තුවක්කුවද රැගෙන පලා යද්දී මෙතුමා අභීතව ලුහුබැඳ ගියේය. "අවාසනාවකී' අනුන් මුදාගැනීමේ වීර ක්‍රියාවේ යෙදුනු අප වීරයා සාහසිකයාගේ වෙඩි පහරට ගොදුරුවී වීරවරයෙකු වශයෙන් අවසන් හුස්ම හෙලුවේය,

ලක්දාස් ද මැල් බිෂොප් තුමා සහ කොළඹ නගරාධිපති ආර්. ඇස්. ඇ(ජ්. ද මැල් මැතිතුමාද මෙතුමාගේ පුත්‍රයෝ වෙති.

## A ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා දිසානායක සිටුතුමා.

සකල සිංහලීය මනු ගණයා අතුරෙන් පළමුකොට ඉංග්‍රීසි ආණ්ඩුවෙන් "නයිට්" යන ගරු නාමය ලැබූ ජනහිතකාමී කීර්තිමත් ප්‍රභූ මන්ත්‍රි ශ්‍රෙෂ්ඨවරයා නම් ක්‍රි.ව: 1890 ක්වූ

සැප්තැම්බර් මස 29 වෙනි සඳු දින දිවංගතවූ ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා ධර්ම ගුණවර්ධන විපුල ජයසූරිය කරුණා-රත්න දිසානායක කෞරව ශේඛර නම් කුරුවංශික සිටු තුමා -යයි කීම කවුරුත් එකහෙලා පිළිගනු ලබන සත්‍යයකි.

සෙවරි සිංහලයෙකු වශයෙන් ආගමක් ජාතියක් නිකායක් තරාතිරමක් නොතකා පූර්වාපර දෙශවාසී පොදු ජනතාවගේ ශුභසිඩිය සඳහා කලාවූ වර්ණනා විෂයාතික්‍රාන්ත කාර්ය්‍ය රාශිය නිමිත්ත කොට ගෙනම ප්‍රදානය කල "නයිට්" නාමය මේ බැව් කියමු.

මේ පිළිබඳව වර්ෂ 1891 අගෝස්තු මස 14 වෙනි දින සරසවි සඳරුස පත්‍රයේ පලවූ වාක්‍යයේ කොටසක් මෙසේය.

‡ "සොයිසා මහතානන්ගේ නෝනාමහත්මයාට" "නයිට්" යන නාමය දරන්නෙකුගේ භාර්‍ය්‍යාවට කලයුතු ගෞරවයද "ලේඩි" යන නාමයද දෙමින් (වික්ටෝරියා) මහා රාඥිය විසින් සම්භාවනාකල බව පෙනේ. මෙයින් සොයිසා මහතාණන් ජීවමානව එහි ප්‍රිති රසාස්වාදනය නොකලත් "නයිට්" යන ගෞරව නාමය ඒ මහතාට ලැබුනු බව පෙනේ.

---

A මහා ධන පරිත්‍යාගය,

ලංකාවේ ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා සිංහල සිටු තුමා ශාස්ත්‍ර ශාලාදි නොයෙක් දේවලට පරිත්‍යාග කරණ ලද මුදල, රුපියල් 2638123/67.

පොහොසත්කු,

ලංකාවේ ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා සිටුතුමා රත්රන් පවුන්ඩ 4000000.

(කවි කල්ප තරුව 1909 අප්‍රේල්)

තවත් සිංහල මිනිසුන් (ලාංකිකයන්) අතරෙන් පළමු කොටම "නයිට්" නාමය ලබන ලද්දේ මොරටුවේ විසූ ඵකුරාඵදේව ආදිත්‍ය ශ්‍රීදමූලගේ ජුසේද සිල්වා කුරු චන්ද්‍රසූරිය තුමා විසිනි, මෙතුමා වනාහි පූර්වෝක්ත ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා සිටු තුමාගේ මයිලණුවෝය. එනම් "ලේඩි" ද සොයිසා මහ ආයතීාවගේ * පියාණෝය.

මෙතුමාගේ "නයිට්" නාමය ආණ්ඩුවෙන් ලබන ලද්දක් නොව ඉතාලි රාජ්‍යයේ රෝම නුවර ශුඩවූ දහතුන් වෙනි ලියෝ පාප් වහන්සේගෙන් දෙවා වදාරණ ලද්දකි.

මෙසේ එතුමානන් විසින් එය දෙවා වදාරණ ලද්දේ ක්‍රි: ව: 1888 මාර්තු මස 20 වෙනි දින දීය. මීට පෙර පාප්වහන්සේගෙන්වත්, ඉංග්‍රීසි ආණ්ඩුවෙන්වත් "නයිට්" යන ගරුකටයුතු සිටු පදවිය කිසිම සිංහලයෙකු විසින් නොලබන ලදී.

(කවිකල්ප තරුව.)

අප ශ්‍රීමත් පස්වෙනි ජෝර්ජ් අගරජතුමා කුමාර අවස්ථාවේදී (ක්‍රි: ව: 1901) ලඞකාවට සම්ප්‍රාප්තවූ ගමන සම්බන්ධව "හනුමා" විසින් රචනා කරණ ලදුව වර්‍ෂ 1901 අප්‍රේල් මස 21 වෙනි දින (කොළඹ ජී. දොන් පැලිස් අප්පුහාමි මහතාගේ) කවට කතික පත්‍රයේ පලකර තිබෙන 'කුමාරෝදය වර්‍ණනාව' නම් කාව්‍යයෙහි මෙසේ ලියා තිබේ.

---

‡ සොමොච සාධු කුරු රාජ කුලම්බරඨො
සම්භාතු සී, ද, සොයිසාබ්‍ය සුමනානිසෙඨො
(සරසවි සඳරැස පත්‍රය, 7 - 2 - 1894)

කිත් රැස දෙස දෙසේ සුපතල කළ ලොව ගේ
පත් වෙන දනන් සැනසූ කප් තුරක ර ගේ
උත් තම සොයිස පරපුර සිහි කරණ අ ගේ
සිත් කලු තෙරළු චතුපෙළ හාරගම ල ගේ

(බෞඩ සත්දෙශය.)

ත සි ව් කමේ උරුම තරුම ඇත්තේ ශොව්සා පවුල ව
ර සි ව් කෙනෙක් නැත බැලුවම ඒපවුලට සමවෙන්න ව
ත සී ව් කමක් දෙන්ට වටී එම පවුලේ ලොකු පුතා ව
ත සී ව් වෙලාවකවත් ඔහු ආවේනැත මට පෙනෙන් ව

කු මා රසිත් සමග අපේ මහ මුදළිඳු ගියෙ රිගෙ නැග
වි මා තයේ ඇල්බට් නම් හවුස් කියන දෙරටුව ල හ
ප මා කලා මල්පොකුරක් දුන්තලු කුමරිට සිරි අ ග
එ මා කාර සැලකිමක් කරලා නැත වෙත ගිය ම ග

(කවට කතිකයා පත්‍රය.)

---

* (ජයවර්‍ධන කුලසූරිය පෙළපතට අයත් එකනාරාජ්‍ය දෙවාදිත්‍ය ගාර්දියවසම් ලිඳමුලගෙ ජුසේ ද සිල්වා) චෙවලියර් තුමා ශුඬවු මහා ග්‍රිගෝරි පඬකාතියේ පළමුවන සිංහල ශිෂ්‍යවරයා "ශුඬවූ රෝම සභාවේ වටිනා ධර්මාභිසමයෙක් කොටහේනේ සාන්ත ලූසියා ආසන දේවමන්දිරයේ සහ මොරටුවේ සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේත් ප්‍රසෙන්ති මුහුප්පු මොහු මොරටුවේ දේවස්ථානය ස්ථාපිත කිරීම සඳහා රුපියල් හතලිස් දහසක් පමණ ත්‍යාග කිරීමෙත්ද, මොරටුවේ කතෝලික පාඨශාලාවලට මුදල් දීමෙත්ද, උදව්කර තිබේ." කැතරින් ද සොයිසා අංගසීාවගේ පියාය.

හතරවන විජයබාහු රජු සේවයේ සිටියාවූද, මිත්තා නම් රාජද්‍රෝහියා මැරුවාවූද, (වර්‍ෂ 1259) ආයසීක්‍ෂත්‍රිය එකාර නම් සේනාධිපති තුමා මෙම පෙළපතේ මිතුන් මිත්තෙකි. රජයේ ආදායම්පාලක නිලයක් දැරූ අජිවදේව, එකාරගේ මුනුපුරෙකි.

(සීමාසහිත මොරටුවේ මිතුරු සමාගම, 1851 - 1951 පිටුව 45)

## කැතරින් ද සොයිසා ආර්යාව.

◦ කුරුකුල එතුර අජිවදෙව ආදිත්‍ය කැතරින් ද සිල්වා කුමරිය කල්ප ලතාවක්.

ස්වාමියා අනුගමනය කරමින් සාධු චරිතයක් ගතකළ ද සොයිසා මැතිණිය මිහිබට කප්ලියක් සේ දිළිත්දන් කෙරෙහි කරුණාවෙන් පොදු වැඩ සැලැස්වූවාය. ඇගේ වැඩිමහල් පුත් A ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා මැතිතුමාද, මැණියන්ගේ සත් ව්‍යාපාරයන්ට අනුමැතිය හා අනුබලයත් දුන්නේය.

ක්ෂුද්‍රපාණී පරීක්ෂණාගාරය,

චාර්ල්ස් හැන්රි ද සොයිසා සමාදාන විනිශ්චයකාර තුමා උමතු බලු විෂ කාරණකොට ගෙන මිය ගිය හෙයින්ද එවකට උමතු බලු විෂට පිළියම් කාරණ ආණ්ඩුවේ ආරෝග්‍ය ශාලාවක් නොතිබුනු හෙයින්ද, ඒ පාඩුව පිරිමසාලනු වස් ක්ෂුද්‍රජීව පරීක්ෂණාගාරය පිහිටුවන ලදී.

---

◦ පරම කෞරව රාජ වංශොද්භූත පරාර්ථකාමී සොයිසා ආර්යාවුන් වහන්සේ.

(දිනපතා ප්‍රවෘත්ති පත්‍රය, 6. 6. 1895)

A ගෞරවාර්හ වැලිගම ශ්‍රී සුමංගල නායක ස්ථවිරපාදයන් වහන්සේගෙ ආදාහනය වෙනුවෙන්, කීර්තිමත් සොයිසා පවුලේ දැනට ප්‍රධානියා වන ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා ලංකාද්වීපයේ සමාදාන විනිශ්චයකාර මුදලි මන්ත්‍රීශ්වරයානන් විසින් සඳුන් දර ටොන් එකක්, එව්වේය.

(වැලිගම ශ්‍රී සුමංගල ස්ථවිර චරිතය ක්‍රි: ව: 1906.)

නයනාරෝග්‍යශාලාව,

නෙත්‍ර රෝගයෙන් පෙළෙන දහසක් දෙනාගේ ප්‍රයෝජනය සඳහා, ද සොයිසා මහතුන්ගේ ධනව්‍යයෙන් පිහිටුවන ලද වික්ටෝරියා නයනාරෝග්‍යශාලාව කොළඹ මහාරෝග්‍යශාලාවේ විශෙෂ අංශයකි. මේ ආයතනයෙන් දිනපතා සිය ගණන් රෝගීහු පිළිසම් ලබති.

ලුනාවේ ආරෝග්‍යශාලාව.

විශෙෂයෙන් මොරටු නගරවාසීන්ගේ හා සාමාන්‍යයෙන් අවට ගම්වාසීන්ගේත් ප්‍රයෝජනය සඳහා පිහිටුවූ මොරටු ආරොග්‍යශාලාව සිය ගණන් රෝගීන්ගෙන් පිරී තිබේ. මොරටු පළාතේ දිළිත්දන්ට මේ ආරොග්‍යශාලාව නොමැතිනම් බලවත් කරදරයකට මූණපාන්ට සිදුවේ.

---

A ජේරෝනිස් ද සොයිසා (මාතික්කුදෙව) නල්ලූර් වරුෂ විපුල සන්නධ (වරුෂ හැන්නැදිගෙ) ජේරෝනිස් ද සොයිසා ධර්මගුණවර්ධන විපුල ජයසූරිය කාරුණාරත්න දිශානායක) රාජවංසල මුදළිඳු ශ්‍රෙෂ්ඨ පරාර්ථකාමි පවුලක ප්‍රමුඛ භවතෙකි. දුගී, මගී, යාචකාදී අසරණයන්ට සරණයක් වීම සම්බන්ධයෙන් මොහු සවකීය පිය මිව් දෙපාශීවයේ මුතුන් මිත්තන් අනුගමනය කෙළේය.

මොහු පුත් චාර්ල්ස් හෙන්රි ද සොයිසා ගේ නාමය මෙරට වාසීන්ගේ සිත්වල සවිරලෙස සනිටුහන් වී තිබේ. ශුඞවූ එම්මානුවෙල් දේවස්ථානයේ ස්ථාපිත කර තිබෙන අනාථාධාර අරමුදල, දෙවනුව නම සඳහන් කළ භවතාගේ මුතුපුරෙක්වූ ගෞරවණීය හැරල්ඩ් ද සොයිසා පියතුමාට සහජයෙන්ම උරුමවී තිබෙන ජනහිතකාමී භාවය ප්‍රකාශ කරයි.

(සීමාසහිත මොරටුවේ මිතුරු සමාගම, 1851-1951)

## ද සොයිසා පවුල.

ජෝශප් ද සොයිසා, A ජ්‍රෝනිස් ද සොයිසා, සුසෙව්-ද සොයිසා, සි. එච්. ද සොයිසා ආදී ද සොයිසාමැති-වරුන්ගෙන් ලොවට සැලසුනු සෙත අපමණය. හගුරත් කෙත විහාරභූමිය දීම, හගුරත්කෙත දෙවස්ථානය හා පාසැල සෑදවීම, මාරාවිල ආරෝග්‍යශාලාව තැනවීම, මොරටුවේ අම්බලම, එම්මාතුවෙල් දෙවස්ථානය හා ආරෝග්‍ය ශාලාව කරවීම, පානදුරේ ආරෝග්‍යශාලාව, ද ශාන්ත ජොහන් පාසැල හා දෙවමන්දිරය පිහිටුවීම, ආදගී ගොවිපලට ඉඩම් දීම හා ද සොයිසා ආරාමය පිහිටුවීමත් මේ සත්කෘත්‍යයන් අතුරෙන් කොටසකි.

**ද සොයිසා චරිතය,**

සි දොන් බස්තියන් පඬිතුමා විසින් ලියන ලද ද සොයිසා චරිතය නම් පිටු දහසකින් යුත් විශාල ග්‍රන්ථයක් ඇත. එහි කතු තුමා විසින් ලියන ලද හැඳින්වීමෙහි මෙසේ සඳහන් වේ.

“ලක්වැසි ජනතාවට සුවසේ ගමනා ගමනය කරගැනීමට සහ නිරුපද්‍රව රථවාහනාදිය ගෙන යාමට බොහෝ මාවත් තනවා දීමෙන්ද, එගොඩ මෙගොඩ වීමට පාලම් හේදඬු තනවා දීමෙන්ද, ගිලණුන්ට ආරෝග්‍යශාලා තනවා දීමෙන්ද, ප්‍රසූතිකාවන්ට සූතිකාගාර තනවා දීමෙන්ද, මගීන්ට ආවාස තනවා දීමෙන්ද, නිවෙස් නැත්තවුන්ට නිවෙස් තනවා දීමෙන්ද, වන්දනාමානාදිය පිණිස බුද්ධස්ථාන සඳහා භූමිභාග දීමෙන්ද, ක්‍රිස්තියානීන්ට දෙව්මැදුරු තනවා දීමෙන්ද, විද්‍යාර්ථීන් සඳහා විද්‍යාලයන් තනවා දීමෙන්ද, මළවුන් සඳහා සුසානභූමි තනවා දීමෙන්ද, කුසගිනි නිවුම සඳහා ක්ෂෙත්‍රදානය කිරීමෙන්ද, වස්ත්‍ර සඳහා කපු වතු වලට ආධාර කිරීමෙන්ද, රෝගීන් සඳහා වෛද්‍යන් නියුක්ත කිරීමෙන්ද, ශාස්ත්‍ර සඳහා පොත පත සුලභ කරවීමෙන්ද,

යාචකයන් සඳහා දන්සැල් විවෘත කරවීමෙන්ද, සුචරිත සඳහා සංගම් ඇතිකිරීමෙන්ද, සාපිපාසා වැනසුම සඳහා ගහකොළ දීමෙන්ද, අසරණයන් සඳහා පින් වැටුප් පිහිටුවීමෙන්ද, නිර්ධනීන්ට බොහෝ ධනය දීමෙන්ද, කරකියා තිබෙන මහත් පුණ්‍ය කෘත්‍යයන් හැර ද සොයිසා මහතුන්ගේ මුත්තණු මිත්තණියන්ගේ කාලයේ පටන් මේ දක්වා ද සොයිසා මැතිවරු දිනපතා දිගාන්තය දක්වා ලෝකයාට දෙන දීමනා ගැන සතර අගතියෙන් දුරුව සිදුකළ ද සොයිසා පවුල අමරපුර ප්‍රවරයෙන් ඉඟිලී වීත් ලඞකාභූමි මණ්ඩලයේ රෝපණයවී තිබෙන කල්පවෘක්ෂ, කල්පලතා කදම්බය කොට නැණවත් පසට මෙංතවට වැටහී යනු නිසැකයි.

මේ තයිත් සිතානවිට ද සොයිසා පවුලෙන් සිදුවූ ලෝ-වැඩ නිසා මුළු ලක් වැසියෝම ද සොයිසා පවුලට තය -ගැතියෝය.

සම්භාවනීය ගෞරව නාමයක් † සී. එච් ද සොයිසා මැතිතුමාගේ භාග්‍යවත්වූ, කැතරින් ද සොයිසා මැතිණිය

---

† ඉංග්‍රීසීන් විසින් ජීවග්‍රාහයෙන් ගන්නා ලද ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට එනතුරු ලක්දිව රජය කල සියලුම රජදරු-වන් දෙකොටස් කළ කල, වැඩිපස සිරිලක ලෙංකා ශාසන-වය විනාශකයන් හැටියට ගැණේ. අඩු පසින් ලෙංකා ශාසන-වය වර්ධනයට හේතු අනන්ත කරුණු ඇතිවූ බව පෙණේ. නිසැකව ගැණියහැකි කාලයක් වන විජයකාල විජයරජුගේ පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලය දක්වාද, එතැන් පටන් අද මේ තත්පරය දක්වාද රාජ තේජසාදියෙන් විරහිත සාමාන්‍ය වැසියෙක්, මෙම ප්‍රකරණයෙන් පෙණෙන, කිසි පැකිලීමකට නොපැමිණ "උත්තමයන්" කොට ආමන්ත්‍රණය කළ හැකි ද සොයිසා මැතිවරුන් මෙන් ලෝකාර්ථසාධක කෘත්‍යයන් කළ බවක් කිසිම ප්‍රකරණයක කිත් අප විසින් මේ තාක් නොදක්නා ලදී.

(ද සොයිසා චරිතය සී දෙන් බස්තියන් 1904 මුද්‍රණය)

ස්වාමියාගේ අභිප්‍රායේ යමින් මහාජනානුකම්පාවෙන් පොදු වැඩ සලස්වන්ම ඒ මේ රාජපාක්ෂික කාන්තාව කෙරෙහි සැලකිලිමත්වූ වික්ටෝරියා මහේෂිකාවෝ (ලේඩි) "ආයෂ්‍රා" යන සම්භාවනීය ගෞරව නාමයෙන් බුහුමන් කරනු ලැබූහ. "ආශ්‍රා නාම අක්කයෙකි

අනුවාදය මහා රාජාඥියගේ අත හණ මහා බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයත් ඇතුලු එක්සත් රාජධානියෙහි ශ්‍රද්ධා -රක්ෂක වික්ටෝරියා වන අප විසින් දෙවෝත්තමයානන්ගේ සරණින් ඇරල් මාර්ෂල් නාමෝපලක්ෂිතවූද, අපේ එංගලන්තයේ උරුමක්කාර මාර්ෂල් අභිධාන." අපේ ඉතා ශ්‍රෙෂ්ඨ "ගාර්ටර්" පඩිකානියේ "නයිට්" කෙනෙක් වූද, අපේ අති විශ්වාසික, ඇති දයාබර සොහොයුරුවූ නෝර්ෆෝක්හි හෙන්රි ආදිපාදයානන්ට ආචාර කිරීමෙන්, ශ්‍රීලඞ්කාවීපයෙහි සාමිදුන බලය දරමින් සිට කථාශෙෂභාවෝපගතවූ චාර්ල්ස් හැන්රි ද සොයිසා (ධම් ගුණවඩිත විපුල ජයරිසූය කරුණාරත්න දිශානායක) මහතාගේ වැන්දඹුවවූ අපේ විශ්වාශික පෙම්බර කැතරින් ද සොයිසාට් යට කියන ලද ඇගේ ස්වාමිපුරුෂයා විසින් කරණ ලද ඵව්තා වැඩද, උතුම් ත්‍යාගිවන්තකම සහ ගුණාංගයන්ද, යනාදිය පිලිගැනීමෙන් සලකනු සඳහා අපේ රාජකීය ආධාර දීමේ ලකුණක් වශයෙන් අපේ විශෙෂ කරුණාධාරයෙන් යටකි කැතරින් ද සොයිසාට අපවිසින්ම හෝ අක්ත කඩදාසියකින් හෝ අපේ රාජධානියේ "නයිට් බැචිලර්" නම් ගෞරවාන්විත නාමය දුන් කලෙක්හි මෙන්ම එම ගෞරවාන්විත නාමයට අයිති සියලුම අයිතිවාසිකම් සම්පූර්ණයෙන් භුක්ති විදීමට සම්පූර්ණ බලය දෙවා වදාළ බැව් මෙයින් සකල ජනයා විසින් දත යුතුයි.

අපේ රාජ්‍යානුශාසනයේ පනස් පස්වෙනි සාංවත්සරය වූ එක්දහස් අටසිය අනූදෙකේ ජනවාරි මස විසිදෙවෙනි

(1892 ජනවාරි 22) දින "සැන්ට් ජේම්ස්" හි අපේ රාජ මන්දිරයෙහිදී දෙවා වදාරණ ලදී.

මහා රාජනීත් වහන්සේගේ ආඥාව පිට,

(අත්සන්කලේ) හැන්රි මැතිව්ස් ලකිසුරු තුමාගේ ලිපිය
1892 අගෝස්තු මස 9 වෙනි දින
මහනුවර රාජමන්දිරයේදීය.)

මැතිණියනි,

"කයිට්" තුමෙකුගේ වැන්දඹු කාන්තාවකට අයත් සියලුම ගෞරව, අයිතිවාසිකම් මහා රාජනීත් වහන්සේ විසින් දෙවා වදාරීමේ රාජකීය අත්සන යටතේ අක්තය, මහා රාජනීත් වහන්සේගේ අක්තය සමග සන්නාහ ගාර්ටර් රාජයාණන් විසින් එවන ලද ලියුමේ පිටපතකුත් ඔබට මෙසේ එවීමට මම ඉතා කැමැත්තෙමි.

මෙවගට මැතිණියෙනි,
ඔබගේ යටහත් මෙහෙකරු.
(අත්සන්කලේ) ඒ. ඊ. හැව්ලොක්

රාජසම්මාන ලාභයෙන් අහංකාරභාවයකට පත්නොවූ ද සොයිසා ආයම්මාව පෙරදී මෙන්ම දිලිත්දන්ට ආහාරපාන, ඇඳුම් ඇඟලුම්, මුදල් ආදිය දනට පිනට දීමෙන්ද, ආරෝග්‍ය ශාලා, ශාස්ත්‍ර ශාලා, අනාථ නිවාස ආදියට උපකාර කිරීමෙන්ද, පොදු වැඩ රැසක් කළාය.

අඳ, ගොළු, බිහිරි පාසැල

අංග විකලත්වයෙන් පෙළෙන අඳ, ගොළු, බිහිරි ළමයින්ට ශිල්ප ශාස්ත්‍රාදිය හැදෑරවීම පිණිස රත්මලානේ පිහිටුවූ අඳ, ගොළු, බිහිරි, පාසැලද, ද සොයිසා ආයම්මාවගේ විශෙෂ පරිත්‍යාගයකින් ආරම්භ වූවකි. අද මේ ආයතන-යෙන් ප්‍රයෝජන ලැබුවෝ දහස් ගණනකි.

---

සුසෙව් ද සොයිසා දිසානායක රජවාසල මුදලි මන් -ත්‍රීශ්වරයානන්ගෙ අයදුම සඳහා වම් 1878 දී, වැලිගම ශ්‍රී සුමංගල නායක සථවිර පාදයන් වහන්සේ විසින් හිතෝප-දේශ සන්නාස මුද්‍රණය කරවන ලදී.

**අවසානය.**

මේසේ ලෝවැඩ වඩමින් විසූ සත් කිතිහිමත් ද සොයිසා ආයසීංව දීඝායුශ්‍රී විඳැතය කොට කම්වූ පරිදි මිය පරලොව ගියාය. එතුමියගේ හා ද සොයිසා මැතිතුමාගේත් කිත් සිරුරතට අදත් කළගුණ දත් සිංහලයෝ ගෞරව කරති.

(සිංහල විරයෝ, පිටු 181 - 182 - 183 - 184, ටී. ඇස්. ධම්බන්ධු.)

## ඩබ්ලිව්. ඇf්ප්. ගුණවර්ධන වංසල මුදලිඳු

(ක්‍රි: වෂි 1861 - 1935)

**දෙමාපියෝ,**

වෂි 1861 - 5 - 18. වෙනි දින මාතර කොටුවේගොඩ "රොස්කොවේප්" නිවසේදී පළමුවරට මනුලොව පහන් එළිය දුටු මේ පින්වත් කුමරුහුගේ පියා අමද්‍රේරු වීරවර්ණ දෙන් බස්තියන් ජයසේකර ගුණවර්ධන මහතාය. ලොකු බදුගේ දෝන සෙලෙස්තිනා ජයසූරිය මහත්මිය මැණියන්ය.

ලංකාවේ ප්‍රථමවරට පැවැත්වූ ලිපිකරු විභාගයෙන් සමත්වූ, මෙහි කථානායක විලියම් ෆ්‍රෙඩ්රික් ගුණවර්ධන තරුණයා 1884 - 1 - 1. වෙනි දින ආණ්ඩුවේ සේවයට පත්වූහේය.

**සරණ මංගල්‍යය,**

තුඩාවේ පඬිතුමා ඇසුරෙන්ද සවකිය ඥාතිවරයෙක්වූ වැලිගම ශ්‍රී සුමංගල නායක ස්වාමීන්‍ද්‍රයන්ගෙන්ද, ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර උගත් මේතෙමේ 1891 - 11 - 26. වෙනි දින වැලිගම ලූසී ඇනී ලොකුබදු ජයසූරිය තරුණ මහත්මිය හා සමග සරණ බන්ධනයට ඇතුළත් විය.

**රාජසේවය,**

අටතිස් වසක් ආණ්ඩුවේ සේවයේ යෙදී සිටි මෙතෙමේ සවභාෂා පත්‍ර පිළිබඳ පරීක්ෂක ධුරය අන්තිමවරට දැරුවේය. වර්ෂ 1922 දී රාජකාර්යයෙන් විශ්‍රාම ගත්තේය ඉක්බිති සිංහල ශබ්දකෝෂයෙහි සහකාර කතෘධුරයට පත්කරණු ලදින් උද්‍යෝගීව තම උසස් මෙහෙය ඉටුකරණසඳ රෝගාතුර වූයෙන් 1932 දී එම ධුරයෙන් ඉල්ලා අස්වන්ට සිදුවිය.

**ආණ්ඩුවේ ප්‍රසාදය,**

වර්ෂ 1888 දී මුහන්දිරම් තනතුරෙන්ද වර්ෂ 1917 දී මුදලි නාමයෙන්ද ගරු කරනු ලැබූ මොහු වර්ෂ 1921 දී වාසල මුදලි පදවියෙන් සම්මානිතවූහ. ආණ්ඩුවේ සහ අධිකරණයන්හි අත්අකුරු විශෙෂඥයෙකු මෙන්ද ගරුබුහුමන් ලදහ.

ප්‍රාචීන භාෂොපකාර සමිතිය පිහිටුවීමට එකල අධ්‍යාපනාධ්‍යක්ෂ ධුරය ඉසුලූ සර් මොන්ටේග් බරොස් ශ්‍රීමතුන් සමග ක්‍රියාරම්භ කළ තැනැත්තන්ගෙන් මේ වාසළ මුදලිඳු ප්‍රමුඛයෙකි. ආරම්භයේ සිට පිළිවෙළින් තෙලෙස් අවුරුද්දක් මෙම සමිතියේ ලේකම් ධුරය දැරූ මොහුට යථොක්ත සමිතියේ සම්මාන සංඛ්‍යාවෙහි යාවජීව සාමාජිකයෙකු ලෙස තෝරාගැනීමෙන් ගෞරවය පිරිනමන ලදී.

**මහජන මෙහෙය,**

ලංකා විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට අවුරුදු කිහිපයක්ම සිංහල සහ සංස්කෘත භාෂා පිළිබඳ ආචාර්ය වරයෙකු මෙන් ක්‍රියා කල කෙනෙකි. ලංකා රාජකීය ආසියාතික සමිතියේ නිලධාරියෙක්වූ මොහු මහා බ්‍රිතාන්‍යයේද, අයර් ලන්තයේද, රාජකීය ආසියාතික සමිතියේ සාමාජික ධුරයකට තෝරාගනු ලැබූහ.

ජාත්‍යන්තර බෞද්ධ සහෝදර (Inter national Buddhist Brother Hood) සමාගමේ සභාපති ධුරයද පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ උප සභාපති ධුරයද ඉසුලූහ. ශාස්ත්‍රීයවූද, ආගමිකවූද, ජාතිකවූද කටයුතුවල නිරතවූ තමුදු තම වාසභූමියවූ ගල්කිස්ස පෙදෙසේ වැසියන්ගේ සුව දුක් සෙවීමද, අමතක නොකලෝය. ඒ සඳහා වරිපනම් ගෙවන්නන්ගේ සමිතියක්ද, අපරාධ මර්දන සමිතියක්ද ආරම්භ කොට ඒ සමාගමයන්හි සභාපති ධුරයටද පත්වීමෙන්ද, පලාත් ආණ්ඩුසභාවේ ආණ්ඩුවෙන් පත්කරනු ලැබූ සාමාජික තැන මෙන් ක්‍රියා කරමින්ද, දෙහිවල - ගල්කිස්ස ප්‍රදේශයේ මහාජනෝපකාර මෙහෙයෙහි නියුක්තවූහ.

ගුණවර්ධන වාසල මුදලිතුමා පමණ භාෂා පරිවර්තනයෙහි දක්ෂයෙක් මෑත අතීතයෙහි නොවීය. දිනක් මෙතුමා එකම සභා වේදිකාවකදී ලකිසුරුතුමාගේ ඉංග්‍රීසි කථාව සිංහලටද, නාහිමි තුමෙකුගේ පාලි කථාව ඉංග්‍රීසියටද, අනෙක් පඬිවරයෙකුගේ සිංහල කථාව ඉංග්‍රිසියටද, පරිවර්තනය කිරීමෙන් ස්වකීය ව්‍යක්තභාවය පළකෙලේය

ආත්මාභිමානයෙන් යුක්තවූ මෙතුමා තුල විවාදයෙහි චතුරතාවයක්ද තිබිණි. වැදගත් මගුල් උළෙලකට ගිය මෙතුමා කිසියම් තුටුපඬුරක් නොදී පෙරළා එනබැව් දුටු මිත්‍රයෙක් "මුදලිතුමා තෑගි දුන්නේ නෑ නොවේද" යි විමසන්ම "ඇයි" මගේ පැමිණීම යන පිළිතුර ආත්මාභිමානයෙන් ඇළලී ගිය මුදලිඳුගේ මුවෙන් නික්මිණි. දිනක් මුදලිඳුගේ මිත්‍රයෙක් "මුදලිතුමනි, දැන් හික්කඩුවේ නායක හාමුදුරුවෝත් නෑ, ධර්මාරාම නායක හාමුදුරුවෝත් නෑ, අපේ රටේ දැන් ඉන්නා පළමුවැනි පඬිවරයා කවුද" යි විමසුවේය. එකෙණෙහි කිසිදු පැකිළීමක් නොමැතිව පිළිතුරු සැපයූ අප වීරයා "මහත්මයා මේ ප්‍රශ්නය මගෙන්ම අහපු එක නොව කාරිය" යනුවෙන් ස්වකීය අභිමානය හා පාණ්ඩිත්‍යය ප්‍රකාශ කෙලේය.

**ෂඩ්භාෂාවන්හි ප්‍රවීණත්වය,**

ගුණවර්ධන වාසල මුදලිතුමෝ එළු, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමල, හා තෙළිඟු යන ෂඩ්භාෂාවේ ප්‍රවීණත්වයක් ඇතිව උසස් ශාස්ත්‍රීය සංග්‍රහයක් කළෝය.

**අභාවය,**

දැනුමෙන් පරසිඳුව සභාරඤ්ජනයෙහි වාගීශ්වරව වැජඹුණු මේ තෙමේ පක්ෂඝාත රෝගයෙන් පෙළුනේ සිව් සැත්තෑ වසක් ආයු වළඳා සිය මැදුරවූ ගල්කිස්සේ වාසල වලව්වේදී අවසන් හුස්ම හෙළුයේ (1935 – 1 – 21, වෙනි දින රාත්‍රියෙහිය.

(මාතර සාහිත්‍යවංශය)

**ඩබ්ලිව්. ඈෆ්. ගුණවර්ධන මුදලිතුමා,**

ම ණ් ඩි ත කල මුදලි වාසල ගරු තා ම
ප ණ් ඩි ත ගුණවඩන ඩබ්ලිව් ඈෆ්. පේම
ප ණ් ඩි ත දිවංගතවී සිව්වස වී ම
මි ත් සි ගි කර පුදම් බැති කුසුමක් දා මි

නි බ ඳ විදු පුබුදු කළ පුන්සඳ වා ගේ
වි රි දු ගජ මැදෙහි බස කෙසරිඳු වා ගේ
ප සි දු වුන තැමැති දිය සුර ගුරු වා ගේ
ප සි දු කව්ද සිටි සිරිලක ඔබ වා ගේ

බැ ලු වො ත් සබෙක සිරිලක මුලසුතක ත මා
බ බ ල ත් සඳසෙ තුරු මැද විදුවරුන් හැමා
නැ ණ ව ත් අපගෙ ගුණවද්දන මුදලි තු මා
මැ රු වෙ ත් මරුගෙ තම පලකරගත්ට ත මා

සෙ ව් මකරුත් දෙහොස පදරුත් ගැඹරි ත් ත
ක ව් සයුරේ කිමිද පලසක් මිණි දු ත් ත
ක ව් කරු නම තැබුව ලෙස අලගිය ව ත් න
ක ව් රුද ඔබ නොදත් සිංහලයෙක් ඉ ක් ත

සිරිලක පසත් කල කුරුරජ කුල වත්සේ
නොවලැක සියන් පිපිවිල රජ රණ හත්සේ
සිරිලක තිබෙනතුරු නොනගින සම හත්සේ
මරුවෙක ගණු කෙසෙද දිවිමුත් තම වත්සේ

‡ (ලංකාමාතා සඟරාව 1939 මැයි 2 වෙනි දින)

**සොහොනෙහි දැක්වෙන මතක සටහන්,**

2\. තිනි දියුණුව සලසා සත පිළිබ ඳ
මැනි ගුණවඩන 'බිදත් අග පඩි ස ඳ
ඉතිහස ගත කොට සිය තම මත ත ද
රැනි ලෙස සිරි සැප වළඳසි සග වැ ද

දුහුනත් ඔද ඊඩමින් සිඳ මොහ'දු රු
බුහුමින් ලැබූ දසතින් නෙක නෙක වි රු
මැනිදුත් වාසල මුදලිඳු නැණිඳු රු
නැසුනෙන් සිරි ලක් විදු සබ විය'දු රු

කටුනායක ලයනල් ඩබ්ලිව්. ද සිල්වා ජිවිදුන් විසිනි.

3\. හස්ත්‍යශ්ව වර්ණි නෙත්‍රාබ්ද
බෞද්ධබ්දෙ, පෞෂ මාසගෙ
කෘෂ්ණ පක්ෂ විතීයස්‍යාං
තිථෞ චන්ද්‍රස්‍ය වාසරෙ

කවිචූඩාමණී ඊාග්වි
කුරුරාජකුල ධවජාං
මන්ත්‍රිඥස් ත්‍රිදිවං යාතො
ඩබ්ලිව්. ඇප්. ගුණවර්ධනඃ

පූජ්‍ය කහදමෝදර පණ්ඩිත චන්ද්‍රකිත්තී ශ්‍රී පියරතන
ස්වාමිපාදයන් විසිනි.

---

‡ තනතුරු කලම්නාකාර දූරු මේ පත සොඳුරු
දිනතුරු දන මෙහෙය යෙදුන පරහිත,සිත මහරු
දන දන වැඩ ලංකා කාන්තා සඟරෙහි කතුරු
දින ප්‍රන්සිස් වර්ණසූරි බිදත් මැතිඳු තඹරු

(ලංකාමාතා පත්‍රයේ සහ සඟරාවෙහිද කර්තෘ ප්‍රන්සිස් වර්ණසූරිය මැතිතුමා ) තංගල්ල - පලතුඩුව.

# සර් ජේම්ස් පීරිස් තුමා

**උත්පත්තිය.**

කොළඹ නගර මැද ගාල ගෝව්පියෙන් මිදි උතුරු දෙසට විහිදෙන මහ මාවත ඔස්සේ ගමන් කරන්නෙකුට දැනට ග්‍රෑන්ඩ් පාස් නමින් ප්‍රකට පෙදෙස හමු වෙයි. දහනව වැනි සිය වසෙහි මැද භාගයෙහි වෙළඳ ව්‍යාපාර සහ විවිධ වෘත්තීන් සඳහා අගනුවරට සංක්‍රමණය වූ ප්‍රභූ ධනවතුන් හට එකල මෙ පෙදෙස වාස භූමිය විය. මෙහි පසෙක පිහිටි කඳු ගොඩැල්ලක පැරණි ක්‍රමයට තැනූ විශාල ගෘහයක් විය. පල තුරු ගසින් හා මල්ලිය ගොමුවෙන් සෙවනවූ මේ නිවාසය හා භූමිභාගය ජේම්ස් වාල්ස් ඈඩ්වඩ් යන කුඩා සිංහල සොහොයුරන් තිදෙනගේ වාසයට හා ළදරු විය කෙලි සෙල්ලමට ලක් වූ ඔවුන්ගේ මූල් භූමිය විය.

සනීපවත් සිරුරෙන් යුත් මේ සුරුබුහුටි සොහොයුරන් තිදෙනගෙන් වැඩිමල් වූ ජේම්ස් උපන්නේ 1856 දෙසැම්බර් මස 20 වෙනි දිය. ධනවත් පරම්පරාවක හිමිකම් ලැබූ x තෙල්ගේ මාටින් පීරිස් මහතා සහ අපලෝනියා ද සොයිසා මහත්මිය ජේම්ස්ගේ දෙමාපියෝ වූහ. පානදුර පෙදෙසෙහි වූ සු සුප්‍රසිඩ වෙළඳ ව්‍යාපාරිකයකු වූ ඩේවිඩ් පීරිස් මහතා ජේම්ස් ළදරුවාගේ මුත්තණුවෝ වූහ. කොළඹ සිට ගාල්ල දක්වා සිටි විශාල ඉඩම් හිමි සුප්‍රසිඩ ධනවතුන් අතර අග්‍රෙසර

---

x පීරිස් මහතාගේ පරම්පරාවේ ආදි මුතුන්මිත්තන් vi ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගේ කාලයෙහි මෙහි පැමිණි සේනාවල ප්‍රධානියෙක් වූ කුරුකුල නාට්ටු දේවාර් නම් තැනැත්තාගෙන් පැවත එන බවත්, ඔවුන් පසු කාලයෙහි කතරගම් දේවාලයේ ශුඩ පහන භාරකාරධුරයේ සිටිබවත් පසුව තෙල් ගබඩා නිලමේ ධුර දැරූ බවත් එසින් තෙල් ගේ පරපුර නමින් ප්‍රකට වූ බවත් පවුලේ ඉතිහාස කථාව විය —

Arunachadam S. Sketches of Ceylon History
8-6-07 Times of Ceylon.

සෙකැයි හඳුන්වනු ලැබූ ඩේවිඩ් පීරිස් මහතා ඉඩම් හිමියෙකු පමණක් නොව එකල මූදු යාත්‍රාවෙහි යෙදුන වෙළඳ නැව් හිමිපක්‍ෂ අයිතිකරුවෙක්ද විය. ඉන්දියානු වෙරළවල සිට හාල්, දුරු, මිරිස්, රෙදිපිළි රැගෙන කොළඹ පානදුර බේරුවල නැව්තොටු කරා ආගිය මේ කුඩා නැව්වලින් කෙරුණු සරු වෙළඳ ව්‍යාපාරයට පහර වැදුනේ මුහුදු යාත්‍රාව සඳහා දුම් නැව් යෙදීමෙන් පසුවයි.

**බාල කාලය.**

පින්වත් ජේම්ස් ළදරුවා මෙලොව පහළ වීමෙන් ඇති වුනු දීප්තිය පීරිස් පවුලටම සීමා නොවීය. මොරටු පලාතට හෝ ලංකාවට පමණක් සීමා නොවීය. මේ ළදරුවා සිකුරු තරුව මෙන් සමස්ත ලොකයෙහිම ස්වකීය ශුභ්‍ර කීර්ති කදම්බය පිළිබඳ දීප්තිය පතුල කිරීමෙහි සමතෙක් විය. කුඩා අවදියෙහි පටන්ම දුටුවන් තුටු කරණ ප්‍රිය මනාප රූප සම්පත්තියකින් හෙබි ජේම්ස් ළදරුවා ඉගෙනීමෙහි සමතෙක් විය. යම් කිසිවක් වරක් කියවූ පමණින් හෝ ඇසූ පමණින් ධාරණය කරගැනීමේ ඥාන ශක්තියකින් යුත් මේ ළදරුවා කවදාහරි ලංකාවේ අවිතීය නායකත්වයක් ලබනවා ඇතැයි ඇතැමෙක් අනා වැකි පළකළහ.

**නැගී තුනක්.**

ස්වභාෂාව තරමක් දුර ඉගෙන ගනිත්ම ළදරු ජේම්ස් ඉංග්‍රිසි භාෂාවද හදාලේය මොළ කැටි සුරු බුහුටි ළදරුවාගේ දක්‍ෂ භාවය දුටු ගුරුවරු ඔහු කෙරෙහි ඉතා ප්‍රසන්න වූහ. වරක් කී පමණින් එය ශිලා ලෙඛනයක කොටුවාක් මෙන් ධාරණය කරගැනීමෙහි වරප්‍රසාදයක් ඇති මේ ළදරුවාට ඉගැන්වීම් ගුරුවරුන්ගේ ගෞරවයට හේතුවක් වන බැව් නිසැකව දත් ඔවුහු ඉංග්‍රිසි භාෂාව කෙරෙහි ළදරුවාගේ සිත් වැඩියක් යොමු කළහ. තම අදහසට ළදරුවාගේ දෙගුරුන්ද නතුකරවා ගත්හ. දක්‍ෂ ලෙස ඉංග්‍රිසි භාෂාව හදාල ජේම්ස් පීරිස් තෙමේ වැඩිකල් නොගොස්ම "ෂේක්ස්පියර්," ත්‍යාගය ටර්නර් ත්‍යාගය හා ඉංග්‍රිසි සමස්ත ශාස්ත්‍ර ශාලා ත්‍යාගයද නාගත්තේය.

**එංගලන්ත ගමන.**

සමස්ත ශාස්ත්‍ර ශාලා ශිෂ්‍යත්වය දිනාගෙන එංගලන්තයට පැමිණි තරුණයා වඩාත් උද්‍යොගයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණය කෙළේය. ක්‍රි. ව. 1878 දී එංගලන්තයේ සැන් ජෝන්ස් විද්‍යාලයට ඇතුළත් වූ හෙතෙම ඉංග්‍රීසි වාක්‍ය රචනාව පිළිබඳ ත්‍යාගය හා වෙනත් ත්‍යාග කීපයක්ද දිනාගැණීමෙන් සවකීය දක්‍ෂ භාවය පෙන්වූයේය. සුරගුරු බඳු ඥාන ශක්තියෙන්ද වාග් පටුත්වයෙන්ද අනූනවූ පීරිස් තරුණ මහත්මා නීතිය හා අර්ථ ශාස්ත්‍රයෙහි විචක්‍ෂණයෙක් විය. ගෞරව පංතියේ ඇම්. ඒ. ඇල්. ඇම්. ඇම්. ආදී උපාධි නාමයන්ට හිමිවූ ජේම්ස් පීරිස් තරුණ මහත්මා මැකෝලි සාමිගෙන් හිස්ව තිබූ කේම්බ්‍රිජ් සමස්ත ශාස්ත්‍ර ශාලාවේ ශාස්ත්‍රීය සංගමයේ සභාපති ධුරයට පත්වීමෙන් ලංකාවට මහත් ගෞරවයක් අත්කොට දුන්නේය. එතුවක් කල් මේ සම්භාවනීය පදවිය එකද ආසියාතිකයෙකුටවත් හිමි නොවීය. (මෑතක් වනතුරුම පීරිස් මැතිතුමා හැර අන්කිසි ආසියාතිකයකු විසින් නොලත් මේ පදවිය අවුරුදු කීපයකට ප්‍රථම පීටර් කේනමන් මහතා විසින් ලබාගන්නා ලදි. නීති විශාරදයෙක් වූ පීරිස් මැතිතුමා අන් සියලුම අපේක්‍ෂකයන් අභිභවනය කොට මැක්මෝහන් නීති ශිෂ්‍යත්වයද දිනාගත්තේය.

**ලංකා ගමනය.**

අවිතීය නීති විශාරදයෙක් වූද දක්‍ෂ අධිනීතිඥවරයෙක් වූද ජේම්ස් පීරිස් තරුණ මහත්මාගේ ලංකා තරණය මොරටු පානදුර ආදී ගම් පළාත් වාසීන්ගේ ගෞරවයට හේතුවක් වූ හෙයින් ඥාති මිත්‍රාදීහු එතුමා නැවෙන් බොඩ බසින තුරු කොළඹ වරාය අසල රැස්කකා උන්හ. තරුණ දුහිතෘන් කීපදෙනෙකුන් ඇති මහදන සිටුවරයෙක් මේ සුරූපී නීති විශාරද තරුණයා සවකීය ප්‍රාසාදය වෙත කැඳවාගෙන ඊම පිණිස සුදු අසුන් යුවලක් යෙදූ විචිත්‍ර රථයක් පිළියෙළකොට වරාය අසළට යැව්වේය. එහෙත් මහදන සිටුවරයාගේ මේ ආරාධනය නො ඉවසා නො ඉවසිලිවන්ත් වූ තරුණ පීරිස්තුමා විමසුම් ඇසින් යුතුව ඒ මේ අත සොයා බලා එතරම් විසිතුරු නොවූ අස්රියකට නැංගේය. ඒ වූකලී සවකීය මයිලණුවන්

විසින් එවන ලද අගය රථය විය. තමාගේ ඉගෙනීමට උපකාර කළ මයිලණුවන් පිටුදුන ධනපතියන් වෙත යාම එතුමාට තරම් නොවිය. කෘතවේදී ජේම්ස් පීරිස් මහත්මා ලක්බිමට පා තැගු මොහොතෙහිදීම දැක්වූයේ උත්තමාදර්ශයකි. කලක් නීතිඥ වෘත්තියෙහි යෙදුනු පීරිස් මහතාණන්ගේ සූරවීර ගුණයෙන් හා චතුර කථාවෙන්ද ප්‍රමුදිතවූ ලක් රජය මගින් බස්නාහිර පලාතේ රජයේ නීතිඥ පදවියට මෙතුමා පත්කරණ ලදි. ඉන් කලකට පසු ගාල්ලේ දිසත්‍රික් විනිශ්චයකාර පදවිය මෙතුමාට ලැබිණි. නීති ගරුකව යුක්තිය පසිඳ වීමෙහි සමත්වූ දිසත්‍රික් විනිශ්චයකාර තරුණ පීරිස් මැතිතුමා රජයේ මෙන්ම මහජනයාගේද ප්‍රසාදය දිනාගත්තේය.

**සරණ බන්ධනය.**

භාග්‍ය සම්පත්ත අනාගතයක් ඇති පීරිස් තරුණ විනිශ්චයකාරයා සවකීය දුහිතෘවකගේ ආදරණීය ස්වාමි පුරුෂයාකොට ගැන්මෙහි ඉරණම ලභාකර දෙනුවස් ඇතැම් ධනපතියෝ යත්න කළහ. එහෙත් ඔවුන්ගේ උත්සාහයන් ගෙන් ප්‍රයෝජනයක් නොවිය. තමා බාල කාලයෙහිදී ඉගෙණීමට උපකාර කළ මයිලනුවන් වූ ජේකොප් ද මැල් මහතාගේ නාමයට මෙතුමා ගරු කෙලේය. කෘතවේදී ජේම්ස් පීරිස් මහත්මා පතල් හිමියෙක් වූද ප්‍රධාන පංතියේ වෙළඳ ව්‍යාපාරිකයෙක්වූද ජේකොප් ද මැල් මහතාගේ දෙටු දියණියන් ක්‍රි. ව. 1889 දී ආවාහකොටගත්තේය. මේ සරණ බන්ධනයෙන් ඔවුනට දූ පුතුන් සිවු දෙනෙකු ලැබිණි. ලෝක ප්‍රසිද්ධ සංගීත විශාරදයෙක්වූද උපාධිධර අධිනීතිඥවරයෙක් වූද දෙවාර්සූරියසේන (හර්බර්ට් පීරිස්) මහතා හා ලෙනාඩ් පීරිස් මහතාත් පුත්‍රයෝය. ඒ. ඇම්. ක්ලැමැන්ට් දියෙස් මැතිණිය හා ජේ. ඇල්. කුරේ මැතිණියත් දියණිවරුන්ය.

**ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ උප සභාපති ධුරය.**

ප්‍රතිසංස්කෘත මන්ත්‍රණ සභාවේ ප්‍රධාන සභාපති උතුමාතන්වහන්සේය. එහෙත් එතුමා මූල් පුටුව භාර ගත්තේ අවුරුද්දකට වරක් හෝ දෙකක් පමණකි. විශෙෂ

සිඩියක් ඇති නොවීනම් එතුමාගේ මූලසූත ගැනීම එක් වර-කටම සීමාවිය. උප සභාපති වරයාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රණ සභාව පැවැත්වේ. ක්‍රි. ව. 1924 ඔක්තෝම්බර් මස 16 වෙනි දින මේ මන්ත්‍රණ සභාවේ පළමුවැනි උප සභාපති ධූරයට පත්වූ පීරිස් මැතිතුමා නීති ගරුකවද සභාවේ ගෞරවය ආරක්ෂා වන පරිදිද ජීවිතාවසානය දක්වාම ඒ ගරු පදවිය දැරුවේය.

## නයිට් නාමය.

උප සභාපති ධූරය ලැබීමෙන් පසුව මන්ත්‍රණ සභාවේ තියුණු වාද විවාදයන්ගෙන් මිදක් ඇත්ව ක්‍රියා කිරීමට එතුමාට සිදු විය මෙතෙක් රටට කරන ලද උසස් සේවය පිළිගැණිම් වශයෙන් 1925 දී එතුමාට මහරජතුමාගෙන් නයිට් පදවිය ලැබිණ සර් ජේම්ස් පීරිස් හෙවත් ශ්‍රීමත් ජේම්ස් පීරිස් නමින් එතුමන් හැඳින්වීමට හේතුවන මේ ගරු පදවිය එතුමන් වෙත පිරිනමන ලද්දේ සර් හියු ක්ලිපඩ් ලඞකාණ්ඩුකාරතුමා විසිනි. සර් පොන්නම්බලම් රාමනාදන් සර් තෝමස් ද සම්පායෝ යන නයිට්වරුන් විසින් එදින පීරිස් මහතා රජවාසල වෙත කැඳවාගෙන යනු ලැබීය.

## පීරිස් මාතාව,

සර් ජේම්ස් පීරිස් තුමන්ගේ පම්ණක් නොව අවිතීය ධනෙශවරයෙක්වූ, චාර්ල්ස් පීරිස් මහතාගේ හා ඇඩ්වඩ් පීරිස් මුහන්දිරම් මහතාගේද මෑණියන්වූ, පීරිස් මාතාව ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් වූවාය. වැලිකඩ ගොතමී විහාරස්ථා-නයෙහි අභිවෘද්ධිය සඳහා මහත් පරිශ්‍රමයකින් කටයුතු කල පීරිස් මාතාවගේ බෞද්ධාගමික සත්ව්‍යාපාරයනට, සර් ජේම්ස් පීරිස් තුමා ඇතුළු දරුවන්ගේද උපකාරය ලැබිණි.

## පරලොකප්‍රාප්තිය,

සර් ජේම්ස් පීරිස්තුමා විවේක සුව ලබනු සඳහා
* උඩරට ගොස් සිටියදී ක්‍රි: වර්‍ෂ 1930 මැයි මස 5 වෙනි දින

හදිසියෙන් අසනීප විය. එකෙනෙහි කැඳවූ දක්ෂ වෛද්‍ය වරයන් ලවා ප්‍රතිකාර කරවූ නමුත් ඔවුහු මේ දේශබන්ධු මහා ප්‍රාඥ දේශපාලනඥයා මරුමුවින් මුදාගැනීමෙහි අසමත් වූහ. රටට දූෂට සේවය කල නිහතමානී වීරවරයා අවසන් හුස්ම හෙලුවේය.

**දෙවැනි රාජසිංහගෙන් පසු,**

මේ වීරයාගේ අභාවය සම්බන්ධයෙන් එවකට ලංකාණ්ඩුවේ බැඩ වැලු බී. එච්. බෝඩිලොන් මහතා, ටී. ඇල් විලියර්ස් යුරෝපීය මන්ත්‍රීතුමා, ඩී. බී. ජයතිලක මැතිතුමා,. සී. ඞී. කුශවෙල දිසා මැතිතුමාද ආදී බොහෝදෙනෙකුගේ ශෝකප්‍රකාශ කථාවලට අනතුරුව දියවඩන නිලමේතුමාද මෙසේ ප්‍රකාශ කෙළේය. ''සර් ජේම්ස් පීරිස් තුමාගේ මරණයෙන් ලංකා මාතාවට සිදුවූයේ විශාල අලාභයකි දෙවැනි රාජසිංහ රජතුමාගෙන් පසු ලක්දිව පහළවූ ශ්‍රේෂ්ඨ සිංහලයා මෙතුමාය.

හැ ම ස ඳ  මුවදූරු දිගසිය මේ  ගු රු ය
කල සො ඳ  පියකරු ලෝවැඩ නිර  තු රු ය
ම හ ර ද  තුමා ගරු ලෙස පිදූ සත  තු රු ය
මැ ති ර ද  අප කුරුකුල සුර මහ  හි රු ය

(සිංහල වීරයෝ සහ ජේම්ස් පීරිස් චරිතය )

**පීරිස් ආයසීව,**

ජේකබ් ද මැල් මහතාගේ හා එම නෝනාමහත්මයාගේ වැඩිමහලු දුහිතෘ වන පීරිස් ආයසීව කාලයාත්‍රා කරණ විට 74 වියේ සිටියාය.

ලෙනාර්ඩ් පීරිස් මහතා සහ දෙවාර් සූරියසේන මහතාද, පීරිස් ආයසීවගේ පුත්‍රයෝ වෙති. ඒ. ඇම්. ක්ලැමැන්ට් ඩයස් නෝනා මහත්මයා හා ජී. ඇල්. කුරේ නෝනා මහත්මයාද එම ආයසීවගේ දියණී වරුන්ය.

---

මෙතුමාට අයිති හපුතලේ වත්තේ රම්‍ය නිවාසයේදී ශ්‍රීමත් ජේම්ස් පීරිස් වීරයා අවසන් හුස්ම හෙළීය.

සහෝදරියන් අටදෙනෙකු ඇතිව සිටි පීරිස් ආයසීමව -ගේ සහෝදරයා ඇ/ප්. බී. ද මැල් මහතා පමණී. තරුණ කාලයේ පටන්ම පීරිස් ආයසීමව මහජන වැඩට සහභාගීව ක්‍රියා කළා පමණක් නොව අද, ගොලු, බිහිරි පාඨශාලාවේ සහ ප්‍රීති නිවාසයේ සැම සැලකියයුතු ක්‍රියාවකටම සහභාගී වූවාය. ලංකා මහජන සේවක සමිතියට පීරිස් ආයසීමවගෙන් වූ සේවය ඉතා විශාලය.

## ඩබ්ලිව්. අංතර් ද සිල්වා මැතිණිය.

සඳුන්රුක බැලඳගත් සමන්වැල,

කෞරව කුල පරාඕකාමි මහජන සේවකයෙක්වූද, පරිත්‍යාගශීලි බෞද්ධොපාසකයෙක්වූද, ද සිල්වා මැතිතුමාගේ හා ද සිල්වා මැතිණියගේත් සම්බන්ධය සඳුන් රුකේ හා සමන්වැලේ සම්බන්ධය වැනි විය. මේ උතුමා හා උතුමිත් සියගුණ සුවඳින් සිරිලක හොබවමින් පොදු වැඩට රුකුල් දුන්හ.

සුවිනීත භාර්‍යාවක්,

අවශෙෂ කුල කාන්තාවනට ආදශීයක් දක්වූ, ද සිල්වා මැතිණිය හැමවිටම සවාමියාගේ සිත දිනාගෙන සිය යුතුකම් නොපිරිහෙලා ඉටුකලාය මේ ආදශීවත් දම්පතින් අතර කිසිවිටෙකුදු මතභෙදයක් ඇතිනොවීය. සවාමියාගේ වචනය දෙව වාක්‍යය මෙන් ගරු කළ මේ ප්‍රිය දෙහිනිය නියම පාද පරිචාරිකාවක් වූවාය

මහජන සේවය,

කාන්තා පක්ෂය වැටී ඉන්නා ප්‍රපාතයෙන් නගාලනු වස් මෙතුමී මහිලා සමිතිය ආරම්භ කොට ඒ මගින් අනල්ප සේවයක් සිදුකළාය. මහිලා සමිතියේ සභාපතිනියවූ ඕතොමෝ කාන්තාවන්ගේ අත්කම්, ගෙත්තම්, පත්කම ආදිය දියුණු කරවමින් ගම් නියම්ගම්හි සැරිසරමින් ගමක් ගම

පාසා සමිති පිහිටෙව්වාය. කාන්තා පක්ෂය මගින් කලහැකි මහජන සේවය පෙන්වා දුන්නාය. අද එතුමියගේ ඥාති දූහිතෘවක්වූ, සැනෙට් සභික සිසි කුරේ මැතිණිය මේ ව්‍යාපාරයෙහි නායිකාව වී සුලුමවුගේ අඩිපාරේ ගමන් කරමින් උදාර සේවයක් කරයි.

**වැල්ලවත්තේ ශ්‍රී ලඞකාධාර සභාවෙ පාඨශාලාව,**

මේ මහා ශාස්ත්‍රශාලාව හා එහි භූමිභාගයත් මෙතුමිය-යේ විශාල පරිත්‍යාගයකි. රුපියල් පනස්දහසකටත් වඩා වටිනා මේ දීමනාව නිසා අද සියගණනක් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ධම් ශාස්ත්‍රය හදරති.

(කලක් මේ ශ්‍රී ලඞකාධාර සභාවේ පාඨශාලාව කානතා අභ්‍යාස විද්‍යාලයක්වද තිබිණි.)

**ශිල ව්‍යාපාරය,**

සවකීය ජන්මභූමියවූ හොරේතුඩුවේ ග්‍රාමයෙහි ගංගාරාමයට අවුත් පසළොස්වක් පෝහෝ දිනයන්හි අටසිල් සමාදන් වීමත්, උපාසක උපාසිකාවනට දන්දීමත් මේ ආදශීවත් කාන්තාවගේ චාරිත්‍රධම්යක්ව පැවතිණි.

**ආදශීවත් කානනාරත්නයක්,**

මෙසේ සකල පුණ්‍ය ක්‍රියාවකටම නොමසුරු ධන පරිත්‍යාග කරමින් සුවිනීත චරිතයක් ඇතිව වුත් ද සිල්වා මැතිණිය කාන්තා සමිති කීපයකම ප්‍රමුඛත්වය ගෙන ලෝ සසුන් වඩමින් සිංහල කාන්තා පක්ෂයට උත්තමාදශීයක් දුන්නීය.

(සිංහල වීරයෝ, පිටු 252 - 253.)

## ජෙරමියස් දියෙස් මැතිණිය.

(ඇම්. බී. ජ්.)

**දෙමාපියෝ,**

පානදුරා පලාතේ (කෞරව කුල ප්‍රසිඬ ධනවතෙක්ව මිසූ ඩබ්ලිව්. පි. ඇස්. රුද්‍රිගු රේත්ද මහත්මයා හා එම මැතිණියත්, මෙතුමියගේ දෙමාපියෝය, සොහොයුරත්

දෙදෙනෙකුගෙන් හා සොහොයුරියන් සත්දෙනෙකුගෙන්ද සැදුම් ලත් රුද්‍රිගු පවුලේ සිව්වැනි දියණිය සෙලෙස්තිනා රුද්‍රිගු (ජෙරමියස් දියෙස්) මැතිණියයි.

**ඉගෙණීම,**

එවකට ගැහැණු ළමයින්ට සෑහෙන අධ්‍යාපනයක් දීම ගැන මවුපියෝ මිඩංගු නොවූහ. එහෙත් මෙතුමී සිංහල භාෂාව තරමක් දුර ලියන්ට හා කියවන්ට දැන සිටියාය.

**විවාහය,**

ගුණ නුවණින් හා රූසිරියෙන්ද අගතැන් පැමිණි සෙලෙස්තිනා රුද්‍රිගු තරුණ මැතිණිය ඇගේ දෙගුරුන් විසින් පළාතේ ධනපති යෙක්ව සිටි ජෙරමියස් දියෙස් මැතිතුමාට විවාහ කොට දෙන ලදී.

**දරුසම්පත්,**

මේ වාසනාවත් යුවලට පුතුන් සිවුදෙනෙක් හා දියණියන් පස්දෙනෙක්ද, ලැබිණි ඔවුන් අතුරින් තුන්වැනි පුත් වින්සන්ට් දියෙස් මහතා බාල කාලයේදීම මියගියේය සෙසු දරුවන් අතුරින් හැරී දියෙස් (අමද්‍යප වීරවර) ආතර් වී. දියෙස්, සී. ඇම්. දියෙස් යන මහතුන්ගෙන් රටට - දැයට සමයට ඉමහත් සේවයක් සිදුවේ.

ෆ්‍රෙඩ් ද පොන්සේකා වෛද්‍යාචාර්‍යතුමා, වෝල්ටර් සල්ගාඩු මැතිතුමා, විල්මට් පෙරේරා මැතිතුමා (පාර්ලිමේන්තුමන්ත්‍රී) හා (වැඩබලන උප පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් ධුරන්ධර) හිටපු පොලිස් පති ඔස්මන් ද සිල්වා මැතිතුමාත් මෙ තුමීගේ මුණුබුරන් අතුරින් සමහරෙකි.

---

ප ර ලොව වැඩ පිණිස දන විසඳ දහ ස
කා ර වත ගොඩනැගිලි ආ දියුණට තෙදෙ ස
ජෙ ර මියස් ඩයස් මැතිනියගේ නිව ස
ව ර දෙස පෙණෙයි කීම දෙව් විමනක්ද? අ ස

(වන පරවි සංදෙශය.)

**විශාඛා විද්‍යාලය,**

“බෞද්ධ කන්‍යා විද්‍යාලය” නමින් අගනුවර ඇරඹි ඉංග්‍රීසි කාන්තා විද්‍යාලය දුෂ්කරතාවයකට මුහුණ පෑ සිටියදී ආතර් ද සිල්වා, ඩී. බී. ජයතිලක, ඩී. ඇස්. සේනානායක ආදී උතුමන්ගේ ඉල්ලීම පරිදි මෙතුමී මේ බෞද්ධ කන්‍යා විද්‍යාලයට උදව් දීමට සතුටුවූවාය. ප්‍රථමයෙන් රුපියල් ලක්ෂයක් පරිත්‍යාග කළ ඕතොමෝ නැවත නැවතත් සැලකියයුතු උදවු දුන්නාය. ඉක්බිති රුපියල් එක්ලක්ෂ පනස්දහසක් පමණ වියදම් කොට ගොඩනැගිල්ලක් කරවා එයිනුදු නොනැවති (පසුව නම වෙනස්වී විශාඛා විද්‍යාලය නමින් ප්‍රසිද්ධියට පැමිණි) ඒ, මේ බෞද්ධ කන්‍යා විද්‍යාලය සඳහා තවත් ලක්ෂ ගනනක් පරිත්‍යාග කළාය. මෙසේ වරින් වර මේ වීරවරිය විසින් විශාඛා විද්‍යාලයට කරණ ලද පරිත්‍යාගය රුපියල් හාරලක්ෂ පනස්දහසකි

**ආනන්ද විද්‍යාලයෙහි වින්සන්ට් දියෙස් ස්මරණශාලාව,**

පරලෝ සැපත් සිය පුත් වින්සන්ට් දියෙස් මහතාට පින් පැමිණවීම සඳහා මෙතුමිය විසින් ආනන්ද ශාස්ත්‍රශාලාවේ විශාල ශාලාවක් ඉදිකරවණ ලදී. මේ හැර වරින් වර ආනන්ද විද්‍යාලයට රුපියල් දහස් ගනනක් මෙතුමියගෙන් ලැබිණි

**ගම්පහ හා මොරටුව,**

පානදුරා පළාතේ සෑම පොදු වැඩක් සඳහාම නිර්ලෝභීව ධන පරිත්‍යාග කළ මෙතුමී මොරටුවේ විහාරයක් හා ගම්පහ පළාතේ විහාරයක්ද, ස්වකීය ධනව්‍යයෙන් කරවූවාය මේ හැර එගොඩ උයන, කටුකුරුන්ද ආදී ගම්වල විහාරාරාමයන් සඳහාද සැලකියයුතු පරිත්‍යාග කීපයක් කළාය

**රැද්‍රිගු පවුලේ අසරණ සරණ සමාගම,**

පානදුරේ රැද්‍රිගු පවුලේ අසරණ සරණ සමාගමේ සභාපතිනිය ජෙරමියස් දියෙස් මැතිණිය වූවාය. අවුරුදු පතා රුපියල් දහස් ගණනක් වියදම් කොට දුගී මගී යාචකාදීන්ට කෑම් බීම් ඇඳුම් පැළඳුම් දීම පිණිස මේ සමාගමට දියෙස් මැතිණියගේ නොමසුරු උපකාරය ලැබිණි.

**අනාථ දරු නිවාසය,**

මව්පියන් නැති අනාථ දරුවන් උදෙසා පානදුරේ අනාථ දරු නිවෙසක් අවුරුදු ගණනක්ම පවත්වන ලදී. අසරණ දරුවන්ට කෑම් බීම් ඇඳුම් ඇඟලුම් දී සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් උගන්වා වඩුකම් පෙහෙකම් ආදී ශිල්ප යන්ද මේ මගින් උගන්වන ලදී. මෙයින් අනාථ දරුවන් රැසකට සැලසුණු සේවය ඉමහත්ය.

**ධර්මදූත මෙහෙය,**

ගරු කටයුතු හීනටියන ධර්මාලෝක ස්වාමීන් වහන්සේ ප්‍රධානකොට ඇති උගත් ස්වාමීන් වහන්සේලා ලවා සතිපතා ලක්දිව ගම් නියම්ගම්හි ධර්මදේශනා පවත්වා ධර්ම පත්‍රිකා ලක්ෂය බැගින් බෞද්ධයන් අතර බෙදා දීමේ ව්‍යාපාරයක් දියෙස් මැතිණියගේ ධනව්‍යයෙන් කොළඹ ධර්ම දූත සභාව මගින් අවුරුදු ගනනක්ම නොකඩවා පවත්වන ලදී. මේ ධර්ම පත්‍රිකා පොත් වශයෙන් බැඳගෙන ප්‍රයෝජන ගත්තෝ අදත් අපරට එමට සිටිති.

**ඇම්. බී. ඊ. නාමය,**

මෙසේ ලෝ සසුන් වඩමින් උන් මෙතුමියට සම්මානයක් දක්වනු කැමැතිවූ ඉංග්‍රීසි ආණ්ඩුව මගින් ඇම්. බී. ඊ. යන අධිරාජ්‍ය ගරු නාමයෙන් ගෞරව කරණ ලදී.

එහෙත් එයින් උද්දාම නොවූ මේ පින්වත් කුලඟන පෙර මෙන්ම ඉතා චාම්ලෙස රෙද්දෙත් හා හැට්ටෙන් සැරසී පොදු වැඩවල යෙදුනාය.

**විශාඛා නාමය,**

රජය මගින් ඇම්. බී. ඊ. නාමය පිරිනමන්නට, විශාඛා මහෝපාසිකාව යළිත් ලොව පහළවූවාක් මෙන් පොදු වැඩ සඳහා රුපියල් ලක්ෂ ගණන් වියදම් කරණ මේ උපාසිකාවට "විශාඛා" යන ගරු නාමය ජන සම්මතයෙන් ව්‍යවහාර වන්නට විය. ඕතොමෝ ඇම් බී ඊ. නාමයට වඩා විශාඛා නාමයට ප්‍රිය කළාය.

**රුවන්මැලි සෑය,**

රුවන්මැලි මහ සෑයේ ප්‍රතිසංස්කරණය සඳහා දියෙස් මැතිණියද සැළකියයුතු පරිත්‍යාගයක් කළාය. මෙනත් විහාරාරාම, පාසැල්, අනාථ නිවාස, අම්බලම් ආරොග්‍යශාලා, සොහොන් බිම් ආදී පොදු කටයුතු සඳහා වරින් වර මෙතුමිය විසින් පරිත්‍යාග කරණ ලද මුදල් රුපියල් විසිලක්ෂයක් පමණ වේ. සිංහල රජකාලයෙන් පසු එකද සිංහල කුල කාන්තාවක් විසිනුදු මෙතරම් උදාර පරිත්‍යාගයක් කරණ ලද බැව් ඉතිහාසයෙහි නොපෙනේ.

(සිංහල වීරයෝ, පිටු 290, 291, 292, 293)

## ඇම්. ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශෙඛර මැතිතුමා

**බාලකාලය,**

මොරටුවේ හොරේතුඩුවේ කුරුරාජ වංශික, ඇම්. සිමන් ප්‍රනාන්දු ශ්‍රීචන්ද්‍රශෙඛර මුදලිතුමාගේ සහ එම ලම්ාඑතානීගේන් ප්‍රිය පුත්‍රයෙක්වූ ඇම්. ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍ර ශෙඛර මැතිතුමා බාල කාලයේදීම කල්පනාකාරි කුමාරයෙක් විය.

මෙතුමා ගුරුන්ගේ සිත් දිනාගනිමින් ජන්ම භාෂාවද ඉගෙණගත්තේය.

**කාරුණික ස්වාමියෙක්,**

ඉගෙණිමෙන් පසු ගරු ඨානාන්තර ලොංඝයෙන් රජයේ රක්ෂාවන්ට ඇතුල්වීම එවකට පැවති සිරිතය. එහෙත් ඒ පිළිබඳව සිත් යොමු නොකල මේ තරුණයා සිය දේපල මැනැවින් දියුණු කරමින් වෙළඳ ව්‍යාපාරයන්හි යෙදෙමින් ඉඩම් වගාකෙළේය.

ආවාහය,

අන්‍ය ලබ්ධික කාන්තාවක් හා සරණ බන්ධනයට ඇතුළත්වූ ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශෙඛර දම්පතීන්ට එකම පුත්‍රයෙක් ලැබිණ, ළදරුවා දෑවුරුදු වියට පැමිණෙත්ම ප්‍රනාන්දු චන්ද්‍රශෙඛර මැතිතුමා බලවත් ලෙස රෝගාතුර විය. ස්වකීය ජීවිතය අවදානම් තත්වයකට මුහුණ පා තිබෙන බැව් වටහාගත් මෙතුමා අන්තිම කැමති පත්‍රයක් ලියා තැබුවේය.

යම් කිසිහෙයකින් පුත්‍රයා අකාලයේ මිය ගියේ නම් එතුමාගේ දේපල වියදම් කළයුතු පිළිවෙළ එහි ඇතුලත්විය. වැඩි දවසක් නොගොස්ම චන්ද්‍රශෙඛර මැතිතුමා අවසන් හුස්ම හෙලුවේය. පුත්‍රයාද දෑවුරුදු වියෙහිදීම පරලෝ සැපත් විය. පුත්‍රයාගේ මෘත ශරීරය බෞද්ධ ඥාතීහු බෞද්ධ සොහොන් බිමක තැන්පත් කෙළේය. එහෙත් ක්‍රිස්තියානි ඥාතීහු රාත්‍රි කාලයේ ළදුරුවාගේ මෘත ශරීරය රැගෙන ගොස් ක්‍රිස්තියානි සොහොන් බිමක තැන්පත් කළහයි අවුලක්ද ඇතිවිය. චන්ද්‍ර-ශෙඛර මහතාගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රකාර ස්ව ප්‍රියාවට මාසික මුදලක් ගෙවීමට නියමව තිබිණි. හොරේතුඩුවේ ගඞ්ගාරාමයටද රුපියල් දහස් ගණනක් වෙන් කොට තිබිණි.

ඇම්. ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර අන්තිම කැමති පත්‍රයේ සිංහලානුවාදය.

1. ආහාර දුර්භික්ෂය, භූමි චලනය, ජල ගැලීම් ආදී විපත්තිදායක කරුණුවලදී ආධාරදීම.

2. අරමුදලේ පාලකසින්ට සුදුසුයයි වැටහෙන පරිදි නියම ලෙස පරිපාලනය වන ආරෝග්‍ය ශාලා, අනුස්මරණ ශාලා සහ වෙනත් පුණ්‍යායතනයන්ට පාලනය හා ගොඩ නැගීම් පිළිබඳව ආධාරදීම,

3. බෞද්ධ විහාර ගොඩනැගිලි හෝ බෞද්ධ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය පිළිබඳව ආධාරදීම,

4 පුස්තකාල හා ශිෂ්‍යත්ව උදෙසාද, පාඨශාලා හා අධ්‍යාපන ස්ථාන ආරම්භ කිරීමට, හා පාලනය කිරීම උදෙසාද සාමාන්‍ය වශයෙන් සියලු පුණ්‍ය කටයුතු උදෙසාද ආධාරදීම,

5. එහෙත් බෞද්ධ නොවූ මොනම ආගමික සිද්ධස්ථානයකටවත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමවත් හෝ පාලනය කිරීම් ආදී කිසිම කාර්‍ය්‍යයකට නියම ලෙසින් හෝ අනියම් ලෙසින් කිසිම ආධාරයක් දීමට ඉඩක් නැත.

## චන්ද්‍රශේඛර අරමුදල.

xමේ අරමුදලේ පොලියෙන් අවුරුදු පතා රුපියල් දහස් ගණනක් පොදු කටයුතු සඳහා යොදනු ලැබේ. මෙතුවක් මේ අරමුදලින් රුපියල් ලක්‍ෂ ගණනක් පොදු කටයුතු සඳහා පිදිණි. ලංකාවේ අනෙක් සිංහල ධනපතියෝත් චන්ද්‍රශේඛර වීරයා අනුගමනය කරමින් මෙසේ අරමුදල් පිහිටුවත් නම් සිංහල වර්ගයාට අත්වන සෙත කියා නිම කළ නොහැකිය.

(ටී. ඇස්. ධම්බන්ධු සිංහල වීරයෝ)

---

xමේ විශාල ධනස්කන්ධයේ වටිනාකම.

(1911 මාර්තු මස 7 වෙනිදා රුපියල් 1320869-38 මෙය කිට්ටු ඥාතීන්ට සහ ස්වකීය භාර්‍යාවටත් ලියා ඉතිරි විශාල ධනස්කන්ධය තම පුත්‍රයාට පවරන ලද්දේය. ළමයා නැති වුවහොත් එම ධනස්කන්ධයෙන් විශාල මුදලක් බෞද්ධ විහාරස්ථානයකට දී ඉතිරි හරිය "ශ්‍රී චන්ද්‍රශේඛර අරමුදල"යයි වෙන් කොට මහ ලේකම් තුමා හා ඔස්තාහිර පළාතේ එජන්ත මහතාද පත්කිරීමට අන්තිම කැමති පත්‍රයෙහි වගන්ති ඇතුලත් කරණ ලද්දේය. 9-2-1924 "දිනමිණ"

සර් ඩී බී ජයතිලක මහතා මෙසේ කීවේය. ශ්‍රී චන්ද්‍රශේඛර මහතා මේ බඳු අරමුදලක් ඇතිකරණ විට මහා බෝධි සමාගම තබා පරම විඥානාර්ථ සමාගමවත් ආණ්ඩුවේ නීත්‍යානුකූල ලෙස ලියා පදිංචිකොට නොතිබුනේය. රුපියල් පනස් තුන් ලක්‍ෂයකටත් අධිකවූ එම මහා ධනස්කන්ධයේ පාලනය පුද්ගල පාලක මණ්ඩලයකට භාරදෙන්ට වූයේ එහෙයිනි.

(සිංහල බෞද්ධයා ක්‍රි. ව. 1942 මාර්තු 28 සෙනසුරාදා)

# කල්‍යාණි වංශ මහා නිකාය.

A කල්‍යාණි වංශ නිකායේ ආදි කර්තෘ හිමිපාණෝ සම්බුද්ධ ශාසනයේ නව යුගයේ ආදි කර්තෘභූත වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ මෙන්ම අනුපමේය ශාසනික මෙහෙයක් කර වදාළ කතළුවේ ශ්‍රී ගුණරතන තිස්ස මාහිමියන් වහන්සේ විසින් පිහිටුවනු ලැබූ කල්‍යාණි වංශ නිකායට එකසිය පනස් වසක් පිරීමේ උත්සවය අගෝස්තු මස 21 වෙනිදා පටන් පුරා සතියක් මූළල්ලේ කතළුවේ පූර්වාරාම විහාරස්ථානයෙහි පැවැත්වෙයි.

---

A කල්‍යාණි සීමාව.

රාමඤ්ඤ රට පේගු නගරයේ බටහිර උප නගරයක්වූ වර්තමාන "සෙන්ගතෙඩ්" නම් නගරවරයෙහි පවත්නා කල්‍යාණි සීමාව වනාහි මින් අවුරුදු හාරසිය හැටනවයකට උඩදී රාමඤ්ඤ දේශාධිශ්වර සාසන සොධක ධම්ම චෙතිය මහ රජහුගේ සහායත්වයෙන් පිහිටුවන ලදි. ලක්දිව කල්‍යාණි නදියෙහි සෑදූ උදකුක්ඛෙප සීමාවෙහි උපසම්පන්නවූ භික්ෂූන් විසින් සම්මත බැවින් කල්‍යාණි සීමා"යි මීට නම් දෙන ලදි. ඒ ස්ථානයෙහි එරජු විසින්ම කිරිගරුඬ සෙල් පුවරු දසයක ලිපි පංතියක් කොටවා පිහිටුවන ලදී. ඒ කාලය වනාහි අපේ ඉතිහාස පොත්වල අඳුරු කාල පරිච්ඡේදයක් වී තිබෙන හෙයින් ලංකා ඉතිහාසය දැනගනු කැමැත්තන්ටද යථොක්ත ලිපි පංතිය බොහෝ උපකාරීවේ.

නවද මේ මහා විහාර පරම්පරාගත පරම විශුද්ධ ශීමාමාලකය පිළිබඳව සටහන් කළ යුතු වැදගත් ඓතිහාසික ප්‍රවෘත්තියක් නම් ක්‍රි. ව. 1807 දී මහා ගුණෑති (කුරුකුලවංශ) කතළුවේ හදන්ත ශ්‍රී ගුණරතන තිස්ස මහා ස්ථවිරයන් වහන්සේද එසේම අධි ශීල අපේක්ෂාවෙන් සිටි බටපොලේ කල්‍යාණි තිස්ස ආදි සාමනේරයන් සත් නමක්ද කැටුව හංසවතී පුරයට සම්ප්‍රාප්තව යථොක්ත සුවිශුද්ධ කල්‍යාණි මහා සීමාවෙත් උපසම්පදාව ලබා පෙරලා ලක්දිව් වැඩමවා ලංකාවීපයෙහි කල්‍යාණි වංශ නම් පිරිසිදු භික්ෂු නිකාය පිහිටුවීමවේ

(ශ්‍රී රාහුල සංඝරාජතුමා පරිකථා 14 පිටුව)

බුඩ වර්ෂ 2295 දී ගාළු දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ කතළුවේ උපන් ගුණරතන තිස්සාභිධාන මාහිමියන් වහන්සේ උපදින විට මෙහි දක් ප්‍රධාන නිකාය වශයෙන් සලකනු ලබන සියම් නිකායවත් නොපැවැත්තේය. සියම් නිකාය පිහිටුවන ලද්දේ එයින් වර්ෂයකට පසුය. එහෙයින් ඒ කාලය මේ රටේ භික්ෂූන් වහන්සේලා අතිශයින් දුර්ලභ යුගයක් විය.

මුන් වහන්සේගේ පියා වූ කතළුවේ හෙට්ටිතන්ත්‍රිගේ කුමාරදාස කුලසූරිය වෙද මහතා සවකීය පුත්‍රයා පැවිදි කරවන්නට කල්පනාකර මාතර අසළ පෙනන්ගහවත්තේ වාසයකළ බෝවල ධම්මානන්ද මාහිමියන්ට භාරකෙලේය. බුඩ වර්ෂ 2316 දී තොටගමුවේ පුරාණ සීමාවේදීද, බුඩ වර්ෂ 2341 දී තංගල්ලේ උදකුක්ඛෙප සීමාවකදීද දෙවරක්ම උපසම්පදාව ලැබූ ගුණරතන සවාමිපාදයෝ එම සීමා දෙකම පිළිබඳව ඇති වූ සැක නිසා සවකීය උපසම්පදාව ගැන විමතියට පත්ව පිට රටකට ගොස් උප සම්පදාව ලබාගන්නට අදහස් කළහ.

එම අදහස අනුව ගුරුවරුන්ගෙන් අවසරද ඥාති මිත්‍ර හිතවතුන්ගෙන් උදවුද ලබාගත් උන්වහන්සේ තමන් සමග ඒ ගමන යාමට පිරිසක්ද පිළියෙල කරගත්හ. උන් වහන්සේ බටපොළේ කල්‍යාණ තිස්ස වැලිකොන්දේ ධම්මරතන, කොග්ගල ධම්මසාර වැලිකොන්දේ පඤ්ඤානිස්ස, තාරන්දෙණියේ ගුණසාර, මිරිස්වත්තේ මේධානන්ද, කිරින්දේ සීලානන්ද යන සාමණේරයන් වහන්සේලා සත් නම සහ කැප කරුවන් කිදෙනෙකුද සමග ශ්‍රී බුඩ වර්ෂ 2351 බිනර මස පුර අටවක් ද දෙඩන්දූ වරායෙන් සුලුප්පුවක නැගී පිටත්වූහ. රාමඤ්ඤ හෙවත් බුරුම රට බලා පිටත්ව දවස් එකොළොසක් මුළුල්ලේ කරදරයක් නැතිව යාත්‍රා කළ පසු දොළොස් වෙනි දින රාත්‍රියේ මහා විපතකට මුහුණ ලා සිටියහ.

විපතට අසුවීම.

එදින රාත්‍රියේ මහ වැහි සහිත වේගවත් කුණාටුවක් ඇතිවී නැවේ රුවල් සියල්ල සුණු විසුණු වී ගොස් කුඹ ගස්ද කැඩී ගියහ. නැව ඉමක් කොනක් නැතිව සාගරයේ ඒ මේ

අත පාවෙන්ට විය එහි සිටි නැවියෝද වෙළෙන්ඳෙද මරණ භයින් තැතිගෙන තම තමන්ගේ දෙවියන් අදහන්නටත් යාඥා කරන්නටත් විලාප කියන්නටත් පටන්ගත්හ. තව ඇසිල්ලකින් තමන් මුහුදුබත් විය හැකි බව පෙනී ගිය මේ භයානක අවස්ථාවේදී අපේ වීර හිමියෝ කිසිම තැතිගැන්මක් නැතිව සවකීය පිරිස අමතා 'විපත්තියේදී ශොක කිරීමෙන් පලක් නැත සිද්ධ කටයුතු උත්තමාශ්‍රයක් ඇතිව අපට විපතක් සිදු වුවහොත් ශොක වන්නට කරුණක් නැතැ'යි වදාළහ.

නැවේ සිටි හැම දෙනාම නැවතත් බලාපොරොත්තු රහිත අවස්ථාවක සිටින විට වැලිකොන්දේ ධම්මරතන හිමියන්ගේ උපාය ඥානයක් ක්‍රියාවෙහි යෙදිණ. කැඩී බිඳී ගිය කුඹ ගස් ආදියේ කැබලි එක්කරවා පහුරක් බැන්දවූ උන්වහන්සේ නැවියන් හතරදෙනෙකු එහි නංවා අනතුරු අඟවන කොඩියක්ද බැඳ පාකර යැවූහ හේතුවකට මෙන් මේ පහුර රුත්ගුත් වරායට සේන්දු විය. එහි නිලධාරියෝ තොරතුරු විමසා ශක්තිමත් නැවක් යවා අබලන්ව පැවති නැව වරායට අද්දවා ගත්හ.

බිලි පූජාවක්.

මේ මහා විපත සිදු වූ දින දවල් කාලයේ නැවේ සිටි යෝනක මිනිසුන් වගයක් එළු බැටළු ආදී සතුන් රැසක් මරා බිලි පූජාවක් පැවැත්වූ බව කියති. කුණාටුවට හේතුව මේ යැයි නැවේ සිටි ඇතැමුන් විශ්වාස කළ බවද පෙනේ. රුත්-ගුත් නගරය ඇතුළු පෙදෙස පාලනය කළ ප්‍රාදේශික රජතුමා ලංකාවෙන් භික්ෂු පිරිසක් පැමිණ සිටි බව අසා බලවත්සේ සතුටට පත්ව උන්වහන්සේලා වෙත ගොස් ආදරයෙන් පිළිගත්තේය. "මේ කුණාටුවෙන් නැව් හම්බන් ආදිය විශාල ගණනක් විනාශවී ගිය නමුත් මේ නැව මෙපමණින් බේරුනේත් නැවියන්ගේ හා අන්‍යයන්ගේ පණ බේරුණේත් ඔබ වහන්සේලාගේ ශීල බලයෙන් බවට සැකයක් නැතැ"යි කියමින් බලවත් ප්‍රසාදය පළ කළ මණ්ඩලික රජතුමා කතළුවේ හිමියන් ඇතුළු පිරිස විහාරයකට කැඳවාගෙන

ගොස් උපස්ථානයට කැපකරුවන්ද යෙදීය. එහිදී සාමණේර තුන් නමකට අතිසාර රෝගය වැළඳුන නමුත් රජතුමා දක්ෂ වෛද්‍යයන් යොදා උන්වහන්සේලා සුවපත් කෙළේය. මණ්ඩලික රජතුමා රංගුන් නුවරින් සැතපුම් 45 ක් ඈතින් පිහිටි හංසවති නගරයට මේ පිරිස සමග ගොස් එහි රාජගුරු මහා තෙරුන්හට මේ පිරිස භාරදුන්නේය. උපසම්පදාව ලබා ගන්නට පැමිණි බව ඇසූ රාජගුරු හිමියෝ කල්‍යාණි සීමාව පිළිබඳ විස්තරය කතළුවේ හිමියන්හට වදාළහ.

## සීමා බැන්දවීම.

මෙයින් අවුරුදු තුන්සිය ගණනකට පෙර බුරුම රට පාලනය කළ ධම්මචේතිය මහ රජතුමා එකල ලක්දිව ජයවර්ධන පුරයෙහි විසූ භුවනෙක බාහු රජු වෙත භික්ෂු පිරිසක් යවා ලාංකික සංඝයාගෙන් කැලණි ගඟේදී උපසම්පදාව ලබා දී ඒ පිරිස සිය රටට පැමිණි පසු බුඩ වර්ෂ 2018 දී මේ සීමාව බැන්දවීය. ඒ රජතුමාගේ කාලයේදීම බුරුම රට දැසි භික්ෂූහු පසළොස් දහසකට අධික සංඛ්‍යාවක් මේ සීමාවේදී සිංහල උපසම්පදාව ලබාගත්හ බුරුම මහ රජුට දැනුම් දී මෙහිදීම උපසම්පදාව ලබාගැනීම ඔබවහන්සේලාටත් හොඳ"ය.

රාජගුරු හිමියන්ගේ මේ බස් අසා අතිශයින් ප්‍රීතියටපත් කතළුවේ හිමියෝ මණ්ඩලික රජතුමාගේ උදවු ඇතිව බුරුම මහ රජුගෙන් අවසරය ලබාගෙන රජතුමාගේම ආරාධනායෙන් සංඝරාජයන් වහන්සේගෙන්ද වර ලැබ කල්‍යාණි සීමාවේදී පරිශුද්ධ උපසම්පදාව ලැබූහ

උපසම්පදාව ලැබීමෙන් පසුද කලක් එහි සිටි මේ යතිවරයන් වහන්සේලා නාගපට්ටන මෙන් නැව් නැගී බුඩ වර්ෂ 2355 පොසොන් මස පුරපසළොස්වක දා දොඩන්දූ වරායෙන් සිය රටට ගොඩබැස්සහ.

මෙසේ ජීවිතාශාව අතහැරදමා ගොස් පිරිසුදු උපසම්පදාව ලැබ පැමිණි කතළුවේ නාහිමියෝ උපසම්පදාව ලබනු කැමති විශාල පිරිසකට උපසම්පදාව දුන්හ. සියම් නිකායෙන් පැමිණි බොහෝ භික්ෂූහුද උන්වහන්සේවෙත පුන ශික්ෂාව ලැබූහ.

## අපවත්වීම.

කලිත්කල කතළුවේ මහා විහාරය දෙඩන්දුවේ දෙගල්ලේ විහාරය අම්බලන්ගොඩ රත්කොත් විහාරය, රත්දොඹේ මහා මංගල සමුද්‍රාරාමය, අලුත්ගම වාලුකාරාමය, කලුතර වැල්ලබඩ විහාරය, කරගම්පිටියේ සුබෝධාරාමය ආදී සවකීය විහාරස්ථානවල වැඩවාසය කරමින් ලෝක ශාසන සංග්‍රහයෙහි යෙදුන මේ මහා වීරවර මාහිමියාණෝ බුඩ වර්‍ෂ 2375දී කළුතර වැල්ලබඩ විහාරයේදී අපවත් වූහ

මේ ඓතිහාසික සිද්ධි ස්මරණය කරමින් මේ දිනවල විශාල උත්සවයක් පැවැත්වෙන කතළුවේ පූර්වාරාම මහා විහාරය පෘතුගීසීන්ගේ කාලයේදී විනාශ කර දමන ලද්දකි. මෙහි තිබුණු ශිලා ලෙඛන සහිත ගල්ලෑල්ල ගාල්ලේ කොටු බැම්ම බැඳීමට ගන්නා ලද බවත් කියති සීතාවක රාජසිංහ කාලයේදී මෙහි සිල්වත්තු වාසය කළෝය.

මේ ඓතිහාසික ස්ථානය පුනර් ජීවයක් ලැබූයේ කතළුවේ ගුණරතනාභිධාන මහා ස්වාමීන්ගෙනි දැන් එහි අධිපතිත්වය දරන කතළුවේ සිරි පඤ්ඤාරංසි හිමියන්හට "කල්‍යාණී වංශොත්තංස ගුණරත්න ශ්‍රී" යන ගෞරවෝපාධිය සමග ගාලු පළාතේ ප්‍රධාන සංඝ නායක පදවියද පිරිනමා ඇත.

(ගුණපාල වීරසේකර) ලංකා දීප පත්‍රය 1958 අගෝස්තු 25

## අම්බලංගොඩ.

අම්බලංගොඩ නාමය පුරාණ ලිපිවල පෙනෙන්නේ "අම්බලම් පියස" නාමයෙනි ක්‍රි. ව. 1400 පමණේදී ගම්පල පිහිටි දෙවෙනි වීරබාහු රජු විසින් මේ ප්‍රදේශය තමාගේ සෙන් පතියෙකුව සිටි කුරුවරාභිජාත රාජපක්‍ෂ මීහ නම්බුකාර අග්‍රකෝන්" නමැත්තාට නින්දගම්කොට පවරාදුන් බව පුරාණ සන්නසකින් පෙනේ.

එසේ දෙන ලද්දේ වන්නිපුර මුක්කරාධිපති චේඩි අර්ශ නමැති සෙන්පතියා හා යුද්කොට ඔහු මරාදැමීම නිසාය මේ පෙදෙසට මාසිම් දක්වා තිබෙන්නේ "බලේසිටුමෝ" කඩින්

මහදම්පා මෝ කඩින් ඇතුළුකොට'' යන වචනවලිනි. එහි බලේ සිටු මෝ කඩ'' නම් බලපිටි මෝදරයි. ''මහදම්පා මෝ කඩ'' නම් දැන් අම්බලන්ගොඩ දකුණු මායිම වන මාදම්පෑ ගඟයි. ''බලේ සිටි'' යන්නෝ තේරුම භට පිරිස සිටි තැන යන්නයි එය කල් ගතවීමෙන් පසු කලක ''බලපිටිය'' වී තිබේ මේ අතර ප්‍රමාණය සැතපුම් තුනකි. මේ සෙන්පතියා විසූ තැන නම් ඒ සන්නසේ තිබෙන්නේ ''පේරඹ කුනත් වාසල තැන් පැමිණියාට'' යන වචනවලින් දැක්වෙන ''පෝරඹ වලව්ව''යයි ප්‍රකටව තිබුණු තැනය.පේරඹ'' යන්න පසු කලෙක 'පෝරඹ' වූ බව පෙනේ. පෝරඹ තිබෙන්නේ අම්බලන්ගොඩ මැද හරියේ උස් පොළොවකය පු රා ණ වලව්ව තිබුනේ දැන් නුග මහ රුකක් හා දේවාලයක් තිබෙන වත්තේය මාගේ ආචාර්‍ය්‍ය වූ පෝරඹ ධම්මාධාර රාජගුරු මහා සථවිරතුමා මේ වලව්වේ උපන් කෙනෙකි. උන්වහන්සේගේ එකම සහෝදරයාව සිටි දොන් ජොහානිස් අබේසේකර මහතා අවිවාහකව සිට මල බැවින් දැන් ඒ පරම්පරාවේ කිසිවෙක් නැත. ඒ පරණ වලව්වේ ගොඩනැගිලි කිසිවකුත් දැන් නැත ඒ අසල තිබුණු විශාල සියඹලා ගස තවම තිබේ. කෝවිලයද දිරාගියෙන් ඒ අසලම දැන් අලුත් කෝවිලක් ගොඩ නංවා තිබේ. පුරාණ කෝවිල ළඟ තිබුනු නාගසක්ද තවම තිබේ.

දැන් ''පෝරඹ වලව්ව'' යයි කියනු ලබන්නේ මෙතැනට සාර දෙතුන් සියයක් ඈතින් තිබෙන ජේ. ද ඇස්. වික්‍රමසූරිය මුදලිතුමන් විසූ තැනටය. ඒ වත්තේ පුරාණ නම ''වඩුගේ වත්ත''ය. ඒ නම ලැබී තිබෙන්නේ කුනත් වාහලේ වඩු වැඩ කළ පිරිස එහි නැවතී සිටි නිසාය. ඒ වඩු පිරිස ගැනද යථෝක්ත සන්නසේ කියවෙන සෙන්පතිගේ පිරිවර දක්වන තැන සඳහන්ව තිබේ. එහි මෙසේ කියවේ. පීළී වැඩූ දිය වැඩූ කන්කානි යන තුන් තිලයදී විජන්ගුරු ජසන්තු අන්ද්‍ර වාස් වන්නකුල යන පටබැඳි යන්ද ගාර්දියේ කෝරලේ කාරිය ලේකම් යන වහන් සම්යෝද......වඩු කියන් ෆෙරෝ නානාය උග්‍ර ලියනක්කාරයෝද මුරපරප්‍රාප්ත උග්‍ර නිවංල් සේනා

සහ ප්‍රදෙශයට තඹ්බු දිමෙල් වාහල් මිණි මුදල් සරක් පරපුරු දැස් පමුණුගම රාජ අස්නයෙන් දී'' මේ වාක්‍යයෙහි ''වඩු කියත් පොරෝනා'' යන වචනවලින් වඩු පිරිසක් ආ බව පෙනේ.

මේ සන්නස දුන්නා පමණක් නොව ඒ කාරණය මාදම්පා මෝදර ගලක කොටවූ බවද, නරගල් මතුයෙහි සත් චක්‍රවර්ති ශ්‍රී වර්ග මුද්‍රගම් පියසෙහි ශිලා ලෙඛන කොට දෙව වදාළ උක්ට යන සන්නස් වාක්‍යයෙන් පෙනේ. මේ සන්නස තිබුණ ගල දැන් කඩාදමා තිබේ. දැන් අම්බලංගොඩ සුනන්ද රාමාධිපතිව වසන අසූපස්වස ඉක්මවූ සිරි සුමන තිස්ස නායක සථවිර තුමෝ කුඩාකාලයේදී එය දුටු බව අප සමග කීහ. ඒ අසලම තවත් ගලක් ''තිරිඳුගේ ගල'' නමින් ප්‍රකට විය. එහි රජුට වාඩිවීමට කොටූ ගල් ආසනයක් විය. ඒ ගලද දැන් අලුත් පාලම් දැමීම සඳහා කඩනු ලැබේ.

''කූනම් වාහල'' නම් පෙර රජුන් රටේ සංචාරය කරණවිට වාඩිකරවා ඔසවාගෙන යන කූනම් තැබූ සථානයයි. අශ්වරථ වලින් යනවිට අසූන් මාරුකරණ තැන් තිබිය යුතුවා සේ කූනම් ඔසවාගෙන යන මිනිසුන් මාරුකිරීමටත් ඒ රජ ඇමති ආදීන්ට නවාතැන් ගැනීමටත් සුදුසු තැන් තිබිය යුතුය. එයින් එකකි මේ ''කූනම් වාහල'' දැන් අම්බලංගොඩ තානායම තිබෙන තැන ඕලන්ද කාලයේ පල්ලියක් හා උසාවියක් තිබුණ තැනකි. ඊට පෙරත් සිංහල රජුන් මේ ගමන්වලදී ඒ සථානයට පැමිණ විවේක ගත්බව කියහැක. දැන් අම්බලංගොඩ සිටින පිරිස මේ සෙන්පතියාගේ පිරිසෙන් පැවතෙන්නන් විය හැක. ජසෙන්තු පටබැඳියකු ගැන සන්නසේ කියවේ. ජසෙන්තු පටබැඳිගේ, ජසෙන්තු ලියන-ගේ නම් ඇත්තෝ අදත් මෙහි සිටිති. අන්ද්‍රවාස් පටබැඳියා තවත් තිලධාරියෙකි. අන්ද්‍රවාස් වනම ඇත්තෝ බොහෝ දෙනෙක් අද මෙහි සිටිති.

''වාස්'' යන්න පෘතුගීසි නමක් යයි තර්ක කළ හැක. එසේ තර්ක කළ හැක්කේ ''වාස්'' යන්න වෙන්කොට ගත් විටය. ''අන්ද්‍රවාස්'' යන්නේ තේරුම ''ආන්ද්‍රවාසි'' යන්නයි

දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර දෙශයෙන් ආ මිනිසුන්ට "ආන්ද්‍ර වංසි" යයි කියනු ලැබේ. එබැවින් "අන්ද්‍ර" යන්න අතහැර "වංස්" යන්න පාවිච්චි කිරීම මූලාවට හේතුවකි.. එය පෘතුගීසින්ගේ වංස් යන්න නොවේ.

මීට පසු 16 වෙනි ශතවර්ෂයේදී මායාදුන්නේ රජු විසින් මේ පෙදෙස "සැටවක තන්තිල" නැමැත්තාට සන්නසකින් දෙන ලදැයි නගර නිර්මාණ ශිල්පී ඔලිවර් වීරසිංහ මහතාගේ ලිපියක දක්වා තිබේ. ඒ තන්තිලද පෙර කී 'රාජපක්ෂ මහ තම්බුකාර" සෙන්පතියාගෙන් පැවත ආවෙකු විය හැක. "තම්බී" නමැත්තෝ මල්බාර් පෙදෙසේ උසස් කුලැත්තෝය. සන්නසේ "තම්බුකාර" වචනයෙන් කියවෙන්නේ මේ තම්බි කුලය විය යුතුයි.

තම්බිගේ වතම ඇති මිනිස්සු අදත් මෙහි වෙසෙති. හිරේවත්ත අසල තිබෙන "තම්බිමුල්ල නමින් අදත් ව්‍යවහාර වෙන ගම් කොටස තම්බි පරපුරය නිසා ඇතිවූවක් විය යුතුයි." එය "තම්බුමුල්ල" නොව අදත් තම්බිමුල්ල බැවින් මේ සන්නසේ තම්බි යන්න තම්බු යයි ලියවී තිබෙන බව පිළිගත යුතුය. තම්බි පිරිසට මලබාරයේ සම්බන්ධකම් තිබේ නම් මලබාරයේ තිබෙන කතකලි කොහොඹ නැටුම් ඔවුන් සමග මෙරටට ආ හැක. අද මෙහි තිබෙන රාක්ස නැටුම මලබාරයේ කතකලි නැටුමට නෑකම් කියන්නැයි ඒවා ගැන දන්නෝ කියත්. එය රාක්ස නැටුම් යයි කියතත් එහි පෙනෙන්නේ නාග ගුරුළු යුද්ධයකි. එකෙකුගේ මූණ නයි පෙණවලින් යුක්තයි. අනිකාගේ මූණ ගුරුළු හොටයෙන් යුක්තයි. නාග ගරුඩයෝ ඉතා පුරාණයේ සිටි මනුෂ්‍ය වර්ගයෝය. ඇතැම් අය මෙය මස් මරණ මිනිසුන්ගේ ගමකැයි ඔප්පුකරන්ට සැරසෙතත් එය නොකළහැකි දෙයක් බව මෙකී කරුණුවලින් තේරුම් ගත යුතුයි. සිංහල ආණ්ඩු කාලවලදී පරදේශීන්ගෙන් ආරක්ෂාව සඳහා තොටමුණුවල යුද්ධසේනා තවත්වන ලදහ. අම්බලංගොඩ එයින් එක් තැනකි. පුරාණ තොරතුරු ගැන මේ ලියුදේ ප්‍රමාණවත්යයි

සිතමි. අම්බලංගොඩ සම්පූර්ණ බෞඩ ගමකි. බෞද්ධ සිද්ධ ස්ථාන දෙළසක් පමණ දූත් නගර සභා සීමාව තුල ඇත්තාහ. ක්‍රිස්තියානි පල්ලියක් හෝ දෙමල කෝවිලක් හෝ මරක්කල පල්ලියක් හෝ නැති ලංකාවේ එකම නගරය අම්බලංගොඩ යයි කියහැකි වීම මේ නගරවාසීන්ට ආඩම්බරයකි. එහෙත් අනාගතයේදී මෙය වෙනස් විය හැක. බෞද්ධ විහාරස්ථාන අතුරෙන්, කරත්තකන්දේ පුරාණ සුභද්‍රාරාමය (දූත් රත්කොත් විහාරය) විලේගොඩ සුනන්දාරාමය, පොල්වත්තේ අග්ගාරාමය, යන තුන පුරාණ ඒවායි. 1808 දී රාමඤ්ඤ රටට ගොස් උපසම්පදාවගෙනා කතළුවේ ගුණරතන තිස්ස මාහිමි තුමා කලක් මේ සුභද්‍රා රාමයෙහි වැඩ විසීය ඒ කාලයේදීම සුනන්දාරාමයෙහි විලේගොඩ පුඤ්ඤසාර නැමති නායක ස්ථවිර තුමෙක් විසීය. ඊට ටිකකලකට පසු පොල්වත්තේ අග්ගාරාමයේ විසූ මිරිස්සේ ධම්මානන්ද නායක මහාස්ථවිර තුමා එකල පාතරට විසූ උගතුන් අතුරෙන් එක්තමක් විය. ඒ කාලයේදී මේ ස්ථානය බොහෝ දෙනෙකුන්ට ශාස්ත්‍රාගම උගන්වන තැනක් විය. දොඩන්දූවේ පියරතන තිස්ස නායක ස්ථවිරතුමා මේ ආරාමයේ උගත් තෙරවරුන්ගෙන් එක් තමකි. මේ මිරිස්සේ නායක මාහිමිතුමා අපවත්වූයේ මින් අවුරුදු අසූවකට උඩදීය.

වර්තමාන බෞද්ධාධ්‍යාපනයට නව පණක් දුන් ශාස්ත්‍රවාසී පී. ද ඇස්. කුලරත්න මහතාද, ශාස්ත්‍රවාසී, ඇල්. එච්. මෙත්තානන්ද මහතාද, අම්බලංගොඩ උපන්නෝය. වර්තමාන පොලිස් පති බස්මන් ද සිල්වා මහතාත් මෙහි උපන්නෙකි. එතුමාගේ පියාවන තෝමස් ද සිල්වා තෝල්ක මුදලි තුමා ධර්මාශෝක විද්‍යාලය නගාසිටුවා මේ නගරයට මහත් සේවයක් කළ මහත්මයෙකි. පළමුකොටම බුරුම රටින් උප සංඝරාජ ධුරයක් ලැබූ දෙවානන්ද නායක හිමිතුමත් මෙහි උපන්නෙකි. අන්තිම වශයෙන් ළඟදී නාලන්දා මහා විද්‍යාලයේ ප්‍රධාන ධුරයට පත් කරුණානන්ද මහතාත් මෙහි උපන්නෙකු බව කියනු කැමැත්තෙමි. මේ නගරයෙහි ඉපිද ලංකාවේ නොයෙක් පළාත්වල රාජකාර්‍ය කරණ නැපැල්

මහත්වරුද. දුම්රිය ස්ථානාධිපති වරුද බොහෝ වෙති.

වඩුවැඩ ගැන මේ ගම මහත් ප්‍රසිද්ධියක් ඉසිලීය. උඩ රට වතුවල වඩුවැඩ ආදී කොන්ත්‍රාත් වැඩ කලවුන්ගෙන් බොහෝ දෙනෙක් අම්බලංගොඩ වැසියෝය. වඩු ආරච්චිවරු කිපදෙනෙක්ද මේ ගමේ විසූහ. අම්බලංගොඩ සුනන්දාරාම මහා විහාරය ඉදිරිපිට තිබෙන විශාල කැටයම් සහිත දොරටු තොරණේ සටහන ඇඳ එහි වැඩ කෙරෙව්වේ දැනට නාට්‍ය ශිල්පියෙකු ලෙස ප්‍රකට ආරියපාල ගුරුන්නාන්සේගේ පියා වන වඩු ආරච්චි මහතාය.

ගැටපත් පැදුරු වීවීමද අම්බලංගොඩට ආවේණික වූවකි රටා හෙවත් සටහන් දමා වියන පැදුරු අතර අම්බලංගොඩ "රටාව"යයි ප්‍රකට රටාවක්ද තිබේ මින් අවුරුදු විසිගණනකට උඩදී අම්බලංගොඩට පැමිණි ජර්මන් මහා පඬිවර "ගයිගර්" මහතාට එයින් පැදුරක් මම පරිත්‍යාග කෙළෙමි. ඒ අවස්ථාවේදී ඒ මහතා කීවේය එය ඒ රටේදී අමූල්‍ය වටිනාකම් කිය නොහැකි) වස්තුවක් වෙන බවයි.

(අග්ග මහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන් වහන්සේ විසිනි)

1955 නොවැම්බර් මස 25 වෙනි සිකුරාදා (ලංකාදීප)

## මොරටුවේ මහා දානපතියා.

### සර් අර්නස්ට් ප්‍රනාන්දු මහතා.

සුප්‍රකට සමාජ සේවකයෙකු වශයෙනුත් මහා දානපතියෙකු වශයෙනුත්, භක්තිමත් බෞද්ධයෙකු වශයෙනුත්, සාර්ථක ව්‍යාපාරිකයෙකු වශයෙනුත් මෙරටේ ජනතාව අතර පමණක් නොව විදේශිකයන් අතර පවා ප්‍රසිද්ධියක් දැරූ සර් අර්නස්ට් ප්‍රනාන්දු (සී. බී. ඊ.) මහතා මේමස 4 වෙනිදා අභාව ප්‍රාප්ත විය. ජාතික පුනරාලෝකයක් පිළිබඳ ප්‍රබල මහජන මතයක් පැන නැගීගන එන මේකල බෞද්ධ අධ්‍යාපන හා සමාජික සාමයික උන්නතිය සඳහා අවංකව වෙර දැරූ ප්‍රනාන්දු

මහතා වැන්තකු අප සමාජයෙන් වෙන්වීම පිරිමැසිය නොහැකි තරම් පාඩුවක් බව කීමට මැලිවිය යුතු නොවේ ශාන්ත ජෝසප් හා ආනන්ද මහා විද්‍යාලයන්හි අධ්‍යාපනය ලැබ සමාජයට පිවිසුනු ප්‍රනාන්දු මහතා සිය දෙගුරුන්ගෙන් තමන්ට හිමිවූ මහා ධනස්කන්ධය තව තවත් දියුණු කර ගනිමින් සමාජ සේවාවන්හි යෙදුනේය පෞද්ගලික දියුණුව මෙන්ම සාමාජික දියුණුව සලසා ගැන්මත් ඒ සමගම රටේ පොදු යහපතට අදාලවන ක්‍රියා කලාපයන්ට හැකිතාක් දුරට සහභාගි වීමත් ඒ මහතාගේ අභිලාෂය විය. ප්‍රනාන්දු මහතා සිය මුළු දිවියම කැප කෙළේ මේ අභිලාෂය මුදුන්පත් කර ගතහැකි වන ආකාරයෙනි.

1904 පෙබරවාරි මස 7 වෙනි දින මෙලෝ එළිය දුටු ප්‍රනාන්දු මහතා ජ්. පි. ඒ, (බෝගල) එස්ටේට් ඇන්ඩ් ඉම්පෝර්ට් සීමාසහිත ජ්. පී. ඒ. (බෝගල) මෝටර්ස්, සීමා සහිත ජ් පී ඒ. (බෝගල) බිල්ඩිංග්ස්, සීමාසහිත බෝගල ග්‍රැෆයිට් යන සමිති සමාගම්වල පරිපාලක අධ්‍යක්ෂකවරයෙකු වූයේය. සීමාසහිතකොළඹ ඇපෝතිකරිස් සමාගමේ සහ ලංකා බැංකුවේත් අධ්‍යක්ෂකවරයා වූයේය. ආදායම් බදු සමාලෝචන මණ්ඩලයේ සාමාජික තනතුරක් දැරුවේය. ලංකා කලා මණ්ඩලයේ උප සභාපති ධූරයක්ද වූයේය.

52 හැවිරිදි වියෙහි සිටි ඒ මහතාගේ අභාවය රටට විශාල පාඩුවකි.

නාවින්නේ අක්කර 18 ක භූමිභාගයේ පිහිටි ජ්. පී. ඒ. ප්‍රනාන්දු මහතා සතු මහා මන්දිරය ආයුර්වේද පර්යේෂණ කටයුතු සඳහා (ආණ්ඩුවට ගත්තම යන බව අගෝස්තු 2වැනි "ඉරිදා ලංකාදීප" යෙන් අනාවරනය කරන ලදී.

"ලංකාදීප 1959 සැප්තැම්බර් 11)
(නව යුගය 1956 දෙසැම්බර් මස 26)

## සර් ලියෝ ප්‍රනාන්දු මැතිතුමා

පානදුරා පලාතේ ප්‍රසිඬ ධනවතෙක්ව විසූ ලියෝ ප්‍රනාන්දු මැතිතුමා කෞරව කුල පරාක්‍රමී මහජන සේවකයෙක් වූද ත්‍යාගශීලි බෞඬ ප්‍රභූවරයෙක් වූද මෙතුමා බුත්තල - ප්‍රදෙශයට කරණ ලද මහජන සේවය ඉතා විශාලය

විශාලය. කලක් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බුත්තල ප්‍රදේශයේ මන්ත්‍රී වරයාව සිටි මෙතුමා ඒ ප්‍රදේශ වාසීන්ගේ සිත් දිනා-ගනිමින් ආගමිකවූද ජාතිකවූද කටයුතු රාශියකට සවකීය ධනය යොදා මහත් සේවයක් කෙලේය. පානදුරං මෝටර්ස් ට්‍රාන්ස්පෝට් කොම්පැනියේ කළමනාකාර අධ්‍යක්ෂක ධුරය දරමින් සේවක පක්ෂයේ සිත් ප්‍රබෝධමත් කරමින් නිහත-මානිව කටයුතු කළ උතුමෙකි. මේතුමා ගැන සන්තෝෂයට පත් රජය මගින් ප්‍රදානය කරන ලද "නයිට්" නාමය ලැබෙනවිට මෙතුමා පරලොව සැපත්වීම නිසා එම ප්‍රීතිය භුක්ති විඳීමට නොලැබිණි. ජාතික වූද, ආගමික වූද, වැඩෙහි නියැලුණු පරාර්ථකාමී ධනවත් මෙබඳු ප්‍රභූන්ගේ අභාවය පළාතට පමණක් නොව මුළු ලක්දිවටම බලවත් සංවේගයට කරුණකි.

## ලක්දිව කතෝලික රාජ වංශය.

මහනුවර වීරවික්‍රම හෙවත් දොන් පිලිප් රජාණන්ගේ පුත්‍ර වූ දොන් ජුවන් නම් ඔටුනු හිමි කුමාරයාගේ විරුදු සංඥාව.

ඉර: සූර්ය වංශයේ ලකුණයි; සිංහයා සිංහල ජාතීන්ගේ ලකුණයි; සිඩි ඔටුන්න: සිංහල රාජයකුගේ ලකුණයි; බලකොටු හත: ප්‍රතිකාල් සිටුවරයකුගේ ලකුණයි. ප්‍රතිකාල් සිටු තනතුරක් මෙතුමන්ට ප්‍රතිකාල් රජ විසින්ම පවරනලදි. ලාකු ඔටුන්න: අපරදිග පිළිවෙලට කුමාරයකුගේ ලකුණයි. සිලා පෝරුවේ ලතින් භාෂාවෙන් ලියා තිබෙන පාඨයේ පිටපත: "මේ දෙව් විමන දෙව් මවුන්ගේ වන්දනාව සඳහා ඉදිකළ කන්ද රටේ කුමාරයාණන්ගේ අස්ථි ධාතුව මෙහි මිහිදන් කර තිබේ." පෙර දක්වන විරුදු සංඥාව සහ සිලා පොරුව දැනට ලිස්බොන් නගරාසන්න තල්හේරාස් නමැති ප්‍රදේශයේ දෙවිස්ථානයක තිබේ.

(යට සඳහන් මහනුවර රාජවංශය බලනු)

සිංහල රාජ වංශයෙන් හා පුරා කතෝලික ආගම වැළඳ ගත්තේ කෝට්ටේ රජ පැමිණි බුවනෙකබාහු නරේන්ද්‍රයාගේ උප කුමරියකු කුසහොත් ජුගෝ බණ්ඩාර නම් කුමාරයායි. මේ රජුගේ ප්‍රධාන මහේෂිකාවට පිරිමි දරු උපතක් නො-

ලැබුණේය. ජුගෝ බණ්ඩාර ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමට සහිටුහන් කරගැනීම සැල වූ වහාම වර්ෂ 1541 දී හේ මරණ ප්‍රාප්ත කර වූයේය. මේ නයින් කල්පනාකරණ කල හෙතෙම ලෙඩින් ප්‍රසාධ ස්නානය ලබාගත්තේ යයි සැලකිය හැකියි.

බුවනෙක බාහු රජුගේ තවත් පුත්‍රයෙක් ජුගෝ බණ්ඩාරගේ සහෝදරයෙක් ගෝවට පලාගොස් එහිදී දොන් ලුවිස් යන නාමයෙන් ප්‍රසාධ ස්නානය ලැබුවේය. හෙතෙම වර්ෂ 1546 ජනවාරි මස 14 දින මසූරිකා රෝගයෙන් මරු වසඟයට පත්විය.

බුවනෙක බාහුගේ බෑණා කෙනෙක්ද (සහෝදරියකුගේ පුත්‍රයෙක්) දොන් ජුවන් යන නාමයෙන් ක්‍රිස්තියානි ආගම වැළඳගත් වහම ගෝවට පලා ගියේය. ඔහුද පෙර කී මසූරිකා රෝගයට ගොදුරු විය. මේ කුමරුවන් දෙදෙනම ගෝවේ ප්‍රන්සිස්කානු තාපසාරාමයේ භූමදාන කරණ ලදුදේය

බුවනෙකබාහුගේ තවත් පුත්‍රයෙක් වර්ෂ 1530 දී දොන් අපොන්සුද නොරොඤ්ඤ නම් යුව රජ විසින් ගෝවට කැඳවාගෙන යන ලද්දේය එහිදී ඔහු පෘතුගාලේ රජුගේ නාමය වූ දොන් ජුවන් යන නාමයෙන් සත්‍යාගම වැළඳ ගත්තට යෙදුනේය මේ කුමරා ගෝවේ ශුධ වූ පාවුළු ශාස්ත්‍ර ශාලාවේ ඉගෙනීම ලබා වර්ෂ 1557 දී පෘතුගාලයට ගොස් කලක් එහි නතරව සිටියේය. පසුව ගෝවට පෙරළා අවුත් පෘතුගීසි කුලඟනක් විවාහ කරගන සිට එහිදී වර්ෂ 1587 දී පරලොක ප්‍රාප්තවූයේය.

ක්‍රිස්තියානි ආගම වැළඳගත් සිංහල කුමාරයන් අතුරෙන් ඉතාමත් ප්‍රසිඹ තැනැත්තා වනාහි බුවනෙකබාහු මහාරාජයාගේ එකම දුවණියගේ පුත්‍රරුවනය ඔහුගේ පියා වනාහි වීදියේ බණ්ඩාර කුමාරයායි. මෙකියන ලද කුමාරයා වර්ෂ 1551 දී රජකමට පැමුණුනේය. හෙතෙම වර්ෂ 1557 දී දොන් ජුවන් යන නමින්ද කුමරිය පෘතුගාලේ අග මෙහෙසියගේ නාමය වූ දෝන කතරිනා යන නාමයෙන්ද ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්හ. දොන් ජුවන් රජුට දරුවෝ නොසිටියෝය.

දෝන කතරිනා කුමරිය පරලොකප්‍රාප්ත වූවාට පසු රජතෙමේ මහනුවර රජ පෙළපතින් තවත් කුමරියකු විවාහ කරගත්තේය. මේ කුමරියද දෝන මර්ගරීද යන නාමයෙන් කතෝලික ආගම වැළඳ ගත්තාය. එතුමෝද දරුවන් නොලැබ මියගියහ. ඊට පසු රජ තුන්වනවරට නැවතත් පහත රටින් විවාහයක් කරගත්තේය. මේ කුමරිය ක්‍රිස්තියානි ආගම වැළඳගත දෝන ඇග්නස් යන නාමයෙන් ප්‍රසිද්ධවූවාය. ඇට දරුවෝ නොලැබුනේය. එනමුත් රජ කාලක්‍රියාකොට අවුරුදු ගණනක් යන තුරුත් ඈ ජීවත්ව සිටියාය. දොන් ජුවන් රජ වර්ෂ 1597 මැයි මස 27 දින පරලෝකප්‍රාප්තවත්ට සෙදී කොළඹ කොටුවේ ශුද්ධවූ ප්‍රන්සිස්කු මුනිඳුන්ගේ දෙවස්ථානය ඇතුලේ භූමිදාන කරන ලද්දේය. දැනට "ගෝර්ඩන් ගාර්ඩන්ස්" යන නාමයෙන් අඳුන්වන්නේ (රජගෙදර උයන) ඒ දෙවස්ථානය තිබුනු ඉඩම වේ. විදිය බණ්ඩාරගේ සහෝදරවූ මාදම්පේ තම්මිට සූරිය බණ්ඩාර කුමරා බුද්ධ ධර්මය ප්‍රතික්ෂෙප කොට වර්ෂ 1555 දී දොන් ප්‍රන්සිස් යන නාමයෙන් ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්තේය. මේ තෙම බුවනෙකබාහු රජුගේ ගබඩා නිලම ධුරයද දොන් ජුවන් රජු කුඹ කල්හි එතුමා වෙනුවෙන් පති රජකම ඉසිලීය.

**මහනුවර රාජ වංශය.**

මහනුවර රජ පරපුරෙන් ප්‍රථම වරට ක්‍රිස්තියානි ආගම වැළඳගත්තේ මහනුවර රජවූ වීරවික්‍රම රජුගේ දූවණියවිය. ඈ කෝට්ටේ අවසාන නරපතිහුගේ කුමරිය වූවාය. ඇගේ නාමය දෝන කතරිනා විය. කෝට්ටේ දොන් ජුවන් රජු දෙවන වරට විවාහකරගත් දෝන මර්ගරීද ඇගේ සොහොයුරියවූවාය. ඔහුගේ පින් දොන් ජුවන් රජකමට පැමිණියේ නමුදු කොනප්පු බණ්ඩාරට භයෙන් රජකම හැරදමා යන ලද්දේය. ඔහු ඉගෙණීම පිණිස ගෝවටද එතනින් ලිස්බන් නුවරටද ගොස් එහිදී පූජක වරය ලබාගත්තේය. ලිස්බන් නුවරට ආසන්න තෙල්හිරාස් නම් පුරයෙහි ජීවත්ව සිට එහිදී වර්ෂ 1642 අප්‍රේල් මස 1 වන දින පරලෝ ප්‍රාප්ත විය. ඔහු විසින් ගොඩනගන ලද දේවස්ථානයේම භූමදානය කරනු ලැබීය. මේ දේවස්ථානය දැන් ජරාවාස වී ගොස් තිබේ.

කරලියද්ද බණ්ඩාරගේ අතදරු දූවණිය දොන කතරිනා යන නාමයෙන් ප්‍රසාධ ස්නානය ලද්දය. මන්නාරමේ ඇති දූඹිවූ මේ කුමරිය පෘතුගීසීන් විසින් මහනුවරට කැඳවාගන වින් සිංහාසනයේ තබන ලද්දීය. මහනුවර වැටලූ කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් පරදවා දොන කතරිනා සරණ කර ගත්තේය. රජුගේ නිධනප්‍රාප්තියෙන් පසු ඕතොමෝ සවල්ප කාලයක් රට අනුශාසනා කළාය. ඊට පසු සෙනරත් ඈ පාවා ගෙන මහනුවර රජකම හිමිකර ගත්තේය. ක්‍රිස්තියානි කාර යන් නොවූ රජවරු දෙදෙනෙකු ඈ සරණ කරගත්තේවී කමුදු ඈ ක්‍රිස්තියානි ජීවිතයක් ගතකර වර්ෂ 1616 ජූලි මස 20 දින ජේසුනි යන වචනය උච්චාරණය කරමින් සිටියදීම ප්‍රාණය නිරුඬවිය.

සෙනරත් රජ නිසා ඇතිවූ ඇගේ පුත්‍රයාන කෙනෙක්වූ මාතලේ විජයපාල කුමාරයා ‡ගෝවේදී දොන් තියඩෝසියෝ යන නමින් වර්ෂ 1646 ‡දෙසැම්බර් මස 8 දින ක්‍රිස්තියානි ආගම වැළඳගෙන සිට එහිදී වර්ෂ 1654 දී පරලෝකප්‍රාප්ත විය. ගම්පල පරපුරෙන්ද කුමාරයෙක් දොන් ප්‍රන්සිස්කු යන නාම-යෙන් ක්‍රිස්තියානි කාරයෙකුව විසුවේය. රාජසිංහ භූපති පත්නාහැර ජමසිංහ හෙවත් දොන් පිලිප් රජකමට කැඳවූයේ මොහුය ඔහුගේ සහෝදරයාවූ දොන් ලූවිස්ගේ පුත්‍ර දොන් පිලිප් බොතැල්ගෝ පූජා ප්‍රසාදී කෙනෙක්වී පෘතුගාලේදීම දිවංගතවූයේය.

(ඥානාර්ථප්‍රදීපය. 1939 දෙසැම්බර් මස 23 සෙනසුරාදා)

## ගොන්ගාලේගොඩ බංඩාගේ පරපුර.

1848 මහා කැරල්ල මෙහෙයවූ † "පුරන්අප්පු රජ තුමාගේ" ප්‍රධාන අනුගාමිකයාවූද, මාතලේ දකුණු ප්‍රදේශයේ හමුදුවන් මෙහෙයවූ ගොන්ගාලේගොඩ බංඩාගෙ පරපුර ගැන

---

† කුරුකුල චරිතයේ පලමුවෙනි කාණ්ඩයෙ 268, 269, 270, 271, යන පිටු ගොන්ගාලේගොඩ බංඩා සහ පුරන්අප්පු රජතුමා ගැන විස්තර වශයෙන් ලියා තිබේ.

යමක් කීමට ඉඩ දෙනු මැනවි පැලියගොඩ උපන් ගොත්ගාලේගොඩ බංඩා වහුත්පුර දේවගේ පවුලට අයත් වූවෙකි. මේ පවුලේ ආදීම තැනැත්තා දෙවෙනි රාජසිංහ මහරජ තුමාගේ සෙන්පතියෙක්ව සිට දේව යන ගරු නම් දැරුවෙකි. ගොත්ගාලේගොඩ බංඩාගේ පියාවූ වහුත්පුර දේවගේ සින්චිප්‍රනාන්දුට සහෝදරියන් දෙදෙනෙක් සිටියාහ. එයින් වැඩිමහලු දූ, ලින්චිගෙ පුත්‍ර ඩිංගි හෙවත් හගුරන්කෙත රාල හත්කෝරලේ සිංහල යුධ හමුදාව මෙහෙයවූයේය. අනිත් සහෝදරියවූ නොන්චිගෙ මැනියන්වූ නවගමු දේවගේ මොංසිනා ප්‍රනාන්දුගේ මුත්තනියයි. ඇගේ සොහොයුරා කැලනියේ හිඹුටුවැල්ගොඩ සහ වනවාසල යන ගම්වල ගම්මුලාදෑනි පදවිය දැරුවේය. වහුම්පුර දේවගේ සින්චි ප්‍රනාන්දු උඩරට වෙළඳ කටයුතුවල යෙදී සිටියදී උඩරට කාන්තාවක් විවාහ කරගත්තේය. ඔහුගේ දරුවන්වූ දාවිත් හා දිනෙස් කලක් හිඹුටුවැල්ගොඩ පදිංචිව සිට පසුව සිය මැණියන්ගෙ ගමට ගොස් ඇගේ පරපුර හිමි කපුරුපස්සරාලලාගේ යන වංසගම යොදාගත්තේය. "ශ්‍රීවික්‍රම සිඩිපති" යන නම ගොත්ගාලේගොඩ බංඩාට හිමිවූයේ මේනිසාය. කපුරුපස්ස බංඩලාගේ දාවිත් උඩුනුවර ගොන්ගාලේගොඩ මැනික්රාල නැමැත්තාගේ දියනියක් සමග විවාහ විය. ඔහු එවක් පටන් ගොත්ගාලේගොඩ බාඩා යන නමින් හඳුන්වනු ලැබීය. ඔහු රජුවසයෙන් ප්‍රකාශ කරන අවස්ථාවේදී දියවඩන නිලමේ විසින් ඔහුට සළු පලඳවන ලදී. බෞඩ භික්ෂුවක්ව සිටි කෝන්ගොඩ සාමි ඔහුගේ මහ අධිකාරම විය. උඩුනුවර අලුදෙනියේ උඩරට පවුලකම විවාහවූ ගොන්ගාලේගොඩ බංඩාගෙ සහෝදරයෙක්වූ දිනෙස්ද උඩරට පවුල්වලට ඇතුලත් කරගන්නා ලද බව, ගලගොඩ හිටපු රටේමහතා විසින් ප්‍රකාශ කරන ලදී.

(මීට - මුහන්දිරම් පී. වාල්ස් ඇfප්. රත්නසේකර

කැලනිය. 1949 ඔක්තෝම්බර් 23, සිළුමිණ පත්‍රය)

## දේපල හෙවත් වස්තුව පිළිබඳව සිංහල නීතිය.

## දළදා වහන්සේ පොදු වස්තුවකි.

දේපල හෙවත් වස්තුව පිළිබඳව පැරණිසිංහල නීති ක්‍රමය මෙසේයි:

"වංචල නිශ්චල කියාද, සවිඤ්ඤාණ අවිඤ්ඤාණක කියාද, ද්‍රව්‍යවත් කියාද, (දේපල හෙවත් වස්තුව) ප්‍රභේද කොට ඇත්තේයයි දතයුතුයි. වංචල වස්තුව දාසි දාස් ගව මහිෂ රන් රිදී පිළිපත් ඝන ධාන්‍ය දේවල්ය. සවිඤ්ඤාණක දේවල්නම් සිත් ඇති, සතර ධාතුවෙන් යුත් ප්‍රාණ ඇති සත්වයෝය. අද්‍රව්‍යවත් දේ නම් වංශය හෙවත් කුලයද නම්බුව හෙවත් උරුමවාසි ආදී සන්තක නාමවල්ද නතතුරු ආදියද අද්‍රව්‍යවත් වස්තු නම් වෙති මෙසේ දක්වන වස්තුවලින් රුවන් ආකර, මුතු අංකර යම් වැසියෙකුට හිමි නොවූ ආරණ්‍යාදි භූමි ප්‍රදෙශද එසේවූ සථානයක ඇතිවූ නිධාන් ආදියද රජුන් සන්තකය. මෙම ලංකාවේ දළදා ධාතූන් වහන්සේ රජ්ජුරුවන් ඇතුළු රටවාසීන් සෑම අයටම අයිතිය, හිමිය.

යම් රටක නොහොත් දිශාවකට කොඩි ආදී දේවල් රජුන් විසින් ලැබුනේවීනම් ඒවා එරට වාසීන් සියල්ලන්ටම හිමිය. යම් ඔයක් හෝ රජුන් විසින් බන්දවා තිබෙන වැවක් හෝ ඉබේටම තැනී තිබෙන විලක් හෝ ගමේ සියල්ලන් විසින් සාරවා තිබෙන විහාර, දේවාල, අම්බලම්, ගොණවූ, ඇල, අමුණු ආදිය හෝ ඒ ගමේ සෑම අයට හිමිය. වංශයටද වතම්වලටද හිමිවූ ඨානාන්තරද, පණිවිඩද, ඒ ඒ ජම්ම වලට හිමිවීය. යම් ගෝත්‍රයක අයට රජුන්ගෙන් ලැබී පරම්පරාවට පැවතගත එන්නාවූ සන්නස්, තුවක්කු, කඩු, කස්තානාදිය ඒ ගෝත්‍රයේ සෑම අයට හිමිය.

පුද්ගලයන්ට දා හිමියෙන්ද, වදා හිමියෙන්ද, ලත් හිමියෙන්ද යන මේ ත්‍රිවිධාකාරවලින් අයිතිවූ දෙය පුද්ගල සන්තකයයි දතයුතුයි. ජාතක පියාණන්ගෙන් හෝ පිය පක්ෂයේ අත්තා, මුත්තා වන කෙනෙකුගෙන් හෝ ඒ පක්ෂයේ වෙන

තැනෙකුගෙන් හෝ ජාතක පියා වැනී අයගෙන් පැවත එන බව කරණකොට ගෙන වස්තු අයිතිවේද, ඒබව පිය උරුමයයි දතයුතුයි.

ජාතක පියාණන්ට ඔහුගේ දරුවෙකුගෙන්වත් මුණුබුරු කෙනෙකුගෙන්වත් උරුම වන බව ජාතක උරුමයයි දත යුතුයි.

**මෙවක් ත්‍රිප්‍රකාර උරුමවාසි ද හිමි වන්නෝය,**

වැදූ මැණියන්ගෙන් හෝ මවුපසේ අත්තා මුත්තා වන කෙනෙකුගෙන් හෝ ඒ පක්ෂයේ වෙන කෙනෙකුගෙන් හෝ එවැනි මවු කුසයෙහි උපන් බව කරණකොටගෙන වස්තු අයිතිවේද, එය මවු උරුමයයි දතයුතුයි. වැදූ මව්හට ඒ වැදූ දරුවෙකුගෙන්වත්, ඒ දරුවාගෙන් පැවත ආ මුණුබුරු කෙනෙකුගෙන්වත් උරුමයෙන් වස්තු අයිතිවේද, එය දරු උරුමයයි දතයුතුයි.

මෙනම් ත්‍රිප්‍රකාර උරුම වාසි හිමි වන්නේය. තමාගේ විශිෂ්ප්‍රයෝගයෙන් සපයාගත්තේද, වස්තු හිමියාට උපස්ථාන කොට ලැබුයේද, ඒ මිල මුදල් ආදී දේ දෙමින් ගත්තේද, දුවැද්ද ත්‍යාගි වශයෙන් ලැබූතේද, රාජකාරුණාවෙන් ලැබු-නේද, මෙසේ කොයි ප්‍රකාරයකින්වත් අයිතිවන දෙය ලත් හිමි යයි දතයුතුයි.

(පැරණි සිංහල නීති ග්‍රන්ථයකිනි. 1944 සැප්තැම්බර් මස 10 ඉරිද සිළුමිණ)

## CHIEFTAINS IN NORTH CEYLON.

The Following, who claims ancestry from the Pandyan Kings of South India and who are of **Kshattriya** dynasty and who have done civil and military duties.

(Who are the Kuru - Kulams of Jaffna?)

(Pages, 26 - 27 and 28,)

## උතුරු ලංකාවේ කුරුකුල ප්‍රධානීන්ගේ නාම සහ පෙළපත්

දකුණු ඉන්දියාවේ † පාන්ඩ්‍ය රාජ පරම්පරාවෙන් පැවත එන්නාවූ ක්ෂත්‍රියවංශයට අයත් පහත සඳහන් අය සිවිල් සේවය සහ යුද්ධ හමුදා රාජකාරිවල යෙදුනාහ.

---

† පාන්ඩිය රාජ පරම්පරා ගැන කුරුකුල චරිතයේ පළවෙනි කාණ්ඩයේ, 30, 31, 32, යන පිටුවල සඳහන්ව තිබේ.

1. දෙන් දියෝගෝ වාස් පුවිරාජසිංහ මුදලියාර්.
2. දෙන් ජුවන් පුවිරාජසිංහ.
3. මානුවෙල් තම්බි පුවිරාජසිංහම්.
4. c දෙන් දියෝගෝ වර්ණසූරිය අරශතිල සිට්ට මුදලියාර් (රුස්පඡෙර් අන්ඩර්දඞව්)
5. කතිරගාම පුලවර්.
6. දෙන් නිකුලස් තිස්ස වීරසිංහ මුදලියාර්.
7. අන්තෝනි සිත්තතම්බි මුදලියාර්.
8. දියෝගෝ පිල්ලෙයි මුදලියාර්.
9. දෙන් ගැස්පර් සතුරුකුලසිංහ මුදලියාර්.
10. දෙන් පිලිපර් මුදලියාර්.
11. විතාසි තම්බි සිත්තම්පරමනාථ මුදලියාර්.
12. පුවිමානසිංහ මුදලියාර්.
13. එදිරිමානසිංහ මුදලියාර්.
14. ලාසරස් අන්තෝනි පිල්ලේ මුදලියාර්.
15. මතගපුලිසිංහ මුදලියාර්.
16. කන්දප්පසේකර මුදලියාර්
17. සේගමන්නසිංහ මුදලියාර්.
18. ගුණවීරසිංහ මුදලියාර්.
19. රාජනායක මුදලියාර්.

(ජාපනයේ කුරුකුල වංශවතුන්ගේ නාම)

---

c "වරුණකුලතා" නමින් කාරාවේ මිනිසුන්ට 'රෙගුලෝ' ගේ, ඉන්දියා ඉතිහාසයෙහි සහ යාපනයේ ඉතිහාසයෙහිද ලියා තිබේ. සංස්කෘත භාෂාවෙන් වරුණකුල ආදිත්‍යයන්ත මෙසේ දෙමල භාෂාවට වරුණකුලතා යයි ලියා තිබේ. ජාප-නයේ ඉතිහාසයෙහි ජාපනේ වරුණකුලතාර් ඔහුගේ 500 ක් සේනාව සමඟ ජාපනේ සංකිලි රජු සමග සටන් කර රජුද ඔහුගේ මුදලිවරුද පරාජය කළ බැව් කියාතිබේ. පසුව පරංගි ඔලිවේරා ඔහුද පරාජය කෙලේය. මෙම වරුණකුලසූරිය වරු වනාහි "නායක්වරුය" ඔහු ප්‍රදේශ ආණ්ඩුකාර ප්‍රභූ කුමාර වරු වෙති. දකුණු ඉන්දියාවේ සිටි "වෙම්නායක්" නැමැත්තාටද වරුණකුලතා යයි රෙගුලෝ විසින් කියා තිබේ

(අගස්ත්‍ය සෘෂිවරයාගේ පියාද "වරුණය")

## මාන්තෝට්ටම් මන්නාරම් ප්‍රදේශයේ කුරුකුල ප්‍රධානීන්.

1. දොන් මතියස් පුවිමානසිංහ මුදලියාර් (අධිකාරි සහ ජේ. පී.)
2. *d* දොන් තුයොගු රාජකරියාර් කුරුකුලසූරිය අරස තිල-සිට්ට එදිරිමානසිංහ මුදලියාර් (ප්‍රධාන මුදලියාර්)
3. දොන් ඩේවිඩ් රත්න මුඩිකාට්ටු වණ්කුලසිංහ මුදලියාර්.
4. දොන් තලතාතු රත්නසිංහ වච්චනාථ තේවර් මුදලියාර් (අධිකාරි)
5 මනුවෙල් වණ්කුලසිංහ (මුතුකිම්දීමේ පාලකතැන)
6 දොන් නිකුලස් පුවිමාන්නසිංහ මුදලියාර් (අධිකාර් රෙජිෂ්ටර් සුපිරින්ටැන්ඩන්ට්)
7 දොන් ඩේවිඩ් වණ්කුලසිංහ මුදලියාර්.
8 ඒ. සතුරුකුලසිංහ මුදලියාර්.
9. එදිර්වීරසිංහ මුදලියාර්.

### වරායවල ප්‍රධානීන්.

1. අරසතිලසිට්ට චොතාලියර් සන්තියාගෝ පිල්ලේමනිගාර් (කරෙඋෆර්)
2. සන්තියාගෝ පිල්ලේ සීමන් අඩප්පන් (කරේබ්ර්)
3. කන්තාන් මූරුගන් *b* පට්ටන්කට්ටි (කොළඹගම්)
4 කදිර්ගාම තම්බයියා *a* අඩප්පන් (පොයින්ට්පේද්‍රුරු)
5. වයිරවනාථ වේලදයුදම් අඩප්පන් (වෙල්වෙට්තුරෙයි).

(Who Are The Kuru - Kulams of Jaffnas.)

---

*d* ජාපනේ ඉතිහාසයෙහි සඳහන් "කුරුකුලතා"ට ඇස්. ජී. ප්‍රේරා පියතුමා අමතනු ලබන්නේ "කෞරව වංශිකයින්ගේ ප්‍රධානියා" කියායි.

# ශ්‍රේෂ්ඨ උත්තම උත්තමාවන් කීපපළකගේ ගුණ වැනුමක්.

ෘ බුදුරකිත තෙර, ගුණරුවන්තිස්, සිරිසුමගුල්, නාහිමිදු සඳ
දෙවිතදත සඟරදද, බුදුදත් * අග මහාපඩි හිමිතුමා නොද
සාගර සහ වේද වියසර, කුරු, බරත චෛතිය විජය ද
තිරිදු සිහ, සිරිවිකුම් රජසිහ, තෙදැති පිත්සර නරපතිහු ද

---

ℓ "පට්ටත්කට්ටි" "කරාවේ" සහ පර්දර් ගෝත්‍රවලට අයත් ආදායම් අයකරන්නෝ සහ ප්‍රධාන මූලාදෑනිවරුය.

(කුරුකුල චරිතයේ පළමුවෙනි කාණ්ඩයේ 42 පිට)

a "අඩප්පත්" නොහොත් "අඩප්පනාර්" භාරත වංශ යෙන් නොහොත් කෞරව වංශයෙන් පැවත එන පරදර් වර්ගයාගේ ආණ්ඩුකාරවරුන්ට "අඩප්පනාර්" යයි කියනු ලැබේ. මදුරාසි ද්‍රවිඩ මහ අකාරාදියේ මීට අර්ථ එසේම දී තිබේ.

මෙය පැරණි ලිපිවල සිංහලෙන් අඩප්පයා යයි ලියා තිබේ. "හුලංගමුවේ කලුඅඩප්පයා" "සෙම්බුගතුරෙයි කුරණ අඩප්පයා" වශී 1803 දී ලියන ලද සත්කෝරලේ ලේකම් මිටියේද අඩප්ප නාමයත් ලියවී තිබේ එයින් කීපයක් නම්, තෙරියාවේ අඩප්ප උත්තෑහේ, මොරගොල්ලේ "අඩප්ප උන්නැහේ" යයි කියායි සත්කෝරලේ මේ ගම්වල කුරුකුල වංශිකයින් අද දක්වාමත් ගම්කාරයින්ව සිටිති.

මේ "අඩප්ප" නාමය කෞරවයන්ට පමණක් උරුම නාමයකි.

තෙරියාවේ ඇති විශාල ගල් පරුවතයකට කුවේනි උත්තු ගල යයිද "කුවේ ගලයයිද" කියති. විජය රජ්ජුරුවන් සමග පැමිණි රාජකීය පිරිස කුවේනි විසින් සඟවා තබන ලද්දේ මෙහියයිද කියති. තවද සත්කෝරලය බද කුරුකුල ජනයාට අයිතිව තිබුන ගම්වලින් රාශියක් දැනට අන්‍ය අය අතට පත්වී තිබේ එයින් ගම් කීපයක්නම් ගිනිකාරාව, කුරුකැටිය, මුරතිහ, පිහිම්බුව, තෙප්තානේ, පොල්පිටියමඩ, කොටගෙදර, සහ ගම්ය.

කු ම ර  තමෙලුත්, කුරුවේන්ද්‍ර අරශත්,
කුරවසිංහ වන්නි බණ්ඩාර  යත

ප ව ර  අන්තෝනියො බැරැත්තෝ,
මනුවෙල්දියස්, නම්නී ගරු  වත

ස ම ර  කෝන් පරතන්ද්‍ර, අන්ද්‍රදි,
මානික්කතලවේන්ද්‍ර, තම  වත

එ ව ර  විසු කෝච්චිටන්ද,
කුරුවීර පුරන්අප්පු නම්නී සහො  බත

තෙ ද ණ  යුතු පැලවාද, පාලව කුමාර
වන්නි මුදියන්සේද, ගුණ  තැණ

සෙ හෙ න  වැජඹුන යුවරජුන් හා
මහා මැතිවරු රණ සූර  යත

සො දි න  සුදවැද රුපුන් එඹිබිඳ
ජය ලබා සිතුලෙස දිනෙන්  දිත

නි නි න  සිරිලක ජයකෙහෙළි බැඳ
පරපුරය රැක දුන්නෙ කුළ  ණිත

---

[2] මහා විහාරවංශික ශ්‍රී බුද්ධරක්ඛිත මහා ස්වාමිපාදයන් වහන්සේ (පාලි ජනවංශ කර්තෘ)

කල්‍යාණි වංශ නිකායේ ආදි කර්තෘවර, කතළුවේ ගුණරතන තිස්ස මහාස්වාමිපාදයන් වහන්සේ.

කළුතර පුලිනතලාරාම මහා විහාරාධිපතිව වැඩ විසූ වැලිගම ශ්‍රී සුමංගල නායක ස්වාමිපාදයන් වහන්සේ.

අම්බලංගොඩ රත්කොත් විහාරාධිපතිව වැඩවිසූ අම්බලංගොඩ ශ්‍රී දේවානන්ද උප සංඝරාජ මාහිමියන් වහන්සේ.

* බේරුවල මංගල පරිවේණාධිපති සද්ධර්ම වාචස්පති සාහිත්‍යාචාර්ය මේධා ශ්‍රී තෙල්වත්තේ ශ්‍රී ආර්යවංශාභිධාන ශ්‍රී කල්‍යාණිවංශ මහානිකායේ මහා නායක ස්වාමිපාදයන් වහන්සේ සහ දැනට ශ්‍රී කල්‍යාණිවංශ මහානිකායේ මහා නායක ධුරන්ධර අම්බලංගොඩ පොල්වත්තේ අග්‍රාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ශ්‍රී බුද්ධදත්ත මහා ස්වාමිපාදයන් වහන්සේද යන දෙනමම නිකායාභිවෘද්ධිය වඩමින් වැඩ වෙසෙති.

4. ලොව පරසිදු සිරිමත් කුරුකුලසේකර
සොයිසා මහදක සිටු වෙති
වික්‍රමැති-මැල්, පීරිස්, සහ දියෙස්ද,
පරනන්දු, පෙරේරා, නම් යුති
කුරේ, අමරසූරිය, ෆොන්සේකා,
ජයවික්‍රම තෙ දැති
සිල්වා, සල්ගාදු සමග සඳසේකර
මහ දනපති

5. කාරවන්තිද, මච්චගන්දි
අම්බාද ගන්ධාරි නම් වත
වීර වූ සෙට සකුන්තල සහ
විජයි අම්බාලිකා වත
දීර සොයිසා මැතිණි සහ ජේරමියස් කුලහන
ලකෙහි බැබලුණ
සූර ආනර් සිල්ව මැතිණිද, කුරේ
නම් දූරු කුලකතුන් වත

6. තිතින කුරුකුල පරපුරය
තිසි විලස හෙබවූ උතුම් පිරි සද
සොඳින සිරිලක සිහල ජාතියෙ
දිනූ අන්කුල සමරකොට සෙද
තුටින සව්සත රකින ගොවිදුද,
කඳකුමරු ඈ සුරන්හට වැද
යෙහෙන ලක සහ ජාතියද
පරපුරද රැකුමට ගදිම් හැම සද

දෙදහස් පන්සියයේ බුඩ ජයන්ති මංගල උළෙල නිමිත්තෙන් දඹදිව සහ සිරිලක අතිශ්‍රේෂ්ඨ සම්භාවනීය උත්තමයන් සවල්පදෙනෙකුගේ ගුණසමරම්න් මේ කවි පංතිය පළකරම්හ.

දෙවීනුවර-ඒ. තේනාබදු නො: 249 පුත්තලම් පාර,
කුරුණෑගල

වරුණකුල සහ කුරුකුලය ගැන ස්කන්ද පුරාන නැමැති ග්‍රන්ථයෙ ඇති කාව්‍යයක් යාපනයේ 'කුරුකුලයෝ කව්ද' යන පොතේ මෙසේ සඳහන්ව තිබේ.

கங்கை வடுண குடுகுலமாம் கதிசேர் அனும்த்தது மதுவும்
செங்கை முஞிகன் கலைமகளும் திருவுய் பிரறந்தது அக்குலத்தே
அங்கன் மரபில் நூற்றுவரோடைவர் பிறன்தார் இமயமலை
மங்கை பிறந்தள்! ஆதலினுல் மறபிற் பெரியது வடுணகுலம்

මෙම කාව්‍යයන්හි කෙටි විස්තර:-

සෘෂිවරයින්ගේද පූජනීය උත්තම උත්තමාවන්ගේද උප්පත්තිය ලැබූ මේ වර්ණකුලය සහ කුරුකුලය ලොව ඇති උසස් කුල බැව් ප්‍රකාශයි.

මෙය Aස්කන්ධ පුරාණ නැමැති සංස්කෘත භාෂාවෙන් ලියා තිබුණ ග්‍රන්ථය කාඤ්චිපුර නුවර ශිව දෙවාලයේ සිටි

---

මැදින්නොරුවේ

xනවරත්නසිංහ ඉරණසිංහ සීතාවකරාජසිංහ රජ්ජුත්දවස නාවක්කාඩුවේ විසූ නවරත්නසිංහ, ඉරණසිංහ රාජවන්නි උන්නැහේගේ මරණින් පසු ඔහුගේ එකම දියණිය වූ නව-රත්නසිංහ ඉරණසිංහ නාගම්මාතේවරේ x වන්නි ආච්චි විසින් වන්නිකම ලබාගෙන සිටි බවත් (අන්‍ය කුල) සතුරෙකු විසින් පොල්ලකින් ගසා ඔලුව පලා ඇය මැරූ බවත් එවක් පටන් වන්නියේ ''ඔලු පැලීයාව'' නම් ගමක්වූ බවත් කට-කථා ව්‍යවහාරව එති. ඔලුපැලියාවට කිට්ටු ගම් කිපයක් ''කෝන්ගොල්ල, කහගොල්ල අංදී නම්වලින් ප්‍රසිඬව තිබේ. මේ ගම්වල කුරුකුල ජනයා වැඩි වශයෙන් සිටිති.

කුරුකුල ජනයා ඔවුන් 'සූරිය කරාව'යයි 'චන්ද්‍ර කරාව' යයි කියා ගනිති. අන්‍යයන් ඔවුන්ට 'කෝන් කරාව' යයි කියති. ද්‍රවිඩ භාෂාවෙන් කෝන් යනු රජුට සහ ඇතැම් විට එඬේරුන්ටද ව්‍යවහාර කරණ නමකි.

තේවර පටබැඳිගේ, තේවර තංත්‍රිගේ, තේවර් මඩුගේ යන අය දේවර් හෙවත් තේවර් නැමැති ප්‍රභූ කුමාරවරුන්-ගෙන් පැවතෙන්නෝ වෙති.

කච්චි අප්පා ශිවාචාරියර් පඬිතුමා විසින් දසවෙනි ශත වර්‍ෂයේදී දෙමළ බසට පරිවර්තනය කරණලද ග්‍රන්ථයෙහි ඇතුළත් කාව්‍යයකි එහි වණ්ණකුලය සහ කුරුකුලය උතුම් කුල බැව් සඳහන්වී තිබේ. 1823 - 1879 යන වර්‍ෂ තුල යාපනයේ ආරුමෝගත් නාවලර් නැමැත්තෙකු විසින් ස්කන්ධ පුරාණ ග්‍රන්ථයේ ඇතුලත් උසස් යයි ප්‍රකාශිත වණ්ණකුලය සහ කුරුකුලය අස්කර තවත් පොතක් ලියා තිබේ. ඊට පසු යාපනයේ වැල්වෙට්ටිතුරේ වෛතිලිංගම් පිල්ලෙයි නැමැත්තා විසින් වෙනස් කරණ ලද කුලවල වරද හරිගස්සා චින්තාමණි නිඝණ්ඩුවට ඇතුළත් කරණ ලද බැව් යාපනයේ කුරුකුලයෝ කවුද? යන ග්‍රන්ථයෙන් මනාකොට පැහැදිලි වේ

බොම්බායේ රාජකීය ආසියාතික සමාගමේ 7 වෙනි ජෝර්නල් පොතේ කරාවේ මිහිසුන් රාජවංශයක් බව කියා තිබේ. කුරුගෙන් පැවත එන චංද්‍රවංශික කරාවේ උදවිය දඹදිව පළමුවෙනි රාජ වංශයක් බව රුද්‍රදම නම් චංද්‍රවංශික රජු විසින් කරවන ලද ශිලා ලේඛනයෙහි සටහන් කරතිබේ

(ක්‍ෂත්‍රිය වංශ පොත මුද්‍රණය 1910)

## පටබැඳි පේරුව.

1 සිරිලක වන්නි බ ද
නාවක්කාඩු ජන ප ද
පට්ටන් කට්ටි ප ද
දූරුව රාජා වන්නි මැති ස ද

2 ×නවරත්න සිංහය
පටබැදි ඉරණ සිංහය
රජ වන්නි සිංහය
ඔහුට මුණුබුරු දේව සිංහය

3 කා බී අඳින්ඩ ත්
හිත කය සැප ලබන්ට ත්
ඉන්නට හිටින්ඩ ත්
සියල් සිරිමට මදක් අඩු නෑ ත්

4 එනිසා මැඹක් ව ද
පටබැඳි පේරු නම් ල ද
පුවත අසනා ලෙ ද
කියමි හෙළදිව බසින් පද බැ ද

5 පටබැඳි පේරුව ද
සිරිලක ඔවුන් කවුරු ද
වත ගොත යට වග ද
අසව් සුදද ෙනි යොමා සවත ද

6 දෙමළ සිංහල ය ත
බාසා මදක් දැනු මෙ ත
පෙර පටබැඳි හට ත
කෝළෙම් ඉවසනු මැනවි පඬි ද ත

7 කිරි මවුන් මරා ලා
සිරස දෙකඩට පලා ලා
වත් නික්ම උදුර ලා
ලැවෙ අහො අප තල්ලුකර ලා

8. කතරගම දෙවිඳු තේ
තෙදැති විබිසන සුරිඳු තේ
අනඩු කට හට අ තේ
දෙවන් මර ඔබ අණින් සෙදි තේ

9. සීතාවක රජු ත්
A රාජසිහ ටිකිරි දෙවිය ත්
යුගයෙ කාරියවස ත්
විදානේවරු ගොතා කේල ත්

---

A රාජසිංහ මහරජානන් විසින් ශාලි වාහන ශක රාජ වරුෂයෙන් වික්‍රම වරුෂ 1671 කේ ඉල්මස 11 වෙනි සඳුදින සූරිය ප්‍රකාශ සුව ශෝභන ශ්‍රී සත්තස් පත්‍රයෙන් තවරත්න-සිංහ ඉරණසිංහ රාජවන්තියාර් යන "කාරාවේ"කුල ඇත්තාට නාගුළු ගඞ්තෙර පටන් මඩකලපුව දක්වා රට ආණ්ඩු කිරී-මට සුළු රජෙක් කොට පත්කරණ ලද්දේය.

10. දල ඇතෙක් අල්ල දී ලා
තොංසෙක් පඹුරුත් ඔප්පු දී ලා
බිත්ත බස් කියා ලා
රජුන් සිත අප කෙරෙහි බිඳ ලා

11. බාලයෝ අගම් පෝ ඕ
පට්ටිවල බාලයෝ අඩුකැ ඕ
තිකුලය අගම්පෝ ඕ
මොවුන් දනු ගතුවෝය හැඩි දැ ඕ

---

A රාජසිංහ මහරජාණන් විසින් ශාලිවාහන ශකරාජ වරුෂයෙන් වික්‍රම වරුෂ 1671 කෝ ඉල් මස 11 වෙනි සඳුද සූරිය ප්‍රකාශ සුව ශෝභන ශ්‍රී සන්නස් පත්‍රයෙන් නවරත්නසිංහ ඉරණසිංහ රාජවන්නිශාර් යන "කරාවේ" කුල ඇත්තාට නාගුළුගත්තෙර පටන් මිඩකලපුව දක්වා රට අංණ්ඩු කිරීමට සුළු රජෙක්කොට පත්කරණ ලද්දේය

හලාවත දිසත්‍රික්කයෙ කටුපිටි මාදම්පේ කුරුකුල අරශත්සූරිය වන්නි උන්නැහේ මුත්තන් වන්නි උන්නැහේ අසියාපුල්ලේ වන්නි උන්නැහේ පාලම් වන්නි උන්නැහේ කුමරප්පෙරුමාල් වන්නි උන්නැහේද යන වන්නිවරු පස් දෙනෙක් මුන්නේස්සරම් දේවාලයෙන් පළමුවෙනිකම් පවත්වාගෙන මීගොමුවේ තෝප්පුවේ පටන් කදිරමොලේ කන්ද දක්වා වන්නිකම් කලින් කලට කර තිබේ

එම වන්නි පේරුවෙන් පැවත එන බොහෝ උදවිය කටුපිටි මාදම්පේ වන්නිවරුය. නුවර කලා වියේම මහා පොතාන කෝරලේ රඹපොතාන, කෝන්වැව කොක් එබේ සහ තවත් ගම් කීපයක පදිංචි වී සිටිති. ඔවුන් මීගමුවේ මහ වීදියේ කරාවේ මිනිසුන්ය, දැනට ඔවුන්ගෙ නෑයෙක්ද වන හලාවත ආඩි අප්පන් සූරියවන්නි උන්නැහේ ලඟ තිබෙන පුරාණ ලියවිලිවලින් මේ කාරනා දැනගනිමි.

කුරුණෑගල හෙන්දිරියාපිටියෙ කුරුකුල විජේසූරිය මුදියන්සේලාගේ වර්ණසූරිය වෙද මහතා විසින් ඝපඝාදෙන ඉ පොතකින් උපුටාගනිමි.

12. මහනෙල් සුවඳම ය
කුඹ මසුත් පිළි ගඳම ය
දෙකළ එක දියම ය
හොඳට තරකට දෙකට දිවම ය

13. පිතාමහ බලමො ල
දිව්තයොදවා කටහ ල
මැවුනු මූත් මූකතු ල
කපත් දිව ගතුවත්ගෙ සහමු ල

14. උත්පල වර්ණය ත්
මෙදිය පාලක සව්මුරු ත්
අපහට බාලය ත්
යෙදූ අණවිත මකාලාව ත්

15. බුලත් ගෙයි බාලය ත්
ගොයම් කරණා බාලය ත්
මිතීවත් බාලය ත්
ලියන බාලයො දතුව ගතුව ත්

16. ගංගාද යමුනා තර
මැදිවූ බිම සකී මතහ ර
මසෙකු රුව සම ව ර
එබිම්විය පෙර මත් සපුරව ර

17. මිරිදිය වලල්ල කි
අතරතුර රට මඩුල්ල කි
කෙවට ජනපදය කි
පසුව කුරුරට පසිදු නාමෙ කි

18. මෙපුර සිරි මතහ ර
සොම් කල තැණැති තරව ර
මොවුන්හට තිර ස ර
තැඹැති දූ කුමරියක් සිටිව ර

19 යමුනා දෙගත්බ ඩ
දීවර දතත් තුඩ තු ඩ
දසත්නම් තිරිඳුත් ඩ
දුවූ දියණිය මච්චකොත්තිය හැ ඩ

20. සත්වතී රද දු    ව
වත පිළිකාද රෝගි    ව
රජ මැදුර බැහැර    ව
ශෝසිත් සුව වී සිටිත සඳ දි    ව

21. මුනි පරාසර ත    ට
ලදුව පුතු දනු වියාසර හ    ට
වේදය දත සොඳ    ට
මෙදිය කුස කිතුසඳ සදහ    ට

22. මුනි පරාසර හ    ට
සරණව තොබෝ කලක    ට
පසු පෙම් පුතු වියාසර තු    ට
වැදුවෙ යමුනා තදිය මැද සි    ට

23. උළිඳු කුල සඳ ව    නි
යළිදු සංතා රජුට පැවැ    නී
බිළිඳුන් වැදූ රුවැ    නි
පසිඳු විය තම මච්චකොත්    නි

24. බිසම චිත්තරාග    ද
වචිත්තර වීරිය කුමරද    ද
සහෝදර පෙම් බැ    ඳ
වැඩුනි තිදුකිත සැපත විඳවි    ද

25. චිත්තරාගද මූල    දී
එතම්න් සිටිය වොරු    දී
ගඳඹ සහ යුද බැ    දී
නැසීගියෙ ඔහු සටන් බිම    දී

26. විචිත්තර වීරිය සු    දී
අම්බ අම්බාලිකා    දී
කාසි රජ දෝණියන් බැ    දී
කුල වැදී පසුවෙතා කල    දී

27. ඔවුන්හට විදුර    ය
දුතරාස්ට නම් කුමරු    ය
පංඩු යන මේ අ    ය
සුතන් තිදෙනෙකු ලදුව පබල    ය

28. දුරුත රාෂ්ට කෑ තී
ගොතිර ˣගන්දර රද පු තී
ඇගෙ සැපත විඳ ර ති
ලදුවෙ කුමරුන් සියක් අරුමැ ති

29. දුර්යෝදන නම් දෑ රු
දුක් සාසන දෙ කුම රු
සියයහට එකුම රු
මහලු බැයන් විය සොඳු රු

30. සියය රජ කුමරු ව
සිරිත් ලෙස කැති කුලය ගම්ර ව
උන් මුතුන් රජ කුරු ව
නමින් පරසිදු විය කෞර ව

31. පංඩු රජිඳුන් ම තා
කුන්ති නම් දූරු කුමරි ජොංදි තා
වංස මුසු නොවෙ තා
ලෙසින් ඝරණීන් යෙහෙන් වස තා

32. ඔවුන්හට පින් බලැ ති
දැහැමි යුදිස්ටිර නම් ඇ ති
බිම් සෙන් මහ බලැ ති
අරුච්චන කුමරුවන් තැණ ඇ ති

33. නකුල සහ දේවය න්
ඉපදුමුත් සුළු මච් කුසි න්
එකුස බෑයන් ලෙසි න්
පසිදුවිය උන් පංඩවරයි න්

34. රජ දරුවින් පස්දෙ නා
පිය රජුගෙ නම යොදමි නා
පංඩවරුණ මෙ නා
පංච පාංඩවරු නමද යෙදු නා

35 පාංඩු රාජ කෞමෙනා රජ කම් ක ර
දුරුත රාෂ්ටහට පවරා රජ දු ර
පැවිදි වෙමින් ලෞකික සැප අත් හැර
වැඩියෙ හිමංලෙට සැපතට තවස ර

---

ˣදඹදිව ගන්ධාර දෙශයේ ,මිනිස්සු කරාවේ ගෝත්‍රයේ බැව් වන්නි රාජාවලියේ සඳහන්ව තිබේ.

36. දුරුත රාස්ට රජ තම පුතු සියය දැ
පංච පාංඩවර සොහොයුරු සුතන දැ
නීතිරීති ලෙස කුරු රට ජනය දැ
පාලන කර මන ලෙස සිරි විඳ වී දැ

37. වයස්ගතව යන බව දැන තමහ ට
යුදිස්ටිර නැණ ගුණ සරු කුමරු ට
අදිස්ටාන ලෙස සිහසුන කුරු ර ට
සතොංස්ව පවරං වැඩියෙ හිමාලෙ ට

38. සිය පිය සිය සුභතාහට නොම දූ
සුලු පිය සුතනට කිරුළය පැල දූ
අ හඬුය දැන කෞරව දරු විරි දූ
උරුමය ගැන්මට සිත උන් පැහැ දූ

39. ස තු ත් එදයෙහි ලොල් වන්තෝහු ය
ම නි න් සුරාදු වඩවන්තෝහු ය
ස ට න් බිමට සමතුන් වන්තෝහු ය
කුරුන් පාංඩවරුහට කිපුනෝහු ය

40 කඩු තෝමර පංචායුද ගත් තූ
දඬු මුගුරුද තං ආයුද යුත් තූ
කාඩ කොංඩිවල තඹ දුනු ඊ ගත් තූ
දැඩිව මතින් රණ කෙළියට පත් තූ

41. දස ද හ ස ක් අලි ඇතු යොදවා ළි
දස ද හ ස ක් හය බලය යොදා ළි
දස ද හ ස ක් දුනුවා යොර දා ළි
දස දෙසරක් මෙන සටන සදා ළි

42. දෙවි බඹ සුර නර සකල ගටින්ග ට
අ වි ආයුද ගෙන උන් මුන් කොට කො ට
දෙවි සභ යද ලද පාංඩවරුන් හ ට
ස වි උනී කුරුරට ජය ජය ජය පි ට

43. පස ලොස්දා වුනු සටන බිරම් වූ
පස බැයන් ජයගෙන මනරම් වූ
යස සිත කුරුරට කිරුළ උතුම් වූ
හිස මිණී කිම ලද යුදිස්ටිර කම් වූ

44. කෞ ර ව  රුපු සොහොයුරු කුමරුන් හ  ට
කෞ ර ව  කර සමුදි සල වරද  ට
කෞ ර ව  ගොත පවතික ලෙස සඳහ  ට
කෞ ර ව  සිත්තම රට රඳවා සෙ  ට

45. ඇ තැ ම  කුමරුවන් කුරුකුල හින්දු  ඕ
උ තු ම  කුලය අපි ලෝ කාටත් වැ  ඕ
තොව ම  කියා පඬුවන්ට අගම්පො  ඕ
කි ර ම  කෝපයෙන් බැහැර ගියෝ කැ  ඕ

46. සෝ ර ල  බර්බර ජාවක මල්ල  ය
කා ර ල  මුක්කර මදුරා මඩල  ය
තෝප ල  මිණිපුර අයෝති පබල  ය
සා ග ල  මරවර වංචිය කල්ල  ය

47. තු ළු ත ර  කාවෙණි තිලකරේ  යා
දෙ ළු ව ර  කාංචිය තුතුකුඩි  යා
ගු ජ් ජ ර  පාඬිය තෙලගු සොළී  යා
කු රු ව ර  මේදෙස විසිර ගියෝ  යා

48. ඒ ඒ කුරුවරු දඹදිව තොන්හි  ය
ඒ මේ අරශර බඩතුරු රජ ල  ය
ඒ ඒ පට්ටන් කට්ටි නමක් වි  ය
මෙ මේ විසිඑක පරිබැන්දන් වි  ය

49. කා රි ය  කරවන රජඅණ තැ  රු
වි රි ය  දන උතුරෙන් බටූ සා  රු
ආ රි ය  වරිගය වඩුග සපු  රු
සූ රි ය  සොම්කුල නමකි උදා  රු

50. උ තු රු  වඩුග වඩු බදග බදුග ය  නු
උ තු රු  රටුන්ගෙට නාමය බව ද  නු
ස තු රු  වලියවද කුරුරට ඉපදු  නු
අ තු රු  වඩුග නම රටරට පැවතෙ  නු

51. ක වූ ර නමක් ඇත වඩුග කුලත්ත ර
ග වූ ර විරුද නාමෙකි නායක්ක ර
බ වූ ර ව අමතන නානායක්ක ර
ක ව ර රටෙක් උන් තයිදෙ ඛඩක්ක ර

52. වේ ග ව හිත සමහර දැඩි කුරු වෝ
නා ග වතට වැද සිසරට හලු වෝ
බා ග කුරුන් මැරවර සිත් දූරු වෝ
සා ග ර සංතදි පේරුව කිව් වෝ

## විල්මට් ඒ. පෙරේරා මැතිතුමා.

මෙතුමා පාතදුර නගරයේ "රබර් රජා" යන විරුදාවලි නාම යෙන් යුත් ඒබ්‍රහම් මහත්මයාගේ පුත්‍ර රත්නය වේ. ඉගෙණීම අවසන් කිරීමෙන් පසුව හොරණ පළාතේ පදිංචිය ගත්තේය. එහි පැමිණ පළාතේ දියුණුවට ග්‍රාමසංවර්ධන සමිති සමාගම් පිහිටුවා ඉමහත් සේවයක් කරණ ලදහ. හොරණ පළාතට පමණක් නොව මුළු ලක්දිවටම අනගි මෙහෙයක් සිදුකිරීමට අදහස් කල මෙතුමා "ශ්‍රීපාලි විද්‍යාලය" යන නමින් ශාන්ති නිකෙතනයක් හොරණ පළාතේ පිහිටුවන ලදී. එම විද්‍යාස්ථා -නයේ මංගල ශිලා තැබීමට, ගුරුදෙවයන්වූ "රවීන්ද්‍රනාත් තාගෝර්තුමා කැඳවාගැනීම ඉතා ප්‍රශංසනීය කර්තව්‍යයකි. සවකීය ධනස්කන්ධය නිර්ලෝභිව වැයකොට පිහිටුවන ලද මේ විද්‍යාස්ථානයෙන් දැනට දසදහස් ගණන් සිසුන්ට ඇතිවූ විපුල ප්‍රයෝජනය කිය නොහැකි තරම් වේ. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මතුගම ආසනය වෙනුවෙන් ඉදිරිපත්වූ මෙතුමා සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර හිටපු අධ්‍යාපන ඇමතිතුමා පරදවා ජයගත්තේය. පසුව ලංකා - චීන මිත්‍රත්වය තහවුරු කර ගැනීම්වස් චීනයේ ලංකා තානාපතිවරයා කොට මෙතුමා චීනයට පිටත්කර යවන ලදහ. විල්මට් පෙරේරා මැතිතුමා නිහතමානී ත්‍යාගිශීලි ධනවත් ප්‍රභුවරයෙකි. පාතදුර නගර -යේ කුරුවංශික ශ්‍රෙෂ්ඨ පෙළපතක කීර්ති පැවත එන උතුමෙකි. මෙබඳු මහාත්මයන්ගෙන් ලක්දිවට පමණක් නොව විදෙශ යන්ටද සිදුවන මෙහෙය අති විශාලය විල්මට් ඒ. පෙරේරා මැතිතුමා ගැන කියයුතු කරුණු බොහෝ වෙත්.

## දිද්දෙනිය.

සත්කෝරළය බද මැල්සිරිපුරට නුදුරු දිද්දෙනිය ග්‍රාමය වනාහි බොහෝකොටම කුරුකුලයින්ගේ වංසභූමියකි. දැනට අපට ලැබිතිබෙන පැරණි ගෞරව රංකොඩියද, දිද්දෙනියේ වර්ණකුලසූරිය කුමාරසිංහ මුදියන්සේලාගේ සෙම්බප්පු මහතා ළඟ තිබෙන කොඩියෙන් ගත්තා ලද ඡායාරූප සටහනකි.

මෙහි ඉර හඳද, මත්ස්‍යයෙක්ද, නැවක්ද, පහණක්ද, ඇතෙක්ද, මාතෙල්, තෙළඹද, තවත් තොයෙක් රාජකීය සටහන්ද ඇති කොඩියකී මෙය අවුරුදු 400 කට වඩා පැරණි කොඩියක් බැව් කාරණා දත් අය කියති. දිද්දෙනී ග්‍රාමයේ කතරගම් දේවාලයක්ද වෙයි. අවුරුදුපතා එම දේවාලේ පෙළහර පවත්වයි. පෙළහර කාලෙට වත්ති බද සියලුම ගම්වලින් ජනයෝ මෙහි රැස්වෙති. මේ ග්‍රාමයෙහි වසන ටික දෙනෙක් හැර අනිත් සියලුදෙනාම කුරුකුලයෙන් පැවතෙන්නෝ වෙති. මොවුන් මීට අවුරුදු තිහ හතලිහකට ප්‍රථම දෙමළ භාෂාවද සිංහල දෙමළ මිශ්‍ර භාෂාවද කථාකර තිබෙන බැව් පෙනේ. මෙහි වැසි පුරුෂයින් මුලින් සෙල්ලප්පු සෙම්බප්පු, සූරියප්පු, කුමරප්පු කියාද, සත්‍රිහු කුමාරි, පාරුවතී, මීනච්චි කියාද භාවිතා කර තිබෙතත් දැනට ඔව්හු නාති-කාර සිංහල නම් පමණක් පාවිච්චි කරති. මොවුන්ගේ පෙළපත් නාම, වර්ණසූරිය, සූරියමුදියන්සේලාගේ, කුමාරසිංහ මුදියන්සේලාගේ සහ රාමනාථ මුදියන්සේලාගේ කියාද වෙති. මේ හැර තවත් පරම්පරා රාශියක් මේ ග්‍රාමයෙහි සහ අවට කුරුකුල ගම්වලත් පවතින බැව් දැනගන්ට ලැබී තිබේ. මොව්හු (පාණ්ඩිය පඩි) කේරල ආදී රජවරු සමග පැමිණි අමාත්‍ය ආදී රාජකීය පිරිසගෙන් පැවතෙන්නෝ වේති.

## ඉරසඳ කොඩිය.

ඉර සඳ කොඩිය, සතරකෝරළේ යුධ කොඩියවේ. ඉර සඳ කොඩිය, ආදි රාජකීය ගෞරව වූකලී ජයවර්ධන පුරය අගනුවර කර විසූ ශ්‍රී පණ්ඩිත පරාක්‍රමබාහු මහ රජාණන් විසින් මීට අවුරුදු 687 කට පෙර කාංචිපුර කාවේරි පට්ටනම කීලක්කරේ යන තුන් රටින් මුක්කර බලඇති පැරදවීමට ලක් දිව කැලණිගමුව දෙරට බට කරාවේ වංශික යුධභටයින්ගේ



කුරුකුල රංකොඩිය (දිද්දෙනිය - සත්කෝරළේ.)

ය සෙනෙවි වන වච්චනාච්චි දේවරිර්තුමාට මීගමුව ආදී තවත් ගම්වර ඇති ශ්‍රී සත්තසක්පිට කෞරව වංශිකයන්ගේ සංග්‍රාමික ශූරත්වය සඳහා සංතිෂය සන්තෝෂයෙන් ප්‍රදානය කරණ ලදහ. මෙ යුධකාමී චන්ද්‍රවංශිකයන් පුරාණ සිටම මුහුදුබඩ පලාත්වල පමණක් නොව බලංගොඩ මැදින්-තොරුව, කෑගල්ල, අවිස්සාවේල්ල, මාතලේ, මැදමහනුවර, සීතාකෝරලේ, සත්කෝරලේ, හතරකෝරලේ, තුන්කෝරලේ, උඩුගම්පල, මත්තම්පිටිය, කත්ඩලම, තමන්කඩුව ආදී මේ ගම්ල වාසස්ථාන ඇතිකරගෙන රට පාලන මෙහෙයන් හිද නියුක්ත වූහ. කෞරව වංශික ශ්‍රේෂ්ඨයෙක්වූ වර්තමාන කීර්තිමත් ඎ සර් මාර්කස් ප්‍රනාන්දු මැතිතුමංගේ මාතෘ තොරෝ සතරකෝරලය පාලනය කල අධිපතිකමට පත්ව සිටි ක්ෂත්‍රියයෙකුගෙන් පැවතෙන කුලධනතාවක් විය.

---

S/H. M FERNANDO Esq, M.D., B.S.C., L.S.A.

ඇම් ඩී., බී. ඇස්. සී., ඇල්. ඇස්. ඒ. යන ශාසත්‍රීය උපාධිධාරී සර් එච්. ඇම්. ප්‍රනාන්දු මැතිතුමා වෙත සමාදරයෙන් පිළිගැන්වීම.

සරසවියගෙවරම ලදලදවිශෙහිදීම තම

සත් දත් බෙලෙන් සිදිබිදි සෙසු පඩි එඩිය
තම් ලත් වෙද ඇදුරු ඇම්. ඩී. ජයකො ඩිය

ගරුත මැති සඳුනි එච්. මාකස් ප්‍රනාන්දු

රජකුල විලෙක සිරි සර ලද රණ හංස
තෙජබල රුපෑ රණසුරු කුරු රජ වංස

විසිතුරු මේලක් දන හට පානා ලෙසි නී
පිවිතුරු අදහසින් ඇරඹෙන මන රම නී
පිහකරු සඟර කුරු රජ වංශය ඉනිනී
සුරගුරු සදිසි ඔබවෙත පුදනෙමු බැති නී

(කතෘ)

බෝධිසාබද්ධගේ නම් ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ලංකාවට ගෙණ ඒම සමග ආවාවූ කෞරව වංශිය උතුමකුගෙන් පැවත එන වංශයයි. ලිඳමූලගේ නම් සත් වෙනි බුවනෙකබාහු රජාහත් වෙනුවෙන් පුර්තුගීස් බල ඇණි ගෙන යුඛ කලාවූ සේනාපති පේද්‍රරු සිල්වා මුදලිඳුගෙන් පැවත එන වංශයයි. පේද්‍රරු සිල්වා මුදලිඳුගේ පැවත ඊම වනාහි පලමු වෙනි භුවනෙකබාහු රජුහට රාජ්‍යය ගෙනදුන් දසදෙස පැතිර ගිය කිර්ති ප්‍රතාපයක් ඇති ඵකුර නම් ආයෂි සේනාපතියාගෙන් විය. මෙතුමාගෙන් පැවතෙන්නන් විසින් සතර කෝරලය පුරාණ සිට පාලනය කරණ ලද්දේය – (කුරු රාජ වංසය මාසික සඟරාව 31. 32 පිටු ක්‍රි: ව: 1935 දෙසැම්බ)

## අවසානය.

කුරුකුල චරිතයේ පලමුවෙනි කාණ්ඩයෙන් ලසදිව විසුවාවූද, දැනට ජිවතුන් අතර වැජඹෙන්නාවූද කුරු රජ වංශිකයින්ගේ තොරතුරු රාශියක් ඇතුලත්ව තිබෙනස් මෙම් දෙවෙනි කාණ්ඩයෙන් තවත් තොරතුරු රාශියක් සහ ශ්‍රෙෂ්ඨ පුද්ගලයන්ගේ සංක්‍ෂෙප චරිත කථා කීපයක්ද සඳහන්ව තිබේ.

බලාපොරොත්තු රහිත කරුණු රාශියක් මෙම පොතට ඇතුලත් කිරිමට සිදුවිම නිසා පළමු පොතට වඩා මෙම දෙවෙනි කාණ්ඩය විශාල බැව් පෙනේ.

ලිය යුතු වැදගත් කරුණු තවත් රාශියක් තිබෙනත් ග්‍රන්ථයාගේ විශාලත්වය නිසා මෙතෙකින් දෙවෙනි කාණ්ඩය සමාප්ත කිරීමට සිදුවිය.

# විශේෂ නිවේදනයයි.

කෞරව වංශිකයන්ගේ පෙළපත් (වරිග) නම් අතුරින් කොටසකි මෙහි දැක්වෙනුයේ. තවත් පෙළපත් නම් දහස් ගණනක් මෙයට ඇතුළත් විය යුතුව ඇත. විශේෂයෙන්ම දකුණු පළාතේ ද, මීගමුව, හලාවත, බේරුවල, අළුත්ගම ආදි ගම්වල ද පෙළපත් නම් රැසක් මෙහි ඇතුළත් කළ නොහැකි විය. මෙය කියවන ඔබ මෙයට ඇතුළත් විය යුතු කෞරව වංශයේ පෙළපත් නම් දන්නෙහි නම් කරුණාකර අප වෙත දන්වනු මැනවි. එවිට ඒවා අකාරාදි පිළිවෙළින් මීළඟ මුද්‍රණයට ඇතුළත් කරන්නෙමු.

තවත් කිව යුත්තකි. පරම්පරාව ලිවීම සඳහා මෙහි යොදා ඇත්තේ ආදර්ශ පිටුවක් පමණකි. එය ප්‍රමාණවත් නොවේ නම් වැඩිපුර කොළ යාකරගැනීම ඔබ සතු කාරියක් බව සලකන්න.

සම්පාදක.